★ **වෙනස පිණිස**

ශ්‍රී බුඩ වර්ෂ 2564ක් වූ මැදින් පුර නවවක ලත් සඳු දින | කාණ්ඩය 112 | පත්‍රය 82 | පිටු 32 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 මාර්තු 22 සඳුදා

# දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

## සමඟ

LOADING

කාලත්‍රයේ ඩිජිටල් දොරටුව

**අලුත් අලුත් දේ සොයනා සැමටම**

# සඳුදා කියවන්න

LAKE HOUSE

ලේක්හවුස් ප්‍රකාශනයක්




# දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ මැදින් පුර නවවක ලත් සඳු දින | කාණ්ඩය 112 | පත්‍රය 82 | පිටු 32 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 මාර්තු 22 සඳුදා





කාලතුරයේ ඩිජිටල් දොරටුව ද්වාර අද පත්‍රය සමඟ



# මාධ්‍ය නිදහස යනු මාධ්‍ය ආයතන හිමිකරුවන්ගේ නිදහස නොවේ

## ගම සමඟ පිළිසඳරේදී ජනපති කියයි

මහින්ද අලුත්ගෙදර

මාධ්‍ය නිදහස යනු මාධ්‍ය ආයතන හිමිකරුවන්ගේ නිදහස නොවන බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ප්‍රකාශ කරයි. පිට 04

# අභ්‍යාසලාභී උපාධිධාරීන් 10,000ක් අද සිට ස්ථිර රාජ්‍ය සේවයට

මහින්ද අලුත්ගෙදර

අභ්‍යාසලාභී උපාධිධාරීන් 10,000ක් අද (22) සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථිර රාජ්‍ය සේවයට බඳවා ගැනීමට රජය තීරණය කරයි. පිට 04



ප්‍රපාතයට පෙරළුණු බස් රථය සහ අනතුරින් මරුමුවට පත් කිහිප දෙනෙක්

## රියැදුරු බසයේ වේගය අඩු නොකරම මාරු වෙන්න ගියා

# බසය පාරේ ගැට්ට කඩාගෙන ප්‍රපාතයට වැටුණා



## සිද්ධියෙන් තුවාල ලැබූ කේ. ඩේවිඩ් කියයි

රක්ෂණ ශ්‍රියන්ත, ප්‍රසන්න පත්මසිරි සහ සී. ගමගේ

කොළඹ යන බසයට මම මීදුම්පිටියෙන් ගොඩ වුණා. බසය හැමදාම යන වේගයෙන් ගියා. 13 කණුව පාරට වැටුණ ගල අසලින් ඉදිරියෙන් ලොරියක් ආවා. බසයේ වේගය අඩු නොකරම එතැනින් මාරුවෙන්න ගියා. ඒත් එක්කම බසය පාරේ ගැට්ට කඩා ගෙන ප්‍රපාතයට පෙරළුණා යැයි මීදුම්පිටිය පදිංචි කේ. ඩේවිඩ් මහතා පැවසීය. පිට 04

## පැරෂුට් 2ක් ගුවනේදී එකට පැටලී ගුවන් හමුදා නිලධාරියා මරුට

පිට 4

## මේජර් ජනරාල් ප්‍රියංක ප්‍රනාන්දුට වෙස්ට්මිනිස්ටර් අධිකරණය දුන් තීන්දුව අවලංගු කෙරේ



පිට 4

## පස්සර බස් අනතුරේ රියැදුරු දෙපළ 25 දක්වා රිමාන්ඩ්

පිට 4

## පස්සර බස් අනතුර ගැන පරීක්ෂණයක් අරඹන්න

රාජ්‍ය ඇමැති දිලුම් මහාමාර්ග කොමිෂන් සභාවට දන්වයි



පිට 4

මාධ්‍යවේදියකු අසත්‍ය පැමිණිල්ලක් කිරීමේ සිද්ධිය

## රාජිත සේනාරත්න සහ චතුර අද සීසීඩීයට

සුභාෂිණී සේනානායක

තමා පැහැර ගෙන ගොස් පුලුස්සා වධ දුන් බවට අසත්‍ය පැමිණිල්ලක් සිදු කළ මාධ්‍යවේදියකු රෝහල්ගත වීමට පෙර හමු වූ බව කියන සිද්ධියක් සම්බන්ධයෙන් ප්‍රකාශ ලබා දීම සඳහා හිටපු ඇමැති පාර්ලිමේන්තු මන්ත්‍රී රාජිත සේනාරත්න සහ ඔහුගේ පුත් චතුර සේනාරත්න යන දෙදෙනා අද (22) සිද්ධියට අදාළව ප්‍රකාශ ලබා දීම සඳහා කොළඹ අපරාධ කොට්ඨාසයට පැමිණීමට නියමිතය. එම මාධ්‍යවේදියා අසත්‍ය පැමිණිල්ලක් සිදු කළ බවට ඔහු සිදු කළ පාපෝච්චාරණයෙන් පසුව පසුගිය දින දෙක තුළ මේ සිද්ධියට අදාළව ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා පැමිණෙන ලෙසට කොළඹ අපරාධ කොට්ඨාසය ඔවුන්ට දැනුම් දී තිබුණි. පිට 04




පිට 4

## එජා මානව හිමිකම් කමිටුවේ යෝජනාවලියට ඉන්දියාව පක්ෂයි

එම්.ඒ. සුමන්තිරන් කියයි

පිට 4

## ශ්‍රී ලංකාවට එරෙහි ජිනීවා යෝජනාව ගැන ඡන්ද විමසීම අද

## රිල්වාන් කොළඹ ගෙනැවිත් ප්‍රතිකාර කළ පුද්ගලයා ත්‍රස්ත විමර්ශන භාරයට

## සහල් මිල පාලනය කරන්නේ ආණ්ඩුව නොව මෝල් හිමියන් කිහිප දෙනකුයි



## නිලධාරීන්ගේ කඹ ඇදිල්ල නිසා ජනතාව අසරණ කරන්න බෑ



මහින්ද අලුත්ගෙදර

නිලධාරීන්ගේ කඹ ඇදිල්ල නිසා රටේ ජනතාව අසරණ කළ නොහැකි බව සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා ප්‍රකාශ කරයි. පිට 04

## එජාපයේ ප්‍රතිසංවිධාන කටයුතු ඇරඹේ

## ගල්කිස්සේ අතුරුදන් වූ සිසුවා නිවෙසට ඇවිත්

මාධ්‍ය වාර්තා බොරු

## සජිත් රහස් සාකච්ඡා පැවැත්වූයේ නෑ

විපක්ෂ නායක මාධ්‍ය අංශය

පිට 4


ලංකාවේ වාසි වැඩිම මොබයිල් පෙරගෙවුම් Plan එකට මාරුවෙන්න

TRIPLE BLASTER

විනාඩි 1150 D2D
SMS 1150 D2D
Anytime Data 550MB
FREE Bonus Data 825MB
(Anytime 4G Bonus 275MB, Night Bonus 550MB)

රු.345/-*
*බදු ඇතුළත් වේ

Activate කිරීමට රු. 345/- රීලෝඩ් කරන්න හෝ #678# dial කරන්න

Dialog
අනාගතය අදයි.

## මේජර් ජනරාල් ප්‍රියංක ප්‍රනාන්දුට වෙස්ට්මිනිස්ටර් අධිකරණය දුන් තීන්දුව අවලංගු කෙරේ

**මහින්ද අලුත්ගෙදර**

බ්‍රිතාන්‍යයේ ලන්ඩන්හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ හිටපු ඇමැති උපදේශක (ආරක්ෂක) මේජර් ජනරාල් ප්‍රියංක ප්‍රනාන්දු මහතාට එරෙහිව එරට වෙස්ට්මිනිස්ටර් මහේස්ත්‍රාත් අධිකරණය දුන් තීන්දුව එක්සත් රාජධානියේ මහාධිකරණය විසින් අවලංගු කර තිබේ.

තමා සම්බන්ධයෙන් වෙස්ට්මින්ස්ටර් මහේස්ත්‍රාත් අධිකරණය දුන් තීන්දුවට එරෙහිව ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ හිටපු අමාත්‍ය (ආරක්ෂක) මේජර් ජනරාල් ප්‍රියංක ප්‍රනාන්දු මහතා විසින් එක්සත් රාජධානියේ මහාධිකරණය වෙත කරන ලද අභියාචනය සඳහා මේ මස 19 වැනි දින අවසර ලබාදෙන ලද අතර එහිදී මහාධිකරණය විසින් එහි තීන්දුව මේජර් ජෙනරාල් ප්‍රනාන්දුට මහතාට පක්ෂව ලබාදෙන ලද අතර, වෙස්ට්මින්ස්ටර් මහේස්ත්‍රාත් අධිකරණය විසින් පසුගිය 2019 වසරේ දෙසැම්බර් 6 වැනි දින ඔහු වරදකරු කරමින් ලබාදෙන ලද තීන්දුව අවලංගු කොට ඒ මහතා නිදොස් කොට නිදහස් කර තිබෙන බව විදේශ කටයුතු අමාත්‍යාංශය පවසයි.

ඒ අනුව මේජර් ජෙනරාල් ප්‍රනාන්දු මහතාට ඔහුගේ නඩු ගාස්තු ගෙවන ලෙස ද පසුගිය 2018 පෙබරවාරි 4 වැනි දින ශ්‍රී ලංකාවේ 70 වැනි නිදහස් දිනයේ දී ලන්ඩනයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය ඉදිරිපිට විරෝධතා පැවැත්වූ එල්.ටී.ටී.ඊ හිතවාදී උද්ඝෝෂකයන් වන විත්තිකරුවන්ට නියෝග කර තිබේ.

මහාධිකරණය විත්තිකරුවන්ගේ තර්ක තරයේම ප්‍රතික්ෂේප කර තිබෙන අතර, මේජර් ජෙනරාල් ප්‍රනාන්දු මහතා වෙනුවෙන් ඉදිරිපත් කළ තර්ක පිළිගැනීම, ශ්‍රී ලංකාව සහ එක්සත් රාජධානිය යන රටවල් දෙකම රාජ්‍ය පාර්ශ්වයන් වන 1961 රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිළිබඳ වියානා සම්මුතියේ අඩංගු වන පරිදි රාජ්‍යතාන්ත්‍රික මුක්තිය පිළිබඳ සාම්ප්‍රදායික අදහස් තහවුරු කර ඇත.

## ශ්‍රී ලංකාවට එරෙහි ජිනීවා යෝජනාව ගැන ඡන්ද විමසීම අද

**මහින්ද අලුත්ගෙදර**

සාවද්‍ය සහ තහවුරු නොකළ කරුණු පදනම් කරගෙන ශ්‍රී ලංකාවට එරෙහිව ජගත් මානව හිමිකම් කවුන්සිලය වෙත ඉදිරිපත් කර තිබෙන යෝජනාව සම්බන්ධයෙන් වන ඡන්ද විමසීම අද (22) පැවැත්වීමට නියමිතය.

එක්සත් රාජධානියේ මූලිකත්වයෙන් ඉදිරිපත් කරන මේ වාර්තාව සභාගත කිරීමෙන් අනතුරුව ඡන්ද විමසීම සිදුකිරීමට නියමිත බව විදේශ කටයුතු අමාත්‍යාංශය පවසයි.

ඒ අනුව ශ්‍රී ලංකාවට එරෙහිව එක්සත් රාජධානිය මූලිකත්වයෙන් යුතු කැනඩාව, ජර්මනිය, උතුරු මැසිඩෝනියාව, මොන්ටිනිග්‍රෝ හා මලාවි යන රටවල් විසින් අදාළ යෝජනාව ඉදිරිපත් කර තිබෙන අතර එම රටවල් සමූහය, ශ්‍රී ලංකාව පිළිබඳ කෙටුම්පත් කෙරුණු යෝජනාව පසුගිය 16 දා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයට ඉදිරිපත් කර ඇත.

සම අනුග්‍රාහක රටවල් සමූහය විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන්ට වඩා බෙහෙවින් වෙනස් නිර්දේශයන් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් මිෂෙල් බැචලේ විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් වන අතර එමඟින් ශ්‍රී ලංකාවේ යුද අපරාධ සහ හිංසනයේ යෙදුණු පුද්ගලයන්ට එරෙහිව ඉලක්කගත සම්බාධක, ඔවුන්ගේ වත්කම් අහුරාලීම සහ සංචාරක තහනම් කිරීම් සලකා බලන ලෙස එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ සාමාජික රටවලින් ඉල්ලා තිබේ.

මිෂෙල් බැචලේ ගේ වාර්තාව පසුගිය දා අන්තර්ක්‍රියාකාරී සංවාදයට ගැනුණු අතර නිකරගුවා, එරිත්‍රියා සහ උතුරු කොරියා ඇතුළු රටවල් 21 ක් එහිදී ශ්‍රී ලංකාවට සහාය පළ කරමින් සිය අදහස් ඉදිරිපත් කළේය. නිකරගුවා, එරිත්‍රියා සහ උතුරු කොරියාව ද මානව හිමිකම් කවුන්සිලය තුළ ඔවුන් පාදක කරගත් යෝජනාවලට මුහුණ දී සිටිති.

කෙසේ වුවද ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ජගත් මානව හිමිකම් කවුන්සිලය හමුවේ ඉදිරිපත් කර තිබෙන යෝජනාව රටවල් කිහිපයක දේශපාලන වුවමනාවන් වෙනුවෙන් ඉදිරිපත් කර තිබෙන අතර මේ විවේචන ඉදිරිපත් කර කිසිදු රටක් වගවීම සහ මානව හිමිකම් පිළිබඳව ශ්‍රී ලංකාව දරා ඇති උත්සාහයක් සඳහා කිසිදු සහායක් දක්වා නොමැති බව විදේශ කටයුතු ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතා පෙන්වා දෙයි.

ජගත් මානව හිමිකම් කවුන්සිලය සාමාජික රටවල් 47 කින් සමන්විත වන අතර එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ සාමාජිකයන්ගේ සෘජු හා රහසිගත ඡන්ද විමසීමකින් එම සාමාජික රටවල් තෝරා ගනු ලැබේ. මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම සඳහා එම අපේක්ෂක රාජ්‍යයන්ගේ දායකත්වය මෙන්ම ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ කැපවීම් සහ ස්වේච්ඡාවෙන් ක්‍රියාකිරීම මහ මණ්ඩලය විසින් සැලකිල්ලට ගනු ලබයි.

කවුන්සිලයේ සාමාජිකත්වය පදනම් වන්නේ සමාන භූගෝලීය ව්‍යාප්තිය මත වන අතර ඒ අනුව අප්‍රිකානු රටවලට ආසන 13ක්, ආසියා - පැසිෆික් රටවලට ආසන 13ක්, ලතින් ඇමරිකානු සහ කැරිබියානු රටවලට ආසන 8ක්, බටහිර යුරෝපීය සහ අනෙකුත් රාජ්‍යයන්ට ආසන 7ක්, නැගෙනහිර යුරෝපීය රටවලට ආසන 6ක් ලෙස මානව හිමිකම් කවුන්සිලයේ ආසන වෙන්වී ඇත.

## පැරෂුට් 2ක් ගුවනේදී එකට පැටලී ගුවන් හමුදා නිලධාරියා මරුට

**සුභාෂිණී සේනානායක**

අම්පාර උහන ගුවන් හමුදා පුහුණු පාසලේ දී පැරෂුට් පුහුණුවක නිරත වෙමින් සිටියදී සුළඟේ දිසාව වෙනස් වීමෙන් පැරෂුට් දෙකක් එකට පැටලී වූ අනතුරක් හේතුවෙන් නිලධාරියකු මියගොස් තිබේ.

මියගොස් ඇත්තේ ගුවන් හමුදා බළගණ නායක මනෝජ් ගුණතිලක නමැති වීරකෝට්ටුව පල්ලෙපොල පදිංචි 34 හැවිරිදි අයෙකි.

සිද්ධියෙන් ස්කොඩ්‍රන් ලීඩර් නිලයේ සිටි නිලධාරියකු මියගොස් ඇති අතර සැරයන්වරයකු තුවාල ලබා අම්පාර රෝහලේ ප්‍රතිකාර ලබමින් පසුවෙයි.

අඩි 8000 උඩ සිට පැරිෂුට් මාර්ගයේ පහළට පැමිණීමේදී පැරිෂුට් දෙක පැටලීමෙන් මෙම අනතුර සිදුව තිබේ.

### බොරැල්ල ලේක්හවුස් පුවත්පත් අලෙවි නියෝජිත මහතා අභාවප්‍රාප්ත විය.



### ධර්මදාස අමරසිංහ මහතා

**බොරැල්ල ලේක්හවුස් පුවත්පත් අලෙවි නියෝජිත ධර්මදාස අමරසිංහ මහතා**

2021-03-20 වන දින අභාවප්‍රාප්ත විය.
දේහය නිවසේ තැන්පත් කර ඇත.

**ඒ පිළිබඳ අවසන් කටයුතු 2021-03-22 සඳුදා සවස 5.00 ට බොරැල්ල පොදු සුසාන භූමියේදී සිදු කෙරේ.**

අලෙවි දෙපාර්තමේන්තුව - ලේක්හවුස්

## රිල්වාන් කොළඹ ගෙනැවිත් ප්‍රතිකාර කළ පුද්ගලයා ත්‍රස්ත විමර්ශන භාරයට

**රක්ෂණ ශ්‍රියන්ත**

අන්තවාදය ප්‍රචාරය කිරීමේ චෝදනාවට රිමාන්ඩ් භාරයේ සිටි පුද්ගලයකු පෙරේදා (20) ත්‍රස්ත්‍ර ක්‍රියා විමර්ශන කොට්ඨාසය භාරයට ගෙන ඇති අතර සැකකරු සහරාන්ගේ සහෝදරයා තුවාල ලැබූ අවස්ථාවේ කොළඹට රැගෙන ආ පුද්ගලයා බව ද පොලිසිය අනාවරණය කරගෙන තිබේ.

ඔහු කාත්තන්කුඩි ප්‍රදේශයේ පදිංචි 27 හැවිරිදි අයෙකි.

සැකකරු මඩකලපුව පොලිසිය කළ පරීක්ෂණ කිහිපයකින් පසු අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රක්ෂිත බන්ධනාගාරගතකර තිබී ඇතැයි පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ ප්‍රකාශ කළේය.

එම සැකකරු අන්තවාදී මත දරමින් විවිධ ක්‍රියාකාරකම්වල නිරතවී ඇතැයි හෙළිවී තිබේ.

## පස්සර බස් රථ අනතුරේ රියැදුරු දෙපළ 25 දක්වා රිමාන්ඩ්

**ආර්.එම්.විජේරත්න- හාලිඇළ සමූහ**

ඉකුත් (20)දා උදෑසන බදුල්ල මොනරාගල මාර්ගයේ පස්සර 13 කණුව ප්‍රදේශයේදී සිදුවූ මාරක බස්රථ අනතුර සම්බන්ධයෙන් එම බස් රථයේ රියැදුරු හා ටිපර් රථ රියැදුරා මේ මස 25 වැනිදා තෙක් රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙස බදුල්ල වැඩබලන මහේස්ත්‍රාත් සුජීව සිල්වා මහතා (21දා) නියෝග කළේය. ලුණුගල සිට කොළඹ බලා ධාවනය වෙමින් තිබියදී පුද්ගලයන් 14 දෙනකුට මරු කැඳවමින් අනතුරට පත් අදාළ පෞද්ගලික බස් රථයේ රියදුරු වූ අම්බලන්ගොඩ කොටස, හොප්ටන්, ලුණුගල යන ලිපිනයේ පදිංචි කේ.ආර්.නිමල් චන්ද්‍රකාන්ත් නමැති 52 හැවිරිදි පුද්ගලයකු හා සිද්ධිය වන අවස්ථාවේ එම ස්ථානයෙන් ප්‍රතිවිරුද්ධ දෙසට ධාවනය කෙරුණු ටිපර් රථයේ රියදුරු වන නිකිණිරාම පාර, දළුපිටිය, කඩවත යන ලිපිනයේ පදිංචි දිසානායක මුදියාන්සේලාගේ චන්ද්‍රකුමාර (45) මෙසේ රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි.

## එජා මානව හිමිකම් කමිටුවේ යෝජනාවලියට ඉන්දියාව පක්ෂයි

### එම්.ඒ. සුමන්තිරන් කියයි

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව විසින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඉදිරිපත් කොට ඇති සංහිඳියාව වගවීම හා මානව හිමිකම් ප්‍රවර්ධනය සඳහා වූ යෝජනාවලියට ඉන්දියාව පක්ෂපාතීව ඡන්දය ප්‍රකාශ කරණු ඇතැයි දෙමළ ජාතික සන්ධානයේ ප්‍රකාශක එම්.ඒ.සුමන්තිරන් මහතා 20 දා පැවසීය.

මාධ්‍යවේදීන් විසින් නගන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් සුමන්තිරන් මන්ත්‍රීවරයා සඳහන් කළේ දෙමළ ජනයාගේ දේශපාලන අභිලාෂයන් පිළිගන්නා ලෙස ඉන්දියාව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලයෙන් අවස්ථා කීපයකදීම ඉල්ලා සිටීම නිසා ඒ පිළිබඳව දෙමළ ජාතික සන්ධානයේ අභිලාෂයන් වැඩි වී ඇති බවයි. ඡන්දය ප්‍රකාශ කිරීම හා ඉන් වැළකී සිටීම ඉන්දියාවේ අයිතිය වූවත් ඔවුන් මෙවර යෝජනාවලියට පක්ෂපාතීව ඡන්දය ලබා දෙනු ඇතැයි අපේක්ෂා කළ හැකි බව පැවසූ සුමන්තිරන් මන්ත්‍රීවරයා ඉන්දියාව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලයේ යෝජනාවන්ට ඡන්දය ප්‍රකාශ කොට නොමැත්තේ 2014 වසරේදී පමණක් බවද සඳහන් කළේය.

## සහල් මිල පාලනය කරන්නේ ආණ්ඩුව නොව මෝල් හිමියන් කිහිප දෙනකුයි

### පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය නලින්ද ජයතිස්ස

**අසේල කුරුළුවංශ හා මස්කෙළිය සමූහ**

මෙරට සහල් මිල පාලනය කරනු ලබන්නේ රජය නොව සහල් මෝල් හිමියන් කිහිප දෙනකු විසින් බව ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතා පවසයි.

කෘෂිකර්ම ඇමැතිවරයා සහල් මිල බස්සන බවට පොර ටෝක් දුන්නත් ඔහුට සහල් මිල පාලනය කිරීමේ හැකියාවක් නොමැති බවද ඒ මහතා කීය. සිස්ටම් ෆේල් මැයෙන් මස්කෙළිය පී.එම්.ඕ ශාලාවේදී පෙරේදා (20) පැවැති ජනහමුවකදී ජයතිස්ස මහතා මේ බව ප්‍රකාශ කළේය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේද පැවසුවේය.මේ රටේ සහල් මිල පාලනය කරනු ලබන්නේ ප්‍රධාන සහල් මොල් හිමියන් සිවු දෙනෙක් විසිනුයි.ඒ බහුතරයකගේ පවුලේ අය පසුගිය මැතිවරණයට පොදුජන පෙරමුණ නියෝජනය කරමින් පොළොන්නරුවෙන් ඡන්දය ඉල්ලුවා.ඩඩ්ලි සිරිසේනට අත තියන්න මේ මේ ආණ්ඩුවට බැහැ. ඒ අය තමයි සහල් මිල පාලනය කරන්නේ.මිනිස්සුන්ට කලින් ලැබුන දේවලුත් දැන් අහිමි වෙලා.මේ දවස් වල රටේ සියදිවි හානිකර ගැනිම් වැඩියි.එක් පැත්තකින් ක්ෂුද්‍ර මූල්‍ය වංචාවට හසුවුණු කාන්තාවන් දුක්විඳිනවා.සමහර ව්‍යාපාර කඩා වැටිලා.මේ ප්‍රශ්න හමුවේ මිනිස්සු සියදිවි හානි කර ගන්නවා. මේ සිස්ටම් එක වෙනස් වෙන්න ඕන.අපිට ජීවත් වෙන්න අමාරු වුණාට පාලකයන්ට සහ ඔවුන් වටේ ඉන්න අයට ජීවත් වෙන්න ප්‍රශ්නයක් නැහැ.

## ගල්කිස්සේ අතුරුදන් වූ සිසුවා නිවෙසට ඇවිත්

**රක්ෂණ ශ්‍රියන්ත**

පසුගිය 18 දින ගල්කිස්ස ප්‍රදේශයේ මහල් සංකීර්ණයක සිට අතුරුදන්වූ 15 හැවිරිදි පාසල් සිසුවා පෙරේදා (20) රාත්‍රියේ නැවත තම නිවෙස වෙත පැමිණ ඇති බව පොලිසිය පවසයි.

ගල්කිස්ස විශේෂ බුද්ධි ඒකකය, ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකය, ගල්කිස්ස ළමා සහ කාන්තා කාර්යාංශය සහ ගල්කිස්ස පොලිසියේ අපරාධ අංශ මගින් මේ සම්බන්ධයෙන් විමර්ශන ආරම්භ කර තිබූ බව ද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කියා සිටියේය.

දැනට සොයාගෙන ඇති ආවේශන රූප කැමරා පද්ධති දත්ත අනුව දරුවා 18 වෙනිදා උදෑසන 6.25ට පමණ නිවසින් පිටව ගොස් ඇති අතර 6.33ත්-6.35ත් අතර කාලය තුළ ඔහු ගාලු පාරේ එක්තරා ස්ථානයක ගමන් කරන අයුරු අවසාන සී.සී.ටී.වී කැමරාවල දර්ශනය වන අතර එතැනින් පසුව ඔහු ගැන තොරතුරක් නොමැතිවූ බැවින් ඔහු සොයා විමර්ශන ආරම්භ කර ඇති අතර තුර ඔහු නැවත තම නිවස වෙත පැමිණ තිබිණි.

## පස්සර බස් අනතුර ගැන පරීක්ෂණයක් අරඹන්න

### රාජ්‍ය ඇමැති දිලුම් මහාමාර්ග කොමිෂන් සභාවට දන්වයි

**සුභාෂිණී සේනානායක**

මොනරාගල - බදුල්ල මාර්ගයේ පස්සර 13 කණුව ප්‍රදේශයේදී මගී ප්‍රවාහන බස් රථයක් ප්‍රපාතයකට පෙරළී යෑමෙන් සිදුවූ අනතුර සම්බන්ධයෙන් වහාම පරීක්ෂණයක් ආරම්භ කරන ලෙස මහාමාර්ග රාජ්‍ය ඇමැති දිලුම් අමුණුගම මහතා මහාමාර්ග කොමිෂන් සභාව වෙත දැනුම් දී තිබේ. අනතුර සිදුවීමට හේතු සොයා බලා වාර්තාවක් ලබා දෙන ලෙස රාජ්‍ය ඇමැතිවරයා උපදෙස් දී ඇත. එමෙන්ම අනතුරින් මිය ගිය තුවාල ලැබූ පුද්ගලයනට අවශ්‍ය සහන ලබාදෙන ලෙසටත් රාජ්‍ය ඇමැතිවරයා උපදෙස් ලබා දී ඇති අතර ඒ අනුව අද 22 ඌව පළාත් සභාව හරහා අදාළව වන්දි මුදල් අනතුරට ලක් වූවන්ගේ නිවෙස් වෙත යොමු කරන බව ගමනාගමන කොමිෂන් සභාවේ ප්‍රකාශකයෙක් පැවැසීය.

එමෙන්ම ඌව පළාත් සභාව හරහාද රක්ෂණ සමාගම් හරහාද වන්දි ලබා දීමට පියවර ගෙන ඇති බව එම ප්‍රකාශකයා කියා සිටියේය. ඉකුත් (20) උදෑසන ලුණුගල සිට කොළඹ බලා ධාවනය වෙමින් තිබූ පෞද්ගලික බස් රථයක් 13 කණුව ප්‍රදේශයේදී මාර්ගයෙන් ඉවතට පැන අඩි 250ක පමණ ප්‍රපාතයකට පෙරළීමෙන් අනතුර සිදුවුණු අතර ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ටිපර් රථයකට මාර්ගයේ ඉඩ ලබාදීමට යෑමේදී බස් රථයේ ඉදිරිපස රෝදය මාර්ගයෙන් ඉවතට ලිස්සා යෑම හේතුවෙන් බසය ප්‍රපාතයට පෙරළී තිබේ. අනතුරින් පුද්ගලයන් 14 දෙනකු මියගොස් තවත් 32කට තුවාල සිදු විය.

**මාධ්‍ය වාර්තා බොරු**

## සජිත් රහස් සාකච්ඡා පැවැත්වූයේ නෑ

### විපක්ෂ නායක මාධ්‍ය අංශය

**පහන් විජේසේකර**

විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා රජයේ ඇතැම් පුද්ගලයන් සමඟ සාකච්ඡා කළ බවට පළ වන මාධ්‍ය වාර්තා පදනම් විරහිත වාර්තා ලෙස ප්‍රතික්ෂේප කරන බව විපක්ෂ නායක මාධ්‍ය අංශය නිවේදනය කරයි. සජිත් ප්‍රේමදාස මහතා සහ ආණ්ඩුවට සම්බන්ධ ඇතැමුන් අතර සාකච්ඡා, හමුවීම් සිදු වී ඇති බවට පදනම් විරහිත ප්‍රවෘත්ති නිර්මාණය කිරීමෙන් ආණ්ඩුව පත්ව සිටින පහත් මානසික තත්ත්වය සහ ව්‍යාකූලත්වයේ ස්වභාවය ගම්‍ය වන බව ද එම නිවේදනයේ දැක්වේ. උග්‍ර අභ්‍යන්තර අර්බුද මැද ඉතා වේගයෙන් සිය ජනප්‍රියත්වය අහිමි කරගනිමින් සිටින වත්මන් රජයේ කිසිවකු සමඟ රහස් සාකච්ඡා කිරීමෙහි අවශ්‍යතාවක් හෝ වේලාවක් විපක්ෂ නායකවරයාට නොමැති බවත් එහි සඳහන් කර තිබේ.

## එජාපයේ ප්‍රතිසංවිධාන කටයුතු ඇරඹේ

**හිදෝගම සමූහ**

එක්සත් ජාතික පක්ෂ ප්‍රතිසංවිධාන කටයුතු අනුරාධපුරයෙන් ඊයේ (21) ආරම්භ විය. එක්සත් ජාතික පක්ෂ මහලේකම් රංගේ බණ්ඩාර මහතාගේ ප්‍රධානත්වයෙන් අනුරාධපුර ක්‍රිස්ටන් පාර්ක් හිදී මේ ප්‍රතිසංවිධාන කටයුතු පිළිබඳව සාකච්ඡාව පැවැත්විණි.

එක්සත් ජාතික පක්ෂ මහ ලේකම් රංගේ බණ්ඩාර, හිටපු මන්ත්‍රී වරුන් වන මහාචාර්ය ආංගු මාරසිංහ, සමන් රත්නප්‍රිය, දඹදෙණිය ආසන සංවිධායක භාරත තෙන්නකෝන්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ එකම ප්‍රාදේශීය සභා සභාපතිවරයා ඇතුළු 75ක් පමණ පිරිසක් මේ සඳහා සහභාගී වූහ. හිටපු මන්ත්‍රී වරුන් වන ආංගු මාරසිංහ මහතා සහ සමන් රත්නප්‍රිය යන මහත්වරුන් සභාව ඇමතූහ. ප්‍රතිසංවිධාන කටයුතු පිළිබඳව සාකච්ඡාව පක්ෂයේ මහ ලේකම් රංගේ බණ්ඩාර මහතා විසින් සිදු කරන ලදී.

එහිදී හිටපු මන්ත්‍රී අංගු මාරසිංහ මහතා මෙසේ ද කීය.

අපි ග්‍රාම සේවකයෙකුව සිටි මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපති කළා. අපට වැරදුනේ ඒක.එක්සත් ජාතික පක්ෂය මේ මොහොත වන විට රට පුරාම ප්‍රතිසංවිධාන කටයුතු ආරම්භ කිරීම සඳහා ආරම්භය අනුරාධපුරයෙන් පටන් ගත්තා. වසර 70 ක්ම අපට වැරදුනේ මම කියපු තැන ඉඳලා. හොඳට බලන්න දේශපාලකයෝ මම ,මම කියලා හැම විටම කියනවානම් තමන් සහ තමන්ගේ පවුල්වල අය හඳපු එක විතරයි කරලා තියෙන්නේ.ප්‍රාදේශීය මට්ටමේ වුනේත් එහෙමයි.ආඩම්බර වනවා අද අප පක්ෂයට තිබෙන එකම ප්‍රාදේශීය සභාව අනුරාධපුරයටම හොරොව්පතාන විතරයි. ඒ සභාපතිතුමා අද කතා කළේ අපි කියලා. ඒ කයි එතුමා ප්‍රාදේශීය සභා සභාපති වුණේ. ඒක තමයි ඇත්ත.

03 වැනි පිටුවෙන්...

### බසය පාරේ.....

මෑත කාලයේ වැඩිම පිරිසක් මියගිය සහ වැඩිම පිරිසක් තුවාල ලැබූ රිය අනතුර බස් රථයක් ප්‍රපාතයකට යෑමෙන් පෙරේදා (20) උදෑසන පස්සර පොලිස් වසමේ 13 කණුව අසලදී පුද්ගලයන් 14ක් මියගොස් පුද්ගලයන් 34 දෙනකු තුවාල ලබා තිබේ.

තුවාල ලැබූවන්ගෙන් පිරිමි පුද්ගලයන් 20ක් සහ කාන්තාවන් 13ක් වේ. තුවාල ලැබූවන් අතර දරුවන් 05 දෙනකු ද වේ. මෙම සිද්ධියෙන් පසුව උදව් කිරීමට පැමිණි පුද්ගලයකු ද ගලක් පෙරළී තුවාල ලබා තිබේ.

ද්විත්ව වංගුවක් ඇති මෙම ස්ථානයේ සිදුවූ රිය අනතුරෙන් බස් රථයේ රියැදුරු අසුනේ පුද්ගලයකු සිරවී තිබූ අතර පසුව ඔහු මියගොස් තිබුණි. නමුත් ඔහු රියැදුරු නොවන බවට අනාවරණය වී ඇත. රියදුරු අසාධ්‍ය තත්ත්වයෙන් මේ වන විට ප්‍රතිකාර ලබමින් සිටින අතර ඔහු 53 හැවිරිදි ලුණුගල ප්‍රදේශයේ පදිංචි අයෙකි.

තුවාලකරුවෝ පස්සර සහ බදුල්ල රෝහල්වල ප්‍රතිකාර ලබමින් සිටිති. මෙම බස් රථය ලුණුගල සිට කොළඹ බලා ධාවනය වූ පෞද්ගලික බස් රථයකි.

සී.සී.ටී.වී දර්ශන අනුව මෙම බස් රථය කොළඹ දිශාවට ගමන් කර ඇති අතර ප්‍රතිවිරුද්ධ දිශාවට ලොරියක් ගමන් කර ඇති අතර එක්වරම මෙම බස් රථය පල්ලමට ඇදී යන ආකාරය නිරීක්ෂණය වන බව පොලිසිය පවසයි.

එම අසල ඇති භෞතික සහ පරිවේශණීය සාක්ෂි පරීක්ෂා කිරීමේදී මෙම රියැදුරුට බස් රථය පාලනය කර ගැනීමට නොහැකිව මෙම අනතුර සිදුව ඇති බවත් නමුත් මෙම බස් රථය සම්බන්ධව තාක්ෂණික පරීක්ෂාවක් මෝටර් රථ සම්බන්ධ පරීක්ෂකවරුන් විසින් සිදුකිරීමට නියමිත බවත් පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කියා සිටියේය. මෙම බස් රථයට අනතුරෙන් දැඩි අලාභහානි සිදුවී ඇති හෙයින් ඒ සම්බන්ධ තාක්ෂණික පරීක්ෂණයක් සිදු කිරීමට කාලයක් යන බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කියා සිටියේය.

පසුගිය අවුරුදු එක හාමාරක කාලය තුළ මෙවැනි අනතුරු 30කට ආසන්න ප්‍රමාණයක් කඳුකර පළාත් තුළ සිදුව තිබේ.

අනතුර සම්බන්ධයෙන් ප්‍රකාශ කිහිපයක් සටහන් කරගෙන ඇති අතර විශේෂ පොලිස් කණ්ඩායමක් යොදවා විමර්ශන සිදු කෙරෙන අතර පස්සර පොලිසිය ද මේ සම්බන්ධයෙන් පරීක්ෂණ මෙහෙයවයි. මෙම බස්රථය ප්‍රතිවිරුද්ධ දිශාවෙන් ධාවනය වූ ලොරි රථයේ ගැටී නොමැති බව සී.සී.ටී.වී දර්ශනවල සටහන් වුවද අදාළ ලොරි රථය සහ එහි රියදුරු ද පරීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය හෙයින් ඔහු ද අත්අඩංගුවට ගෙන ඇත. පස්සර පෞද්ගලික බස් රථ අනතුර සිදුවන අවස්ථාවේ දී එය දැක පළා ගොස් සැඟව සිටි බව කියන ටිපර් රථ රියැදුරා සහ අනතුරට ලක්වූ බසය පැදවූ රියැදුරා අත්අඩංගුවට ගෙන බදුල්ල වැඩ බලන මහෙස්ත්‍රාත් සුජීවන සිල්වා මහතා හමුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඔවුන් දෙදෙනා ලබන 25දා දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට නියෝග කළේ ය.

### නිලධාරීන්ගේ ...

අණ පනත් නිර්මාණ්‍ය කරන්නේ සහ සංශෝධනය කරන්නේ ද නිලධාරීන් බව පෙන්වාදෙන ඒ මහතා එවැනි අණපනත් සෑදීමෙන් පසුව යම් යම් තැන්වල ගැටළු ඇතිවූ පසුව ඇඟිල්ල දිගු කරන්නේ දේශපාලඥයන්ට බවද පෙන්වාදෙයි. නයිවල ජයසිංහ උත්සව ශාලාවේ පැවති ගම්පහ දිස්ත්‍රික් ජීවනෝපාය සංවර්ධන කමිටු රැස්වීමේ දී ඒ මහතා මේ බව සදහන් කළේය. එහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් ප්‍රසන්න රණතුංග මහතා පෙන්වා දුන්නේ දේශපාලනඥයෝ අවුරුදු 05න් 05ට මාරු වන නමුත් නිළධාරීන් ටයි පටි මාරු කරගෙන ඉන්නා බවත් ඒ නිසා නිලධාරීන් මේ ප්‍රශ්නය අපට විසඳා දියයුතු බවත්ය. ගොඩක් දුරට නිලධාරින් කරන වැරදි නිසා මේ රට මේ තත්ත්වයට පත්ව තිබෙන බව කී ඇමැතිවරයා තීන්දු කරලා කරන්න ඕනෑ දේ අපිට කිව යුතු බවද කීවේය. ඉඩම් ඇමති එස්.එම්.චන්ද්‍රසේන මහතා ද මේ අවස්ථාවට එක් විය.

03 වැනි පිටුවෙන්...

### අභ්‍යාසලාභි උපාධිධාරීන්...

ඒ වෙනුවෙන් අවශ්‍ය පියවර ගෙන තිබෙන බව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන ඇමැති ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා පවසයි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා තම ජනාධිපතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් කළ පරිදි රැකියා විරහිත උපාධිධාරීන් රැකියා ගත කිරීමේ වැඩසටහනේ ප්‍රගතිය සම්බන්ධයෙන් කළ විමසීමකට ඇමැති ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා සඳහන් කළේය.

එහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් ඒ මහතා පෙන්වා දුන්නේ, “රජයක් ලෙස අපේ දැක්ම උගත් තරුණ පිරිස මේ රටේ සංවර්ධනයට සෘජුව දායක කර ගැනීමයි. මේ සඳහා තමයි අපි උපාධිධාරීන් 60,000ක් රාජ්‍ය සේවයට බඳවා ගැනීමට පියවර ගත්තේ. ඒ වගේම යහපාලන රජය බඳවා ගත් 14000ක් පමණ වන උපාධිධාරී අභ්‍යාසලාභීන්ගෙන් දස දහසක පිරිසක් ස්ථිර රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ කටයුත්ත අද සිට අපේ අමාත්‍යාංශය ක්‍රියාත්මක කරනවා. මේ අයගේ අභ්‍යාසලාභී කාලය අවසන් වී තිබුණත් පවතින කොරෝනා වසංගත තත්ත්වය තුල මේ අය ස්ථිර රාජ්‍ය සේවයට බඳවා ගැනීමට තිබුන සැලැස්ම අපට අවශ්‍ය පරිදි සිදුකරන්න බැරි වුණා. සමස්ත රාජ්‍ය සේවයේම පැමිණීම දැඩිලෙස සීමාකර තිබූ නිසා මේ අභ්‍යාසලාභීන්ගේ තොරතුරු ගෙන්වා ගෙන ඔවුන් සම්මුඛ සාකච්ඡාවකට ගෙනැවිත් ස්ථිර කිරීමට අදාළ පියවර ගැනීමට නොහැකි වුණා.

කොහොම වුණත් මේ පැවති තත්ත්වය සමහන් වුන ගමන් යලිත් මේ ස්ථිර කිරීමේ වැඩසටහන ආරම්භ කිරීමට අමාත්‍යාංශ නිලධාරීන් පියවර ගත්තා. සීමිත මානව සම්පතක් උපයෝගී කරගෙන මේ 10,000 දෙනාගේ ලියකියවිලි සියල්ල ගෙන්වාගෙන මේ වෙනකොට ස්ථිර කිරීමේ කටයුත්ත සාර්ථකව අවසානයක් දක්වා ගෙනැවිත් තියෙනවා. අද (22) සිට මේ පත්වීම් ලිපි දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් බෙදා හැරීම සඳහා පියවර ගෙන තියෙනවා. මාසයක් වැනි කෙටි කාලයක් තුළ මෙතරම් විශාල පිරිසකගේ ස්ථිර කිරීම් කටයුත්තක් ලංකා ඉතිහාසයේ කවදාවත් සිදුව නෑ. ඒ සම්බන්ධයෙන් මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමන්ටත්, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයටත් අමාත්‍යවරයා ලෙස මාගේ ස්තූතිය පිරිනමන්නත් මෙය අවස්ථාවක් කරගන්නවා.

අපි රජයක් විදියට නිතරම උත්සාහ දරන්නේ මේ රටේ උගත් තරුණ ප්‍රජාව රටේ සංවර්ධනයේ සක්‍රිය කොටස්කරුවන් කරගන්නට. එහිදී කිසිඳු දේශපාලන මතවාදයක් සැලකිල්ලට නොගෙන උගත්කම පමණක් මූලික සුදුසුකම විදියට තබා ගෙනයි අපි කටයුතු කළේ. කොහොම වුණත් මේ තරම් දෙයක් කරද්දීත් තමන්ගෙන් ගිලිහෙන දේශපාලන බලය රැකගන්න බාල දේශපාලනයේ නිරත වන පිරිසක් මේ උපාධිධාරියාව තමන්ගෙ පටු අරමුණු වෙනුවෙන් භාවිත කරන්නට උත්සාහ කිරීම පිළිකුලෙන් හෙළා දකිනවා.” යැයිද අමාත්‍යවරයා පැවසීය.

මෙලෙස ස්ථිර පත්වීම් ලබන දස දහසක් ඉක්මවූ උපධිධාරීන්ගේ නාම ලේඛනය www.pubad.lk වෙබ් ලිපිනයෙන් දැනගැනීමට හැකියාව ලබා දී ඇති අතර එළඹෙන අප්‍රේල් පළමු වැනිදා සිට අදාළ සේවාස්ථානවලට අදාළ නිලධාරීන් වාර්තා කළ යුතු බව ද රාජ්‍ය සේවා අමාත්‍යාංශය දැනුම් දෙයි.

### මාධ්‍ය නිදහස යනු...

ඇතැම් මාධ්‍ය ආයතන හිමියන්ට රට පාලනය කිරීමට අවශ්‍යව ඇතත් එසේ කළ නොහැකි බව පෙන්වාදෙන ඒ මහතා තමා ජනාධිපතිවරයා ලෙස ජනමාධ්‍යයට කිසිදු බලපෑමක් කර නොමැති බවද විවිධ කණ්ඩායම්වල සහ පුද්ගලයන්ගේ අවශ්‍යතාව මත වැරදි මාධ්‍ය භාවිතයක නිරත වෙමින් රටත්, ජනතාවත් නැවත අගාධයට ඇද දැමීමට උත්සහ කළහොත් එවැනි පිරිස්වලට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට පැකිලෙන්නේ නොමැති බවද පෙන්වා දෙයි.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, යෝඹුවැල්තැන්න ප්‍රදේශයේ දී පෙරේදා (20) පැවති “ගම සමග පිළිසඳර” 15 වැනි වැඩසටහනට සහභාගී වෙමින් ජනාධිපතිවරයා මේ අදහස් පළ කළේය.

2020 සැප්තැම්බර් 25 වන දින බදුල්ල දිස්ත්‍රික්කයෙන් “ගම සමග පිළිසඳර” වැඩසටහන ආරම්භ විය. මාතලේ, රත්නපුරය, අනුරාධපුරය, අම්පාර, පොළොන්නරුව, කළුතර, මොනරාගල, කෑගල්ල, මහනුවර, පුත්තලම, ත්‍රිකුණාමලය, කුරුණෑගල සහ ගාල්ල දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පසුගිය වැඩසටහන් සංවිධාන කෙරිණ. මෙතෙක් නිසි අවධානයට ලක් නොවූ, නගරයෙන් බැහැර දුෂ්කර ගම්මානවල ජනතාව හමු වී, ඔවුන්ගේ ගැටලු විමසා ඒ මොහොතේම නිලධාරීන්ගේ අවධානයට යොමු කොට විසඳුම් දීම ජනාධිපතිවරයාගේ අරමුණයි.

එහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පෙන්වා දුන්නේ යුද සමයේ රටට එරෙහිව කටයුතු කළ මාධ්‍ය කණ්ඩායමක් මාධ්‍ය ආයතනවලට රිංගාගෙන දේශීයත්වයට සහ ජාතික වැඩපිළිවෙළට පහර ගසමින් සිටින බවයි.

මේ රටේ බහුතර ජනතාව එක්ව තමා ජනාධිපති ධූරයට පත් කරගත්තේ රට ගොඩනැගීමට බව සඳහන් කළ ගෝඨාභය රාජපක්ෂ මහතා මාස 60ක් වූ ධූර කාලයෙන් ගතව ඇත්තේ මාස 16ක් පමණක් බවද තව සැලකිය යුතු කාලයක් ඉදිරියට තිබෙන අතර ඊළඟ ජනාධිපතිවරයා පිළිබඳ ඇතැමුන් කලබල වී සිටින බව ද පෙන්වා දුන්නේය.

කිසිවකු ඒ සම්බන්ධයෙන් කලබල නොවිය යුතු අතර එය තීරණය කරන්නේ ජනතාව බවද ඉදිරි ධූර කාලය ජාතික ආර්ථිකය මෙන්ම ග්‍රාමීය ජනතාව නගාසිටුවීමට සුවිශාල වැඩකොටසක් ඉටු කරමින් ජනතා අපේක්ෂා මල්පල ගන්වන බවද ජනාධිපතිවරයා පැවසීය. නිලධාරීන්ගේ වගකීම ජනතාව ජීවත් කරවීමයි. කිසිවිටෙක ඔවුන්ට කරදර නොකළ යුතුයි. ජන ජීවිතය අඩාළ කෙරෙන කිසිදු අකටයුත්තක් තමා රාජ්‍ය නිලධාරීන්ගෙන් අපේක්ෂා නොකරන බව ද හෙතෙම සඳහන් කළේය.

ඇමැති සී.බී. රත්නායක, මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් යූ. ගමගේ, රාජ්‍ය ඇමැති ජීවන් තොණ්ඩමන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන එස්.බී. දිසානායක, නිමල් පියතිස්ස, රමේෂ්වර මරුදපාණ්ඩි, ජනාධිපති ප්‍රධාන උපදේශක ලලිත් වීරතුංග මහත්වරු සහ දිස්ත්‍රික්කයේ ජනතා නියෝජිතයෝ, අමාත්‍යාංශ ලේකම්වරුන්, රාජ්‍ය ආයතන හා ආරක්ෂක අංශ ප්‍රධානීන් ඇතුළු පිරිසක් යෝඹුවැල්තැන්න ග්‍රාමයේ පැවති “ගම සමග පිළිසඳර” වැඩසටහනට එක්ව සිටියහ.

### රාජිත සේනාරත්න...

එහෙත් කලින් යොදා ගත් දේශපාලන කයුතු කිහිපයක් හේතුවෙන් තමන්ට කැඳවූ දින දෙකේ දී පැමිණිය නොහැකි බවට ඔවුන් නීතිඥයකු මගින් ලිඛිතව පොලිසියට දැනුම් දී තිබූ අතර අද පැමිණ ප්‍රකාශයක් ලබාදීමට කටයුතු කරන බව ඔවුන් එම ලිපිය මගින් කොළඹ අපරාධ කොට්ඨාසයේ ස්ථානාධිපතිවරයාට දැනුම් දී තිබිණි.

එමෙන්ම මේ මාධ්‍යවේදියා තමාව කොළඹ මාලිගාවත්ත ප්‍රදේශයේ දමා ගිය බවට පැමිණිල්ලේ සඳහන් කර තිබුණද ඔහු දුම්රියෙන් පැමිණ දෙමටගොඩ දුම්රිය ස්ථානයෙන් බැස වතුර සේනාරත්න මහතාගේ තිඹිරිගස්යාය කාර්යාලයට ගොස් එහි පැය තුනහමාරක් පමණ රැඳී සිට සමගි ජන බලවේග පාර්ලිමේන්තු මන්ත්‍රී රාජිත සේනාරත්න මහතා හමු වී කොළඹ ජාතික රෝහලට ප්‍රතිකාර සඳහා ඇතුළත් වී ඇති බව විමර්ශන අනාවරණය කර ඇත.

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341
2021 මාර්තු 22 සඳුදා

# පස්සර අනතුර හා ඩ්‍රයිවර් ත්‍රස්තවාදය!

පස්සර බස් අනතුර සම්බන්ධයෙන් වැඩි දෙනකුගේ ඇඟිල්ල දිගු වන්නේ බස් රියැදුරා වෙතය. ඔහුගේ නොහික්මුණු හා අශීලාචාර රිය පැදවීම නිසා බස්රථය ප්‍රපාතයට වැටී පෙරළී ගිය බව අනතුරට මුහුණ දුන් මගීහු ද කියති. ඊටත් වඩා වැදගත් කරුණ වන්නේ අදාළ රියැදුරාගේ පෙර වැරැදි සම්බන්ධයෙන් චෝදනා ගණනාවක් එල්ල වී තිබීමය. අපරික්ෂාකාරී රිය පැදවීම සම්බන්ධයෙන් පැමිණිලි ගණනාවක් රියැදුරුට එරෙහිව ඉදිරිපත් වී ඇත. එහෙත් රියැදුරා පිළිබඳ සොයා බැලීමක් සිදු වී නැත. පෞද්ගලික බස් රථයේ හිමිකරු මෙන්ම බස් ධාවනය ගැන සොයා බලන ආයතන ද මේ වගකීමෙන් කොටසක් භාර ගත යුතුය. මගීන්ගේ වටිනා ජීවිත සමඟ සෙල්ලම් කිරීමට කිසිවකුට අයිතියක් නැත.

අනතුර සිදුවීමට දින කිහිපයකට පෙර මේ බස් රථයේ ගමන් ගත් කාන්තාවක අපරික්ෂාකාරී රිය පැදවීම ගැන රියැදුරාට චෝදනා කර ඇත. ඊට උත්තර ලබා දුන් කොන්දොස්තර කියා ඇත්තේ ටිකට් එකේ සල්ලි දෙන්නම් බැහැල යන්න යනුවෙනි. මගීන්ගේ අයිතිය - ගෞරවය ගැන කිසිඳු හැඟීමක් බස්කාරයන්ට නැත. රියැදුරන් මෙන්ම කොන්දොස්තරලා ද ක්‍රියා කරනුයේ මහ බලයක් ඇති පුද්ගලයන් ලෙසය. පාර ඔවුන්ගේය. බස් රථය ඔවුන්ගේය. මගීන් ද ඔවුන්ගේය. ඒ හැර රියැදුරා බසය පදවන්න දන්නේ නැත. කොන්දොස්තර මගීන්ට කතා කරන්න දන්නේ නැත. පෞද්ගලික බස් ධාවනය අත්‍යවශ්‍ය සේවාවක් වන්නේ වුව එය පවතින්නේ වගකීම් විරහිත ක්‍රියාවලියක් හැටියටය.

අනතුර සිදුවන ආකාරය කැමරාවල සටහන් වී ඇත. එහි වංගු දෙකක් තිබේ. පාරේ එක් පැත්තක මාර්ග අවහිරයක් ඇත. ඒ විශාල ගලක් පාරට පෙරළී තිබීමය. දිනපතා මේ පාරේ ගමන් කරන රියැදුරා ස්ථානය පිළිබඳ ඉතා හොඳින් දැන ගෙන සිටිය යුතුය. මෙබඳු ස්ථානයකදී වාහනයේ වේගය අඩු කොට ඉදිරියෙන් එන වාහන ගැන පරික්ෂාවෙන් රිය පැදවීම විනීත රියැදුරකුගේ ක්‍රමය වෙයි. එහෙත් බස් රථ රියැදුරු මෙහි එන වංගුවලදී රිය පදවන්නේ අධික වේගයකිනි. ඔහු ඉදිරියෙන් පැමිණි ටිපර් රථයට ඉඩ දෙන්නේ ද අපරික්ෂාකාරී ලෙසය. බස් එක කිසිඳු වේග පාලනයකින් තොරව ධාවනය වූ බව මගීහු කියා සිටිති. මේ රියැදුරාට ලයිසන් දුන්නේ කවුරුදැ'යි තවත් අය විමසා සිටිති.

මගී බස් රථයක රියැදුරු ආසනය භාරදිය යුත්තේ ජීවිතවල වටිනාකම දන්නා ශිෂ්ට සම්පන්න මිනිසකුටය. 1960 ගණන්වල ලංගම බස්රථවල රියැදුරු ආසනයට ඉහළින් වටිනා වාක්‍යයක් සටහන් කර තිබිණි. එනම්; "ජීවිත ගණනක් ඔබ දෑතේ" යන්නය. ලංගමය හොඳ රියැදුරන් බිහි කළේය. වරින් වර ඔවුනට පුහුණුව දුන්නේය. ඒ හැරෙන්නට රියැදුරන්ගේ සෞඛ්‍ය තත්ත්වය ගැන ද නිරීක්ෂණය කළේය. පෞද්ගලික බස් සේවාව තුළ මේ කිසිවක් නැත. රියැදුරු බලපත්‍රයක් නැති අය ද පෞද්ගලික බස් එළවති. ඔවුන් වාහන ගැන දන්නේ නැත. මාර්ග නීති ගැන දන්නේ නැත. මිනිස් ජීවිතවල වටිනාකම ගැන තේරුමක් ද ඔවුන්ට නැත. මෙබඳු පසුබිමක බස් රථ අනතුරු සිදුවීම පුදුමයක් ද නොවේ. බස් සංගම් ඇතත් ඒවා මේ පිළිබඳ සොයා බලන්නේ නැත.

ශ්‍රී ලංකාව හැඳින්වෙන්නේ රිය අනතුරු අධික රටක් හැටියටය. පොලිසිය කරුණු දක්වන අන්දමට රිය අනතුරු බහුලවීමට බලපාන හේතු - සාධක කිහිපයකි. අධික වේගය, මාර්ග සංඥා නොසැලකීම, අපරික්ෂාකාරී ඉස්සර කිරීම, මත්පැන් පානය කොට රිය පැදවීම ඒ අතර ප්‍රධාන වෙයි. දිනකට සිදුවන රිය අනතුරු ගණන විශාලය. මාරක රිය අනතුරු පමණක් හතක් - අටක් සිදු වන බව වාර්තා වෙයි. මේ අනතුරුවලින් මිය යන පිරිස දහයක් - දොළහක් වෙති. ඒ එක දිනකටය. ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදය පවතින කාලයේ යුද ගැටුම්වලින් මිය ගිය පිරිසට වැඩි පිරිසක් රිය අනතුරුවලින් මිය ගොස් තිබේ. එබැවින් එය මහ මග ත්‍රස්තවාදය ලෙස හැඳින්විණි.

පෞද්ගලික බස් රථ, ත්‍රිරෝද රථ හා යතුරු පැදි බහුල ලෙසින් අනතුරුවලට ලක් වෙයි. පෞද්ගලික බස් රථ පාරේ ධාවනය වන්නේ රේස් එකටය. ලංගම බස් රථයකට පාරේ ඉඩක් දෙන්නේම නැත. ත්‍රිරෝද රථ මාර්ග නීති සලකන්නේ නැත. යතුරු පැදි පාර පුරාම ගමන් කරයි. වමෙන් ඉස්සර කරයි. මාර්ග නීති හා දඩ මුදල් සංශෝධනයට ලක් වුව ද රිය අනතුරුවල අඩුවක් දකින්නට නැත. කොවිඩ් වසංගතයේ මුල් අවධියේ දී රිය අනතුරුවල අඩුවක් වාර්තා වී තිබුණ ද මේ වන විට දෛනික අනතුරු සංඛ්‍යාව ඉහළ ගොස් තිබේ. රිය අනතුරු සම්බන්ධයෙන් විද්වත් කතිකාවක් ඇතිකොට මීට පිළියම් යෙදීම වඩා වැදගත් වෙයි. රියැදුරන්ගේ තත්ත්වය පමණක් නොව; මාර්ගවල තත්ත්වය ද, වාහනවල තත්ත්වය ද නිරීක්ෂණයට ලක් කිරීම වැදගත්ය.

පස්සර අනතුරට බලපෑ තවත් හේතුවක් ලෙස වංගුවට ආසන්නයේ ඇති මාර්ග බාධකය පෙන්වා දිය හැකිය. පාරේ සැලකිය යුතු කොටසක් වසාගෙන ඇති ගල් ගෙඩිය පාරට වැටී මාස ගණනක් ගත වී ඇතත් එය ඉවත් කිරීමට පියවර ගෙන නැත. පාරේ අලුත්වැඩියාව කොන්ත්‍රාත් සමාගමකට භාර දී ඇතැ'යි මාර්ග සංවර්ධන අධිකාරිය කියයි. ගල ඉවත් කරන ලෙස දැනුම් දී ඇති බව ද අධිකාරිය කියයි. අදාළ කොන්ත්‍රාත් සමාගම එය ප්‍රමාද කළේ මන්දැ'යි පරීක්ෂණයක් කළ යුතුය. මාර්ගයක් හැමවිටම පැහැදිලි හා ස්ථාවර එකක් ලෙස පැවැතිය යුතුය. පාරවල් අබලන් වන විට ද රිය අනතුරු වැඩි වෙයි. මේවා පිළිබඳ සමාලෝචනයක් කිරීම අත්‍යවශ්‍ය කාරණයකි.

පස්සර අනතුරෙන් වටිනා ජීවිත දාහතරක් රටට අහිමි විය. බරපතළ තුවාල ලැබූ පිරිසක් ද සිටිති. ඔවුන්ගේ ජීවිත කුමන පැත්තකට හැරේදැ'යි කිව නොහැකිය. රිය අනතුරු වළක්වා ගැනීම සඳහා අලුත් වැඩසටහනක අවශ්‍යතාව පස්සර අනතුර අපට පෙන්වා දෙයි.

දිල්රුගෙ සීවිද

| | |
|---|---|
| රියැදුරකුගෙන් ගිලිහුණ හොත් | විමසිල්ල |
| අහිමිව යයි බොහෝ දෙනකුට | සැනසිල්ල |
| ජීවත් වන අයට නොතබා | ළතැවිල්ල |
| ඔක්කෝටම කලින් උගනිමු | ඉවසිල්ල |

# වනපෙත මැදින් ගැලූ සමාජ මාධ්‍ය භීතිකාව



ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
**සමන් රාජපක්ෂ**
ජනසන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

එක්තරා රූපවාහිනී නාලිකාවක වැඩසටහනකට සහභාගී වූ භාග්‍යා අබේරත්න නම් තරුණියක් 'සිංහරාජය කපනවා අපේ ඇස් පනාපිටම අපට බලන්න ඉන්න සිද්ධවෙලා තියෙනවා' යනුවෙන් සිංහරාජය පිළිබඳ දීර්ඝ විස්තරයක් කළාය. සිංහරාජය ආසන්නයේ මහා පරිමාණයෙන් වනාන්තර විනාශයක් සිදු වන බව ද ඈය පැවසුවාය.

භාග්‍යා අබේරත්න රූපවාහිනී වැඩසටහනක සිදු කළ මෙම ප්‍රකාශයෙන් පසුව මෙරට පරිසර විෂය ක්ෂේත්‍රයට සම්බන්ධ විවිධ රාජ්‍ය ආයතන නිලධාරීන් ඇය සොයා යන අතර ඇයගේ ප්‍රකාශයේ පදනම සම්බන්ධයෙන් විවිධ ප්‍රශ්න ඇයගෙන් විමසනු ලබයි. ඇයට වන විනාශය පිළිබඳ තොරතුරු ලැබුණ අයුරු ද විමසයි. පරිසර ආරක්ෂණ සංවිධාන භාග්‍යාගේ ප්‍රකාශය අගය කරයි. ආණ්ඩුව භාග්‍යාගේ හඬ යටපත් කිරීමට සැරසෙන බව ද ඇය මර්දනය කිරීමට කටයුතු කරමින් සිටින බව ද පරිසර සංවිධාන චෝදනා කරයි. මෙරට ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය මෙම සිද්ධි දාමය උණුසුම්ව වාර්තා කරයි. රාජ්‍ය නිලධාරීන් ඇය සමඟ සිදු කෙරෙන සාකච්ඡාව ඇතැම් සමාජ මාධ්‍ය ජාලවල සජීවී ලෙස ප්‍රචාරය කරයි. භාග්‍යා හැඟීම්බරව හඬමින් පිළිතුරු දෙන අයුරු දකින ඇතැම් පුද්ගලයන් ජනාධිපතිවරයා ද ආණ්ඩුව ද පතුරු ගසයි.

'කැලෑ කපන උන් හුරතල් කරන, සාමාන්‍ය තරුණියන් බය කරන, ආණ්ඩුවේ නිර්ලජ්ජිත ක්‍රියාවට එරෙහි ජනතා විරෝධය' යනුවෙන් ආණ්ඩුවට විරුද්ධව ෆේස් බුක් (face book) එකේ පෝස්ටර් පළ කරන ඔවුන් නිමේෂයකින් භාග්‍යා වීරවරියක් බවට පත් කරයි' මෙම සිද්ධියට අදාළව ෆේස් බුක් (face book) එකේ පළ කරන සෑම පෝස්ටරයක්ම ආණ්ඩු විරෝධී ජනමතයක් කරා මෙහෙයවීමට ඇතැම් පාර්ශ්ව සංවිධානාත්මක අයුරින් කටයුතු කරමින් සිටින බව පෙනේ. ඒ අනුව මෙම සිද්ධි දාමය මුල් කර ගනිමින් ජනමාධ්‍ය සහ සමාජ ජාලා ඔස්සේ ඇතැම් පුද්ගලයන් ආණ්ඩුවට එරෙහිව විරෝධය පළ කරමින් සිටියි. ඔවුහු ආණ්ඩුව දරුණු වන විනාශයක නියැළී ඇතැයි චෝදනා කරති. පරිසරය සුරැකීමේ සංවිධාන සහ ඒ පුද්ගලයින් මාධ්‍ය ඔස්සේ දිගින් දිගටම ආණ්ඩුවට ඇඟිල්ල දිගු කරන්නේ ආණ්ඩුව සාහසික ලෙස වන සංහාරයක නියැළී සිටින බවට චෝදනා කරමිනි.

මේ ඒ බව සනාථ කෙරෙන තවත් එවැනි පෝස්ටරයකි. 'කැලේ කපපු එකාට නැති දඬුවමක්කැලේ කපනවා කිව්ව කෙල්ලට දෙන්න කියන මොංගල් අපතයෝ ඉන්න රටකට මොන සෞභාග්‍යයේ දැක්මක් ද ඕයි !

## ප්‍රචාරණ ව්‍යාපාරය

මේ දිනවල ඇතැම් පුද්ගලයන් හා කණ්ඩායම් ආණ්ඩුවට එරෙහිව ගෙන යන ප්‍රචාරණ ව්‍යාපාරයේ ඉහළින්ම තිබෙන්නේ පරිසර සංහාර' චෝදනාවය. මෙරට පිහිටා ඇති රක්ෂිත වනාන්තරවල ස්ථාන දෙසිය හැත්තෑවක පරිසර විනාශය සිදුවන බව පෙරටුගාමී සමාජවාදී පක්ෂය චෝදනා කරයි. ඔවුන් පවසන්නේ සිංහරාජ වනාන්තර භූමිය ආශ්‍රිතව අනවසරයෙන් හෝටල් ඉදි කරන බවයි. මෙරට ක්‍රියාත්මක නොයෙක් පරිසර සංවිධාන සහ සාමාජ මාධ්‍ය ආණ්ඩුවේ අනුග්‍රහයෙන් වන විනාශයන් සිදුවන්නේ යැයි කියන ස්ථාන පිළිබඳ ලැයිස්තුවක් ඉදිරිපත් කරයි.

01. රඹකැන් ඔය රක්ෂිතය
02. කතරගම තම්මැන්නාව
03. කන්තලේ අයි. අවඩි රක්ෂිතය
04. දහයියා ගල රක්ෂිතය
05. ත්‍රිකෝණමඩු රක්ෂිතය
06. ලාහුගල රක්ෂිතය
07. ගාල්ල රුමස්සල ප්‍රදේශය
08. කතරගම පුදබිම ආශ්‍රිතව කුඹුක් ගස් කැපීම

ඉහතින් දක්වන ලද පරිසර පද්ධති ආශ්‍රිතව විශාල වන සංහාරයක් සිදු වන බව ද ආණ්ඩුවේ ඇතැම් අයගේ මැදිහත්වීමෙන් මේවා සිදු වන බව ද සමාජ මාධ්‍ය වාර්තා කරයි. සමාජ මාධ්‍යවල පළ වන ඇතැම් පෝස්ටර්, ප්‍රකාශන, ඡායාරූප දකින විට වත්මන් ආණ්ඩුව තමන් සිදු කරන සියලු කාර්යයන් පසෙකට දමා 'කැලෑ කැපීම පමණක්ම සිදු කරමින් සිටින්නේ යැයි සාමාන්‍ය ජනයාට හැඟී යාමට පිළිවන. ආණ්ඩුවට එරෙහි 'පරිසර සංහාර' චෝදනාව ඒ තරමට ඉතා සංවිධාත්මකව ද සැලසුම් සහගතව ද සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචලිත කරමින් සිටියි. මෙම පෝසටර්, ඡායාරූප සමාජ මාධ්‍ය ඔස්සේ දකින කොයි කවුරුන් හටත් හැඟෙන්නේ රටේ සියලු වනාන්තර තව ටික දිනකින් විනාශ වී නොබෝ දිනකින් රටම කාන්තාරයක් බවට පත් වනු ඇත යන්නය.



## ආණ්ඩුවේ වගකීම

එහෙත් මෙම 'පරිසර සංහාර' චෝදනාව පිළිබඳ සොයා බලා ඒ හා සම්බන්ධ සත්‍ය තොරතුරු රටේ ජනතාවට වාර්තා කිරීම ආණ්ඩුවේ වගකීමය. ආණ්ඩුව මුලින්ම කළ යුතු වන්නේ භාග්‍යාගේ අනාවරණය පිළිබඳව විධිමත්ව සොයා බැලීමය. ඇය අපහසුතාවයට පත් කිරීමට කටයුතු නොකිරීම ආණ්ඩුවේ වගකීමකි. ඇය පවසන කරුණු සත්‍ය නම් වහාම එකී වන විනාශය වැළැක්වීමට ආණ්ඩුව කටයුතු කළ යුතුය. මෙපරිද්දෙන් පරිසර නීතිවලට පිටින් යමින් යම් තැනැත්තෙක් පරිසරය විනාශ කරන්නේ නම් ඒවා වැළැක්වීම ආණ්ඩුවේ වගකීමය. පරිසර නීති උල්ලංඝනය කරමින් වනාන්තර විනාශ කරන කැලෑ පාළු' ව්‍යාපාරිකයන්, රාජ්‍ය නිලධාරීන් හා දේශපාලනඥයින් නීතිය හමුවට පැමිණ වීම ආණ්ඩුවට අයත් කාර්යයකි. එහෙත් භාග්‍යා සහ පරිසර සංවිධාන අතේ පැළවෙන බොරු කියන්නේ නම් ආණ්ඩුව ඒ සඳහා ද මැදිහත් විය යුතුය. ඒ ජනතාවට සත්‍ය දැන ගැනීමට ඇති අයිතිය වෙනුවෙනි. ස්විට්සර්ලන්ත තානාපති කර්යාලයේ නිලධාරිනියක පැහැර ගෙන ඒ චෝදනාව රජයට එල්ල කිරීමට ඇතැම්හු උත්සාහ ගත්හ. පසුව එම සිදුවීම ගොතන ලද නාටකයක් බව අනාවරණය විය. නාඳුනන කණ්ඩායමක් මාධ්‍යවේදියෙක් පැහැර ගත් බවට ද පසුගිය දා පුවතක් පළ විය. එය ද ආණ්ඩුවට එරෙහි කුමන්ත්‍රණයක් බව අනාවරණය වී ඇත. විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හා ඔහුගේ පුතණුවන් මේ පසුපස සිටින බව පොලීසිය සොයාගෙන ඇත. එවක ආරක්ෂක ලේකම්වරයා සුදුවෑන්වලින් මිනිසුන් පැහැර ගෙන ගොස් කිඹුලන්ට කෑමට දමන බව ද පවසමින් පසුගිය කාලයේ මාධ්‍ය සාකච්ඡාවක් පවා පැවැත්විණි. එය ද අමූලික බොරුවක් බව අනාවරණය වී ඇත. ඇතැම් විට 'ආණ්ඩුවේ වන විනාශ' චෝදනාව ද ඉහත සැලසුම්වලම කොටසක් වීමට ද පිළිවන. ආණ්ඩුව මේ පිළිබඳව ඉක්මනින් සෙවිය යුත්තේ එබැවිනි.

රජයට අයත් වන රක්ෂිත භූමි අභය භූමි ආශ්‍රිතව මහාපරිමාණයෙන් කැලෑ කැපීමට අපේ ගමේ සිරිපාල මාමා යන්නේ නැත. රන්බණ්ඩා මාමා යන්නේ ද නැත. හේරත් අය්යා යන්නේ ද නැත. ගමේ පන්සලේ හාමුදුරුවෝ හෝ විදුහල්පතිවරයා යන්නේ ද නැත. උන්දැලා වනාන්තරයට දෙවියන්ට මෙන් පුද සත්කාර කරයි. දෙවියන්ට මෙන් ගෞරව කරති. වනාන්තරය මෙන්ම සතා සිව්පාවුන් ද දිවිහිමියෙන් ආරක්ෂා කරයි. ආදී අපේ සිංහරාජේ කොහොඹා දෙවියන්ගේය."

මෙරට ජීවත් වුණ ගැමියන් ගැන හිතුවේ එහෙමය.

## පරිසරයේ ආරක්ෂකයෝ

සැමදා වනාන්තරයට විනකටින්නේ බලපුළුවන්කාරයෝය. අපේ රටේ කැලය රැක ගත යුත්තේ බලවතුන්ගෙන්ය. සාමාන්‍ය ගැමියන් කිසිදා මහා පරිමාණයෙන් වන සංහාරයකට නොගියේය. ඒ තවමත් මෙරට ගැමියෝ අසීමිතව පරිසරයට ආදරය කරන හෙයිනි. ඔවුහු සැමදා පරිසරයේ ආරක්ෂකයෝ වූහ.

එක්තරා ලෙසකින් මෙරට සාමාන්‍ය ගැමියා වන සංහාරයට යොමු නොවුණේ ඔවුන් රටේ නීතියට අවනත බැවිනි; නීතියට බය පක්ෂපාතීත්වය දක්වන බැවිනි. නීතියට ගරු කරන බැවිනි.

එහෙත් යහමින් සල්ලිය බාගේ ඇති මිල මුදල්වලට උරුමකම් කියන ධනවත්හු දේශපාලන බලය ද යොදා ගනිමින් කැලෑ කපති. ව්‍යාපාර ස්ථාන ඉදි කරති. හෝටල් හදති. බොහෝ විට මේ වන සංහාරයන් පසුපස දේශපාලනඥයන් සිටිය හැකිය. මේ සියල්ලෝ රටේ නීතියට අවනත නොවී නීතියේ සිදුරු අතරින් යමින් නීතිය මුදලට ගනිමින් නීතිය තමාට අවශ්‍ය පරිදි 'නමමින්' සිය ව්‍යාපාරික අරමුණු ඉටු කර ගනිති.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා හෝ අගමැති මහින්ද රාජපක්ෂ මහතා කැලෑ කපන්නට නොයන බව අපි දනිමු. ආරක්ෂක ඇමතිවරයා හෝ ආරක්ෂක ලේකම්වරයා කැලෑ කපන්නට යන්නේ ද නැති බව අපි දනිමු. ආණ්ඩුවේ වගකිව යුතු ඇමතිවරු මේ පරිසර විනාශයන් සඳහා දායක නොවන්නේ යැයි අප උපකල්පනය කරමු. විශ්වාස ද කරමු. එහෙත් ඇතැම්විට ආණ්ඩුවේ මැතිඇමතිවරුන්ට සම්බන්ධ ගෝලබාලයන් හා හිතවතුන් පරිසර නීතියට පිටින් යමින් සිය ව්‍යාපාරික අරමුණු ඉටු කර ගන්නට යනවා විය හැකිය. කිහිප දෙනකුගේ වුවමනාව මත සිදුවන මෙවැනි ක්‍රියා හේතුවෙන් දේශපාලනික වශයෙන් වන්දි ගෙවීමට සිදු වන්නේ ජනාධිපතිවරයා ප්‍රමුඛ අණ්ඩුවටය. විනාශයට ලක් වන්නේ වනාන්තරය; සතාසිව්පාවුන්ය. අවසානයේ සියල්ලටම වන්දි ගෙවීමට සිදු වන්නේ රටේ ජනතාවටය. එහෙයින් මෙම වන සංහාර චෝදනා පිළිබඳ පුළුල් ලෙස සොයා බලා ක්ෂණිකව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ආණ්ඩුවේ වගකීමකි. යම් හෙයකින් ආණ්ඩුවට එරෙහිව නගන 'වන සංහාර' චෝදනාව අසත්‍ය වුවක් නම් එය ජනතාව 'ගොනාට ඇන්දවීමකි' සත්‍ය විකෘති කර ජනතාව නොමග යැවීමකි. එහෙයින් ආණ්ඩුව වහාම මෙම ගැටලු නිරාකරණය කළ යුතුය.

මෙවැනි සිදුවීම් නිර්මාණය කර දේශපාලන වාසි ලබා ගැනීමට මාන බලන අය කොතෙකුත් සිටිති. නමුත් ජනතා ඡන්දයෙන් ප්‍රජාතන්ත්‍රවාදීව පත් වූ ආණ්ඩුවක් ව්‍යාජ තොරතුරු පතුරුවමින් ජනතාව නොමග යවමින් ආණ්ඩුව බලයෙන් පහ කිරීමට උත්සාහ ගැනීම වූ කලී කුමන්ත්‍රණයකි. බොරුවෙන් ජනතාව මුළා කිරීම අනුමත කළ නොහැකිය. ප්‍රජාතන්ත්‍රවාදීව පත් වූ ආණ්ඩුවක් බලයෙන් පහ කළ යුත්තේ ද ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදයන්ගෙන් මිස කුමන්ත්‍රණවලින් නොවේ.

මේ වන විට ආණ්ඩුවට එරෙහිව පැනනැඟී ඇති 'වන සංහාර චෝදනාව' ආණ්ඩු විරෝධී ආණ්ඩු පෙරළීමේ ව්‍යාපාරයක් දක්වා වර්ධනය වෙමින් පවතියි. මේ එවැන්නක් සඳහා ඉඟියකි. මේ ආණ්ඩුවට එරෙහිව සමාජ මාධ්‍යවල පළ වූ පෝස්ටර් කිහිපයකි.

"රටේ සිදුවන මහා පරිමාණ වන සංහාරය නොඉවසමු. සාමූහිකව එරෙහි වෙමු. පක්ෂ භේදයෙන් තොරව විරෝධය දක්වමු."

"රටේ දරුවකුට තමන්ට දැනෙන දෙයක් කියන්නටවත් අයිතියක් නිදහසක් නැති කරන වත්මන් ආණ්ඩුවේ සුපුරුදු මර්දන ක්‍රියාවල් දැඩි පිළිකුලෙන් හෙළ දකිමු. "පරිසරය විනාශයට විරුද්ධව අඳින චිත්‍රවලටත් ගෝඨා බයයි. ජනාධිපතිතුමෝ ලැජ්ජයි නේද?"

බළලා මල්ලෙන් එළියට පනින්නේ දැන්ය. පරිසර විනාශයට එරෙහි වීම සෑම පුරවැසියෙකුගේම වගකීමකි. යුතුකමකි. නමුත් එය දඩමීමා කරගනිමින් ජනාධිපතිවරයාට හෝ අගමැතිවරයාට අශ්ලීල ලෙස බැන වැදීම, අභූත චෝදනා නැඟීම, ද්වේෂ සහගත ප්‍රකාශ නිකුත් කිරීම අනුමත කළ නොහැකිය. අප මඩ ගැසීමේ දේශපාලනය හෙළා දැකිය යුතුය.

" රටේ තැන තැන සිදු වන වනාන්තර හෙළිපෙහෙළි කිරීම් සම්බන්ධයෙන් ඕනෑම අයකුට දේශපාලන විවේචනයක් තිබිය හැකිය. එහෙත් රාජ්‍ය පාලකයාට මඩගැසීම හෝ ඔහුට අපහාස කිරීම නොදියුණු අයගේ ලක්ෂණයකි. කිසිදු පාලකයෙක් මඩවලින් නැහැවිය යුතු නැත. එහෙත් තර්කානුකූල වූ දේශපාලන විවේචන ගෙන ආ හැකි යගපාලකයින්ට බොරු චෝදනා නගමින්, අසත්‍ය පතුරුවමින් ජනතාව නොමග යැවීම අනුමත කළ නොහැකිය.

එහෙයින් ආණ්ඩුව මේ පිළිබඳ වහ වහා ක්‍රියාත්මක විය යුතුය. වන සංහාර චෝදනාවන්ගේ සත්‍යය, අසත්‍යය හැකි ඉක්මනින් රටේ ජනතාව අභිමුවේ තැබිය යුතුය. යම් අයෙක් රටේ නීතිය උල්ලංඝනය කරමින් පරිසරය විනාශ කිරීමට යොමු වී ඇත්නම් ඔවුන් නීතිය හමුවට පමුණු වන ලෙස ඉල්ලමු. එසේම ජනතාව නොමඟ යවන ලෙස යමෙක් වැරදි ප්‍රචාර නිකුත් කර ඇත්නම්, මඩ ගසන්නේ නම් එවැනි අයට ද නීතියෙන් දඬුවම් හිමිවිය යුතුය. එහෙයින් ආණ්ඩුව කඩාකප්පල්කාරී පිරිස් ජනතාව නොමග යවන තෙක් නොඉඳ වහා මෙම සිදුවීම්වල සත්‍ය අසත්‍ය බව අනාවරණය කළ යුතුව ඇත. ආණ්ඩුව කඩාකප්පල්කාරීන්ට හැට නව ලක්ෂයේ ජනතා ජයග්‍රහණ උදුරා ගැනීමට ඉඩ නොතැබිය යුතු බව අප අවධාරණය කරමු.



# අපේ ස්වාධීනත්වයට ඇඟිලි ගැසීමට කිසිවකුට අයිතියක් නැහැ



## කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ මණ්ඩපාධිපති මහාචාර්ය ප්‍රතිභා මහානාමහේවා

අද (මාර්තු 22) දින පැවැත්වෙන ජිනීවා මානව හිමිකම් කවුන්සිලයේ ඡන්දයේදී ඇති වන තත්ත්වය රටට බලපාන ආකාරය, මේ යෝජනා මඟින් රටට සිදු වන බලපෑම සහ ඒ තත්ත්වය පරාජය කිරීම සඳහා ගත යුතු පියවර පිළිබඳ කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ මණ්ඩපාධිපති මහාචාර්ය ප්‍රතිභා මහානාමහේවා මහතා සමඟ සිදු කළ සංවාදයකි මේ.

**● ජිනීවා මානව හිමිකම් මහ කොමසාරිස්වරිය විසින් ශ්‍රී ලංකාවට එරෙහි ඉදිරිපත් කර තිබුණු යෝජනාවලිය සංශෝධනය වී තිබෙන නිසා එයින් මෙරටට සිදුවන බලපෑම සීමා වෙන බවට ඇතැමුන් මත පළ කරනවා.?**

ලංකාවට එරෙහි ජිනීවා මානව හිමිකම් මහ කොමසාරිස්වරියගේ වාර්තාවේ සංශෝධනය වී ඇත්තේ වචන කිහිපයක් පමණයි. වගවීමේ ක්‍රියාවලියේදී දේශීය යාන්ත්‍රණයට වඩා අන්තර්ජාතික යාන්ත්‍රණයක සහය ගැනීම සඳහා ශ්‍රී ලංකාවට බලකෙරෙමින් තිබෙනවා. මෙය කිසිසේත්ම හොඳ දෙයක් නොවෙයි. අපේ ස්වාධීනත්වයට ඇඟිලි ගැසීමට ඔවුනට කිසිම අයිතියක් නැහැ.

**● අද වන විට ක්‍රියාත්මක වෙමින් තිබෙන්නේ එවැනි තත්ත්වයක්. ඔබ සඳහන් කරන්නේ මේ ක්‍රියා පසුපස දෙමළ ඩයස්පෝරාවේ කණ්ඩායම් සිටින බව ද.?**

ඩයස්පෝරාව වෙනත් කණ්ඩායම්වලට මුවා වෙලා ඒ කණ්ඩායම් හරහා ශ්‍රී ලංකාවට එරෙහි යෝජනාවක් මානව හිමිකම් කොමිසමට භාර දීමට උත්සාහ කළත් එයට නිසි සාර්ථකත්වයක් ලැබුණේ නැහැ. නමුත් ඩයස්පෝරාව උත්සාහය අත්හැර නැති බවයි පෙනෙන්නේ.

**● මෙරටට යුද අපරාධ සිදු කළ බවට චෝදනා එල්ල කිරීමට මානව හිමිකම් කොමිසම සහ ඩයස්පෝරාව විශාල උත්සාහයක නියැලෙනවා මේ ගැන ඔබේ අදහස පැහැදිලි කළ හැකි ද.?**

මෙහිදී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පීඩාකාරී කියා කියනවා. ඒත් ත්‍රස්තවාදයට මුදල් එකතු කිරීම් ගැන කතාවක් නැහැ. යුද හමුදාව යුද අපරාධ කළා කියලා චෝදනා කරනවා. ඒත් ළමා සොල්දාදුවන් පුහුණු කිරීමට පහසුකම් සැලසූ කාන්තා බළකායට නායකත්වය දුන් ඇඩෙලා බාලසිංහම් බ්‍රිතාන්‍යයේ ජීවත් වෙනවා. මේවා වැරැදි නොවෙයි ද? මේවාට වගකිව යුත්තේ කවුද, ඒ වැරැදිවලට වගකියන්න ඕනෑ කවුද ඒ ගැන කවුරුවත් ප්‍රශ්න කරන්නේ නැහැ. බ්‍රිතාන්‍යයට වුණත් ඒවා පෙනෙන්නේ නැහැ. ඒ නිසා තමයි චීනය, රුසියාව වගේ රටවල් ලංකාවත් එක්ක ඉන්නේ. ශ්‍රී ලංකා රජයට ඇඩෙලා බාලසිංහම්ට විරුද්ධව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ කටයුතු කරන්න පුළුවන්. මතක තියාගන්න ඕනෑ ප්‍රභාකරන් නැති වුණත් ඔහුගේ සංකල්පය තවම තිබෙනවා. කැනඩාව, ප්‍රංශය වගේ රටවල සිට ශ්‍රී ලංකාවේ හමුදා නායකයින්ට එරෙහිව පෙත්සම් ගහන්නේ අඩුම තරමේ ලංකාවේ ඉපදිලාවත් නැති අය.

**● මෙම වාතාවරණය තුළ අපේ තානාපති අංශවලට ලොකු වගකීමක් පැවරිලා තිබෙනවා ඒත් ඔවුන් ඒ වගකීම් නිසි විදිහට ඉටු කරනවා කියලා ඔබ විශ්වාස කරනවා ද.?**

ඔව්, ඔබ නිවැරැදියි. අපේ තානාපතිවරුන්ට විශාල හඬක් නැඟිය හැකියි. මානව හිමිකම් කොමිසමේ තව සැසි වාර තිබෙන හෙයින් එහිදී රට වෙනුවෙන් ඔවුන්ට විශාල හඬක් නැඟිය හැකියි. අපට විරුද්ධව වැඩ කරන අය කතා කරන අය ඉතාමත් ක්‍රියාකාරියි. ඒ අය ඉතාමත් වේගයෙන් තම ප්‍රචාරක යාන්ත්‍රණය ක්‍රියාත්මක කරනවා. මේ හැම දෙයක් ගැනම අපේ තානාපති අංශ අවධානය යොමු කර නවීකරණය විය යුතුයි. ක්‍රියාකාරී විය යුතුයි. එහෙම වුණොත් තමයි අපේ තානාපති අංශවලට මේ අර්බුදය සාර්ථකව ජය ගැනීමට හැකියාව ලැබෙන්නේ.

**● අප රටට මෙතරම් තදින් විදෙස් බලපෑම් ඇති වීමට හේතුව ලෙස ඔබ දකින්නේ කුමන තත්ත්වයක් ද ?**

බටහිරට පිලට අවශ්‍ය වෙලා තියෙනවා අප රට ඔවුනට අවශ්‍ය ආකාරයට නැඹුරු කර ගැනීමට ඒ සඳහා එල්ල කරන බලපෑමක් විදිහට තමයි අපට විවිධ මානව හිමිකම් චෝදනා එල්ල කරමින් පීඩාවට පත් කරන්නේ. ඒත් ඒ තත්ත්වයට මුහුණ දීමට අපට පුළුවන්. අපට සහාය දෙන රටවල් සැලකිය යුතු ප්‍රමාණයක් තියෙනවා. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය තුළ පවා අපට සෘජුව සහාය ලබා දෙන චීනය, රුසියාව වැනි රටවල් සිටිනවා.

**හැම දෙයක් ගැනම අපේ තානාපති අංශ අවධානය යොමු කළ යුතුයි**

**රුසියාව වගේ රටවල් ලංකාවත් එක්කයි ඉන්නේ**



**● ඔබ සඳහන් කරනවා ජිනීවා මානව හිමිකම් කොමිසම තුළ යෝජනා සම්මත වුණත් ඒවා ක්‍රියාත්මක කරන්නට බලතල නොමැති බව . මානව හිමිකම් කවුන්සිලය වැනි ආයතනයක් ගැන ඔබ මෙතරම් සැහැල්ලු ස්ථාවරයක් දරන්නේ ඇයි.?**

යෝජනා සම්මත කරන්න පුළුවන්, නිර්දේශ ලබා දෙන්න පුළුවන්. ඒත් ඒවා බලහත්කාරයෙන් ක්‍රියාත්මක කරවන්න ඒ අයට බලයක් නැහැ. ඒකට අන්තර්ජාතිකව උදාහරණ රැසක් තියෙනවා. එක් උදාහරණයක් සඳහන් කරන්නම්. මේ මානව හිමිකම් කොමිසම කියුබාවට විරුද්ධව නිර්දේශ හතළිස් එකක් ඉදිරිපත් කර තිබෙනවා. ඒත් ඒ කිසිම එකක් ක්‍රියාත්මක වී නැහැ. ඊශ්‍රායලයට විරුද්ධවත් එවැනි නිර්දේශ ඉදිරිපත් කර තිබෙනවා. ඒත් ඒ නිර්දේශ ක්‍රියාත්මක වීමක් වෙලා නැහැ. ජිනීවා කොමිසමට බලයක් නැති බව මා සඳහන් කළේ ඒකයි.

**● ජිනීවා යෝජනා වැනි කරුණු හරහා රටට විරුද්ධව අභ්‍යන්තර දේශපාලන ක්‍රියාකාරීත්වයක් සිදුවන බවට මතයක් පළ වෙනවා. ඒ ගැන ඔබේ අදහස පැහැදිලි කළ හැකි ද.?**

සම්බන්දන්, විග්නේෂ්වරන්, සුමන්තිරන් තුන් කට්ටුව තමයි මෙම ක්‍රියාවලිය පිටුපස සිටින්නේ. ඔවුන් සඳහන් කරන විදිහේ පීඩාවක් හෝ නොතකා හැරීමකට දෙමළ ජනතාව පත් වෙලා නැහැ. ඒත් මේ දෙමළ නායකයන් අන්තර්ජාතිකව වෙනම චිත්‍රයක් නිර්මාණය කරන්න උත්සාහ කරනවා. ඒත් මෙරට සාමාන්‍ය දෙමළ ජනතාවට පමණක් සීමා වූ ප්‍රශ්න නැහැ. දෙමළ ජනතාව සෙසු කණ්ඩායම් සමඟ එක්ව කටයුතු කරනවා. ඒ තත්ත්වය අප ලෝකය ඉදිරියේ පෙන්වා දෙන්න ඕනෑ. එතැනදී අපට සන්නිවේදන දුර්වලතාවක් තියෙනවා අපි එහෙම නොවෙයි කියල පෙන්වා දීමට. ඒ නිසා අප රජයක් විදිහට ජාතික මානව හිමිකම් කවුන්සිලයක් පිහිටුවිය යුතුයි. ජාතික වශයෙන් මානව හිමිකම් වැඩපිළිවෙළ ඉස්සරහට අරන් යන්න ඕනෑ. එහෙම වුණොත් අපට අනාගතයේදී අප රටට එරෙහිව ක්‍රියාත්මක වෙන බොරු චෝදනාවලට නිසි පිළිතුරු ලබා දීමට පුළුවන්කම ලැබේවි.

**● මෙහිදී ඇතැම් පිරිස් නඟන චෝදනාවක් වන්නේ මානව හිමිකම් චෝදනා පසුපස වෙනම දේශපාලන න්‍යාය පත්‍රයක් ක්‍රියාත්මක වන බවයි. මේ චෝදනාවට පදනමක් තිබෙනවා ද?**

තමන්ගේ න්‍යාය පත්‍රයට පිටින් රටක් වැඩ කරනවා නම් ඒ රටේ පාලනය වෙනස් කිරීමට සැලැසුම් කිරීම ඇතැම් රටවල සැලැසුමක්. සමහර විට අපව රටක් විදිහට පීඩනයට ලක් කරනවා වගේම ඒ පීඩාවේ දිගුවක් ලෙස ජනතාව වෙත පීඩනයක් ඇති වෙන්න ඉඩ තිබෙනවා. එහි අවසාන ප්‍රතිඵලය ආණ්ඩු මාරුවක් ඇති කිරීමට අවශ්‍ය තත්ත්වයක් බවට පත්වෙන්න පුළුවන්. සමහර විට මේ කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙළට රට ඇතුළතින් සහාය ලබා දෙන කණ්ඩායම් සිටින්න පුළුවන්.

පසුගිය ආණ්ඩු කාලයේ දී බලවත් රටවලට අවශ්‍ය විදිහට වැඩ කිරීම නිසා ඔවුනට ලොකු පීඩනයක් බලවතුන්ගෙන් එල්ල වුණේ නැහැ. ඒ වගේම ඒ කාලයේදී අහිතකර යෝජනා කිහිපයකටත් ඔවුන් එකඟ වුණා. මේ හැම දෙයක්ම රටේ ඉදිරි ගමන් මගට ලොකු බාධාවක් වුණා. යළිත් ඒ අයට අවශ්‍ය වෙලා තියෙනවා ඔවුනට අවශ්‍ය කරන විදිහට වැඩ කරන පිරිසක් බලයට පත් කර ගැනීමට. ඒ ගැන අවධානයෙන් වැඩ කළ යුතුයි. මා සියලු පාර්ශ්ව වෙත යෝජනා කරන්නේ රට මූලිකත්වයේ තියල වැඩ කරන්න. අභ්‍යන්තර දේශපාලන භේදවලට වඩා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව රට ගැන සිතා වැඩ කිරීම වැදගත්.

**උදිත ගුණවර්ධන**

**ඡායාරූප**
**ලේක් හවුස් මාධ්‍ය පුස්තකාලය**

**ප්‍රභාකරන් නැති වුණත් ඔහුගේ සංකල්පය තවම තිබෙනවා**

**පක්ෂ විපක්ෂ භේදයකින් තොරව රට ගැන සිතා වැඩ කිරීම වැදගත්**




අද (මාර්තු 22) ලෝක ජල දිනයයි

# ජලය පණ මෙන් සුරකිමු

පෘථිවියෙන් වැඩි ප්‍රමාණයක් පිරී තිබෙන්නේ ජලයෙනි. ඒ නිසාම ජලය ඉතා දුලබ දෙයක් බව පැවසීම ඇතැම්විට විහිළුවක් ලෙස පෙනෙනු ඇත. පෘථිවි පෘෂ්ඨයෙන් 71%කට වැඩි ප්‍රමාණයක් වසා ගෙන පවතින ජලය ප්‍රතිශතයක් ලෙස ගත් විට එයින් මිනිසාට ප්‍රයෝජනයට ගන්නට හැකි ප්‍රමාණය සියයට දශම ගණනක් තරම් පහළ අගයක් ගන්නා බව බොහෝ දෙනෙක් නොදන්නා කරුණකි.

සාගර සහ මුහුදු තුළ 97%කට වැඩි ප්‍රමාණයක් කරදිය ලෙස තැන්පත් වී ඇති ජලය ග්ලැසියර හා අයිස් වැස්මක් ලෙස සියයට 2.58 ක් පමණ ප්‍රමාණයක් ඝන අවස්ථාවේ පවතී. ගංගා විල් පොකුණු ආදියෙහි ඇත්තේ 0.6% ක් තරම් ඉතා කුඩා ජල ප්‍රතිශතයකි. මිනිසාට ප්‍රයෝජනයට ගන්නට හැකියාව තිබෙන්නේ ඒ අඩු ප්‍රතිශතයක් සහිත ජල ප්‍රමාණයයි.

ඝන ද්‍රව වායු ලෙස ආකාර තුනකින් සමන්විත ජලය විවිධ ආකාරවලින් මිනිස් පරිභෝජනය සඳහා යොදා ගනී.

ආහාර නොමැතිව වැඩි කාලයක් ගත කරන්නට හැකි නමුත් ජලය නොමැතිව අපට ගත කරන්නට හැකි කාලය ඉතා සීමිතය. ශරීරය විජලනය වීම තුළින් මරණය පවා කැඳවීමට හැකි බැවින් ජලය පානය කිරීම ශරීරයේ ඇඩි අවශ්‍යතාවයකි.

ශරීරයේ ජල ප්‍රමාණය අඩු වීමෙන් සිරුර විවිධාකාර රෝගාබාධයන්ට ද ගොදුරු වන අතර, මිනිස් දේහයෙහි 55% සිට 78% දක්වා ප්‍රමාණයක් සමන්විත වී තිබෙන්නේ ද ජලයෙනි. දිනකට ලීටර එකේ සිට හතක් දක්වා ප්‍රමාණයක් ජලය පානය කිරීම මිනිස් සිරුරකට අත්‍යවශ්‍ය වන අතර මෙයින් සිරුරේ නිවැරදි දේහ ක්‍රියාකාරිත්වය පවත්වා ගන්නට හැකියාව ලැබේ.

කෘෂිකර්මාන්තය ඇතුළු සියලු කාර්මික කටයුතු සඳහා ද ජලය අනිවාර්යයෙන්ම අත්‍යවශ්‍ය අංගයක් වන අතර විවිධාකාර විනෝදාත්මක කටයුතු සඳහා ද මිනිසා ජලය යොදා ගනී. පෘථිවියේ කාන්තාර ආශ්‍රිත ප්‍රදේශවල ජලය ඉතාම අවම මට්ටමක පවතින අතර එබඳු පෙදෙස්වල වාසය කරන පුද්ගලයන්ගේ ජල අවශ්‍යතා පිරිමසා ගැනීම ඉතාම අසීරුය. වනගහනය සහ ශාකවල පැවැත්ම මත භූගත ජලය සහ වර්ෂාව පිළිබඳ තීරණය වන බැවින් ජල සම්පත සුරකින්නට නම් වනාන්තර ආරක්ෂා කිරීම ද අනිවාර්යයෙන් කළ යුතුය.

මිරිදිය කරදිය සහ කිවුල් දිය ලෙස ජලය වර්ග කරන්නට හැකි අතර, කරදියෙහි ජීවත් වන ජලජ ජීවීන් මිනිසාගේ ආහාර අවශ්‍යතා සපුරයි. මිනිස් පරිභෝජනයට වැඩි වශයෙන් අවශ්‍ය වන්නේ මිරිදිය වන අතර කිවුල්දිය පරිභෝජනය එතරම් පහසු නැත.

වනාන්තර ආශ්‍රිත තෙත් කලාපවල ජල සම්පත ඉතා පිරිසිදුව සහ වැඩි ප්‍රමාණයකින් යුතු වන අතර නාගරික පරිසරයේ දී ජල ප්‍රභවයන් ආරක්ෂා කිරීම ඉතාම අසීරු වී ඇත. මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් දූෂණය වන සහ ක්‍රමයෙන් අවම වී යන ජල සම්පත දිනෙක ජීවය මිහිමතින් තුරන් කර දමන්නට හැකිතරම් අර්බුදකාරී තත්වයකට පත් වෙමින් තිබේ.

මිනිසා බැහැර කරන පොලිතින්, ප්ලාස්ටික් ආදී සියලු අපද්‍රව්‍ය ජල මාර්ගවලට මුදා හැරීම තුළින් සහ කර්මාන්තශාලාවලින් පිට කරන අප ජලය කෘෂි රසායනික ද්‍රව්‍ය ආදිය නිසා ජල සම්පත සම්පූර්ණයෙන්ම විනාශ වී යන අතර සුරක්ෂිත ලෙස ජලය භාවිතා කිරීමට හුරු නොවීම හේතුවෙන් ද අපතේ යෑමෙන් ජල සම්පත ක්‍රමයෙන් ක්ෂය වෙමින් පවතී.

ආහාර නිෂ්පාදනයේ මූලිකම අවශ්‍යතාවයක් වන ජලය අවම වීම හේතුවෙන් නිෂ්පාදනය වන ආහාර ප්‍රමාණය ප්‍රතිශතයෙන් අඩු වීම හේතු හේතුකොටගෙන මිනිසාට පරිභෝජනය සඳහා ආහාර අවම වීමට ද ඉඩ තිබේ.

සොබාදහම විසින් ලබාදෙන විශිෂ්ටතම දායාදය ලෙස ජලය හඳුන්වන්නට හැකි අතර ශරීරයේ ජල අවශ්‍යතාවය පිරිමැසීමට පමණක් නොව තවත් බොහෝ කටයුතු සඳහා මිනිසාට ජලය නොමැතිවම බැරි සාධකයකි. ජලය අපිරිසුදු වීම හේතුවෙන් මිනිසුන්ට විවිධාකාර රෝගාබාධවලට මුහුණ දෙන්නට සිදුවන බැවින් අපි නිරන්තරවම පානය කිරීම සඳහා පිරිසුදු ජලය සපයා ගත යුතුය. පිරිසුදු ජලය සපයා ගැනීමට වඩා ජලය අපවිත්‍ර වීමට ඇති මාර්ග අවහිර කර දමන්නට හැකි නම් එය වඩාත් සුදුසුය.

ජල සම්පත සුළුකොට තැකීම මිනිසා විසින්ම මිනිසාගේ විනාශය දිනෙන් දින ආසන්න කරගන්නා කාර්යයක් වන අතර සොබාදහමේ චක්‍රයක් ලෙස ක්‍රියාත්මක වන වර්ෂාව ලැබීම සහ ඒ තුළින් ජලය සුරක්ෂිත වීම යන ක්‍රියාවලිය සාර්ථකව සිදු වීමට අවශ්‍ය කරන පසුබිම පරිසරය තුළ සකස් කළ යුතුය.

ශරීරයේ පරිවෘත්තීය ක්‍රියාවලිය සාර්ථකව සිදු කරන්නට සිරුර තුළ ප්‍රවාහකයකු ලෙස ක්‍රියා කරන ජලය සිරුරේ සියලු පටලවල තෙතමනය මනාව පවත්වාගෙන යන්නට උපකාරී වේ.

ජලය කොතරම් වැදගත් සාධකයක් දැයි පැවසීමට මෙයටත් වඩා වැඩි අටුවා ටීකා අවශ්‍ය නොවෙන නිසා තවත් වසර ගණනාවකට පසු මිහි මතින් සම්පූර්ණයෙන්ම වඳ වී යනවාද ලෝකය කාන්තාරයක් බවට පත් කරනවා ද එසේත් නැත්නම් තව කාලයක් ඉදිරියට ජීවය පවතින්නට ලෝකය ආරක්ෂා කර තබනවා ද යන්න වර්තමානයෙහි මිහිමත ජීවත් වන සෑම පුද්ගලයකුම සිතා බැලිය යුතුය.

අද අප විසින් විනාශ කර දමන්නේ හෙටට ඉතිරි කර යා යුතු ලෝකයයි. එය අනාගත පරපුර අප වෙත ශාප කරන්නට තරම් බරපතළ නොවිය යුතුය.

හැකි සෑම මොහොතකම සොබාදහම අපට ලබාදුන් අනගි දායාදය වන ජල සම්පත සුරක්ෂිත කරන්නට අපි තරයේ සිතට ගනිමු.

**දිල්රූ ජයසේකර**




LAKE HOUSE
දැයේ දූ පුතුනට පත්තර මහගෙදරින්
අධ්‍යාපනික
ප්‍රකාශන රැසක්
1 ශ්‍රේණිය දරුවන් සඳහා මුතු අහුර
2 ශ්‍රේණිය දරුවන් සඳහා මුතු අහුර
3 ශ්‍රේණිය දරුවන් සඳහා මුතු අහුර
4 ශ්‍රේණිය දරුවන් සඳහා මුතු අහුර
5 ශ්‍රේණිය දරුවන් සඳහා මුතු අහුර
Grade 1 Muthu Ahura English
Grade 2 Muthu Ahura English
Grade 3 Muthu Ahura English
Grade 4 Muthu Ahura English
Grade 5 Muthu Ahura English
6 ශ්‍රේණිය
6 සිත්මිණ
7 ශ්‍රේණිය
7 සිත්මිණ
8 ශ්‍රේණිය
8 සිත්මිණ
9 ශ්‍රේණිය
9 සිත්මිණ
10 ශ්‍රේණිය
10 සිත්මිණ
11 ශ්‍රේණිය
11 සා/පෙළ සිත්මිණ
මිහිර
බුදුසරණ
දහම් පාසල
குட்டி சுட்டி
අතුරු මිතුරු
Athuru Mithuru
විදුනැණ
විශේෂිත වර්ණවත් මුද්‍රණය
පාසල් විෂය නිර්දේශය මුළුමනින්ම ආවරණය කෙරෙන
ප්‍රවීණ ලේඛක මණ්ඩලයකින් සම්පාදිතය
රජයේ මාධ්‍ය ආයතනයකින් නිකුත් කරන එකම අධ්‍යාපනික ප්‍රකාශන

# බුද්ධ චරිතය-ත්‍රිපිටකය-සිද්ධස්ථාන ගැන දුර්මත පතුරවන්නන් සොයන්න කමිටුවක්

## ත්‍රිපිටක සංරක්ෂණ පනත කඩිනමින් කෙටුම්පත් කරන්න

## මහා සංඝරත්නය ජනපතිට කියති

**මහින්ද අලුත්ගෙදර**





බුද්ධ චරිතයට, ත්‍රිපිටකයට සහ බෞද්ධ සිද්ධස්ථානවලට වැරදි අර්ථකථන දෙමින් දුර්මත පතුරවන අය සම්බන්ධයෙන් සොයා බලා ගත යුතු පියවර රජයට නිර්දේශ කිරීම සඳහා කමිටුවක් පත් කෙරේ.

ඒ අනුව පුරාවිද්‍යා චක්‍රවර්තී එල්ලාවල මේධානන්ද, විද්‍යෝදය පරිවේණාධිපති බළංගොඩ සෝභිත, අස්ගිරි පාර්ශ්වයේ නියෝජ්‍ය ලේඛකාධිකාරි නාරම්පනාවේ ආනන්ද, සියම් මහා නිකායේ අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ මහා ලේඛකාධිකාරී මැදගම ධම්මානන්ද, රාමඤ්ඤ මහා නිකායේ නියෝජ්‍ය ලේඛකාධිකාරී නැදගමුවේ විජයමෛත්‍රී, රජරට විශ්වවිද්‍යාලයේ කුලපති මිරිසවැටිය විහාරාධිකාරී ඊතලවැටුණු වැවේ ඤාණතිලක, මහාචාර්ය මැදගොඩ අභයතිස්ස, මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන, ආචාර්ය කිරින්දේ අස්සජි යන ස්වාමීන් වහන්සේලා එහි සාමාජිකයෝ වෙති.

බෞද්ධ උපදේශක සභාව පසුගිය (19) දා පස්වරුවේ 9 වැනි වතාවට ජනාධිපති කාර්යාලයේ දී රැස් වූ අවස්ථාවේ ත්‍රෛනිකායික මහා නායක ස්වාමීන්වහන්සේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත කළ ලිඛිත ඉල්ලීමට ප්‍රතිචාර ලෙස කමිටුව කඩිනමින් ස්ථාපනයට තීරණය කෙරිණි.

"ශ්‍රී ලංකාව ථෙරවාදී බෞද්ධ මූලස්ථානයයි. බෞද්ධ ප්‍රතිරූපකයන් සහ වංචනික භික්ෂු ප්‍රතිරූපකයන් බෞද්ධ මූලික ඉගැන්වීම් විකෘති කිරීමේ උත්සාහයක නිරතව සිටිති. පිරිසුදු ථෙරවාදී බුදුදහම විනාශ කර දැමීමේ සැලසුම්සහගත කුමන්ත්‍රණය වැළැක්වීමට රජය කඩිනමින් මැදිහත් විය යුතුය. දුර්මතධාරීන් ශාස්ත්‍රීයව පරාජය කිරීමට වැඩපිළිවෙළක් අවශ්‍ය බව මහා සංඝරත්නය අවධාරණය කළහ.

සම්බුද්ධ ශාසනය සහ ත්‍රිපිටකය රැක ගැනීමේ මෙහෙවරේ නිරත භික්ෂූන් වහන්සේට මෙම දුර්මතධාරීහු සංවිධානාත්මකව නින්දා අපහාස එල්ල කරමින් සිටිති. ඒ පිළිබඳ කනගාටුව පළ කළ මහා සංඝරත්නය සමාජ මාධ්‍ය ජාල හරහා ගෙනයන මේ වැඩපිළිවෙළ කෙරෙහි ද කඩිනම් අවධානය යොමු කිරීමේ වැදගත්කම පෙන්වා දුන්හ.

ඇදහිලි හා රෝග ප්‍රතිකාර මධ්‍යස්ථාන ලෙස පවත්වාගෙන යන ස්ථාන නියාමනය කිරීමේ අවශ්‍යතාව පිළිබඳ ද සාකච්ඡා කෙරිණි. ත්‍රිපිටකය රැක ගනිමින් සංරක්ෂණය කිරීම යනු අපගේ බෞද්ධ උරුමයත්, සංස්කෘතියත් ආරක්ෂා කිරීමයි. ත්‍රිපිටකය ලෝක උරුමයක් බවට පත් කිරීමෙන් පමණක් එය සුරක්ෂිත නොවන බව පෙන්වා දුන් මහා සංඝරත්නය, ත්‍රිපිටක සංරක්ෂණ පනත කඩිනමින් කෙටුම්පත් කිරීමේ අවශ්‍යතාව අවධාරණය කළහ.

2600 වන සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් යෝජනා කෙරුණු බෞද්ධ ග්‍රන්ථ නියාමන පනත සවිබල ගැන්වීම පිළිබඳ ද දීර්ඝ ලෙස සාකච්ඡා කෙරුණු අතර, කෙටුම්පත මහා නායක ස්වාමීන් වහන්සේට ඉදිරිපත් කර මසක් තුළ සංශෝධන සහ යෝජනා ලබා ගැනීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට තීරණය විය. පුරාවස්තු රැකගනිමින් ජාතික උරුමය තහවුරු කිරීමට පුරාවිද්‍යා ආඥා පනත සංශෝධනයට කටයුතු කෙරුණු අතර, එහි ප්‍රගතිය ද සමාලෝචනය කෙරිණි.

අපේ රටේ බොහෝ පුරාවිද්‍යා ස්මාරක යනු බෞද්ධ උරුමයක් වන අතර, පුරාවිද්‍යාත්මකව කාසියක් හෝ පෞරාණික භාණ්ඩයක් දෙස හෝ බලන අයුරින් පමණක් ඒ දෙස බැලීම සුදුසු නොවන බව පෙන්වා දුන් මහා සංඝරත්නය තීරණ ගැනීමේ දී අදාළ නිකාය මූලස්ථානවල අදහස් හා යෝජනා අනුව කටයුතු කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කළහ. ආරණ්‍ය සේනාසන පවත්වාගෙන යෑමේ දී භික්ෂූන් වහන්සේට රාජ්‍ය නිලධාරීන්ගෙන් එල්ල වී ඇති ගැහැට පිළිබඳ ද ජනාධිපතිවරයාගේ අවධානයට යොමු කළ මහා සංඝරත්නය උන්වහන්සේට නිදහස්ව ආරණ්‍ය සේනාසනවලට වැඩවිසීමට අවශ්‍ය පරිසරය සකසා දෙන ලෙස ඉල්ලා සිටියහ. පරිසරය සහ සතා සීපාවා රැකගැනීමට අතීතයේ පටන් මහා සංඝරත්නය සුවිශාල කැප වීමක් කළහ. භික්ෂූන් වහන්සේගෙන් කිසිදා පරිසරයට හානියක් නොවන අතර, කිසිවකුට පරිසරයට හානි කිරීමට උන් වහන්සේලාගෙන් ඉඩක් නොලැබෙන බවද අවධාරණය කෙරිණි.

තවමත් රටේ ජනගහණයෙන් සියයට 75ක් පමණ වන ග්‍රාමීය ජනතාව දිගුකලක සිට විවිධ වූ ආර්ථික, සමාජ ගැටලු සමුදායකින් පීඩා විඳිති. ඔවුන්ගේ ගැටලු සොයා බැලීමට ගමින් ගමට යමින් ජනාධිපතිවරයා දෙන ආදර්ශය අගය කළ උන් වහන්සේ ඊට ද එරෙහිව ඇතැම් පිරිස් ගෙන යන සාවද්‍ය ප්‍රචාර නිසා ගමටයාම නතර නොකරන්නැයි ඉල්ලා සිටියහ. වත්මන් රජය බලයට පත්කිරීමට අති බහුතර ජනතාවක් කැප වීමෙන් ක්‍රියා කළහ. ජනතාව අනුමත කළ එම ප්‍රතිපත්ති මාලාව සැමදා ආරක්ෂා කළ යුතුය. අවශ්‍ය වන්නේ තමා ආරක්ෂා කිරීම නොව ජනතාව අනුමත කළ ප්‍රතිපත්තිය ආරක්ෂා කිරීම බව ජනාධිපතිවරයා මෙහිදී අවධාරණය කළේය. රජයට එරෙහි විවිධ මඩ ප්‍රහාර දියත් වී ඇත්තේ මේ ප්‍රතිපත්ති මාලාවට එරෙහිව බව පැවසූ ජනාධිපතිවරයා ඒ සඳහා ඇතැම් පිරිස් විශාල මුදලක් වැය කරමින් සිටින බවත්, මේ කුමන්ත්‍රණ කඩිනමින් ජනතාවට හෙළි කළ යුතු බවත් කියා සිටියේය.

බෞද්ධ උපදේශක සභාවේ සාමාජික මහා සංඝරත්නය, විදුර වික්‍රමනායක, විජිත බේරුගොඩ රාජ්‍ය අමාත්‍යවරු සහ ජනාධිපති ප්‍රධාන උපදේශක ලලිත් වීරතුංග මහතා ඇතුළු නිලධාරීහු පිරිසක් බෞද්ධ උපදේශක සභා රැස්වීමට එක්ව සිටියහ.

# පරිසරය සුරකින්න කිසිවක් නොකළ අය මට ඇඟිල්ල දිගු කිරීම කනගාටුවක්

## පරිසරය වෙනුවෙන් මා තරම් කවුරුත් වැඩක් කළේ නැහැ

## රට වෙනුවෙන් කැප වීම පසෙක තබා ඊළඟ ජනාධිපතිවරයා ගැන ඇතැමුන් කලබල වෙලා

## ජනපති කියයි

**මහින්ද අලුත්ගෙදර**





පරිසරය රැක ගැනීම වෙනුවෙන් කිසිවක් නොකළ අය තමාට ඇඟිල්ල දිගු කිරීම කනගාටුවට කරුණක් බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ප්‍රකාශ කළේය.

තමා කිසිවිටෙකත් පරිසරය විනාශ කර නොමැති බව කී ඒ මහතා, නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස සිටින අවදියේ පටන් පරිසර සංරක්ෂණය වෙනුවෙන් ගෙනගියේ කිසිවකු නොකළ වැඩකොටසක් බවත්, නිදහස් චතුරශ්‍රයේ පවා එදා කුණු ගොඩවල් පිරී තිබුණු නමුත් ඒ තත්ත්වය නැතිකොට කොළඹ නගරය හරිත උයනක් බවට පත් කළ බවත් සිහිපත් කළේය.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, යෝබුවැල්තැන්න ප්‍රදේශයේ දී පෙරේදා (20) පැවති 'ගම සමඟ පිළිසඳර' 15 වැනි වැඩසටහනට සහභාගී වෙමින් ජනාධිපතිවරයා මේ අදහස් පළ කළේය.

මේ රටේ බහුතර ජනතාව එක්ව තමා ජනාධිපති ධුරයට පත් කරගත්තේ රට ගොඩනැඟීමට බව සඳහන් කළ ගෝඨාභය රාජපක්ෂ මහතා, මාස 60ක් වූ ධුර කාලයෙන් ගතව ඇත්තේ මාස 16ක් පමණක් බවත් තව සැලකිය යුතු කාලයක් ඉදිරියට තිබෙන බවත් ඊළඟ ජනාධිපතිවරයා පිළිබඳ ඇතැම්මු කලබල වී සිටින බවත් කීවේය.

කිසිවකු ඒ සම්බනධයෙන් කලබල නොවිය යුතු බවත්, එය තීරණය කරන්නේ ජනතාව බවත්, ඉදිරි ධුර කාලය ජාතික ආර්ථිකය මෙන්ම ග්‍රාමීය ජනතාව නඟාසිටුවීමට සුවිශාල වැඩකොටසක් ඉටු කරමින් ජනතා අපේක්ෂා මල්ඵල ගන්වන බවත් ජනාධිපතිවරයා පැවසීය.

නිලධාරීන්ගේ වගකීම ජනතාව ජීවත් කරවීමයි. කිසිවිටෙක ඔවුන්ට කරදර නොකළ යුතුයි. ජන ජීවිතය අඩාල කෙරෙන කිසිදු අකටයුත්තක් තමා රාජ්‍ය නිලධාරීන්ගේ අපේක්ෂා නොකරන බවද හෙතෙම සඳහන් කළේය.

මා කිසිවිටෙකත් පරිසරය විනාශ කර නැහැ. නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස සිටින අවදියේ පටන් පරිසර සංරක්ෂණය වෙනුවෙන් ගෙනගියේ කිසිවකු නොකළ වැඩකොටසක්. නිදහස් චතුරශ්‍රයේ පවා එදා කුණු ගොඩවල් පිරී තිබුණා. ඒ තත්ත්වය නැතිකොට කොළඹ නගරය හරිත උයනක් බවට පත් කළා. පරිසරය වෙනුවෙන් කිසිවක් නොකළ අය මට ඇඟිල්ල දිගු කිරීම කනගාටුවට කරුණක්" ජනාධිපතිවරයා කීය.

පසුගිය රජයේ සිටි ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයෙක් හන්තානේ අක්කර 30ක ඉඩමක් තම දියණියට තෑගි දී තිබෙන බවත්, පරිසරය ආරක්ෂා කළා නම් අද ඔවුන්ට මාධ්‍ය ඉදිරියට පැමිණ හඬා වැටීමට සිදුනොවන බවත් ජනාධිපතිවරයා පෙන්වා දුන්නේය.

2015-2019 කාලය තුළ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කැලෑ අක්කර 77, පුත්තලම අක්කර 258, මොණරාගල අක්කර 100ක්, අනුරාධපුරයේ අක්කර 224ක් ඇතුළුව මයිලෑව, මාතලේ, ලග්ගල, රිදීගම, වැලිකන්න ඇතුළු දිස්ත්‍රික්ක ගණනාවක වන විනාශය සිදු කර තිබෙනවා. එවැනි පිරිස් අද රජයට ඇඟිල්ල දිගු කිරීම හාස්‍යයට කරුණක් බවද ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පැවසීය.

දිළිඳුකම තුරන් කර ග්‍රාමීය ජනතාව ආර්ථික වශයෙන් නඟාසිටුවීම රජයේ ප්‍රමුඛ ප්‍රතිපත්තියකි. සියයට 75ක් වන ග්‍රාමීය ජනතාවගෙන් සියයට 35ක් සෘජුවම කෘෂිකර්මාන්තයේ නියැළෙති. කෘෂිකර්මාන්තයේ උන්නතිය වෙනුවෙන් අවශ්‍ය සියලු වැඩපිළිවෙළ ක්‍රියාවට නංවමින් ග්‍රාමීය ජනතාව දිළිඳුබවින් මුදා ගැනීමේ වගකීම ඉටුකරන බවද රාජපක්ෂ මහතා පැවසීය. සමාජයේ පහළම ආදායම් ස්ථරයට අයත් පවුල්වලින් තෝරාගත් ලක්ෂයකට රැකියා දීමේ වැඩසටහන ආරම්භ කෙරුණු අතර, ඉන් රැකියා 35,000ක් දැනටමත් ප්‍රදානය කර තිබේ. රැකියා ලක්ෂයේ ප්‍රථම වැඩසටහන අවසන් වූ පසු තවත් ලක්ෂයකට රැකියා දෙන බව ජනාධිපතිවරයා සඳහන් කළේය.

ඒ සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ දී නිවැරදිම පුද්ගලයන් හඳුනා ගැනීම ග්‍රාමීය රාජ්‍ය නිලධාරින්ගේ මෙන්ම මහජන නියෝජිතයන්ගේ වගකීම බව පෙන්වා දුන් ඒ මහතා පුහුණු ශ්‍රමිකයන් නැතිවීම රටේ සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රමාදයට ඉවහල් වී තිබෙන බව කීය.

2020 සැප්තැම්බර් 25 වන දින බදුල්ල දිස්ත්‍රික්කයෙන් 'ගම සමඟ පිළිසඳර' වැඩසටහන ආරම්භ විය. මාතලේ, රත්නපුරය, අනුරාධපුරය, අම්පාර, පොළොන්නරුව, කළුතර, මොණරාගල, කෑගල්ල, මහනුවර, පුත්තලම, ත්‍රිකුණාමලය, කුරුණෑගල සහ ගාල්ල දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පසුගිය වැඩසටහන් සංවිධාන කෙරිණ. මෙතෙක් නිසි අවධානයට ලක්නොවූ නගරයෙන් බැහැර දුෂ්කර ගම්මානවල ජනතාව හමු වී, ඔවුන්ගේ ගැටලු විමසා ඒ මොහොතේම නිලධාරීන්ගේ අවධානයට යොමු කර විසඳුම් දීම ජනාධිපතිවරයාගේ අරමුණයි.

විසඳීමට කල්ගතවන ගැටලු පසුව ආමන්ත්‍රණය කරනු පිණිස සටහන් කරගනු ලබන අතර, ගමේ ජනතාව අතරට පැමිණ ඔවුන්ගේ ප්‍රශ්න විමසා ඔවුන්ගේම යෝජනා තුළින් පිළියම් සෙවීම 'ගම සමඟ පිළිසඳර' වැඩසටහනේ අපේක්ෂාවයි.

යෝබුවැල්තැන්න ග්‍රාම නිලධාරී වසම වලපනේ නගරයේ සිට කි.මී 13ක් දුරින් පිහිටා තිබේ. එය වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් අතරින් වඩාත්ම දුෂ්කර ගම්මානය වේ. ඌව වෙල්ලස්ස සටනට දායකත්වය දුන් ජනතාවක් ජීවත් වූ පෞරාණික ප්‍රදේශයක් වන යෝබුවැල්තැන්න කැප්පෙටිපොළ නිලමේතුමා යළි සිංහල හමුදාව සමඟ එක් වූ ප්‍රදේශය බව ජනප්‍රවාදයේ සඳහන්ය. ඖෂධීය ශාඛයක් වන යෝබුවැල් බහුල නිසා ගමෙහි නම නිර්මාණය වූ බව කියැ වේ. පවුල් 139ක් වෙසෙන යෝබුවැල්තැන්න ග්‍රාමයේ දැන් ජනගහණය 397කි. වී සහ එළවළු වගාව ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය වේ.

'ගම සමඟ පිළිසඳර' වැඩසටහනට සහභාගීවීමට නිල්දණ්ඩාහින්න මහජන ක්‍රීඩාංගණයේ සිට යෝබුවැල්තැන්නට යන මඟ දෙපස රැස්ව සිටි ජනයා ජනාධිපතිවරයා මහත් හරසින් පිළිගනු ලැබූ අතර, ජනතාවගේ ගැටලු පිළිබඳ එහිදී ජනාධිපතිවරයා කරුණු විමසීය.

කලගන්වත්ත නවෝදයා පාසලේ දරුවන් සමඟ ඡායාරූපයකට ද පෙනී සිටියේය.

දේශීයව සොසේජස් නිෂ්පාදනය කිරීමක් ජනාධිපතිවරයාට හඳුන්වා දුන් ප්‍රදේශවාසියකු තමා එම අදහස ලබාගත්තේ වියත්මඟ සමුළුවකදී බව පවසමින් එහිදී ගත් ඡායාරූපයක් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට පෙන්වීය.

දීර්ඝ කාලයක් තිස්සේ වන සතුන්ගෙන් තම බෝගවලට සිදුවන හානියට පිළියමක් දෙන ලෙස ද මඟ දෙපස රැස්ව සිටි ජනතාව ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටියහ.

SLT මොබිටෙල් ආයතනය විද්‍යාපදීප ද්විතීයික පාසලට හා සිදුහත් මහා විද්‍යාලයට පරිත්‍යාග කළ අන්තර්ජාල සබඳතා සහිත ලැප්ටොප් පරිගණක හා ඩයලොග් ආයතනය තැන්නබෝධි ප්‍රාථමික විද්‍යාලයට පිරිනැමූ රූපවාහිනී යන්ත්‍රය විදුහල්පතිවරුන්ට භාරදීම ජනාධිපතිවරයා අතින් සිදුකෙරිණ. 'ගම සමඟ පිළිසඳර' වැඩසටහන පැවැත්වෙන සෑම ප්‍රදේශයකම පාසල්වල පුස්තකාල පහසුකම් ප්‍රවර්ධනය ගෝඨාභය රාජපක්ෂ මහතාගේ තවත් අරමුණකි. 'නැණ බල සහිත ළමා පරපුරක්' තේමාකර ගනිමින් ඒ සඳහා වූ පොත් කට්ටල ජනාධිපතිවරයා අතින් පාසල් වෙත පිරිනැමිණි. එක් පාසලකට ලැබෙන විවිධ විෂයයනට අයත් පොත් සංඛ්‍යාව 500කි.

හිමිකමක් නැතිව මෙතෙක් රජයේ ඉඩම් භුක්ති විඳිමින් සිටි පවුල් වෙත දීමනා පත්‍ර ප්‍රදානය පසුගියදා ආරම්භ කෙරිණි. ජනාධිපතිවරයා වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පවුල් 5ක් වෙත සංකේතාත්මකව දීමනා පත්‍ර ප්‍රදානය කළේය. ප්‍රදේශයේ ජනතාව මුහුණ දෙන ප්‍රධානම ගැටලුව මාර්ග, අතුරුමාර්ගවල ඇති දුෂ්කරතාවයි. ඒ පිළිබඳ දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරිණි. ගල්වත්ත - යෝබුවැල්තැන්න මාර්ගය, තේරිපැහැ - මොලන්දෑව, ගලහ - දෙල්තොට සිට රිකිල්ලගස්කඩ මාර්ගය, යටිවැල්ල - මතුරට මාර්ගය, තෙරිපැහැ, නිල්දණ්ඩාහින්න ප්‍රධාන සහ අතුරු මාර්ග රැසක සංවර්ධන වැඩ කඩිනම් කරන ලෙස ජනාධිපතිවරයා උපදෙස් දුන්නේය.

ප්‍රදේශයේ ප්‍රධාන හා අතුරු මාර්ගවල පාලම් 15ක් ඉදිකිරීමට ද තීරණය විය. යෝබුවැල්තැන්න, ලවැල්ලගොල්ල, මකුණගහපිටිය, හපුගහපිටිය, කලගන්වත්ත ඇතුළු ප්‍රදේශයේ සියලුම ප්‍රජා ජල ව්‍යාපෘති ජනතා අවශ්‍යතාව අනුව සම්පූර්ණ කිරීමට ද තීරණය විය. වලපනේ ජල පිරිපහදුව වැඩිදියුණු කිරීමට තීරණය කෙරිණි. දඩකැලේ, වැලිතුඩුව, පරගහලන්ද, කිරිවඩුන්න, මූකලන්, උඩකන්ද, ඇතුළු ප්‍රදේශයේ තවත් වැව් රැසක ප්‍රතිසංස්කරණ කඩිනම් කරන්නැයි ද දැනුම් දුන්නේය.

ප්‍රදේශයේ විදුහල්වල ගුරු හිඟය සම්පූර්ණ කිරීමටත්, කලගන්වත්ත නවෝදයා ද්විතීක පාසල, අරුණෝදය හින්දු විදුහල, රන්තෙළඹුව මහා විදුහල, උඩමාදුර ශ්‍රී විද්‍යා ප්‍රදීප ද්විතික විද්‍යාලය ඇතුළු ප්‍රදේශයේ පාසල් රැසක යටිතල පහසුකම් සංවර්ධනයට ද තීරණය කෙරිණි. මඩුල්ල ද්විතික පාසල ජාතික පාසලක් බවට උසස් කිරීමට තීරණය විය. ග්‍රාමීය ක්‍රීඩාපිටි සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එකක් බැගින් ක්‍රීඩාපිටි සංවර්ධනයට ද උපදෙස් දෙනු ලැබිණි. විහාරස්ථානවල පවත්වාගෙන යන දහම්පාසල් 12ක යටිතල පහසුකම් සංවර්ධනයට ද මූල්‍ය ප්‍රතිපාදන වෙන් කෙරිණි. මධ්‍යම පළාතේ පිරිවෙන්වල භෞතික අවශ්‍යතා සම්පූර්ණ කරදෙන ලෙස භික්ෂූන් වහන්සේ කළ ඉල්ලීමට ජනාධිපතිවරයා එකඟතාව පළ කළේය.

ග්‍රාම නිලධාරී වසම් 13ක පවතින ඉඩම් ගැටලු "ගම සමඟ පිළිසඳර" වැඩසටනේ දී හඳුනා ගැනිණි. එම සියලු ගැටලු නිරාකරණය කොට ඔප්පු ප්‍රදානයට වහාම පියවර ගන්නයි ජනාධිපතිතුමා උපදෙස් දුන්නේය. වන අලි ගැටලුට විසඳුම් ලෙස ප්‍රදේශයේ ඉදිකර ඇති සියලු අලි වැට ප්‍රතිසංස්කරණ කිරීමට ද තීරණය කෙරිණි. දිස්ත්‍රික්ක්යේ ඇති ෆයිනස්, ටර්පන්ටයින් පරිසරයට හානියක් බව ජනතාව පෙන්වා දුන්නේය. එම වගා ඉවත් කොට දේශීය වන වගා ප්‍රචලිත කරන ලෙස ජනාධිපතිවරයා පරිසර බලධාරීන්ට උපදෙස් දුන්නේය.

ලෝකයේ රසවත් කෝපි අතරින් හතරවන ස්ථානය කොප්‍රියා ඇරබිකා ලක්පැරකුම් ප්‍රභේදය බව නිලධාරීහු පෙන්වා දුන්හ. ඒ සඳහා සුදුසුම පාරිසරික හා දේශගුණික විභවතාව නුවරඑළිය දිස්ත්‍රික්කය සතුය. එම කෝපි වගාව දිස්ත්‍රික්කය පුරා ප්‍රවර්ධනය කිරීමට වැඩි අවධානයක් යොමු කරන ලෙස ද ජනාධිපතිවරයා උපදෙස් දුන්නේය.

වලපනේ, බගවන්තලාව, නිල්දණ්ඩාහින්න, මතුරට, තෙරිපැහැ ප්‍රාදේශීය සහ ග්‍රාමීය රෝහල්වල යටිතල පහසුකම් සංවර්ධනයට කිරීමට ද තීරණය විය. දිස්ත්‍රික්කයේ වෛද්‍ය, හෙද සහ සුළු සේවක හිඟය පියවීමට පියවර ගෙන්නා ලෙස ද බලධාරීන්ට උපදෙස් දෙනු ලැබිණි. රිකිල්ලගස්කඩ, වලපනේ රෝහල්වල භික්ෂු වාට්ටු දෙකක් ස්ථාපනය කිරීමට ද තීරණය විය. ප්‍රදේශයේ සියලු වතු රෝහල්වල අඩු පාඩු සොයා බලා සම්පූර්ණ කරන්නයි ද ජනාධිපතිවරයා උපදෙස් දුන්නේය.

ප්‍රදේශයේ ආරක්ෂාව සහ හදිසි ආපදා තත්වයන්ට මුහුණදීමට හමුදා කඳවුරක් වලපනේ ප්‍රදේශයේ පිහිටුවට තීරණය කෙරිණ. වලපනේ ප්‍රදේශයේ පොහොර මධ්‍යස්ථානයක අවශ්‍යතාව ජනතාව පෙන්වා දුන්හ. දිස්ත්‍රික්කයේ පැවති භෝග එකතු කිරීමේ මධ්‍යස්ථාන පසුගිය රජය නොසළකා හැර තිබීම ජනතාවගේ විවේචනයට ලක් විය. භෝග එකතු කිරීමේ මධ්‍යස්ථාන දිස්ත්‍රික්කයේ සුදුසු තැන්වල ස්ථාපනය කරන ලෙස ජනාධිපතිවරයා බලාධාරීන්ට දැන්වීය. ගොවිතැන් කළ නොහැකි පුරන් කුඹුරුවල කරුදු සහ කෝමාරිකා වගාවන් ප්‍රචලිත කිරීමට ද යෝජනා කෙරිණ. දීර්ඝ කාලයක සිට ජනතා ඉල්ලීමක් වූ වලපනේ හා පුඩලුඔය නගර පූර්ණ සංවර්ධනයට ද තීරණ විය.

ඇමැති සී.බී. රත්නායක, මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් යූ.ගමගේ, රාජ්‍ය ඇමැති ජීවන් තොණ්ඩමන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන එස්.බී. දිසානායක, නිමල් පියතිස්ස, රමේෂ්වර මරුදපාණ්ඩි, ජනාධිපති ප්‍රධාන උපදේශක ලලිත් වීරතුංග මහත්වරු සහ දිස්ත්‍රික්කයේ ජනතා නියෝජිතයෝ, අමාත්‍යාංශ ලේකම්වරු, රාජ්‍ය ආයතන හා ආරක්ෂක අංශ ප්‍රධානීහු ඇතුළු පිරිසක් යෝබුවැල්තැන්න ග්‍රාමයේ පැවති "ගම සමඟ පිළිසඳර" වැඩසටහනට එක්ව සිටියහ.

**2015 -2019 කාලයේ කුරුණෑගල අක්කර 77ක් පුත්තලම අක්කර 258ක් මොනරාගල අක්කර 100ක් අනුරාධපුර අක්කර 224ක් වනය විනාශ කරලා**

**යහපාලනයේ ජ්‍යෙෂ්ඨ ඇමැතිවරයෙක් හන්තානේ අක්කර 30ක් දියණියට තෑගි දීලා**

# රට අද පත්ව ඇති තත්ත්වයට නිලධාරීන් වග කිව යුතුයි



## ● ඇමැති ප්‍රසන්න රණතුංග

**මහින්ද අලුත්ගෙදර**

අණ පනත් සකසන්නේත් ඒවා වෙනස් කරන්නේත් නිලධාරීන් බවත් ඔවුනුත් රට අද පත්ව ඇති තත්ත්වයට වග කිව යුතු බවත් සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා අවධාරණය කරයි.

ඔහු මේ අදහස් පළ කළේ පසුගියදා නයිවල ජයසිංහ උත්සව ශාලාවේ පැවති ගම්පහ දිස්ත්‍රික් ජීවනෝපාය සංවර්ධන කමිටු රැස්වීමේ දීය. මේ අතර ගම්පහ දිසා අඩවි වන නිලධාරිනි දේවානි ජයතිලක මහත්මිය පෙන්වා දෙන්නේ නිලධාරීන් ගනු ලබන වැරදි තීරණ හේතුවෙන් දේශපාලනඥයන් අපහසුතාවයට පත්වන බවයි.

ගම්පහ දිස්ත්‍රික් ජීවනෝපාය සංවර්ධන කමිටු රැස්වීම සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග හා ඉඩම් ඇමැති එස්.එම්.චන්ද්‍රසේන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. ගම්පහ දිස්ත්‍රික්කයේ රජය සතු භාවිතයට නොගත් ඉඩම් සම්බන්ධයෙන් මතු වූ සාකච්ඡාවේ දී දොම්පේ මීතිරිගල සේද ගොවිපළ පදිංචි කරුවන්ට ඉඩම් ලබාදීම සම්බන්ධයෙන් මතු වූ සංවාදයේ දි මේ අදහස් පළ කෙරිණි.

මෙහි දී ඇති වූ සංවාදය මෙසේයෙ.

**ඉඩම් ප්‍රතිපත්ති හා සැලසුම් දෙපාර්තමේන්තුවේ ඉඩම් පරිහරණ නිලධාරි දයාරත්න මහතා -**

දොම්පේ මීතිරිගල සේදවත්ත ගොවිපළේ ගොවීන් ඉවත් කිරීමට වන සංරක්ෂණය සැලසුම් කර තිබෙනවා. නමුත් පසුගිය දා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දී පැවති රැස්වීමක දී එකඟතාවයට ආවා ආපහු මේ ඉඩම පදිංචිකරුවන්ට දෙන්න ප්‍රාදේශීය ලේකම්වරයාට භාර දිය යුතුයි කියලා. මේ සාකච්ඡාවට මිට අදාළ සියලු දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් සහභාගි වුණා. ගම්පහ වන අඩවි නිලධාරිනියත් හිටියා. මේ තීන්දුව ඇය ක්‍රියාත්මක කළා නම් හරි.

**පාර්ලිමේන්තු මන්ත්‍රී මිලාන් ජයතිලක මහතා -**

ඔය සේද ගොවිපළ 1976 දී තමයි හදලා තියෙන්නේ. මෙතන කපු වගා කළේ. ඒ සේද ගොවිපොළ පාඩු ලබලා වහනකොට වන්දි විදිහට එතැන හිටපු ගොවීන්ට ඒ ඉඩම් වගා කරන්න දීලා තියෙනවා. ඊට පස්සේ මේ අය එතැන ඒ ඉඩම්වල රබර් වගේ දේවල් වගා කරලා. මෑතක දී ඒ ඉඩම සංරක්ෂිතයක් කියලා පදිංචිකරුවන් ඉවත් කරන්න හදනවා.

**දොම්පේ ප්‍රාදේශීය සභාවේ සභාපති නීතිඥ පියසේන කාරියප්පෙරුම මහතා -**

මේක එන්.එම්.පෙරේරා මහත්තයා මුදල් ඇමති විදිහට පටන් ගත්ත එකක්. 1977 දී වැහුණා. වන්දි දෙන්න බැරිනිසා ඉඩම කට්ටි කරලා වැඩ කරපු අයට වන්දි විදිහට දුන්නා. මේ මිනිස්සු පරම්පරා 02 ක් ජීවත් වෙච්ච තැන. දැන් වන සංරක්ෂණය කියලා ඒ අයව එළියට දාන්න හදනවා.

**ගම්පහ දිස්ත්‍රික් අතිරේක දිසාපති සුගත් කිත්සිරි මහතා -**

මම ක්ෂේත්‍ර පරීක්ෂාවක් කළා. ඒ වාර්තාවට අනුව වන සංරක්ෂණ අධ්‍යක්ෂ ජෙනරාල් විශේෂ රැස්වීමක් කැඳවුවා. ඒකට සියලුම නිලධාරීන් සහභාගී වුණා. මෙතන හෙක්ටයාර් 38 ක් ගොවීන්ට දීලා තියෙන්නේ. අවුරුදු 45 කට වැඩි කාලයක් මේ අය භුක්ති විඳලා තියෙනවා. 13 දෙනෙක් පදිංචියි. අනිත් අය වගා කරනවා. මෙතන දී අපි තීරණයක් ගත්තා මේ ඉඩම් කොටස් ඒ අයට දෙන්න. දිසා වන නිලධාරීනිය අතේ තමයි ඉතිරි වැඩ කොටස් තියෙන්නේ.

**දිසාවන අඩවි නිලධාරිනී දේවානි ජයතිලක මහත්මිය -**

කමිටු දෙකකින් තීරණය කරලා තියෙනවා රක්ෂිතයෙන් කොටසක් නිදහස් කරන්න කියලා. මේක 1885 මැයි 22 ගැසට් පත්‍රයකින් රක්ෂිතයක් බවට පත්කරපු ලංකාවේ පළමු රක්ෂිතය. මේක කැලණි ගගේ අවසාන ජල පෝෂක ප්‍රදේශය. මීතිරිගල ඔයේ ජල පෝෂක ප්‍රදේශය. මීතිරිගල ඔය කියන්නේ අතිශය සංවේදී ප්‍රදේශයක්. පිරිසුදුම ජලය තියෙන ප්‍රදේශයක්. ගම්පහ තියෙන එකම ස්වාභාවික කැළේ. රක්ෂිතයක නීතියක් තියෙනවා අනවසර පදිංචියක් තියෙනවා නම් ඉවත කරන්න ඕන. හැමෝම මේකට කියන්නේ සේද ගොවිපළ කියලා. ඒක වැරදියි. සේද ගොවිපළ තියෙන්නේ රක්ෂිතයේ කොටසක. මේ රජය අපකීර්තියට පත්වෙන්නේ මේ වගේ වැරදි තීරණ නිසයි. නිලධාරීන්ගේ වැරදි තීරණ නිසයි දේශපාලනඥයන් අපහසුතාවට පත්වෙන්නේ.

**මන්ත්‍රී මිලාන් ජයතිලක මහතා -**

ඕකට දේශපාලනඥයන් ඈදාගන්න එපා.

**ඇමැති ප්‍රසන්න රණතුංග මහතා -**

මේ තීරණය අරන් තියෙන්නේ අපි නෙමෙයි. නිලධාරීන්.

**ගම්පහ දිස්ත්‍රික් අතිරේක දිසාපති සුගත් කිත්සිරි මහතා -**

මේක අවුරුදු 45 ක් විතර මිනිස්සු භුක්ති විඳලා තියෙනවා.

**ඇමැති ප්‍රසන්න රණතුංග මහතා -**

මේ තීන්දුව ගත්තේ වන සංරක්ෂණ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා ඇතුළු සියලුම වග කිව යුතු නිලධාරීන් එකතු වෙලාද?

**අතිරේක දිසාපති -**

එතුමා දෙපාර්තමේන්තු ප්‍රධානියා. සංරක්ෂක දෙපාර්තමේන්තුව දැනුවත්ව තමයි මේ ඉඩම් සේද ගොවිපළට දීලා තියෙන්නේ. මිනිස්සුන්ට නඩු දලා තියෙනවා. වන සංරක්ෂක අධ්‍යක්ෂ ජෙනරාල්වරයා දැනුම් දීලා තියෙනවා ඒ නඩු ඉවත් කරගන්න කියලා.

**ජයතිලක මහත්මිය -**

මට නඩුව අයින් කරගන්න කියලා අධ්‍යක්ෂ ජෙනරාල්තුමා මාව දැනුවත් කරලා නෑ.

**දයාරත්න මහතා -**

මේ සාකච්ඡාවට මෙතුමියත් හිටියා. ඇය පමණයි විරුද්ධ වුණේ. කමිටුවේ දී තීරණය කළා මෙතුමිය හැර සියලු දෙනාට එකඟ වු නිසා මේ ඉඩම් ප්‍රාදේශීය ලේකම්ට භාරදෙන්න. නඩුව ඉවත් කරගන්නත් එතැන දී තීරණය කළා.

**ඇමැති ප්‍රසන්න රණතුංග මහතා -**

දේශපාලන නායකයෝ නෙමෙයි මේ තීන්දු අරන් තියෙන්නේ නිලධාරීන්. රාජ්‍ය නිලධාරීන් කරන වැරදිවලට දේශපාලනඥයන් බැනුම් අහන්නේ. කරුණාකරලා ජනතාව පීඩාවට පත් කරන්න එපා.

**ජයතිලක මහත්මිය -**

මේක 1885 ගැසට් කරලා තියෙන්නේ.

**දොම්පේ ප්‍රාදේශීය සභාවේ සභාපති නීතිඥ පියසේන කාරියප්පෙරුම මහතා -**

ඔතන තමයි ප්‍රශ්නේ. කොළඹ නුවර පාර තිබුණේ කරත්ත පාර කියලා 1800 ගණන් වල. 1800 ගණන් වල තිබුණු දේවල් දැන් ක්‍රියාත්මක කරන්න බෑ. ඒවා කාලෙන් කාලට වෙනස් වෙලා.

**ජයතිලක මහත්මිය -**

සුරකිමු ගංගා ව්‍යාවපෘතිය ආණ්ඩුවෙන් කරනවා. ඒ ව්‍යාපෘතිය යටතේ ඔය ඉඩම් දෙන්න බෑ.

**ඇමතිි ප්‍රසන්න රණතුංග මහතා -**

ඉතිං ඔබතුමියලා ආයතන ප්‍රධානීන්මනේ මේ තීන්දුව අරන් තියෙන්නේ. අපි නෙමෙයිනේ.

**ජයතිලක මහත්මිය -**

ඔව් ඒක ඇත්ත. මම ඒක පිළිගන්නවා. හැබැයි ඒක වැරදියි.

**ඇමැති ප්‍රසන්න රණතුංග මහතා -**

මිනිස්සු අසරණ කරන්න බෑ නිලධාරීන්ගේ කඹ ඇදිල්ල නිසා.

**ජයතිලක මහත්මිය -**

විද්‍යාත්මක දැනුමක් තියෙන අලුත් කමිටුවක් දාන්න.

**දොම්පේ ප්‍රාදේශීය සභාවේ සභාපති නීතිඥ පියසේන කාරියප්පෙරුම මහතා -**

මේ 1885 නෙමේ. මේ 2021. 1885 දිහා බලලා දැන් තීන්දු ගන්න බෑ. මෙතුමිය ඇකේෂියා එක ගහක් කැප්පුවා කියලා ආවාසගේ හදන්න නා උයනේ අරියධම්ම හාමුදුරුවෝ උසාවි ගෙනිච්චා.

**වන ජීවි අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වර්නන් පෙරේරා මහතා -**

මේ නඩුව ඉල්ලා අස් කරගන්න කියන එක තමයි සියලු නිලධාරීන්ගේ සාකච්ඡාවේ දී ගත්ත තීන්දුව. මේ සම්බන්ධයෙන් අපි මැදිහත් වෙලා ඊළඟ දීස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට කරුණු ඉදිරිපත් කරන්නම්.

**ඇමැති ප්‍රසන්න රණතුංග මහතා -**

නිලධාරීන් තමයි අණ පනත් හදන්නෙත් ඒ පනත් සංශෝධනය කරන්නෙත්. නිලධාරීන්ම හදලා නිලධාරීන් ඒවායේ හිර වුණාම ඒකේ වැරැද්ද පටවන්නේ දේශපාලනඥයන්ට. දේශපාලනඥයෝ අවුරුදු 05න් 05ට යනවා. හැබැයි නිලධාරීන්ටයි පටි මාරු කරගෙන ඉන්නවා. ඒ නිසා නිලධාරීන් මේ ප්‍රශ්නය අපිට විසඳලා දෙන්න. ගොඩක් දුරට නිලධාරි කරන වැරදි හින්දා තමයි මේ රට මේ තත්ත්වයට පත්වෙලා තියෙන්නේ. ඔබතුමියලා තීන්දු කරලා කරන්න ඕන දේ අපිට කියන්න. අපි නෙමෙයිනේ මේවාට නිපුණතාවය තියෙන අය.

ගම්පහ වනගහණය වැඩි කරනවාට මම සියයට 1500කින් එකඟයි. හැබැයි ඒකට ක්‍රමවත් වැඩපිළිවෙළක් තියෙන්නේ ඕනැ. ඔබතුමිය හඳුනාගෙන තියෙනවාද ගම්පහ වන වගාවන් සිදුවිය යුතු ප්‍රදේශ.

**ජයතිලක මහත්මිය -**

ඒ ගැන කටයුතු කරමින් ඉන්නවා.

**ඇමතිි ප්‍රසන්න රණතුංග මහතා -**

එහෙම හඳුනාගෙන නැත්තම් ඉක්මණින් එවැනි වැඩ පිළිවෙළක් දිස්ත්‍රික් කමිටුවට ඉදිරිපත් කරන්න. අපි ඒකට අවශ්‍ය සහයෝගය දෙන්නම්.

# සුව සේවාව ශක්තිමත් කරමින් රටේ සංවර්ධන කටයුතු අඛණ්ඩව

## ● ඇමැතිනි පවිත්‍රා වන්නිආරච්චි

**පහන් විජේසේකර**



මෙරට සෞඛ්‍ය ක්ෂේත්‍රය ශක්තිමත් කරමින්, රටේ සංවර්ධන කටයුතු අඛණ්ඩව සිදු කරගෙන යැමට රජය කටයුතු කරන බව සෞඛ්‍ය ඇමැතිනි පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය පැවසුවාය.

සෞඛ්‍ය ඇමතිවරිය මේ බව ප්‍රකාශ කළේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නීතිඥ සංගමයේ රත්නපුර දිස්ත්‍රික් නීතිඥ සංවිධානයේ රැස්වීමට පසුගියදා එක්වෙමිනි.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ සෞඛ්‍ය ඇමැතිවරිය මෙසේ සඳහන් කළාය.

"අපි පළමු කොවිඩ් රැල්ල සාර්ථකව පාලනය කළා. නමුත් රට හැමදාම වහලා තියන්න බැහැ. අද බොහෝ රටවල් වහලා තිබුනත් ලක්ෂ ගණන් මිය යනවා. අපි දවසකට ලක්ෂ 800 ක් විතර පී.සී.ආර් පරීක්ෂණ සඳහා පමණක් වියදම් කරනවා. කොවිඩ් වෛරසය වාර්තා වන විට අපට ඊට අදාළ ප්‍රතිකාර සේවාවන් ලබාදීමට තිබුනේ එක රෝහලයි. ඒ අයි.ඩී.එච් රෝහල විතරයි. දෛනිකව රෝගීන් විශාල වශයෙන් වාර්තා වන විට අපි සෞඛ්‍ය අංශ ශක්තිමත් කිරීමට විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළා.

සියලු අභියෝග ජයගනිමින් රටේ සංවර්ධන කටයුතු ද සාර්ථකව සිදු කරනු ලබනවා. අපි දැන් පටන් ගන්නවා පාරවල් කිලෝමීටර් ලක්ෂයක් කාපට් කරන්න. හැම ගෙදරකටම ජලය, විදුලිය දෙන්න කටයුතු කරනවා. ඉදිරි මැතිවරණ අපි ජයග්‍රහණය කළ යුතුයි. එම ජයග්‍රහණ කළ යුත්තේ රටට හොඳට මිසක් වෙන කාගේවත් හොඳකට නොවෙයි. වත්මන් ජනාධිපතිතුමා ප්‍රමුඛ රජය හොරකම් අවම කිරීමට කටයුතු කරනවා, ඒ වගේම මා කවදාවත් හොරකම් කරලා නැහැ හොරකම් කරන්නේත් නැහැ කියන සහතිකය දෙන්න පුළුවන්.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නීතිඥ සංගමය තමයි අද ලංකාවේ පක්ෂයක තිබෙන දැවැන්තම නීතිඥ සංගමය. මෙවැනි ශක්තිමත් නීතිඥ සංගමක් අපට හදා ගැනීමට හැකිවීම ගැන අප සතුටු වෙනවා. මේ බලවේගය මාතෘ භූමියේ සුබදායක තත්ත්වය සඳහා යොදා ගනිමින් මේ බලවේගය තවත් ශක්තිමත් කළ යුතුයි."

# ඊබ්‍රහිම් ජවිපෙ ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයෙක්

## ● ඇමැති සරත් වීරසේකර



**සුභාෂිණී සේනානායක**

පාස්කු ඉරිදා ප්‍රහාරයේ බෝම්බ කරුවකුගේ පියා වන මේ වන විට ප්‍රහාරය සම්බන්ධයෙන් අත්අඩංගුවේ පසු වන ඊබ්‍රහිම් හාජියාර් ජනතා විමුක්ති පෙරමුණේ ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයකු ලෙස සිටිබව හා ඒ පිළිබඳව විමර්ශන වලදී කළ ප්‍රකාශ ගැන ජනතා විමුක්ති පෙරමුණේ නායකයා බියට පත් වී ඇති බව මහජන ආරක්ෂක ඇමැති, විශ්‍රාමික රියර් අද්මිරාල්, ආචාර්ය සරත් වීරසේකර මහතා පවසයි.

ඊබ්‍රහිම් නමැති පුද්ගලයා ජනතා විමුක්ති පෙරමුණේ ජාතික ලැයිස්තු මන්ත්‍රී අපේක්ෂකයෙක් ලෙස එම ලැයිස්තුවට ඇතළත් වී තිබූ බවද ඒ මහතා කියා සිටියේය.

ජනතා විමුක්ති පෙරමුණේ ඇතැම් පුද්ගලයන් සහරාන්ගේ මත වාද පිළිගන්නා බවට සැකයක් මතු වන බව ද මෙහිදී ඇමැතිවරයා අවධාරණය කළේය. ජනතා විමුක්ති පෙරමුණේ බිමල් රත්නායක මහතා පසුගිය දිනවල කළ ප්‍රකාශයක් අනුව පිළිම වන්දනා කරන්නේ ගෝත්‍රිකයන් බව පවසා තිබෙන බවත් පිළිම වන්දනා කරන අයට එරෙහි වන්නේ සහරාන් වැනි මූලධර්මවාදීන් නිසා එම මත වාද ජනතා විමුක්ති පෙරමුණේ තියෙනවා බවට මෙහිදී සැක පහළ වන බවත් ජනතා මතය සියයට තුනට පහළට බැස්ස ජනතා විමුක්ති පෙරමුණට කිසිම ජනතාවකගේ සහයක් ඉදිරියේදී නොලැබෙන බවත් කියා සිටියේය.

මහජන ආරක්ෂක අමාත්‍ය සරත් වීරසේකර මහතා මේ බව කියා සිටියේ ඊයේ (21) ට යෙදී තිබුණු 147 වැනි පොලිස් විරු දිනයට සමගාමීව අද මාලිගාකන්ද මහා බෝධි විහාරස්ථානයේ දී පැවැති ආගමික වතාවත් හා දානමය පින්කම අවසන්වීමෙන් පසු මාධ්‍ය වෙත අදහස් දක්වමින්.

මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් මේජර් ජෙනරාල් ජගත් අල්විස්, බස්නාහිර පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහත්වරුන් ඇතුළු පොලිස් නිලධාරීහු ද මේ අවස්ථාවට එක්ව සිටියහ.

# කහ මිල අඩු වුණාට කුරුඳු සහ කෝපි මිල ඉහළ ගිහින්

## ● අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

**නුවන් හෙට්ටිආරච්චි**

කහ මිල පහත වැටුන ද ගම්මිරිස් රුපියල් 100කින් ද කුරුඳු සහ කෝපි රුපියල් 150කින්ද මිල ඉහළ ගොස් ඇති බව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ඒ.පී හීන්කෙන්ද මහතා ඊයේ (21) දිනමිණට පැවසීය.

ඒ අනුව රුපියල් 550ට පැවති ගම්මිරිස් කිලෝවක් රුපියල් 650 ක් දක්වා ද රුපියල් 850ට පැවති කුරුඳු සහ කෝපි කිලෝවක් රුපියල් 1000ක් දක්වා ද ඉහළ ගොස් ඇති බවත් කහ මිල රුපියල් 400 දක්වා පහත වැටී ඇත්තේ කහ අස්වනු අතිරික්ත මට්ටම දක්වා ළඟා වීම නිසා බවත් ඒ මහතා පැවසීය.

නමුත් ඒ මිල ද කහ සඳහා ඉතිහාසයේ ලැබුණ ඉහළ මිලක් බවත් ඉදිරියේ කහ අපනයනය ආරම්භ කළ විට මේ තත්ත්වය විසදෙන බවත් ඒ.පී හීන්කෙන්ද මහතා කීවේය.

# පිළියන්දල සාදයකදී 34ක් අත්අඩංගුවට

**රක්ෂණ ශ්‍රියන්ත**

පිළියන්දල පොලිස් වසමේ මඩපාත ප්‍රදේශයේ ලැගුම්හලක නිරෝධායන රීතීන් උල්ලංඝනය කරමින් මත්ද්‍රව්‍ය භාවිත කරමින් සාදයක් පැවැත්වූ පුද්ගලයන් 34 දෙනකු ඊයේ (21) අලුයම 3.45ට පමණ පිළියන්දල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

මුහුණු පොත සහ සමාජ ජාල ආශ්‍රයෙන් පිරිස එක් රැස් කරගෙන මේ සාදය පැවැත්වූ බවට පොලිස් පරීක්ෂණවලදී අනාවරණය වී තිබේ. අත්අඩංගුවට ගත් පුද්ගලයන් අතර කාන්තාවන් 09 දෙනකු සහ අදාළ ලැගුම්හලේ කළමනාකරුද වේ. මේ අත්අඩංගුවට ගත් පුද්ගලයන්ගෙන් 22 දෙදෙනකු ඊයේ (21) කැස්බෑව අධිකරණයට ඉදිරිපත් කර ඇති අතර 18 දෙනකු ඇප මත මුදා හැර තිබේ. තවත් පුද්ගලයන් හතර දෙනකු ලබන 01 දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට අධිකරණය නියෝග කර තිබේ. රිමාන්ඩ් භාරයට පත් කළ පුද්ගලයන් 04 දෙනා අතර අදාළ ලැගුම් හලෙහි කළමනාකරුද වේ. අත්අඩංගුවට ගත් පිරිසෙන් 12 දෙනකු භාරයේ අයිස් නමැති මත්ද්‍රව්‍යද 05 දෙනකු භාරයේ ගංජා නමැති මත්ද්‍රව්‍යද, තවත් එක් අයකු භාරයේ වෙනත් මත්ද්‍රව්‍යක්ද තිබී ඇති බව පොලිසිය පවසයි.

# ජිනීවා සැසියේදී රටවල සහාය පතා පින්කමක්

ජිනීවා මානව හිමිකම් සැසිවාරයේ දී ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවයට හා රජයට මෙන්ම රටේ ජනතාවට සංවර්ධිත අභිමානවත් හෙට දවසක් සඳහා එංගලන්තය ඇතුළු රටවල සහයෝගය ලැබේවා යන ප්‍රාර්ථනයෙන් නාරාහේන්පිට ධර්මදූත බෞද්ධ විහාරස්ථානයේ දී පරිත්‍රාණ ධර්ම දේශනාවක් අද (22) දින සවස 6.00ට පැවැත්වේ.

එම විහාරස්ථානයේ විහාරාධිපති කොළොන්නේ දීපවංශ හිමියන්ගේ අනුශාසකත්වයෙන්, සුරාජ් දන්දෙණිය මහතාගේ මඟපෙන්වීම හා පූර්ණ දායකත්වයෙන් සහ සමන්ත හේවා බන්දුල මහතාගේ සහයෝගීත්වය ඇතිව දෙදිනක් පුරාවට පැවත්වෙන මේ පිරිත් පින්කමේදී වත්මන් රජයටත්, ජනාධිපතිවරයාටත් ආශිර්වාද එක් කරනු ඇත.

ශ්‍රී ලංකාවට එරෙහිව මානව හිමිකම් කවුන්සිලය වෙත ඉදිරිපත් කර ඇති චෝදනා සම්බන්ධයෙන් ඡන්දය විමසන මොහොතේ දී මෙරට වේලාවෙන් අද සවස 6.00ට පරිත්‍රාණ ධර්ම දේශනාව ආරම්භ කිරීමට නියමිතය.

# මාඔයේ දිය නෑමට ගිය තරුණයෝ දෙදෙනෙක් මරුට

**රක්ෂණ ශ්‍රියන්ත**

මාවනැල්ල මාඔයේ දිය නෑමට ගිය තරුණයන් 7 දෙනකු අතුරින් තරුණයන් දෙදෙනකු ඊයේ (21) දියේ ගිලී මියගොස් තිබේ.

මෙලෙස මියගොස් ඇත්තේ 24 හැවිරිදි වියේ පසුවන මාකෙහෙල්වල සහ පිළිමතලාව යන ප්‍රදේශවල පදිංචි තරුණයෝ දෙදෙනෙකි.

සිරුරු මාවනැල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර තිබේ.

සිද්ධිය සම්බන්ධයෙන් මාවනැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරයි.

# බළන්ගොඩ විවේකානන්ද විද්‍යාලයේ දරු දැරියන්ට පරිත්‍යාගයක්



මහා බ්‍රිතාන්‍යයේ හොන්ස්ලෝ "ශ්‍රී ලංකා ජනහඬ පදනම" සහ "ශ්‍රී ලංකාවේ ජනහඬ පදනම" එක්ව බළන්ගොඩ, නන්පේරියල් හි විවේකානන්ද විද්‍යාලයේ දරු දැරියන් වෙනුවෙන් ආහාර ද්‍රව්‍ය පරිත්‍යාගකිරීමේ සමාරම්භක අවස්ථාව පසුගිය 05වැනි දින එම විද්‍යාලයේ දී පවත්වන්නට යෙදුණි. ඒ අනුව, මේ වසරේ සිට ඉදිරි මාස හයක් පුරාවට එම විදුහලේ නේවාසිකව ඉගෙනුම ලබන දරු දැරියන්ගේ ආහාර අවශ්‍යතාවන් වෙනුවෙන් බරපැන දැරීමට "හොන්ස්ලෝ ජනහඬ පදනම" විසින් "ශ්‍රී ලංකාවේ ජනහඬ පදනම" මාර්ගයෙන් කටයුතු කරනු ඇත.

රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ අධ්‍යාපන කොට්ඨාසයේ, නන්පේරියල් වතුයායට යෑමට ඇති මාර්ගය ද ඉතා දුෂ්කර එකකි. එහි දිවි ගෙවන වතු කම්කරුවන්ගේ දූ දරුවන් රැසක් ඉගෙනුම ලබන විවේගානන්ද විදුහලේ නේවාසිකාගාරයේ එකම පවුලේ දරුවන් තිදෙනෙක් ආදී වශයෙන් සිසු සිසුවියන් 30 දෙනෙක් නේවාසිකව අධ්‍යාපනය ලබයි. එවන් දරුවන් සිටින කම්කරු පවුලකට එම දරුවන් තිදෙනාගේම නේවාසික වියපැහැදම් දැරීම අසීරු බවත්, අධ්‍යාපනය ලබන දරුදැරියන්ගේ මවුපියන්ගේ ආර්ථික අපහසුතා මෙන්ම, විදුහල පිහිටීමේ හා ප්‍රදේශයේ ඇති දුෂ්කර තත්ත්වයන් හේතුවෙන් මෙහි අධ්‍යාපනය ලබන දරු දැරියන් විශාල අගහිඟකම්වලින් පෙළෙන බවත් පසුගිය කාලයේ මාධ්‍ය මඟින් වාර්තා වී තිබුණි. මේ විදුහලේ සමස්ත සිසු සිසුවියන්ගේ සංඛ්‍යාව 89 කි. ඉන් පනස් දෙනෙක් ශිෂ්‍යයන් වන අතර, ශිෂ්‍යාවන් තිස් නවයකි.

මේ තත්ත්වය හඳුනාගත් "මහා බ්‍රිතාන්‍යයේ හොන්ස්ලෝහි ජනහඬ පදනමේ" නිර්මාතෘ ශ්‍රී ලාල් ඩයස් මහතා විසින් ඔහුගේ සංවිධානයට උපකාර කිරීමට ඉදිරිපත්වන ලන්ඩන් හි වෙසෙන හිතවතුන්ගේ ද නොමසුරු ආධාර උපකාර ද රැගෙන "ශ්‍රී ලංකාවේ ජනහඬ පදනම" හරහා මේ ආධාර ලබාදීමට පියවරගෙන තිබේ. මේ මාසික ආධාර ද්‍රව්‍යයන්හි වටිනාකම රුපියල් හැටපන්දහසක උපරිමයකට යටත්වෙයි. "ශ්‍රී ලංකාවේ ජනහඬ පදනම" නීත්‍යානුකූලව පිහිටුවා ඇති සංවිධානයක්.

සෞභාග්‍යයේ හරිතාභිමානය

# සුරකිමු ගංගා
சுரகிமு கங்கா
Surakimu Ganga

## ශ්‍රී ලාංකේය ගංගා සංරක්ෂණය කිරීමේ ජාතික පාරිසරික වැඩසටහන


ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති
අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා


ගරු අග්‍රාමාත්‍ය
මහින්ද රාජපක්ෂ මැතිතුමා

"සෞභාග්‍යයේ දැක්ම" වත්මන් රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවමින් සුරක්ෂිත පරිසරයක පොදුජන අවශ්‍යතා ඉටුකරලීමේ ඉදිරිගාමී ප්‍රයත්නයක් ලෙස සැමට ජලය උදෙසා පෙරමග සකසන ජාතික පරිසර වැඩසටහන

පරිසර අමාත්‍ය
ගරු මහින්ද අමරවීර මැතිතුමන්ගේ ආරාධනය පරිදි


පරිසර අමාත්‍ය
ගරු මහින්ද අමරවීර මැතිතුමා


පරිසර අමාත්‍යාංශයේ ලේකම්
විශේෂඥ වෛද්‍ය
අනිල් ජාසිංහ මහතා

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන්

ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමන්ගේ ආශිර්වාදයෙන්


මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති
එස්. අමරසිංහ මහතා


මධ්‍යම පරිසර අධිකාරියේ
අධ්‍යක්ෂ ජනරාල්
පී. බී. හේමන්ත ජයසිංහ මහතා

2021 ක් වූ මාර්තු මස 22 වන දින පෙ.ව. 10.00 ට
මැණික් නදිය අසළ ඓතිහාසික
රුහුණු කතරගම පූජා භූමි පරිශ්‍රයේදී දියත්වන වගයි.

මෙම අවස්ථාවට,
ගරු අමාත්‍යවරුන්, ප්‍රාදේශීය මහජන නියෝජිතයින්,
ඌව පළාත් ආණ්ඩුකාර
ගරු ඒ. ජේ. එම්. මුසම්මිල් මැතිතුමන්,
ඇතුළුව සම්භාවනීය අමුත්තන් රැසක් සහභාගී වේ.

"සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහන ශ්‍රී ලංකාවේ ගංගා සහ ඒ ආශ්‍රිත පරිසරය සංරක්ෂණය උදෙසා දියත් වන්නා වූ දැවැන්ත පාරිසරික සත්කාරයකි. "සෞභාග්‍යයේ දැක්ම" අතිගරු ජනාධිපතිතුමන්ගේ දසවැදෑරුම් ප්‍රතිපදාවන්හි නව වැන්න වූ තිරසර පරිසර කළමනාකරණයට අනුව "සුරකිමු ගංගා" ජාතික වැඩසටහන එළිදක්වා ඇත. මෙම වැඩසටහනේ අරමුණ වන්නේ, ශ්‍රී ලංකාවේ පිහිටි ගංගා ද්‍රෝණි 103 ම පුනරුත්ථාපනය කොට ආරක්ෂා කිරීමයි.

"දිය දෝතක් බීමට හැකි ලෙස" ගංගාවන් ජනතාවට දායාද කිරීම "සුරකිමු ගංගා" වැඩසටහනේ මුඛ්‍ය පරමාර්ථයයි. මෙම වැඩසටහන තුළින් ගංගා ජලයට; කර්මාන්ත ශාලාවලින් අපද්‍රව්‍ය බැහැර කිරීම, හෝටල්, ව්‍යාපාරික ආයතන හා නිවාස ආදියෙන් ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම, කෘෂි රසායනික ද්‍රව්‍ය මුසුවීම, අවිධිමත්ව සිදුවන වැලි කැණීම යනාදියෙන් සිදුවන අපවිත්‍ර වීම් වළකා ඉවුරු සංරක්ෂණය, ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය, පාංශු ඛාදනය අවම කර ගැනීම ආදිය තුළින් අපගේ වටිනා ගංගා පද්ධතිය තිරසාරව පවත්වාගෙන යාම අපේක්ෂා කෙරේ.

ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් අදාළ පාර්ශ්වකාර ආයතන අතර මනා සම්බන්ධීකරණයක් සහිත විධිමත් යාන්ත්‍රණයක් සකස් කිරීමටත්, මෙම විෂය පථයට අයත්වන සියලුම රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවල සම්පත් උපරිම කාර්යක්ෂම ලෙස යොදා ගෙන සිදුකරන, ඵලදායී ආයෝජන මෙන්ම පරිසර සංරක්ෂණ නීතිරීති හා රෙගුලාසි පාරදෘශ්‍ය ලෙස හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම මඟින් හැකි අවම කාලයක් තුළ, දිවයිනේ ගංගා පද්ධතිවලට සිදුවන පාරිසරික දූෂණය අවම මට්ටමකට පත්කර ගැනීම "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහනින් අරමුණු කෙරේ.

අනාගත දැයේ දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක "සුරකිමු ගංගා" ජාතික පාරිසරික සත්කාරය සඳහා සක්‍රීය ජනතා දායකත්වය මහත් සේ අගය කරමු.

### මෙම දිනයට යෙදී ඇති ලෝක ජල දිනයට සමගාමීව ගරු ආණ්ඩුකාරවරුන්ගේ ප්‍රධානත්වයෙන් සියලු පළාත්වල ගංගා සංරක්ෂණ කටයුතු ආරම්භ කෙරේ.

| බස්නාහිර | මධ්‍යම | දකුණ | සබරගමුව | වයඹ | උතුරුමැද | නැගෙනහිර | උතුර |
|---|---|---|---|---|---|---|---|
| **කැළණි ගඟ** | **මහවැලි ගඟ** | **වළවේ ගඟ** | **කළු ගඟ** | **දැදුරු ඔය** | **මල්වතු ඔය** | **ගල් ඔය** | **කනගරායන් ආරු** |
| පහළ හංවැල්ල | ගන්නොරුව, මහනුවර. | අම්බලන්තොට පාලම ආශ්‍රිතව | සමන් දේවාලය ආශ්‍රිතව රත්නපුරය | බිංගිරිය | බන්ධනාගාර පරිශ්‍රය ආශ්‍රිතව, අනුරාධපුරය | අම්පාර | කිලිනොච්චිය |

පරිසර අමාත්‍යාංශය, "සොබාදම් පියස",
416/C/1, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල.

ලක්මව් සියොළඟ ජීව වායු පිරි ධමනී
සිව්දිග ගලනා ගංගාවන්මය රමණී

මධ්‍යම පරිසර අධිකාරිය, "පරිසර පියස"
104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
Hotline: 1981, www.cea.lk



# ලෝක ජල දිනය

2021 මාර්තු 22

UN WATER
22 MARCH
WORLD WATER DAY



# භූගත ජල සම්පත

## අනාගත පරපුර උදෙසා සුරකිමින් භාවිත කරමු



මිහි මත ඉපැදුණු සැමට, පවසට දිය පොදක් නොමැතිව, දින ගණනක් නොව, පැය ගණනක් වත් ජීවත් විය නොහැකිය. මිනිසුන්ට, සතුන්ට පමණක් නොව, ගහකොළවල ජීවය පවා රඳා පවතින්නේ ජලය නිසා ය. මහ පොළොව මත ජීවත් වන සැමට නැතිවම බැරි අමිල සම්පතක් වන ජලය අපතේ නොයවා, නිසි පරිදි පරිභෝජනය කළ යුතුය. එසේ රැක ගනිමින්, මතු පරපුර වෙත මේ මාහැඟි සම්පත උරුම කර දීමේ භාරධූර කර්තව්‍යය හිමිව ඇත්තේ, වත්මනෙහි ජීවත් වන අපට ය. ඒ පිළිබඳ කතා කිරීමට, අදට යෙදී ඇති 'ලෝක ජල දිනය' සුදුසු ම දවස ය.

මූලික මිනිස් අවශ්‍යතා අතුරින් ජලයට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි. අවශ්‍යතා සපුරා ගැනීමේ දී, ලාංකිකයන් ලෙස අනාදිමත් කාලයක සිට ම, දෛනික වැඩ කටයුතු සඳහා භූගත ජලය යොදා ගැනීම සිදු විය. අතීතය පිළිබඳ සලකා බැලීමේ දී, ලංකාවේ නොගැඹුරු ළිං මඟින් භූගත ජලය උකහා ගැනීමේ ප්‍රතිශතය 80%ක් පමණ විය. පානීය සහ ගෘහ පාරිභෝජන අවශ්‍යතා මේ මඟින් සපුරා ගැනිණි. මෙහි දී අප රටේ සෑම දිස්ත්‍රික්කයකම, ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල ඉතා පවිත්‍ර හා සෞඛ්‍යාරක්ෂිත ජලය සහිත, නොගැඹුරු වළ ළිං ජාලයක් ස්ථාපිත වී තිබිණි. කෘෂි කාර්මික සහ අනෙකුත් ජල අවශ්‍යතා, මතුපිට ජල ප්‍රභව වන, ගංගා, ඇළ දොළ, වැව්, පොකුණු සහ පැරණි වාරිමාර්ග පද්ධති ආශ්‍රිතව සපුරා ගැනිණි.

එහෙත්, පසු ගිය දසක කිහිපයේ දී, නළ මාර්ග මඟින් ජලය සැපයීම සහ ගැඹුරු නළ ළිං මඟින් ජලය ලබා ගැනීමේ ප්‍රවණතාව ඉහළ ගොස් ඇත. වැඩි වන ජනගහනය, කෘෂිකාර්මික සහ කර්මාන්ත ක්ෂේත්‍රයෙහි ඇති වන ශීඝ්‍ර සංවර්ධනය හේතුවෙන්, ඉදිරියේ දී දිවයිනේ දෛනික ජල අවශ්‍යතා තව දුරටත් ඉහළ යනු ඇත. මෑත කාලීන දේශගුණික හා කාලගුණික විපර්යාස නිසා, නියමිත කාලවලදී වර්ෂාව ලැබීමේ රටාව වෙනස් විය. ඒ හේතුව නිසා, මතුපිට ජල ප්‍රභවවල (වළ ළිං) ජල මට්ටම් අඩු විය. ඒ හේතුවෙන්, ගැඹුරු භූගත ජල ප්‍රභවවල ජලය භාවිත කිරීම තව දුරටත් ඉහළ ගොස් ඇත. ගැඹුරු නළ ළිං ඉදි කිරීම මඟින් ජල අවශ්‍යතා සපුරා ගැනීම අවිධිමත්ව සිදු වීම නිසා, භූගත ජල මට්ටම්වලට මෙන් ම, එම ජලයේ ගුණාත්මකභාවයට ද බලපෑම් සිදුව ඇත. ශීඝ්‍ර වර්ධනයත් සමඟ, නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල සිදු කරන මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන්, භූගත ජලය දූෂණය වීම ද ඉහළ ගොස් ඇත.

මේ නිසා, අපගේ වටිනා භූගත ජල සම්පත ආරක්ෂා කර, නිසි කළමනාකාරිත්වයෙන් යුතුව පරිභෝජනය කරමින්, අනාගත පරපුර වෙත දායාද කිරීම, අප සැමගේ පරම යුතුකම ය. මේ සඳහා, ජල සම්පත් මණ්ඩලය වෙත සම්පූර්ණ වගකීම පැවරී තිබේ. ඒ අනුව, නීති රෙගුලාසි සකස් කර, අවශ්‍ය කටයුතු කිරීමට සැලැසුම් සකස් කර ඇත. භූගත ජල සම්පත් ආරක්ෂා කර, විධිමත්ව භූගත ජලය ලබා ගැනීමට අදාළ උපදෙස් ඇතුළත් අංක 2010/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය, 2017 මාර්තු 16 වැනි දින ප්‍රකාශයට පත් කෙරිණි. ඒ අනුව මේ කටයුතු තව දුරටත් විධිමත් කර, නීත්‍යානුකූලව නළ ළිං ඉදි කිරීමේ ක්‍රමවේදය සැකසිය යුතුය. එය, ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් සකස් කිරීම අවශ්‍ය ය. භූගත ජලය ප්‍රමාණාත්මක හා ගුණාත්මක භාවය රැකෙන පරිදි හා පාරිසරික ගැටලු අවම වන පරිදි සිදු කිරීමට, අදාළ අනෙකුත් සියලු පාර්ශ්ව සම්බන්ධීකරණය, ජල සම්පත් මණ්ඩලය මඟින් සිදු කරයි. එලෙස අපගේ අවශ්‍යතා සඳහා භූගත ජලය තිරසරව යොදා ගැනීම සහ කළමනාකරණය කිරීමේ කටයුතු තව දුරටත් විධිමත් කිරීමට, 2021 වර්ෂයේ දී සැලසුම් කර ඇත.

මේ පිළිබඳව පසුගියදා ජල සම්පාදන අමාත්‍ය වාසුදේව නානායක්කාර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ජල සම්පාදන අමාත්‍යාංශ ලේකම් ආචාර්ය ඉංජිනේරු ප්‍රියත් බන්දු වික්‍රම මහතාගේ සහභාගිත්වයෙන් පැවැති විශේෂ සාකච්ඡාවේදී, භූගත ජලය නිසි කළමනාකාරිත්වයකින් යුතුව, තිරසරව, අනාගත පරපුර වෙනුවෙන් සුරක්ෂිතව භාවිත කිරීමට අවශ්‍ය කළමනාකරණ සැලසුම් සකස් කිරීම සඳහා උපදෙස් ලබා දුනි.

ඒ අනුව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් දැනට භාවිත කරන සියලුම භූගත ජල ප්‍රභවවලට අදාළ විස්තර එක් රැස් කිරීම, ප්‍රදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ආරම්භ කර ඇත. මේ තොරතුරු ලබා ගැනීම මඟින්, භූගත ජල සම්පත් වර්තමානය වන විට විවිධ අවශ්‍යතා සඳහා භාවිත කරන ප්‍රමාණය හා ආකාරය තක්සේරු කෙරේ. එමඟින්, භූගත ජලය හිඟ ප්‍රදේශ හඳුනා ගැනීම හා එම ප්‍රදේශ සඳහා ජලය සැපයීමට අවශ්‍ය වෙනත් ක්‍රමවේද සැලසුම් කිරීමට ද හැකි වේ. ජල සම්පත් මණ්ඩලය මඟින් භූගත ජලය වැඩිපුර ලබා ගන්නා සංවේදී කලාප හඳුනා ගෙන, එම ප්‍රදේශවල භූගත ජලය ලබා ගැනීම නිසි කළමනාකාරිත්වයක් යටතේ දීර්ඝ කාලීනව භාවිත කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම සිදු කළ යුතුව ඇත.

භූගත ජලය පොළොව තුළට කාන්දු වී, නැවත ආරෝපණය වනුයේ, අප රටට ලැබෙන වැසි ජලයෙන් හා එමඟින් පෝෂණය වන මතුපිට පවතින සියලු ජල ප්‍රභව මඟිනි. එබැවින්, වර්තමානයේ භූගත ජලය වැඩි වශයෙන් භාවිත කරන ප්‍රදේශවල පොළොවෙහි අභ්‍යන්තර භූගත ජලධර ආශ්‍රිත ව්‍යූහ හඳුනාගෙන, කෘත්‍රිම ලෙස එම කලාප නැවත ආරෝපණය කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කරමින් පවතී. එමඟින්, භූගත ජලය තිරසාරව රටෙහි ආර්ථික සංවර්ධනය සඳහා හා සියලු දෙනාගේ ජීවිත සෞභාග්‍යවත් කර ගැනීමට, නිසි අයුරින් භාවිත කිරීමට හැකි වේ. ඒ සඳහා, ශ්‍රී ලාංකික අප ඔබ සියලු දෙනාගේ සහභාගිත්වය සහ සහයෝගය ජල සම්පත් මණ්ඩලය අපේක්ෂා කර සිටී.

සටහන
**ඉරෝෂිණී දීපිකා**


# භූගත ජලය ලබාගැනීමේදී ඔබ මේ පිළිබඳ සැළකිලිමත් වූවාද?

- නිසි ක්‍රමවේදයකට නල ළිං ඉදිකිරීම පිළිබඳ අවබෝධයක් ඔබට තිබේද?
- ඔබ නිවසක් හෝ ව්‍යාපාරික ස්ථානයක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීමේ දී එම ඉඩමෙහි ළිඳක් ඉදිකර ජලය ලබාගැනීමට බලාපොරොත්තු වන්නේ නම්, එහි ප්‍රමාණවත් භූගත ජලය පවතීද යන්න පිළිබඳ නිසි අවබෝධයක් තිබේද?
- මහා පරිමාණ කර්මාන්ත ශාලා, ව්‍යාපාරික හා කෘෂි කර්මාන්ත කටයුතු ආරම්භ කිරීමට පෙර ඒ සඳහා භූගත ජලය භාවිතා කරන්නේ නම්, අදාල ඉඩමෙන් එම ජල ප්‍රමාණය ලබා ගත හැකි බවට විශ්වාසයක් පවතීද?



වගකීමෙන් හා උසස් ප්‍රමිතියෙන් යුතු සේවාවන් සඳහා

## කතා කරන්න අපට...

අනුරාධපුර : 0252053005 පුත්තලම : 0322265208 මොණරාගල : 0552276160 යාපනය : 0212227268

### අපගේ සේවාවන්

- ✔ නල ළිං හෝ වල ළිං ඉදිකිරීමට සුදුසු ස්ථාන නිවැරදි විද්‍යාත්මක ක්‍රමවේද භාවිතා කර හඳුනා ගැනීම.
- ✔ සියලුම අවශ්‍යතා සදහා නිසි තාක්ෂණික ක්‍රමවේද භාවිතයෙන් නල ළිං ඉදි කර දීම.
- ✔ ජල ධාරිතා පරීක්ෂණ සිදු කර වාණිජමය කටයුතු හා මහා පරිමාණ කෘෂි කර්මාන්ත කටයුතු සදහා භාවිතා කරන ළිං වලින් ආරක්ෂිතව ලබාගත හැකි ජල ප්‍රමාණයන් නිර්ණය කරදීම.
- ✔ වාණිජමය කටයුතු සඳහා ඉදිකරන ලද නළ ළිං සඳහා ජල ධාරිතා පරීක්ෂණ සිදුකිරීමෙන් පසු ජල මනු සවිකිරීම හා නිසි පරිදි ජලය භාවිතා කරන ලෙස උපදෙස් දීම.
- ✔ පැරණි නල ළිං අලුත්වැඩියා සිදුකර දීම හා අත්පොම්ප සවිකරදීම.
- ✔ ජල සාම්පල විශ්ලේෂණය සිදුකිරීම (රසායනික, ක්ෂුද්‍ර ජීව හා බැරලෝහ).
- ✔ පස්. බොරළු,කළුගල් හා වැලි කැණීම් සිදු කිරීමේදී භූගත ජලයට සිදුවන බලපෑම් පිළිබඳ අධ්‍යනය සිදුකර අදාල නිර්දේශ ලබා දීම.
- ✔ මහා පරිමාණ කර්මාන්තශාලා, ව්‍යාපාරික කටයුතු හා කෘෂි කර්මාන්ත ව්‍යාපෘතිවල පාරසරික බලපෑම් ඇගයීම් වාර්තා සඳහා භූ ජල අධ්‍යයනය සිදුකර නිර්දේශ ලබාදීම.
- ✔ නල ළිං ඉදිකිරීමේදී ඇති වන සමාජ ගැටළු නිරාකරණය කිරීම සඳහා අදාල ආයතන සමග සම්බන්ධීකරණය සිදු කර ගැටළු විසදීමට කටයුතු කිරීම හා ලැබෙන පැමිණිලි අනුව අදාළ පාර්ශවයන් හා ආයතන සහභාගිත්වයෙන් ඒකාබද්ධ ස්ථානීය පරීක්ෂණ සිදුකර නිර්දේශ ලබා දීම.
- ✔ බාහිර විදුම් ආයතන ජල සම්පත් මණ්ඩලයේ ලියාපදිංචිය සිදුකර නල ළිං ඉදිකිරීම නියාමන කිරීම.
- ✔ භූගත ජල සම්පත් උකහා ගැනීම හා පාරිභෝජනය පාලනය කිරීම සඳහා වන නියාමන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම. (නල ළිං කැණීම හා පාරිභෝජනය පාලනය කිරීම)
- ✔ . භූගත ජලයේ ගුණාත්මක භාවය හා ප්‍රමාණාත්මක භාවය පිළිබඳ පර්යෂණ අධ්‍යයන සිදු කිරීම, භූ ගත ජලය කෘතිමව ආරෝපණය කිරීමට අදාල පර්යේෂණ සිදුකිරීම හා කාලීන නිර්දේශ ලබා දීම.
- ✔ භූගත ජලය තිරසාරව පැවැත්ම තහවුරු කිරීමට අවශ්‍ය කෙටි කාලීන හා දිගු කාලීන දත්ත දීප ව්‍යාප්තව එක්රැස් කිරීම, යාවත්කාලීන කිරීම හා එම දත්ත විශ්ලේෂණය කර අවශ්‍ය නිර්දේශ ලබා දීම.

**වැඩි විස්තර සඳහා www.wrb.gov.lk අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න.**

## ජල සම්පත් මණ්ඩලය

**(ජල සම්පාදන අමාත්‍යංශය)**
**2 ඒ, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,කොළඹ 07.**
**දුරකථන : 0112697050, 0112694835**
**ඊ-මේල් : gru@wrb.gov.lk**




# ශ්‍රී ලංකාවේ අංක එකේ සිංගර් වතුර පොම්ප

## සියලු අවශ්‍යතා සපුරන මාදිලි රැසකින්

ශ්‍රී ලාංකේය ගෘහස්ථ සහ කෘෂිකාර්මික අවශ්‍යතා සපුරාලීම උදෙසා සිය සමාජ වගකීමට උර දුන් සිංගර් ශ්‍රී ලංකා සමාගම වර්ෂ 1991දී මාදිලි දෙකකින් සිංගර් වතුර පොම්ප වෙළෙඳපොළට නිකුත් කිරීම ආරම්භ කෙරිණි.

ISO 9001:2015 තත්ව සහතික යටතේ නිෂ්පාදනය කෙරෙන සිංගර් වතුර පොම්ප තත්ත්වයෙන් උසස් බව තහවුරු කෙරෙන විශේෂත්වයන් රැසකින් සමන්විතය. ඒ අතර මල නොබැඳෙන සුදු යකඩ ඉම්පේලරය, දිගුකල් පවතින ජපන් බෙයාරිං, විදුලිය පිරිමසින තඹ කම්බිවලින් සමන්විත වේටරය සහ රොටරිය, ඈඩි තාපයට ඔරොත්තු දෙන වෝටර් සීල් ආදිය ප්‍රධාන වේ. සිංගර් ශ්‍රී ලාංකිකයන්ගේ ජනප්‍රියතම වෙළෙඳ නාමයයි. ඊට හේතුව අපේ රටේ ජනතාවගේ අවශ්‍යතා නිවැරදිව හඳුනා ගෙන, ඊට අවශ්‍ය නිවැරදිම විසඳුම් දීමේ අවබෝධය සහ හැකියාව ඔවුන් සතු වීමයි. ගෘහස්ථ හෝ කෘෂිකාර්මික අවශ්‍යතා සඳහා ද සිංගර් නිවෙසින් වතුර පොම්ප මාදිලි තිහකට අධික ප්‍රමාණයක් වෙළෙඳපොළට නිකුත් කොට ඇත්තේ ඒ එක් එක් අවශ්‍යතා සඳහා සුදුසුම විසඳුම ලබා දෙමිනි. සිංගර් ගෘහ වතුර පොම්ප, ජලය රැගෙන යන දුර, ලබාගත හැකි ජල ප්‍රමාණය ඇතුළු සියලු මූලික ගෘහ ජල අවශ්‍යතා සපුරාලන මාදිලි 12කින් වෙළෙඳපොළට ඉදිරිපත් කර ඇති අතර ධාරිතාව අශ්ව බල (horsepower) 0.5 සිට 2 දක්වා පරාසයක් තුළ ලබාගැනීමට අවස්ථාව සලසා දී ඇත. විශේෂයෙන් ගෘහ වතුර පොම්ප සඳහා වසර 5ක් දක්වා දීර්ඝ කළ සේවා වගකීමක්ද නොමිලේ ලබාදේ. නාගරික නිවාස සහ නිවාස ව්‍යාපෘතීන්හි පවතින අඩු පීඩන ජල ගැටලුව සඳහා නියම විසඳුම සපයන ලෙස ප්‍රෙෂර් පොම්ප මාදිලි දෙකක් ද ගෘහ වතුර පොම්ප අතරට එක් කොට තිබේ. වැඩි ගැඹුරකින් යුතු ළිංවලින් ජලය ලබා ගැනීමේදී භාවිත කිරීමට සුදුසු ජලයේ ගිල්වා තබමින් භාවිත කරන submersible පොම්ප හතරක් වෙළෙඳපොළට එළිදක්වා තිබේ. මෙම submersible පොම්ප අශ්වබල 1 සහ 2 බලයෙන්, පයිප්ප විෂ්කම්භය අඟල් 1 සහ 2 ලෙස අවශ්‍යතාවය අනුව තෝරා ගැනීමට අවස්ථාව ලබාදී ඇත.

සිංගර් නළ ළිං වතුර පොම්ප අශ්ව බල 0.5, 7.5 සහ 01 ලෙසින් බලගැවෙන මාදිලි හයකින් සියලු අවශ්‍යතා ආවරණය කරයි. නළ ළිඳෙහි බැඳීම අනුව පොම්පයේ විෂ්කම්භය අඟල් 3 හෝ 4 ලෙස තෝරා ගත හැකි අතර, සියලු පොම්ප සියයට සීයක් මල නොබැඳෙන වාත්තේවලින් නිෂ්පාදිතය. කෘෂිකාර්මික වතුර පොම්ප අශ්ව බල 3, 4, 5 බලයෙන් යුක්තව මිල දී ගත හැකි අතර, පයිප්පයේ විෂ්කම්භය අඟල් 1.25, 2, 3 ලෙස කෘෂි අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි තෝරා ගැනීමට අවස්ථාව උදා කර දී ඇත. විවිධ කෘෂි ව්‍යාපෘති අනුව බොහෝවිට විවිධ ධාරිතාවන් අවශ්‍ය වන බැවින් සිංගර් කෘෂි වතුර පොම්ප මාදිලි 8ක් වෙළෙඳපොළට හඳුන්වාදී තිබේ. ඒ අතරට අත් ට්‍රැක්ටරයට සම්බන්ධ කළ හැකි පයිප්ප විෂ්කම්භය අඟල් 2 සහ 3 පරිමාණයේ වතුර පොම්ප මාදිලි දෙකක් ද එක් කොට තිබේ.

සිංගර් වතුර පොම්ප සිංගර් කර්මාන්ත ශාලාව තුළ දී දේශීය කාර්මික ශිල්පීන් රාශියකට රැකියා උත්පාදනය කරමින් නිෂ්පාදනය කෙරෙන අතර, වසරකට මිලියන 1200ක අලෙවි අගයක්ද වාත කරයි.

සිංගර් නිෂ්පාදන කමන්ත අංගනයේ නිෂ්පාදනය කෙරෙන සියලු පොම්ප එකිනෙක තනි තනිව පරීක්ෂා කිරීමෙන් අනතුරුව පමණක් වෙළෙඳපොළට නිකුත් කරනු ලබයි. දිවයින පුරා විසිරුණු සිංගර් ප්‍රදර්ශනාගාර සහ බලයලත් වෙළෙඳ නියෝජිතයන්ගෙන් සිංගර් වතුර පොම්ප මිල දී ගැනීමේ පහසුකම් සලසා දී ඇති අතර සිංගර් සේවා ස්ථාන සහ නියෝජිතයන් මගින් සැලසෙන සිංගර් අසමසම අලෙවියෙන් පසු සේවාව පාරිභෝගිකයන්ගේ විශ්වාසය ඉහළින්ම තහවුරු කර ඇත.






# ගංගා සංරක්ෂණයට නෛතික වගකීම හා සමාජ වගකීම එක් කරන 'සුරකිමු ගංගා'



**පී. බී. හේමන්ත ජයසිංහ**
අධ්‍යක්ෂ ජනරාල්
මධ්‍යම පරිසර අධිකාරිය

ශ්‍රී ලාංකේය ගංගා සංරක්ෂණය කිරීමේ "සුරකිමු ගංගා" ජාතික වැඩසටහනේ සමාරම්භක මහෝත්සවය කතරගම, මැණික් නදිය අසල ඓතිහාසික රුහුණු කතරගම පූජා භූමි පරිශ්‍රයේදී ලෝක ජල දිනයට සමාගාමීව මාර්තු 22, එනම් අද දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, ගරු පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමා, ඌව පළාත් ආණ්ඩුකාරතුමා, ප්‍රාදේශීය දේශපාලන නියෝජිතයන්, කතරගම මහා දේවාලයේ බස්නායක නිලමේතුමන් ඇතුළු අදාළ රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වේ. ඌව පළාත් සමාරම්භක උත්සවයට සමගාමීව, සෙසු පළාත් සමාරම්භක උත්සව ඒ ඒ ගංගාධාරා ආශ්‍රිව ආණ්ඩුකාරවරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට ද කටයුතු යොදා ඇත.

"සෞභාග්‍යයේ දැක්ම" වත්මන් රාජ්‍ය ප්‍රතිපත්තියේ තිරසර පරිසර කළමනාකරණ ප්‍රතිපදාව යටතේ, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පයකට අනුව, "සුරකිමු ගංගා" තිරසර සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. ගංගා සංරක්ෂණය තුළින්; පොදු ජනතාවට පිරිසුදු පානීය ජල පහසුකම් ඇති කිරීමත්, පරිසර හා ජෛව සම්පත් ආරක්ෂා කිරීමත්, තිරසර ලෙස ආර්ථික හා සමාජ ප්‍රතිලාභ අත් කර ගැනීමත්, අපේක්ෂිතය. ගංගා සංරක්ෂණ ක්‍රියාවලියේදී, කාලයක සිට විවිධ මානව ක්‍රියාවන් හේතුවෙන් හායනයට පත් වූ ගංගා නැවත පුනරුත්ථාපනය කෙරෙන අතර, ගංගාවලට විවිධ රසායනික හා වෙනත් අපද්‍රව්‍ය බැහැරලීම වැළැක්වීම හා පාලනයත්, වැලි ඇතුළු ඛනිජ සම්පත් කැණීම් ඇඩි ලෙස නියාමනයටත්, ලක් කෙරෙනු ඇත. ඒ සමගම ගං ඉවුරු ඛාදනය මෙන්ම ගං ඉවුරු ආශ්‍රිත අනවසර ඉදිකිරීම් වැළැක්වීමත්, මුහුදු ජලය ගංගා වලට එක් වීම වැළැක්වීමත්, ආක්‍රමණශීලි ශාක විශේෂ වර්ධනය පාලනයත් සිදු කෙරේ.

### ජාතික පාරිසරික පනත හා ගංගා සංරක්ෂණය

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත ප්‍රකාරව දේශීය ජල තීරය/ අභ්‍යන්තර ජලාශවල ජල තත්ත්වය පවත්වා ගැනීමේ වගකීම මධ්‍යම පරිසර අධිකාරියට පැවරී තිබේ. ඒ අනුව නිරන්තරයෙන් ගංගාවල, ජලාශවල, ජල තත්ත්ව පරීක්ෂණ සිදු කරමින් ගංගා ජලයේ ගුණාත්මක තත්ත්වය පිළිබඳව මිනුම්ගත කිරීම් සිදු කරන අතර, කාරමික අපජලය මුදාහැරීම ජාතික පාරිසරික පනතේ ප්‍රමිති හා උපමානවලට යටත් කර ඇත. ජාතික පාරිසරික පනත ප්‍රකාරව 2019 නොවැම්බර් මස අංක 2148/ 20 ගැසට්පත්‍රය අනුව, 2019 අංක 1 දරන ජාතික පාරිසරික පනත (සංසරණ ජල තත්ත්ව) නියෝග කාලීනව විධිමත් කර හඳුන්වා දී ඇත. මේ මගින් කාණ්ඩ හයක් (06) යටතේ සංසරණ ජල තත්ත්ව ප්‍රමිති හඳුන්වා දී ඒ ඒ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කරන ලෙසට පළාත් පාලන ආයතන වෙත විධාන නිකුත් කිරීමේ බලය ද මධ්‍යම පරිසර අධිකාරියට පැවරී ඇත. මෙමගින් ඔස්සේ ජල සංරක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් පදනමක් ලැබී තිබේ. දේශීය ජල තීරය/ අභ්‍යන්තර ජලාශවල ජල තත්ත්වය පවත්වාගෙන යෑම සඳහා නෛතිකව ලැබී ඇති බලය ක්‍රියාත්මක කිරීමේදී ඇති වන විවිධ ගැටලු හා බාධාවන් ජයගෙන කටයුතු කිරීමේ විශේෂිත හැකියාවක් සුරකිමු ගංගාජාතික පරිසර සංරක්ෂණ වැඩසටහන යටතේ ලැබී තිබෙන බව මෙහිදී සඳහන් කළ යුතුය. මෙම වැඩසටහන සාර්ථක කරගැනීම සඳහා අමාත්‍යංශ මට්ටමේ සිට ප්‍රදේශීය මට්ටමේ ග්‍රාම නිලධාරි මෙන්ම පරිසර සංවිධාන දක්වා වන අදාළ වන සියලු ආයතන එක්කරන ශක්තිමත් යාන්ත්‍රණයක් සකස් කර ඇති අතර, මෙමගින් ගංගා සංරක්ෂණ ක්‍රියාවලියට අදාළ රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල සහය ලබාගැනීමට ද හැකියාව ලැබී ඇත. මෙකී යාන්ත්‍රනය ව්‍යුහගත වන්නේ, සුරකිමු ගංගා අන්තර් අමාත්‍යාශ මෙහෙයුම් කමිටුව, දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුව, ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුව වශයෙන් පහළ සිට ඉහළට ක්‍රිමයාත්මක කිරීමේ ශක්‍යතාවක් අති වන ආකාරයටය. අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජනාධිපති කාර්ය සාධන බලකාය සමග සුරකිමු ගංගා මෙහෙයුම් කමිටුව මගින් මාස 3කට වරක් ප්‍රගති සමාලෝචනය සිදුකෙරේ. ඒ අනුව සුරකිමු ගංගා වැඩසටහන මගින් ගංගා සංරක්ෂණයට නායකත්වයක් හා ශක්තිමත් පරිසරයක් ගොඩනැඟී තිබෙන බව සඳහන් කළ යුතු වේ.

### තිරසර සංවර්ධනය හා සුරකිමු ගංගා

ලෝකය මුහුණ දෙන පාරිසරික අභියෝග ජයගනිමින් ආර්ථික හා සමාජීය වශයෙන් සමෘද්ධිය ඇති කර ගැනීමේත්, මිහිමවගේ යහපැවැත්ම සුරක්ෂිත කිරීමේත්, පරමාර්ථය ඇතිව ලෝක නායකයින් විසින් ඇතිකරගත් අන්තර්ජාතික සම්මුතියට අනුව, 2030 වනවිට තිරසර සංවර්ධන අභිලාෂ මුදුන්පත් කරගැනීම පිණිස ලෝක ප්‍රජාව කැපවී කටයුතු කළ යුතුය. ඒ අනුව, ශ්‍රී ලංකාව ද මෙකී සමුම්තියට අත්සන් තබා ඇති බැවින් තිරසර සංවර්ධනය අත්කරගැනීමට කැපවිය යුතුවේ. වත්මන් රාජ්‍ය ප්‍රතිපත්තිය සකස් කර ඇත්තේ ද තිරසර සංවර්ධන මූලධර්ම මත පිහිටා බැවින් සුරකිමු ගංගා වැඩසටහන ද තිරසර සංවර්ධන වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක තලයට පමුණුවා ඇත. මෙවර මාර්තු 22 දිනට එනම් අද දිනට යෙදෙන ලෝක ජල දිනය ද ලෝක ජාතීන් විසින් සැමරීම සිදුකරන්නේ, තිරසර සංවර්ධන අභිමතාර්ථ 17න් සැමට ජලය හා සනීපාරක්ෂාවයත 6 වන අභිලාශය සාක්ෂාත් කරගැනිමට ලෝක ජනතාව බලගන්වන ප්‍රතිපත්ති හඳුන්වා දීම හා විවිධ ප්‍රාභයෝගික වැඩසටහන් ඔස්සේය.

වත්මන් ලෝක පිළිගැනීම මත තිරසර සංවර්ධනය අත්පත් කරගැනීම සඳහා ද තීරණාත්මක සාධකයක් වී ඇත්තේ ජලයයි. මෙවැනි යථාර්ථයක් යටතේ එක්සත් ජාතීන් විසින් ලෝක ජල දින තේමාව ලෙස නම් කර ඇත්තේ, "Valuing Water" ජලය අගය කිරීම යන්නයි. අපේ පැවැත්මට අනගි මෙහෙයක් ලබාදෙන, මාන ගණනාවකින් සංකීර්ණ හා දැවැන්ත වටිනාකමක් දෙන, යම් මිලක් පවතින්නේ නම්, එයට වඩා විශාල වටිනාකමක් ඇති ජල සම්පතේ බහුමානීය වටිනාකම අවබෝධ කරගැනීමේ කාලීන වැදගත්කමත්, එකී වැදගත්කම නිසි අර්ථයෙන් තේරුම්ගෙන ජලය සංරක්ෂණය සඳහා, ජල මූලාශ්‍රය සංරක්ෂණය සඳහා ගෝලීය ජන සමාජයේ සක්‍රිය මැදිහත්වීමක ප්‍රබල අවශ්‍යතාව මෙවර තේමාව මගින් ඇඩි ලෙස හඬගා කියයි. ජල සම්පතේ බහුමානීය වටිනාකම නොසලකා ක්‍රියාකරන්නේ නම්, එය වැරදි ජල කළමනාකරණයක නිරතවීමක් බව ද කියා සිටියි. "සුරකිමු ගංගා" ජාතික පරිසර සංරක්ෂණ වැඩසටහන; අත්‍යන්තයෙන්ම පරිසර පද්ධති, සජීවී ගංගා පරිසර පද්ධති, හා ජල සම්පතේ නිසි වටිනාකම බහුමානීය අර්ථයෙන් තේරුම් ගනිමින් අද පරපුරේත්, මතු පරපුරේත්, මූලික අයිතීන්, උරුමයන් සුරැකීමට දියත් කෙරෙන තිරසර සංවර්ධන ක්‍රියාදාමයක් බව මෙහිදි අවධාරණය කළ යුතු වේ

# ලොවම ජීවත් කරවන 'මැජික්' සංඝටකය!

අභ්‍යවකාශයේ ඇති මිලියන ගණනක් වන තාරකා සහ දහස් ගණනක් වන ග්‍රහලෝක අතුරින් නිල් පැහැයෙන් දිස් වන්නේ පෘථිවිය පමණක්මය. ඊට හේතුව මේ විශ්වයෙ අතිශය දුර්ලභ වස්තුවක් වන ජලය එහි පැවතීමයි. පෘථිවිය ජීවයෙන් පිරී ගිය අති සුන්දර ග්‍රහලෝකයක් බවට පත් වන්නේ ද ජලය පැවතීම හේතුවෙනි.

මේ ජලය හෙවත් හයිඩ්‍රජන් අණු දෙකකට ඔක්සිජන් අණුවක් එක් වීමෙන් හැදෙන රසායනික සංඝටකය අප මිහිතලය මත ඇති 'මැජික්එක' ලෙසින් හැඳින්වූවාට වැරැද්දක් නැත. මේ මැජික් එක මුළු ලොවම ජීවත් කරවන්නේය. මේ ලියන්නේ ඒ මැජික් එක ගැනය. අප ජීවත් කරවන මැජික්එක ගැනය.

ශ්‍රී ලංකාවේ අපි ඉතා වාසනාවන්ත වෙමු. ඒ අන් කිසිවක් නිසා නොව, අප රටේ පිහිටීම නිසාය. අපි මහාද්වීපයක කෙළවරෙහි එයට සම්බන්ධ නොවෙමින් මහා සාගර ජල තලයක රැඳී සිටිමු. මේ හේතුවෙන් අපට ගෝලීය දේශපාලනයේදී ලැබෙන අවධානය සහ වාසි විශාලය. එපමණක්ද නොව ස්වභාවිකවද අපි මෙතරම් පහසු ජීවිත අත්විඳින්නේ ද මේ පිහිටීම හේතුවෙනි.

අප පෙර සඳහන් කළ මහා ජලතලය පීරමින් එන සිසිල් සුළඟ වසරකට දෙවරක් මාස කීපයක් පුරා අප රටට යහමින් වර්ෂාව ලබා දෙන්නේය. අපේ රටේ ජනතාව පරම්පරා ගණනාවක් මේ වර්ෂාව අනුව තම ජීවිත හැඩගස්වා ගනිමින් වගා කටයුතු වල යෙදුණහ. ජලයේ වැදගත්කම ඔවුන්ට අමුතුවෙන් පහදා දිය යුතු වූයේ නැත. එහෙත් කාලානුරූපව පැමිණි නාගරීකරණය සහ කාර්මිකකරණය හේතුවෙන් ඔවුන්ගේ ජීවන රටාවන් බිඳ වැටෙන්නට විය. ඔවුන්ගේ දරු මුනුපුරන් ගොවිතැනින් ඉවත් වීම පමණක් නොව කලට වැසි නොලැබීම ද එයට ප්‍රබල හේතුවක් විය.

මේ තත්ත්වය ශ්‍රී ලංකාවේ අපට පමණක් නොව මුළු මහත් ලෝකයටම තර්ජනයක් විය. කලට වැසි නෙලැබීම මෙන්ම ප්‍රමාණවත් වර්ෂාවක් නොලැබීම ද මිනිස් ජීවිතවලට විවිධාකාරයෙන් තර්ජන එල්ල කරන්නට විය. මිනිස් ජීවිතයට ජලයේ ඇති වැදගත්කම සහ ජලය සුරැකීමේ වැදගත්කම, අවශතාව සම්බන්ධව මිනිසා අවධානය ද යොමු කිරීමට පටන් ගත්තේ ඉන්පසුවය. සැම වසරකම මාර්තු මස 22 වැනිදා ලෝක ජල දිනය සැමරෙන්නේ ද ඒ අනුවය. අපේ රටේ පෞරාණික රාජධානි මාරු වීම සලකා බැලුවහොත් අපේ රටේ ජනතාව සහ ජලය අතර සබඳතාව මනාව වටහා ගත හැකිය. රාජධානි එකින්එකට මාරු වීම සිදු වී ඇතතේ ජලාශ්‍රිත පරිසරය පාදක කර ගනිමිනි. අවසානයේ වැඩි ජනගහනයක් බස්නාහිර පළාතේ ස්ථාවර වන්නේ නිරිතදිග මෝසමෙන් වැඩිම වර්ෂාවක් ලබා ගන්නා සශ්‍රීකම ප්‍රදේශය එය වන බැවිනි. එහෙත් අප රටේ සමස්ත භූමි ප්‍රමාණය සලකා බැලුව හොත් ඒ අතරින් වැඩි ප්‍රමාණය අයත් වන්නේ වියළි කාලපයටය. එය සමස්ත භූමි ප්‍රමාණයෙන් සියයට හැත්තෑවකි. අපේ රටේ ජනතාවෙන් බහුතරයක් වර්ෂාව බහුල ප්‍රදේශයේ ස්ථිරව පදිංචි වුව ද කෘෂිකාර්මික ජීවන රටාවක් පවත්වා ගත්තේ ඔවුන් අතුරින් ඉතා සුළු පිරිසක් පමණි. කෘෂිකාර්මික ජීවන වෘත්තීන්හි නිරත සෙසු බහුතරය වියළි කලාපයේ එලෙසින්ම වගා කටයුතුවල නිරත වෙමින් දිවි ගෙවූහ. එබැවින්ම වාරිමාර්ග නිසි පරිදි පවතිවා ගැනීමත් කලට වේලාවට අහස් දිය ලැබීමත් මේ ජනතාවගේ ජීවන තත්ත්වයට මෙන්ම රටේ ආර්ථිකයටද ඉතා වැදගත් විය.

එහෙත් මෑතකාලීනව බැලූ විට පෙනී යන්නේ ශ්‍රී ලංකාවට ලැබෙන වර්ෂා රටාවේ පැහැදිලි වෙනස්කම් දක්නට ලැබෙන බවයි.

මීට පෙර කලට වේලාවට ලැබුණු වර්ෂාව වෙනුවට දැන් ඇත්තේ මාස ගණන් දිගට ඇදෙන නියඟයයි. 2019 ගෝලීය කාලගුණ අවදානම් දර්ශකයට අනුව කාලගුණ විපර්යාසවලට මුළු ලෝකයෙන්ම දෙවැනියට මුහුණ දීමට සිදු වන රට වන්නේ ශ්‍රී ලංකාවය. මේ ලියන මොහොත වන විටත් අප රටේ වියළි කලාපයේ මායිම් විශාල වෙමින් පවතින්නේය. වර්ෂාව ලැබුණ ද එය ප්‍රමාණවත් නොවීමෙන් වගා කටයුතු අසාර්ථක වන්නේය. මේ සියල්ලෙන් වඩාත් වැඩි පීඩාවකට මුහුණ දෙන්නේ සුළු පරිමාණ ගොවි ජනතාවය.

නියමිත පරිදි වර්ෂාව නොමැති වීමෙන් ඔවුන්ගේ වගා විනාශ වන අතර ඔවුන්ට ආදායම් අහිමි වේ. එමගින් සිදු වන්නේ ඔවුන් තවතවත් ණය බරෙහි ගිලී යැමය. එවැනි වූ පවුල් රාශියක් එක්වූ විට උද්ගත වන්නේ සමාජ ප්‍රශ්නයකි. අනික් අතට රටේ ජනතාවට ප්‍රමාණවත් ආහාර නිෂ්පාදනයක් සිදු නොවීමෙන් ආහාර ආනයනය කිරීමට සිදු වන අතර එමගින් ද සිදු වන්නේ රටේ ණය බර වැඩිවීමය.

මෙලෙස චක්‍රයක් සේ ක්‍රියාත්මක වන දුර්විපාක හේතුවෙන් බලපෑම සමස්ත රටටමය. මේ චක්‍රයෙන් ගොඩ ඒමට නම් අප ජලය ආරක්ෂා කර ගත යුතුය. එපමණක් ද නොව කාලගුණ විපර්යාස සිදුවීමට තුඩු දෙන ක්‍රියාකාරකම්වලින් බැහැර කල යුතුය. අප රකිනා මැජික් බලය හෙවත් ජලය ආරක්ෂා කර ගත යුතුය. ඒ සඳහා අප විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග රාශියකි. ඒ අතරින් අප විසින් ප්‍රථමයෙන්ම කළ යුතු වන්නේ අප සතු වනාන්තර ආරක්ෂා කර ගැනීමය. වර්ෂාව ලැබීමට මෙන්ම එය සාමාන්‍ය පරිදි ලැබීමට ද වනාන්තර ලබා දෙන්නේ ප්‍රබල පිටුබලයකි. මෝසම් වර්ෂාව පමණක් නොව සංවහන වර්ෂාව ලැබීමේදී ද වනාන්තර ඉටු කරන්නේ අත්‍යවශ්‍ය සේවයකි. වර්ෂාව ඇතිවීමට නම් ප්‍රමාණවත් ජලවාෂ්ප වලාකුළුවල එක්ව ඝනීභවනය විය යුතු අතර උත්ස්වේදනය මගින් මේ කාර්යයට සම්පූර්ණ දායකත්වය දෙන්නේ වනාන්තර විසිනි.

එහෙත් අපේ රටේ වනාන්තර දිගින් දිගටම විනාශ කෙරමින් පවතින්නේය. වර්ෂාව අඩුවීමට මෙය හේතුවක් වන බව වටහා ගැනීමටත් ක්‍රියාත්මක වීමටත් දැන් කාලය ප්‍රමාණවත්ය.

මේ වන විටත් එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල වැනි වැඩසටහන් සහ ශ්‍රී ලංකා රජය ද එක්ව ජලය සුරැකීමේ වැඩසටහන් මෙන්ම ජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් ද ක්‍රියාතමක කරමින් තිබේ. එහෙත් එය පමණක් ප්‍රමාණවත් නොවන්නේ දිනෙන් දින සමස්ත පෘථිවි ගෝලයම දේශගුණ විපර්යාස අර්බුදයක් කරා ගමන් කරමින් සිටින බැවිනි.

ජලය යනු අපට ජීවය සපයන මාධ්‍යයයි. ජලය නොමැතිව ජීවය නැත. ජලය හිඟ වීමෙන් මිනිසාට මුහුණ දෙන්නට සිදු වන දුෂ්කරතා ඉතා කටුකය. ජලය ආරක්ෂා කර ගත යුත්තේ සමෘද්ධිමත් ජීවිතයක් උදෙසාය.

සටහන
**ටිරෝනි වැවලගේ**

# වසර 2022දී පදක්කම් දිනන නව සැලසුම් යටතේ

# ක්‍රීඩා 7ක ක්‍රීඩකයන් 60කට මාසිකව ලක්ෂය බැගින් දීමනාවක්

sports.dinamina@lakehouse.lk

**ප්‍රින්ස් ගුණසේකර**

ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතාගේ අදහසක් අනුව වෘත්තීය මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් බිහි කර අන්තර්ජාතික පදක්කම් දිනාගත හැකි ලෙස ඔවුන් ශක්තිමත් කිරීම අරමුණින් මළල ක්‍රීඩා, බර ඉසිලීම, බොක්සිං, ජූඩෝ, බැඩ්මින්ටන්, පිහිනුම්, පැරා ආදී ක්‍රීඩා 7කට අදාළ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 60කට මාසිකව රුපියල් ලක්ෂය බැගින් දීමනාවක් පිරිනැමීමේ කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කරයි. මෙම ක්‍රීඩක ක්‍රීඩිකාවන් උසස් දක්ෂතා සංචිතයේ පුහුණුවීම් සිදුකරන අතර, ගිවිසුම් ප්‍රකාරව ඉදිරියේදී රුපියල් විසිපන්දහක තවත් පෝෂණ දීමනාවක් ද ගෙවීමට සැළසුම් කර ඇත.

වසර 2022දී පැවැත්වීමට නියමිත ආසියානු ක්‍රීඩා උලෙළ සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල මෙහි ප්‍රමුඛ ඉලක්කයක් වන අතර, පදක්කම් ලබාගත හැකි ක්‍රීඩක ක්‍රීඩිකාවන් මේ සඳහා තෝරාගෙන ඇත. ඉතිහාසයේ මුල් වරට මෙවැනි කොන්ත්‍රාත් ගිවිසුමක් ක්‍රියාත්මක වන අතර, ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමග ක්‍රීඩා අමාත්‍යාංශය වෙනුවෙන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් අමල් එදිරිසූරිය මහතා ගිවිසුම්වලට අත්සන් තැබුවේය.

ජාතික ක්‍රීඩා සභාව සහ බහුවිධ අංශවල පළපුරුදු වෘත්තිකයන්ගෙන් සමන්විත ජාතික උසස් දක්ෂතා කමිටුව සමග එක්ව මෙම වැඩසටහන ක්‍රියාවට නංවා ඇති අතර, මෙවර ඉතිහාසයේ ප්‍රථම වතාවට ජාතික ක්‍රීඩා සභාවේ නිර්දේශය මත, ඇමැතිවරයාගේ අනුමැතියෙන් පළමු අදියරේදී ක්‍රීඩා අමාත්‍යාංශ වැය ශීර්ෂයෙන් 20%ක මුදලක් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට සෘජුවම වැයකිරීමට පියවර ගෙන ඇත.

මෙතෙක් පැවති සාම්ප්‍රදායික ක්‍රමවේදය වූයේ ක්‍රීඩා අමාත්‍යාංශය වෙත වෙන් වන මුදලින් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට වැඩි මුදලක් වෙන් කිරීම හා ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් 6%ක් වැනි අඩු මුදලක් වෙන් කිරීමය. එහෙත් නව සංකල්පය යටතේ ඉදිරි වසර කිහිපය තුළ ක්‍රීඩා අමාත්‍යාංශය වෙත වෙන් වන මුදලින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට සෘජුවම 40% ක් දක්වා ඉහළ ප්‍රතිශතියක් වෙන් කිරීමට අපේක්ෂිතය.

ක්‍රීඩා අමාත්‍යාංශයේ නව සැලසුම් යටතේ ඉදිරියේ රටපුරා ජාතික ක්‍රීඩා සංකීර්ණ 4ක් ඉදි වන අතර, දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 12ක්, පාසල් පිහිනුම් තටාක සමග ක්‍රීඩාංගණ 8ක් හා වොලිබෝල් ක්‍රීඩා පිටි 22ක් ඉදිකිරීමට කටයුතු යෙදේ. එමෙන්ම ජාතික ඉහළ කාර්ය සාධන උපාය මාර්ග සහ ක්‍රීඩා කාණ්ඩ පද්ධතියක් සකස් කිරීමද සැලසුම් කොට ඇත. ඉහළ ක්‍රීඩා මධ්‍යස්ථාන සංවර්ධන ආකෘතීන් අතර දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණය ජාතික ක්‍රීඩා මධ්‍යස්ථානය ලෙස සංවර්ධනය වන අතර, පළාත් 9ක පළාත් කේන්ද්‍රීය ක්‍රීඩා මධ්‍යස්ථාන ස්ථාපිත වේ. මේවා සියල්ලම 'සින්තටික්' ධාවන පථ සහිත අංග සම්පූර්ණ ක්‍රීඩා මධ්‍යස්ථාන වනු ඇතැයි ඇමැති නාමල් රාජපක්ෂ මහතා ජාතික ක්‍රීඩා සභාවේ සැලසුම් ඉදිරිපත් කරමින් මෙයට පෙර පැවැසීය.

## බස්නාහිර පළාත් කැරම් අද ඇරඹේ

හතළිස් හය වැනි ජාතික මහා ක්‍රීඩා උලෙළ සඳහා බස්නාහිර පළාත නියෝජනය කරන කැරම් කණ්ඩායම් තෝරා ගැනීමේ කැරම් ශූරතාවලිය අද සිට (22) 24 දින දක්වා දෙල්කඳ ශ්‍රී ලංකා කැරම් සම්මේලන මූලස්ථානයේ දී පැවැත්වේ.

බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය සංවිධාන කරන මේ ශූරතාවලියට කොළඹ, කළුතර, ගම්පහ යන දිස්ත්‍රික්ක නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ දෙසීයකට අධික පිරිසක් සහභාගී වීමට නියමිතය.

## මතිවානන්-රණතුංග-වර්ණපුර උසාවි යන්න සූදානම්



කේ. මතිවානන්, නිශාන්ත රණතුංග හා බන්දුල වර්ණපුර මහත්වරු මාධ්‍ය හමුවේදී

**ප්‍රින්ස් ගුණසේකර**

ශ්‍රී ලංකා ක්‍රිකට් නිලවරණයට නාම යෝජනා දුන් නිසි සුදුසුකම් සපුරා නැති අයට එරෙහිව විරෝධතා ගොනු කළද, ඒවාට සාර්ථක ප්‍රතිචාරයක් නොදැක්වූ නිලවරණ කමිටුවට එරෙහිව අධිකරණයේ පිහිට පතන බව ක්‍රිකට් නිලවරණයට තරග කරන කේ. මතිවානන්, නිශාන්ත රණතුංග හා බන්දුල වර්ණපුර මහත්වරු පවසති. කේ. මතිවානන් හා නිශාන්ත රණතුංග මහතා කලක් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ප්‍රධාන තනතුරු දැරූ අතර, ශ්‍රී ලංකාවේ පළමු ටෙස්ට් නායක බන්දුල වර්ණපුර මහතා ක්‍රිකට් පරිපාලනයට එක් වීමේ අපේක්ෂාවෙන් සිටී.

ශ්‍රී ලංකා ක්‍රිකට් නිලවරණය මැයි මස 20 වැනිදා පැවැත්වීමට තීරණය වී ඇති අතර, ඒ සඳහා නාම යෝජනා භාර ගැනීම හා නාමයෝජනා සම්බන්ධ විරෝධතා විභාගය පසුගියදා අවසන් විය. සභාපති තනතුර සඳහා වත්මන් සභාපති ෂම්මි සිල්වා, මොහාන් ද සිල්වා, ජයන්ත ධර්මදාස හා කේ. මතිවානන් මහත්වරු නාම යෝජනා ඉදිරිපත් කර ඇති අතර, ලේකම් තනතුරට වත්මන් ලේකම් මොහාන් ද සිල්වා, නිශාන්ත රණතුංග, නලීන් අපොන්සු හා බන්දුල දිසානායක මහත්වරු ද, උප සභාපති තනතුරු දෙක සඳහා වත්මන් උප සභාපතිවරුන් වන රවීන් වික්‍රමරත්න, ජයන්ත ධර්මදාස මහත්වරුන් සමග බන්දුල වර්ණපුර, නලීන් අපොන්සු හා බන්දුල දිසානායක මහත්වරු සටනට පිවිස සිටිති.

මෙම නාමයෝජනා අතර සිටින කේ. මතිවානන්, නිශාන්ත රණතුංග හා බන්දුල වර්ණපුර මහත්වරුන් එක් කණ්ඩායමක් ලෙස තරගයට පිවිස සිටින අතර, ඔවුන්ගේ ප්‍රධානත්වයෙන් කොළඹ කොල්ට්ස් ක්‍රීඩාගාරයේදී පසුගියදා මාධ්‍ය හමුවක් ද පැවැත්විණි. එහිදී නිශාන්ත රණතුංග මහතා පැවැසුවේ තමන් විසින් ඉදිරිපත් කරන ලද විරෝධතාවන්ට නිලවරණ කමිටුව සාධාරණ ප්‍රතිචාර දක්වා නැති හෙයින් ක්‍රීඩා රෙගුලාසි අනුව අභියාචනා කමිටුව වෙත විරෝධතා ගොනු කිරීමට සූදානමින් සිටින බවය.

"දැනට සිටින ක්‍රිකට් විධායක සභාවට තවදුරටත් නිල වශයෙන් කටයුතු කිරීමට හැකියාවක් නෑ. නාමයෝජනා කැඳවීමත් සමග ඔවුන්ගේ ධූර කාලය අවසන් වෙනවා. මේ සම්බන්ධව ක්‍රීඩා ඇමැතිතුමාට ලිඛිතව කරුණු දැක්වූවා. ඒ ලිපිය නීතිපති දෙපාර්තමේන්තුවට යවා ඇති බව දැනගන්න ලැබුණා. අප බලා සිටිනවා සිදු වන්නේ කුමක්ද කියා. මෙයට පෙර 2017දී හා 2019දී මේ වගේ තත්ත්වයක් නිර්මාණය වුණා. එහිදී අප අභියාචනා කමිටුව හමුවේ කරුණු දැක්වූවා" රණතුංග මහතා පැවැසීය.

ශ්‍රී ලංකා ක්‍රිකට් පිල ටෙස්ට්, එක්දින හා විස්සයි 20 සියලු අංශවලින් පසු බැසීමට ලක්ව ඇතැයිද මෙයට පරිපාලනය වගකිව යුතුව ඇතැයි ද රණතුංග මහතා පෙන්වා දුන්නේය. "ක්‍රිකට් ක්‍රීඩා කරන රටක් ලෙස අප විශාල පසුබැසීමකට ලක්ව සිටිනවා. වසර 2015 වෙද්දී ලෝක ශ්‍රේණිගත කිරීම්වල ඉදිරියෙන් සිටි අප දැන් ටෙස්ට් තරගවල 6 වැනි ස්ථානයට, එක්දින තරගවලදී 10 වැනි ස්ථානයට හා විස්සයි 20 අංශයෙන් 10 වැනි ස්ථානයට වැටී සිටිනවා. මෙහෙම වෙලා තියෙන්නේ පරිපාලනය ක්‍රීඩාවට අනවශ්‍ය ඇඟිලි ගැසීම් කරන නිසයි. ඒ වගේම ක්‍රීඩකයන්ට අවශ්‍ය පහසුකම් දෙන්නේ නෑ. මේ තත්ත්වය තුල අපේ ක්‍රීඩකයන්ගෙන් අවශ්‍ය දේ ලබා ගන්න පාලකයන් සමත් වෙලා නෑ. අද කණ්ඩායමේ නායකයාට වීසා එකක් ලබා දෙන්න පරිපාලනය අසමත් වෙලා. මෙවැනි තත්ත්වයක් කිසි දිනෙක තිබුණේ නෑ" රණතුංග මහතා පැවැසීය.

පාසල් ක්‍රීඩාවට නිසි තැනක් ලබාදීම ක්‍රිකට් පරිපාලනයේ වගකීමක් බව බන්දුල වර්ණපුර මහතා පැවැසීය. "අපේ ක්‍රිකට් ක්‍රීඩා සමාජ මත නොවෙයි ඉදිරියට එන්නේ. ගොඩ නැගෙන පාසල් ක්‍රීඩාව හරහා අපේ රටේ ක්‍රිකට් ස්ථාවර වෙන්නේ . පාසල් ක්‍රිකට් ක්‍රීඩාංගණ දියුණු කරන්නේ නැත්තේ ඇයි. පාසල් පුහුණුකරුවන්ට ලබාදෙන උදව් මොනවාද? මේ අංශවලට උදව් නොකර පිටරටින් පුහුණුකරුවෙක් ගෙනත් ඔහුට විශාල මුදලක් ගෙවීම නොවෙයි අපේ ක්‍රීඩාව විය යුත්තේ" වර්ණපුර මහතා සඳහන් කළේය.

වත්මන් ක්‍රිකට් පරිපාලනය වෙනස් කිරීමට නොහැකි වුව හොත් තව තවත් විශාල පරිහානියක් ඉදිරියේදී සිදු වනු ඇති බවත්, ඒ සමගම ක්‍රිකට් ක්‍රීඩාව නැත්තටම නැතිවී යනු ඇති බවත් කේ. මතිවානන් මහතා පැවැසීය.

## වසර 16කට පසු එස්එස්සී විස්සයි20 ශූරතාව දිනයි






ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ලේකම් මොහාන් ද සිල්වා මහතා ජයග්‍රාහී එස්එස්සී කණ්ඩායමට කුසලානය පිරි නමමින්. තරගාවලි කමිටු සභාපති බන්දුල දිසානායක සහ දේශීය තරගහාර ප්‍රධානී චින්තක එදිරිමාන්න මහත්වරු ද මෙහි වෙති.


ක්‍රිෂාන් සංජුල

ක්‍රිෂාන් සංජුලගේ විශිෂ්ට පිතිහරඹය හේතුවෙන් ශ්‍රී ලංකා යුද හමුදා ක්‍රීඩා සමාජයට එරෙහිව ලකුණු 29ක ජයක් අත් කර ගනිමින් වසර 16කට පසු අන්තර් සමාජ විස්සයි20 ක්‍රිකට් ශූරතාව දිනා ගැනීමට එස්එස්සී ක්‍රීඩා සමාජය සමත් විය. මීට පෙර අවසන් වරට එස්එස්සී පිල අන්තර් සමාජ විස්සයි20 ශූරතාව දිනා ගනු ලැබුවේ වසර 2005දී අවිශ්ක ගුණවර්ධනගේ නායකත්වය යටතේය.

එස්එස්සී ක්‍රීඩා පිටියේ පසුගියදා පැවැති අවසන් මහා තරගයේ පළමුව පන්දුවට පහර දුන් එස්එස්සී පිල නියමිත ඕවර 20 අවසානයේ කඩුලු 5කට ලකුණු 146ක් රැස් කළ අතර, යුද හමුදා පිල ඕවර 19.2කදී ලකුණු 117කට දැවී ගියේය. එස්එස්සී පිල වෙනුවෙන් අගනා පිතිහරඹයක නිරත වූ කඩුලු රකින පිතිකරු ක්‍රිෂාන් සංජුල නොදැවී ලකුණු 71ක් රැස් කිරීමට සමත් විය. පිළිතුරු ඉනිම ක්‍රීඩා කළ යුද හමුදා පිල දැඩි පීඩනයට හසු කළ එස්එස්සී පිලේ හිමේෂ් රාමනායක කඩුලු 3ක් දවාලමින් දස්කම් දැක්වීය.

අවසන් තරගයේ වීරයා ලෙස ක්‍රිෂාන් සංජුල සම්මාන ලැබූ අතර, තරගාවලියේ වීරයා සම්මානය නුගේගොඩ ක්‍රීඩා සමාජයේ ප්‍රමුද් හෙට්ටිවත්තට හිමි විය. තරගාවලියේ හොඳම පිතිකරු ලෙස නුගේගොඩ ක්‍රීඩා සමාජයේ මුදිත ලක්ෂාන් ද, හොඳම පන්දු යවන්නා ලෙස රාගම ක්‍රිකට් සමාජයේ ඉෂාන් ජයරත්න ද සම්මාන දිනා ගත්හ.

## තලෙයිමන්නාරමේ සිට ඉන්දියාවට පිහිනා ලෝක වාර්තාවක්



**උතුරු පළාත් විශේෂ**
**රසුල දිල්හාර ගමගේ**

තලෙයිමන්නාරමේ සිට පෝක් සමුද්‍ර සන්ධිය හරහා ඉන්දියාවේ ධනුස්කොඩිය දක්වා පිහිනමින් ලෝක වාර්තාවක් තැබීමට ඉන්දියාවේ හයිද්‍රාබාද් තෙලන්ගානි ප්‍රදේශයේ 48 හැවිරිදි ගුරුවරියක වූ ශ්‍යාමලා කෝලි 20 දා සමත්විය.

ඇය කිලෝ මීටර් 30ක් වූ මේ දුර ප්‍රමාණය පැය 13 යි විනාඩි 40 කින් අවසන් කොට ධනුස්කොඩියේ අරිචල්මුනායි වෙරළට ළගා වූවාය.

පෝක් සමුද්‍ර සන්ධිය හරහා මේ වන විට 13 දෙනෙකු පිහිනා ලෝක වාර්තාවන් තබා ඇති අතර ඉන්දීයා පිහිණුම් ක්‍රීඩාකවක් විසින් මේ වාර්තාව තබා ඇත්තේ ප්‍රථම වතාවටය.



## පුත්තලමේ පාපැදි තරගයට අයැදුම්පත් කැඳවයි

**ඊ.සී.ප්‍රනාන්දු**
**මුන්නේශ්වරම සමූහ**

පුත්තලම දිසාවේ පාපැදි ක්‍රීඩාව ජනප්‍රිය කරවීමේ අරමුණින් පුත්තලම දිසාවේ පාපැදි ක්‍රීඩකයන්ට සහභාගි විය හැකි ආධුනික හා ජ්‍යෙෂ්ඨ පුරවැසි පාපැදි තරගයක් සඳහා වෙන්නප්පුව වෙන්පුර ස්පීඩ් පාපැදි සමාජය ඉල්ලුම් පත් කැඳවයි.

මෙම තරගාවලි ආධුනික (ස්ටැන්ඩර්ඩ්) හා වයස අවුරුදු 50 න් ඉහළ (රේසින්) වශයෙන් පැවැත්වේ. අප්‍රේල් මස 4 වන දින පෙරවරු 8 ට වෙන්නප්පුව ශ්‍රීමත් ඇල්බට් ඇෆ්. පීරිස් ක්‍රීඩාංගණය ඉදිරිපිටින් තරග ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.වෙන්නප්පුව කොළඹ පාර වයික්කාල දංකොටුව කිරිමැටියාන නාත්තණ්ඩිය මාරාවිල වෙන්නප්පුව ගමන් මාර්ගයයි. අධුනික තරගය සඳහා මෙම මාර්ගය ඔස්සේ වට තුනක් ද ජ්‍යෙෂ්ඨ සඳහා එක් වටයක් ධාවනය කළ යුතු වේ.

ජාතික හැඳුනුම් පත් පිටපත හෝ අනන්‍යතාව සහතික කරන ලිපියක් ද වෛද්‍ය සහතිකයක්ද සමග මර්තු මස 31 වන දිනට කලින් ඉල්ලුම් පත් එවිය යුතුයි. ජයග්‍රාහි විසි දෙනකු වෙත මුදල් ත්‍යාග පිරිනමනු ඇත.

තරගය සම්බන්ධ සියලු විස්තර 0777643808 හෝ 0774156707 යන දුරකතන මගින් ලබා ගත හැකිය.

## දකුණු අප්‍රිකාවේ ලීසල් අංක එකට



ඉන්දියානු කාන්තා පිල සමඟ පසුගියදා පැවැති සිවුවැනි එක්දින තරගයේදී ලකුණු 69ක් රැස් කළ දකුණු අප්‍රිකානු පිලේ ආරම්භක පිතිකාරිනිය ලීසල් ලී එක්දින පිතිකාරිනියන් අතර පෙරමුණ ගැනීමට සමත් වූවාය. ප්‍රසාද ලකුණු 773ක් ලබා ඇය පෙරමුණ ගනිද්දී ඊට පෙර එම ස්ථානයේ පසු වූ එංගලන්ත පිලේ ටැමී බියුමන්ට් දෙවැනි තැනට පත් වූවාය.

දකුණු අප්‍රිකාව වෙනුවෙන් කාන්තා එක්දින ශ්‍රේණිගත කිරීම්වල අංක එක ස්ථානයට පත් වූ පළමු පිතිකාරිනිය ලෙසත් ලීසල් වාර්තාපොතට එක් විය. ඔස්ට්‍රේලියාවේ මැග් ලැනින් නවතම ශ්‍රේණිගත කිරීම්වල තුන්වැනි තැන පසුවන අතර, බටහිර ඉන්දීය කොදෙව් දූපත් හි ස්ටෙෆානි ටේලර් සිවුවැනි තැන සිටී. එම ලැයිස්තුවේ පස්වැනි තැන පසුවන්නේ ඔස්ට්‍රේලියානු ක්‍රීඩිකා ඇලිසා හීලිය. ශ්‍රී ලංකාවේ චමරි අතපත්තු 12 වැනි ස්ථානයේ පසුවන අතර, යොවුන් පිතිකාරිනිය හර්ෂිතා මාධවී 43 වැනි ස්ථානයේ රැඳී සිටී.

## තිරසර සංවර්ධනය සඳහා වූ

# වසර 2030 න්‍යාය පත්‍රයට ශ්‍රී ලංකා-බංග්ලාදේශ එකඟතාව



## අගමැති මහින්දට බංග්ලාදේශයේදී ඉමහත් හරසර



තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා අදාළ දැනුම, අදහස්, නව්‍යකරණයන් බෙදාහදා ගැනීමට ශ්‍රී ලංකා - බංග්ලාදේශ අගමැතිවරු එකඟතාව පළ කරති.

සමෘද්ධිමත්, සාමකාමී, ස්ථාවර, සියල්ල ඇතුළත් සහ තිරසාර දකුණු ආසියානු කලාපයක අවශ්‍යතාව නායකයන් දෙදෙනා අවධාරණය කළ අතර, විවිධ උප කලාපීය සහ කලාපීය සහයෝගීතා යාන්ත්‍රණයන්හි සහයෝගීතාව පුළුල් කිරීමට සහ බිම්ස්ටෙක් (BIMSTEC), සාර්ක් (SAARC) සහ අයෝරා (IORA) යන සංසදවල ඉලක්කගත හා ප්‍රතිඵල මත පදනම් වූ කලාපීය ආර්ථික සහයෝගීතාව සඳහා එකඟතාව පළ විණි.

මහජන බංග්ලාදේශ ජනරජයේ අගමැතිනී ෂෙයික් හසීනා මහත්මියගේ ආරාධනයෙන් බංග්ලාදේශයේ ජාතියේ පියා වන බංගබන්දු ෂෙයික් මුජිබර් රහ්මාන් මහතාගේ ජන්ම ශත සංවත්සරය සහ බංග්ලාදේශයට නිදහස ලැබීම පිළිබඳ ස්වර්ණ ජයන්තිය සැමරීමේ උත්සවයට සහභාගි වීම සඳහා අගමැති මහින්ද රාජපක්ෂ මහතා පසුගිය දා (19) බංග්ලාදේශයේ රාජ්‍ය සංචාරයක නිරත විය. 2020 අගෝස්තු මාසයේ දී අග්‍රාමාත්‍ය ධුරයට පත්වීමෙන් පසුව, මහින්ද රාජපක්ෂ මහතා නිරත වූ පළමු විදෙස් සංචාරය මෙයයි.

මෙහිදී අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා සමඟ අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල් පීරිස්, කලාපීය සහයෝගිතා රාජ්‍ය ඇමැති තාරක බාලසූරිය, මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය ඇමැති අජිත් නිවාඩ් කබ්රාල්, බතික්, අත්යන්ත්‍ර රෙදිපිළි සහ දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය ඇමැති දයාසිරි ජයසේකර, ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ, අග්‍රාමාත්‍ය ලේකම් ගාමිණී සෙනරත්, විදේශ ලේකම්තුමා ජයනාත් කොළඹගේ මහත්වරු සහ ශ්‍රී ලංකා රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත ඉහළ පෙළේ නියෝජිත පිරිසක් එක් වූහ.

අගමැති මහින්ද රාජපක්ෂ මහතාව අග්‍රාමාත්‍ය ෂෙයික් හසීනා මහත්මිය පිළිගැනීමෙන් අනතුරුව ඪකාහි හස්රත් ෂාජලාල් අන්තර්ජාතික ගුවන්තොටුපළේ දී චාරිත්‍රානුකූල පිළිගැනීමක් ද සිදු කෙරිණි. මහින්ද රාජපක්ෂ මහතාට ගෞරව දැක්වීම පිණිස බංග්ලාදේශ අගමැතිනිය 19 වැනි දින රාජ්‍ය භෝජන සංග්‍රහයක් ද පැවැත්වූවාය.

1971 විමුක්ති යුද්ධයේ දී දිවි පිදූවන් සිහි කිරීම සඳහා බංග්ලාදේශයේ සාවාර්හි පිහිටුවන ලද ජාතික දිවි පිදුවන්ගේ ස්මාරකය වෙත ගොස් මහින්ද රාජපක්ෂ මහතා ඊට උපහාර දැක්වීය. එතුමා ජාතික දිවි පිදූවන්ගේ අනුස්මරණ පරිශ්‍රයේ දී පැළයක් ද රෝපණය කළේය. ඪකාහි බංගබන්දු අනුස්මරණ කෞතුකාගාරයේ දී බංග්ලාදේශ ජාතියේ පියා වන බංගබන්දු ෂෙයික් මුජිබර් රහ්මාන් මහතාගේ අනුස්මරණය වෙනුවෙන් උපහාර දැක්වීය.

අගමැති මහින්ද රාජපක්ෂ මහතා බංග්ලාදේශ ජනාධිපති මොහොමඩ් අබ්දුල් හමීඩ් මහතා හමු වූ අතර, මාර්තු 20 වැනි දින අගමැතිනී ෂෙයික් හසීනා මහත්මිය සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීය. බංග්ලාදේශ විදේශ ඇමැති ආචාර්ය ඒ. කේ. අබ්දුල් මෝමන් මහතා අගමැති මහින්ද රාජපක්ෂ මහතා හමු විය. මහින්ද රාජපක්ෂ මහතා, මාර්තු 19 වැනි දින ඪකාහි ජාතික පෙළපාළි පිටියේ දී පැවති විශේෂ වැඩසටහනේ 'ගෞරවනීය ආරාධිතයා' ලෙස අගමැතිනී ෂෙයික් හසීනා මහත්මිය ඉදිරිපිට දී බංගබන්දු අනුස්මරණ දේශනය පැවැත්වීය.

අගමැති මහින්ද රාජපක්ෂ මහතා සිය දේශනයේ දී ජාතියේ පියා වන බංගබන්දු ෂෙයික් මුජිබර් රහ්මාන් මහතාට සහ ස්වෛරී හා ස්වාධීන බංග්ලාදේශයක් බිහිවීම සඳහා තුඩු දුන් එතුමාගේ දූරදර්ශී නායකත්වයට මහත් සේ උපහාර දැක්වීය. 'සොනාර් බංග්ලා', 'සමෘද්ධිමත් ස්වර්ණමය බෙංගාලය' පිළිබඳ එතුමාගේ සිහිනය සැබෑකර ගැනීම සඳහා බංගබන්දු මහතාගේ සාරවත් උරුමය සාර්ථකව ඉදිරියට



ගෙන යෑම පිළිබඳව අග්‍රාමාත්‍ය ෂෙයික් හසීනා මහත්මියට ප්‍රශංසා කළේය.

වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද, මෙම අවස්ථාව අලංකාර කරමින් ඊට සහභාගි වීම සහ බංග්ලාදේශය සහ එහි ජනතාව කෙරෙහි එතුමා දක්වන සහයෝගිතාව ප්‍රකාශ කිරීම පිළිබඳ අගමැතිනී ෂෙයික් හසීනා මහත්මිය අගමැති මහින්ද රාජපක්ෂ මහතාට සිය ස්තුතිය පළ කළාය. අගමැති ෂෙයික් හසීනා මහත්මිය සහ අගමැති මහින්ද රාජපක්ෂ මහතා 2021 මාර්තු 20 වැනි දින ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත් වූ අතර, දෙරට අතර පවතින විශිෂ්ට ද්විපාර්ශ්වික සබඳතා සහ මිත්‍රත්වය පිළිබිඹු කරමින් එය මහත් උණුසුම් සුහදතාවයේ සලකුණු විය. නායකයෙන් දෙපළ බංග්ලාදේශ - ශ්‍රී ලංකා සබඳතාවල සියලු අංශ පිළිබඳ සාකච්ඡා කළ අතර, සමකාලීන ජාත්‍යන්තර හා කලාපීය පොදු අවශ්‍යතා පිළිබඳ ද සාකච්ඡා කළහ. ඉතිහාසය, සම්ප්‍රදාය, සංස්කෘතිය සහ දෙරට අතර පවතින පොදු සමානකම් රාශියක් පිළිබඳ ඔවුහු සිහිපත් කළහ. දෙරටේ ජනතාවගේ අන්‍යෝන්‍ය ප්‍රතිලාභය සඳහා ස්වෛරීභාවය, සමානාත්මතාව, මිත්‍රත්වය, විශ්වාසය සහ අවබෝධය මත පදනම් වූ ප්‍රයෝගික හා පරිණත ප්‍රවේශයකින් ද්විපාර්ශ්වික සබඳතා තව දුරටත් ශක්තිමත් කිරීම සඳහා ඔවුන්ගේ ස්ථිර කැපවීම නැවත අවධාරණය කෙරිණි.

බංග්ලාදේශයේ කොවිඩ් - 19 වසංගතය ඵලදායි ලෙස හසුරුවා ගැනීම සම්බන්ධයෙන් අගමැති මහින්ද රාජපක්ෂ මහතා අගමැතිනී ෂෙයික් හසීනා මහත්මියගේ නායකත්වය අගය කළේය. 'සාර්ක් කොවිඩ්-19 හදිසි අරමුදල' යටතේ ශ්‍රී ලංකාවට කොවිඩ් 19 ආශ්‍රිත වෛද්‍ය උපාංග ලබාදීම මඟින් රජය දැක්වූ සහයෝගයට ඒ මහතා ස්තුතිය පළ කළේය. ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 වසංගතය සමඟ සාර්ථක ලෙස කටයුතු කිරීමේ දී ආදර්ශවත් නායකත්වයක් ලබාදීම පිළිබඳ අගමැතිනී ෂෙයික් හසීනා මහත්මිය මහින්ද රාජපක්ෂ මහතාට ප්‍රශංසා කළාය. වසංගතය පැවති සමයේ දී එකිනෙකා වෙත දැක්වූ කොන්සියුලර් සහාය හා නැවත සිය රට පැමිණවීමේ සේවාවන් නායකයන් දෙපළම අගය කළහ.

අගමැතිනී ෂෙයික් හසීනා මහත්මිය මහින්ද රාජපක්ෂ මහතාගේ ජනතා හිතවාදී නායකත්වය, යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට ගන්නා ලද පියවර සහ ශ්‍රී ලංකාවේ සාධාරණ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා වූ දැක්ම අගය කළාය. ජාතික සමඟිගිය, සංහිඳියාව සහ සංවර්ධනය උදෙසා එතුමාගේ රජය දරන ප්‍රයත්නය ද එතුමියගේ ඇගයීමට ලක් විය. නායකයන් දෙපළම ඔවුන්ගේ රටවල ප්‍රජාතන්ත්‍රවාදය ආයතනිකකරණය කිරීම ද අගය කළහ.

අග්‍රාමාත්‍ය ෂෙයික් හසීනා මැතිනියගේ දූරදර්ශී නායකත්වය යටතේ පසුගිය දශකය තුළදී බංග්ලාදේශයේ සිදුවූ දැවැන්ත සමාජ ආර්ථික සංවර්ධනය සහ ආහාර ස්වයංපෝෂිතභාවය, දරිද්‍රතාවය තුරන් කිරීම, බලශක්ති උත්පාදනය, කෘෂිකර්මාන්තය, ග්‍රාමීය සංවර්ධනය, කාර්මීකරණය, සේවා අංශය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ඩිජිටල්කරණය, ආපදා කළමනාකරණය, කාන්තා සවිබල ගැන්වීම, දේශගුණික විපර්යාස අනුවර්තනය, යටිතල පහසුකම් සංවර්ධනය, අධ්‍යාපනය යනාදී ක්ෂේත්‍රවල ලබා ඇති ජයග්‍රහණ පිළිබඳ අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා ඇයට ප්‍රශංසා කළේය.

ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදයට එරෙහි සටනේ දී දැක්වූ නොසැලෙන සහායට සහ මෙම සන්දර්භය තුළ, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය (UNHRC) සහ එක්සත් ජාතීන්ගේ සංවිධාන සහ අන්තර්ජාතික සංවිධාන ඇතුළු ජාත්‍යන්තර වේදිකාවල දී ශ්‍රී ලංකාවට සහය දැක්වීම සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා අග්‍රාමාත්‍ය ෂෙයික් හසීනා මැතිනියට සහ බංග්ලාදේශ රජයට ස්තුතිය පළ කළේය. ජිනීවාහිදී පැවැත්වෙන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 46 වැනි සැසිවාරයේ දී බංග්ලාදේශය ශ්‍රී ලංකාව සමඟ සහයෝගයෙන් කටයුතු කරනු ඇතැයි ද අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා විශ්වාසය පළ කළේය.

රඛයින් ප්‍රාන්තයෙන් බලහත්කාරයෙන් අවතැන් කරන අසල්වැසි රටවල අවතැන් වූවන් සඳහා ශ්‍රී ලංකාව නිවාස සපයන අතර, අනුමත නීතිමය රාමු සහ නියමිත ක්‍රියාපටිපාටිවලට අනුකූලව කටයුතු කරමින්, ගැටලු විසඳීම සඳහා සැමවිටම එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ශ්‍රී ලංකාව කැප වී සිටී.

මෙහිදී රෝහින්ග්‍යා අර්බුදය විසඳීම සඳහා බංග්ලාදේශයට සහාය දෙන ලෙස බංග්ලාදේශ අග්‍රාමාත්‍යතුමිය අග්‍රාමාත්‍යවරයාගෙන් සහය ඉල්ලා සිටියාය.

ත්‍රස්තවාදය, ප්‍රචණ්ඩ අන්තවාදය සහ රැඩිකලීකරණය හේතුවෙන් බහුත්වවාදී සමාජවලට එරෙහිව පැන නගින තර්ජන හඳුනා ගනිමින්, දෙරටේම කලාපය තුළ සහ ඉන් ඔබ්බෙහි පවත්නා එවැනි අභියෝගයන්ට මුහුණ දීම සඳහා නායකයන් දෙපළ එක්ව කටයුතු කරන බවට ප්‍රතිඥා දුන්හ. මෙම සංකීර්ණ, පොදු ආරක්ෂක අභියෝගයන්ට මුහුණ දීම පිණිස ද්විපාර්ශ්වික සහයෝගීතාවට පහසුකම් සැලසීම සඳහා ඒකාබද්ධ ආයතනික යාන්ත්‍රණයක් සැකසීමට කටයුතු කිරීමට ඔවුහු එකඟ වූහ.

ත්‍රස්තවාදය සහ ප්‍රචණ්ඩ අන්තවාදයට එරෙහි බංග්ලාදේශයේ අත්දැකීම් 'සමස්ත සමාජයේ' ප්‍රවේශයක් හරහා බෙදා හදා ගැනීමට බංග්ලාදේශ අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් වූවාය.

දෙරට අතර අන්තර් ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කිරීමේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ මට්ටම ඇතුළුව ඉහළ මට්ටමේ හුවමාරු කිරීම් ඉහළ නැංවීමේ අවශ්‍යතාව පිළිබඳ අග්‍රාමාත්‍යවරුන් දෙපළම අවධාරණය කළහ. බංග්ලාදේශ - ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය පිහිටුවීම පිළිබඳ සඳහන් කරමින්, අලුතින් තේරී පත් වූ මන්ත්‍රීවරුන් සමඟ සංගමය පුනර්ජීවනය කිරීමට නායකයන් දෙදෙනා එකඟ වූ අතර, දෙරට අතර සබඳතා ගැඹුරු කිරීම සඳහා උත්ප්‍රේරක කාර්යභාරයක් ඉටු කිරීම සඳහා ව්‍යවස්ථාදායකයන් දිරිමත් කෙරිණි.

සමස්ත ද්විපාර්ශ්වික සබඳතා තව දුරටත් වැඩි දියුණු කිරීම සඳහා වැදගත් උත්ප්‍රේරකයක් ලෙස විදේශ කාර්යාල උපදේශන (FoC), ඒකාබද්ධ ආර්ථික කොමිෂන් සභාව (JEC), ආංශික ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම් (JWGs), ඒකාබද්ධ වැඩසටහන්/ වැඩ සැලසුම් ඇතුළුව දෙරට අතර පවත්නා ආයතනික යාන්ත්‍රණයන් යළි පණගැන්වීම පිළිබඳව නායකයන් දෙපළම අවධාරණය කළහ. මෙම සන්දර්භය තුළ, දෙරට අතර ද්විපාර්ශ්වික සබඳතා නිරන්තරයෙන් අධීක්ෂණය කිරීමේ අරමුණින් යුතුව දෙරටේ විදේශ අමාත්‍යවරුන්ගේ ප්‍රධානත්වයෙන් විස්තීර්ණ සහයෝගිතාව සඳහා ඒකාබද්ධ උපදේශන කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා නායකයන් දෙදෙනා එකඟ වූහ. මේ සම්බන්ධයෙන් වන අවබෝධතා ගිවිසුමක කෙටුම්පතක් කඩිනමින් බංග්ලාදේශ පාර්ශ්වය ඉදිරිපත් කරනු ඇත.

ද්විපාර්ශ්වික නිදහස් වෙළෙඳ ගිවිසුමක් (FTA) කරා යාම සඳහා දෙරට අතර අත්සන් තබා ඇති ආර්ථික හවුල්කාරිත්වය පිළිබඳ අවබෝධතා ගිවිසුම ගැන සඳහන් කරමින්, නායකයන් දෙදෙනා දේශපාලන සබඳතා සමඟ නොගැළපෙන ලෙස ඉතා පහළ මට්ටමේ විභවයක පවතින, ද්විපාර්ශ්වික වෙළෙඳාමේ සහජීවනය උපයෝගී කර ගැනීම සඳහා ද්විපාර්ශ්වික නිදහස් වෙළෙඳ ගිවිසුමට කඩිනමින් එළඹීමට ඇති කැපවීම යළිත් අවධාරණය කළහ. මේ සඳහා ද්විපාර්ශ්වික නිදහස් වෙළෙඳ ගිවිසුම පිළිබඳ ඒකාබද්ධ ශක්‍යතා අධ්‍යයනය වහා නිම කිරීමට නායකයන් දෙදෙනා එකඟ වූහ. මේ අතර, ද්විපාර්ශ්වික නිදහස් වෙළෙඳ ගිවිසුමෙහි පළමු පියවර ලෙස අනාගතයේ දී පුළුල් වෙළෙඳාමක්, ආයෝජන සහ සංචාරක ව්‍යාපාරයක් සඳහා අවස්ථා විවර කළ හැකි කෙටි නිෂ්පාදන ලැයිස්තුවක් සමඟින් ආරම්භ වන ද්විපාර්ශ්වික වරණීය වෙළෙඳ ගිවිසුමක් (PTA) සඳහා කටයුතු කිරීමට ඔවුහු එකඟ වූහ. වෙළෙඳාම පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමේ මීළඟ රැස්වීම නොබෝ දිනකින් පැවැත්වීමට දෙපාර්ශ්වයම එකඟ වූහ.

තීරුබදු නොවන බාධක හඳුනා ගැනීම හා ඉවත් කිරීම සහ අන්‍යෝන්‍ය වශයෙන් පිළිගත් ප්‍රමිති සරල කිරීම හා එකඟ කිරීම ඇතුළුව වෙළෙඳ පහසුකම් සැපයීම සඳහා පියවර ගැනීමට දෙපාර්ශ්වයම එකඟ වූහ. වෙළෙඳාම් කළ හැකි භාණ්ඩ ගොන්න විවිධාංගීකරණය කිරීමටත් වෙළෙඳ හා වාණිජ සබඳතාවලට නැවුම් ශක්තියක් එක් කිරීම සඳහා නව්‍ය ක්‍රම සොයා ගැනීමටත් දෙපාර්ශ්වයම එකඟ වූහ. මෙම සන්දර්භය තුළ දෙපාර්ශ්වයම එකිනෙක පාර්ශ්වයන්හි සෘණාත්මක ලැයිස්තුවලින් සෆ්ටා ගිවිසුම යටතේ පවතින අයිතම සංඛ්‍යාව තව දුරටත් අඩු කිරීමේ අවශ්‍යතාව අවධාරණය කෙරිණි. මෙම සන්දර්භය තුළ තාක්ෂණික සහයෝගිතාව පිළිබඳ බංග්ලාදේශ ප්‍රමිති සහ පරීක්ෂණ ආයතනය (BSTI) සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) අතර අවබෝධතා ගිවිසුම කඩිනමින් ක්‍රියාත්මක කිරීම පිළිබඳ අවධාරණය කෙරිණි. ඖෂධ අංශයේ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක විය හැකි සහයෝගීතාව සඳහන් කරමින් අග්‍රාමාත්‍යවරු දෙපළම බංග්ලාදේශයෙන් ගුණාත්මක ඖෂධ නිෂ්පාදන වැඩි ප්‍රමාණයකින් මිලදී ගැනීමට මෙන්ම, බංග්ලාදේශ ඖෂධ නිෂ්පාදන සඳහා ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පහසු කිරීම, සරල කිරීම හා කඩිනම් කිරීමට ද එකඟ වූහ.

නැව්ගත කිරීම අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක සහයෝගීතාවකට විභවයක් ඇති ප්‍රධාන අංශයක් ලෙස නායකයන් දෙදෙනා අවධාරණය කළ අතර, එමඟින් සම්බන්ධතාව වැඩි දියුණු කරමින්, දෙරට අතර සහ ඉන් ඔබ්බට ද්විපාර්ශ්වික වෙළෙඳාම සඳහා තව දුරටත් අවස්ථා විවෘත වේ. වෙරළබඩ නැව්ගත කිරීමේ ගිවිසුම සහ චැට්‍රෝග්‍රෑම් සහ කොළඹ අතර පෝෂක සේවා පිළිබඳ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටියේ (SOP) කෙටුම්පත පිළිබඳ සාකච්ඡා දියුණු මට්ටමක පවතින බව නිරීක්ෂණය කරමින්, ඒවාට ඉක්මනින් එළඹීමට ඔවුහු එකඟ වූහ. ඉතිරිව ඇති ගැටලු නිරාකරණය කිරීම සඳහා, නැව්ගත කිරීම පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමේ මීළඟ රැස්වීම් හා නාවික කටයුතු පිළිබඳ ලේකම් මට්ටමේ සාකච්ඡා ඉක්මනින් පැවැත්වීමට ද ඔවුහු උපදෙස් දුන්හ.

දෙපාර්ශ්වයම අන්‍යෝන්‍ය ප්‍රතිලාභය සඳහා ශ්‍රී ලංකා ව්‍යාපාරික ආයතන ගණනාවක් බංග්ලාදේශයේ ආයෝජනය කර ඇති බව දෙපාර්ශ්වයම සතුටින් සඳහන් කළහ. රෙදිපිළි, ගෙතූ ඇඳුම්, ලිනන්, සම්, ඖෂධ, කෘෂි පාදක කර්මාන්ත සහ වානේ සහ ඉංජිනේරු කටයුතු, තොරතුරු තාක්ෂණ, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ ආගන්තුක සත්කාර වැනි අංශ සඳහා ශ්‍රී ලාංකික ආයෝජන බංග්ලාදේශය වැඩි වශයෙන් පිළිගැනිණි. ඖෂධ, අගය එකතු කළ ඇඟලුම්, ආහාර සැකසුම්, සැපයුම් සේවා, සංචාරක කටයුතු හා තොරතුරු තාක්ෂණ සේවා යන අංශයන්හි නව අවස්ථා සොයා ගන්නා ලෙස ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයා බංග්ලාදේශ ව්‍යාපාරික අංශයට ආරාධනා කළේය. නායකයන් දෙපළම ද්විපාර්ශ්වික ආයෝජන ප්‍රවර්ධනය සහ ආරක්ෂණ ගිවිසුම කඩිනමින් අවසන් කිරීම දිරිමත් කළහ.



**ඉතිරි කොටස හෙට**

# වන විනාශය සෙවීමට විශේෂ කාර්ය බළකා ඒකකයක්



## ● ඇමැති ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල

**අසේල කුරුළුවංශ සහ මධ්‍යම පළාත් සමූහ**

වත්මන් රජය යටතේ වන විනාශ සිදු වන බවට සංවිධානාත්මකව ප්‍රචාරයක් ගෙන යමින් තිබෙන බව පැහැදිලිව පෙනෙන්නට ඇති බවත්, මේ පිළිබඳව විධිමත් ආකාරයෙන් සොයා බැලීමට විශේෂ කාර්ය බළකා ඒකකයක් කඩිනමින් පිහිටුවන බවත් ජනමාධ්‍ය ඇමැති,කැබිනට් ප්‍රකාශක ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා පවසයි.

ඇමැතිවරයා මේ බව පැවැසුවේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ඩිජිටල් ගෙවීමේ වැඩසටහනක් වන Lanka QR හඳුන්වා දීම නිමිත්තෙන් මහනුවර කැන්ඩි සිටි සෙන්ටර් හිදී පසුගියදා (20) පැවති උත්සවයකින් අනතුරුව මාධ්‍ය හමුවේ අදහස් දක්වමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.

'සත්‍ය වශයෙන් ම වන විනාශයක් සිදු වන්නේ නම්, ඊට එරෙහිව උපරිම ලෙස නීතිය ක්‍රියාත්මක කිරීමට රජය පසුබට වන්නේ නෑ. එසේ නැතිව දේශපාලන අරමුණු මුදුන් පමුණුවා ගැනීමට රජයට මඩ ගැසීම අරමුණින් කැලෑ එළි කරන බවට ව්‍යාජ මවා පෙන්වීමක් කරන්නට කවුරුන් හෝ උත්සාහ කරන්නේ නම්, ඒ සම්බන්ධයෙන් ද සොයා බැලීමක් කළ යුතුයි.

2015 ජනපතිවරණයට ප්‍රථම මේ ආකාරයෙන්ම රත්තරං අශ්වයන්, ලැම්බෝ ගිනි ඇතුළු ව්‍යාජ ලෙස නිර්මාණය කළ බොහෝ දේවල් ඉතා සැලසුම් සහගතව සමාජ ගත කර ජන මනස වෙනස් කිරීම ඔස්සේ යහපාලන ආණ්ඩුව බලයට පැමිණි බව කවුරුත් දන්නා කරුණක්. ඒවා සියල්ල බොරු බව ජනතාව දැන ගත්තේ මහින්ද රාජපක්ෂ මහතා පරාජයට පත්වීමෙන් පසුවයි. දැන් ක්‍රියාත්මක වෙමින් තිබෙන්නේ එහි දිගුවක් ද යන සැකය මතු වෙනවා. කෙසේ වුවත් සිදු වන බව කියන වන විනාශය සම්බන්ධව විධිමත් සොයා බැලීමක් රජය සිදු කරනවා. මේවායෙහි සත්‍ය අසත්‍ය බව ඉදිරියේදී ජනතාවට පැහැදිලිව දැන ගැනීමට හැකි වෙනවා.

තමන් පැහැර ගැනීමකට ලක් වූ බවට මාධ්‍යවේදියකු පැවසූ කාරණය සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වූ පොලිසිය එය මුළුමනින්ම සත්‍යයෙන් තොර පැමිණිල්ලක් බව අනාවරණය කරගෙන තිබෙනවා. මෙය පසුගිය ජනපතිවරණ සමයේ කරළියට පැමිණි කිඹුලා කෑ කතාවේ දෙවන කොටස බව පෙනෙන්නට තිබෙනවා. මේ සිදුවීම් සම්බන්ධ කුතුහලය දනවන තවත් කරුණු රැසක් හෙට අනිද්දා දැක ගැනීමට හැකි වෙයි.

කච්චතිව් දූපත ඉන්දියාවට දීම පිළිබඳ කිසිදු සාකච්ඡාවක් සිදුව නෑ. එහි අයිතිය සම්බන්ධයෙන් ඉන්දියාවේ දේශපාලන කණ්ඩායම් විවිධ අවස්ථාවල දේශපාලනික අවශ්‍යතාව මත ප්‍රකාශ සිදු කර තිබෙනවා. රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් ඒ සම්බන්ධ අපේ ස්ථාවරය ප්‍රකාශ කරනවා. ඉන්දියාව හිමිකම් ඉල්ලා සිටින කච්චතිව් දූපත සම්බන්ධයෙන් කිසිදු අවසන් තීරණයක් ගෙන නෑ. ඉන්දියාවේ වරින් වර බිහිවන දේශපාලනික සන්ධිස්ථානවලදී ඔවුන් එම දූපත සිය දේශපාලන මාතෘකාවක් බවට පත් කර ගන්නවා.'

මහනුවර පුරපති කේසර සේනානායක, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සභාපති කේෂලා ජයවර්ධන, ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් හා පියවීම් අංශයේ අධ්‍යක්ෂ ධර්ම ශ්‍රී කුමාරතුංග, QR බේතය හඳුන්වාදීමේ කමිටුවේ සභාපති, සණස සංවර්ධන බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී තිලක් පියදිගම, මහනුවර කැන්ඩි සිටි සෙන්ටර් කළමනාකාර අධ්‍යක්ෂ තුසිත විජයසේන මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට සහභාගි වූහ.

# රට ස්වයංපෝෂිත කිරීමේ විශේෂ වැඩපිළිවෙළක් අනුරපුරින් ඇරඹීමට පියවර

## ● ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ

**නදී මාණික්කගේ**



සත්ත්ව නිෂ්පාදන සහ බඩඉරිඟුවලින් රට ස්වයංපෝෂිත කිරීමට විශේෂ වැඩපිළිවෙළක් අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් ආරම්භ කිරීමට කෘෂිකර්ම ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ මහතා පියවර ගෙන තිබේ.

ඒ අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජීවන තත්ත්වය නගාසිටුවීමට කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය (SAPP) පියවර ගෙන ඇත.

ගම් කුකුළන් ඇති කිරීමට මේ යටතේ රුපියල් මිලියන 78ක ආධාර පවුල් 500කට පිරිනැමෙන අතර, සත්ත්ව නිෂ්පාදන සිදු කිරීමට, අලෙවි කිරීමට අවශ්‍ය උපදේශනය සහ තාක්ෂණය ද මේ යටතේ පිරිනැමේ.

ඉදිරියේදී රජරට බඩඉරිඟු ගොවීන් 5000ක් නගාසිටුවීමට පියවර ගෙන ඇති අතර, ආනයනය නතර කර නවීන තාක්ෂණය, නවීන යන්ත්‍ර සූත්‍ර, 50%ක බීජ සහනාධාර ඇතුළු රජයේ ආධාර යටතේ දේශීය ගොවියාට හොඳ මිලක් සාදා දී බඩඉරිඟුවලින් රට ස්වයංපෝෂිත කිරීමට කටයුතු සකස් කරනු ලැබේ.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ කරන ලද නිරීක්ෂණ චාරිකාවකින් පසු කරන ලද සාකාච්ඡාවකින් අනතුරුව ඇමැතිවරයා මේ තීරණ ගෙන ඇත.

ගොවියාට සියලු පහසුකම් රජය දෙන අතර, වගා කොට රටේ ජාතික නිෂ්පාදනය වැඩි කිරීමේ කාර්යය ගොවියා විසින් සිදු කළ යුතු බවත්, යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමේදී ගොවියාගේ ඉල්ලීමට අනුව එය සිදු කරන ලෙසත් ඇමැතිවරයා නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

මේ යටතේ දිවයිනේ අනෙකුත් ප්‍රදේශවල ගොවීන් 7000කට ද ආධාර පිරිනැමෙන අතර, බීජවල ගැටලු, කුඩා වාරි ගැටලු, ඇළ මාර්ග ගැටලු, බැංකු ණය ගැනීමේ දුෂ්කරතා ආදී ගොවි සංගම් නියෝජිතයන් ඉදිරිපත් කරන ගැටලු සියල්ල අදාළ ආයතන සම්බන්ධීකරණය කරමින් විසඳුම් දෙනු ලැබීය.

ගොවිජන සේවා මධ්‍යස්ථානයකට එක බැගින් වැව්වල පාසි ඉවත් කිරීමේ යන්ත්‍ර දෙන බව ද, රුපියල් මිලියන 09ක වියදමින් වියළීමේ යන්ත්‍ර 02ක් දීමට ද ඇමතිවරයා මෙහිදී තීරණය කළේය.

# විපක්ෂය මොන නාටක රඟ දැක්වූවත් ආණ්ඩුවේ ගමන් මඟ නවත්වන්න බෑ

## ● රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා

**චන්දිමා කරුණාරත්න**



විපක්ෂය විවිධ නාටක රඟ දැක්වුවද ආණ්ඩුවේ ගමන් මඟ නතර කළ නොහැකි බවත්, රටේ සංවර්ධනය අඛණ්ඩව ඉදිරියට ගෙන යන බවත්, ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගැනීමට පසුබට නොවන බවත් ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා මහතා සඳහන් කරයි.

රාජ්‍ය ඇමැතිවරයා මේ බව සඳහන් කළේ පසුගියදා (19) බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ආසනයේ, හල්පේ දිඹුල්ගස්තැන්න මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීමේ අවස්ථාවට සහභාගි වෙමිනි.

මේ යටතේ සංවර්ධනය වන දුර ප්‍රමාණය කිලෝ මීටර් 2.40කි. ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 26කි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැතිවරයා මෙසේ ද කීය.

'අපට මතකයි, ගානියා බැනිස්ටර් නාටකය. ඒ වගේම පසුගියදා මාධ්‍යවේදියකු පැහැරගෙන යෑමේ නාටකය. දේවානී නාටකය. මේ සියලු දේ සිදු කරමින් සමාජයේ අසත්‍ය පැතිරවීමට විපක්ෂය උත්සාහ කළත් එම අසත්‍ය පරාජයට පත්ව තිබෙනවා. මෙමගින් පෙන්නුම් කරන්නේ විපක්ෂයේ බංකොළොත්භාවය. ඔවුන්ට අවශ්‍ය වී තිබෙන්නේ රටේ සංවර්ධනයත්, ජන ජීවිතයත් අවුල් කර එයින් දේශපාලන වාසි ගන්න.

මහ බැංකු බැඳුම්කර වංචාව වගේම පාස්කු දා ප්‍රහාරය වුණේ යහපාලන කාලයේ. ඒත් අද එයාලා අහනවා මහ මොළකාරයා ඇල්ලුවාද කියලා. අප දැන් එක එක්කෙනා අල්ලගෙන යනවා. මහ බැංකු බැඳුම්කර වංචාවට චෝදනා ලැබ සිටින අර්ජුන් මහේන්ද්‍රන් ලංකාවට ගෙන්වීමට කටයුතු කරනවා. පාස්කු දා ප්‍රහාරය මෙන්ම බැඳුම්කර වංචාවට සම්බන්ධ වූ සියලු දෙනාට රටේ පවතින නීතිය අනුව දඬුවම් දීමට කටයුතු කරනවා. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා උපදෙස් දී තිබෙන්නේ පරිසරය ආරක්ෂා කර ගනිමින් සංවර්ධන කටයුතු සිදු කරන්න කියලා. අප සෑම සංවර්ධනයකදීම ගස් සිටුවන්න කටයුතු කරනවා. අපේ අමාත්‍යාංශය විසින් මග දෙපස තුරු සෙවණ ඇති කිරීමට පැළ මිලියන 2ක් සිටුවීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක කර තිබෙනවා.'

ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව් ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය ඇමැති අනුරාධ ජයරත්න, බදුල්ල දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපති සුදර්ශන දෙනිපිටිය, පාර්ලිමේන්තු මන්ත්‍රී චාමර සම්පත් දසනායක, ඌව පළාත් මාර්ග අධ්‍යක්ෂ ගලප්පත්ති මහත්වරුන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට සහභාගී වී සිටියහ.

# පළාත් සභා පනතට සංශෝධන ගෙන එන්නේ නම් සියලු පක්ෂ සමඟ සාකච්ඡා කර අදහස් විමසිය යුතුයි

## ● විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ලක්ෂ්මන් කිරිඇල්ල

**අසේල කුරුළුවංශ**



පළාත් සභා පනතට සංශෝධන ගෙන එන්නේ නම්, එය කළ යුත්තේ පාර්ලිමේන්තුවේ සියලු පක්ෂ සමඟ සාකච්ඡා කර ඔවුන්ගේ අදහස් විමසීමෙන් පසුව බව විපක්ෂයේ ප්‍රධාන සංවිධායක, සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂ්මන් කිරිඇල්ල මහතා පවසයි.

ඒ මහතා මේ බව පැවැසුවේ විපක්ෂ නායක කාර්යාලයේදී පසුගියදා පැවති මාධ්‍ය හමුවකදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

'යහපාලන ආණ්ඩුව දහ නව වැනි ව්‍යවස්ථා සංශෝධනය ගෙන ආවේ පාර්ලිමේන්තුවේ සියලු පක්ෂ සමඟ සාකච්ඡා කරලා. ඒත් වත්මන් ආණ්ඩුව විසි වන ව්‍යවස්ථා සංශෝධනය ගෙන ආවේ විපක්ෂය සමඟ සාකච්ඡා නොකර හිතුවක්කාර ලෙස. මොවුන් ඒ ආකාරයෙන්ම පළාත් සභා පනතට සංශෝධන ගෙන ඒමට ද උත්සාහ කරනවා.

සකස් කරන බව කියන නව ව්‍යවස්ථාවට අදහස් ඉදිරිපත් කරන ලෙස ආණ්ඩුව කළ දැනුම් දීමට ප්‍රතිචාර දක්වමින් සමගි ජන බලවේගය මුළු පාර්ලිමේන්තුවම ව්‍යවස්ථාදායක සභාවක් හෝ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් බවට පත් කරන ලෙස දැනුම් දුන්නා. නමුත් ඔවුන් මේ යෝජනා දෙකටම අකමැති වුණා.

මේ සඳහා රජය පත් කර තිබෙන්නේ ඔවුන්ට පෞද්ගලික හිතවත්කම් ඇති නීතිඥ මහත්වරුන්. සමගි ජන බලවේගයෙන් ඉදිරිපත් කළ නීතිඥ මහත්වරුන්ට ඔවුන් ප්‍රකාශ කර තිබෙන්නේ 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් ආණ්ඩුවේ එකඟතාවක් නොමැති බවයි. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා මේ නිසා එම කාරණය හැර සෙසු කරුණු පිළිබඳව යෝජනා ඉදිරිපත් කරන ලෙස සමගි ජන බලවේගයේ නීතිඥවරුන්ට දැනුම් දී තිබෙනවා.

සීනී වංචාවෙන් කෝටි 1600ක පමණ පාඩුවක් සිදුව තිබෙන බව මහ බැංකුව ප්‍රකාශ කරන්නේ නම්, තවත් ඒ සම්බන්ධව පරීක්ෂණ අවශ්‍ය නෑ. එනිසා ඉක්මනින් අදාළ අයට එරෙහිව නඩු පවරන ලෙස රජයට කියනවා. යහපාලන සමයේ බැඳුම්කර ගනුදෙනුව සම්බන්ධයෙන් නඩු පැවරීම නිසා එම සමාගම්වල බැංකු ගිණුම් සීල් තැබීමට හැකි වුණා. එම ගිණුම්වල අදටත් රුපියල් කෝටි 1200ක් රඳවා තබා තිබෙනවා.'

# දේශීය කෘෂි භෝග නිෂ්පාදනය ශක්තිමත් කළේ වත්මන් ජනපති

## රාජ්‍ය ඇමැති සිරිපාල ගම්ලත්

**මහින්ද අලුත්ගෙදර**



ආහාර ආනයනය කිරීමට වැය කරන අතිවිශාල ධනය මේ රටේ ගොවි ජනතාවට ලැබෙන ආකාරයෙන් දේශීය කෘෂි ආහාර භෝග නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කළේ වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා බව මහවැලි කලාප ආශ්‍රිත ඇළවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය ඇමැති සිරිපාල ගම්ලත් මහතා ප්‍රකාශ කරයි.

රාජ්‍ය ඇමැතිවරයා මේ බව කියා සිටියේ මහවැලි ඊ කලාපයට අයත් කොත්මලේ සහ උඩ පළාත ප්‍රදේශවල මහවැලි ජනපදිකයන්ගේ ඉඩම් ගැටලුවලට විසඳුම් දීමට පැවති ජංගම සේවා වැඩසටහනකට සහභාගි වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැතිවරයා මෙසේ ද කීය.'මෙරට නිෂ්පාදනය කළ හැකි ආහාර ද්‍රව්‍ය 16කට ආනයනය සීමා පැනවීමෙන් ජනාධිපතිවරයා අපේක්ෂා කළේ දේශීය ගොවි ජනතාවට සිය නිෂ්පාදන සඳහා හොඳ මිලක් දීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමයි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ උපදෙස් හා මඟ පෙන්වීම මත මහවැලි කලාප ජනතාවගේ ඉඩම් ආරවුල් විසදීමට කඩිනම් ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා.

# ඕනෑම රටකට උතුරු නැඟෙනහිරත් ආයෝජන අවස්ථා සලසා දිය යුතුයි

## ශ්‍රී ලංකාවේ භාරතීය ජනතා පක්ෂයේ නායක වේලුසාමි මුත්තුසාමි



**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

ලෝකයේ ඕනෑම රටකට ශ්‍රී ලංකාවේ මෙන්ම උතුරු නැඟෙනහිර පළාත්වලත් විවිධ ආයෝජන කිරීමට සහ ව්‍යාපාර ආරම්භ කිරීමට අවස්ථාව සලසා දිය යුතු බව ශ්‍රී ලංකාවේ භාරතීය ජනතා පක්ෂයේ නායක වේලුසාමී මුත්තුසාමී මහතා පැවැසීය.

ඒ මහතා මේ බව පැවැසුවේ යාපනයේ මාධ්‍ය සමාජ ශාලාවේ පෙරේදා (20) පැවති සාකච්ඡාවකදීය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.'ශ්‍රී ලංකාවේ යුද්ධයෙන් විනාශයට පත් වූ සියලු ප්‍රදේශ සංවර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුයි. මේ රටේ දේශපාලන පක්ෂ විශාල සංඛ්‍යාවක් තිබෙනවා. නමුත් ඒ පක්ෂ සියල්ල අතර මුල් දහයට පැමිණීමට ශ්‍රී ලංකාවේ භාරතීය ජනතා පක්ෂයට කිසිදු වුවමනාවක් නෑ. අපේ පක්ෂයට අවශ්‍යව තිබෙන්නේ බාල පරම්පරාවට අධ්‍යාපන, සංස්කෘතික සහ ක්‍රීඩා ආදී අංශවලින් ඉහළට යෑමට අවස්ථාවක් සලසා දී එයින් යහපත් සමාජයක් බිහි කිරීමයි.

# මානව හිමිකම් ආරක්ෂා කළොත් ලංකාවට පක්ෂව රටවල් රැසකින් ඡන්දය ලැබෙනවා

## ● ජනතා විමුක්ති පෙරමුණේ ජාතික සංවිධායක බිමල් රත්නායක

**නදී මාණික්කගේ**



මානව හිමිකම් ආරක්ෂා කළොත් ලංකාවට පක්ෂව රටවල් බොහොමයකින් ඡන්දය ගැනීමට හැකි බව ජනතා විමුක්ති පෙරමුණේ ජාතික සංවිධායක බිමල් රත්නායක මහතා පසුගියදා (19) පැවති මාධ්‍ය හමුවේදී කියා සිටියේය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද පැවැසීය.

'එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ මානව හිමිකම් කොමිෂන් සභාව 60-252 කියන යෝජනාවෙන් ස්ථාපිත කර තිබෙනවා. මෙයට නියෝජිතයන් පත් කරන්නේ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ ඍජු රහස්‍ය ඡන්දයකින්. මහා මණ්ඩලයේ සිටින රටවල් 193ටම මේ සඳහා ඉදිරිපත් වෙන්නත්, ඡන්දය දෙන්නත් පුළුවන්. මේ අනුව රටවල් 47ක් වසර තුනක කාලයකට සාමාජිකයන් බවට පත් වෙනවා. ලෝක මානව හිමිකම් කොමිසම 2006දී පිහිටුවීමේදී රටවල් 117ක් ඡන්දය දුන්නා. ඒ රටවල් අතර, ශ්‍රී ලංකාවත් ඉන්නවා. මේ කවුන්සිලයට ලෝකයේ සෑම කලාපයකින්ම මහද්වීප සියල්ලම නියෝජනය වන පරිදි රටවල් 47ක් තේරී පත් වෙනවා. මේ සාමාජික සියලුම රටවල්වල මානව හිමිකම් සම්බන්ධව නිරීක්ෂණවලට මැදිහත්වී වාර්තා දෙනවා.

ලංකාවේ මානව හිමිකම් පිළිබඳ ප්‍රශ්නය සාකච්ඡා කරන්න පටන් ගන්නේ 2009 මැයි 26 වැනිදා 1/11 කියන යෝජනාවෙන්. එවකට සිටි එක්සත් ජාතීන්ගේ මහ ලේකම් බැංකි මූන් සහ ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා ඒකාබද්ධ නිවේදනයක් නිකුත් කර ජාත්‍යන්තර මානුෂීය නීති සහ මිනිස් අයිතීන් උල්ලංඝනයවී ඇත්නම් ඒ පිළිබඳව පරීක්ෂා කිරීමට එකඟවී තිබෙනවා. ඒ පිළිබඳව සොයා බැලීමට එකඟවීම නිසා ශ්‍රී ලංකාවට අදාළව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ විශේෂ යෝජනා 2012 සිට එන්න පටන් ගන්නවා. 2012දී 2/19, 2013දී 2/23, 2014දී 1/25, 2015දී 1/30, 2017දී 1/37, සහ 2019දී 1/40 වශයෙන් ශ්‍රී ලංකාව සම්බන්ධව විශේෂ යෝජනා විවිධ රටවලින් ඉදිරිපත් කර තිබෙනවා. 2009 යුද්ධය අවසන් වෙලා සැප්තැම්බර් මාසයේදී ඉදිරිපත් වූ මූලික යෝජනාව හැරුණාම අනෙක් සියලුම යෝජනා ලංකාවට විරුද්ධව ඉදිරිපත් කළ ඒවා. ඒ යෝජනා ගණනාවකින් ලංකාව පරාජයට පත් වෙලා තිබෙනවා. 2015 ඉදිරිපත් කළ යෝජනාවට ලංකාව අනුග්‍රහය දැක්වීම නිසා ඡන්ද විමසීමක් අවශ්‍ය වුණේ නෑ.

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය නියෝජනය කරන රටවල් 41ක් අත්සන් කර පසුගිය මාර්තු මස 16 වැනිදා මානව හිමිකම් කවුන්සිලයට යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ ඉදිරිපත් කළ යෝජනාව පිළිබඳව මාර්තු මස 23 වැනිදා ඡන්දය විමසනවා. යෝජනාවේ ඉදිරිපත් කර තිබෙන කරුණුවල හරි වැරැද්ද නොවෙයි යෝජනා ඉදිරිපත් කර තිබෙන පසුබිම ගැන සලකා බලන්න ඕනෑ. මේ ඉදිරිපත් කර තිබෙන යෝජනා සම්බන්ධයෙන් ආණ්ඩුවේ විශාල ජනමාධ්‍ය ජාලය ආණ්ඩුවේ බල ව්‍යාපෘතියට අනුව මේ පිළිබඳවත් තොරතුරු වාර්තා කරනවා. උදාහරණයක් හැටියට ජනාධිපති ධුරයට ඉල්ලන්න පෙර ගෝඨාභය රාජපක්ෂ මහතා ද්විත්ව පුරවැසියෙක්. ජනාධිපතිවරණයට ඉල්ලද්දීත් එය අහෝසි කර ගෙන තිබුණේ නෑ කියන එකයි අපට තිබෙන විශ්වාසය. ඔහුගේ බිරිය සහ පුතා දැනුත් අමෙරිකානු පුරවැසියන්. ඔවුන්ගේ නායක බැසිල් රාජපක්ෂ මහතා අමෙරිකන් පුරවැසිභාවය තවමත් දරනවා. ඒ පුරවැසිභාවය ඉවත් කර නොගෙන ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව පවා ඊට ගැළපෙන ආකාරයට වෙනස් කළා. සෑමවිටම විදේශ රටවලට පක්ෂග්‍රාහීව කටයුතු කරන ද්විත්ව පුරවැසිභාවය දරන පුද්ගලයන් ද්විත්ව පාස්පෝර්ට් සහිත පුද්ගලයන් ජිනීවා ප්‍රශ්නය ආවම දැවැන්ත ජිනීවා විරෝධීන්, එක්සත් ජාතීන්ගේ සංවිධානයට විරුද්ධ පුද්ගලයන් වෙනවා.

දැන් ඉදිරිපත් කර තිබෙන යෝජනාවට පෙර ඉදිරිපත් කළ යෝජනාවල තිබුණේ 2009 යුද්ධය සම්බන්ධ කාරණා. නමුත් අද අවුරුදු 12කට පසුව ඉදිරිපත් කර තිබෙන යෝජනාවල වැඩිපුරම අඩංගු වෙන්නේ යුද්ධයෙන් පසු ගත වූ කාලය සම්බන්ධ කරුණු. ප්‍රජාතන්ත්‍ර විරෝධී, අධිකරණයේ ස්වාධීනත්වයට ඇඟිලි ගැසීම වැනි කරුණු. මෙය සහමුලින්ම යුද්ධය සම්බන්ධ යෝජනාවලියක් නොවන බව අවධාරණය කරන්න ඕනෑ. ජනවාරි මස 12 වැනිදා ජනාධිපතිවරයා විසින් මේ දක්වා පත් කර තිබෙන ජනාධිපති කොමිෂන් සභාවල සියලුම වාර්තා පරීක්ෂා කරන්න වෙනම කොමිෂන් සභාවක් පත් කරනවා. මේ මානව හිමිකම් යෝජනාවලියේ ජනාධිපතිවරයාගේ කොමිෂන් ගැන කොමිසම සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබෙනවා.

# සිංහරාජයේ වන විනාශය කියූ භාග්‍යා වෙනුවෙන් අප පෙනී සිටිනවා

## ● සජබ හිටපු පා.ම.චන්ද්‍රාණි බණ්ඩාර

**සුභාෂිණී සේනානායක**



සිංහරාජ වනාන්තරය විනාශ වන බව කියූ භාග්‍යා දියණිය වෙනුවෙන් සමගි වනිතා පෙරමුණ පෙනී සිටින බව සමගි ජන බලවේගයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රිනී චන්ද්‍රාණි බණ්ඩාර මහත්මිය පැවැසුවාය.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහත්මිය මෙසේ ද කීවාය.

'සිංහරාජ වනාන්තර විනාශ වන බව කියන භාග්‍යා දියණිය ගැන රටම කතා වෙනවා. එම දියණිය මේ දිනවල විශාල මානසික පීඩනයකට ලක් වෙලා. කාන්තාවන් විදියට අප ඒ වෙනුවෙන් පෙනී සිටිනවා. තවත් කාන්තාවක්ට එසේ නොවෙන්න ශක්තියක් වෙන්න අප පසුබට වෙන්නේ නෑ. පසුගිය දින කිහිපයකට ඉහත රත්නපුර දිස්ත්‍රික්කයේ භාග්‍යා අබේරත්න කියන මේ දැරිවිය රූපවාහිනී වැඩසටහනකදී කළ ප්‍රකාශයක් පිළිබඳව තමයි, මේ ආන්දෝලනය සිදු ව තිබෙන්නේ. ඒ දැරිවියගෙන් ඇසූ ප්‍රශ්නයකට පිලිතුරු දුන්නේ. ආණ්ඩුව බලයට එන්න කලින් මහ ලොකුවට කිවුවා, පරිසරය ආරක්ෂා කරනවා කියලා. දැන් ආණ්ඩුව පත් වෙලා වසර එක හමාරක් වෙනවා. අපි අහනවා, දැන් ඒ කියූ දේවල් ඉටු වෙලා ද? අද දිගින් දිගටම පරිසර විනාශ වන බව දැන ගන්න ලැබෙනවා. ඒ හේතුව නිසා ආණ්ඩුව අපකීර්තියට ලක් වෙලා ජනතාව තුළ තිබූ විශ්වාසය නැති වෙලා. ආණ්ඩුවේ වන්දි බට්ටයන් කරන වන විනාශය අද දිගින් දිගටම වාර්තා වෙනවා. ඒ පිළිබඳව කරුණු කාරණා එළිපිට තිබෙන අවස්ථාවක එය වහගන්න අහිංසක දැරිවියක් පස්සේ යන එක පිළිකුලෙන් හෙළා දකිනවා. එසේ පස්සේ පන්නන්නේ දැරිවිය කාන්තාවක් නිසා ද? එය ගොදුරක් කර ගැනීම පහසු නිසා ද? වෙනත් රටවල දරුවන් එවැනි ප්‍රකාශ කළාම ඒ රටවල නායකයන් ඒ අය ගෙන්වා ප්‍රශංසා කරනවා. අපේ රටේ නායකයන් එවැනි අය මර්දනය කරනවා. මේ දියණිය එම ප්‍රකාශය කරන අවස්ථාවේදී කිසිම පුද්ගලයෙක්, ආයතනයක්, දේශපාලන පක්ෂයක් සම්බන්ධ කර ගත්තේ නෑ. ඒ වගේම එම දැරිය උදේ සවස දකින දෙයක් ප්‍රකාශ කළා පමණි. එයට ආණ්ඩුවට රිදිලා. එම නිසා ආණ්ඩුව දැරිවිය පස්සේ පන්නනවා. එදා තිබූ රාජපක්ෂ මර්දන යුගය නැවත ක්‍රියාත්මක වෙමින් තිබෙන බව පෙනී යනවා.'

සමගි වනිතා බලවේගයේ ජාතික සංවිධායක, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රිනී හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

'ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා ඇයි දරුවන්ට මෙච්චර බය කියලා මේ අවස්ථාවේ අහනවා. ඇයි සර් දරුවන්ට බය. අද විහාරමහාදේවි පාර්ක් එකේ චිත්‍රයක් අඳලා එය ප්‍රදර්ශනය කළ දරුවන්ට එය ගලවන්න කියනවා. ඔබතුමා පුටින් වගේ නායකයෙක් කියලා කිවුවේ. අද දරුවන්ට සහ දැරියන්ටත් බයයි. ඒ වගේම ඔබතුමා අල්ලේ නටවන ව්‍යාපාරිකයන්ටත් බයයි. එසේ බය නිසා තමයි භාග්‍යා දැරියගේ පැත්ත ගන්නේ නැතිව ඒ පරිසරය විනාශ කරන ව්‍යාපාරිකයන්ගේ පැත්ත ගන්නේ. අද හුස්ම පොද වෙනුවෙන් කතා කර දැරිවියගේ කට වහන්න හදනවා. ඔය ව්‍යාපාරවලින් මුදල් කුට්ටි කුට්ටි කාට කාට හරි ලැබෙන්න ඇති. එම මුදල් පාවිච්චි කරන්නත් හුස්ම තිබිය යුතුයි. පුදුම විය යුතු නෑ, ඔය ආණ්ඩුවේ ම අය තමයි ඇහුවේ ජීවත් වෙන්න හුස්ම අවශ්‍ය ද කියලා.

ජීවත් වෙන්න අවශ්‍ය පොහොට්ටුව ද? හුස්ම ද? 69 ලක්ෂයේ බාගයකට වැඩිය කලකිරිලා. මේ 69 ලක්ෂයම තීරණය කළ යුතුයි, හුස්ම ද පොහොට්ටුව ද කියලා. අද සෑම තැනම කැලෑ කපනවා. ඊයේ අපේ නායකතුමා මුතුරාජවෙල ගියා. අපේ පක්ෂය ප්‍රතිපත්තියක් විදියට හරිත පක්ෂයක් ලෙස ජනගත කළා. එය ඩඩ්ලි මහතාගෙන් පසුව කළ එකම පක්ෂය සමගි ජන බලවේගය. අප සියලු දෙනා පොරොන්දු වෙලා තිබෙනවා පරිසරයට කිසිම හානියක් සිදු නොකර බවට. යම් ආකාරයට පරිසරය විනාශයක් සිදු වෙනවා නම් ඒ වෙනුවෙන් අප පෙනී සිටිනවා.'

## දවසේ රාහු කාලය

උදේ 07.44 සිට 09.16 දක්වා රාත්‍රී 07.50 සිට 09.19 දක්වා

## දින තත්ත්වය

මීන රවි 08 භාග මැදින් පුර නවවක තිථිය ලත් සඳු දින ඉර උදාව 06.14 ට ඉර බැසීම 06.21 ට අද නැකත රාත්‍රී 09.24 න් ගෙවී පුනාවස නැකත ලබයි. මැදින් පුර අටවක තිථිය උදේ 08.59 න් ගෙවී පුර නවවක තිථිය ලබයි. සෞභාග්‍යයෝගය දහවල් 12.52 න් ගෙවී ශෝභනයෝගය ලබයි. බවකරණය උදේ 08.59 න් ගෙවී බාලවකරණය ලබා එය රාත්‍රී 09.37 න් ගෙවී කෞලවකරණය උදා වනු ඇත.



සුබසෙත ජ්‍යෙෂ්ඨ කර්තෘ ප්‍රවීණ ජ්‍යොතිෂවේදී අජිත් ධර්මසිරි

## දවසේ කාල හෝරාව ගෙවී යන අයුරු

**උදේ**
06.14 සිට 07.14 දක්වා - සඳු හෝරාව
07.14 සිට 08.14 දක්වා - සෙනසුරු හෝරාව
08.14 සිට 09.14 දක්වා - ගුරු හෝරාව
09.14 සිට 10.14 දක්වා - කුජ හෝරාව
10.14 සිට 11.14 දක්වා - රවි හෝරාව
11.14 සිට 12.14 දක්වා - සිකුරු හෝරාව

**සවස**
12.14 සිට 01.14 දක්වා - බුධ හෝරාව
01.14 සිට 02.14 දක්වා - සඳු හෝරාව
02.14 සිට 03.14 දක්වා - සෙනසුරු හෝරාව
03.14 සිට 04.14 දක්වා - ගුරු හෝරාව
04.14 සිට 05.14 දක්වා - කුජ හෝරාව
05.14 සිට 06.14 දක්වා - රවි හෝරාව

**රාත්‍රී**
06.14 සිට 07.14 දක්වා -සිකුරු හෝරාව
07.14 සිට 08.14 දක්වා - බුධ හෝරාව
08.14 සිට 09.14 දක්වා - සඳු හෝරාව
09.14 සිට 10.14 දක්වා - සෙනසුරු හෝරාව
10.14 සිට 11.14 දක්වා - ගුරු හෝරාව
11.14 සිට 12.14 දක්වා - කුජ හෝරාව

**අලුයම**
12.14 සිට 01.14 දක්වා - රවි හෝරාව
01.14 සිට 02.14 දක්වා - සිකුරු හෝරාව
02.14 සිට 03.14 දක්වා - බුධ හෝරාව
03.14 සිට 04.14 දක්වා - සඳු හෝරාව
04.14 සිට 05.14 දක්වා - සෙනසුරු හෝරාව
05.14 සිට 06.14 දක්වා - ගුරු හෝරාව

### බබාට නමක්

මෙදින රාත්‍රී 09.24 දක්වා අද නැකත උදාවන නිසා නම් තැබීමට කු, ජ අකුරු ද ඉන්පසු පුනාවස නැකත උදාවන නිසා කෙ,කො, හ, හි අකුරු ද දිනට හිමි අකුරු ලෙස ය, ර, ල, ව, ශ, ෂ අකුරු ද යොදා නම් තැබීම සුබයි.



## දවසේ ලග්න පලාපල

**මේෂ ලග්නය - හොඳ නරක සම සේ ලැබේ**

මේෂ ලග්නයට අනුව අද ඔබට මධ්‍යපල සහිතයි. විශේෂයෙන් ලැබීම් මෙන්ම වියදම් තත්ත්වයක් ද පෙනේ. තම මව් පාර්ශ්වයෙන් අතපසු වූ දේපළක හිමිකරුවකු වීමට ද පුළුවන. පිටරටක සිටි තම ස්වාමියා හෝ ඥාතියාගේ පැමිණීම වාසිසහගත වෙයි. රැකියා ස්ථානගත ආරවුල් මතභේද ඇතිවීමට පුළුවන. තමා කරන සාධාරණ කටයුතු අඩාල කිරීමට පිරිසක් මාන බලනු ඇත. උගුරේ ආසාදන, තුනටියේ ආපදා විය හැක.

**වෘෂභ ලග්නය - කෙනෙකුට දී තිබූ මුදලක් ලැබේ**

වෘෂභ ලග්නයට අනුව අද ඔබට ආදායම් අතින් සුබයි. හදිසි ලැබීම් හා ලොතරැයි ජය හිමි වන දිනකි. එහෙත් හිසට වද දෙන කාරණාවක් නිසා පීඩාවෙන් කාලය ගත කිරීමට සිදු-වෙයි. තමා මීට පෙර කෙනෙකුට දී තිබූ මුදලක් යළි ලැබේ. තමා විවාහක නම් දෙදෙනා අතර සහයෝගය එකිනෙකා අතර ඇති කර ගන්න. පුණ්‍ය කටයුතු සඳහා දවසේ කීප විටක් යොදා ගත හැකි නම් සුබයි.

**මිථුන ලග්නය - ඈත් වී සිටි අයකු සමඟ හමුවක්**

මිථුන ලග්නයට අනුව අද ඔබට ඉතා සුබ දිනකි. විශේෂයෙන් අද දින ග්‍රහ තත්ත්වයට අනුව සිතේ සතුටින් කාලය ගත කිරීමට පුළුවන් වන අතර කාලයක් තමාගෙන් ඈත්වී සිටි කෙනෙකු යළි පැමිණේ. ආර්ථික වශයෙන් ද යහපත්ය. චිත්ත ප්‍රීතිය වැඩි නිසාම නිර්මාණශීලී හැකියාව වැඩි දියුණු වේ. ගායනය, නර්තනය ආදි සෞන්දර්ය අංශයේ කටයුතු කරන අයට සුබවාදී ජනා-දරයක් උරුම වනු ඇත. පාදයේ දණහිසින් පහළ අසුබයි.

**කටක ලග්නය - හදිසි ධනයක් හෝ පරිත්‍යාගයක්**

කටක ලග්නයට අනුව ඔබට තම රාජකාරිය වෙනුවෙන් දුර බැහැරකට යාමට සිදුවේ. ඒ සඳහා ප්‍රතිපාදන ලැබේ. විශේෂයෙන් පුණ්‍ය කටයුත්තකට ඒ ගමන වෙන් වනු ඇත. එහිදි ඔබ ගන්නා ආහාරපානයක් හේතුකොටගෙන ඇතිවන්නා වූ අජීර්ණ තත්ත්වයක් මත පීඩා විඳීමට සිදු වේ. ප්‍රවේශම් වන්න. හදිසි ධනය හෝ පරිත්‍යාගයක් ලැබීමේ වාසනාව ඇත. .

**සිංහ ලග්නය - නවතා තිබූ ව්‍යාපාරයක් යළි ආරම්භ වේ**

සිංහ ලග්නයට අනුව අද ඔබට අත්හැර දමා තිබූ ව්‍යාපාරයක් යළි ආරම්භ කිරීමට අව-ස්ථාව සැලසේ. ඒ සඳහා හතර පස්දෙනෙකු සමග අත්වැල් බැඳ ගනු ඇත. රැකියාගත ගැටලු ඇති වේ. ඒ සඳහා ප්‍රධානීන්ගේ දෝෂ දර්ශනයට ලක්වේ. බොහෝ විට ඔබට මග හැරුණු රාජකාරි කොටසක් නිසා එසේ වීමට පුළුවන.

**කන්‍යා ලග්නය - බොහෝ දෙනාගේ ප්‍රසාදය**

කන්‍යා ලග්නයට අනුව අද ඔබට රැකියා ස්ථානගත අභිවෘද්ධිය ආර්ථික වාසි හා බොහෝ දෙනාගේ ප්‍රසාදය හිමි වන දිනකි. පිරිමි අයකු නම් කාන්තාවන්ගේ ආකර්ෂණය ද කාන්තාවක නම් පිරිමි අයගේ ආකර්ෂණය ද හිමි වේ. උත්සව අවස්ථාවකට සහභාගි වීමෙන් ඒ බව වඩා තහවුරු වේ. තමාගේ පුණ්‍යවන්තභාවය හේතුවෙන් අතපසුව ගිය දේපළ උරුමකම් හිමිකම් උදා-වනු දිනකි.

**තුලා ලග්නය - දානමාන කටයුතු වෙනුවෙන් දුෂ්කර ගමනක්**

තුලා ලග්නයට අනුව අද දින ඔබට සුබ දිනකි. එසේම කාර්යබහුල දිනකි. විශේෂයෙන් ආග-මික කටයුතු සඳහා දවස වෙන් කෙරේ. දානමාන කටයුතු මෙන්ම ඒ වෙනුවෙන් අතිදුෂ්කර ගමනකට වුව ද සහභාගි වීමට ඉඩ තිබේ. මුදල් අතින් ලැබීම් පෙන්වන අතර එය ඉතා ඉක්ම-නින් නැති නාස්ති වන දිනයකි. සකසුරුවමින් කටයුතු කළ හොත් සුබයි.

**වෘශ්චික ලග්නය - සිතේ කනස්සල්ල**

වෘශ්චික ලග්නයට අනුව අද ඔබ ඉතා ප්‍රවේශම්ව කටයුතු කළ යුතු වෙයි. විවාහක නම් යුග-දිවි අවුල් පවා එළඹීමට පුළුවන. අවිවාහක අයගේ ආදර සබඳතා දෙදරා යාමට ද ඉඩ ඇත. ඉගෙන ගන්නා වයසේ නම් ඒ ඉගෙනුම් කටයුතුවලට පවා බාධා එල්ල වේ. මීට හේතුව සිතේ පවතින නොසන්සුන්තා, හදිසි කෝපය, කලබලය වීමට ඉඩ ඇත. බොහෝ ඉවසීමෙන් කටයුතු කරන්න. එවිට ඉන් මිදී ඉතා හොඳ සුබවාදී දිනක් උදා කර ගත හැක.

**ධනු ලග්නය - බලාපොරොත්තු සඵල වේ**

ධනු ලග්නයට අනුව අද ඔබට යහපත්ය. පිටරටකට යෑමට අපේක්ෂාවෙන් සිටි අයගේ බලා-පොරොත්තු සඵල වේ. අවිවාහක අයට මංගල යෝග උදා වේ. ආදායම් අතින් ද සතුටුදායක වෙයි. පාදයේ වළලුකරට අගුණයි. උඩ නැගීම් අවම කරන්න. තමාට උරුමයෙන් ලැබීමට තිබූ අන්සතු වූ ධනයක් ඔබට ලැබේ. තමා සැලසුම් කරගෙන ආර්ථික කටයුත්තක් ක්‍රියාවට නැංවෙන දිනකි. ඒ වෙනුවෙන් බොහෝ දෙනාගේ කැපවීමක් ඔබ වෙනුවෙන් ලැබෙන දිනකි.

**මකර ලග්නය - නිවසේ අලංකාරය සඳහා වැඩි කැපවීමක්**

මකර ලග්නය හිමි ඔබට අද දින ලැබීම්වලට වඩා වියදම් උදා කෙරෙන දිනකි. තම මව් පාර්ශ්වයේ කෙනෙකු පිළිබඳ කනගාටුදායක ආරංචි ලැබෙන දිනකි. ඔබට ද ඔබගේ යටි-බඩ ආශ්‍රිත ආසාදන බහුල වනු ඇත. ඔබ පරණ බඩු භාණ්ඩ පිළිබඳ උනන්දු වන දිනකි. ඒ අතර ගෘහභාණ්ඩ පිළිබඳ උනන්දුව වැඩි වේ. ඒ තුළින් නිවෙසේ අලංකාරය සඳහා කැප වී කටයුතු කරනු ඇත.

**කුම්භ ලග්නය - හවුල් ව්‍යාපාරයකට අත ගසයි**

කුම්භ ලග්නයට අනුව අද ඔබට සුබ දිනකි. කිසියම් ලාභදායි ආයෝජනයකට යොමු වේ. හවුල් ව්‍යාපාරයකට අත ගසයි. ඒ නිසා රැකියා ස්ථානගතව අතපසුවීම් ඇති වේ. මෙම මොනම දෙයක් වුව සමබරව කළ යුතු වේ. දණහිසට අපලයි. ප්‍රවේශම් වන්න. නමුත් ඔබට පිටස්තර බොහෝදෙනෙකුගෙන් සහාය ඇප උපකාර ලැබේ. ඔබ ගන්නා කිසියම් ධනෝපායන ක්‍රියාමාර්ගයක් සපල වන ලකුණු පෙනේ.

**මීන ලග්නය - ලැබීම් බහුල දිනකි**

මීන ලග්නයට අනුව අද ඔබට ඉතා හොඳ දිනකි. ආර්ථික වශයෙන් ද රැකියාව වශයෙන් ද ලැබීම් ඇති කෙරේ. ඒ අතර ඉඩමක, නිවෙසක, වාහනයක හිමිකමක් ද පෙනේ. තමාට සහයට සිටින අයගෙන් විශාල කැපවීමක් සිදුවන දිනකි. ඉතා වෙහෙසකාරි දිනකි. ආගමික වශ-යෙන් ද ඔබ කැපවෙනු ඇත. අන් අයගේ ප්‍රසාදය පිළිගැනීම ලැබේ. කාලයකට අමතක නොවන දෙයක් සිදු වේ.

# ‘නීතිය’ පාසල් විෂය මාලාවට ක්‍රමවේද සකසන්න අනු කාරක සභාවක්

**ස්වර්ණා විජේකෝන්**

නීතිය විෂයයක් ලෙස පාසල් විෂය මාලාවට ඇතුළත් කිරීම සඳහා උචිත ක්‍රම-වේදයක් සකස් කිරීමට පාර්ලිමේන්තු අනු කාරක සභාවක් පත්කර තිබේ.

අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා හා අධිකරණ අමාත්‍ය අලි සබ්රි මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගිය සතියේදී රැස්වූ එම අමාත්‍යාංශවල ඒකා-බද්ධ උපදේශක කාරක සභා විශේෂ රැස්වී-මේදී මෙම අනු කාරක සභාව පත්කිරීම සිදු විය.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව-විද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතා හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන රාවුෆ් හකීම්, සිවඥානම් ශ්‍රීදරන්, වීරසුමන වීර-සිංහ, සාගර කාරියවසම්, අමරකීර්ති අතු-කෝරල, ඩයනා ගමගේ, (මේජර්) සුදර්ශන දෙනිපිටිය යන පිරිස මෙම කමිටුවේ සාමා-ජිකයන් වන අතර, මෙහි ලේකම්වරයා ලෙස පාර්ලිමේන්තුවේ සහකාර මහලේ-කම් ටිකිරි කේ. ජයතිලක මහතා පත්කර ඇත.

මෙහිදී අදහස් දැක්වූ අධිකරණ ඇමැති අලි සබ්රි මහතා සඳහන් කළේ නීතිය පිළි-බඳ මහජනතාව සතු දැනුම ඉතා පහළ මට්ටමක පවතින බැවින්, නීතිය සම්බන්ධ මූලික අවබෝධයක් මෙරට දරුවන්ට ලබා දීම ඉතාමත් වැදගත් බවයි. ලොව දියුණු රාජ්‍යයන්වල ද මූලික නීතිය පිළිබඳ පුර-වැසි අධ්‍යාපනයක් ලබා දීමට කටයුතු කර ඇති බවත්, නීතිය පිළිබඳ දැනුම පාසල් විෂය මාලාවට එක්කිරීම කාලීන අවශ්‍යතා-වක් බවත් අධිකරණ අමාත්‍යවරයා මෙහිදී සඳහන් කළේය.

පාසල් විෂය මාලාවට නීති විෂය එක්කි-රීමේ වැඩපිළිවෙළ සම්බන්ධයෙන් පත් කළ මෙම මූලික කමිටුවේ යෝජනා ඇතුළත් වාර්තාව මාස දෙකක කාලයක් තුළ ලබා-දෙන ලෙස අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා කමිටු සාමාජිකයන්ට උපදෙස් ලබා දුන්නේය. ඉන් අනතුරුව විශේෂඥ කමිටුවක නිර්දේශ මත නීතිය, විෂය මාලාවට කඩිනමින් ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු බවද අධ්‍යාපන අමාත්‍යව-රයා වැඩි දුරටත් පැවසීය.

# මතින් මුදන්න දැනුමෙන් සන්නද්ධ කරන කඩුවෙල අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය





කඩුවෙල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය ඇබ්බැ-හිය හා ඒ ආශ්‍රිත ගැටලුවෙන් පීඩාවට පත් මහජනතාව, තරුණ තරුණියන්, පාසල් ශිෂ්‍යයන් දැනුවත් නිරීම සඳහා විධිමත් වැඩ-පිළිවෙළක් දියත් කිරීමට අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් ප්‍රජා මූලික ප්‍රතිකාර ක්‍රමය (community base treatment) ආරම්භ කර ඇත.

මෙහි එක් පියවරක් වශයෙන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ කඩුවෙල ප්‍රදේශය භාර සහකාර උපදේශක පී.පී.යූ. ලක්මාලි සහ කඩුවෙල මත්ද්‍රව්‍ය නිවාරණ සහයක නවක පුහුණු සිසුන් එක්ව මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩ පිළි-වෙලක් ක්‍රියාත්මක කළ අතර එහි අරමුණු අතර අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මත්ද්‍රව්‍ය උපදේශන ක්ෂණික ඇමතුම් අංකය (1927) ප්‍රචලිත කිරීම ද විය.

# අසීමිත අන්තර්ජාල පැකේජ ක්‍රියාත්මක කිරීම හානිකරයි

## තොරතුරු තාක්ෂණ සංගමය කියයි

**පහන් විජේසේකර**

අසීමිත අන්තර්ජාල භාවිතය ශ්‍රී ලංකාව සතු ටෙලිකොම් යටි-තල පහසුකම් ප්‍රමාණවත් නොවන අවදියක අසීමිත අන්තර්ජාල පැකේජ ක්‍රියාත්මක කිරීමට යාම සමස්ත අන්තර්ජාල පද්ධතිය කඩා වැටිය හැකි බව ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සංගමය පවසයි.

අප්‍රේල් මස සිට අසීමිත අන්තර්ජාල පැකේජයන් පාරිභෝගි-කයන්ට අන්තර්ජාල සේවා සපයන්නන් හරහා ලබාදීමට කට-යුතු කරන බව විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ජන-තාව දැනුවත් කිරීමට කටයුතු කර ඇති බව සඳහන් කරන එම සංගමය, මෙවැනි ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථම ඒ සඳහා අවශ්‍ය ටෙලිකොම් යටිතල පහසුකම් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු බවත් පෙන්වා දෙයි.

අන්තර්ජාල වේග සීමා සම්බන්ධයෙන් අන්තර්ජාතික ප්‍රමි-තියක් අනුගමනය කිරීමට අන්තර්ජාල සේවා සපයන සමාගම් කටයුතු කළ යුතු බවද එම සංගමයේ සභාපති රජීව් යසිරු කුරු-විටගේ මහතා කීවේය.

අන්තර්ජාල සේවා සපයන සමාගම් කිහිපයක් සතුව පවතින අන්තර්ජාල කේබල් ගොඩබෑමේ ස්ථානවල පවතින ධාරිතාව මෙරට අන්තර්ජාල පරිශීලකයන්ගේ ඉල්ලුමට සරිලන පරිදි සැපයීමට හැකි මධ්‍යස්ථාන දැයි කියා නිසි ඇගයීමක් සිදු කළ යුතු බවත් ඔහු සඳහන් කළේය.

# දැවිතෙල් ප්‍රවාහනය GPS ඔස්සේ නියාමනයට

**බුද්ධිකා ඉඹුලාන**

බවුසර් මගින් දැවිතෙල් ප්‍රවාහනය , GPS තාක්ෂණය ඔස්සේ නියාමනය කිරීම මධ්‍යම පරිසර අධිකාරිය පසුගිය (19) සිටආ-රම්භ කර ඇත.

නැව් මගින් බැහැර කරන දැවිතෙල් ලබා ගෙන රට තුළ ප්‍රවා-හනය කරන ඇතැම් පුද්ගලයන් ඒවා රහසිගතව ඇළදොළව-ලට මුදා හැරීම සිදු කරන බවත්, එමගින් විශාල පරිසර හානියක් මෙන්ම මහජන සෞඛ්‍යයට හානියක් සිදු වන බවත් අනාවර-ණය වී ඇති බැවින් මෙම දැවිතෙල් ප්‍රවාහණය කිරීම විදිමත් පරිදි නියාමනය කරන්නැයි පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් හේමන්ත ජයසිංහ මහතාට උපදෙස් දී තිබිණි.

මෙය අධිකාරියේ නිලධාරියකුගේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදු කෙරේ. දැනට මෙම දැවිතෙල් ප්‍රවාහනය කිරීම සඳහා ආය-තන 23කට බලපත් ලබා දී ඇති අතර, ආයතන දෙකක් ඒවා ගබඩා කර තබා ගැනීම සිදු කරයි.

දැවිතෙල් ප්‍රවාහණය GPS තාක්ෂණය ඔස්සේ නියාමනය කරන බැවින් කිසියම් බලපත්‍රලාභියෙක් ඒවා පරිසරයට මුදා-හරින්නේ නම් ඔවුන්ට එරෙහිව නඩු පැවරීමටත්, බලපත්‍රය අහෝසි කිරීමටත් කටයුතු කරන ලෙසත් ඇමැති අමරවීර මහතා මධ්‍යම පරිසර අධිකාරියට උපදෙස් දී ඇත.

සාමාන්‍යයෙන් වාර්ෂිකව නැව්වලින් බැහැර කරන දැවිතෙල් කිලෝ ලීටර් 64,000ක් පමණ මෙරටට ගෙන එන බව අනාවර-ණය වී තිබේ. මෙම දැවිතෙල් අවිධිමත් ලෙස බැහැර කිරීම නිසා පිළිකා, චර්ම රෝග, ස්වශන ආබාධ ආදි රෝග රැසකට මහජන-තාව ලක්වීමේ අවදානමක් පවතින බව මධ්‍යම පරිසර අධිකාරිය පෙන්වා දී ඇත. එම නිසා නැව්වලින් බැහැර කරන දැවිතෙල් යොදා ගැනීම විශාල ජාවාරමක් දක්වා වර්ධනය වී ඇතැයි ද හෙළිදරව් වී තිබේ.

මෙම දැවිතෙල් ජාවාරම පිළිබඳ පැහැදිළි තොරතුරු සහිත වාර්තාවක් තමන්ට ලබා දෙන ලෙස ඇමැතිවරයා මධ්‍යම පරි-සර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් හේමන්ත ජයසිංහ මහතාට දන්වා තිබේ.

# පෑලියගොඩ මිල ගණන්

**පෑලියගොඩ මත්ස්‍ය වෙළෙඳපොළ දෛනික මසුන් මිල**

| | කිලෝ ග්‍රෑම් එකක මිල - රුපියල් |
|---|---|
| තෝරා බිළී | 850 |
| පරව් මධ්‍යම | 500 |
| කබරපරව් | 450 |
| ඇටනගුල් පරව් | 500 |
| බලයා ලොකු | 280 |
| බලයා කුඩා | 380 |
| කෙළවල්ලා ලොකු | 280 |
| කෙළවල්ලා කුඩා | 380 |
| කෙන්දා බොකු සහිත | 500 |
| තලපත් ලොකු | 700 |
| ඇටිස්සා ලොකු | 500 |
| හබරලි | 450 |
| හබරලි පටි | 450 |
| පිලා මධ්‍යම | 220-260 |
| අලගොඩුවා | 400 |
| පියාමැස්සා | 200-260 |
| හුරුල්ලා | 450 |
| ගල්හුරුල්ලා | 500 |
| හාල්මැස්සා | 180 |
| දැල්ලා පිලි | 850 |
| ඉස්සා ලොකු | 1000 |
| ඉස්සා මධ්‍යම | 850 |
| මොරැල්ලා සුදු | 350 |
| ලින්නා ලොකු | 350 |
| ලින්නා මධ්‍යම | 290 |
| සුද්දා | 400 |
| ලේන පරව් | 350 |
| ලෝමැස්සා | 400-450 |
| අගයා | 380 |
| කුම්බලාවා | 450 |
| බෝල්ලා | 450 |
| සුරාපරව් | 350 |

**පෑලියගොඩ එළවළු මිල**

| | (කිලෝවක තොග මිල) රුපියල් |
|---|---|
| ගෝවා | 80 |
| බෝංචි | 200 |
| තක්කාලි | 60 |
| ලීක්ස් | 60 |
| කැරට් | 120 |
| වම්බටු | 80 |
| පිපිඤ්ඤා | 30 |
| අමුමිරිස්- | 120 |
| මාළුමිරිස් | 200 |
| බණ්ඩක්කා | 80 |
| තලනබටු | 60 |
| දෙහි | 50 |
| වට්ටක්කා | 70 |
| පතෝල | 80 |
| බීට් | 80 |
| දේශීය අර්තාපල් - | 100 |
| ලූණු | 60-70 |
| ලූණු | 60-70 |

**පෑලියගොඩ පලතුරු මිල**

| | (කිලෝවක තොග මිල) රුපියල් |
|---|---|
| අඹ අල්පොන්සෝ | 460 |
| කෝලිකුට්ටු | 140-150-160 |
| ඇඹුල් කෙසෙල් | 40-50-60 |
| සීනි කෙසෙල් | 50-60 |
| දොඩං | 150 |
| කොමඩු | 90-100 |
| අන්නාසි | 100-120 |
| කිලෝ පේර | 130-140 |
| ගස්ලබු | 80-90 |

**මේ දිනවල මහත් ආන්දෝලනයට ලක්ව ඇති මහා සීනි මංකොල්ලයක් සිදු වූයේ යැයි කියන සිද්ධිය පෙරට දමා මහ දවල් මංකොල්ලයක් සේ සිදු වූ මහබැංකු වංචාව යට ගැසීමට පිරිසක් උත්සාහ දරන බව කැපිටල් පී.ඒ.සී. පර්යේෂණ ආයතනයේ ප්‍රධානී ලලිත් පියුම් පෙරේරා මහතා ප්‍රකාශ කරයි. "මහා සීනි මංකොල්ලය සරලව" මැයෙන් තම ආයතනය සිදු කළ පර්යේෂණ විග්‍රහ කරමින් දිනමිණ සමඟ දැක්වූ අදහස් ඇසුරෙන් මේ ලිපිය සකස් කෙරිණි.**



**සීනි මෙරටට ගෙන්වා ගබඩා කර ගැනීම දක්වා ක්‍රියාවලියේදී පිරිවැය, රක්ෂණ සහ ප්‍රවාහන වියදම් එකතු වීමෙන් වරායේදී සීනි කිලෝ එකක් සඳහා රුපියල් 72ක මුදලක් වැය වූ අතර මෙරටට ගොඩ බැසීමේදී සීනි කිලෝ එකක් සඳහා රුපියල් 50ක බද්දක් අය කිරීම හේතුවෙන් රුපියල් 122ක වටිනාකමක් එයට ලැබෙන අතර ඉන් අනතුරුව මෙරට බෙදාහැරීමේ ක්‍රියාවලිය තුළ දළ වශයෙන් රු.13කින් සීනි මිල ඉහළ ගොස් ඇති බවයි.**

# සීනි බද්දේ ඇත්ත කතාව මොකක් ද?



කැපිටල් පී.ඒ.සී. පර්යේෂණ ආයතනයේ ප්‍රධානී
**ලලිත් පියුම් පෙරේරා**

**● පළමුව මහා සීනි මංකොල්ලය සරලව විග්‍රහ කර බලමු**

මුදල් අමාත්‍යාංශය විසින් 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 2020/10/14 වන දිනෙන් ආරම්භ වන මාස 3ක් දක්වා කාලසීමාවක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ ගැසට් පත්‍රයක් මඟින් සිනි ඇතුළු භාණ්ඩ 28ක විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑම් 1ක් සඳහා ශත 25ක් දක්වා අඩුකරන ලදී.

අදාළ ගැසට් පත්‍රය නිකුත් කරන දින වන විට මෙරටට ආනයනය කරනු ලබන සීනි කිලෝ එකක් සඳහා රුපියල් 50ක වෙළෙඳ භාණ්ඩ බද්දක් අය කරන ලද අතර උක්ත ගැසට් පත්‍රය හේතුවෙන් සීනි කිලෝ එකක් සඳහා වන ආනයන බද්ද ශත 25 දක්වා පහළ දමන ලදි. එසේම අදාළ දිනට මෙරට සීනි කිලෝග්‍රෑම් එකක මිල ආසන්න වශයෙන් රුපියල් 135.00 ලෙස සටහන් විය.

එසේ නම් සීනි නමැති වෙළෙඳ භාණ්ඩය මත පනවා තිබූ බද්ද රුපියල් 49.75කින් අඩු වූයේ නම් 135ට වඩා රුපියල් 49.75ක මුදලක් අඩුවෙන් පාරිභෝගිකයාට සීනි මිල දී ගැනීමට ඉඩ තිබිය යුතු බවත් එසේ නොවීම මත රජය මහා පරිමාණ වංචාවක් සිදු කර ඇති බවට චෝදනා එල්ල වේ.

**● එකී චෝදනාව තවදුරටත් පහත පරිදි විග්‍රහාත්මකව මෙසේ හඳුනා ගත හැකිය.**

අදාළ බදු අඩු කිරීම සිදු කිරීමෙන් පසුව සීනි මෙට්‍රික් ටොන් ලක්ෂ තුනක් ආනයනය කර ඇති අතර එම ප්‍රමාණය කිලෝ මිලියන තුන්සීයකි. ඒ අනුව 300,000,0000 X 49.75 ලෙස ගණනය කර රජයට අහිමි වූ බදු ආදායම රුපියල් බිලියන 15.6ක් ලෙස දක්වයි.

පාරිභෝගිකයාට මෙම බදු අඩුකිරීම තුළ අපේක්ෂිත මිල අඩු වීමේ සහනය ලැබී නොමැත.

පිරිමිඩ් විල්මා ආයතනය රුපියල් බිලියන 15ක ලාභයක් වංචාකාරීව ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය විමර්ශනය කිරීමේදී පළමුව ආර්ථික විද්‍යාවේ මූලික නීතීන් දෙසට යොමු විය හැකිය.

රජයක් විසින් තම මූල්‍ය සැලසුම් සකස් කිරීමේදී ඉදිරි වසර සඳහා අපේක්ෂිත ආදායම ගණනය කරනු ලබයි. එසේම වසර අවසානයේදී සත්‍ය වශයෙන් ලැබූ ආදායම හඳුනාගත හැකි අතර එය අපේක්ෂිත ආදායම්වලට වඩා වැඩි අගයක් ගැනීමට මෙන්ම අපේක්ෂිත ආදායමට වඩා අඩු අගයක් ගැනීමට ද ඉඩ තිබෙයි. මෙය ව්‍යාපාරික ආයතනයකට මෙන්ම නිවෙසකට ද පොදු තත්ත්වයකි.

රාජ්‍ය අර්ථයෙන් ඉහත කරුණ විග්‍රහ කරද්දී ඉහත කී ආර්ථික ඉලක්ක සාධනය සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති බලපාන බව හඳුනාගත හැකිය. එසේම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය මඟින් රජයේ රැකියා නියුක්තිය වැඩි කිරීම මිල ස්ථාවරත්වය පවත්වා ගැනීම අවශ්‍යතා මත සම්පත් බෙදාහැරීම, සමාජ සුභසාධනය, ආපදා කළමනාකරණය ආර්ථික අභිවෘද්ධිය ඇති කිරීම වැනි කරුණු සිදු කරනු ලබයි.

ඉහත අංශයන්ගේ ධනාත්මක හෝ ඍණාත්මක පැවැත්ම තීරණය වන්නේ රජයේ සමස්ත ආදායම් වියදම් කළමනාකරණය කිරීම තුළිනි. ඒ අනුව මෙරට ප්‍රධාන ආදායම් සහ වියදම් මෙසේ වර්ග කර දැක්විය හැකිය.

ඉහත කී අගයන් නියතීන් නොවන අතර රජය විසින් එළඹෙන ප්‍රතිපත්තිමය කරුණු මත ආදායම් වියදම් සම්බන්ධ අගයන් බදු ප්‍රතිපත්තීන් නිරන්තරව වෙනස් වෙයි. එසේම වර්තමාන රජය ව්‍යාපාර අර්ථයෙන් ජාතික ආර්ථිකය හැසිරවීම වෙනුවට සුභසාධන අර්ථයෙන් ආර්ථිකය හසුරවන බව ද පෙන්වා දිය යුතුය.

උදාහරණ ලෙස : රජය විසින් අගය එකතු කරනු ලබන බද්ද අඩු කරන බවට මැතිවරණයේදී මැතිවරණ පොරොන්දුවක් ලෙස ජනතාවට පොරොන්දු වූ අතර රට තුළ ගනුදෙනු වැඩි කිරීමට සහ දේශීය නිෂ්පාදකයාට සහන ලබා දීම එහි අරමුණ විය. ඒ අනුව 15%ක් වූ වැට් බද්ද 8% දක්වා අඩු විය. ඒ හේතුවෙන් රට අභ්‍යන්තරයේ ඇති ව්‍යාපාරවල ක්‍රියාකාරීත්වය වැඩි වූ අතර ඒ හේතුවෙන් කොවිඩ් වසංගත තත්ත්වය තුළ වුව ද අපනයන ආදායම ක්‍රමානුකූලව ඉහළ නැංවීමට හැකි විය.

2020 මැයි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි භාණ්ඩ 26ක් සඳහා වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද වැඩි කරන ලදී. දේශීය නිෂ්පාදකයා සවිමත් කිරීම එහි අරමුණ වූ අතර ඒ හේතුවෙන් දේශීය නිෂ්පාදකයාට විශේෂිත ස්ථානයක් ලැබුණු අතර නිෂ්පාදනය ද වැඩිවීම සිදු වූ බැවින් කහ, උඳු, මුංඇට ආදී භාණ්ඩවලින් මෙරට ස්වයංපෝෂිත විය.

මෙවැනි රාජ්‍ය ප්‍රතිපත්තිය හා සමපාත සාමාන්‍ය අවස්ථාවක් ලෙස 2020/10/14 වන දිනෙන් ආරම්භ වන මාස 3ක් දක්වා කාලසීමාවක් සඳහා බල පැවැත්වෙන පරිදි විශේෂ ගැසට් පත්‍රයක් මඟින් සීනි ඇතුළු භාණ්ඩ 28ක විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑම් 1ක් සඳහා ශත 25ක් දක්වා අඩු කිරීමේ තීරණය හඳුනාගත හැකිය.

අදාළ අවස්ථාව වන විට මෙරට සීනි සංචිතය පරිභෝජනය සහ මිල සාමාන්‍යයෙන් මෙරට මාසික සීනි පරිභෝජනය සලකා බැලීමේදී එය ප්‍රමාණාත්මකව මෙට්‍රික් ටොන් 40,000 – 50,000 අතර අගයක් ගනියි. ඒ අනුව 2020/10/14 දින වන විට මෙරට සීනි මෙට්‍රික් ටොන් 90,000ක් පමණ ගුදම්ගතව පැවතුණි.

2020/10/14 වන විටත් මෙරට ආනයනයකර තිබූ සීනිවල මිල නිර්මාණය වූ ආකාරය මෙසේය. සීනිවල CIF වටිනාකම රු.72කි. විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද රු. 50කි. දේශීයව ප්‍රවාහන ගබඩා පහසුකම් සහ ව්‍යාපාරික ලාභය රු.10 – 25කි. ආසන්න වශයෙන් රු.135/ක මිලකට සීනි කිලෝවකට ගෙවීමට සිදුවිය.

ඉහතින් දක්වා ඇති පරිදි හඳුනා ගත හැක්කේ සීනි මෙරටට ගෙන්වා ගබඩා කර ගැනීම දක්වා ක්‍රියාවලියේදී පිරිවැය, රක්ෂණ සහ ප්‍රවාහන වියදම් එකතු වීමෙන් වරායේදී සීනි කිලෝ එකක් සඳහා රුපියල් 72ක මුදලක් වැය වූ අතර මෙරටට ගොඩ බැසීමේදී සීනි කිලෝ එකක් සඳහා රුපියල් 50ක බද්දක් අය කිරීම හේතුවෙන් රුපියල් 122ක වටිනාකමක් එයට ලැබෙන අතර ඉන් අනතුරුව මෙරට බෙදාහැරීමේ ක්‍රියාවලිය තුළ දල වශනේ 13කින් සීනි මිල ඉහළ ගොස් ඇති බවයි.

**● බදු මුදල් පහත දැමූ වහාම සීනි මිල අඩුකිරීම ප්‍රායෝගික ද?**

2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව සහ ප්‍රායෝගිකව ගත් කල ඒ වන විට මෙරට සීනි සංචිතවල ඉහත ක්‍රමවේදය තුළ කිලෝ එකක් සඳහා රුපියල් 50 බැගින් බදු ගෙවා ගබඩා කර ගත් මෙට්‍රික් ටොන් 90000 ක තරම් සීනි තොගයක් පැවති අතර එලෙස මිල අඩු කිරීමක් සිදු වුව හොත් ඒ වන විට සීනි ගබඩා කර ගත් ව්‍යාපාරිකයන්ට සහ ආයතනවලට දැවැන්ත සහ පිරිමැසිය නොහැකි පාඩුවක් සිදු වේ. ඒ අනුව බදු මුදල් අඩු කළ වහාම සීනි මිල අඩු වෙතැයි උපකල්පනය කිරීම මිථ්‍යාවකි.

**● පසුව මෙරටට ආනයනය කළ සීනි සඳහා බදු සහනය ලැබුණි ද ආසන්න වශයෙන් රුපියල් 50කින් සීනි මිල අඩු නොවූයේ වංචාවක් සිදු වූ නිසා ද?**

2020/10/14 වන දිනෙන් ආරම්භ වන මාස 3ක් දක්වා කාලසීමාවක් සඳහා බල පැවැත්වෙන පරිදි විශේෂ ගැසට් පත්‍රයක් මඟින් සීනි ඇතුළු භාණ්ඩ 28ක විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑම් 1ක් සඳහා ශත 25ක් දක්වා අඩු කිරීමේ තීරණය ගැනීමෙන් අනතුරුව සීනි ආනයනය කිරීම සඳහා ගිය වියදම් සහ තත්කාලීන මිල තීරණය වීම සඳහා බලපෑ මූලික සාධක විමසා ඉහත ප්‍රශ්ණය නිරාකරණය කළ යුතුය. ඒ අනුව ආනයනය කළ සීනි මෙරට වරාය දක්වා ගෙන ඒමට කොපමණ මුදලක් වැය වීද යන්න විමසා බැලිය යුතුය. එසේම කොවිඩ් වසංගත තත්ත්වය තුළ මෙරට සීනි හැකි තරම් ගබඩා කර ගැනීමේ අවශ්‍යතාවයක් පැන නැගුනි.

එසේම සීනි අපනයනය කරන ලද ඉන්දියාව තමන් විසින් පනවා තිබූ සීනි අපනයන තහනම ඉවත් කරන ලදී. අගෝස්තු මාසයේදී උක්ත තහනම ඉවත් කළ අතර ලොව පුරා විවිධ රටවල්වලින් සීනි මිලදී ගැනීමට ඇනවුම් ලැබීම නිසා සීනි මිල ද වේගයෙන් ඉහළ යැමට පටන් ගෙන තිබුණි. ඒ අනුව සීනි සංචිත මෙරට ගබඩා කර ගැනීම අත්‍යවශ්‍ය හදිසි කරුණක් බවට ද පත් විය. සමස්තයක් ලෙස සීනි ආනයනකරුවන්ට උපරිම සහන ලබා දිය යුතු තත්ත්වයක් නිර්මාණය වී තිබුණි.

Cost + insurance + freight (පිරිවැය, රක්ෂණ, ප්‍රවාහන) සම්බන්ධ ලෝක ප්‍රවණතා (කොවිඩ් වසංගත කාලය තුළ)

කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් නාවික ප්‍රවාහනයට ද තරමක බලපෑමක් ඇති වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස භාණ්ඩ ප්‍රවාහන නැව් හිඟ වූ අතර නාවික ගාස්තු වැඩි විය. එසේම රක්ෂණ ගාස්තු ද වසංගත කාලයට අනුරූපව ඉහළ ගොස් තිබේ. එසේම නිෂ්පාදන පිරිවැය ද කැපී පෙනෙන ලෙස වැඩිවී ඇත. මෙය සීනි මිල සඳහා බරපතළ ලෙස බලපා ඇති බව පෙනී යයි.

කෙසේ නමුත් සීනි ආනයනය කිරීමේදී පිරිවැය රක්ෂණ භාර සහ ප්‍රවාහන ගාස්තු CIF පූර්ව සීනි තොග ආනයන අවස්ථාවට වඩා කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් තිබුණි. තත්ත්වය පහත පරිදි හඳුනා ගත හැකිය. එයද ක්‍රමානුකූලව වැඩි වෙමින් පවතී.

2020 ඔක්තෝබර් මාසයේ රු.81ක් ද 2020 නොවැම්බර් මාසයට රු.85 ද විය. එහි මිල 2020 දෙසැම්බර් මාසයට රු.84ක්ද අඩු විය. 2021 ජනවාරි මාසයට රු. 92ක් දක්වා වැඩි විය.

ඒ අනුව දෙසැම්බර් මාසයේදී සීනි ආනයන කරන අවස්ථාව වන විට මෙරට වෙළෙඳපොළේ තිබුණේ පූර්වයෙන් ආනයනය කරන ලද සීනි වන අතර ඒ හේතුවෙන් කැපී පෙනෙන මිල අඩු වීමක් සිදු නොවීය. කෙසේ නමුත් මේ වන විට බදු සහනය යටතේ ආනයනය කරන සිනි වෙළෙඳපොළට පැමිණ ඇති අතර එහි වෙළෙඳපොළ මිල පහත පරිදි හඳුනා ගත හැක. ඒ අනුව CIF වටිනාකම රු 90කි.

විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද රු. 0.25කි. දේශීයව ප්‍රවාහන ගබඩා පහසුකම් සහ ව්‍යාපාරික ලාභය රු. 10.25කි. සීනි කිලෝවක මිල ආසන්න වශයෙන් රු. 105ක් විය.

**● මේ අනුව ඉතාමත් පැහැදිලිව පෙන්වා දිය හැක්කේ ඉහත බදු සහනය හේතුවෙන් සීනි මිල රුපියල් 20කින් අඩු වී ඇති බවයි.**

අනෙක් අතට එය රුපියල් 50කට ආසන්න මුදලකින් අඩු නොවූයේ මෙරට වරායට ගොඩබාන තෙක් සීනි කිලෝ එකක් සඳහා වැය වන පිරිවැය රක්ෂණ හා ප්‍රවාහන වියදමේ CIF එකතුව පසුගිය මාස කිහිපය තුළ (2020/10/14ට) පසුව රුපියල් 25කට ආසන්න මුදලකින් ඉහළ ගොස් ඇති නිසා බවයි. මෙම තත්ත්වය ආර්ථික විද්‍යාවට අනුව පුරෝකථන ආදායම අහිමි වීමක් මිස රජය විසින් ලැබූ අලාභයක් නොවෙයි. මන්ද යත් අද වන විට සීනි කිලෝ එකක් සඳහා රුපියල් 50ක බද්ද අය කළේ නම් ආසන්න වශයෙන් සීනි කිලෝ එකක මිල රුපියල් 170ක් වීමට ඉඩ තිබුණි.

**● මෙලෙස බදු අඩු කළේ පළමු වතාවට ද?**

මෙලෙස සීනි සඳහා සහ තවත් වෙළෙඳපොළ භාණ්ඩ සඳහා වන බදු මුදල් ප්‍රමාණය මෑත ඉතිහාසයේ අවස්ථා කිහිපයකදී ශත 25ක අගයක් දක්වා අඩු කර තිබේ. උදාහරණ ලෙස 2016/7/19 රුපියල් 50ක් වූ බද්ද ශත 25ක් දක්වා අඩු කරන ලදී. එසේම එම බද්ද යළිත් ආසන්න වශයෙන් මාසයකට පසුව පනවා තිබේ.

එහිදී 2016 ජූලි මස සීනි මිල - රුපියල් 100ක් විය

2016 අගෝස්තු මාසයේ සීනි මිල - රුපියල් 101ක් විය

2016 සැප්තැම්බර් මාසයේ සීනි මිල - රුපියල් 104ක් විය.

ඒ අනුව එම අවස්ථාවේ බදු මුදල් කපා හැරිය ද කිසිදු සහනයක් ජනතාවට ලබා දීමට එවක යහපාලන රජය අසමත් වී තිබේ. එසේම එම බදු කපා හැරි කාලසීමාව තුළ සීනි මෙට්‍රික් ටොන් 145000ක් පමණ මෙරටට ආනයනය කර තිබේ.

මේ අනුව 2016දී මෙහිදී රුපියල් බිලියන 7.8 (145,000,000 සීනි කිලෝග්‍රෑම් (49.75 කපාහැරිය බදු + 4 වැඩිවූ මිල) ක බදු ආදායමක් අහිමි වී ඇති අතර එය ආර්ථික විද්‍යාව පිළිබඳව දැනුමක් ඇති අයෙක් වංචාවක් ලෙස අර්ථකථනය නොකරනු ඇත.

බදු අඩුකිරීම මඟින් කිසිදු ආකාරයක සහනයක් ජනතාවට ලැබී නොමැති අතර, එවක ආණ්ඩුව බදු අඩු කිරීමෙන් පසු සීනි කිලෝ එකක මිල රුපියල් 4කින් ඉහළ දමා තවදුරටත් වංචා සහගතව ආදායම් ලබා ඇති බවට තර්ක කිරීමට හැකි බවය.

**● පිරිමිඩ් විල්මා ආයතනය සමස්ත සීනි ආයනයයෙන් වංචා සහගත ලෙස ලාභ ලැබුවේද?**



ඉහත ගැසට් නිවේදනයෙන් පසුව සීනි පමණක් නොව තවත් භාණ්ඩ 28ක පමණ බදු ශත 25 දක්වා අඩු කරන ලද අතර ඒ හේතුවෙන් ඒ යටතේ වූ සියලුම වෙළෙඳ භාණ්ඩවල මිල අඩු වීම සහ මිල ඉහළ යෑම පාලනය කිරීමේ වටපිටාවක් නිර්මාණය කර ගැනීමට හැකි වූ අතර එහි ලාභය ඍජුව මහජනතාව වෙත ලැබී තිබේ. නමුත් මෙහිදී සීනි ආයනය සම්බන්ධව පමණක් චෝදනාව ඉදිරිපත් වන බව පෙනේ. එම තත්ත්වය ද තවදුරටත් ගැඹුරින් විග්‍රහ කළ හැකිය.

ඒ අනුව ඉහතින් තර්කානුකූලව වංචාවක් නොවන බව තහවුරු කර ඇති සීනි ආනයනය සම්බන්ධ චෝදනාව එක් ව්‍යාපාරික ආයතනයකට ලඝු කර දක්වා ඇති අතර ඒ පිළිබඳව ද විශ්ලේෂණය කිරීම මෙහිලා වැදගත් වන බව පෙන්වා දිය හැකිය. එනම් අදාළ බද්ද අඩු කිරීමෙන් පසුව සිනි ආනයනය කරන ලද සමාගම් විසින් සිදු කරන ලද ප්‍රමාණාත්මක ආනයනයන් විග්‍රහ කළ යුතුය.

ඒ අනුව මෙට්‍රික් ටොන් ලක්ෂ තුනක් ආනයනය කර ඇති අතර පිරමිඩ් විල්මා ආයතනය විසින් ඉහත කී ආනයනය කරන ලද සීනි ප්‍රමාණයෙන් 37%ක් ආයනයන කර තිබේ. ඉතිරි සමාගම් විසින් ඉතිරි 63% ප්‍රමාණය ආනයනය කර තිබේ. උක්ත බදු වංචා චෝදනාව පමණක් නොව අතුරු චෝදනා ද මිථ්‍යාවන් බව පෙන්වා දිය හැකිය.

අවසන් වශයෙන් පෙන්වා දිය හැක්කේ තවදුරටත් අදාළ බදු සහනය සීනි ඇතුළු භාණ්ඩ 28 වෙනුවෙන් ක්‍රියාත්මක වන බවත් ඕනෑම ව්‍යාපාරිකයකුට සීනි ආනයනය සඳහා අවස්ථාව පවතින බවත්ය.

උක්ත චෝදනාව පදනම් විරහිත සහ දේශපාලන අර්ථයෙන් සටන් පාඨය ලෙස යොදා ගත් අදහස් දැක්වීමක් පමණක් වන බවයි. මේ අනුව කිවහැක්කේ රජය විසින් අගය එකතු කරනු ලබන බද්ද 15% සිට බද්ද 8% දක්වා අඩු කිරීම මඟින් රජයේ බදු ආදායම බිලියන 250කට ආසන්ව පහළ දැමීම මඟින් ජනතාවට ලබා දුන් සහනය ද යම් දිනෙක වංචාවක් ලෙස අර්ථ දැක්වීම ආර්ථික විද්‍යාව පිළිබඳ අල්ප අවබෝධයක් ඇති අයකු පැවසීම පුදුමයට කරුණක් නොවනු ඇති බවය.

**ජයසිරි මුණසිංහ**



# සැහැල්ලු බව සතුට උදා කරයි

**ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දර්ශනපති**
**පූජ්‍ය කුඩාවැවේ සෝමානන්ද හිමි**

මිහිපිට වෙසෙන සෑම පුද්ගලයෙක්ම සතුටින් ඉන්න ඇලුම් කරයි. ඇතැම් අවස්ථාවලදී ඒ වෙනුවෙන් මිනිසුන් මින් පෙර නොකරන දේවල් පවා සිදු කරයි. එලෙස තමන්ගේ නොදැනුවත්භාවය හේතුවෙන් , වර්තමානයේදී සතුට හඹා යන ජනතාව අවසානයේදී විනාශයට පත් වේ. අගහිඟකම්වලින් මිරිකුණු ඇතැම් මිනිසුන් උදෑසන සිට රාත්‍රිය දක්වාම අනවරත අරගලයක යෙදෙන්නේ කෙසේ හෝ තමන්ගේ අභිමතාර්ථයන් ඉෂ්ට කර ගෙන සතුටින් ජීවත් වීමට ය. එසේ වුවත් ඇතැම් අවස්ථාවලදී භෞතික සැප සම්පත් බොහෝ සෙයින් තිබුණ ද , එවැනි මිනිසුන්ට ජීවිතයේ සතුටක් හිමි වී නැත. පහත දැක්වෙන්නේ බුදුදහමෙහි සතුට විග්‍රහ කර ඇති අන්දම පිළිබඳ ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ, සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශයේ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දර්ශනපති, පූජ්‍ය කුඩාවැවේ සෝමානන්ද හිමි සමඟ සිදු කළ සංවාද සටහනකි.

**● ස්වාමීන් වහන්ස, සතුට පිළිබඳව බුදුදහමෙහි දක්වා තිබෙන්නේ කෙසේ ද?**

සතුටින් ජීවත් වීම මේ ලෝකයේ ජීවත්වන සෑම පුද්ගලයෙකුගේම එක් බලාපොරොත්තුවක්. සොයන්නේ මොකක් ද කියලා ඇහුවොත් , හැමෝම කියන්නේ සතුට කියලා. රස්සාවක් කරන්නේ සතුටින් ඉන්න. විවාහ වෙන්නේ, ආදරය කරන්නේ , විදෙස්ගත වෙන්නේ සතුටින් ඉන්න. මාපියන්ගේ බලාපොරොත්තුව තමයි, දරුවන් සතුටින් තැබීම. රට කරවන පාලකයන්ගේ වගකීම වෙන්නේ, රටවැසියා සතුටින් තැබීම. ඕනෑම කෙනෙකුට ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදු වෙනවා. ඒ නිසා කවුරුත් බලාපොරොත්තු වන්නේ එම ප්‍රශ්න විසඳා සතුටින් ජීවත් වෙන්න. “සන්තුට්ඨී පරමං ධනං “ යන්නට බුදුරජාණන් වහන්සේ දේශනා කළේ සතුට පුද්ගලයාගේ උතුම්ම ධනය නිසා.

**● සැබෑ වශයෙන්ම පුද්ගලයකු ලබන සතුට පිළිබඳ බුදුරදුන් ප්‍රායෝගිකව ගෙන හැර දැක්වූයේ කොහොම ද?**

ඇතැම් කෙනෙක් බුදුදහම සර්ව අසුබවාදී දර්ශනයක් හැටියට පෙන්වා දීමට උත්සාහ කළත් එය එසේ වන්නේ නැහැ . බුදු දහම යථාර්ථවාදී දර්ශනයක්. ලෝකයේ පවතින සෑම දෙයක්ම ත්‍රිලක්ෂණයට ගොදුරු වන බව සත්‍යයක්. නමුත් ඒ ගැනම කල්පනා කරමින් ශෝකීව සිටිය යුතු බවක් බුදුසමය කිසි විටෙකවත් කියන්නේ නැහැ .

අතෘප්තිමත් ආශාවන් පසු පස්සේම හඹායන මිනිසාට සතුටක් ලැබීම දුෂ්කරයි. එහෙත් ඉන් මිදෙන කෙනෙකුට චතුර්විධ වු සතුටක් ලබාගත හැකි බව අංගුත්තර නිකායේ ආරියවංස සූත්‍රයේ දැක්වෙනවා. ලෞකික වු ගෘහ ජීවිතයෙන් මිදෙන භික්ෂුව, ඉතරීතර චීවර සන්තුෂ්ටියීය, ඉතරීතර පිණ්ඩපාත සන්තුට්ඨිය, ඉතරීතර සේනාසන සන්තුට්ඨිය, භාවනාරම්මන සන්තුට්ඨිය. එනම්, භික්ෂුවක් ලෙස තමන් ලද සිවුරක්, පිණ්ඩපාතයෙන් හා ලැබුණු සෙනසුනින් සතුටට පත්ව භාවනාව කෙරෙහි ඇල්මක් ඇති කර ගන්නවා. එලෙස භාවනාවේ ඇලීමෙන්ම සතුටක් ලබන්න පුළුවන්. ඒ සතුට ළාමක වු තාවකාලික සතුටක් නෙමෙයි. මේක ගිහි සමාජයට ද ආදර්ශයට ගන්න පුළුවන්. අත්ථි සුඛය, භෝග සුඛය, අණන සුඛය, අනවජ්ජ සුඛය, යන්නට බුදුරජාණන් වහන්සේ දේශනා කළ අංගුත්තර නිකායේ අණන සූත්‍රයට අනුව ගිහියෙකු සතුටුවන අවස්ථා හතරක් දක්වනව.

ඒවායින් කියන්නේ ධාර්මික උපයා සපයාගත් ධනය හා භෞතික වස්තුව තමාට ඇතැයි වන සතුට, ධාර්මිකව උපයා සපයා ගත් වස්තුව පරිභෝග කිරීමෙන් ලබන සතුට, කිසිවකුටත් ණය නොවී ජීවිතය, ඉදිරියට ගෙනයාමෙන් ලැබෙන සතුට සහ අධාර්මික ජීවිතයක් ගත නොකර සමාජයට හිතකාමී පුද්ගලයෙක් හැටියට ජීවත් වුණා කියලා ඇතිවන සතුටටයි.

ධනය උපයාගත් පමණින්ම සතුටු වෙන්න බැහැ. එකිනෙකා සමඟ සුහද සිතින් කටයුතු කරන්න ඕනෑ. ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, පළිගැනීම, වගේ දුර්ගුණයක් තමන්ගේ සිතින් බැහැර කර ගත්තොත් ,සතුට ළඟා කර ගන්න පුළුවන්. උපයාගත් වස්තුව තමන් පමණක්ම පරිභෝජනය නොකර සමාජය වෙනුවෙනුත් කොටසක් යොදන්න කියලා බුදුරදුන් දේශනා කරලා තියනවා. එලෙස සමාජ සේවය සඳහා යුතුකම් ඉටුකළා යැයි සිතා සතුටු වෙන්නත් පුළුවන්. ආත්මාර්ථකාමී නොවී පරාර්ථකාමීත්වයෙන් සතුට ළඟාකර ගන්න පුළුවන්.

**● වර්තමානයේදී මිනිසුන් සැබෑ සතුට පිළිබඳව නිසි පරිදි අවබෝධ කර නොගෙන , සිතේ දුකින් ජීවත් වෙනවා. එහෙම වෙන්නේ ඇයි?**

සතුට පරම ධනයයි කියලා තථාගතයන් වහන්සේ දේශනා කරන්නේ අනිවාර්යයෙන්ම සතුට ලබාගැනීමත් සතුට පවත්වා ගැනීමත් අතිශයින්ම දුෂ්කර නිසා. ඉන් කියවෙන්නේ ලබාගන්නත් අමාරුයි සතුට පවත්වා ගන්නත් අමාරුයි කියන එක. මනසේ ඇතිවෙන තෘෂ්ණාව, ද්වේෂය, මෝහය, අවිද්‍යාව, සතුටින් ඉන්න ඉඩදෙන්නේ නෑ. ඒවා සතුට ළඟා කර ගන්නටත්, එය පවත්වාගෙන යන්නටත් ඉඩදෙන්නේ නෑ. සෝමනස්සයට එරෙහිව දෝමනස්සය, සතුටට එරෙහිව අසතුට මේ අකුසල මූලයන් ගෙන දෙනවා. මනසේ අතෘප්තිය වඩවනවා.

බොහෝ අය හිතන්නේ සතුට බාහිර අයවලුන් හෝ බාහිර දේවල්වලින්ම ගෙන දෙන්නක් හැටියට. නමුත් බාහිර සාධක අපේ සතුටට හේතුවෙන්නේ නැහැයි කියන්න බැහැ. ඇතැම් විට සතුටත් එක්ක, බාහිර අයවලුන් බාහිර සාධක සම්බන්ධයි. ඒත් සතුටට ප්‍රධාන මානසික සාධකයයි. සතුට පවතිනවාද නැත්ද යන්නට ප්‍රධාන වන්නේ මානසික සාධකයි. අනෙක සතුටට බාහිර හා අභ්‍යන්තරික සාධක බලපානවා. බුදු , පසේ බුදු, සහරහතන් වහන්සේලා හැර සාමාන්‍ය පුද්ගලයන්ට බාහිර සාධක බලපානවා. බාහිර සාධක සියල්ලක්ම නරක පැත්තට හැරී ඇති විට සතුට ගොඩනගා ගැනීම ඉතාම දුෂ්කරයි. ඒ නිසා උත්සාහ කරන්න ඕන , මනස තුළින් සතුට ළඟා කර ගන්නත් සතුට පවත්වා ගන්න.

**● කිසිදු භෞතික සැප සම්පතක් නැතිව සතුටෙන් සිටින මිනිස්සුත්, භෞතික සැප සම්පත් බොහෝ තබාගෙන සිතේ දුකින් සිටින මිනිස්සුත් යන දෙවර්ගය පිළිබඳ ඔබ වහන්සේගේ අදහස කුමක් ද?**

කාම භෝගි මිනිසා පහසුවෙන් සතුටට පත් කරන්න බැහැ. “ දුක්ඛෙ ලොකෝ පතිට්ඨිතා “ ලෝකය දුක මතම පිහිටා තිබිය දී මිනිසා සතුටම ප්‍රාර්ථනය කිරීම එයට හේතු වෙනවා. කාම ලෝකයේ ජීවත්වන මිනිසාට බොහෝ විට දුක් වේදනාවන්වලට මුහුණ දීමට සිදු වෙනවා. “ අප්පස්සාදා කාමා ඉති විඤ්ඤාය පණ්ඩිතෝ “ කාමයන්ගේ පවතින්නේ අල්ප වු ආශ්වාදයක්. අනෙක ඊට වැඩියෙන් එය බොහෝ දුක් දොම්නස්වලින් යුක්ත වෙනවා. එයින් මිදී සතුටින් ජීවත් වෙන්න ඕන. භෞතික වස්තු දේපළට වැඩියෙන් උසස්ම ධනය, වස්තුව වන්නේ මිනිසුන් තුළ ඇතිවන සතුට බව බුදුදහම අවධාරණය කරනවා. යථා ලාභ සන්තුට්ඨිය, යථා බල සන්තුට්ඨිය, යථා සාරුප්ප සන්තුට්ඨිය යනුවෙන් ගිහි හා පැවිදි ජීවිත සතුටට පත්විය හැකි අවස්ථා තුනක් ගැන ධර්මයේ ඇතුළත් වෙනවා. බුදුදහම අපේක්ෂා කරන්නේ යථාලාභ සන්තුට්ඨියයි. ඒ කියන්නේ ලද දෙයින් සතුටු වීම. යමෙක් මෙය වැරදියට අවබෝධ කරගෙන දියුනු වීමට උත්සාහ නොකර අලස ජීවිතයක් ගත කළහොත් එය යථා ලාභ සන්තුට්ඨියේ ලක්ෂණයක් වෙන්නේ නැහැ. වස්තුව කෙරෙහි මිනිසා ස්වභාවයෙන්ම ආශාවක් දක්වනවා. භෞතික දේවල් කෙරෙහි පමණ ඉක්මවා එල්බී සියල්ල ලබා ගැනීමට තැත් කරනවා. ඒ නිසයි, අයථා ක්‍රමවලින් ධනය උපයන්නේ. හොරකමට,වංචාවට, දූෂණයට පෙලඹෙනවා. එසේ ලබන භෞතික සම්පත්වලින් යථා ලාභ සන්තුට්ඨිය ලබන්න බැහැ. සෑම පුද්ගලයෙකුටම කායික හෝ මානසික හෝ වෙන කිසියම් බලයක් හෝ ශක්තියක් තියනවා. තමා සතු එම බලය මගින් අභිවෘද්ධිය කරා යන පුද්ගලයා යථාබල සන්තුට්ඨිය ලබනවා. තනතුරු , නම්බුනාම ලැබීමට තමාට වැඩියෙන් සුදුසු අය ඉන්නවානම් ඔවුන්ට ඒවා පිරිනැමීමෙන් මිනිසුන්ට සතුටු වෙන්න පුළුවන්. එය සාරුප්ප සන්තුට්ඨියයි.

ආහාර අනුභවයේ සිට වස්තු දේපළ ඒකරාශී කිරීම දක්වා සියල්ලම සීමා සහිතව රැස්කිරීමට, පරිභෝජනය කිරීමට හුරු වීමෙන් මිනිසාට සතුටින් ජීවත් වෙන්න පුළුවන්. ගිහිපැවිදි දෙපක්ෂයම නිවන් මඟ සලසා ගැනීමට අල්පේච්ඡ ජීවිතයකට හුරු විය යුතු වෙනවා. “ න කහාපණ වස්සේන තිත්ති කාමේසු විජ්ජති “ ධනකාමියා කහවනු වැස්සක් වැස්සත් ඉන් තෘප්තිමත් වෙන්නේ නෑ. තෘප්තිමත් සැනසිලිදායක සතුටින් යුතු ජීවිතයකට අල්පේච්ඡතාවයට බොහෝම වැදගත් වෙනවා.

**● උපන්දා සිට මිය යන තෙක්ම පුද්ගලයකුට සතුටින් ජීවත් වීම සඳහා ඔබ වහන්සේ ලබා දෙන සමාජ උපදේශයන් මොනවා ද?**

සතුට අතීතයෙන්වත්, අනාගතයෙන්වත් ලබා ගැනීමක් නෙමෙයි. වර්තමානයේ පවතින්නක්. වර්තමානයේ සෝමනස්සය පවත්වා ගෙන යාමයි. නුවනින් යුක්ත සතුට තිබිය යුතු යි. “ සෝමනස්ස සහගත ඤාණසම්පයුක්ත “ අවබෝධයත් සමග සතුට ලබා ගත යුතු වෙනවා. සතුටු වෙන ගමන්ම සතුට ලබා දෙන කෙනා හෝ දෙය වෙනස්වන සුළුයි කියා අනිවාර්යයෙන්ම අවබෝධකරගත යුතු වෙනවා. සතුට ස්ථිර දෙයක් නෙමෙයි. වෙනස් වීමක් තිබෙන බව අවබෝධයෙන් සිටිය යුතු වෙනවා. එසේ කලින් අවබෝධ කරගෙන තිබීම නිසාම ඒ වේලාවෙත් සතුට ළඟා කර ගන්න පුළුවන්. සතුට ගෙන දෙන හේතුවල තියෙන යථාර්ථවත් බව අවබෝධය නිසා සාමාන්‍ය කෙනෙක් සතුටුවන විදිහට නෙමෙයි සතුටු වෙන්නේ. ඒත් අවබෝධයෙන් තොරව සතුට විඳිනවානම් ඊට වැඩියෙන් අසතුට ළඟා කර දීමට හේතු වෙන්න පුළුවන්.

අසතුට එන්නේ මනසින් පනවා ගත්තු දේවල් නිසා. මේ ලොකේ අටලෝ දහමින් යුක්ත වෙනවා. ඒවාට හැමෝම මුහුණ දිය යුතු වෙනවා. සතුට ලැබෙන දේවල්ම අපේක්ෂා කළොත් දුකින් යුක්ත වීමට හේතු වෙන්න පුළුවන්. ඒ අපේක්ෂාවම එය විඳවන්නක් කරනවා. දුකට පත් කරනවා. සියලු ලාභ ලබාගන්න දවසේ සතුටු වෙනවා කියලා හිතුවොත් කිසිදාක සතුටු වෙන්න බෑ. හමුවීම් වගේ ම වෙන්වීම් තිබෙනවා . ඒ සෑම දෙයක්ම තෘප්තිමත්ව භාරගත යුතු වෙනවා. ඒවා තාවකාලිකයි. වෙන්වීම සිදුවෙනකොට ඇතිවෙන චෛතසිකය තාවකාලිකයි. හමුවීම කියන චෛතසිකය තාවකාලිකයි. සන්සන්දනය කිරීමෙන් සතුට ලබාගන්න බෑ.. අනුන්ගෙන් වෙනත් දෙයකින් සතුට සොයන්න යෑම අනුවණකමක්. වඩාත් උචිත වෙන්නේ තමන්ට ලැබුන දෙයින් සතුටට පත්වීමයි.

**සොයන්නේ මොකක් ද කියලා ඇහුවොත්, හැමෝම කියන්නේ සතුට කියලා. රස්සාවක් කරන්නේ සතුටින් ඉන්න. විවාහ වෙන්නේ, ආදරය කරන්නේ, විදෙස්ගත වෙන්නේ සතුටින් ඉන්න. මාපියන්ගේ බලාපොරොත්තුව තමයි, දරුවන් සතුටින් තැබීම. රට කරවන පාලකයන්ගේ වගකීම වෙන්නේ, රටවැසියා සතුටින් තැබීම. ඕනෑම කෙනෙකුට ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදු වෙනවා. ඒ නිසා කවුරුත් බලාපොරොත්තු වන්නේ එම ප්‍රශ්න විසඳා සතුටින් ජීවත් වෙන්න.**

**මදාරා මුදලිගේ**




## බොදු දිවියට ඔවදන්



පව් කළ තැනැත්තා ඒ නිසා තමන්ම කෙළෙසෙන්නේය. පව් නොකළ තැනැත්තා ඒ නිසා තමන් පිරිසිදු වන්නේය. පිරිසිදුකම ද අපිරිසිදුකම ද පවතින්නේ තම තමන් තුළය. එක් අයෙක් තවත් අයෙක් පිරිසිදු නොකරන්නේය.

පෙර වැරදි කළත් පසුව වැරදි නොකරන තැනැත්තා වළාකුලින් නිකුත් වූ සඳ මෙන් මේ ලෝකය බබුළුවයි. ඇත්ත නොකියන බොරු කියන පරලොව ගැන නොතකන්නා වූ තැනැත්තාට නොකළ හැකි පව්කමක් නැත.

බියෙන් තැතිගත් මිනිස්සු පර්වත ද, ආරාම ද, වෘක්ෂ ද චෛත්‍යයන් ද බොහෝ සෙයින් සරණකොටයත්, එහෙත් මේ කිසිවක් බිය රහිත නොවේ. උතුම් ද නොවේ. මේ කිසිවක් සරණකොට ගොස් සියලු දුකින් මිදීමට හැකි නොවේ.

රාගය හා සමාන ගින්නක් නැත. ද්වේෂය තරම් අපරාධයක් නැත. ස්කන්ධයන්ගේ පරිහරණය හා සමාන දුකක් වෙන නැත. නිවනට වඩා සැපයක් වෙන නැත. (ධම්මපදය) ප්‍රියයන් හා අප්‍රියයන් කිසිදා එක් නොවිය යුතුය. ප්‍රියයන් නොදැකීම ද දුකකි. අප්‍රියයන් දැකීම ද දුකකි. කෙනෙකුට නොයෙක් පිරිවර ඇතත් සිදුවන දෙය වැළැක්විය නොහැක. තාරකා පිරිවරාගත් පුන්සඳ රාහු අල්ලාගනු නොලැබේ ද බේබද්දන්ට දෙන අවවාදය දිය යට සිටින කෙනෙකු ගිනි හුලකින් පුළුස්සන්නාක් වැනි දෙයකි. ප්‍රසිද්ධ ගුණවත් කුලයක හෝ දුර්ජනයෙක් උපන්නොත් එම කුලය විනාශ වේ. ශ්‍රී කාන්තාව චන්ද්‍රයා අමා ආදී උසස් දේ උපන් සාගරයෙන් විෂ හටගෙන විනාශයට ගියා මෙනි.

හීන කුලයේ ජනයෝ මහත්මයන් ඇසුරෙන් ඉසුරින් ආඪ්‍ය වී ගරු කටයුතු තත්ත්වයට පැමිණේ. ඒ කෙසේද යත් මල් දමෙහි මල් සමඟ එක් වූ කෙසෙල් පට්ටය රජුන්ගේ හිස්මුදුනට පැමිණෙන්නාක් මෙනි.

සිනිඳු රේණුවලින්, වර්ණවත් පෙතිවලින් යුක්ත නෙළුම් මලෙහි කටු පේළියකින් යුක්ත නටුවක් ඇත. එමෙන්ම මිනිසාට යහපත් ගුණ හා නුගුණ ද ඇත්තේය. එමෙන්ම නිර්දෝෂි වූ කෙනෙකු මෙලොවෙහි ඉපදීමක් නැත්තේය. දුර්ජනයන්ගේ ගතිය කෙසේද කිවහොත් සඳුන්, කපුරු කස්තුරි ගෙන පිණිදියෙන් අනා ජලය සමඟ මිශ්‍රකොට රන් කෙන්ඩියෙන් ඉසිමින් ලූනු වැවූව ද කිසිදා ලූනුවල දුගඳ ඉවත්වන්නේ නැතිවාක් මෙනි.

අප්‍රමාණවූ ගුණයෙන් යුතු උතුමෝ කෙතරම් වෙහෙස ලදුවත් දුෂ්ට සිත් ඇත්තාහු නොවෙති. දිශාන්තයෙහි පැතිරුණාවූ සුවඳ ඇති සඳුන් කඳ කපන කල්හි ද මඬින කල්හි ද එකාකාරයෙන් සුවඳ විහිදුවයි.

එක කුස උපන් සිය සොහොයුරා වුවත් තමනට හිතවත් නැත්නම් නෙළුම් පත වැටුණු ජලය දුරුකරන්නාක් මෙන් දුරු කළ යුතුය. තමාගේ සිරුරෙහි වාත, පිත්ත, සෙම මරණයට කුපිත වීම සිදු වේ. එහෙත් වනයෙහි වූ ඖෂධ සුවයට පැමිණීම පිණිස හිතවන්නේය.

වර්ෂාව හා සුළඟ සමාන වූ කල්හි කුඹුරු වතුපිටි සශ්‍රීක වන්නාක් මෙන් යෝග්‍ය වූ රජුගෙන් හා නුවණැති ඇමතියන්ගෙන් ලෝක සත්වයන් රැකෙති. මහත්වූ ගින්නෙන් හා සුළඟින් වනාන්තරය දැවෙන්නාක් මෙන් දුශ්චරිත ඇති රජුගෙන් හා දුෂ්ට අමාත්‍යයන්ගෙන් හැම තැන විනාශ වේ.

**පී. ඒ. කපුරුබණ්ඩාරආරච්චි**

# බොදු දනන් නිති පුදන පුලියන්කුලම රජමහා විහාරය





වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ පල්ලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුලියන්කුලම රජමහා විහාරස්ථානය පිහිටා ඇත. බංගදෙනිය -ආණමඩුව ප්‍රධාන මාර්ගයේ බංගදෙනියේ සිට ආණමඩුව දෙසට ගිය විට හමුවන එකොළොස් වෙනි සැතපුම් කණුව අසළින් දකුණත දෙසට හැරී පුලියන්කුලම තම්මන මාර්ගයේ මීටර 200ක් ගිය තැන පුලියන්කුලම රාජමහා විහාර පින්බිම හමු වේ. දුටුගැමුණු රජුගේ දසමහා යෝධයන් අතර සිටි නන්දිමිත්‍ර යෝධයා විසින් මෙම විහාරය ඉදිකර ඇතැයි ජනප්‍රවාදයේ සඳහන් වේ.දුටුගැමුණු -එළාර යුද්ධයෙන් ජයග්‍රහණය කළ දුටුගැමුණු රජතුමා විසින් දැදුරු ඔය දැල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු භාර දී ඇත්තේ නන්දිමිත්‍ර යෝධයාට බව කියැ වේ. එදා නන්දිමිත්‍ර යෝධයා විසූ ගම හඳුන්වන්නේ පල්ලම නමිනි. නන්දිමිත්‍ර යෝධයා විසින් දැදුරු ඔය දැල විහාරස්ථාන හතරක් ඉදිකර ඇත.පල්ලම නන්දිමිත්‍ර නවවංගු රාජමහා විහාරස්ථානය දැනට දැඳුරු ඔයට (ජජ්ජර නදියට, සේදී යමින් විනාශ මුඛයට යන වෙහෙර ගොඩැල්ල විහාරස්ථානය, වෙහෙර බැඳිකැලේ රජමහා විහාරස්ථානය , පුලියන්කුලම රාජමහා විහාරස්ථානය එම විහාරස්ථානවේ. වර්තමානයේ මෙම විහාරස්ථානයේ විහාරාධිපති ධූරය උසුලනු ලබන්නේ කුඩාවැව විහාර පරම්පරාවේ ගල්කුලමේ සෝනුත්තර ස්වාමීන් වහන්සේය. මුන්නේශ්වරම-ශ්‍රී පුෂ්පාරාම විහාරස්ථානයේ විහාරාධිපති ව වැඩ විසූ අපවත් වී වදාළ රොටුවේ සද්ධානන්ද හිමිගේ ශිෂ්‍ය හිමි නමකි. පුත්තලම ආනන්ද ජාතික පාසලේ නියෝජ්‍ය විදුහල්පති ලෙස කටයුතු කරති. ඉන්දියාවේ බරණැස හින්දු විශ්ව විද්‍යාලයෙන් චිත්‍ර මූර්ති කලාව පිළිබඳ විශේෂ උපාධියක් දිනා ගැනීමට සමත් වී ඇති උන්වහන්සේගේ චිත්‍ර මූර්ති කලාව පිළිබඳ දැනුම උපයෝගී කරගෙන විහාරස්ථානයේ සංවර්ධන කටයුතු කරගෙන යයි. දර්ශනීය දෙමහල් විහාර මන්දිරය සහිත චෛත්‍ය ඉදිකර ඇත. දැනට වයඹ පළාතේ ඉදිකර ඇති විශාලම දෙමහල් විහාර මන්දිරය සහිත චෛත්‍ය පුලියන්කුලම රජ මහා විහාරස්ථානයේ පිහිටි මෙම නිර්මාණය බව කියැ වේ. ඇත් පවුර සහිත දර්ශනීය වළාකුළු බැම්ම ඉදිකර ඇත. විහාරස්ථානයට පිවිසෙන ප්‍රධාන දොරටුව අභියස සම්පූර්ණයෙන්ම වටිනා දැව උපයෝගී කරගෙන දැවමය වාහල්කඩක් ඉදිකර ඇත. පරිසර හිතකාමී සෝනුත්තර හිමියන් විසින් විහාරස්ථාන භූමියේ වටිනා දුර්ලභ ඖෂධ පැළ සියයකින් පමණ සමන්විත ‘දීඝායු’නමින් ඔසු උයනක් පවත්වාගෙන යනු ලබයි. පර්චස් අසූවක පමණ භූමි භාගයක මෙම ඔසු උයන විසිරී පවතී. එදා නන්දිමිත්‍ර යෝධයා විසින් ඉදි කළ ‘කොට වෙහෙර ’සහ තැනින් තැන ගල් කණු විහාර භූමියේ පවතී. පිහිටි බෝධීන් වහන්සේ ද ඉපැරණිය. අක්කර නවසිය අනූ නවයක් විහාරස්ථාන භූමිය පැවති බව සඳහන් වුව ද අද ශේෂව පවතින්නේ අක්කර අටක පමණ භූමි භාගයකි. විහාරස්ථාන භූමිය ද පොල් වගාවෙන්, වටිනා දැවමය ශාක වලින් ,විසිතුරු මල් ගස්වලින් දර්ශනීය භූමියකි. විහාරස්ථ ශ්‍රී ධර්මපාල දහම් පාසල ප්‍රදේශයේ කීර්තිමත් දහම් නිකේතනයකි. ප්‍රාදේශීය ,දිස්ත්‍රික් ,සමස්ත ලංකා ,දහම් පාසල් සිසු නිපුණතා ඇගයීම් වලදී ජයග්‍රහණය ලැබූ සිසු දරු දැරියෝ බොහෝ වෙති.



ගල්කුලමේ සෝනුත්තර හිමි

විහාරස්ථානයේ දායක පවුල් තුන්සියයකි. පුලියන්කුලම රාජ මහා විහාරස්ථ ශාසන වර්ධන දායක සමිතිය ,උපාසක උපාසිකා සමිතිය, තරුණ බෞද්ධ සමිතිය ක්‍රියාත්මක වේ.

**ඒ.පී ගුණරත්න - මාදම්පේ සමූහ**







Pronews@lakehouse.lk 0112429283-289



හොර වැලි තොටුපොළට දෙවැනි වරටත් STF පනී

පිටුව 23



ඉන්ටර්සිටියේ මඟීන්ට නහය වහගෙන යන්න වෙලා

පිටුව 24



රන්මිහිතැන්න නවීකරණය කරයි

පිටුව 25



බී.එම්.විජේසූරිය අනුරාධපුර මධ්‍යම විශේෂ

# පාසල් පෙම දෙදරා ගියැයි දෙදෙනාම මුහුණු පොතේ අශ්ලීල පින්තූර දාලා

## සිසුවියගේ ඡායාරූප 157ක් සිසුවාගේ ඡායාරූප 110ක් ෆෝන් දෙකේ

පෙම්වතියගේ නිරුවත, සහ පෙම්වතාගේ නිරුවත ඇතුළත් ඡායාරූප අන්තර්ජාලයට මුදාහැරීම් සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි මත තරුණයා හා තරුණිය අනුරාධපුර මූලස්ථාන පොලීසියේ ළමා හා කාන්තා කාර්යංශය මඟින් (20දා) සැකපිට අත්අඩංගුවට ගෙන තිබේ. අනුරාධපුර නගරයේ පිහිටි ප්‍රධාන පාසල් දෙකක උසස් පෙළ ඉගෙනුම ලබන සිසුවියක විසින් සිදුකළ පැමිණිල්ලකට අනුව සැකකාර සිසුවා පොලිස් අත්අඩංගුවට ගෙන තිබු අතර ඔහු අත්අඩංගුවට ගැනීමෙන් පසුව පෙම්වතියට එරෙහිව ඉදිරිපත් කළ පැමිණිල්ල නිසා සිසුවියත් පොලීසිය අත්අඩංගුවට ගෙන තිබුණි.

තරුණ පාසල් සිසුවා හා සිසුවිය මාස කිහිපයක් තිස්සේ පෙම් සබඳතාවක් පවත්වා තිබෙන බවත් එම අවස්ථාවලදී දෙදෙනාම විවිධ ඉරියවුවලින් ලබාගෙන හුවමාරු කරගත් සෙල්ෆි ඡායාරූප විරසක වීමෙන් පසුව අන්තර්ජාලය හරහා මුහුණු පොතට මුදාහැර තිබෙන බවත් පොලීසිය පවසයි.දෙදෙනා අමනාපවීමෙන් පසුව සිසුවිය මුලින්ම පෙම්වතාගේ නිරුවත් ඡායාරූපයක් මුහුණු පොතට මුදාහැර තිබෙන අතර ඉන් කෝපයට පත්වු තරුණයාද පෙම්වතියගේ නිරුවත් ඡායාරූපයක් මුහුණු පොතට මුදාහැර තිබේ.

දෙදෙනා විසින් දෙදෙනාට ඉදිරිපත් කරගත් පැමිණිලි නිසා ඔවුන්ගේ ස්මාට් වර්ගයේ ජංගම දුරකතන පොලීසිය බාරයට ගෙන පරීක්ෂා කර තිබෙනා අතර එහිදි සිසුවිය විසින් විවිධ ඉරියවුවලට නිරුවතින් ලබාගත් සෙල්ෆි ඡායාරූප 157ක් පෙම්වතාගේ දුරකතනයේ ගබඩා කරගෙන තිබියදී පොලීසිය සොයා ගෙන තිබු අතර පෙම්වතා විසින් පෙම්වතියගේ දුරකතනයට යැවූ සෙල්ෆි ඡායාරූප 110ක් ඔහුගේ ස්මාට් ජංගම දුරකතනයේ ගබඩා කරගෙන තිබියදී සොයාගත් බවද පොලීසිය පැවසුවේය.

දෙදෙනාම පෙම්සුව විඳී අවස්ථාවේ සීමාමායිම් නොමැතිව නිරුවත් ඡායාරූප හුවමාරු කරගෙන තිබෙන බව පවසන පොලීසිය දෙපාර්ශවයම අනුරාධපුර වැඩ බලන මහේස්ත්‍රාත් ආකාශ් නදී කුරේරා මහත්මිය හමුවට ඉදිරිපත් කිරීමෙන් පසුව රුපියල් ලක්ෂය බැගින්වූ ශරීර ඇපමත මුදාහැර තිබුණි.නඩු විභාගය සඳහා මැයි මස (21දා) ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ පෙනී සිටින ලෙසද විනිසුරුවරිය නියෝග කළාය. අත්අඩංගුවට ගත් සැකකාර පාසල් සිසුවා අනුරාධපුර පිහිටි යුද හමුදා කඳවුරේ පිහිටි නිල නිවෙසක පදිංචිව සිටින මේජර්වරයකුගේ පුත්‍රයකු වන අතර පාසල් සිසුවිය විශ්‍රාමික නාවික හමුදා නිලධාරියකුගේ දියණියක බව පොලීසිය පවසයි.ඔවුන්ගේ ජංගම දුරකතන දෙකම අධිකරණ භාරයට ගෙන පොලිස් තොරතුරු තාක්ෂණ ඒකකයට යවා වැඩිදුර පරීක්ෂණ සිදුකිරීමට නියමිතය.

සිසුවාගේ ජංගම දුරකතනයේ වටිනාකම රුපියල් 125000ක් පමණ වන අතර සිසුවියගේ දුරකතනය රුපියල් හතළිස් දහකස් පමණ වටිනා ඒවා බව පොලීසිය කියයි. අනුරාධපුර මූලස්ථාන පොලීසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඊ.එම්. සංජීව මහනාම මහතාගේ උපදෙස් මත ළමා හා කාන්තා කාර්යංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂිකා පී.යමුනා කාන්ති, පොලිස් සැරයන්වරුන් වන ඒ.සී දයානන්ද හා බස්නායක යන නිලධාරිහු වැඩිදුර පරීක්ෂණ සිදු කරති.

ඇල්පිටිය විශේෂ

# ඇල්පිටියෙන් කොළඹට ආ බසයකට පොලු ප්‍රහාරයක්



ඇල්පිටිය බස් නැවතුම්පොළේ සිට ඊයේ (21) පෙරවරුවේ දක්ෂිණ අධිවේගී මාර්ගය හරහා කොළඹ බලා ධාවනය වෙමින් තිබූ බස් රථයකට පුද්ගලයකු විසින් කුරුඳුගහහැතැප්ම නගරාසන්නයේදී පහර දී අලාභ හානි සිදුකර ඇති අතර සිද්ධිය සම්බන්ධයෙන් ඔහු අත්අඩංගුවට ගත් බව ඇල්පිටිය පොලීසිය පවසයි.

ඇල්පිටිය නගරයේ කැඳ කඩයක් අසලදී මෙම පුද්ගලයා බදුල්ල පස්සර සිදුවූ බස් අනතුර ගැන කියමින් බස් රියැදුරන්ට බැණ වැදීම නිසා මෙම ආරවුල ඇතිවී ඇත. බස් රථය බස්නැවතුම්පොළෙන් පිටත්ව අධිවේගි මාර්ග පිවිසුමට යමින් සිටියදී මෙම සැකකරු කුරුඳුගහහැතැප්ම නගරයේ බස් නැවතුමක එය නතර කළ අවස්ථාවේ පොල්ලකින් පහර දීමෙන් බස් රථයේ වීදුරුවකට අලාභ හානි සිදුකර ඇතැයි පොලීසිය පවසයි.

මේ ආරවුලෙන් පසු බස් රථයේ වූ මගීන් වෙනත් බස් රථයක් නංවා පිටත් කර ඇති පොලීසිය සැකකාර මගියා අත් අඩංගුවට ගෙන තිබේ. ඇල්පිටිය පොලීසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

සුදත් පුබුදු කීර්ති - දෙල්ගොඩ සමූහ

# දැරියකට වේවැල් පහර දුන් කඳුබොඩ යකැදුරාගේ ගෙදරටත් හොරු පැනලා

දෙල්ගොඩ කඳුබොඩ ප්‍රදේශයේ පසුගිය දිනක වේවැල් පහරදී දැරියක මරණයට පත්කළ සැකකාර යකැදුරු කාන්තාවගේ වසා දමා තිබු නිවසේ විදුලි උපකරණ සොරාගත් පුද්ගලයකු ඊයේ (21) මීගහවත්ත පොලීසිය අත්අඩංගුවට ගෙන තිබේ. වසා දමා තිබු එම නිවසේ පිටුපස ජනේලයකින් ඇතුළු වී ඇති සැකකරු විසින් එහි තිබු බෙලෙන්ඩරයක්, ගෑස් කුකර් ඇතුළු විදුලි උපකරණද, ඇළුමිනියම් ඉනිමඟක්ද සොරාගෙන පලාගොස් සිටියදී ලද තොරතුකට අනුව ඔහු අත්අඩංගුවට ගත් බව පොලීසිය කියයි. තදින්ම හෙරෝයින් මත්ද්‍රව්‍ය පානයට ඇබ්බැහි වී ඇති මෙම සැකකරු කඳුබොඩ ප්‍රදේශයේ පදිංචි වයස අවුරුදු විසිපහක විවාහක පුද්ගලයෙකු බවත් මීට පෙරද මෙම සැකකරු විසින් අසල ගෙවත්තක පොල් සොරකමක් සිදුකර එහි තිබු පොල් උලද සොරාගෙන ගොස් තිබු බවත් එම පොල් උලද ඇතුළුව සැකකරු විසින් යකැදුරු කතගේ නිවසින් සොරාගත් භාණ්ඩ එම ප්‍රදේශයේ නිවාස දෙකක පුද්ගලයන්ට විකුණා තිබියදී සොයා ගත් බවත් පොලීසිය කියයි. අදාළ සැකකරු මහර මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි. මීගහවත්ත පොලීසියේ අපරාධ අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක එල්.ඒ. විමලරත්න, පොලිස් සැරයන් (35434) සුමේධ , (5366)දුමින්ද , පොලිස් කොස්තාපල් (88384) චතුරංග යන නිලධාරීන් වැඩිදුර පරීක්ෂණ මෙහෙයවති.

ප්‍රියන්ත සුමනසේන - උකුවෙල සංචාරක

# අවුරුදු 100ක් පැරණි කෝන් ගස කැපීම ප්‍රා. සභාපතිගේ මැදිහත් වීමෙන් නවතියි



උකුවෙල නගරයේ වසර 100කට ආසන්න කාලයක් පවතිනා විශාල ප්‍රමාණයේ පැරණි කෝන් ගසක් විදුලිබල මණ්ඩලය මඟින් ඉවත් කිරීමට ගත් උත්සාහයක් වහාම නතර කිරීමට උකුවෙල ප්‍රාදේශීය සභාවේ සභාපති ඩී. ඩබ්. එම්. චේතියරත්න මහතා විසින් පියවර ගෙන තිබේ.

උකුවෙල නගරය හරහා නව විදුලි රැහැන් ඇදීම හේතුවෙන් මෙලෙස කෝන් ගස කැපීමට තීරණය කිරීමත් සමඟ නගරවාසීන් විසින් සභාපතිවරයාට සැල කර විදුලිබල මණ්ඩලයේ ඉහළ නිලධාරීන් සමඟ ද තීරණයක් ගන්නාතුරු ගස කැපීම තාවකාලිකව නතර කළ බව හෙතෙම පැවසීය.

උකුවෙල නගරවාසීන් හා අවට බොහෝ අය ප්‍රකාශ කරන්නේ වසර ගාණක් මේ ගස නගරයේ අලංකාරය හා පරිසර හිතකාමී ගසක් වී ඇති බවත් ගස ඉවත් කිරීම නොකළ යුතු බවටත්ය.

දිඹුලාගල සමූහ

# යතුරුපැදි - ටිපර් එකට ගැටී දෙදරු පියා එතැනමයි



දෙහිඅත්තකණ්ඩිය,රත්මල්කඳුර, නාමල්ගම හන්දියේදී පසුගිය 20වැනි දින යතුරු පැදියක් ටිපර් රථයක හා බට්ටා ලොරියක ගැටී සිදු වූ රිය අනතුරකින් දෙදරු පියකු එම ස්ථානයේදීම ජීවිතක්ෂයට පත්වී ඇති බව පොලීසිය කියයි. මෙලෙස මියගොස් ඇත්තේ දෙහිඅත්තකණ්ඩිය,හුංගමාලගම අංක 225 පදිංචි හේරත් මුදියන්සේලාගේ අනුර කුමාර හේරත් නැමැති (අවුරුදු 28) දෙදරු පියෙකි.තම දරුවන්ට පාන් ගෙන ඒම සඳහා මෙම පුද්ගලයා හුංගමාලගම සිට රත්මල්කඳුර නාමල්ගම හන්දියට යතුරුපැදියෙන් ගොස් ඇත.එම අවස්ථාවේ නාමල්ගම ගල්කොරියේ සිට පැමිණි ටිපර් රථයක් අධික වේගයෙන් ප්‍රධාන මාර්ගයට ඇතුළු කරනවාත් සමගම යතුරු පැදියේ ගැටීමෙන් යතුරු පැදිය මහමග පෙරළී ඇත.ඒ සමගම මාර්ගයේ පැමිණි බට්ටා වර්ගයේ ලොරියට යතුරුපැදිකරු යටවී එම ස්ථානයේදීම ජීවිතක්ෂයට පත්වී ඇත.

ටිපර් රථයේ රියැදුරු වන මාතර බ්‍රාහ්මණගේ සුබිත ශ්‍රී විජේරත්න සහ බට්ටා ලොරියේ රියැදුරු වන ප්‍රදීප් සංජය ගුණවර්ධන යන දෙදෙනා දෙහිඅත්තකණ්ඩිය පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ.ඔවුන් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.දෙහිඅත්තකණ්ඩිය පොලීසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ටිරෝන් රත්නායක මහතාගේ උපදෙස් මත උප පොලිස් පරීක්ෂක හේරත්,පොලිස් සැරයන් 43759 ගමගේ,37749 චමින්ද,61663 රාජපක්ෂ,පොලිස් කොස්තාපල් 77532 රත්නායක,යන නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ මෙහෙයවති.

නුවන් ජයසේකර - සූරියවැව විශේෂ

# විශ්‍රාමික සෙබළා දවසේ පඩියට කසිප්පු පෙරලා

සූරියවැව හත්පෝරුව ප්‍රදේශයේ නිවෙසක පවත්වාගෙන ගිය කසිප්පු නිශ්පාදනාගාරයක් වටලා සැකකරුවකු සමඟ කසිප්පු ස්ප්‍රිතු,ගෝඩා සහ උපකරණ තොගයක් සූරියවැව පොලිස් විශේෂ කාර්ය බළකා නිලධාරින් විසින් අත්අඩංගුවට ගෙන තිබේ. මෙලෙස අත්අඩංගුවට පත්ව ඇත්තේ සෙවණගල,මහගම ජනපදයේ පදිංචි 47 හැවිරිදි විවාහක පුද්ගලයෙකි. විශේෂ කාර්ය බළකා නිධාරින්ට ලද තොරතුරකට අනුව අදාළ නිවස පරීක්ෂා කර ඇති අතර නිවසේ වසා දමා තිබූ කාමරයක සැකකරු කලක් තිස්සේ මෙම ජාවාරම කරගෙන ගොස් ඇති බවට තොරතුරු වාර්තා වේ.වැටලීම සිදුකරන අවස්ථාව වන විට සැකකරු කසිප්පු පෙරමින් සිට ඇති අතර එහිදී එහි තිබී කසිප්පු ස්ප්‍රිතු බෝතල් 90ක්,කසිප්පු පෙරීමට යොදාගන්නා ගෝඩා මිලි ලීටර් එක්ලක්ෂ හතළිස් එක් දහස් පන්සීයක්,යකඩ බැරල් දෙකක් හා කසිප්පු පෙරීමට යොදාගත් ගෑස් ලිප්,ගෑස් සිලින්ඩර්,සැලැන්ගි ඇතුළු උපකරණ තොගයක්ද පොලිස් විශේෂ කාර්ය බළකා නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

අත්අඩංගුවට පත් සැකකරුගෙන් කරණ ලද ප්‍රශ්න කිරීමේදී අනාවරණය වී ඇත්තේ සැකකරු කලක් තිස්සේ දවසේ පඩියකට මෙහි කසිප්පු පෙරීම කර ඇති බවය.

සමීර අබේසිංහ නුගේගොඩ සමූහ



# රාජගිරියේ කොටාගේ අයිස් ජාවාරමක් අල්ලයි

මහා පරිමාණයෙන් අයිස්, ගංජා, හෂීස් මෙන්ම හෙරොයින් මත්කුඩු ජාවාරමේ නියුතු ප්‍රධාන පෙළේ මත්ද්‍රව්‍ය ජාලයකට සම්බන්ධ නායකයෙක් හා ඔහුගේ සමීපතම ගෝලයෙන් තිදෙනෙක් මත්කුඩු හා අයිස් මත්ද්‍රව්‍ය සමඟ බොරලැස්ගමුව, රත්තනපිටිය, පිල්ලෑව පන්සල ආශ්‍රිත ප්‍රදේශයේදී අත්අඩංගුවට ගත් බව බොරලැස්ගමුව පොලීසිය පවසයි.අත්අඩංගුවට ගැනීම සිදු කළ අවස්ථාවේදී මත්ද්‍රව්‍ය ජාලයේ ප්‍රධානතම පුද්ගලයා සන්තකයේ තිබී හෙරොයින් මත්කුඩු ග්‍රෑම් 05යි මිලිග්‍රෑම් 200ක් සොයාගත් බවත් ඔහුව අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ඒ අසලම සිටි මෙම පුද්ගලයාගේ ප්‍රධාන ගෝලයාවද අත්අඩංගුවට ගත් බවත් ඔහු සන්තකයේ තිබී අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 51ක්ද සොයාගත් බවත් පොලීසිය පැවසීය. මෙම සැකකරුවන් දෙදෙනා පොලිස් ස්ථානය වෙත ගෙනවිත් සිදු කළ ප්‍රශ්න කිරීම්වලදී ප්‍රධාන සැකකරු වෙත ලැබෙන මත්ද්‍රව්‍ය බෙදාහැරීමේ කටයුතුවල නියුතු වූ තවත් පුද්ගලයන් දෙදෙනෙක් අත්අඩංගුවට ගත් බවත් ඔවුන් සන්තකයේ තිබී අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 බැගින් ග්‍රෑම් 30ක් ද පොලිස් භාරයට ගත් බවත් පොලීසිය පැවසීය. මත්ද්‍රව්‍ය ජාවාරම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන දැනට බන්ධනාගාර ගතව සිටින රාජගිරියේ කොටා නැමැති පුද්ගලයා හා වැලිකඩ කටී රොෂාන් නැමැති ප්‍රධාන පෙළේ මත්ද්‍රව්‍ය ජාලයකට සම්බන්ධිත පුද්ගලයන් දෙදෙනා බන්ධනාගාරය තුළ සිට මෙම ජාවාරම හා ජාලය මෙහෙයවා ඇති බවට පොලීසිය සිදුකළ මූලික විමර්ශනයේදී අනාවරණය වී තිබේ. අත්අඩංගුවට ගත් ප්‍රධාන සැකකරු පිළියන්දල, විජිතපුර ප්‍රදේශයේ පදිංචි (32) හැවිරිදි පුද්ගලයෙක් බවත් අනෙක් පුද්ගලයන් තිදෙනා (21,23,38) වැනි වයස් කාණ්ඩවල පසුවන මාතර හා ඇරැව්වල ප්‍රදේශයේ පදිංචිකරුවන් බවත්පොලීසිය පවසයි. පොලීසිය විසින් අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය තොගයේ වටිනාකම රුපියල් ලක්ෂ දහයකට ආසන්න බවත් නුගේගොඩ, බොරලැස්ගමුව, පිළියන්දල, දෙහිවල යන ප්‍රදේශයන්වල මත්ද්‍රව්‍ය බෙදා හැර ඇති බවත් පරීක්ෂණවලදී අනාවරණය වී තිබේ. සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ බස්නාහිර පළාත දකුණ භාර නියෝජ්‍ය පොලිස්පති කපිල කඩුපිටිය, නුගේගොඩ කොට්ඨාස බාර භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නුවන් අසංක, නුගේගොඩ කොට්ඨාස කලාප 01 භාර පොලිස් අධිකාරි කේ.එස් රූපසිංහ යන මහත්වරුන්ගේ අධීක්ෂණය මත බොරලැස්ගමුව පොලීසියේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක කේ.පී විජේරත්න මහතාගේ උපදෙස් මත පාලන අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක ආසිරි ජයසූරිය මහතාගේ මෙහෙයවීමෙන් පොලිස් කොස්තාපල් 68843 දේශාන්, 74259 හේරත්, 91213 ඉසුරු යන නිලධාරීන් විසින් පවත්වනු ලබයි.

දිනමිණ දැසත
දස අත ම එක තැන

මාපාකඩවැව සමූහ - එච් එම් රංජිත් කරුණාතිලක





# හොර වැලි තොටුපොළට දෙවැනි වරටත් STF පනී

## තොරතුරු පත්තරේ නොදාන්නැයි මාධ්‍යවේදීන්ටත් තර්ජන

මහියංගණ, සොරබොර, ගුරුමඩ ප්‍රදේශයේ බලපත්‍ර රහිතව මාසයකට ආසන්න කාලයක් එක දිගට දේශපාලන හයියෙන් පවත්වාගෙන ගිය වැලි තොටුපළක් දෙවන වර පසුගිය 17 දින සවස 4.00ට පමණ විශේෂ කාර්යය බළකා නිලධාරින් (STF) විසින් වටලා ෆයිබර් බෝට්ටු 03ක් හා වැලි කැණීමේ යෙදුණු පුද්ගලයන් 08ක් අත් අඩංගුවට ගනු ලැබීය.

මෙම වැලි තොටුපළ මහියංගණයේ දේශපාලනයට සම්බන්ධ පවුලක, පවුලේ සාමාජිකයෙකු විසින් භූ විද්‍යා හා පතල් කාර්යාංශයේ බලපත්‍ර ලබාගැනීමකින් තොරව සිදු කරගෙන යනු ලැබූ එකකි. පසුගිය මාසයේ 24 වන දිනද එම තොටුපළ විශේෂ කාර්යය බළකා නිලධාරින් (STF) විසින් මේ ආකාරයෙන්ම වටලා වැලි ට්‍රැක්ටරයක් හා ෆයිබර් බෝට්ටුවක් අත් අඩංගුවට ගනු ලැබීය. දෙවන වරටද නිති විරෝධී ආකාරයෙන් වැලි තොටුපළ පවත්වාගෙන යනු ලැබූ දේශපාලන පවුලේ සාමාජිකයා අත් අඩංගුවට ගැනිමට විශේෂ කාර්යය බළකා නිලධාරින්ට නොහැකි විය.

17 වන දින අත් අඩංගුවට ගනු ලැබූ සැකකරුවන් 08 දෙනාගෙන් එක් අයෙකු (තොටුපළ පාලක) රාත්‍රී කාලයේදී විශේෂ කාර්යය බළකා නිලධාරින් ගේ ග්‍රහණයෙන් මිදී පලා ගොස් ඇති අතර, අධිකරණ කටයුතු සිදු කිරිම සඳහා විශේෂ කාර්යය බළකා නිලධාරින් විසින් අත්අඩංගුවට ගත් පුද්ගලයන් හා උපකරණ 18 දින අලුයම මහියංගණ පොලිසිය වෙත බාරදීමෙන් අනතුරුව 25 වන දින අධිකරණයට ඉදිරිපත් කරන තුරු අත්අඩංගුවට ගත් පුද්ගලයන් එදින උදැසනම පොලිස් ඇප මත මුදාහැර ඇත.

බලපත්‍ර රහිත නිති විරෝධී වැලි තොටුපළ පවත්වාගෙන ගිය ප්‍ර දේශයේ දේශපාලනයට සම්බන්ධ පවුලේ සාමාජිකයා පසුගියදා විද්‍යුත් මාධ්‍යවේදියෙකුගේ නිවසටම ගොස් ඔහුගේ වැලි තොටුපළ රූපවාහිනියට දමා තමන්ට කරදර නොකරන ලෙසද මාධ්‍ය වේදියාට බලපෑම් සිදු කර ඇත.



මහඔය විශේෂ කාර්යය බළකායේ පොලිස් පරික්ෂක අත්තනායක මහතාගේ ප්‍රධානත්වයෙන් උප පොලිස් පරික්ෂක නිශාන්ත මහතා, පොලිස් කොස්තාපල් 82748 සදකැළුම්, 90632 අමරසිංහ, 90796 ළහිරු, 94216 ලක්මාල්, 94148 මධුශන්ක, රියදුරු 19192 බුද්ධික මහත්වරුමෙම වැටලීමේ මෙහෙයුම සිදු කරනු ලැබූහ.

ඊ. සී. ප්‍රනාන්දු මුන්නේශ්වරම සමූහ

# ටිපර් රියේ ගැටී යතුරුපැදිකරු මරු දකී

පුත්තලම දෙසින් ආණමඩුව දෙසට ගමන් ගත් ටිපර් රථයක් පසු පසින් පැමිණි යතුරුපැදියක් ටිපර් රථයේ පසු පස ගැටී සිදු වු අනතුරින් තුවාල ලද යතුරු පැදියේ ආ තරුණයා පුත්තලම මූලික රෝහලට ඇතුළු කිරිමට ගෙන යන අතර මිය ගිය බව ආණමඩුව පොලිසිය කියයි.

මෙසේ මිය ගොස් ඇත්තේ මදුරන්කුලිය ප්‍රදේශයේ විසු 22 වියේ පසුවන ඩබ්ලිව්. එම්. දිනේශ් උමයංග නමැති තරුණයෙකි.

ඉකුත් සිකුරාදා ( 19 දා ) රාත්‍රි 7 ට ආසන්නව තිබිය දි ටිපර් රථය වේගයෙන් පුත්තලම ආණමඩුව මාර්ගයේ ධාවනය වෙමින් පැවැති අවස්ථාවේ දි මිය ගිය තරුණයා විසින් පදවා ආ යතුරු පැදියක් ද වේගයෙන් ඒ පසු පසින් පැමිණි පොලිසිය කියයි.

එම මාර්ගයේ 104/105 අතර කජු වත්ත ප්‍රදේශයේ දි ඉදිරියෙන් ගිය ටිපර් රථය එක්වරම තිරිංග තද කනර නතර කළ අවස්ථාවේ දේ පසු පසින් පැමිණි යතුරුපැදිය ටිපරයේ පසු පස ගැටි අනතුරකට ලක්ව පැදිකරු තුවාල ලබා ඇති බවත් කියයි.

අනතුරට සම්බන්ධ ටිපරය හා එහි රියදුරු අත් අඩංගුවට ගත් අතර ආණමඩුව පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරික්ෂක ප්‍රසන්න කුමාර මහතාගේ උපදෙසින් රථවාහන ඒකකය විසින් පරීක්ෂණ සිදු කරයි.

ඌරුබොක්ක විශේෂ ඒ. පි. දයාචන්ද්‍ර

# පල්ලියට එරෙහිව පිටබැද්දර නගරයේ දී උද්ඝෝෂණ



පිටබැද්දර ප්‍රදේශයේ පල්ලියක් ඉදිකිරීමට කටයුතු කරන බවට පවසමින් ස්වාමීන් වහන්සේලා ඇතුළු පිරිසක් පිටබැද්දර නගරයේ දී පෙරේදා විරෝධතාවක් පැවැත්වූ අයුරු. එවිට පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අසලට පැමිණි මාතර දස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වීරසුමන වීරසිංහ සහ මාතර දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී නිපුන රණවක යන මහත්වරුන් ස්වාමීන් වහන්සේලා ඇතුළු පිරිස සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව විරෝධතාකරුවෝ සංදේශයක් භාර දුන්හ. එහිදී මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු වීරසුමන වීරසිංහ මහතා කියා සිටියේ ඉදි කිරීමට යෝජිත පල්ලිය ඉදි කිරීමට ඉඩ නොදෙන බවත් එය තහනම් කිරීමට අවශ්‍ය කටයුතු කරන බවයි. ඒ පිරිස විසිර ගියහ.

කරන්දෙනිය සමූහ අනුරාධ ප්‍රියදර්ශන

# බාරය ඔප්පු කරන්න පා ගමනින් කතරගමට



රට වෙනුවෙන් ගාලු දිස්ත්‍රික් හිටපු පළාත් සභා මන්ත්‍රී ආරියවංශ සම්මු මහතා පා ගමනින් සීනිගම සිට කතරගමට යයි.

කොරෝනා වසංගතයෙන් රටත් ජනතාවත් මුළු මහත් ලෝකවාසීනුත් ආරක්ෂා කර අපේ රටට සෞභාග්‍යය උදා කරන දෙන ලෙසටත් අප රටට එරෙහිව අධිරාජ්‍යවාදී රටවල් ජිනීවා මානව හිමිකම් කවුන්සලයට ගෙන ආ යෝජනාවෙන් රට ජාතිය බේරාගත් වීරෝදාර රණවිරුවන්ට සහ රාජ්‍ය නායකයන්ට දඬුවම් කර අප රටට සම්බාධක දැමීමට දරන උත්සාහය පරාජය කිරීමටත් මවුබිමට සතුරුකම් කළ යහපාලන ආණ්ඩුව පෙරළා දමන ලෙසත් දින නවයක් පුරා බක්කි කරත්තෙන් සීනිගම අයිතිය ඓතිහාසික ශ්‍රී දෙවොල් දේවාලයේ සිට කතරගමට ගොස් දෙවියන්ට වූ භාරයක් ඔප්පු කිරීම සඳහා මෙම පා ගමන සංවිධානය කොට ඇති බව ශම්මු ආරියවංශ මහතා පවසයි. ඔහු අද මේ පාගමන දින නමයක් තිස්සේ සීනිගම ශ්‍රී මහා දෙවොල් දේවාලයේ සිට කතරගම දේවාලය දක්වා පා ගමනක් ආරම්භ කරන ලදී. මේ අවස්ථාවට අමාත්‍ය රමේෂ් පතිරණ රාජ්‍ය අමාත්‍ය මොහාන් පී ද සිල්වා මැති ඇමතිවරුන් ඇතුළුව පොදුජන පෙරමුණේ පළාත් පාලන නියෝජිතයෝ රැසක්ම සහභාගි වූහ. අද දින පා ගමන සීනිගම සිට හබරාදුව දක්වා ගමන් කරනු ඇත.

විජිත සල්ගාදු - අකුරැස්ස මධ්‍යම විශේෂ

# වෑන්රියේ ගැටී බිරිය මරුට සැමියාට අමාරුයි

අකුරැස්ස, දියලපේ දී කුඩා වෑන් රථයක ගැටී 19 වෙනි දින රාත්‍රී කාන්තාවක මියගොස් ඇයගේ සැමියා ද බරපතළ තුවාල ලබා අකුරැස්ස රෝහලේ ප්‍රතිකාර ලබයි. මෙලෙස මියගොස් ඇත්තේ දියලපේ, අම්බලන්ගොඩවත්ත පදිංචි 62 හැවිරිදි එම්. ඒ. අනුලාවතී නමැත්තියයි. 19 වෙනි දින රාත්‍රී 7.00 ට පමණ දියලපේ ඇති තම වෙළඳසල වසා ඒ අසල පිහිටා ඇති සිය නිවෙස වෙත පා ගමනින් ගමන් ගත් අඹු සැමි යුවළ කුඩා වෑන් රථයක ගැටී තිබේ. අඹු සැමි යුවළ සිහසුන්ව පාරේ වැටී සිට ඇත. කිසිවෙකු විසින් රාත්‍රී 10.00 ට පමණ අකුරැස්ස පොලිසිය වෙත දුරකථනයෙන් දැනුම්දී ඇති අතර අකුරැස්ස පොලිස් ස්ථානාධිපති සහ නිලධාරීන් පිරිස රාත්‍රී එම ස්ථානය වෙත ගොස් සිහිසුන්ව පාරේ වැටී සිටි අඹු සැමි යුවළ අකුරැස්ස දිසා රෝහල වෙත යැවීමට පියවර ගෙන තිබුණි. වෑන් රථයේ රියැදුරු ස්ථානයෙන් පලාගොස් තිබුණි. තුවාල ලැබූ කාන්තාව රෝහල්ගත කරන විටත් මියගොස් තිබූ බව රෝහල් ආරංචි මාර්ග පවසයි.

කරාපිටිය සමූහ - එස්. ලොකුකරවිට

# රූමස්සල රැකදෙන්නැයි මහජන විරෝධතා

රූමස්සල අභය භූමිය ආශ්‍රිත පරිසරය බේරා දෙන්න යැයි රජයට බලකිරීමේ මහජන විරෝධතාව පෙරේදා (20) සවස ගාල්ල දුම්රිය ස්ථානය ඉදිරිපිට විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් පැවැත්විණ.

විරෝධතාව ගාල්ල බස් නැවතුම ඉදිරිපිට පැවැත්වීමට සංවිධාන කර තිබූ නමුත් එයට එරෙහිව පොලිසිය අධිකරණ නියෝගයක් ලබාගැනීම හේතුවෙන් එම උද්ඝෝෂණය ගාල්ල දුම්රිය ස්ථානය ඉදිරිපිටට ගෙන යෑමට සංවිධායකයෝ පියවර ගත්හ.

මෙම නියෝගය නිකුත් කර තිබුණේ ගාල්ල වැඩබලන මහේස්ත්‍රාත් ප්‍රේමරත්න තිරාණගම මහතා විසිනි.

"ගාල්ලේ හදවත අනතුරේ රූමස්සල අභයභූමිය වනසන්න ඉඩ නොදෙමු" යන්න තේමා කරගනිමින් රූමස්සල සුරකිමු සංවිධානය ඇතුළු පරිසර සංවිධාන හා සිවිල් සංවිධාන රැසක් මේ උද්ඝෝෂණය සංවිධාන කර තිබිණි. එහිදී




ඔවුන් ඉල්ලා සිටියේ රූමස්සල පරිසර සංවේදී කලාපය හරහා ඉදිකිරීමට යෝජනා කර ඇති මාර්ගය ඉදිකිරීම වහාම නතර කරන ලෙසයි. එමෙන්ම රූමස්සල අභභූමියට අමතරව රූමස්සල පරිසර පද්ධතිය සංරක්ෂිත කලාපයක් ලෙස නම්කරන ලෙසත් අනවසර ඉදිකිරීම් වහාම නතර කරන ලෙසත් ඉල්ලමින් එම සංවිධාන උද්ඝෝෂණය පැවැත්වීය.

මේ සඳහා මහා සංඝරත්නය ඇතුළු රූමස්සල සහ උණවටුනේ පදිංචි පිරිසක් සහ ගාල්ල දිස්ත්‍රික්කයේ පදිංචිකරුවෝ රැසක් ද එක්ව සිටියහ.

උද්ඝෝෂණය ආරම්භකිරීමට සූදානම් වන අවස්ථාවේ එම ස්ථානයට පැමිණි ගාල්ල මූලස්ථාන පොලිසියේ නිලධාරීන් සංවිධායකයන්ට අධිකරණ නියෝගය පෙන්වා උද්ඝෝෂණය නතර කරන්න යැයි ඉල්ලා සිටියේය. එම අධිකරණ නියෝගය නිකුත්කර තිබුණේ ගාල්ල බස් නැවතුම්පොළ ඉදිරිපිට උද්ඝෝෂණය පැවැත්වීම තහනම් කරමින් බැවින් එම ස්ථානයේ උද්ඝෝෂණය සංවිධාන කළ පිරිස එතැනින් ඉවත්ව ගාල්ල දුම්රිය ස්ථානය ඉදිරිපිට උද්ඝෝෂණය පැවැත්වූහ.

ගාල්ල පොලිසියේ නිලධාරීහු ද උද්ඝෝෂණය අවසන්වනතුරු ම එම ස්ථානයේ රැඳී සිටියහ.

අමිල ප්‍රභාත් වනසිංහ-අනුරාධපුර අතිරේක

# රට වටේම රන් සොරකමේ ගිය නාඋල කතට වැඩ වරදී

දිවයිනේ දිස්ත්‍රික්ක හතක රන් ආභරණ සැලසුම් සහගතව සොරකම් කළ කාන්තාවක අත්අඩංගුවට ගැනීමට තඹුත්තේගම පොලිසියේ අපරාධ විමර්ශන අංශය පසුගියදා සමත්විය. මෙලෙස අත්අඩංගුවට ගත් සැකකාර කාන්තාව අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස තඹුත්තේගම මහේස්ත්‍රාත් කේ. ඒ. ආර්. නදිෂානි මහත්මිය නියෝග කළාය. මෙලෙස රක්ෂිත බන්ධනාගාරගත කරනු ලැබුයේ නා උල, හාඩුව ප්‍රදේශයේ පදිංචි පනස් එක් (51) හැවිරිදි කාන්තාවකි.

සැකකාර කාන්තාව දිවයිනේ විවිධ ප්‍රදේශවල ඇති ස්වර්ණාභරණ ආයතනවලින් අවුරුදු තුනක පමණ කාලයක් තිස්සේ සැලසුම් සහගතව හා සූක්ෂමව ස්වර්ණාභරණ සොරකමේ නිරතව ඇති බවට පොලිසියට අනාවරණ වි තිබේ. මේ කාන්තාව තඹුත්තේගම නගරයේ පිහිටා තිබෙන ස්වර්ණාභරණ වෙළෙඳසලකට පසුගිය දහතුන්වනදා (13) සිය පුතාගේ මංගල උත්සවය සඳහා රන් ආභරණ මිලදී ගැනීමට අවශ්‍ය බව පවසමින් පැමිණ ඇති අතර එහිදි ඉතා සුක්ෂම ලෙස තුන් ලක්ෂ හතළිස් දහසක් (340 000) පමණ වටිනා වළල්ලක් සොරකම් කර පලා ගොස් තිබේ.

කෙසේ වෙතත් අදාළ සොරකම සීසීටීවී දර්ශන තුළින් අනාවරණ කරගත් ස්වර්ණාභරණ වෙළඳසල් හිමියා මේ සම්බන්ධයෙන් තඹුත්තේගම පොලිසියට පැමිණිලි කර තිබේ. අනතුරුව තොරතුරු හරහා හඹා ගිය පොලිසිය අදාළ සැකකාර කාන්තාව පදිංචිව සිටින පහල හාඩුව, නා උල ප්‍රදේශයේදි අත්අඩංගුවට ගැනීමට පසුගියදා (19) සමත්විය. පසුව එම ආභරණය අලෙවි කර තිබිය දි පොලිසිය විසින් සොයා ගෙන තිබේ.

මූලික පරීක්ෂණවලින් හෙළි වී ඇත්තේ අදාළ කාන්තාව මෙම රන් ආභරණ සොරකම් සම්බන්ධයෙන් මේ වනවිට නඩු පහළවකට පමණ පෙනී සිටින අයෙකු බවත් අනුරාධපුරය, යාපනය, ගාල්ල, මීගමුව, පොළොන්නරුව, කුරුණෑගල ඇතුළු දිස්ත්‍රික්ක තුළ රන් ආභරණ සොරකම කර ඇතැයි පොලිසිය පවසයි.

තඹුත්තේගම මුලස්ථාන පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරික්ෂක අතුකෝරළ මහතාගේ උපදෙස් මත අපරාධ අංශ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරික්ෂක පි.එම්.එස්.එස් ගුනසේකර,උප පොලිස් පරික්ෂක දයාරත්න,පොලිස් සැරයන්වරුන් වන (38425)ජාලිය,(36357) කුමාර,(83071)රසික,කාන්තා පොලිස් සැරයන් (3308)නිලන්ති,කාන්තා පොලිස් කොස්තාපල් (7107) තුෂාරි යන මහත්ම මහත්මීන් විසින් සැකකාර කාන්තා අත් අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කෙරිණ.

එස්. ජී. උබේපාල - කැබිතිගොල්ලෑව සමූහ



# මැදවච්චියේ පවුල් 300කට නොමිලේ විදුලිය



ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම තුළින් දිවයින පුරා ක්‍රියාත්මක දැයට එළිය විදුලි ව්‍යාපෘතිය යටතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගම්මාන 108ක, සමෘද්ධිලාභීන් සහ සමෘද්ධි අපේක්ෂක විදුලිය නැති පවුල් 300කට නොමිලේ විදුලිය දීම සඳහා සූදානම් බව පොදුජන විදුලි ව්‍යාපෘති ඉංජිනේරු, මැදවච්චිය විදුලි ව්‍යාපෘති සම්බන්ධීකාරක නිශාන්ත ගුණතිලක මහතා පැවසීය. මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මේ වන විට විදුලිය නැති පවුල් 400කට ආසන්න ප්‍රමාණයක් සිටිනා බවට හඳුනාගෙන ඇති බවත් පළමු අදියර ලෙස තොරාගත් පවුල් 300ක් සඳහා රජය නොමිලේ විදුලිය දීම සඳහා මේ වන විට රුපියල් හැටඑක් ලක්ෂ අනූපන්දහසක මුදලක් වෙන් කර ඇති බවත් විදුලි ඉංජිනේරුවරයා කීවේය. මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේදී පෙරේදා (20) දැයට එළිය විදුලි ව්‍යාපෘතිය ආරම්භ කරමින් ඒ මහතා එසේ ප්‍රකාශ කළේය.

මැදවච්චිය ප්‍රාදේශීය සභාව මඟින් මෙය සංවිධානය කර තිබිණි. විදුලිබල අමාත්‍යාංශය, සූර්යබල, සුළං ජාල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, සමෘද්ධි රාජ්‍ය අමාත්‍යාංශය, ලංකා විදුලිබල මණ්ඩලය සහ සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම ඒකාබද්ධව මේ දැයට එළිය විදුලි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිතය.

2022 වර්ෂය වන විට මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විදුලිය නැති සියලුම නිවාස සඳහා මේ දීපව්‍යාප්ත වැඩසටහන යටතේ විදුලිය දීමට අපේක්ෂා කරනා බවත් ලෝක වසංගය හමුවේ දැවැන්ත අධිරාජ්‍යවාදී රටවල් බිඳ වැටී තිබෙනා අවධියක ශ්‍රී ලංකාව තුළ වත්මන් රජය ශක්තිමත්ව සිට ගනිමින් ගමට සංවර්ධනය ගෙන එමින් සිටිනා බවත් මේ උත්සවය අමතා මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ සභාපති හේරත් සේනාරත්න මහතා පවසා සිටියේය.

රාගම සමූහ

# රියැදුරුට නින්ද ගිහින් කන්ටේනරය කඩේ ගිහින්



කිරිබත්ගොඩ නගරයේ සංඥා පුවරුවක් අසලදී 19වනදා අලුයම 4.30ට පමණ සිදුවූ රිය අනතුරකින් කොළඹ නුවර මාර්ගයේ පිහිටි ව්‍යාපාරික ස්ථාන දෙකකට අලාභහානි සිදුවී ඇති අතර එම ස්ථනයේ පිහිටි විදුලි කණුවක් සම්පූර්ණයෙන්ම විනාශයට පත්වී ඇතැයි කිරිබත්ගොඩ පොලීසියේ රථවාහන අංශය කියයි. කාඩ් බෝර්ඩ් පැටවූ අඩි හතළිහක දිගින් යුත් කන්ටේනර් රථයක් කොළඹ වරායේ සිට නිට්ටඹුවේ නිදහස් වෙළඳ කලාපය දක්වා ප්‍රවාහනය කරමින් තිබියදී රියදුරුට නින්ද යාම නිසා මෙම අනතුර සිදුවී ඇත. රිය අනතුරින් පසු රියදුරු එම ස්ථානයෙන් පලා ගොස් පසුව කිරිබත්ගොඩ පොලීසියට භාරවී ඇත. පොලිස් අත් අඩංගුවට පත් සැකකරුට එරෙහිව රජයේ දේපළකට සිදුවූ අලාභහානි සම්බන්ධව හා රිය අනතුරක් සිදුකර පලායාමේ චෝදනාව මත මහර අධිකරණයේ නඩු පැවරීමට නීතිමය පියවර ගන්නා බව රථවාහන අංශය පැවසීය .

චිත්‍රාරත්න කලුආරච්චි - හිදෝගම සමූහ

# අනුරපුර - කොළඹ ඉන්ටර්සිටියේ මගීන්ට නහය වහගෙන යන්න වෙලා



අනුරාධපුරය සිට කොළඹ බලා ධාවනය වූ නගරාන්තර ශීඝ්‍රගාමී දුම්රියේ වැසිකිළි පද්ධතියේ අපද්‍රව්‍ය දුම්රිය මැදිරි තුළට ගලා යෑමක් සිදු වී ඉන් මඟී ජනතාව අපහසුතාවට පත් වී තිබේ. මේ දුම්රියේ රුපියල් 600, 400 වැනි මුදලක් ටිකට් පතට අය කරන බවත්, මෙලෙස වැසිකිළි පද්ධතියේ අපද්‍රව්‍ය මැදිරි තුළට ගලා ඒම හේතුවෙන් දැඩි ගඳක් පැවතුණ බවත් මඟීහු පවසා සිටියහ.

දුම්රියේ ගමන් ගත් මඟීහු මුත්‍රා ගඳ හේතුවෙන් නාසය වසාගෙන ගමනාන්තය දක්වා යෑමට සිදු වී ඇති බවත් කොරෝනා මුව ආවරණය එම අවස්ථාවේදී වාසිසහගත වූ බවටත් එදින දුම්රියේ ගමන් කළ මඟීහු පවසා සිටියහ.

බී. එම්. විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

## මිනිස්සු කට්ටියක් අපේ ඉඩමේ පදිංචි වෙන්න හදනවා



වසර තිස්පහකට අධික කාලයක් වගා කටයුතු සිදු කළ මිහින්තලය පළුගස්වැව පිහිටි සිය පවුලට අයත් ඉඩම මිහින්තලය ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයකු කොල්ලකෑමට සූදානම් වන බව කියමින් අසාධාරණයට පත්වූ පවුලක් පෙරේදා (20දා) උදෑසන ඒ - නවය ප්‍රධාන මාර්ගයේ පළුගස්වැව ප්‍රදේශයේ විරෝධතාවක නිරත විය.

මිහින්තලය පළුගස්වැව ඉඩම් හිමිකරු වන ඒ. විමලසිරි, ඒ. සිරියලතා, ඒ. රූපලතා, ඒ. චන්ද්‍රලතා ඇතුළු පිරිසක් මිහින්තලය ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී චමින්ද සම්පත් යන අයට විරෝධය පළ කරමින් විරෝධතාව පවත්වා ඇති අතර ඔවුන් මන්ත්‍රීවරයාගේ ක්‍රියාකලාපයට එරෙහිව විරෝධතා පුවරු ප්‍රදර්ශනය කරමින් විරෝධතාව පැවත්වූහ. වසර 35ක පමණ කාලයක් සිය මව, පියා ඇතුළු පිරිස හේන් ගොවිතැන් කළ අක්කර තුනක පමණ ඉඩම මන්ත්‍රීවරයකුගේ පෞද්ගලික බුදලක් බවට පත්වෙමින් පවතිනා බවත් මිහින්තලය අශෝකපුර පදිංචි අඩු ආදායම්ලාභී පවුලකට නිවෙසක් ඉදි කිරීමට කියමින් ඉඩමට බලහත්කාරයෙන් ඇතුළු වී එළිපෙහෙළි කිරීම් සිදු කර තිබෙනා බව විරෝධතාකරුවෝ පවසා සිටියහ. විරෝධතාවට එක්වූ ඉඩමේ හිමිකරුවෝ මෙසේ පැවසූහ.

"අපේ මව්පියෝ අවුරුදු 35ක් මේ ඉඩමේ වගා කටයුතු කළා. අක්කරයක විතර තේක්ක වගාවක් තියෙනවා. චමින්ද සම්පත් කියන මන්ත්‍රීවරයා හරියට ඉඩම් ඇමති වගේ. පහුගිය කාලය පුරා ඇමැතිතුමාට මඩ ගහ ගහ ඔහු තමයි මිහින්තලයේ ඉඩම් ටික කොල්ල කෑවේ. දැන් මිනිස්සු කට්ටියක් අපේ ඉඩමේ පදිංචි කරන්න ගෙවල් හදන්න අවශ්‍ය බඩු මුට්ටු මේ ඉඩමට ගෙනල්ලා දාලා. වැසිකිළි වළක් කපලා. මන්ත්‍රී තමයි දැන් ඉඩම් ඇමැතිතුමා."

මේ සම්බන්ධයෙන් සොයා බැලීමට මිහින්තලය ප්‍රාදේශීය ලේකම් සිරිමෙවන් ධර්මසේන මහතා කටයුතු කර ඇති අතර අදාළ ඉඩමට කිසිදු බලපත්‍රයක් නැති බවත් ආරවුල විසඳීමට කටයුතු කරනා බවත් ඒ මහතා පවසා සිටියේය.

ගයාන් සංජය

## නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍රකුමාර වැඩ භාර ගනී



නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍රකුමාර මහතා කොළඹ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා වශයෙන් පසුගියදා වැඩ භාර ගන්නා ලදි.

චන්ද්‍රකුමාර මහතා වැලිමඩ වංගියකුඹුර ජාතික පාසලෙන් මූලික අධ්‍යාපනය ලබා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් උපාධිය හදාරා 2001 වසරේදී සහකාර පොලිස් අධිකාරිවරයකු වශයෙන් පොලිස් සේවයට එක් වී ඇත. එලෙස සහකාර පොලිස් අධිකාරිවරයකු වශයෙන් පොලිස් සේවයට බැඳී ඒ මහතා අවිස්සාවේල්ල, තංගල්ල, අගමැති ආරක්ෂක හා ජනාධිපති ආරක්ෂක අංශවලත් කොට්ඨාස භාර පොලිස් නිලධාරියකු ලෙස තංගල්ල, බණ්ඩාරවෙල, මාතලේ සහ ත්‍රිකුණාමලය යන කොට්ඨාසවලත් වසර 08ක් සේවය කර තිබේ.

පොලිස් මූලස්ථානයේ අධ්‍යක්ෂ ධුර විශාල ප්‍රමාණයක් හොබවා ඇති ඒ මහතා පර්යේෂණ හා සැලසුම්, දේපළ කළමනාකරණය, සුබසාධක, සංඛ්‍යාලේඛන, පොලිස් රෝහල යන අංශවල කැපීපෙනෙනා සේවයක් ඉටු කිරීමට සමත් වී තිබේ. ක්ෂේත්‍ර බළකා මූලස්ථානයේ ද අණ දෙන නිලධාරි වශයෙන් කටයුතු කර ඇති චන්ද්‍රකුමාර මහතා නියෝජ්‍ය පොලිස්පතිවරයකු වශයෙන් ගාල්ල හා තොරතුරු තාක්ෂණ දිසාව භාරව රාජකාරි කර ඇති අතර එතුමාගේ සේවා කාලය වසර 20කි.

කේ. ඩී. දේවප්‍රිය - කතරගම

## කතරගම පුදබිමට වැඩි සෙනඟක්



කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් බැතිමතුන්ගේ පැමිණීම අඩු වූ කතරගම පුදබිම වෙත මේ වන විට බැතිමතුන්ගේ පැමිණීම වැඩි වී ඇතැයි රුහුණු මහා දේවාලයේ බස්නායක නිලමේ ඩිෂාන් ගුණසේකර මහතා පැවසීය. ලෝකයේ ඇති එකම සර්වආගමික කේන්ද්‍රස්ථානය වන කතරගම පුදබිම වෙත හින්දු, බෞද්ධ, ඉස්ලාම් යන බැතිමතුන් පැමිණ දෙවියන්ගේ ආශිර්වාද ප්‍රාර්ථනා කරනු ලබයි. හින්දු බැතිමතුන් පිරිසක් පුදබිම තුළ බිම පෙරළී සිය බාරහාර ඔප්පු කළ අයුරුයි මේ.

සිසිර ජේ. පීරිස් - අම්පිටිය සමූහ

## කළගුණ සලකා කිරි ආහාර පූජාවක්



පේෂ කර්මාන්ත සේවක සේවිකාවන් 3300 දෙනෙක් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන්ට සෙත්පතා ඊයේ (21) හිම්දිරියේ දළදා සමිඳුන් උදෙසා කිරි ආහර සමඟ විශේෂ මුළුතැන්ගේ ආහාර පූජාවක් පවත්වන ලදි. පෙෂ් කර්මාන්තයේ නියැළුණු මේ සේවිකාවන් සමඟම එම රජයේ පේෂ කර්මාන්තශාලා හිටපු පෙෂ් කර්මාන්ත ඇමැති විජයපාල මැණ්ඩිස් මහතා එම කර්මාන්තශාල පුද්ගලික ව්‍යාපාරිකයන්, සේවිකාවන් හා යන්ත්‍රෝපකරණ සමඟ විකුණා දැමීමෙන් අනතුරුව අන්ත අසරණ තත්ත්වයට පත්ව තිබේ. දැනට 60 වැනි විය ද ඉක්මවා සිටිනා දිවයිනේ විවිධ පළාත්වල පේෂ කර්මාන්ත සේවිකාවන් වසර 40ක් පුරා තමන්ට විශ්‍රාම වැටුපක් ගැනීම පිණිස විවිධ අරගල කළත් පැවති සෑම රජයකම බලධාරීන්ගේ අවධානය යොමු නොවූ බව එම සංගමයේ සභාපති හෙරත් තිලකරත්න මහතා 'දිනමිණ'ට පවසා සිටියේය.

අවසානයේ වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන්ට සිය දුක්ගැනැවිල්ල ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මේ සේවිකාවන් 3300ට විශ්‍රාම වැටුප් දීමට පියවර ගත් බව පැවසූ එම පිරිස කළගුණ සැලකීම පිණිස ජනාධිපතිතුමන්ට හා රජයට සෙත්පතා මහනුවර දළදා සමිඳුන්ට උපහාර කිරි ආහාර පූජාවක් පවත්වන ලදි.

ඒ. ටී. කහඳුගොඩ - වීරකැටිය සමූහ

## බන්ධනාගාරයට ගෙනා දර අස්සේ සුරුට්ටු 570ක්

අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයට දර සපයනා ලොරියක් පසුගියදා (19) සවස පරීක්ෂා කළ බන්ධනාගාර ආරක්ෂක සේවයේ නියුතු පොලිස් නිලධාරීන්ට එම දර අස්සේ සඟවා තිබූ සුරුට්ටු 570ක්, ජංගම දුරකතන බැටරි 7ක්, චාජර් 3ක් සහ ඩේටා කේබල් 2ක් සොයා ගැනීමට හැකි වී තිබේ.

මේ සම්බන්ධයෙන් දර සපයන කොන්ත්‍රාත්කරු, ලොරියේ රියැදුරු සහ ලොරි සහායක සැකපිට අත්අඩංගුවට ගෙන තිබේ. මේ එක් සුරුට්ටුවක් රැදෙවියකුට අලෙවි කරනු ලබන්නේ රුපියල් 5000ක් වැනි ඉහළ මිලකට බවද හෙළි වී තිබේ. අත්අඩංගුවට පත් සැකකරුවන් වැඩිදුර පරීක්ෂණ සඳහා අඟුණකොළපැලැස්ස පොලිසිය වෙත භාර දී තිබූ අතර පොලිසිය මඟින් ඔවුන් පෙරේදා (20දා) පෙරවරුවේ අඟුණකොළපැලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

අමිල ප්‍රභාත් වනසිංහ - අනුරාධපුර අතිරේක

## භූතයා වෑන් රියේ හැප්පිලා 3ක් රෝහලේ



අනුරාධපුර - කුරුණෑගල ප්‍රධාන මාර්ගයේ නවතා තිබූ වෑන් රථයක ගොයම් කැපීමේ යන්ත්‍රයක් (භූතයා) රැගෙන යමින් තිබූ කැන්ටර් රථයක් ගැටීමෙන් තිදෙනකු තුවාල ලබා ප්‍රතිකාර සඳහා පෙරේදා (20) අනුරාධපුර ශික්ෂණ රෝහලට ඇතුළත් කර තිබේ. අනුරාධපුරයේ වන්දනාවේ පැමිණ ආපසු යමින් සිටි දංකොටුව ප්‍රදේශයේ පදිංචි පිරිසක් ශ්‍රාවස්තිපුර පහේ ඇළ ප්‍රදේශයේදී උදෑසන ආහාර ගැනීම සඳහා වෙළෙඳසැලක් අසල වෑන් රථය නවත්වා තිබේ. එම අවස්ථාවේදී පිටුපසින් අනුරාධපුර දෙස සිට තලාව දෙසට ගොයම් කැපීමේ යන්ත්‍රයක් රැගෙන යමින් තිබූ කැන්ටර් රථයක් වෑන් රථයේ ගැටී ඇතැයි පොලිසිය ප්‍රකාශ කළේය.

කැන්ටර් රථයේ රැගෙන යමින් තිබූ ගොයම් කැපීමේ යන්ත්‍රයේ කොටසක් කැන්ටර් රථයෙන් එළියට පැන තිබී ඇති අතර එම කොටසෙහි වෑන් රථය ගැටී මීටර පනහක් පමණ වෑන් රථය ඉදිරියට ඇදී ගොස් තිබේ. එම අවස්ථාවේ වෑන් රථයේ ගමන්ගත් පිරිසක් ආහාරය ගැනීම සඳහා බැස ගොස් තිබූ අතර අනතුර සිදුවන අවස්ථාවේ එහි සිටි තිදෙනකු බරපතළ තුවාල ලබා තිබේ. ඔවුන් ප්‍රතිකාර සඳහා අනුරාධපුර ශික්ෂණ රෝහලට ඇතුළත් කර තිබේ. අනතුරින් වෑන් රථයට ද දැඩි අලාභ හානි සිදුව තිබේ. අනතුරින් පසුව කැන්ටර් රථයේ රියැදුරු පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන තිබේ. සිද්ධිය සම්බන්ධ වැඩිදුර පරීක්ෂණ අනුරාධපුර මූලස්ථාන පොලිසිය මඟින් සිදු කරයි.

ජී. අයි. ආර්. ගරුසිංහ - වැල්ලවාය විශේෂ

## අලිකොටේ ජලාශය අවට ශ්‍රමදානයක්



බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බළකාය මඟින් වැල්ලවාය අලිකොටේ ජලාශය හා ඇල්ලේවල ආශ්‍රිත ප්‍රදේශයේ දැවැන්ත ශ්‍රමදාන වැඩසටහනක් පසුගියදා (19) ක්‍රියාත්මක කරන ලදි. මේ ශ්‍රමදාන වැඩසටහන සඳහා 50කට අධික පිරිසක් එක්ව සිටි අතර ජලාශය ආශ්‍රිත පරිසරය ඇල්ලෙවල දියඇල්ල දක්වා ඇති කිලෝමීටර දෙකකට ආසන්න මාර්ගයේ දෙපස හා ඇල්ලෙවල දියඇල්ල ආශ්‍රිතව ශුද්ධපවිත්‍ර කිරීම් සිදු කරන ලදි.

එම ස්ථාන නැරඹීමට, දිය නෑමට යන එන පිරිස් විසින් ඉවත දමනා කැළිකසළ හේතුවෙන් අවට පරිසරය දිනෙන් දින අපවිත්‍ර වෙමින් පවතිනා අතර මත්පැන් පානය සඳහා යොදාගත් බියර් ටින් බෝතල්, ප්ලාස්ටික් බඳුන්, පොලිතින්, ෂොපින් බෑග් ඇතුළු අපද්‍රව්‍ය රැසක් ශ්‍රමදානයට එක්වූ පිරිස විසින් ඉවත් කරන ලදි.

චන්දන ජයවීර - හැටන් සමූහ, මස්කෙළිය සමූහ සහ නුවරඑළිය සමූහ

## කසළ තේ කිලෝ 4195ක් අත්අඩංගුවට





පූඩළුඔය, කුඹල්ඔළුව ප්‍රදේශයේ රහසිගත ලෙස යන්ත්‍රසූත්‍ර භාවිත කරමින් ඉවතලන කසළ තේ පරිභෝජනයට ගත හැකි තේ කුඩු බවට සකසනා මහාපරිමාණ කසළ තේ සැකසුම් මධ්‍යස්ථානයක් පසුගියදා (19) රාත්‍රියේ සිදු කළ වැටලීමකදී සොයා ගත් බව තලවාකැලේ පොලිස් විශේෂ කාර්ය බළකාය ප්‍රකාශ කළේය. මේ තේ සැකසුම් මධ්‍යස්ථානයේ තේ කුඩු සැකසීම සඳහා ගබඩා කොට තිබූ කසළ තේ කුඩු කිලෝ 4195ක් සමඟ පුද්ගලයන් දෙදෙනකු සැකපිට අත්අඩංගුවට ගෙන තිබේ. බලපත්‍ර නැතිව ඉතාමත් රහසිගතව මේ ස්ථානයේදී කසළ තේ කුඩු යන්ත්‍ර සූත්‍ර භාවිත කරමින් පිරිසුදු තේ කුඩු ලෙස ව්‍යාජ අන්දමින් සකස් කිරීමෙන් අනතුරුව ඒවා අලෙවි කිරීම සඳහා වෙළෙඳපොළට නිකුත් කොට ඇතැයි පොලිස් විශේෂ කාර්ය බළකාය ප්‍රකාශ කළේය. අත්අඩංගුවට ගත් සැකකරුවන් සහ කසළ තේ කුඩු තොගය නීතිමය කටයුතු සිදු කිරීම සඳහා පූඩළුඔය පොලිසියට භාරදීමට පොලිස් විශේෂ කාර්ය බළකාය පියවර ගෙන තිබේ.

සීගිරිය විශේෂ

## පෙට්‍රල්වල සුවඳ බලන්න ගිය හත් හැවිරිදි දරුවා මිය යයි



යතුරුපැදියක ඉන්ධන ටැංකියේ මුහුඩිය ඉවත්කොට පෙට්‍රල් ගඳ සුවඳ බැලීමට ගිය වයස අවුරුදු 7ක දරුවකු මිය යෑමේ දුක්බර පුවතක් දඹුල්ල පොලිස් බල ප්‍රදේශයේ වැලම්ටියාව ප්‍රදේශයෙන් පෙරේදා (20) වාර්තා විය. මෙසේ අවාසනාවන්ත අන්දමට මියගොස් ඇත්තේ දඹුල්ල වැලම්ටියාව ප්‍රාථමික විදුහලේ දෙවැනි වසරේ ඉගෙනුම ලැබූ සජිත් කුමාර මුණසිංහ නමැති දරුවෙකි. මේ දරුවා පෙරේදා (20) පස්වරුවේ තම මිත්තනියගේ නිවෙසට පැමිණ නිවෙස ඉදිරිපිට නවතා තිබූ ඥාතියකුට අයත් යතුරුපැදියක් මතට නැඟ එහි පියන ඉවත් කොට පෙට්‍රල්වල ගඳ සුවඳ ආඝ්‍රාණය කිරීමට යද්දී මේ අනතුර සිදු වී ඇතැයි ඥාතීහු පවසති. මියගිය දරුවාගේ පියා වන අජිත් කුමාර මුණසිංහ මහතා කියා සිටියේ තමන් සහ බිරිඳ මෙන්ම තවත් කුඩා දරුවකු තම ඥාති නිවෙස ආසන්නයේ පදිංචිව සිටිනා බවය. තමන් කුලී වැඩ කරමින් ජීවත් වන බවත් පෙරේදා (20) පස්වරුවේ නිවෙසට පැමිණ සිටි අවස්ථාවේදී ඥාති අයකු මේ දරුවා යතුරුපැදිය මත සිහිසුන්ව සිටිනා බව ප්‍රකාශ කිරීමත් සමඟ එම ස්ථානයට දිව ආ බවය. එම අවස්ථාව වන විටත් තම දරුවා යතුරුපැදිය මතම වැටී සිටි බවද ගලේවෙල රෝහලට අසල්වාසීන්ගේ සහයෝගය ඇතිව රැගෙන යන විට මියගොස් තිබේ.

ටී. එල්. ජව්ෆර්කාන් - මඩකලපුව

## මඩකලපුවේ 157 වැනි පොලිස් රණවිරු දිනය





ශ්‍රී ලංකාවේ මියගිය පොලිස් විරුවන් ස්මරණය කිරීමේ රණවිරු දිනය ඊයේ (21) මඩකලපුව දිස්ත්‍රික්කයේදී පවත්වන ලදි. මඩකලපුව දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කාර්යාල පරිශ්‍රයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සුදත් මාසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති ස්මරණ උත්සවයට සර්වාගමික නායකයන්, ප්‍රභූවරුන්, පොලිස් අධිකාරිවරුන් හා ජීවිතක්ෂයට පත් පොලිස් නිලධාරීන්ගේ ඥාතීන් ඇතුළු පිරිසක් සෞඛ්‍ය නීති පිළිපදිමින් සහභාගි වී සිටියහ. එහිදී ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සුදත් මාසිංහ මහතා විශේෂ කතාවක් ද සිදු කරන ලදි.

2021 මාර්තු 22 සඳුදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

තිහගොඩ සමූහ - පී.පී.පී. සුගතදාස , ලුණම සමූහ - සනත් ගමගේ

# රන්මිහිතැන්න නවීකරණය කරයි

රන්මිහිතැන්න මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානයේ නවීකරණ කටයුතු ක්‍රියාත්මක කෙරේ.

යෝජිත ව්‍යාපෘති යටතේ උද්‍යාන නගර ප්‍රදේශය හා නේවාසිකාගාර නවීකරණ කටයුතු දැනටමත් අවසන්කර තිබේ. ඊට අමතරව චිත්‍රාගාරය සහ ජම්බුගස් වැව සංවර්ධනය දැනට ආරම්භකර තිබෙන බව මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනිමා උද්‍යානයේ වැඩබලන අධ්‍යක්ෂ සෝමසිරි ඒකනායක මහතා පවසයි.

ඒ අනුව දැනටමත් ටෙලි නාට්‍ය හා සිනමා රූගතකිරීම්, චිත්‍ර පට ගීත නිර්මාණය හා වීඩියෝ පට රූගතකිරීම් කටයුතු සහ අවශ්‍ය සියලුම පහසුකම් ප්‍රසම්පාදනය කරතිබේ. වැඩබලන අධ්‍යක්ෂ ජෙනරාල් සෝමසිරි ඒකනායක මහතා ප්‍රකාශකරන පරිදි මෙම උද්‍යානය පසුගිය මාස කිහිපයක කාලයතුළ කොරෝනා වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකා යුධ හමුදාවේ නිරෝධායන මධ්‍යස්ථානයක් වශයෙන් ද පවත්වාගෙන ගොස් තිබු අතර, පසුගිය පෙබරවාරි 23 දින සිට නැවතත් ටෙලි සිනමා උද්‍යානය දේශීය හා විදේශීය සංචාරකයන් සඳහා විවෘතකර තිබේ. තවද, ලබන අප්‍රේල් මාසයේ මුලදී මහාචාර්ය සුනිල් ආරියරත්න මහතාගේ නවතම චිත්‍රපටය රූගතකිරීම ද මෙහිදී සිදුකෙරේ.ඒ සඳහා අවශ්‍ය දර්ශන පහසුකම් ද දැනට සකස්වෙමින් පවතින බව හෙතෙම පවසයි.



ඉදිරි සංවර්ධන කටයුතු නිමවූ වහාම රූගතකිරීම් ඇතුළු අනෙකුත් පහසුකම් ප්‍රසම්පාදනය කිරීම ප්‍රධාන අපේක්ෂාව බව රන්මිහිතැන්න මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනිමා උද්‍යාන පාලක මණ්ඩලයේ සභාපති ප්‍රවීණ රංගන ශිල්පී රවීන්ද්‍ර රන්දෙනිය මහතා සඳහන් කරයි.

දේශීය හා විදේශීය චිත්‍රපට සහ දේශීය හා විදේශීය සංචාරකයන් ආකර්ෂණය කරගැනීම හරහා රජයට වැඩිපුර ආදායමක් උපයාදීම ටෙලි සිනමා උද්‍යානය නවීකරණ වැඩපිළිවෙළේ මූලික පරමාර්ථය වේ. මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානයේ වැඩබලන අධ්‍යක්ෂ ජෙනරාල් සෝමසිරි ඒකනායක මහතා පවසන පරිදි වසර 2010 සිට අද දක්වා දේශීය හා විදේශීය සංචාරකයන් ලක්ෂ 15කට වැඩි පිරිසක්



ටෙලි සිනමා උද්‍යානය නැරඹීම සඳහා පැමිණ ඇත.

මෙම වසරේ ජාතික ටෙලි සිනමා උද්‍යානය නවීකරණ ව්‍යාපෘති සඳහා වැයකෙරෙන මුදල රුපියල් දස ලක්ෂ 50 කි. මධ්‍යම රජයේ ප්‍රතිපාදන මේ සඳහා යොදා ගනු ඇත.

ජාතික උරුම, ප්‍රසාංගික කලා හා ග්‍රාමීය කලා ශිල්ප ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති විදුර වික්‍රමනායක මහතාගේ උපදෙස් පරිදි රන්මිහිතැන්න මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනිමා උද්‍යානයේ සියලුම සංවර්ධනය කටයුතු ක්‍රියාත්මක බව ටෙලි සිනමා උද්‍යානයේ වැඩබලන අධ්‍යක්ෂ සෝමසිරි ඒකනායක මහතා වැඩිදුරටත් පැවසීය.

කල්පිටිය සමූහ

## විහාරාධිපති හිමි හමුවේ අශෝභනව හැසිරුණැයි කතුන් 4ක් රිමාන්ඩ්



කල්පිටිය දලුව අන්තර් සමුද්‍ර පිරිවෙන් විහාරයේ විහාරාධිපති ස්වාමීන්වහන්සේ හමුවේ අශෝභන ලෙස හැසිරෙමින් අසභ්‍ය ඡායාරූප ගැනීමට උත්සාහ ගැනීමේ සිද්ධියක් සම්බන්ධයෙන් සැක පිට එක් පිරිමි පුද්ගලයකු සහ කාන්තාවන් සිව් දෙනෙකු නොරොච්චෝල පොලිසිය විසින් අත් අඩංගුවටගෙන 19 දින පුත්තලම මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව,කාන්තාවන් සිව් දෙනා 24 දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කළ බැව් නොරොච්චෝල පොලිසිය පවසයි.

කාන්තාවන් විහාරස්ථානයට පැමිණි ත්‍රී රෝද රථයේ රියැදුරු ශරීර ඇප දෙකක් මත මුදා හැර ඇත.

නොරොච්චෝල පොලිසියේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක නිලන්ත බණ්ඩාර මහතාගෙන් අප කළ විමසීමේ දී ඒ මහතා ප්‍රකාශ කළේ,18 දින සන්ධ්‍යාවේ කාන්තාවන් දෙදෙනෙකු මෙම විහාර්ස්ථානයට පැමිණ විහාරාධිපති හිමියන්ට අයුතු බලපෑම් සිදු කිරීමට උත්සාහ දරා ඇති අතර,ඒ අවස්ථාවේ විහාරස්ථ දායක සභාව මැදිහත්ව කාන්තාවන් දෙදෙනා විහාරස්ථානයේ රඳවා ගෙන,කල්පිටිය සහකාර පොලිස් අධිකාරී දුමාල් වීර සිංහ මහතාත්,නොරොච්චෝල පොලිසියත් විහාරස්ථානයට කැඳවා කාන්තාවන් පොලිසිය භාර දී ඇත. කාන්තාවන් රැගෙන ආ ත්‍රී රෝද රථ රියදුරු ද අත් අඩංගුවට ගෙන ඇත.

අනතුරුව මෙම කාන්තාවන් දෙදෙනාගෙන් ප්‍රශ්න කිරීමේ දී එම කාන්තාවන් ප්‍රකාශ කර ඇත්තේ,තමන් සාමාජිකත්වය දරණ පුත්තලම රාජ්‍ය නොවන සංවිධානයක සභාපතිවරියක වන කාන්තාවක ඔවුන්ට මෙම මෙහෙයුම භාර දුන් බව ය.විහාරාධිපති හිමියන් අපහසුතාවට හා නින්දාවට පත් කිරීමේ අරමුණින් තමන්ට මෙම වකීම භාර දී ඇතැ යි ඔවුන් එහිදී ප්‍රකාශ කොට ඇත.

රාජ්‍ය නොවන සංවිධානයේ කාන්තාව අත් අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමේ දී ඇය විහාරස්ථානය අසල පදිංචි එක්තරා ව්‍යාපාරික කාන්තාවක තමාට මෙම මෙහෙයුම භාර දුන් බැව් ප්‍රකාශ කර ඇත.

දිනමිණ දිසත දස අත ම එක තැන

අරණායක ප්‍රදීප්කුමාර



## රුක් රෝපණ වැඩසටහනක්

මාර්තු 21 වැනිදාට යෙදී තිබුණ ජාත්‍යන්තර වනාන්තර දිනය සමරමින් අරණායක පොලිස් ස්ථානයේදී රුක් රෝපණ වැඩසටහනක් 21 දා පෙරවරුවේ කෑගල්ල දිශාව භාර නියෝජ්‍ය පොලිස්පති ප්‍රියන්ත චන්ද්‍ර සිරි මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි.

157 වැනි පොලිස් විරු දිනය සමරමින් හා ජාත්‍යන්තර වනාන්තර දිනය සමරමින් නියෝජ්‍ය පොලිස්පතිවරයා අරණායක පොලිස්ථාන භූමියේ රුක් රෝපණ වැඩසටහනට සහභාගි වූ අයුරු.

අරණායක පොලීසියේ අපරාධ අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක සම්පත් කුමාර මහතා ඇතුළු නිලධාරීහු ද මේ අවස්ථාවට සහභාගි වූහ.

සූරියවැව විශේෂ - නුවන් ජයසේකර

## වලවේ ගඟ දෙපස පරිසර හානිය නවත්වන්න

### ජනතාව වගකිවයුත්තන්ගෙන් ඉල්ලති



සූරියවැව බැදිගන්තොට හා ඒ අවට ප්‍රදේශයේ පරිසරයට දැඩි හානි සිදුකරමින් සිදුකරගෙන යන වැලි ජාවාරම නවතා දෙන්නැයි ප්‍රදේශයේ ජනතාව හා ගොවි සංවිධාන නියෝජිතයෝ බලධාරීන්ගෙන් ඉල්ලති.

ගොවි සංවිධාන නියෝජිතයින් හා ප්‍රදේශයේ ජනතාව වැඩිදුරටත් පෙන්වා දෙන්නේ සූරියවැව,අම්බලන්තොට හා කුට්ටිගල පොලිස් වසම් යා කරමින් ගලා බසින වලව ගඟ දෙපස ජාවාරම් කරුවන් කලක් තිස්සේ මෙලෙස දැඩි පරිසර හානියක් සිදුකරමින් වැලි ගොඩ දැමීම හා තැන තැන වළවල් කපමින් ගොඩවැලි කැණීම් සිදුකරන බවයි. මෙම ජාවාරම් කරුවන් කලක් තිස්සේ මෙම ජාවාරම කිසියම් දේශපාලන හයියකින් යුතුව මෙය කිසිදු ගැටලුවකින් තොරව සිදුකරගෙන යන බවත්,ඒ හේතුව නිසා කිසිදු වගකිවයුතු පාර්ශ්වයන් මේ සම්බන්ධයෙන් කිසිදු සොයා බැලිමක් නොකරන බවටත් ප්‍රදේශවාසිහු චෝදනා කරති.

ජාවාරම් කරුවන් සූරියවැව බැදිගන්තොට හා කුට්ටිගල පොලිස් වසමට අයත් තෙරුන්නාන්සේගම,ගඟවැලැන මෙන්ම අම්බලන්තොට පොලිස් වසමට අයත් වලවෙවත්ත,ජන්සගම,මාමඩල ඇතුළු අවට ප්‍රදේශ රැසක නිරුපද්‍රිතව මෙම ජාවාරම කරගෙන යන අතර මේ හේතුව නිසා ජනජීවිත රැසක් දැඩි බලපෑමට ලක්ව තිබේ.මේ සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශව වෙත පැමිණිලි කිරීමටද ප්‍රදේශවාසීන් අකමැත්ත පළකරන්නේ ජාවාරම්කරුවන් වගකිවයුතු පාර්ශ්ව සමගද දැඩි සම්බන්ධකම් පැවැත්වීම බවයි ජනතාව පවසන්නේ.තැන තැන වළවල් හාරමින් සිදුකර ඇති වැලි කැණීම් හේතුවෙන් ප්‍රදේශයේ ළිංවල ජල මට්ටමද පහළ බැස ඇති අතර තැන තැන ගිලා බැසීම්ද සිදුව තිබේ.එමෙන්ම ප්‍රදේශයේ තැන තැන අනාරක්ෂිත ලෙස වළවල් හාරා තිබ්මෙන් සතා සිව්පාවුන් මෙන්ම මිනිසුන්ද වළවල්වලට වැටී අනතුරට ලක්වීම් සිදුව තිබේ.ඊට අමතරව ජාවාරම් කරුවන් වලව ගං ඉවුර තැනින් තැන කපා දමා ගං ඉවුරට දැඩි ලෙස හානි සිදුකර තිබේ.මේ හේතුව නිසා ජනතාව වගකිවයුතු පාර්ශ්ව වලින් ඉල්ලා සිටින්නේ වලව ගං ඉවුර දෙපස සිදුකරන මෙම ජාවාරම වහා නවත්වා එහි සිදුවන පරිසර හානිය නවතා දැමීමට කටයුතු කරන ලෙසයි.

අම්බලන්ගොඩ සමූහ ආර්.ඤාණදාස

## සුවරැස් සෑයට මුල්ගල්



කරන්දෙණිය, නාමිනිගොඩ "සදහම් සුව අරණ" ධර්මායතනයෙහි අභිනවයෙන් ඉදිකිරීමට නියමිත සුව රැස් සෑය චෛත්‍යයේ මංගල ශිලා ප්‍රතිෂ්ඨාපනය කිරීම සේනාසනාධිපති රතුපස්කැටියේ විමුක්ති ස්වාමීන්වහන්සේගේ ජන්ම දිනයට සමගාමීව පසුගියදා සිදු කරනු ලැබීය.

මෙම චෛත්‍යය උසින් දෙවැනි වන්නේ තිස්සමහරාම රජ මහා විහාරස්ථානයේ ඉදි කොට තිබෙන චෛත්‍යයට පමණි. මෙම දුර්ලභ වූ මහත්ඵල මහානිසංස වූ පුණ්‍ය කර්මයට සහභාගීවූ හා ඊට ආධාර අනුබල දුන් සෑම පිංවතෙකුට හා පිංවතියනට තෙරුවන් සරණින් යහපතක්ම වේවායි රතුපස්කැටියේ විමුක්තිරතන ස්වාමීන්වහන්සේ කෙටි අනුශාසනාවක් පවත්වමින් පැවසූහ.

සබරගමුව සමූහ

## රෙදිපිළි සොරාගත්තැයි මුරකරු රිමාන්ඩ්

කෑගල්ල නගරයේ ප්‍රසිද්ධ රෙදි පිළි වෙළෙඳසලකට අයත් නගරයට මඳක් දුරින් පිහිටි රෙදි පිළි ගබඩාවක ඉබි යතුරු කඩා රුපියල් ලක්ෂ දෙකකට නොඅඩු වටිනාකමක් ඇති දේපළ සොරාගන ගිය එම ගබඩාවේම මුරකරු ලබන 27 දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කෑගල්ල මහේස්ත්‍රාත් අධිකරණයෙන් නියෝග නිකුත් කර ඇත .

ජාතික පුවත්පතක පළකළ පුරප්පාඩු දැන්වීමකට අනුව තෝරා ගෙන තිබූ මෙම මුරකරු බඳවා ගෙන ඇත්තේ පසුගිය පෙබරවාරි මස 21 වෙනි දාය.

බඳවාගත් මුරකරු ට කෑම බීම සමග නවාතැන් පහසුකම් ද මසකට රුපියල් තිස්දහසක වැටුපක්ද ලබා දීමට ද එකඟ වී තිබූ බවද පැවසේ .මුරකරු ගබඩාව බලාගන සිටින අතර අයිතිකරුවන් දිනකීපයකට වරක් ස්ථානය විමර්ශනය කිරීමට ගොස් ඇති බවද පැවසේ.

මේ අතර පසුගිය මාර්තු 05 වෙනිදා දහවල් 12 ත් - 03 ත් අතර කාලයේදි මෙම මුරකරු ගබඩාවේ ඉබි යතුරු කඩා ඇතුළු වී එහි තිබූ රුපියල් ලක්ෂ දෙකකට නොඅඩු කාන්තා ,ළමා හා පිරිමි ඇදුම් තොගයක් සොරාගන ගිය බවට කෑගල්ල පොලීසියට ලැබුණු පැමිනිල්ලේ විස්තර කර තිබුණි .

ඒ අනුව කෑගල්ල කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක අතුල අබේරත්න මහතා ප්‍රධාන පොලිස් නිලධාරීන් කණ්ඩායමක් විසින් අදාළ සැකකරු හලාවත ප්‍රදේශයේ දී අත්අඩංගුවට ගෙන තිබුණි .

අත්අඩංගුවට ගත් සැකකරු කෑගල්ල පොලීසිය නඩු මෙහෙයුම් අංශයේ පොලිස් සැරයන් වරුන් වන පො.සැ 36859 වසන්ත , සහ පො.සැ .31185 රලපනාව යන නිලධාරීන් විසින් අධිකරණ යට ඉදිරිපත් කර තිබුණි .



එන්. විජේරත්න - නාගොඩ විශේෂ

**කළුතර නාගරික මන්ත්‍රී යොහාන් වඩුගේ මහතාගේ ඉල්ලීමකට අනුව "ඔබට ගෙයක් - රටට හෙටක්" ජාතික නිවාස වැඩසටහන යටතේ 725 කළුතර දකුණ ග්‍රාමනිලධාරී වසමේ පදිංචි අඩු ආදායම්ලාභීයකු වන සමන් පාලිත මහතා ඇතුළු දරු පවුල වෙනුවෙන් ඉදිවූ නව නිවස පරිත්‍යාග කිරීමට කටයුතු කෙරිණි.**

**ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ කළුතර දිස්ත්‍රික් කාර්යාලයේ මූලිකත්වයෙන් රුපියල් හය ලක්ෂයක ආධාර මුදලින් ඉදිවූ මෙම නව නිවස පරිත්‍යාග කිරීමේ අවස්ථාවට හිටපු බස්නාහිර පළාත් සභා මන්ත්‍රී රෝහණ අබේගුණවර්ධන මහතා ඇතුළු පිරිසක් සහභාගි වූහ.**

## ඔබට ගෙයක් රටට හෙටක් යටතේ කළුතර අඩු ආදායම්ලාභියකුට නව නිවෙසක්



දෙල්ගොඩ සමූහ - සුදත් පුබුදු කීර්ති, මල්වාන සමූහ - මහානාම විතානගේ

## හොර ගවඝාතකාගාරයේ සැකකරුට ඇප

මල්වානේ උලහිට්වල ප්‍රදේශයේ හොර ගව ඝාතකාගාරයක එළ හා මී ගවයන් දෙදෙනෙකු මරා මස් කරමින් සිටියදී අත් අඩංගුවට ගත් පුද්ගලයකු රුපියල් ලක්ෂ දෙක බැගින්වූ ශරීර ඇප හතරක් මත මුදා හැරීමට මහර ප්‍රධාන මහේස්ත්‍රාත් ජී.ඒ. ආර්. ආටිගල මහත්මිය නියම කළාය.

තවද මෙහිදී පොලිස් භාරයට ගත් ගවමස් තොගය දෙහිවල සත්තු වත්තට දීම සඳහා කටයුතු කරන ලෙසට ද මහේස්ත්‍රාත්වරිය පොලිසියට නියෝග කළාය.

වැඩිදුර විභාගය 23 වැනි දිනට කල් තැබිණි.

බියගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඒ. ජේ. එම්. ආර්. සමරසිංහ මහතාගේ උපදෙස් මත අධිකරණ කටයුතු භාර උප පොලිස් පරීක්ෂක ඒ.එම්. ඩී. තිලකනාත් හා සැරයන් චන්ද්‍රසිරි යන නිලධාරීහු මොහු අධිකරණයට ඉදිරිපත් කළහ.

දිනමිණ
2021 මාර්තු 22 සඳුදා

ක්‍රීඩා SPORTS
sports.dinamina@lakehouse.lk

# ශ්‍රී ලංකාවේ සිට ඉන්දියාවට පිහිනා වාර්තා පිහිටුවීමට දකුණේ කොල්ලෝ-කෙල්ලෝ සූදානම්




අභිමන්, ශෂාන් සහ දිල්මිණි

**ජයසිරි පේදුරුආරච්චි - ගන්දර සමූහ**

බ්‍රිතාන්‍ය රාජකීය ජීවිතාරක්ෂක සංගමය විසින් පිරිනමන මවුන්ට් බැටන් සම්මානයෙන් පිදුම් ලද පිහිනුම් උපදේශක ආචාර්ය කේ. ඩබ්ලිව් යසරත්න මහතා මෙරටට අත්කරදී ඇති කීර්තිය අති මහත්ය. ඒ අතරට තම ගොලයින් එක්කරගනිමින් නව වාර්තාවක් ඔස්සේ ශ්‍රී ලංකා පිහිනුම් වාර්තා පොත අලුත්කරන්නට යසරත්න සැලසුම් කර ඇත්තේ ඒ කෙරෙහි ලෝක අවධානය ද හිම්කර ගනිමිනි.

පිහිනුම් ක්‍රීඩාව හරහා මෙරට වැඩිම වාර්තා පිහිටුවා ඇත්තේ කෙටිදුර පිහිනුම් අංශ සඳහාය. එම තත්ත්වය වෙනස්කරමින් ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර කිලෝ මීටර් හැටක දුරක් දිවා රාත්‍රී පිහිනා වාර්තාවක් පිහිටුවන්නට යසරත්න මහතාගේ ගෝලයකු වන ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ රෝෂාන් අබේසුන්දර (32) සූදානමින් සිටින්නේ මෙරට පිහිණුම් ක්‍රීඩාව නව මාවතකට යොමුකරමිනි.

ඒ අතරට තවත් තවත් වාර්තාවක් එක්කරන්නට මාතර රාහුල විද්‍යාලයේ සිසුන් වන අභිමන් වෙල්ලප්පිලි (17) හා ශෂාන් අෂීම් (15) ද මාතර සුජාතා විද්‍යාලයේ කේ. ඩබ්ලිව් විහංගා දිල්මිණි (17) ශිෂ්‍යාව ද සූදානමින් සිටිති. ඒ මන්නාරමේ සිට ඉන්දියාවේ ධනුස්කොඩි වරායට කිලෝමීටර් තිහක දුරක් පිහිනා ගොස් නව ශ්‍රී ලංකා වාර්තාවක් පිහිටුවන්නටය.

මෙම නව ශ්‍රී ලංකා වාර්තා පිහිටුවීමේ සැලසුමට අදාලව පසුගිය සති කීපය පුරා පුහුණු තරග රැසක් දකුණු මුහුදු තීරයෙහි පැවති අතර එහිදී ද නව වාර්තා කීපයක් බිහිවිය. ඒ අතරට පළමුවෙන් එක්වූ වාර්තාව වූයේ මාතර සිට මිදිගමට කිලෝ මීටර් පහළොවක් පිහිනාගොස් තැබූ නව ශ්‍රී ලංකා වාර්තාවයි. එතෙක් පැවති වාර්තාව වූයේ කිලෝ මීටර් දහයක් පිහිනා තබූ තිබූ වාර්තාවයි. රෝෂාන් සමග එක්ව පාසල් දූ දරුවන් තිදෙනා එම වාර්තාව බිඳදමා නව වාර්තාවක් තබන්නට සමත්වූහ.

ඉකුත් ජනවාරි තුන්වැනිදා රොෂාන් මාතර සිට කොග්ගලට කිලෝ මීටර් විසි පහක් පිහිනා නව වාර්තාව තවත් අලුත් කළේය. එම අවස්ථාව සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා ජලක්‍රීඩා සංගමයේ නිලධාරීන් ද එක්ව සිටි අතර එය නව ශ්‍රී ලංකා වාර්තාවක් බවට ඔවුන් වාර්තා පොතට එක්කරන ලදි.

එතැනින් නොනැවතුණු රොෂාන් පෙබරවාරි මස 26 හා 27 දෙදින දිවා රාත්‍රියේ මාතර සිට ගාල්ල දඩල්ලටත් දඩල්ලේ සිට නැවත උණවටුනටත් කිලෝමීටර් හතළිස් අටක් පිහිනා නව ජාතික වාර්තාවක් තැබුවේය. මෙම හැම තරග අවස්ථාවකටම අභිමන්, ශෂාන් අෂීම් හා විහංගා දිල්මිණි ද සහාය පිහිනුම්කරුවන් ලෙස එක්වෙමින් අත්දැකීම් එක්කර ගත් අතර ඔවුන් මෙම නව ශ්‍රී ලංකා වාර්තාව පිහිටුවීම සඳහා ඉහළ පුහුණුවක් ද ලබුහ.

තම පුහුණුකාරීත්වය යටතේ නව වාර්තා තබන්නට ගෝලයින් සූදානම් කළ අයුරු පිහිණුම් උපදේශක ආචාර්ය කේ. ඩබ්ලිව් යසරත්න මහතා මෙලෙස විස්තර කළේය - මගේ වයස දැන් අවුරුදු පනස් නවයයි. පිහිනුම් උපදේශකයකු ලෙස සේවා කාලය වසර තිස් අටක්. මෙම කාලය තුළ මම පහළොත් දහසක් විතර පිහුණුම් ක්‍රීඩාව සඳහා පුහුණු කර තිබෙනවා. මම 2014 සුනාමි ව්‍යසනයේදි ජීවිත රැසක් බේරාගත්තා. ඒ සඳහා තමියි මට එංගලන්ත මහ රැජිනගේ විශේෂ සම්මානය හිමිවුණේ.


පිහිණුම් උපදේශක ආචාර්ය කේ. ඩබ්ලිව් යසරත්න

1985 පොල්හේන ජල ක්‍රීඩා සංගමය පිහිටුවා අද වෙනතෙක් එහි සාමාජිකයක් ලෙස කටයුතු කරමින් අනාගත පරපුරට අතහිත ලබාදෙනවා. රොෂාන් මගේ ලඟට ආවේ පිහිනුම් තාක්ෂණය පිළබඳ හදාරන්නට. එලෙස පැමිණි රෝෂාන්ගේ දක්ෂතා හඳුනාගෙන මම මෙම වාර්තාව සඳහා ඔහුව සූදානම් කළා එය දුටු රාහුලේ දරුවන් දෙදෙනාත් සුජාතා විද්‍යාලයේ ඉගෙනුම ලබන මගේ දියණියත් නව වාර්තාවක් සඳහා යන්නට සැලසුම් කළා.

අපේ සැලසුම අදියර කීපයකදි පරීක්ෂා කර බලා අපි එහි ප්‍රතිඵල අපේක්ෂාවෙන් මාර්තු මස විසිහයවැනි දින මන්නාරමේ සිට ඉන්දියාවේ ධනුස්කොඩි වරායට පිහිණා යන්න සැලසුම් කර තිබෙනවා. එහිදි රෝෂාන් මන්නාරමේ සිට ධනුෂ්කොඩි වරායට කිලෝ මීටර් තහක් හා එහි සිට නැවත මන්නාරමට කිලෝ මීටර් තිහක් පිහිනා යන්න තමයි සැලසුම. මෙය දිවා රාත්‍රියේ නොනවත්වාම සිදුකරන්නටයි බලාපොරොත්තුව.

රොෂාන් සමග විනෝදයට හා පුහුණුව වෙනුවෙන් පිහිණු සිසුන් හා සිසුවිය නව ශ්‍රී ලංකා වාර්තාවක් වෙනුවෙන් පිහිනන්නට ගත් ක්‍රියාමාර්ගය පිළිබඳ ඔවුන් මෙලෙස පැවසූහ.

අභිමන් වෙල්ලප්පිලි - මම මාතර රාහුල විද්‍යාලයේ දොළහ ශ්‍රේණියේ වානිජ අංශයෙන් ඉගෙණුම ලබනවා. අනාගතයේදී හමුදා නිලධාරියෙක් වන්නට තමයි මගේ බලාපොරොත්තුව. පිහිණුම් ක්‍රීඩාව වගේම මගේ ඉගෙනුම් කටයුතුත් බාධාවකින් තොරව කරගෙන යනවා. මම කලාප හා දිසත්‍රික් මට්ටමේ පිහිනමු තරග රැසක් ජයගෙන තිබෙනවා. යසරත්න සර් තමයි මෙම අවස්ථාව සඳහා අපි යොමු කළේ. ඒක බයානකයි කියා කෙනෙකුට හිතෙන්න පුළුවන් ඒත් ඒක අපිට හරිම විනෝද අවස්ථාවක්. මෙම උත්සාහය අනිවාර්යයෙන් ඉටුකරගෙන නව ශ්‍රී ලංකා වාර්තාවක් තියන්න උනන්දුවෙන් බලා ඉන්නවා. ජාලිය වෙල්ලප්පිලි මගේ තාත්තා තමයි මේ වැඩවලදි මගේ ලඟින්ම ඉඳන් උදව් කරන්නේ.

ශෂාන් අෂීම් - මම මාතර රාහුල විද්‍යාලයේ දහය ශ්‍රේණියේ ඉගෙනුම ලබනවා. කුඩා කාලයේ ඉඳන් පිහිනුම් කටයුතු සඳහා එක්වුනා. මට ලැබුණු හැම අවස්ථාවක්ම අරගෙන ඉන් මගේ හැකියාව පෙන්වන්න මම උත්සාහ ගත්තා ඉන් ජයග්‍රහණ රැසක් ද ලැබුණා. මෙයත් මගේ ජීවිතයේ තවත් එක් ඉලක්කයක්.

කේ. ඩබ්ලිව්. විහංගා දිල්මිණි. - මම මාතර සුජාතා විද්‍යාලයේ ජීවවිද්‍යා අංශයෙන් උසස්පෙළ හදාරනවා. අනගතයේදි වෛද්‍යවරියක් වෙන්න තමයි මගේ බලාපොරොත්තව. වයස අවුරුදු තුනේ සිට මම පිහිනුම් ක්‍රීඩාවට යොමුවුනා. දැන් අවුරුදු දාහතරක් පුරා මම පිහිනුම් තරග සඳහා එක්ව සිටිනවා. ඉන් කලාප, දිස්ත්‍රික් වගේම ජාතික මට්ටමේ තරග සඳහාත් ඉදිරිපත්ව ජයගෙන තිබෙනවා. ලබන විසිහයවැනිදා මම සූදානම් වෙන්නේ මගේ පිහිණමු ජීවිතයේ විශේෂිතම අවස්ථාවකට. ඒ සඳහා මම අරගෙන යන්නේ මගෙ දයාබර පියා. ඔහු මට වගේ දහස් ගණනකට පිහිනමු කියාදුන් දයාබර පියෙක්.

මාර්තු මස 26 හා 27 දෙදින පැවැත්වෙන තරගය සඳහා මෙන්ම පසුගිය සති කීපය පුරා පැවති සියලු තරග සඳහා යසරත්න මහතාට අමතරව සහාය පුහුණුකරුවන් වන පී. එච්. සුදත් මධුශංක හා එච්. ජී. අජන්ත මහත්වරුන්ගෙන් විශේෂ සහායක් ලැබී ඇති අතර පොල්හේන කිමිදුම් සමාජයේ චම්ලි ද සිල්වා මහතා, පොල්හේන ජල ක්‍රීඩා සමාජය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, නාවික හමුදාව, ගාල්ල සාගර විශ්වවිද්‍යාලයේ පිහිණමු උපදේශක සුදේශ විදානගම, සංචාරක මණ්ඩලයේ පිහිනුම් උපදේශක ජේ. එච් පතිරණ, ඊ. ඒ. නන්දන මහත්වරුන් සේම ෆර්ම් ජල බෝතල් නිෂ්පාදන ආයතනයේ හිමිකාර ජාලිය වෙල්ලප්පිලි මහතා ද අනුග්‍රාහකත්වය දක්වා ඇත.

## විවෘත මේස පන්දු අද කෑගල්ලේදී

**කෑගල්ල චමින්ද ජයලත්**

සමස්ත ලංකා විවෘත මේස පන්දු ශූරතාවලිය අද 22 දා කෑගල්ල මහජන ක්‍රීඩා සංකීර්ණයේ පිහිටි ගෘහස්ථ ක්‍රීඩාගාරයේදී පැවැත්වීමට නියමිතය.

වයස අවුරුදු 15 පහළ හා 18 පහළ කාන්තා පිරිමි කේවල තරග ලෙස පැවැවෙන තරගාවලිය සඳහා දිවයිනේ ප්‍රමුඛ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇතුළු 200ට ආසන්න පිරිසක් සහභාගිවීමට නියමිතය. පවතින කොරෝනා වසංගතය හේතුවෙන් යුගල තරග ඉසව් පවත් වන්නේ නැති අතර සියලු තරග කේවල තරග ලෙස පැවැත්වීමට නියමිතය.

මෙම ශූරතාවය සමස්ත ලංකා මේස පන්දු සංගමය හා සබරගමුව පළාත් මේස පන්දු සංගමය සංවිධානය කරනු ලබයි. තරගාවලිය අවසානයේ සමස්ථ ලංකා මේස පන්දු සංගමයේ සභාපති රාජ්‍ය අමාත්‍ය කනක හෙරත් මහතාගේ ප්‍රධානත්වයෙන් ත්‍යාග හා සහතික පත්‍ර පිරිනැමීමට නියමිතය.

## දේවානන්දයට ලකුණු 28ක ජයක්

**කරන්දෙණිය සමූහ - අනුරාධ ප්‍රියදර්ශන**

අන්තර් පාසල් වයස 19න් පහළ දෙවන කොටසේ එක්දින ක්‍රිකට් තරගාවලියේදී අම්බලන්ගොඩ ශ්‍රී දේවානන්ද විද්‍යාලය හා අනුරාධපුර මධ්‍ය විද්‍යාලය අතර පැවති තරගයෙන් ලකුණු 28න් ශ්‍රී දේවානන්ද විද්‍යාලය ජය ගත්තේය.

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංණයේ පැවති මේ තරගයේදී ශ්‍රී දේවානන්ද විද්‍යාලයේ කවීෂ කල්පන අර්ධ ශතකයක් (71) වාර්තා කළේය.

ඕවර 38කට සීමාවූ මේ තරගයේදී පළමුවෙන් පන්දුවට පහරදුන් ශ්‍රී දේවානන්ද විද්‍යාලයීය කණ්ඩායම ඕවර 37-5කදී සියලුදෙනාම දැවී 181(කවීෂ කල්පන 71,පසිදු ධනංජය43,සසිදු ද සිල්වා 15,දි මුතු ධනංජය3-3,සචින් සංදීප16-2,ලකේත් තිලකසිරි31/2)

අනුරාධපුර මධ්‍ය විද්‍යාලය ඕවර 33-5කදී සියලු දෙනාම දැවී 153. (ලහිරු ගීතාංජන 35, ලසන්ත රඹුක්වැල්ල 28, කවිදු නේරංජන 20, බුද්ධික ද සිල්වා 19-3, සිතුම් විහග 26-2, හසිදු ප්‍රබෝධ 37-2

## අම්පාර බැඩ්මින්ටන් පුහුණුකරුවන්ට වැඩමුළුවක්

**දමන සමූහ කේ.ඒ.මෛත්‍රීපාල**

අම්පාර මහජන ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රථම වතාවට ශ්‍රී ලංකා බැඩ්මින්ටන් ආයතනයේ පූර්ණ අනුග්‍රහයෙන් හා සහභාගිත්වයෙන් අම්පාර දිස්ත්‍රික්කය පුරා ක්‍රීඩා නිළධාරින් නව බැඩ්මින්ටන් පුහුණුකරුවන් පුහුණු කරවීමේ දෙදින වැඩමුලුවක් පසුගියදා දිගාමඩුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය තිලක් රාජපක්ෂ මහතාගේ මූලිකත්වයෙන් සංවිධානය කෙරිණි.

මේ සඳහා ජාතික මට්ටමේ පුහුණුකරුවන් වන චින්තක ප්‍රනාන්දු මහතා හා ශ්‍රී ලංකා



බැඩ්මින්ටන් ආයතනයේ උප සභාපතිතුමන් වන දීපාල් මදුරප්පෙරුම මහතා ඇතුළු නිලධාරිහු රැසක් සහභාගි වූහ. ඉදිරි වසර තුන ඇතුලතදී ජාතික මට්ටමට දිගාමඩුලු ක්‍රීඩකයින් රැගෙන යාම මෙහි මුලික අරමුණ වේ.

මෙහිදී දැනට කලාප ක්‍රීඩා සඳහා සහභාගිවූ පාසල් සඳහා අවශ්‍ය බැඩ්මින්ටන් රැකට් ඒ සඳහා භාවිතා කරන සියලු අංග සම්පූර්ණ උපකරණ කට්ටලයක් හා බැඩ්මින්ටන් ක්‍රීඩා පිටිය සඳහා අවශ්‍ය දැල් හා කණු ලබා දෙනු ලැබූහ. එසේම දැනට අම්පාර මහජන ගෘහස්ථ ක්‍රීඩාංගණයේ ක්‍රීඩා පිටි 4ක් බැඩ්මින්ටන් දක්වා පුළුල් කිරිමට අවශ්‍ය කණු හා දැල්ද ශ්‍රී ලංකා බැඩ්මින්ටන් ආයතනය මගින් අම්පාර නගර සභාව වෙත භාර දීමද මෙදින සිදු කෙරිණි.

## සුමංගල විදුහලට ලකුණු 69ක ජයක්

**කරන්දෙණිය සමූහ අනුරාධ ප්‍රියදර්ශන**

අන්තර් පාසල් වයස 19න් පහල සිංගර් කුසලාන ක්‍රිකට් තරගාවලියේ හික්කඩුව ශ්‍රී සුමංගල විද්‍යාලය සහ නාගොඩ රාජකීය විද්‍යාලය අතර සුමංගල විදුහල් ක්‍රීඩාංගනයේ පැවති 3වැනි කාණ්ඩයේ තරගයෙන් ලකුණු 69ක ජයක් හිමි කර ගැනීමට සුමංගල විද්‍යාලය සමත්විය.

එහිදී තුන් ඉරියව් දක්ෂතා දැක්වූ සුමංගල විද්‍යාලයේ හිමාල් හංසක දක්ෂ ලෙස පන්දුවට පහරදෙමින් අර්ධ ශතකයක්ද (87) දක්ෂ ලෙස පන්දු යවමින් ලකුණු 15කට කඩුලු 3ක් ලබා ගත් අතර දක්ෂ පන්දු යැවීමක නිරතවූ රාජකීය විද්‍යාලයේ සී,හසරංග ලකුණු 37කට කඩලු 6ක් බිඳ හෙළීය.

සුමංගල විද්‍යාලය - ඕවර28-3දී සියලුදෙනා දැවී 153

හිමාල් හංසක 87 (සී.හසරංග37-6,යූ.කුමාර39-2,)

රාජකීය විද්‍යාලය-ඕවර 26-3කදී සියලුදෙනා දැවී84

වි.හසරංග 36 (ඉදුවර හරිත් 22-3,හිමාල් හංසක 15-3,රන්සර දේශාන්1-2)

## බස්නාහිර කාන්තා පාපන්දු ශූරතාව ගම්පහට


ශූරතාව දිනා ගත් ගම්පහ කාන්තා පාපන්දු කණ්ඩායම

**කළුතර මධ්‍යම විශේෂ**

46 වෙනි ජාතික මහා ක්‍රීඩා උලෙළේ බස්නාහිර පළාත් කාන්තා පාපන්දු ශූරතා තරගාවලිය පෙරේදා (20 ) කළුතර වර්නන් යූ පුනාන්දු ක්‍රීඩා පිටියේදී පැවැති අතර එහිදී අවසන් වටයට තරග කළ ගම්පහ සහ කළුතර කණ්ඩායම් දෙක ඉතා තියුණු තරගයකින් පසුව ගෝල් 5-0 වශයෙන් ගම්පහ කණ්ඩායම සමස්ත ශූරතාව හිමි කර ගත් අතර කළුතර කණ්ඩායමට හිමි වූයේ අනුශූරතාව යයි.

ඡායාරූපය:
කළුතර මධ්‍යම විශේෂ.

# දිනමිණ The Dinamina ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

කදාන, රාගම පාර, අංක 73 හි පදිංචි **පිච්චපිල්ලෙයි නඩරාජා ශිවාජිනි දේවි හෙවත් ශිවාජිනි දේවි කෝසරි ඩොනල්ඩ් චන්දන** වන මම අංක 107/233 පත් ඉරුවේ දිනපොත් 7564 යටතේ 2018 මැයි 03 වන දින ලියාපදිංචි කරන ලද නොතාරිස් S.D.P.G.R. ජයවර්ධන මහතා විසින් ලියා සහතික කළ අංක 11869 සහ 2018-05-02 දිනැති ඇටෝර්නි බලපත්‍රය මගින් මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් ජාඇල, කන්දෙවත්ත පාර, මා එළිය අංක 1/41 හි පදිංචි **මැනුවෙන් සෙබස්තියන් ප්‍රසන්න පිලිප්ස්** යන අය පත්කළ අතර අද පටන් එය අවලංගු කර ඇති බව ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනයාටත් මෙයින් දැනුම් දෙමි.

**පිච්චපිල්ලෙයි නඩරාජා ශිවාජිනි දේවි හෙවත් ශිවාජිනි දේවි කෝසරි ඩොනල්ඩ් චන්දන.**

කොළඹ පිටකොටුව බෞද්ධ මන්දිරයේ 203 1/4, ස්ථානයේ පැවති ආයුර්වේද බෙහෙත් ශාලාව නැවත විවෘතව පවතී.
**0718239973**

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, කඳාන, මීගමුව පාර, පියෝ මාවත, අංක 121/68 දරන ස්ථානයේ පදිංචිව සිටි දැනට රද්දෙළුගම, කුස්වල, ලංකා ලෑන්ඩ් අංක 64/A/47 දරන ස්ථානයේ පදිංචි නව ජාතික හැඳුනුම්පත් අංක 194209803204 හිමි / පැරණි ජාතික හැඳුනුම්පත් අංක 420983204V හිමි තුවාන් තාජුදීන් සාවල් වන මම වර්ෂ 2016 ක් වූ නොවැම්බර් මස 01 වන දින මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් රත්න බී. චන්ද්‍රසිරි විසින් ලියා සහතික කරන ලද අංක 6620 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් කඳාන, මීගමුව පාර, පියෝ මාවත, අංක 121/68 දරන ස්ථානයේ පදිංචිව සිටි, දැනට රද්දෙළුගම, කුස්වල, ගල්හේනවත්ත, අංක 66B දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 860861208V හිමි තුවාන් ඉම්රාන් සාවල් හට දෙන ලද ඇටෝර්නි බලය වර්ෂ 2021 ක් වූ මාර්තු මස 18 වන දින සිට අවලංගු කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

**ටී. ටී. සාවල්**

SriLankan Catering

## ලංසු ඉදිරිපත් කිරීමේ ආරාධනය

### ශ්‍රී ලංකන් කේටරින් සමාගමේ වෛද්‍ය මධ්‍යස්ථානයට බාහිරින් වෛද්‍ය කාර්ය මණ්ඩලය සැපයීම

SLC/PRO/SER/2021/006

2021/2023 වසර සඳහා ශ්‍රී ලංකන් කේටරින් සමාගමේ වෛද්‍ය මධ්‍යස්ථානයට බාහිරින් වෛද්‍ය කාර්ය මණ්ඩලය සැපයීම සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් ශ්‍රී ලංකන් කේටරින් සමාගම මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ලංසු ලියවිලි සහ වැඩිදුර විස්තර 2021 මාර්තු 22 දින සිට http://www.srilankancatering.com/procurement-notices යන වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

මුද්‍රා තබන ලද ලංසු ලියවිලි 2021 අප්‍රේල් 20 දින පෙරවරු 11.00 හෝ ට පෙර ශ්‍රී ලංකන් කේටරින් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී වෙත භාර දිය යුතුය.

උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ලංසු ලියවිලි සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් ලබාගත හැකිය.
රොශෙල් - rochelle.senanayake@srilankancatering.com හෝ + (94)19 733 4144
රොහාන්- rohan.silva@srilankancatering.com හෝ: +94) 19 733 4140.

ප්‍රධාන විධායක නිලධාරී,
**ශ්‍රීලංකන් කේටරින් සමාගම,**
ගුවන්සේවා මධ්‍යස්ථානය,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ,
කටුනායක, ශ්‍රී ලංකාව.

# ලංසු සඳහා ආරාධනයයි (2021/5)

## පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## උතුරු පළාත

01. උතුරු පළාතේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත වගුවේ විස්තර කොට ඇති ඉදිකිරීම් කර්මාන්ත සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. ජාතික තරඟකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.

03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, පහත වගුවේ සඳහන් ශ්‍රේණි සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය යටතේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

04. සුදුසුකම් අවශ්‍යතා ලංසු ලිපි ලේඛනයේ 4 වන කොටසේ සඳහන් කොට ඇත. අතිරේක විස්තර ලංසු දත්ත සහ කොන්ත්‍රාත් දත්තවල (5 වන කොටසේ) ලබා දී ඇත.

05. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු පහත 6 සඳහන් ලිපිනය වෙතින් ලබා ගත හැකි අතර, එම ස්ථානයේදී ඕනෑම රාජකාරී දිනක **පෙ.ව. 9.00 සහ ප.ව. 3.00 අතර** ලංසු ලිපි ලේඛන පරීක්ෂා කර බැලිය හැක.

06. පහත වගුවේ සඳහන් ආපසු ගෙවනු නොලබන ගාස්තුව මුදලින් පහත වගුවේ සඳහන් කාලසීමාව තුළ පෙ.ව. 9.00 සහ ප.ව. 3.00 අතර නල්ලූර්, වෙම්මඩි පාරේ, උතුරු පළාතේ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු (**දු.ක. 021-2242806/ 021-222-2219 ෆැක්ස් : 021-2241383/ 021-222-2219**) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැක.

07. ලංසු **(මුල් පිටපත හා අනුපිටපත)**, පහත වගුවේ සඳහන් දිනයේ **පෙ.ව. 10.30** ට හෝ ඊට පෙර ලැබෙන පරිදි **"සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, උතුරු පළාත, වෙම්මඩි පාර, නල්ලූර්"** යන ලිපිනය වෙත ගෙනැවිත් භාර දීමට හෝ ලියාපදිංචි තැපැල් මගින් එවීමට හැකිය. ලංසු අංකය කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

08. පූර්ව ලංසු රැස්වීමක් පහත වගුවේ සඳහන් දිනයේ **පෙ.ව. 10.30** ට නල්ලූර්, වෙම්මඩි පාරේ, උතුරු පළාතේ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ කාර්යාලයේදී පැවැත්වේ.

09. ලංසු සමග පහත වගුවේ ලබාදී ඇති තොරතුරු ප්‍රකාර වූ ලංසු ඇපකරයක් අමුණා එවිය යුතුය.

| කාණ්ඩය | | |
|---|---|---|
| | ලංසු ලිපිලේඛන නිකුත් කරන / මිලදීගත හැකි කාලසීමාව | 2021.03.22 වෙනි දින සිට 2021.04.11 වෙනි දින දක්වා |
| | පූර්ව ලංසු රැස්වීම | 2021.03.31 වෙනි දින පෙ.ව. 10.30 ට |
| | ලංසු භාරගැනීමේ අවසානය / විවෘත කිරීම | 2021.04.12 වෙනි දින පෙ.ව. 10.30 ට |

| ලංසු අංකය | වැඩ විස්තරය | ඇස්තමේන්තු ගත පිරිවැය රු. මිලියන | කොන්ත්‍රාත් කාලය | අවශ්‍ය ශ්‍රේණිය | ආපසු ගෙවනු නොලබන ගාස්තුව | අවශ්‍ය ලංසු ඇපකරය: ඇපකරයේ වටිනාකම | අවශ්‍ය ලංසු ඇපකරය: වලංගු කාලය |
|---|---|---|---|---|---|---|---|
| TEDP/NP/ MCC/2020 | මුල / මල්ලවී මධ්‍ය මහා විදුහලේ තෙමහල් තාක්ෂණ පීඨය ඉදිකිරීම | 40.71 | දින 270 යි | සී 5 හෝ සී 4 (ගොඩනැගිලි) | 12,500.00 | 407,000.00 | 2021.08.08 වෙනි දින දක්වා |
| TEDP/NP/ MMV/2020 | කිළි/ මුලංකාවිල් මහා විද්‍යාලයේ තෙමහල් තාක්ෂණ පීඨය ඉදිකිරීම | 40.71 | දින 270 යි | සී 5 හෝ සී 4 (ගොඩනැගිලි) | 12,500.00 | 407,000.00 | 2021.08.08 වෙනි දින දක්වා |
| TEDP/NP/ AMMV/2020 | මන්/ අඩම්පන් මධ්‍ය මහා විදුහලේ තෙමහල් තාක්ෂණ පීඨය ඉදිකිරීම | 40.71 | දින 270 යි | සී 5 හෝ සී 4 (ගොඩනැගිලි) | 12,500.00 | 407,000.00 | 2021.08.08 වෙනි දින දක්වා |

"ජාතික තරඟකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ. මෙම ප්‍රසම්පාදනය යටතේ ඉටුකරනු ලබන කර්මාන්තයේ ඇස්තමේන්තුගත වටිනාකම (වැට් හා අනෙකුත් බදු හැර) රු. මිලියන 50 ට අඩු බැවින් අංක 04/2016(iii) දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය සහ පිළිවෙලින් **2020.10.09 සහ 2021.01.11 දතම** අංක 03/2020 සහ අංක 03/2020(i) දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රාදේශී ප්‍රමුඛතාවය සහ CIDA ශ්‍රේණි ප්‍රමුඛතාවය අදාළ වනු ඇත.

**සභාපති**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,**
**උතුරු පළාත.**

# ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි.

## මොරටුව දිසා අධිකරණයේදීය.

1994 අංක 09 දරන සංශෝධිත 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4(1) වගන්තිය යටතේ පවරන ලද නඩුකරය.

අංක 155/ඒ, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08 යන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි

(කලින් මොරටුව, රාවතාවත්ත පාර, අංක 45 "අර්ථධර්ම කේන්ද්‍රය")

සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ්

මොරටුව දිසා අධිකරණයේ නඩු අංකය : 149/DR2019

(කලින් "දේශෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්" යනුවෙන් නම් කර හඳුන්වනු ලැබූ)

(සමාගමේ අංකය : පී.බී.3795)

**(පැමිණිලිකරු)**

**මොරටුව දිසා අධිකරණයේ නඩු අංකය :** 149/DR/2019

**කඩුවෙල දිසා අධිකරණයේ ඇස්කීසි අංකය :** 43/20

**-එදිරිව-**

සුරේන් කුමාර ලියනගේ

අංක 38/2, එස්. ද එස්. ජයසිංහ මාවත, නුගේගොඩ.

හා/හෝ

අංක 61/36, දම්බුගහවත්ත පාර, කලල්ගොඩ, තලවතුගොඩ.

**(විත්තිකරු)**

**සහ දැන්**

1994 අංක 09 දරන පනතින් සංශෝධිත 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 6(අ)(1) වන වගන්තියෙහි ප්‍රතිපාදන සමග කියවිය යුතු සිවිල් නඩු විධාන සංග්‍රහය පනතේ 839 වගන්තින් ප්‍රකාරව කරනු ලබන ඉල්ලීමයි.

සුරේන් කුමාර ලියනගේ

අංක 38/2, එස්. ද එස්. ජයසිංහ මාවත, නුගේගොඩ, හා/හෝ අංක 61/36, දම්බුගහවත්ත පාර, කලල්ගොඩ, තලවතුගොඩ.

**විත්තිකාර පෙත්සම්කරු**

**-එදිරිව-**

අංක 155/ඒ, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08 යන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි

(කලින් මොරටුව, රාවතාවත්ත පාර, අංක 45 "අර්ථධර්ම කේන්ද්‍රය")

සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ්

(කලින් "දේශෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්" යනුවෙන් නම් කර හඳුන්වනු ලැබූ)

(සමාගමේ අංකය : පී.බී.3795)

**පැමිණිලිකාර- වගඋත්තරකරු**

ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2020.09.03 වන දින පැමිණිලිකාර වගඋත්තරකරු සහ විත්තිකාර පෙත්සම්කරු අතර රු.14,400,000/- ක මුදලක් සඳහා ඇති වූ සමථය ප්‍රකාරව විත්තිකාර පෙත්සම්කරු විසින් පැමිණිලිකාර වගඋත්තරකරු වෙත එකඟ වූ කිසිදු මුදලක් නොගෙවීම මත 2020.12.10 වන දින නියම කරන ලද නෛසයි තීන්දු ප්‍රකාශය ප්‍රකාරව 2019.03.03 දිනට ශ්‍රී ලංකාවේ මුදලින් රු.13,504,004/- ක් හා එකී මුදල මත අන්තර්ගත ප්‍රාග්ධන මුදල වන රු.10, 144,480/- ක මුදල මත 2019.03.04 දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා 19% ක වාර්ෂික පොළී ප්‍රතිශතයක් මත ගණනය කරන ලද පොලියද තීන්දු ප්‍රකාශයේ දින සිට තීන්දු ප්‍රකාශිත සම්පූර්ණ මුදල මත අදාළ නෛතික පොලියද නඩු ගාස්තුද පැමිණිලිකාර සමාගමට ගෙවිය යුතු යැයි නියෝග කොට ඇති නමුදු විත්තිකරු එකී ගෙවීම් පැහැර හැර ඇති හෙයින් එකී අධිකරණයෙන් පැමිණිලිකාර සමාගමට පවරන ලද ඇස්කිසි බලපත්‍රයේ බලය මත පැමිණිලිකාර සමාගමෙන් මා වෙත ලබාදුන් බලය මත 2021.02.23 දින තහනමට ගත් ඉහත නම් සඳහන් විත්තිකරුගේ නිශ්චල දේපළ 2021.03.29 දින පෙරවරු 11.30 පැයට ප්‍රසිද්ධ වෙන්දේසියේ එකී විකිණීම කරනු ලැබේ.

### ඉහත කී උපලේඛනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලයේ, පල්ලේ පත්තුවේ මහරගම මහනගර සභා සීමාව තුළ මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක 493-කලල්ගොඩ ග්‍රාම නිලධාරී වසම තුළ කලල්ගොඩ යන ගමේ පිහිටි ඇගවලන්ද සහ කහටගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්.ඩබ්. තෙපුලගොඩ විසින් මැන සාදන ලද අංක 938 සහ 2000.12.07 දරන සැලැස්මේ කැබලි අංක 8 බී (බලයලත් මිනින්දෝරු ඩී.එස්.එස්. කුරුප්පු විසින් මැන සාදන ලද අංක 3175 සහ 1995.05.20 දරන සැලැස්මේ කැබලි අංක 08 නැවත මැන අනුබෙදා සාදා ඇත.) දරන කොටසට මායිම්, **උතුරට :** අගල ද, **නැගෙනහිරට :** බලයලත් මිනින්දෝරු ආර්. දන්තනාරායන මහතාගේ අංක 151 සහ 2000.05.07 සැලැස්මේ කැබලි අංක 08 ඒ සහ අංක 3175 සැලැස්මේ කැබලි අංක 04 (අඩි 15 ක් පළල පාර) ද, **දකුණට :** අංක 3175 දරණ සැලැස්මේ කැබලි අංක 06 ද, **බස්නාහිරට :** අංක 3175 දරණ සැලැස්මේ කැබලි අංක 07 ද මායිම් වූ පර්චස් දහය (අ:0-රූ:0-පර්:10) ක් හෙවත් හෙක්ටයාර් 0.0253 ක් විශාල බිම් ප්‍රමාණය සහ ඊට අයත් අංගසම්පූර්ණ නිවස සහ ගහ කොළ පලතුරු ආදී සියලු දේද වේ. (හෝමාගම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ පත්ඉරු අංක C 90/102 හි ලියාපදිංචි කර ඇත.)

පහත සඳහන් මාර්ගවලින් ගැණුම්කරු සහ ඔහුගේ පෙර සඳහන් කළ උරුමක්කාරාදීන් සහ ඔහුගේ කුලී නිවැසියන්ට, සේවකයන්ට, කම්කරුවන්ට, අමුත්තන්ට සහ එවැනි අයිතිවාසිකම් ඇති අනෙකුත් සියලු දෙනාට සහ ගැණුම්කරුගේ බලයලත් ඕනෑම අයෙකුට පයින් ගමන් කිරීම, වාහනවලින් ගමන් කිරීම, විදුලි කණු සිටුවීම, විදුලි රැහැන් ඇදීම, දුරකථන රැහැන් ඇදීම, ජලනල එලීම, ජලප්‍රවාහන නළ එළීම ආදී සියලු කටයුතු සඳහා යොදා ගැනීමේ පරවශ්‍යතා අයිතීන්ද සමගය. එසේ වුවද ඉහත සඳහන් අයිතීන් භාවිතා කිරීමේදී එකී අයිතිවාසිකම් හිමිකම් ඇති අනෙකුත් අයගේ අයිතිවාසිකම් සමග ගැටුමක් නොවිය යුතුය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලයේ, පලේ පත්තුවේ මහරගම මහනගර සභා සීමාව තුළ මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක 493- කලල්ගොඩ ග්‍රාම නිලධාරී වසම තුළ කලල්ගොඩ යන ගමේ පිහිටි ඇගවලන්ද සහ කහටගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී.එස්.එස්. කුරුප්පු විසින් මැන සාදන ලද අංක 3175 සහ 1995.05.20 දරණ සැලැස්මේ කැබලි අංක 04 දරණ කොටසට මායිම්, උතුරට : කැබලි අංක 8, 1 සහ 3 ද, නැගෙනහිරට : 9369 සැලැස්මේ කැබලි අංක 2, 3 සහ සී ද, දකුණට අඩි 10 ක් පළල පාරක් සඳහා වෙන් කළ කොටස ද, බස්නාහිරට : කැබලි අංක 10, 06 සහ 08 ද මායිම් වූ පර්චස් දෙළහයි දශම එක (අ:0-රූ:0-පර්:12.1) ක් හෙවත් හෙක්ටයාර් 0.0306 ක් විශාල බිම් ප්‍රමාණය වේ. (හෝමාගම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ පත්ඉරු අංක C 57/79 හි ලියාපදිංචි කර ඇත.)

### දේපළට පිවිසීම

බොරැල්ලේ සිට රාජගිරිය හරහා පාර්ලිමේන්තු පාරෙන් පැලවත්තට ගොස් එහි කොට්ටාව පාරේ ගිය විට කලල්ගොඩ හන්දිය හමුවේ. එහි වමට ඇති කලල්ගොඩ පාරේ වම් පසට වන්නට ඇති දම්බුගහවත්ත පාරේ වම් පසට වන්නට මෙම දේපල පිහිටා ඇත.

### ගෙවීමේ ක්‍රමය

වෙන්දේසිය අවසන් වූ විගස ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25%ක් ගෙවිය යුතුය.
2. නොතාරිස් ගාස්තුව සහ ගමන් ගාස්තුව
3. විකුණුම් කොන්දේසි සකස් කිරීම
4. වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු සහ ගමන් ගාස්තු
5. ලිපිකරු, සීනුව නාද කරන්නා සහ ඝෝෂක ගාස්තු
6. ඉතිරි 75% ක මුදල දින 30 ක් ඇතුළතදී මොරටුව දිසා අධිකරණයේ තැන්පත් කළ යුතුය.
7. වෙන්දේසිය අවසන් වූ විගස වෙන්දේසිකරුගේ 2.5% ක මුදල ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය.
8. සියළුම වියදම් ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ විගසම ගෙවිය යුතුය.

**ඉන්ද්‍රා හේවාවිතාරණ**
**බස්නාහිර පළාත්බද වාණිජ මහාධිකරණයේ සහ දිසා අධිකරණයේ උසාවි කොමසාරිස්, වෙන්දේසිකරු, තක්සේරුකරු සහ සාම විනිසුරු**
**කාර්යාලය/ නිවස**
**අංක: එච් 1/16, සාංචිආරච්චිවත්ත, මහල් නිවාස, කොළඹ 12.**
**දුරකථනය: 076-3034024/ 0724459575**

# සොයා දෙන්න



**මාර්ක් ජේම්ස් ෆර්ඩිනන්**

නැමැති අවු. 65 ක් පමණ වයසැති මානසික ආබාධයකින් පෙලෙන පිරිමි පුද්ගලයෙකු අතුරුදන් වී ඇත. සොයා දෙන්නෙකුට මුදල් පරිත්‍යාගයක් කරනු ලැබේ.

**0769705898**
**0112971588**

---

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වන පරිච්ඡේදය)**

## 7 වන වගන්තිය යටතේ දැන්වීමයි

**යොමු අංකය :** MLB/LND/LNDAQ/L1/44-2-1

**ඉඩම් අමාත්‍යාංශයේ අංකය :** 4-3/12/2018/WS/284

මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ලද ඉඩම රජයට අත්පත් කරගෙන ඇත. වැඩි විස්තර සඳහා අංක 2213/33 හා 2021.02.03 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය බලන්න.

**උපලේඛනය**

| | |
|---|---|
| දිස්ත්‍රික්කය | : මාතර |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : මාලිම්බඩ |
| ග්‍රාම නිලධාරී කොට්ඨාසය | : 351, මාලිම්බඩ බටහිර |
| ගමේ නම | : මාලිම්බඩ |
| ඉඩමේ නම | : නාකන්දගොඩ හේනකැලේ |
| කැඩැස්තර සිතියම් අංකය | : මූ.පී. මාර 2854 |
| කැබලි අංකය | : කැබලි අංක 01 සිට 04 දක්වා |

**කේ.ජී.ආර්. ජයනාත්**
**ප්‍රාදේශීය ලේකම්,**
**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාලිම්බඩ.**
**2021.03.08**

---

## නම වෙනස් කිරීම

ගම්පහ දිස්ත්‍රික්කයේ කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නො.33/3D, සඟබෝ මාවත, වත්තල, හුණුපිටිය ලිපිනයේ පදිංචි හෙට්ටි ආරච්චිගේ රේණුකා වන මා විසින් මාගේ ළමයින් දෙදෙනා වන රාජ පාන්ඩියන් තඩාර් විලෝච සඳරුවන් සහ රාජ පාන්ඩියන් තාඩාර් දුල්මි තරුෂා මෙතැන් පටන් රාජපක්ෂ වික්‍රමසිංහ ආරච්චිලාගේ විලෝච සඳරුවන් සහ රාජපක්ෂ වික්‍රමසිංහ ආරච්චිලාගේ දුල්මි තරුෂා යනුවෙන් භාවිත කරන බව ශ්‍රී ලංකා රජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

**මෙයට මව වන හෙට්ටි ආරච්චිලාගේ රේණුකා.**

---


**තරුණියන්ගේ කාන්තාවන්ගේ මවුවරුන්ගේ**

හද බැඳි කාන්තා පත්තරය

**සෑම බදාදාවකම**

**තරුණී**


---

# ප්‍රසම්පාදන දැන්වීමයි

අලුතින් ඉදිකරන කුරුණෑගල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා පහත උප ලේඛනයේ සඳහන් කර්මාන්ත කටයුතු සහ සැපයීම් කටයුතු සඳහා ඉදිකිරීම් සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් සහ සුදුසුකම්ලත් සැපයුම්කරුවන්ගෙන් සීල් තබන ලද ප්‍රසම්පාදන අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | කර්මාන්තය/ සැපයීම හෝ සේවාව | ඇස්තමේන්තු මුදල | ආරක්ෂිත ලංසු ඇපය | ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් පෝරම ගාස්තුව |
|---|---|---|---|---|
| 01 | ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ පිටත වැඩ (CIDA) C5 හෝ ඉහළ | මිලි. 20 | 200,000.00 | 10,000.00 |
| 02 | වායුසමීකරණ යන්ත්‍ර සපයා සවි කිරීම | | 100,000.00 | 3,000.00 |
| 03 | ගිනි නිවන උපකරණ පද්ධතිය සපයා සවි කිරීම | | 10,000.00 | 2,500.00 |

- ප්‍රසම්පාදන අයදුම්පත් නිකුත් කිරීම 2021-04-09 දින ප.ව. 3.00 දක්වා සිදු කෙරේ.
- ප්‍රසම්පාදන අයදුම්පත් සීල් තබන ලද කවරවල බහා වම්පස උඩු කෙලවරේ අදාළ කර්මාන්තය හෝ සැපයීම සඳහන් කර **"......... සඳහා මිල ගණන්"** යනුවෙන් සඳහන් කර 2021-04-16 පෙ.ව. 9.30 ට පෙර **"සභාපති, ප්‍රසම්පාදන කමිටුව, කුරුණෑගල ප්‍රාදේශීය සභාව, මල්පිටිය, බෝයගනේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ප්‍රධාන කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හැකිය.
- 2021-04-16 දින ප.ව. 1.00 ට ටෙන්ඩර් විවෘත කරන අතර එම අවස්ථාවට ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.
- ටෙන්ඩර් පෝරම සහ ඊට අදාළ අනෙකුත් ලියවිලි කාර්යාල වේලාවන් තුළදී ප්‍රාදේශීය සභාවට පැමිණ ලබාගත යුතුය.
- ටෙන්ඩර් පෝරම සමග ලබාදෙනු ලබන ලියවිලිවල ඇතුළත් කොන්දේසි මෙම දැන්වීමෙහි සඳහන් කොන්දේසිවලටම අදාළ වෙයි.
- ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මිල ගණන් සම්බන්ධ අවසාන තීරණය සභාව සතුවන අතර මේ සම්බන්ධයෙන් වැඩි විස්තර දුරකථන අංක 037-2222551 ට ඇමතීමෙන් ලබාගත හැකිය.

**අචල නිමන්ත වික්‍රමතිලක,**
**සභාපති,**
**කුරුණෑගල ප්‍රාදේශීය සභාව, මල්පිටිය, බෝයගනේ.**
**2021-03-19 දින කුරුණෑගල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදීය.**

---

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

# භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම

**2021 මාර්තු 24 වැනි දින රුපියල් මිලියන 45,000 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ වෙන්දේසිය**
**භාණ්ඩාගාර බිල්පත් නිකුතුව පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.**

| පරිණත කාලය | දින 91 | දින 182 | දින 364 | එකතුව |
|---|---|---|---|---|
| සු.හ.ජා.අංකය (ISIN)* | LKA09121F259 | LKA18221I243 | LKA36422C255*** | |
| වෙන්දේසිය සඳහා ඉදිරිපත් කළ මුදල (රු. මිලි.) | 10,000 | 15,000 | 20,000 | 45,000 |
| පිළිගනු ලබන උපරිම ඵලදා අනුපාතිකය (%)** | | | 5.12 | |

| | |
|---|---|
| වෙන්දේසි කරන දිනය | : 2021 මාර්තු 24 වැනි දින |
| ගෙවීම් කළ යුතු දිනය | : 2021 මාර්තු 26 වැනි දින |
| නිකුතුවේ දිනය | : 2021 මාර්තු 26 වැනි දින |
| ලංසු භාරගන්නා අවසාන දිනය හා වේලාව | : 2021 මාර්තු 24 වැනි බදාදා පෙ.ව. 11.00 |
| ලංසුවක් සඳහා අවම මුදල | : රුපියල් මිලියන පහක් (5,000,000/-) සහ ඉන් අනතුරුව රුපියල් මිලියනයේ (1,000,000/-) ගුණිතයන්ගෙනි. |

**රජයේ සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ. ලංසු ඉදිරිපත් කළ යුත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයනු ලැබ ඇති විද්‍යුත් ලංසු ඉදිරිපත් කිරීමේ පහසුකම මගින් පමණකි. වෙළෙඳපොළ තත්ත්වයන් මත මෙම වෙන්දේසියට ඉදිරිපත් කරන ලද සම්පූර්ණ ප්‍රමාණය ඉක්මවා නොයන පරිදි, එක් එක් පරිණත කාලයන්ට අදාළව ඉදිරිපත් කරන ලද ප්‍රමාණයන්ට වඩා අඩු හෝ වැඩි ප්‍රමාණයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගනු ලැබිය හැකිය.**

**පහත සඳහන් ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන් හෝ අනෙකුත් බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගන්නා ලෙස මහජනතාවට දැනුම් දෙනු ලැබේ.**

| | | | |
|---|---|---|---|
| ඇකියුටි සෙකියුරිටීස් ලිමිටඩ් | 2206297 | මහජන බැංකුව | 2206783 |
| ලංකා බැංකුව | 2541938 | සම්පත් බැන්ක් පී.එල්.සී. | 2305842 |
| කැපිටල් එලයන්ස් ලිමිටඩ් | 2317777 | සෙලාන් බැන්ක් පී.එල්.සී. | 2456340 |
| කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී | 2332319 | වෙල්ත්ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ් | 2675096 |
| එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ් | 2425010 | ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් පී.එල්.සී. | 2639883 |

* **සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංකය**

** වෙන්දේසියේදී දින 91 සහ දින 182 පරිණත කාලයන් සඳහා තීරණය වනු ලබන ඵලදා අනුපාතිකයන්, දින 364 පරිණත කාලයට අනුරූපව පවත්වා ගනු ඇත.

*** නිවාඩු දිනයන්හි දී සිදුවන භාණ්ඩාගාර බිල්පත් පරිණතයන් සඳහා අදාළ නව ක්‍රමවේදයට යටත් වේ. ඒ අනුව 2022 වසරේ සිට කිසියම්, භාණ්ඩාගාර බිල්පතක් පරිණත වන දිනය බැංකු නිවාඩු දිනයක් වුවහොත් එම පරිණතයට අදාළ ගෙවීම් ඵලඹෙන පළමු රාජකාරි දිනයේදී සිදු කරනු ලැබේ.

**නිකුත් කරන කාර්යාලය**
**රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව,**
**ශ්‍රී ලංකා මහ බැංකුව,30, ජනාධිපති මාවත, කොළඹ 01.**
**දුරකථන : +94 11 2477011, ෆැක්ස් : +94 11 2477687**
**www.cbsl.gov.lk**

**එම්. ඉසෙඩ්. එම්. ආසිම්,**
**රාජ්‍ය ණය අධිකාරී / ලේඛකාධිකාරී.**

---

**1950 සිට දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොව ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.**

**පුස්තකාලයාධිපති**
**දුරකථන**
**(011) 2 242 9491**

LAKE HOUSE

---

# ලංසු සඳහා ආරාධනයයි

Highland

# මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්

## (රජය සතු ව්‍යවසායකි)

MILCO®

මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් යනු, ශ්‍රී ලංකාවේ 'හයිලන්ඩ්' වෙළෙඳ නාමය යටතේ කිරි ආශ්‍රිත නිපැයුම් නිෂ්පාදනයේ යෙදෙන, රජය සතු කිරි සකස් කිරීමේ හා අලෙවි කිරීමේ ප්‍රමුඛතම ආයතනය වේ. මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ ටෙන්ඩර් කමිටුවේ සභාපති විසින්, පහත සඳහන් අයිතම සපයා, ගෙනැවිත් භාරදී, ස්ථාපිත කොට, ක්‍රියාත්මක කොට, පරීක්ෂා කිරීම සඳහා නිෂ්පාදකයන් / සැපයුම්කරුවන් හෝ ඔවුන්ගේ පත්කළ නියෝජිතයන් වෙතින්, මුද්‍රා තැබූ මිල ගණන් මෙයින් කැඳවනු ලබේ.

| | අයිතමය / විස්තරය | මුද්‍රා තැබූ මිල ගණන් අංක | අවසාන දිනය හා වේලාව | ආපසු නොගෙවන ලේඛන ගාස්තු - රුපියල් - | ලංසු බැඳුම්කරය - රුපියල් - |
|---|---|---|---|---|---|
| 01. | එල්ලා තබන වර්ගයේ කිරුම් තරාදි සැපයීම ප්‍රමාණය - 1800 | SQ/2021/P/98 | 2021.04.06 15.00 පැය | 5,000.00 | 75,000.00 |
| 02. | අධිශීතකරණ 100 ක් සැපයීම (ලීටර් 175 ධාරිතාවය : ඒකක 50) (ලීටර් 150 ධාරිතාවය : ඒකක 50) | SQ/2021/P/99 | 2021.04.06 15.00 පැය | 5,000.00 | 100,000.00 |
| 03. | පිදුරු හතරැස් ලෙස බේල් කිරීමේ යන්ත්‍ර සැපයීම. ප්‍රමාණය - ඒකක 03 | SQ/2021/P/100 | 2021.04.06 15.00 පැය | 5,000.00 | 100,000.00 |
| 04. | කොළඹ කිරි කර්මාන්තශාලවේ ශීත ජල යන්ත්‍රාගාරයේ (ටැංකි අංක 02) සඳහා සම්පූර්ණ වාෂ්පීකරණ ඝනීකාරක ඒකකයක් (Complete Evaporative Condenser Unit) සපයා, ස්ථාපිත කොට, ක්‍රියාත්මක කොට, පරීක්ෂා කිරීම. | SQ/2021/P/101 | 2021.04.06 15.00 පැය | 3,000.00 | 75,000.00 |
| 05. | කොළඹ කිරි කර්මාන්තශාලාවේ ශීත කාමර අංක 05 සඳහා වාෂ්පක කොයිල් සම්පූර්ණ කට්ටලයක් (Evaporator Coil) සපයා, ගෙනැවිත් භාරදී, ක්‍රියාත්මක කොට, පරීක්ෂා කිරීම. | SQ/2021/P/102 | 2021.04.06 15.00 පැය | 3,000.00 | 75,000.00 |

ආපසු ගෙවනු නොලබන ගාස්තු, පහත සඳහන් බැංකු විස්තර ප්‍රකාරව ඕනෑම මහජන බැංකු ශාඛාවක් වෙත මුදලින් තැන්පත් කළ යුතුය. (කිසිදු හේතුවක් මත මුදල් භාරගනු නොලැබේ)

| | |
|---|---|
| **ගිණුමේ නාමය** | : මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් |
| **ගිණුම් අංකය** | : 004100180210331 |
| **බැංකුවේ නාමය හා ශාඛාව** | : මහජන බැංකුව, ආයතනික බැංකුකරණ අංශය |
| **කාරණය** | : SQ/2021/P/......... සඳහා ආපසු නොගෙවන ගාස්තු ගෙවීම්. |

**පොදු කොන්දේසි :**

01. ආපසු ගෙවනු නොලබන ලේඛන ගාස්තු ඉහතින් සඳහන් ප්‍රමාණයෙන් මුදලින් ගෙවීමෙන්, 2021.04.01 දින දක්වා, සාමාන්‍ය රාජකාරි දිනවල පෙරවරු 9.30 හා පස්වරු 4.00 අතර කාලය තුළ, කොළඹ 03, ගාලු පාරේ, අංක 345, පස්වන මහලේ, මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ මිලදී ගැනීම් අංශයෙන් සම්පූර්ණ පිරිවිතරයන් / විස්තර ඇතුළත් මුද්‍රා තැබූ මිල ගණන් ලේඛන ලබාගත හැක. ඉල්ලීම් ලිපියක් නොමැතිව මුද්‍රා තැබූ මිල ගණන් ලේඛන හෝ වෙනත් කිසිදු ලේඛනයක් නිකුත් කරනු නොලැබේ.
02. අදාළ ලංසු මිල ගණන් සමග ඉහත සඳහන් වටිනාකමට (එක් එක් වර්ගීකරණයට අදාළ පරිදි) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පිළිගත් වාණිජ බැංකුවකින් නිකුත් කළ, දින 90 ක කාලයක් සඳහා වලංගු ලංසු බැඳුම්කරයක් බැගින් තිබිය යුතුය.
03. මුද්‍රා තැබූ මිල ගණන් **මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්** ආයතනයේ මිලදී ගැනීම් අංශයේදී 2021.04.06 දින පස්වරු 3.00 ට භාර ගැනීම අවසන් කරනු ලබන අතර, ඒ හා සමගම ලැබී ඇති මිල ගණන් විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්හට හෝ ඔවුන්ගේ නියෝජිතයන්හට එම අවස්ථාවට පැමිණ සිටීමට අවසර ඇත.
04. මුද්‍රා තැබූ මිල ගණන් ලේඛන මිලදී ගැනීම් අංශයේදී නොමිලයේ පරීක්ෂා කොට බැලිය හැක.
05. ලැබී ඇති ලංසු සියල්ලම හෝ ඕනෑම එකක් හෝ කිසිදු හේතු දැක්වීමකින් තොරව පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ටෙන්ඩර් කමිටුව සතුවේ.
06. මිල්කෝ ආයතනයේ සේවකයන්හට හෝ ඔවුන්ගේ ළඟම ඥාතීන් හට මෙම මුද්‍රා තැබූ මිල ගණන් කැඳවීමට සහභාගි වීමට අවකාශ නොමැත.

වෙනත් මේ සම්බන්ධ අවශ්‍ය විස්තර, තොරතුරු හෝ පැහැදිලි කර ගැනීම් අවශ්‍ය වෙතොත් **මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්** ආයතනයේ කළමනාකරු මිලදී ගැනීම් වෙතින් දුරකථන අංක : 011-4500530-4 මගින් ලබා ගත හැක.

**සභාපති ටෙන්ඩර් කමිටුව,**
**මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්**
**පස්වන මහල, අංක 345, ගාලු පාර,**
**කොළඹ 03.**

---

# ටෙන්ඩර් දැන්වීමයි

AHEAD

**උසස් අධ්‍යාපනය ව්‍යාප්ත කිරීමේ හා සංවර්ධනය කිරීමේ කඩිනම් ව්‍යාපෘතිය (AHEAD)**

**මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලය - (OTS)**

## ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

**මිහින්තලේ**

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ AHEAD ව්‍යාපෘති වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් යෝජිත ව්‍යාපෘතිය සඳහා සුදුසුකම්ලත් යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන් වෙතින් දැන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

මිහින්තලේ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ AHEAD ව්‍යාපෘතිය නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) කාර්යාලයේදී ලංසුකරණ ලිපිලේඛන ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැකිය.

| ව්‍යාපෘති ශීර්ෂය | ලිපිගොනු යොමු අංකය | අවම සුදුසුකම් | ආපසු නොගෙවන ලිපි ලේඛන ගාස්තුව (රු.) | ලංසු ඇපකර වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| මිහින්තලේ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය සඳහා ඩෙස්ක් ටොප් පරිගණක 60 ක් සැපයීම, ගෙනැවිත් භාරදීම, ස්ථාපනය හා ක්‍රියාත්මක කර පෙන්වීම. | AHEAD/RA2/IT/RJT/FSSH/GOODS/01 | අදාළ ව්‍යාපාර ක්ෂේත්‍රයේ අඩුතරමින් වසර 05 ක පළපුරුද්ද ලංසුකරු සතු විය යුතුය. | 2,500/- | 80,000/- (ලංසු වලංගු කාලය 2021-08-02 දින දක්වා) |

1. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙයවනු ලැබේ.
2. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට ලංසුකරු අසාධු ලේඛන ගත නොවූවකු විය යුතු අතර, නෛතික අධිකාරියක් මගින් නිකුත් කළ අදාළ ක්ෂේත්‍රයේ වලංගු ව්‍යාපාර ලියාපදිංචි සහතිකය සහිත අයකු විය යුතුය.
3. මිහින්තලේ, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ, AHEAD ව්‍යාපෘතියේ, OTS කාර්යාලයේ. නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් හා **ඉහත වගුවේ සඳහන් කර ඇති පරිදි ආපසු නොගෙවන ගාස්තුවක්** ගෙවීමෙන් අනතුරුව, **2021 මාර්තු 22 දින සිට 2021 අප්‍රේල් 16 දින තෙක් එක් එක් වැඩකරන දිනයන්හි ප.ව. 3.00 දක්වා** ඉංග්‍රීසි බසින් වන ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් අභිලාෂී ලංසුකරුවන්ට මිලදී ගත හැකිය. ගෙවීම්, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ, මූල්‍යාධිකාරී නමට **අනුරාධපුර, මහජන බැංකුවේ අංක** 008-1-8-1725841 දරන ගිණුමට මුදල් තැන්පත් කිරීමෙන් කළ හැකිය. අවශ්‍ය වන අවස්ථාවන්හිදී ලංසුකරුවන් 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනතේ නියමයන් අනුව ලියාපදිංචිය ලබා ගත යුතුය.
4. ලංසු සමග, ඉහත වගුවේ සඳහන් කර ඇති පරිදි ලංසු සුරක්ෂණයක් එවිය යුතුය.
5. සම්පූර්ණ කළ ලංසු "මුල්පිටපත" හා "අනුපිටපත" ලෙස සලකුණු කොට වෙන් වෙන්ව මුද්‍රා තැබූ කවර දෙකක බහා එම කවර දෙකම නැවත, වම් ඉහළ කෙළවරේ " AHEAD/RA2/IT/RJT/FSSH/GOODS/01" වශයෙන් ලකුණු කළ මුද්‍රා තැබූ තනි කවරයක බහා ඉදිරිපත් කළ යුතුය. එසේම, ලංසු භාර ගැනීම අවසන් කරන දිනය හා වේලාව ලංසු අංකය යටතේ වම් ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.
6. ලංසු 2021 අප්‍රේල් 19 දින ප.ව. 2.30 ට හෝ ඊට පෙර, මිහින්තලේ, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ, AHEAD ව්‍යාපෘතිය, OTS කාර්යාලය, අධ්‍යක්ෂ (OTS) වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත්, මිහින්තලේ, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ. AHEAD ව්‍යාපෘතියේ OTS කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය.
7. ලංසු 2021 අප්‍රේල් 19 දින ප.ව. 2.30 ට ලංසු භාරගැනීම අවසන් කෙරේ. ප්‍රමාද වී ලැබෙන ලංසු විවෘත නොකරම ආපසු එවනු ලැබේ. ලංසු භාර ගැනීම අවසන් වී දින දෙකට පසුව (2021 අප්‍රේල් 21 දින), ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ. AHEAD ව්‍යාපෘතියේ. අධ්‍යක්ෂ (OTS) කාර්යාලයේදී ලංසු විවෘත කෙරෙන අතර, කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් ලංසුකරණ මිල විද්‍යුත් තැපෑලෙන් දැනුම් දෙනු ඇත.
8. එක් අයිතමයක් ගෙනැවිත් භාරදීමේ කාලය ගිවිසුම / මිලට ගැනීමේ ඇණවුම අත්සන් කරන දින සිට දින 60 ක් තුළ විය යුතුය.
9. ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.
10. වැඩිමනත් පැහැදිලිකර ගැනීම් සඳහා දුරකථනය 025-226632 මගින් නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) අමතන්න.

**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති,**
**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,**
**මිහින්තලේ.**

## ඇටර්නි බලය අවලංගු කිරීම / ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, කොළඹ - 14, ලූකස් පාරේ, අංක 06 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි අයිඩියා ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ් සමාගම (පීබී 5357) වන අපි, පානදුර නොතාරිස් කේ. තිළිණි එන්. ෆොන්සේකා විසින් වර්ෂ 2019 ක් වූ අගෝස්තු මස 08 වැනි දින සහතික කරන ලද විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් එකී ශ්‍රී ලංකා ජනරජයේ, කොළඹ - 14, ලූකස් පාරේ අංක 06 දරන තැන සහ කිරිබත්ගොඩ, රෝහල පාරේ, රණසිංහ වත්තේ, අංක 279-1 හි පදිංචි චින්තක නිරන්ජන් ෆ්‍රෙඩ්රික් නමැති අයට ලබාදුන් ඇටර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරනු ලැබූ බව ශ්‍රී ලංකා රජයත් සියලු මහජනතාවනුත් අන් සියලු දෙනාත් මෙයින් දැන ගනිත්වා.

එකී ඇටර්නි බලපත්‍රයේ සඳහන් ඇටර්නි බලකරු විසින් මෙදිනෙන් පසු අප සමාගම වෙනුවෙන් කරනු ලබන ක්‍රියාවන් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් අප සමාගම විසින් කිසිදු වගකීමක් භාරගනු නොලබන බවද, සියලු දෙනාම මෙයින් දැන ගනිත්වා.

**අධ්‍යක්ෂ මණ්ඩලය - අයිඩියා ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ්**

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

### ඇඹිලිපිටිය දිසා අධිකරණයේ දීය

වන්නිආරච්චි කංකානම්ගේ පියසේන, අංක 503, රෝහල පෙදෙස, පදලංගල.

**- පැමිණිලිකරු -**

| | | |
|---|---|---|
| නඩු අංකය | : | 14073/M |
| ස්වභාවය | : | මුදල් |
| වටිනාකම | : | රු. 100,000/- |
| ඇස්කිසි අංක | : | 43/2018 |

**- එදිරිව -**

පතිරනගේ උපුල් සමන්ත ප්‍රේමරත්න. අංක 100, ඩී 15 ඇල, කුට්ටිගල.

**- විත්තිකරු (වන්) -**

ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2017 ක්වූ දෙසැම්බර් මස 07 වෙනි දින දරන තීන්දුව ප්‍රකාරව රු. 95,000/- මුදල ද, 2013.01.26 වන දින සිට 2014.05.25 වන දින දක්වා රු. 100,000/- මුදලක් මත නෛතික පොලියද, 2014.05.26 වන දින සිට මෙම නඩුව පැවරූ දින දක්වා රු. 95,000/- ක මුදලක් මත නෛතික පොලිය ද රු. 95,000/- ක මුදලක් මත නඩු පැවරූ දින සිට නඩු තීන්දුවේ දිනය දක්වා ද ඉහත සියලු මුදල් වල එකතුව මත මෙම නඩු තීන්දුවේ දින සිට එම සම්පූර්ණ මුදල ගෙවන දින දක්වා නෛතික පොලිය සහ නඩු ගාස්තු පැමිණිලිකරුට අය කර ගත හැකි බවට තීන්දු ප්‍රකාශ කර ඇති අතර, එකී මුදල් ගෙවීමට මෙම නඩුවේ විත්තිකරු අපොහොසත් වී පැහැර හැර ඇති හෙයින්,

මෙම නඩුවේ මා වෙත නිකුත් වී ඇති දේපළ තහනමට ගැනීමේ ආඥාව මත මා විසින් වර්ෂ 2018.11.16 වන දින තහනමට ගන්නා ලද විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති චංචල දේපළ වර්ෂ 2021 ක්වූ මැයි මස 20 වන දින පෙ.ව. 11.00 ට අංක 100, ඩී 15 ඇල, කුට්ටිගල ලිපිනයැති ස්ථානයේ දී ප්‍රසිද්ධ පිස්කල් වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ඉහත කී උපලේඛනය**

| | | |
|---|---|---|
| 01. | උස අඩි 6 දිග අඩි 8 ප්‍රමාණයේ කැබිනට් | 01 |
| 02. | Sharp වර්ගයේ අඟල් 32 රූපවාහිනි යන්ත්‍රය | 01 |
| 03. | Sharp වර්ගයේ කැසට් යන්ත්‍රය | 01 |
| 04. | පිලිප්ස් වර්ගයේ DVD ප්ලේයර් | 01 |
| 05. | Glelco වර්ගයේ DVD ප්ලේයර් | 01 |
| 06. | අඩි 04 උස දෙර දෙකේ අල්මාරි | 01 |
| 07. | රිකෝන් වර්ගයේ ටේබල් ෆෑන් | 01 |
| 08. | LG වර්ගයේ ශීතකරණය | 01 |
| 09. | වානේ කෑම මේස | 01 |
| 10. | කුෂන් සහිත පුටු සෙට් | 01 |

**රෙජිස්ට්‍රාර් / නියෝජ්‍ය පිස්කල්**
**දිසා අධිකරණය - ඇඹිලිපිටිය.**
**2021.03.09**

**වර්ෂ 2020 ක්වූ පෙබරවාරි මස 25 වන දින දීය.**
**සකස් කළේ (පැමිණිල්ලේ නීතිඥ)**

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වන පරිච්ඡේදය)**

## 7 වන වගන්තිය යටතේ දැන්වීමයි

**යොමු අංකය : MLB/LND/LNDAQ/L1/53**

**ඉඩම් අමාත්‍යාංශයේ අංක : 4-3/9/2017/WS/379**

මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ලද ඉඩම රජයට අත්පත් කරගෙන ඇත. වැඩි විස්තර සඳහා අංක 2213/33 හා 2021.02.03 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය බලන්න.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| දිස්ත්‍රික්කය | : | මාතර |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : | මාලිම්බඩ |
| ග්‍රාම නිලධාරී කොට්ඨාසය | : | කටුවන්ගොඩ |
| ගමේ නම | : | කටුවන්ගොඩ |
| ඉඩමේ නම | : | අරලුගහ කොරටුව |
| කැඩැස්තර සිතියම් අංකය | : | මු.පී. මාර 2855 |
| කැබලි අංකය | : | කැබලි අංක 01 |

**කේ.පී.ආර්. ජයනාත්**
**ප්‍රාදේශීය ලේකම්,**
**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාලිම්බඩ.**
**2021.03.08**

## ශ්‍රී ලංකා ජාතික රෝහල

**කොළඹ 10**

### විදුලි ලොන්ඩ්‍රියේ යන්ත්‍ර සූත්‍ර නඩත්තු කිරීම හා සේවා කටයුතු සඳහා ප්‍රසම්පාදන දැන්වීම

2021 / 2022 වර්ෂය වෙනුවෙන් කොළඹ ශ්‍රී ලංකා ජාතික රෝහලේ විදුලි ලොන්ඩ්‍රියේ යන්ත්‍ර සූත්‍ර නඩත්තු කිරීම හා සේවා කටයුතු සිදු කිරීම සඳහා අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති රජයේ ලියාපදිංචි පුද්ගලයින්ගෙන් හෝ ආයතන වලින් මිල ගණන් කැඳවනු ලැබේ.

ආපසු නොගෙවනු ලබන රු. 1,500.00 ක ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2021-04-09 දින දක්වා සතියේ දිනවලදී පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා අතරතුර, ශ්‍රී ලංකා ජාතික රෝහලේ සැපයීම් අංශයෙන් අදාළ ලංසු කොන්දේසි සහිත අයදුම්පත් ලබාගත හැකියි.

2021-04-12 දින පෙ.ව. 10.00 ට ශ්‍රී ලංකා ජාතික රෝහලේ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේ දී මිල ගණන් විවෘත කරනු ලැබේ.

**වෛද්‍ය ඩබ්.කේ. වික්‍රමසිංහ**
**සභාපති,**
**ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා ජාතික රෝහල.**

# ලංසු කැඳවීම

## සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම

**ලංසු අංකය : 020/T/2021**

**මත්තල, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ වායු සමීකරණ පද්ධතියේ ජල සිසිලන කුලුනු සඳහා ජලයේ ගුණාත්මක තත්ත්වය, නඩත්තු කිරීම, ප්‍රතිකර්ම හා රසායනික ද්‍රව්‍ය සැපයීම**

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) පුද්ගලික සමාගමේ සභාපති විසින් මත්තල, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ වායුසමීකරණ පද්ධතියේ ජල සිසිලන කුලුනු සඳහා ජලයේ ගුණාත්මක තත්ත්වය, නඩත්තු කිරීම, ප්‍රතිකර්ම හා රසායනික ද්‍රව්‍ය සැපයීම සඳහා ලංසු කැඳවනු ලැබේ.

ලංසු ලිපිලේඛන කට්ටලයක් ආපසු නොගෙවනු ලබන රුපියල් දහසක (රු. 1,000.00) මුදලක් සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශයට ගෙවීමෙන් ලබාගත හැකි අතර, ඒ සඳහා ලංසු තබන්නා විසින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය.

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශය වෙතින් 23.03.2021 වන දින සිට 23.04.2021 වන දින දක්වා ඕනෑම වැඩකරන දිනයකදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලංසු ලිපි ලේඛන කට්ටල ලබාගත හැකිය. අවශ්‍ය නම් ඉහත ලංසු ලිපි ලේඛන සැපයුම් දම කළමනාකරණ අංශ කාර්යාලයේදී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

ලංසු තබන්නන් ඔවුන්ගේ ලංසු කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශයේ තබා ඇති ලංසු බහාලුම් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. තවද, ලංසු තබන්නන්ගේ කැමැත්ත පරිදි ඔවුන්ගේ සීල් තබන ලද ලංසු ඉහත ලිපිනයට පෞද්ගලිකවද ගෙනවිත් භාරදිය හැකිය.

ලංසු තැබීම 2021 අප්‍රේල් මස 27 වන අඟහරුවාද දින ප.ව. 2.00 ට අවසන් වන අතර, අදාළ ලංසු විවෘත කිරීම ඒ සමගම **සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක** පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශයේදී සිදු කෙරේ. ලංසු තබන්නන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කරන අවස්ථාවේදී එයට සහභාගි විය හැකිය.

ලංසු සුරැකුම් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ලත් බැංකුවකින් **සභාපති, සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම** වෙත ඉල්ලුම මත ගෙවෙන සේ නිකුත් කරන රුපියල් හතලිස් හතර දහසක (රු. 44,000.00) වටිනාකමකින් යුත් බැංකු ඇපකරයක් ලංසු සමඟ ඉදිරිපත් කළ යුතුය.

ලංසු තැබීමට අදාළ විස්තර පැහැදිලි කිරීම 2021 අප්‍රේල් මස 06 වන දින පෙ.ව. 10.00 ට මත්තල, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ පිහිටි ගුවන් තොටුපොළ ව්‍යාපෘති කාර්යාලයේ සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වනු ලැබේ.

මේ පිළිබඳ වැඩි විස්තර සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ, සැපයුම් දම කළමනාකරණ අංශයේ **දුරකථන අංකය** 011-2264103 ඇමතීමෙන් **head.scm@airport.lk** විද්‍යුත් ලිපිනයෙන් හෝ අපගේ **www.airport.lk** යන අන්තර්ජාල වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

**සභාපති,**
**සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම,**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ,**
**කටුනායක.**

## සී/ස ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම

**ප්‍රසම්පාදන අංක : 094/T/2020**

**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ නඩත්තු ගොඩනැගිලි සංකීර්ණයේ වහලයේ ජල කාන්දු වැළැක්වීම සඳහා මිල ගණන් කැඳවීම**

සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ සභාපති විසින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ නඩත්තු ගොඩනැගිලි සංකීර්ණයේ වහලයේ ජල කාන්දු වැළැක්වීම සඳහා මිල ගණන් කැඳවීම සුදුසුකම්ලත් යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් අනතුරුව දවස් අනූවක් (90) තුළ නිමකළ යුතු වේ.

ලංසුකරු මෙම ආයතනයේ මීට පෙර ප්‍රතික්ෂේපිත කොන්ත්‍රාත් නාම ලැයිස්තුවේ නම අඩංගු නොවූ අයකු/ ආයතනයක් විය යුතුවේ.

සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ සැපයුම් දම කළමනාකරණ අංශයෙන් (දුරකථන අංක : 011-2264103) ලංසු ගාස්තු වශයෙන් ආපසු නොගෙවනු ලබන රුපියල් 3,500.00 (රුපියල් තුන්දහස් පන්සියක් පමණි) මුදලින් ගෙවීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද එකී ලංසු ලිපි ලේඛන කට්ටලයක් මිලදී ගත හැකිය. ලංසු ලිපි ලේඛන නිකුත් කරනු ලබන්නේ 23.03.2021 දින සිට 23.04.2021 දින දක්වා සතියේ රාජකාරී දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 03.00 දක්වා කාලය තුළ වේ. එකී ලංසු ලිපි ලේඛන ඉහත සඳහන් ලිපිනයේදී ගාස්තුවකින් තොරව පරීක්ෂා කර බැලිය හැක.

ලංසු සුරැකුම් වෙනුවෙන් එම ලංසු ලිපි ලේඛනවල සඳහන් ආයතනයකින් නිකුත් කරන ලද රු. 200,000.00 (රුපියල් ලක්ෂ දෙකක් පමණි) වටිනා ඇපකරයක් හෝ මුදල් ඇපකරයක් ලංසුව සමග ඉදිරිපත් කළ යුතුවේ.

සභාපති, ප්‍රසම්පාදන මණ්ඩල අංක 02, සැපයුම් දම කළමනාකරණ අංශය, සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ, කටුනායක යන ලිපිනයට එම මුද්‍රා තැබූ ප්‍රසම්පාදන ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු අතර 2021 අප්‍රේල් මස 27 වන අඟහරුවාද දින ප.ව. 02.00 ට එම කාල සීමාව අවසන්වේ. එදින එම වේලාවට අදාළ ලංසු විවෘත කරනු ලැබේ.

පූර්ව ලංසුකරණ රැස්වීම 2021 අප්‍රේල් මස 06 වන දින පෙ.ව. 10.00ට කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ සිවිල් ඉංජිනේරු (නඩත්තු) අංශයේ රැස්වීම් ශාලාවේ පවත්වන අතර ලංසුකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට සහභාගි විය හැක.

මේ පිළිබඳ වැඩි විස්තර කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ, සිවිල් ඉංජිනේරු (නඩත්තු) අංශයේ අංශ ප්‍රධානී වෙතින් දුරකථන අංක : 011-2264700/ 011-2264704 ඔස්සේ ලබාගත හැක.

**සභාපති,**
**ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම,**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ,**
**කටුනායක.**

## සී/ස ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම

# ලංසු තැබීම සඳහා ආරාධනයයි

**ලංසු අංක : 095/T/2020**

**කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි 5 වන ගුවන්ගැල් ගම්මානයෙහි ගොඩනැගිලි ආවරණය ඉදිකිරීම (Shelter for Cargo Terminal-05)**

සභාපති, සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම විසින්, කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි ගුවන්ගැල් ගම්මානයෙහි 5 වන ගොඩනැගිල්ලෙහි ආවරණය ඉදිකිරීම පිණිස මුද්‍රා, තැබූ ලංසු පහත විස්තර කර ඇති පරිදි සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මෙයින් කැඳවනු ලැබේ. මේ සඳහා ඇස්තමේන්තුගත මුදල අවිනිශ්චිත වියදම සහ වැට් බද්ද හැර රුපියල් මිලියන 12 ක් වේ.

මෙකී ඉදිකිරීම් වැඩ වලට අඩංගු වන ආවරණය ඉදිකිරීම (දළ වශයෙන් බිම් වර්ග මීටර 192 කි) සිදු කළ යුතු අතර, එම සියලුම ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඉදිකිරීම් ද්‍රව්‍ය සහ කම්කරු ශ්‍රමය සපයා ගනිමින්, අදාළ පිරිවිතර අනුව, ප්‍රමාන සමීක්ෂණ පත්‍රයේ සඳහන් පරිදි හා ඉංජිනේරු සැලසුම් අනුව එය ඉදි කළ යුතුවේ.

**කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් කාල පරිච්ඡේදය දින 90 කි.**

**ව්‍යාපෘති ස්ථානය : කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ වේ.**

**ලංසු පවත්වාගෙන යනු ලබන්නේ ජාතික තරඟකාරී ලංසු ඉදිරිපත් කිරීමේ පටිපාටියට අනුව වේ.**

මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සිදු කරනු ලබන්නේ යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්ට වන අතර, අසාදුගත කොන්ත්‍රාත් නාම ලැයිස්තුවේ නම අඩංගු නොවූ අයෙකු /ආයතනයක් විය යුතුයි. තවද මෙම ලංසුකරුවන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA, මින් පෙර ICATD නමින් හැඳින්වූ) ගොඩනැගිලි ඉදිකිරීම සඳහා C6 හෝ C5 ශ්‍රේණියේ ලියාපදිංචි වූ, අදාළ මාදිලියේ ඉදිකිරීම් කටයුතු පිළිබඳ පළපුරුද්දක් ඇති කොන්ත්‍රාත්කරුවන් විය යුතුය.

මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට 2021 මාර්තු මස 23 වන දින සිට 2021 අප්‍රේල් මස 19 වන දින දක්වා ඕනෑම රාජකාරී දිනයක පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා කාලය තුළ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ, සැපයුම් දම කළමනාකරණ අංශය වෙත, සභාපති, ප්‍රසම්පාදන කමිටු අංක 02, නමින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවනු ලබන රුපියල් 4,000/- (හාර දහසක්) මුදලින් ගෙවීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද එකී සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් මිලදී ගත හැක. එකී ලංසු ලිපි ලේඛන, ඉහත සඳහන් ලිපිනයේදී ගාස්තුවකින් තොරව පරීක්ෂා කර බැලිය හැක.

ලංසු සුරැකුම් වෙනුවෙන් ලංසුකරුවන්, එක් ලංසුවක් සඳහා රුපියල් එක්ලක්ෂ පනස් දහසක් පමණක් (රුපියල් 150,000/-) මුදලින් හෝ ලංසු තොරතුරු ලේඛනයේ සඳහන් ආයතනයකින් ලබාගත් ඉල්ලුම මත වූ ලංසු බැඳුම්කරයක් සමග එකී ලංසු ඉදිරිපත් කළ යුතුවේ.

2021 අප්‍රේල් මස 01 වන දින පෙ.ව. 10.00 ට කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ, නව පරිපාලන ගොඩනැගිලි සංකීර්ණයේ, 4 වන මහලේ, සිවිල් ඉංජිනේරු (සැලසුම් හා නිර්මාණ) අංශයේ සම්මන්ත්‍රණ කාමරයේදී පැවැත්වෙන පූර්ව ලංසුකරණ රැස්වීමට සහභාගි වන ලෙස සියලුම ලංසුකරුවන්ට හා ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට මෙයින් ආරාධනා කරනු ලැබේ.

සම්පූර්ණ කරන ලද ලංසු 2021 අප්‍රේල් මස 20 වන දින ප.ව. 02.00 ට පෙර ලැබෙන සේ අතින් ගෙනවිත් හෝ ලියාපදිංචි තැපෑලෙන් සභාපති, ප්‍රසම්පාදන කමිටු අංක 02, සැපයුම් දම කළමනාකරණ අංශය, සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක වෙත ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාර ගැනීම අවසන් වූ විගස ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරිපිට එකී ලංසු විවෘත කරනු ලැබේ.

මේ පිළිබඳ, වැඩි විස්තර කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ, සිවිල් ඉංජිනේරු (සැලසුම් හා නිර්මාණ) අංශයේ අංශ ප්‍රධානී වෙතින් දුරකථන අංක 011-2263500, 011-2263507 සහ ෆැක්ස් අංක 011-2251356 ඔස්සේ ලබා ගත හැක.

**සභාපති,**
**සී/ස ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම,**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ,**
**කටුනායක.**

# මෙරටට චීන රජයෙන් කොරෝනා මර්දන එන්නත් මාත්‍රා ලක්ෂ 6ක ප්‍රදානයක්

**රාජ්‍ය ඇමැති චන්න ජයසුමන**

**අමිල ප්‍රභාත් වනසිංහ - අනුරාධපුර අතිරේක**

චීනයේ නිෂ්පාදනය කරන සයිනෝෆාර්ම් එන්නත ශ්‍රී ලංකාවට ගෙනඒමට ජාතික ඖෂධ නියාමන අධිකාරියෙන් අනුමැතිය ලැබී ඇති බවත්, මේ වන විට චීන රජයෙන් සයිනෝෆාර්ම් එන්නත් මාත්‍රා ලක්ෂ හයක් ප්‍රදානයක් ලෙස ශ්‍රී ලංකාවට දීමට තීරණය කර ඇති බවත් සෞඛ්‍ය රාජ්‍ය ඇමැති චන්න ජයසුමන මහතා සඳහන් කළේය.

රාජ්‍ය ඇමැතිවරයා මේ බව පැවැසුවේ පසුගියදා (20) මාධ්‍ය වෙත අදහස් දක්වමිනි.

එහිදී නැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැතිවරයා මෙසේ ද කීය.

'සති දෙකක කාලය ඇතුළත එම එන්නත මෙරටටට ලැබෙනු ඇතැයි මා විශ්වාස කරනවා. දෛනිකව වාර්තා වන කොරෝනා රෝගීන් තවදුරටත් අඩු කර ගැනීමට සෞඛ්‍ය අංශවල සහ යුද හමුදාවල සහාය බලාපොරොත්තු වෙනවා. ලෝක සෞඛ්‍ය සංවිධානයේ කොවැක්ස් වැඩපිළිවෙළ යටතේ දුන් එන්නත් මේ වන විට දෙනවා. ඉන්දියාවෙන් දෙන එන්නත් ද ඉදිරි සති දෙකේදී ලැබෙනු ඇති. වයස අවුරුදු හැටට වැඩි පුද්ගලයන්ට එන්නත්කරණය සිදු කරනවා.

පළමු එන්නත දුන් පුද්ගලයන්ට දෙවන වටයේ එන්නත් දීම අප්‍රේල් දහ වැනිදායින් පසුව සිදු කෙරෙනවා. ඒ සඳහා අවශ්‍ය එන්නත් වෙන් කර තිබෙනවා.

නිරෝධායන නීති ලිහිල් කර සංචාරකයන් වැඩි පිරිසකට මෙරටට පැමිණීමට අවස්ථාව දී සංචාරක ව්‍යාපාරය ඉහළ නැංවීමටත්, මේ වන විට මෙරට නොමැති කොරෝනා නව ප්‍රභේද මෙරට ව්‍යාප්ත වීම වළකාලමින් එම සංචාරක ව්‍යාපාරය සිදු කිරීමටත් කටයුතු කරනවා.'

## හිටපු ඇමැති රවි ඇතුළු 8 දෙනාට කොවිඩ් නෑ

**බුද්ධිකා ඉඹුලාන**

මහ බැංකු බැඳුම්කර වංචා චෝදනා මත රක්ෂිත බන්ධනාගාරගත කළ හිටපු ඇමැති රවි කරුණානායක මහතා ඇතුළු 08 දෙනාගේ පීසීආර් පරීක්ෂණ වාර්තාවලින් ඔවුන් කොවිඩ් ආසාදිතයන් නොවන බව තහවුරු කර තිබේ.

ඒ අනුව ඔවුන් කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයට මාරු කර යැවූ බවත්, එම බන්ධනාගාරයේ M-2 සිරමැදිරියේ විශේෂ ආරක්ෂාවක් සහිතව ඔවුන් රඳවා ඇති බවත් බන්ධනාගාර කොමසාරිස් (පාලන හා පුනරුත්ථාපන) බන්ධනාගාර මාධ්‍ය ප්‍රකාශක චන්දන ඒකනායක මහතා කියයි.

## යාපනය සරසවියේ විනය නිලධාරීවරයාට සිසුන් 17කට කොවිඩ්

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

යාපනය විශ්වවිද්‍යාලයේ විනය නිලධාරීවරයාට සහ සිසුන් 17කට කොරෝනා වැළඳීමත් සමගම එහි සිටින සියලුම දෙනාත්, ඔවුන් සමග සබඳකම් පවත්වන සියලුම දෙනාත් පීසීආර් පරීක්ෂණවලට ලක් කිරීමේ වැඩසටහනක් පසුගියදා (20) සිට ආරම්භ කර තිබේ.

යාපනයේ නල්ලූර් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයාගේ මෙහෙයවීම මත විශේෂ කණ්ඩායමක් මේ සඳහා එම විශ්වවිද්‍යාලයට එවා ඇත.

එහිදී ගන්නා පීසීආර් පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම යාපනය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයෙන් සිදු කරයි. එයින් දිනකට පීසීආර් පරීක්ෂණ 300ත් 400ත් අතර ප්‍රමාණයක් සිදු කළ හැකිය.

## කැකිරාවේ කොවිඩ් ආසාදිත ගණන 50 දක්වා ඉහළට

**තිරප්පනේ සමූහ - ඩී. ජේ. දිසානායක**

කැකිරාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයේ ඊයේ (21) උදෑසන වන විට කොවිඩ් ආසාදිතයන්ගේ ගණන 50 දක්වා ඉහළ ගොස් ඇත.

තිබ්බටුවැව ප්‍රදේශයෙන් ඇඟලුම් කර්මාන්ත ශාලාවක සේවිකාවක කොවිඩ් ආසාදිත බවට හඳුනාගැනීමෙන් පසු ඇගේ ආශ්‍රිතයන් 122කගේ පීසීආර් පරීක්ෂණ සිදු කර ඇත. එයින් 16 දෙනකුට ද කොවිඩ් ආසාදිත බවට හඳුනාගෙන ඇත.

ප්‍රදේශයේ කොවිඩ් පැතිරීම වළක්වා ගැනීමට දැඩි වෙහෙසක් දරන කැකිරාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ නිලධාරී මණ්ඩලය මහ ජනතාවගෙන් සෞඛ්‍ය උපදෙස් නිසි ලෙස පිළිපදින ලෙස ද ඉල්ලීම් කරයි.

## මකුළුව නිවෙසේ මිය ගිය පුද්ගලයාට කොවිඩ්

**කරාපිටිය සමූහ - එස්. ලොකුකරවිට**

නිවෙසේ මිය ගොස් සිටි ගාල්ල, මකුළුව පදිංචිකරුවකු කොරෝනා ආසාදිත බව පෙරේදා (20) ලැබුණු පීසීආර් ප්‍රතිඵල අනුව තහවුරු වූයේ යැයි කරාපිටිය රෝහලේ අධිකරණ වෛද්‍ය අංශය පවසයි.

මෙලෙස මිය ගොස් ඇත්තේ වයස අවුරුදු 84ක් වූ දරුවන් හය දෙනකුගේ පියෙකි. මේ තැනැත්තාගේ සිරුර කරාපිටිය රෝහලට ගෙන ඒමෙන් පසු සිදු කරන ලද පීසීආර් පරීක්ෂණයෙන් තහවුරුවී ඇත්තේ මොහු මිය යන විට කොරෝනා ආසාදනයවී සිටි බවයි.

අධිකරණ වෛද්‍ය පරීක්ෂණය සිදු කළ කරාපිටිය ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී සමාධි දන්දෙණියආරච්චි මහත්මිය දුන් වාර්තාවට අනුව එය හෘදයාබාධයක් සහ කොවිඩ් ආසාදනය වීම හේතුවෙන් සිදු වූ මරණයක් බව ගාල්ල නාගරික හදිසි මරණ පරීක්ෂක එන්. ජී. බී. කරුණාතිලක මහතා විසින් නිගමනය කරන ලදී.

## නිරෝධායන රීති කැඩූ ඇල්කඩුව වතු ආශ්‍රිත ඇඟලුම් ආයතනයක හිමිකාරියට දඩ

**උකුවෙල සංචාරක - ප්‍රියන්ත සුමනසේන**

නිරෝධායන නීති උල්ලංඝනය කරමින් උකුවෙල, ඇල්කඩුව නගරයේ වතු ආශ්‍රිතව පවත්වාගෙන ගිය පෞද්ගලික ඇඟලුම් ආයතනයක පාලන කාන්තාවක මාතලේ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු රුපියල් 10,000ක දඩ මුදලක් නියම කර ඇත.

උකුවෙල මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් දෛනිකව සිදු කරන මෙහෙයුම්වලදී මේ ආයතනයේ සේවිකාවන් මුව ආවරණ නොමැතිව සේවය කරන අයුරු නිරීක්ෂණය වීමෙන් පසුව එහි පාලකවරියට විරුද්ධව මෙලෙස කටයුතු කර ඇත. උකුවෙල මාතලේ පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක ඒ. ඩී. බංඩාර මහතාගේ මෙහෙයවීමෙන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් වන එච්. එම්. එස්. සෙනෙවිරත්න, ආර්. විනයාගමූර්ති, පී. එල්. පී. ජී. කරුණාරත්න, ආර්. එම්. එන්. එස්. රාජකරුණා මහත්වරුන් මේ විමර්ශන කටයුතු සිදු කරයි.

## ත්‍රිකුණාමලයේ වීදි දෙකකින් කොවිඩ් ආසාදිතයෝ 76ක්

**ඒ. ටී. එම්. ගුණානන්ද - ත්‍රිකුණාමලය විශේෂ**

ත්‍රිකුණාමල නගරයේ වාණිජමය අතින් වැදගත් ප්‍රධාන වීදි දෙකකින් මේ වන විට කොවිඩ් ආසාදිතයන් 76 දෙනකු සොයා ගත් බව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය ඩී. ජී. එම්. කොස්තා මහතා පැවැසීය.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

'ආසාදිතයන් සොයා ගත් වෙළෙඳසල් 44ක් වසා දැමීමට පියවර ගත්තා. ආසාදිතයන් සේවය කළ වෙළෙඳසල්වලට වෙනත් කාර්ය මණ්ඩල යොදවා විවෘත කිරීමට හැකියාව පවතිනවා. මේ සම්බන්ධයෙන් උපදෙස් සහ සෞඛ්‍ය නීතිරීති මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හරහා නිරන්තරයෙන් දෙනවා.'

## විහාර මහා දේවි උද්‍යානයේ ඉදි කර තිබූ චිත්‍රය ඉවත් කළේ අනාරක්ෂිත අට්ටාලයක රඳවා තිබූ නිසයි

**කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් රෝෂිණී දිසානායක**

**සුභාෂිණී සේනානායක**

කොළඹ නෙළුම් පොකුණ අසල විහාරමහා දේවි උද්‍යානයේ ප්‍රදර්ශනය කර තිබූ චිත්‍රය එම ස්ථානයෙන් ඉවත් කරනු ලැබුවේ අනාරක්ෂිත ලෙස ඉදිකරන ලද අට්ටාලයක මේ චිත්‍රය රඳවා ඇති බවට ලැබුණු පැමිණිලි හේතුවෙන් බව කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් රෝෂිණී දිසානායක මහත්මිය පැවැසුවාය.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ ඇය මෙසේ ද කීවාය.

'නියමිත ආරක්ෂක උපදෙස් අනුව ඉදි කර නෑ. ලයිට්වලට ඉතාම ළඟින් මෙය සකස් කර තිබුණා. මහජනතාවගෙන් අපට පැමිණිලි ආවා. විශාල ප්‍රමාණයක් මේ උද්‍යානය හරහා ගමන් කරනවා. මහජනතාවට පීඩාවක්වීම වැළැක්වීම වෙනුවෙන් අප එය ඉවත් කිරීමට කටයුතු කළා.'

**පොලිස් පරිසර ඒකකයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී රොෂාන් රාජපක්ෂ මහතා**

'මේ බැනර් එක ගහලා තිබුණේ පොලිසියේ කිසිම අවසරයක් නැතිව. බැනර් එකේ තිබූ දේ ලස්සන වෙන්න පුළුවන්. ඒත් අවසර ගන්න අවශ්‍යයි.'

වන සත්ත්ව හා ස්වාභාව ආරක්ෂක සංගමයේ ප්‍රකාශකයෙක් චිත්‍රය ගැන පළ කළේ මෙවන් අදහසකි.

'ගෝලීය දේශගුණික විපර්යාස පිළිබඳ දැනුම්වත් කිරීමේ දිනය නිමිත්තෙන් ඇඳ තිබූ චිත්‍රයක් එලෙස ඉවත් කිරීමට පියවර ගෙන තිබුණා. අප මේක කිසි දෙයක් බලාපොරොත්තුවෙන් කළ දෙයක් නොවෙයි. කාටවත් අභියෝග කරන්න කළ දෙයකුත් නොවෙයි. මේකෙන් අපට පෙන්වන්න ඕනෑ වුණේ ගෝලීය දේශගුණික විපර්යාස පිළිබඳවයි.'

## කසළ තේ අපනයනයේ ප්‍රධාන සැකකරු අත්අඩංගුවට ගැනීමට නියෝග

**සුභාෂිණී සේනානායක**

කසළ තේ අපනයනය කිරීමේ ජාවාරමේ ප්‍රධාන සැකකරු අත්අඩංගුවට ගැනීමට කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නියෝග කර තිබේ.

අදාළ සැකකරු අත්අඩංගුවට ගැනීමට වරෙන්තු නිකුත් කරන ලෙස රේගු අවදානම් කළමනාකරණ ඒකකය අධිකරණයෙන් සිදු කළ ඉල්ලීම සලකා බැලීමෙන් අනතුරුව කොළඹ අතිරේක මහේස්ත්‍රාත් ලෝචනී අබේවික්‍රම මහත්මිය එම නියෝගය දුන් බව රේගු ප්‍රකාශකයෙක් පැවැසීය.

කසළ තේ ජාවාරම කොලොන්නාව ප්‍රදේශයේ ව්‍යාපාරිකයකු විසින් සිදු කර ඇති බවත්, ඔහු රේගුව මග හරිමින් සිටින බවත් එම නිසා සැකකරු අත්අඩංගුවට ගැනීමට වරෙන්තු නිකුත් කරන ලෙස රේගු අවදානම් කළමනාකරණ ඒකකය සිදු කළ ඉල්ලීම සලකා බැලූ කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය මේ නියෝගය සිදු කර ඇත.

එම සැකකරු මීට පෙර ද කසළ තේ ජාවාරම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන දින 10ක් රක්ෂිත බන්ධනාගාරගතව සිටි පුද්ගලයකු වන බව රේගුව අධිකරණයට දන්වා තිබූ අතර, සැකකරු අත්අඩංගුවට ගැනීම වළක්වාලන ලෙස ඉල්ලමින් ඔහුගේ නීතිඥයන් අභියාචනාධිකරණය හමුවේ පෙත්සමක් ගොනු කර තිබීම හේතුවෙන් අදාළ පෙත්සම විභාගය ගන්නා තුරු සැකකරු අත්අඩංගුවට ගැනීමට වරෙන්තු නිකුත් නොකරන ලෙස ඉල්ලා තිබුණි. දෙපාර්ශ්වයම ඉදිරිපත් වූ කරුණු සලකා බැලූ කොළඹ අතිරේක මහේස්ත්‍රාත් ලෝචනී අබේවික්‍රම මහත්මිය සැකකරු අත්අඩංගුවට ගන්නා ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට නියෝග කර ඇත.

ශ්‍රී ලංකාවේ තේවලට ඇති කීර්ති නාමය විනාශ කරමින් මේ වන විට රුපියල් කෝටි හය හමාරකට අධික වටිනාකමකින් යුත් කසළ මෙට්‍රික් ටොන් 45කට අධික ප්‍රමාණයක් සැකකරු විසින් ඉරාකයට යවා ඇති බව රේගු අවදානම් කළමනාකරණ ඒකකය සිදු කළ මූලික විමර්ශනවලින් අනාවරණවී ඇත. මේ සම්බන්ධයෙන් ඔවුන් අධිකරණයට කරුණු වාර්තා කර අධිකරණය නියෝග ඉල්ලා තිබිණි.

එලෙස අපනයනය කළ කසළ තේ බහාලුම් 04ක් පසුගියදා ඩුබායිහිදී නතර කෙරුණු අතර, එම බහාලුම් මේ වන විට ශ්‍රී ලංකාවට රැගෙන එමින් පවතී. එම කසළ තේ ජාවාරම සම්බන්ධයෙන් මේ වන විටත් පුද්ගලයන් දෙදෙනකු රේගුව විසින් අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කර ඇත.

## බන්ධනාගාර නිලධාරියකු හෙරොයින් සමඟ අත්අඩංගුවට

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

යාපනය නගරයේ මාටින් පාරේදී රුපියල් ලක්ෂ දෙකක් පමණ වටිනා හෙරොයින් පැකැට්ටුවක් සමග බන්ධනාගාර නිලධාරියකු යාපනය සුරාබදු නිලධාරීන් විසින් පෙරේදා (20) අත්අඩංගුවට ගෙන තිබේ.

යුද හමුදාවේ බුද්ධි අංශ නිලධාරීන්ට ලැබුණු තොරතුරක් මත යාපනයේ සුරාබදු නිලධාරීන් විසින් අදාළ සැකකරුව අත්අඩංගුවට ගෙන ඇති අතර, ඔවුන් විශ්වාස කරන්නේ බන්ධනාගාර නිලධාරියා මේ හෙරොයින් රැගෙන යන්නට ඇත්තේ සිරකරුවන්ට අලෙවි කිරීමට බවයි. අත්අඩංගුවට ගත් සැකකරුව යාපනය අධිකරණයට ඉදිරිපත් කිරීමට පියවර ගෙන තිබේ.

## නිදහස් ලංකාවේ නිර්මාතෘ ඩී. එස්. සේනානායක ශ්‍රීමතාණෝ

***(ඩී. එස්. සේනානායක ශ්‍රීමතාණන් දිවංගත වී අදට (22) වසර 69ක් සපිරේ. මේ ලිපිය ඒ නිමිත්තෙනි.)***



ජාතියේ පියා ලෙසින් විරුදාවලියට පත් වූ ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැති, එක්සත් ජාතික පක්ෂයේ නිර්මාතෘ දොන් ස්ටීවන් සේනානායක හෙවත් ඩී. එස්. සේනානායක ශ්‍රීමතාණන් මීට වසර එකසිය තිස් හතකට පෙර මෙලොව එළිය දුටුවේ 1884 ඔක්තෝබර් මස 20 වැනිදා ගම්පහ දිස්ත්‍රික්කයට අයත් හාපිටිගම කෝරළයේ බෝතලේ වලව්වේදීය. දොන් ස්ටෙපර් සේනානායක මුදලිතුමන් සහ කැතරින් එළිසබෙත් පෙරේරා ගුණසේකර මාපිය දෙපළගේ තුන් වෙනි පුතණුවන් ලෙස ඩී. එස්. සේනානායක මෙලොව එළිය දුටුවේය.මාතලේ පිහිටි ඉංග්‍රීසි විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ ඩී. එස්. පසුව කොළඹ ශාන්ත තෝමස් විද්‍යාලයට ඇතුළත් වූයේ වැඩිදුර අධ්‍යාපනය සඳහාය. නමුත් ඔහුට පාසල් අධ්‍යාපනය නීරස එකක් විය. ශ්‍රේණි විභාගයෙන් අට සමත් වන විට පාසලෙන් ඉවත් වූ ඩී. එස්. කැත්ත උදැල්ලේ වැඩත්, වතු පිටිවල වගාවන් පිළිබඳවත්, කෙත නගුල සහ ගවයා පිළිබඳවත් ලැබූ දැනුම සාර්ථක ඉඩම් හිමි වැවිලිකරුවකු වීමට උපයෝගී කර ගත්තේය.

ඩී. එස්. සේනානායක මහතා දේශපාලනයට පිවිසියේ උගතුන් රැසක් සමඟය. සර් ඩී. බී. ජයතිලක, ෆ්‍රැන්සිස් ද සොයිසා, සී. ඩබ්. ඩබ්. කන්නන්ගර, පොන්නම්බලම් රාමනාදන්, පොන්නම්බලම් අරුණාචලම්, ආතර් ද සිල්වා, එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ඒ අතර ප්‍රධාන වේ.

විටෙක උගතුන් වියතුන්ගෙන් පිරුණු ලංකා ජාතික සංගමයේ නායකයා වූ ඩී. එස්. එකල තිබූ බොහෝ දේශපාලන සංවිධාන එක්ව පිහිට වූ එක්සත් ජාතික පක්ෂයේ ආරම්භක නායකයාවී ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැති ධුරයට පත් විය.

තමාගේ උපදේශකවරයා බඳු වූ වැඩිමහල් සොහොයුරු දේශබන්ධු අධිනීතිඥ එෆ්. ආර්. සේනානායක මහතාගේ දේශපාලනය, සමාජ මෙහෙවර, ආගමික සේවය ආදර්ශයට ගත් ඩී. එස්. තම ගම් ප්‍රදේශය වූ මීරිදුගී දුප්පත ජනතාවගේ විවිධ අවශ්‍යතා ඉටු කිරීමට කැප වූයේ තම වගකීමක්, යුතුකමක් ලෙස සලකමිනි. එහි ප්‍රතිඵලය වූයේ ඩී. එස්. සිය දිවිමගෙහි හතළිස් විය සපිරෙන 1924දී ව්‍යවස්ථා දායක සභාවේ මීගමුව දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයා බවට පත්වීමයි. ඔහු ටික කලකින් ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් මන්ත්‍රීවරුන්ගේ ලේකම් පදවියට පත් විය. වසර තුනක් සම්පූර්ණ වූ මන්ත්‍රී දිවියේදී ඩී. එස්.ට තවත් වගකීමක් හිමි විය. එය නම් එවකට සිටි ආණ්ඩුකාරවරයා පත් කළ ඉඩම් කොමිසමේ සාමාජිකයකු වීමයි.

1933 වසරේ ඩී. එස්. ඉදිරිපත් කළ ලංකාවේ ඉඩම් සංවර්ධන පනත රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සම්මත වීමත් සමගම යළිත් මෙරට පැරකුම් යුගයකට පා එසවීය. රජයේ ඉඩම් ජනතාව අතරට පත්වීමේ සුබ මොහොත ආරම්භ කරමින් 1934දී ප්‍රථමයෙන්ම පොළොන්නරුවේ මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරය ආරම්භ කෙරිණි. මේ අයුරින් මිණිපේ, කාගම, බකමූණ, ඇළහැර ගොවි ජනපද බිහිවීමෙන් රටේ ගොවිකමේ නවෝදය පුළුල් වීමට අඩිතාලම වැටුණි. රට පුරා සිටි ඉඩම් නොමැති ජනයා රජරට පදිංචි කරමින් ඔවුන් නව ගොවිකම් ශිෂ්ටාචාරයකට හුරු කිරීම සිදු කරන්නට විය.

1946 සැප්තැම්බර් මහ 06 වැනි දින එක්සත් ජාතික පක්ෂය පිහිටුවා 1947 වසරේ පැවති ලංකාවේ ප්‍රථම මැතිවරණයට තරග වැදුණු ඩී. එස්. මැතිවරණයෙන් ජයගෙන 1947 සැප්තැම්බර් මස 24 වැනි දින මෙරට ප්‍රථම අගමැතිවරයා වශයෙන් දිවුරුම් දුන්නේය. එයින් පසු ඔක්තෝම්බර් මස 08 වැනි දින මෙරට ප්‍රථම ඇමැති මණ්ඩල රැස්වීම පැවැත්වූ අතර, 1947 නොවැම්බර් මස 21 වැනිදා ශ්‍රී ලංකාවේ නිදහස් පනත පාර්ලිමේන්තුවේ සම්මත කරවා 1948 පෙබරවාරි මස 04 වැනි දින ලංකාවට නිදහස උරුම කර දුන්නේ ජාතියේ පියා යන විරුදාවලිය ලබමිනි.

ඩී. එස්. බිහි කළ බොහෝ දේ අතරින් අද අපි රටක්, ජාතියක් වශයෙන් එළිය දකිමු. ඔහු අපට පෙන්වා දුන් ගමන් මග අමතක කිරීම නිසා රටට ඇති වූ අඳුරු දිශා අපමණය. මෙරට සංවර්ධනය කළ හැක්කේ එක්සත් ජාතියක් ලෙස සියලු දෙනාම නැඟී සිටියහොත් බව ඔහු සිය දේශපාලන දර්ශනයෙන් අපට කියා දුන්නේය. එය අමතක කර බෙදුණු දේශයකට රට යොමු කළේ මෙරට පැටව් ගසා ඇති පටු දේශපාලන සංකල්පයි. වැටුණු දේශය යළි ගොඩනැඟීමට හැකි දර්ශනය ඔහු ගොඩනැඟූ එක්සත් ජාතික පක්ෂයේ තවමත් ඉතිරිව ඇත. ඩී. එස්. ගොඩනැඟූ අපරිමිත දේශපාලන ශක්තිය එක්සත් ජාතික පක්ෂය වනු ඇත. එය සුරක්ෂිත කර පවත්වාගෙන යෑම ඩී. එස්. ට සිදු කරන උපහාරයකි.

අදට (22) දිවංගත වී වසර 69ක් සපිරෙන නිදහස් ලංකාවේ නිර්මාතෘ ඩී. එස්. සේනානායක ශ්‍රී නාමය සදා සමරමු.

**වජිර අබේවර්ධන**
**එක්සත් ජාතික පක්ෂයේ සභාපති,**
**හිටපු ඇමැති**

## පොලිස් විරු සමරුව හැටන් ක්‍රීඩා පිටියේදී

**හැටන් මධ්‍යම විශේෂ**

ශ්‍රී ලංකා පොලිසියේ 157 වන පොලිස් විරු සැමරුම හැටන් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි විජිත ද අල්විස් මහතාගේ ප්‍රධානත්වයෙන් පෙරේදා (21) හැටන් පොලිස් ක්‍රීඩා පිටියේදී පැවැත්විණි.

1864 මාර්තු මස 21 වැනි දින මුම්මලේ මරික්කාර් නැමති සැකකරුවකු අත්අඩංගුවට ගැනීමට යෑමේදී පොලිස් කොස්තාපල් සජාන් නැමති නිලධාරියා මිය යෑමත් සමඟ එතැන් සිට පොලිස් විරු සැමරුම් දිනය ආරම්භ වු බවත්, එතැන් සිට මේ දක්වා රටේ සාමය ආරක්ෂා කිරීමට පොලිස් විරුවන් 3137 දෙනකු දිවි පුදා ඇති බවත්, තවත් පිරිසක් ආබාධිත තත්ත්වයට පත්ව ඇති බවත් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා වැඩිදුරටත් පැවැසීය.

හැටන් සහකාර පොලිස් අධිකාරි රසික රත්නායක, හැටන් වැඩ බලන මුලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ඊ. ඒ. පී. එස්. වීරසේකර, හැටන් පොලිස් කොට්ඨාසයේ වටවල, ගිනිගත්හේන, නෝර්ටන්, මස්කෙළිය, නල්ලතන්නිය, නොර්වුඩ්, බගවන්තලාව පොලිස් ස්ථානවල ස්ථානාධිපතිවරුන් ඇතුළු මිය ගිය පොලිස් විරුවන්ගේ ඥාතීහු ද, ආබාධිත පොලිස් විරුවෝ ද මේ අවස්ථාවට සහභාගි වූහ.

මියගිය පොලිස් විරුවන්ට පුෂ්පෝපහාර දැක්වීම ද සිදු විය.

## ඕමන්තේ ස්ථාන දෙකක තිබී අත් බෝම්බ 2ක්-සමඟ ජොනී බට්ටෝ සොයා ගැනේ

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

වවුනියාවේ ඕමන්ත ප්‍රදේශයේ ස්ථාන දෙකක තිබී අත් බෝම්බ දෙකක් හා ජොනී වර්ගයේ බෝම්බයක් (බට්ටන් ) ආරක්ෂක අංශ විසින් පසුගියදා (20) සොයා ගෙන තිබේ.

වවුනියාවේ ඕමන්ත ගෝමරසන්කුලම ප්‍රදේශයේ ගම්වැසියකු විසින් සිය ඉඩම සුද්ධ පවිත්‍ර කිරීමේදී අත් බෝම්බය හමුවී ඇති අතර, ඒ පිළිබඳව පොලිසිය දැනුම්වත් කිරීමෙන් පසුව අත් බෝම්බය ගොඩගෙන තිබේ.

මේ බෝම්බ ඕමන්ත පොලිසියට භාරදීමෙන් පසුව ඒවා නිෂ්ක්‍රීය කිරීමට අධිකරණ නියෝගයක් ගැනීමට ඕමන්ත පොලිසිය පියවර ගෙන තිබේ.

## ආරවුල විසඳීමට ගිය පොලිස් නිලධාරියාට පහර දුන් සොයුරන් දෙදෙනා සොයා පරීක්ෂණ

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

යාපනය තිරුනගර් ප්‍රදේශයේදී පෙරේදා (21) දහවල් පොලිස් නිලධාරියකුට පහරදී පලා ගිය සහෝදරයන් දෙදෙනකු අත්අඩංගුවට ගැනීමට යාපනය පොලිසිය පරීක්ෂණ ආරම්භ කර තිබේ.

යාපනය තිරුනගර් ප්‍රදේශයේදී පවුල් දෙකක් අතර ආරවුලක් ඇති වූ අවස්ථාවේදී ඒ පිළිබඳව අසල අයකු 119 දුරකතන අංකයට දැනුම් දීමෙන් පසුව පොලිස් නිලධාරියකු සිද්ධිය විමර්ශනය කිරීමට එම ස්ථානයට ගොස් තිබේ.

මේ අවස්ථාවේදී ආරවුල ඇති කර ගත් පවුලේ සහෝදරයන් දෙදෙනකු පොලිස් නිලධාරියාට පහරදී පලා ගොස් තිබේ. තුවාල ලබා ඇති පොලිස් නිලධාරියා ප්‍රතිකාර සඳහා යාපනය ශික්ෂණ රෝහලට ඇතුළත් කර ඇති අතර, යාපනය පොලිසිය සැකකරුවන් දෙදෙනා අත්අඩංගුවට ගැනීමට පරීක්ෂණ ආරම්භ කර තිබේ.

# MARKET PRICE

## කොවිඩ්වලින් රැකෙන්න
## කැන්ගරු කැබ්ස් වෙතින් ආරක්ෂිත ක්‍රම රැසක්



වසර 33ක කාලයක් පුරා ශ්‍රී ලාංකීය ජනතාවගේ විශ්වාසය ඉහළින්ම දිනූ මෙරට ප්‍රමුඛතම කැබ් රථ සේවා සැපයුම් සමාගම වන කැන්ගරු කැබ්ස් පෞද්ගලික සමාගම සිය පාරිභෝගික ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳ ඉහළම අවධානය යොමු කරමින් ශරීර උෂ්ණත්ව මාපකයක් සහ විෂබීජ නාශක දියර බෝතල් සිය සමාගමේ ලියාපදිංචි සෑම රියැදුරකුටම දීමට කටයුතු කර තිබේ. කොවිඩ් 19 රෝගයෙන් සිය පාරිභෝගික ජනතාව ආරක්ෂා කර ගැනීම උදෙසා මේ පියවර ගෙන ඇත.

කැන්ගරු කැබ්ස් රියැදුරන් සෞඛ්‍ය උපදෙස් ඉතා ඉහළින්ම අනුගමනය කරන අතර සිය වටිනා පාරිභෝගිකයන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳ නිරන්තරයෙන් ඉහළ අවධානයක් යොමු කරති. සෑම පාරිභෝගිකයකුගේම ශරීර උෂ්ණත්වය මැන බැලීමෙන් පසුව ඔවුන්ව රථයට නංවා ගෙන ප්‍රවාහන අවශ්‍යතා ඉටු කර දීමටත්, සෑම ගමනාන්තයකටම පෙර රියැදුරු මහතාගේ හා පාරිභෝගිකයන්ගේ දෑත් විෂබීජ නාශක දියර යොදා පිරිසිදු කර ගැනීමටත්, නිසි පරිදි මුහුණු ආවරණ පැලඳ සිටීමටත් කැන්ගරු කැබ්ස් රියැදුරන් කටයුතු කරන අතර එමගින් කැන්ගරු කැබ්ස් භාවිත කරන පාරිභෝගිකයන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව මනාව තහවුරු කර ගනු ලැබේ.

## කැලණි කේබල්ස් සමාගම
## සම්මාන 2කින් පිදුම් ලබයි



ශ්‍රී ලංකාවේ අංක 1 ආරක්ෂිත විදුලි රැහැන් වෙළෙඳනාමය වන කැලණි කේබල්ස් PLC සමාගම පසුගියදා පැවති 19වැනි SLIM Brand Excellence-2020 සම්මාන උලෙළේදී Restart Sri Lanka Resilience Award සම්මානය හා අන්තර් ව්‍යාපාරකරණය වෙනුවෙන් පිරිනමන B2B Brand of the Year අංශයෙහි සම්මානයක් දිනා ගැනීමට සමත් විය. ශ්‍රී ලංකාවේ සන්නාම විශිෂ්ටත්වය ඇගයීමට ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය විසින් (SLIM) විසින් වාර්ෂිකව සංවිධාන කරන මේ සම්මාන උලෙළ කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ශාලාවේදී පසුගියදා පැවැත්විණ. කැලණි කේබල්ස් සමාගම මෙවර සම්මාන උලෙළේදී සම්මානයට පාත්‍ර වූ අන්තර් ව්‍යාපාරකරණය වෙනුවෙන් පිරිනමන B2B Brand of the Year සම්මානය පෙර පැවති SLIM Brand Excellence සම්මාන උලෙළවලදීද සම්මානයට පාත්‍රව තිබේ.

මෙවර පැවති SLIM Brand Excellence-2020 සම්මාන උලෙළේදී පමණක් විශේෂයෙන්ම තිළිණ කළ Restart Sri Lanka Resilience Award සම්මානය කොවිඩ් වසංගත සමයේ මෙරට සමාගම් සාර්ථකත්වයට පත්වීමට අනුගමනය කළ ක්‍රියා පරිපාටිය සැලකිල්ලට ගනිමින් පිරිනැමූවකි. එම විශේෂ සම්මානයෙහි කැලණි කේබල්ස් සමාගමට හිමි වූයේ මහා පරිමාණ සමාගම් පාරිභෝගික භාණ්ඩ (Fast Moving Consumer Goods Sector) අංශය වෙනුවෙනි.

## අගය එකතු කළ
## හොඳම අපනයනකරු රන්ක්‍රිස්ප් කැෂූ



අගය එකතු කළ කජු නිෂ්පාදනයෙහි පෙරළිකාර පුරෝගාමියා වන රන්ක්‍රිස්ප් කැෂූ ජාතික අපනයන මණ්ඩලය සංවිධානය කළ NCE අපනයන සම්මාන උලෙළේදී අගය එකතු කළ හොඳම අපනයනකරුවා සම්මානයෙන් සහ නැවුම් හා සැකසූ කෘෂි අපනයන අංශයේ රිදී සම්මානයෙන් පිදුම් ලැබීය. සම්මාන රාත්‍රිය කොළඹ ෂැන්ග්‍රිලා හෝටලයේදී උත්කර්ෂවත් ලෙස පැවැත්විණි. "අගය එකතු කිරීමේ පුරෝගාමීන් ලෙස කළ කැප කිරීමට නිසි පිළිගැනීමක් ලැබීම සතුටක්. මාගේ කාර්ය මණ්ඩලයටත්, ගනුදෙනුකාර භවතුන්ටත් කෘතඥතාව පුද කරන අතරම කජු කර්මාන්තයට මුලින්ම අගයක් එකතු කරමින් රන්ක්‍රිස්ප් ව්‍යාපාරය ඇරැඹූ මගේ පියා, ඊඩන් තමෙල් මහතාවත් ආදරයෙන් සිහිපත් කරනවා" රන්ක්‍රිස්ප් කැෂූ කළමනාකරණ අධ්‍යක්ෂ සමන්ත තමෙල් මහතා පැවසීය.

කජුවල ස්වභාවික නැවුම් රසය සුරකිමින් උසස්ම තත්ත්වයේ පිරිසිදු දේශීය කජු අගය එකතු කළ විවිධ ඇසුරුම් ඔස්සේ ඉදිරිපත් කරන රන්ක්‍රිස්ප් කැෂූ අල, මඤ්ඤොක්කා, කිරිඅල, කොස් ආදී චිප්ස් වර්ග සහ පලතුරු යුෂ, පල්ප්, වියළි පලතුරු හා එළවළු ආදී සැකසූ ආහාර රැසක් නිපදවයි. ආහාර නිෂ්පාදන සමාගම් රැසකට පලතුරු යුෂ, පල්ප් ආදිය සැපයීමද රන්ක්‍රිස්ප් කැෂූහි විශේෂත්වයකි. "දේශීය නිෂ්පාදකයන්ට අන්තර්ජාතික වෙළෙඳපොළ

ජය ගැනීම සඳහා වටිනාකම් එකතු කිරීම අත්‍යවශ්‍යයි. එයින් වැඩි ලාභයක් උපයා ගත හැකියි. අන්තර්ජාතික වෙළෙඳ ප්‍රදර්ශනවලට නිපැයුම් ඉදිරිපත් කිරීමේදී අපේ සමාගම් මෙන්ම රටත් නියෝජනය වන බව සිහි තබා ගත යුතුයි." රන්ක්‍රිස්ප් අපනයන හා අලෙවි ප්‍රධානි හර්ෂ වික්‍රමරත්න මහතා පැවසීය. ISO 22000, HACCP සහ GMP යන තත්ත්ව සහතික ලබා ඇති රන්ක්‍රිස්ප් කැෂූ නිපැයුම් අමෙරිකාව, බ්‍රිතාන්‍යය, ජපානය, ඕස්ට්‍රේලියාව හා මැදපෙරදිග ඇතුළු රටවල් රැසකට අපනයනය කරයි. දිවයිනේ සුපිරි වෙළෙඳසලවලින් හා සමාගමේ අලෙවිසල් 21කින් රන්ක්‍රිස්ප් කැෂූ නිෂ්පාදන මිලට ගත හැකිය.

## පීපල්ස් ලීසිං අලෙවි කුටියක්
## මාලඹේ Family Cars පරිශ්‍රයට



ශ්‍රී ලංකාවේ බැංකු නොවන ප්‍රමුඛතම මූල්‍ය සමාගම වන පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් සමාගම මාලඹේ පිහිටි Family Cars පරිශ්‍රයේ ගනුදෙනුකරුවන්ගේ පහසුව වෙනුවෙන් අලෙවි කුටියක් විවෘත කෙරුණි. කඩුවෙල-මාලඹේ මාර්ගයට මුහුණලා පිහිටි මේ Family Cars ආයතනයෙහි මෝටර්රථ අලෙවි පරිශ්‍රයට අමතරව නව අලෙවි පරිශ්‍රයක් එහි ඉදිරිපිට පසුගියදා විවෘත කළ අතර එම පරිශ්‍රයෙන් වාහන 125කට වැඩි සංඛ්‍යාවකට ඉඩකඩ පවතින දැවැන්ත මෝටර් රථ ප්‍රදර්ශන පරිශ්‍රයකි. පීපල්ස් ලීසිං සමාගම එහි අලෙවි සම්බන්ධීකරණ කුටියක් ඇරඹීමත් සමඟ වාහන මිල දී ගන්නා පාරිභෝගිකයන්ට අපහසුවකින් තොරව එම සමාගමේ සුවිශේෂී මූල්‍ය පහසුකම් දැන් ලබා ගත හැක.

මාලඹේ Family Cars පරිශ්‍රයේ පීපල්ස් ලීසිං සමාගමේ අලෙවි සම්බන්ධීකරණ කුටිය විවෘත කිරීමේ අවස්ථාවට සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි/ සාමාන්‍යාධිකාරි, ෂමින්ද්‍ර මර්සිලින්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ලයනල් ප්‍රනාන්දු, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අලෙවි) ලක්සඳ ගුණවර්ධන, ප්‍රධාන කළමනාකරු, වජිර රාමනායක යන මහත්වරු ඇතුළු පිරිසක් සහභාගි වූහ.




| | නාරාහේන්පිට ආ. ම. | රත්මලාන ආ. ම. | වැලිසර. ආ. ම. | මීගොඩ ආ. ම. | තඹුත්තේගම ආ. ම. | දඹුල්ල ආ. ම. | නුවරඑළිය ආ. ම. | මිල රුපියල් |
|---|---|---|---|---|---|---|---|---|
| පහත රට එළවළු | සිල්ලර මිල රු. | සිල්ලර මිල රු. | සිල්ලර මිල රු. | තොග මිල රු. | තොග මිල රු. | තොග මිල රු | | තොග මිල රු. |
| වට්ටක්කා | 120 | 140 | 70 | 70 | 50-60 | 80 | ගෝවා | 100 |
| අළු කෙසෙල් | 120 | 130 | 70 | 70 | - | 70-80 | කැරට් | 130 |
| පිපිඤ්ඤා | 80 | 110 | 40 | 50 | - | 25-35 | ලීක්ස් | 60 |
| වැටකොළු | 180 | 190 | 90 | 130 | 120 | 100 | රාබු | 60 |
| බණ්ඩක්කා | 140 | 140 | 40 | 130 | 50-70 | 80-90 | බීට්රූට් | 60 |
| කරවිල | 200 | 200 | 80 | 80 | - | 120-130 | අර්තාපල් | 80 |
| පතෝල | 120 | 140 | 80 | 100 | 60 | 75-80 | අර්තාපල් රතු | 90 |
| මාළු මිරිස් | 300 | 280 | 240 | 300 | 110 | - | නෝකෝල් | 115 |
| බටානා | 140 | 150 | - | 90 | - | 90-100 | බෙල්පෙපර් රතු | 900 |
| මුරුංගා | 500 | - | - | - | - | 250 | කහ | 1000 |
| එළබටු | 120 | - | 80 | 62-70 | - | - | කොළ | 500 |
| කැකිරි | 100 | 120 | 50 | 60 | - | 50-60 | බැසිල් | 330 |
| නෝකෝල් | 140 | 170 | 90 | 110 | 30-40 | - | චයිනීස් කැබේජ් | 170 |
| මඤ්ඤොක්කා | 80 | 100 | 50 | - | 50-40 | 25-30 | රෙඩ් කැබේජ් | 800 |
| බතල | 100 | - | 100 | - | 40 | 100 | සැල්දිරි | 240 |
| දඹල | 120 | 130 | 80 | 100 | - | 40 | කොත්තමල්ලි කොළ | 400 |
| මැකරල් | 120 | 170 | - | - | 50-60 | 40 | අයිස්බර්ග් | 300 |
| **උඩරට එළවළු** | | | | | | | සලාද | 80 |
| බෝංචි | 220 | 220 | 190 | - | 270 | 170-200 | රතුසලාද | 550 |
| ගෝවා ගෙඩි | 160 | 170 | 120 | 210 | - | 80-90 | මිංචි | 170 |
| කැරට් | 200 | 220 | 170 | 140 | 140 | - | පාස්ලි | 550 |
| ලීක්ස් | 120 | 130 | 100 | 80 | 75-100 | 80-85 | රූබා | 170 |
| රාබු | 120 | 100 | 40 | 80 | - | 25-30 | රෝස්මරි | 700 |
| තක්කාලි | 140 | 200 | 90 | 200 | 60-70 | - | බ්‍රොකෝලි | 1100 |
| බීට්රූට් | 140 | 150 | 95 | 90 | 120 | 70-85 | මල්ගෝවා | 850 |
| සලාද | 300 | 210 | 150 | 200 | 200 | - | රතුරාබු | 450 |
| ගෝවා කොළ | 160 | - | 100 | - | - | - | පැචර්ලි | 120 |
| **පලතුරු** | | | | | | | සුකිනි | 330 |
| අන්නාසි | 110 | 150 | 120 | 110 | 100-120 | 80-100 | කහ සුකිනි | 330 |
| ඇඹුල් කෙසෙල් | 120 | 110 | 180 | 70 | - | - | දිගරාබු | 100 |
| කෝලිකුට්ටු | 220 | 200 | 160 | 160 | 130-160 | 150-160 | තක්කාලි | 90 |
| සීනි කෙසෙල් | 130 | 150 | 80 | 70 | 30-60 | 65-70 | මාළුමිරිස් | 270 |
| ඇඹුල් | 220 | 190 | 140 | - | 130-150 | - | | - |
| ගස් ලබු (රෙඩ්ලේඩි) | - | 100 | 150 | - | - | - | | - |
| ගස් ලබු | 160 | 120 | - | 130 | - | 85-95 | | - |
| ඇපල් (ආනයනික) | 60-80 | 220 | - | - | 90-120 | - | | - |
| මිදි (දේශීය) | - | - | - | - | - | - | | - |
| මිදි (ආනයනික රතු) | 1100 | 1200 | - | - | - | - | | - |
| මිදි (ආනයනික කොළ) | 1000 | 1200 | - | - | - | - | | - |
| **මස්** | | | | | | | | |
| කුකුළු මස්- අලුත් (සම රහිත) | 580-630 | 590 | 650 | - | 420 | - | | - |
| කුකුළු මස් - ශීත කළ (සම සහිත) | 430-480 | 430 | 550 | - | - | - | | - |
| **අනෙකුත්** | | | | | | | | |
| අමු මිරිස් | 280 | 290 | 90 | - | - | - | | |
| දෙහි | 160 | 190 | 200 | - | - | 60-70 | | |
| අමු ඉඟුරු | 300 | 320 | 170 | - | - | 160 | | |
| **සහල්** | | | | | | | | |
| රතු නාඩු | 96-110 | 110 | 106 | - | - | - | | |
| සුදු නාඩු | 96-105 | 105 | 106 | 90-92 | - | 95 | | |
| රතු කැකුළු | 98-100 | 98 | 95 | 90-92 | - | - | | |
| සුදු කැකුළු | 98-105 | 100 | 92 | 98 | - | | | |
| සුදු කැකුළු සම්බා | 98-125 | 135 | 120 | 116 | - | - | | |
| තම්බපු කැකුළු සම්බා | 98-125 | - | 120 | 98 | - | 122 | | |
| කිරි සම්බා | 125-165 | 170 | 160 | - | - | - | | |



දැණගෙණ ගණ්ණ
රන් මිල

| |
|---|
| කැරට් 21 - 91,437 |
| කැරට් 22- 95,791 |
| කැරට් 24- 104500 |

2021 මාර්තු 22 සඳුදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

දිනමිණ

LOADING

කාලතුරයේ ඩිජිටල් දොරටුව


ලෝකය දිනූ අපේ රොබෝ වැඩකරුවෝ — පිටුව 02

සිසුවකු හැදූ සරල සිංහල යතුරු පුවරුව — පිටුව 03

ලොව පැරණිතම ලෝකඩ පරිගණකය — පිටුව 06

අභ්‍යවකාශයේ ඉපදුණා නම් — පිටුව 07


2021 මාර්තු 22



දිනමිණ
ද්වාර
LOADING





# ලෝකය දිනූ අපේ රටේ රොබෝ වැඩකරුවෝ

මිනිස් බුද්ධිය ඉක්මවා අනාගතයේ රොබෝ තාක්ෂණය පැන නගිනු ඇති බවටත් ඒ හරහා රොබෝවන් අනාගතයේදී කෘත්‍රිම බුද්ධිය භාවිත කරමින් මිනිසාව තම යටතට නතු කර ගැනු ඇති බවටත් ලොව පුරා වූ විද්‍යාඥයන්, තාක්ෂණඥයන් අතර අදහස් ඇති වෙමින් තිබෙන්නේ දිගු කාලයකට පටන්ය. එම අදහසට ගැළපෙන අයුරින් විද්‍යා ප්‍රබන්ධ මෙන්ම ඒ හරහා චිත්‍රපට ද බොහෝ නිර්මාණය වී ඇති අතර තව තවත් ඉදිරියේ දී නිර්මාණය වනු ඇත. එහෙත් අලුත් අලුත් දෑ සොයා යෑමේ මිනිසාගේ නොනිමි ආශාව හමුවේ විනාශයේ මුව වෙත වුවද යෑමට මිනිස්සු බිය නොවෙති. දියුණුව මෙන්ම විනාශය ද එකවර ගෙන ආ හැකි තාක්ෂණික දියුණුව අපට පෙනෙන තරමක් නොව ඊට එහා ගිය තාක්ෂණයන් ද ලොව දියුණු යැයි කියාගන්නා හෝ පෙන්වමින් සිටින රටවල් තමන් සතු කරගෙන සිටිතැයි අනාවැකි පළ කරන විද්‍යාඥයෝද සිටිති. ඒවා බොහොමයක් තවත් රටක් විනාශයට පත් කරන අධි තාක්ෂණික අවි යැයි කෙනකුට සැක කළ හැකිය. තවත් රටක සම්පත්, දැනුම එම රටට හොරෙන් ගවේෂණය කළ හැකි තාක්ෂණයක් විය හැකිය. නැතහොත් එම සම්පත් හෝ දැනුම පැහැරගත හැකි තාක්ෂණයක් විය හැකිය. දියුණුවට හෝ විනාශයට මුල පුරන ඒ දැනුම ලොවට සම්පත්ය. ලොව බොහෝ රටවල් ඒ මොළවලට ආයෝජනය කරති; ඒ හරහා රටවල් දියුණුවට මං පාදා ගනිති. අනෙක් රටවල් සීතල යුදවලින් යටත් කර ගනිති.

අතීතයේ නොරට සිහිනවල පවා නොතිබූ තාක්ෂණයක් මේ කුඩා දූපතේ ස්ථාපනය වී තිබිණි. ඒ බව මෙරට ඇති දාගැබ්, ගංගා සහ වැව් මෙන්ම විහාර සංකීර්ණ මෙන්ම රජ මාලිගවලින් ද මනාව විද්‍යමාන වන්නකි. එවන් දැනුම් සම්භාරයක් හෙබි ශ්‍රී ලාංකිකයන් කාලයත් විදෙස් ආක්‍රමණවලටත්, නිදහසින් පසු ඒ ඒ කාලවලදී බලයට පත් පාලකයන් මගිනුත් නොමිලේ කෑමට හුරු පුරුදු කරවූ ජාතියක් බවට පත් වුවත් අතීතයේ සිට පැමිණෙන නොනැසී පවතින හෙළ විරු ජාන මේ මහ පොළොවේ තවමත් පවතින බවට මනාව පසක් වූ සමයක අපි සිටිමු.

ශ්‍රී ලාංකික ඓතිහාසික තාක්ෂණික ජාන තවමත් ක්‍රියාත්මක වන බවට මේ කුඩා දූපත ලෝකය ඉදිරියේ ජයග්‍රාහකයෙක් කිරීමට සමත් වූ නව නිර්මාණ ශිල්පී කණ්ඩායමකට පසුගියදා හැකි විණි. ඒ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ රොබෝ තාක්ෂණික කණ්ඩායමයි. සිංගප්පූරුවේ පැවැති Singapore Autonomous Underwater Vehicle Challenge තරගාවලියේ දී රටවල් රැසක් අබිබවා ඉහළ අවධානයක් දිනා ගැනීමට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ රොබෝ තාක්ෂණික කණ්ඩායමට හැකි විණි.

මෙම තරගාවලියේදී ලැබුණු අභියෝග වූයේ දිය යටදී දෙන අභියෝග හතරක් ජය ගැනීමයි. එහි පළමු අභියෝගය සහ ඉදිරියට තරග කිරීමට සුදුසුකම් හිමිකර ගැනීමේ අවස්ථාව විය. එය දිය යට ලබාදුන් ධාවන පථයක රොබෝවා ගමන් කිරීමයි. පළමු වැනි අභියෝගය ජය ගත්තවුන්ට ලැබුණු දෙවැනි අභියෝගය වූයේ දිය යට ඇති ගේට්ටුවකින් ඇතුළු වීමයි. මෙම අභියෝගයේ දී කිසිදු අයුරකින් රොබෝවා ගේට්ටුවේ ස්පර්ශ නොවිය යුතු විය. තෙවැනි අභියෝගය වූයේ රොබෝවාට එල්ලන ලද බෝලයක් නාන තටාකයේ පතුලේ තබා ඇති බීකනයක් සහිත බේසමකට දැමීමයි. පාට වර්ග තුනක බේසම් පතුලේ තැන්පත් කර තිබූ අතර එහි එක් බේසමක අති ධ්වනි තරංග නිකුත් කරන බීකනයක් තිබිණි. රොබෝවා අදාළ බීකනය හඳුනාගෙන ඔහු සතු බෝලය එම බේසමට දැමිය යුතු විය. හතර වැනි අභියෝගය වූයේ නාන තටාකයේ යම් කිසි තැනක සවිකරන ලද බීකනයක් සහිත කණුව සොයා ගොස් එහි තැන්පත් කර ඇති බෝලය වැට්ටවීමයි. ඉන්පසු තෙවැනි අභියෝගයේ දී බේසමට දැමූ බෝලය නැවත රැගෙන මතු පිටට ආ යුතුය. මෙම අභියෝග හතරම පහසුවෙන් ජය ගැනීමට ශ්‍රී ලංකාව නියෝජනය කළ රොබෝවාට හැකි විණි.

එම අභියෝග ජයගත හැකි රොබෝවකු නිර්මාණය කිරීම අදාළ කණ්ඩායම්වල කාර්යය විණි. ඒ සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාල කණ්ඩායම දිගු කාලයක සිට උත්සාහ කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස අදාළ අභියෝග ජය ගැනීමට හැකි දිය යට ගමන් කළ හැකි සහ රැඳී සිටිය හැකි රොබෝවෙක් නිර්මාණය කෙරිණි. ඩ්‍රෝන යානයක හැඩැති මෙම රොබෝවාට ක්‍රියා කරවිය හැකි රොබෝ හස්තයක් ද එක් කර තිබිණි. විශේෂයෙන්ම මෙම රොබෝ ස්වයංක්‍රීයව ක්‍රියා කිරීම විශේෂත්වයකි. ජලය යට දී අදාළ ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා ඔහුට රොබෝ හස්තයක් ද හඳුනා ගැනීම සඳහා ජලයට ඔරොත්තු දෙන කැමරාවක් ද සවි කිරීමට පේරාදෙණිය රොබෝ කණ්ඩායම කටයුතු කර තිබිණි.

ප්‍රමෝද් සඳරුවන්ගේ කණ්ඩායම් නායකත්වයෙන් රංග දයාවංශ, දිමුතු එරංග, කවිඳු සසංක, චමීර ප්‍රේමසිරි, තරිඳු කරුණාතිලක සහ හසිත බණ්ඩාර මෙම කණ්ඩායමේ සාමාජිකයෝ වූහ.

සිය ජයග්‍රහණය ගැන මෙන්ම මෙම රොබෝවාගේ අනාගතය ගැන ද කණ්ඩායමේ නායක ප්‍රමෝද් සඳරුවන් මෙසේ අදහස් දක්වා සිටියේය.



ප්‍රමෝද් සඳරුවන්

“මෙම රොබෝවා අප කණ්ඩායමේ වෙහෙස මහන්සියේ ප්‍රතිඵලයක්. එම මහන්සියේ ප්‍රතිඵලය අප නෙළා ගෙන තියෙනවා. මෙම රොබෝවා ඉහත අභියෝගවලට පමණක් නිර්මාණය කළත් එය වෙනත් සංකීර්ණ කාර්යයන් සඳහා වැඩි දියුණු කළ හැකි වෙතැයි අප බලාපෙරොත්තු වෙනවා. විශේෂයෙන්ම ගංගා සහ මුහුද යට කාර්යයන් සඳහා මෙය යොදා ගත හැකි ආකාරයෙන් වැඩි දියුණු කළ හැකියි. මුහුදු යට ගවේෂණ, මුහුදු යාත්‍රා අලුත්වැඩියාව වැනි භාරධූර කාර්යයන් සඳහා රොබෝ යන්ත්‍රයට නවීන තාක්ෂණය එක් කර භාවිතයට ගත හැකියි. එසේම මෙය ස්වයංක්‍රීයව ක්‍රියා කරන අතරම ඩ්‍රෝන යානාවක් මෙන් මුහුදේ කිමිදී ගමන් කළ හැකිවා සේම ඕනෑම ස්ථානයක ස්ථාවරව නැවතී සිටිය හැකියි. තවද මුහුදේ ගැඹුරටම ගමන් කළ හැකි අයුරින් මෙහි පිටත ආවරණය සකස් කළ හැකි ද වනවා. කොරෝනා වසංගතය හේතුවෙන් විශ්වවිද්‍යාලයේ විද්‍යාගාර සහ ඒ සම්පත් භාවිත කිරීමට නොහැකි වීම නිසා අපේ වැඩිදුර පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ඇන හිට තිබෙනවා. එහෙත් ඉදිරියේ දී මේ රොබෝවාට නවීන තාක්ෂණික අංග සහ මෘදුකාංග වැඩිදියුණු කොට වැඩි වැඩ කොටසක් කිරීමට හැකි අයුරින් නිර්මාණය කිරීමට අප සැලැසුම් කර තිබෙනවා.“

ප්‍රමෝද් ඇතුළු කණ්ඩායම 2019 වසරේ නොවැම්බර් මස චීනයේ පැවැති China International Agricultural Machinery Exhibition (#CIAME) සමඟ පැවති China Agricultural Robot Competition සඳහා ද සිය නිර්මාණයක් ඉදිරිපත් කළේය.

මෙම තරගාවලියේ දී ලැබුණු අභියෝගය වූයේ තැනින් තැන සිටුවා ඇති කුඩා ගස් හයක එල්ලා ඇති රතු සහ කොළ පාට ටේබල් ටෙනිස් බෝල අතුරින් රතු පාට බෝල පමණක් හඳුනාගෙන බිමට නොවැටෙන සේ එම බෝල රැස් කර ගැනීමයි. ඉන්පසුව එම බෝල ඔවුන් නියම කරන ස්ථානය වෙත ගෙන ගොස් තැන්පත් කළ යුතුය. මේ සඳහා ඔවුන්ගේ කණ්ඩායම විසින් රොබෝවන් දෙදෙනකු භාවිත කළ අතර මෙම තරගයේ දී කිසිදු අයුරකින් අදාළ රතු බෝල බිම නොවැටෙන අයුරින් ගබඩා වෙත ගෙන යෑම දක්වා කටයුතු කළ යුතුය. මෙම තරගාවලියේදී ශ්‍රී ලංකා කණ්ඩායමට දෙවැනි ස්ථානයත් කාර්යක්ෂම කණ්ඩායමට හිමි සම්මානයත් දිනා ගැනීමට සමත් විය.

ගස්වලින් ගෙඩි කඩන රොබෝවට ගසේ එල්ලා ඇති බෝල කඩා ගත හැකි ආකාරයේ හස්තයක් ද එසේ කඩා ගන්නා බෝල ගබඩා කිරීමට තැටියක් ද එක් කර තිබුණු අතර අදාළ ගස් හඳුනා ගැනීමට අධිතාක්ෂණික කැමරාවක් ද සවි කර තිබිණි.

මෙම රොබෝ යන්ත්‍රයද අනාගතයේ කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිත කළ හැකි අයුරින් වැඩි දියුණු කළ හැකි බව ප්‍රමෝද්ගේ අදහසයි. තරගයේ දී මෘදු මතුපිටක් මත ගමන් කළත් සැබෑ ගොවි බිමක ඇති රළු පොළොවේ ගමන් කළ හැකි ආකාරයෙන් සහ එලදාව හඳුනාගත හැකි ආකාරයෙන් සහ ආරක්ෂාකාරී අයුරින් එල නෙළා ගත හැකි අයුරින් මෙම රොබෝවා වැඩිදියුණු කළ හැකි බවත් ප්‍රමෝද්ගේ අදහසයි.

සිය කණ්ඩායමේ සාමාජිකයන් මෙන්ම විශ්වවිද්‍යාලයේ ආචාර්ය එම්.පී.බී. ඒකනායක, ආචාර්ය ඩබ්.ඒ.එන්. හරිශ්චන්ද්‍ර, මහාචාර්ය එල්. සමරනායක සහ ආචාර්ය ඩී.එච්.එස්. මෛත්‍රීපාල යන ආචාර්යවරුන් ද ප්‍රමෝද් ඇතුළු කණ්ඩායමේ කටයුතු සඳහා නොමඳ සහායක් දක්වා ඇත. ඒ සැමට ප්‍රමෝද ඇතුළු කණ්ඩායම ස්තුතිය පුද කර සිටින අතරම තම දැනුම අනාගතයේ දී මෙරටට දියුණුවට යොදා ගැනීමටත් තව තවත් පර්යේෂණ කටයුතුවල නියැළෙමින් තාක්ෂණයෙන් ශ්‍රී ලංකාව අන්තර්ජාතික වෙළෙඳපොළට ගෙන යෑමත් තම අරමුණ බව හෙතෙම වැඩි දුරටත් සඳහන් කර සිටියේය.

**පී.කේ. බණ්ඩාර**



**‘ද්වාර’ යනු විද්‍යා-තාක්ෂණ ලිපි අන්තර්ගත අතිරේකයකි. නව නිපැයුම් පිළිබඳ හඳුන්වා දීම මෙන්ම කාලීන විද්‍යා-තාක්ෂණ තොරතුරු ඉදිරිපත් කිරීම මෙහිදී විශේෂය. ‘ද්වාර’ අතිරේකයේ විද්‍යා ප්‍රබන්ධයක් ද සතිපතා පළ වේ. මේ අතිරේකයට පාඨක ඔබටත් ලිපි සහ විද්‍යා ප්‍රබන්ධ ලිවිය හැකිය.**

‘ද්වාර’, දිනමිණ, අංකඃ 35, ඩී.ආර්. විජයවර්ධන මාවත, ලේක් හවුස්, කොළඹ 10.
dwara@lakehouse.lk 0112 429 245 / 246

සංස්කරණය
කාංචනා අමිලානි

# මෙරට සිසුවකු හැදූ සරල සිංහල යතුරුපුවරුව

යුනිකේත බිහි වන්නත් ප්‍රථමයේ සිටම පරිගණකය තුළින් සිංහල අකුරු හසුරුවන්නට අපේ ලාංකිකයන් වික්‍රමාන්විතව කටයුතු කරද්දී, මෑත වසරවල ආ දෙවැනි අභියෝගය වූයේ ස්මාර්ට් දුරකතන මඟින් සිංහල යුනිකේත හැසිරවීමයි. ඒ වෙනුවෙන් සිංහල කීබෝඩ් විසඳුම් මෙරටින් මෙන්ම මයික්‍රොසොෆ්ට්, ගූගල් වැනි අන්තර්ජාතික සමාගම්වලින්ම බිහි වුවත්, අන්තර්ජාතික මට්ටමේ ගුණාත්මක බවකින් හා සුමට බවකින් යුත් සාර්ථක නිමැවුමක් ලොවට හඳුන්වා දෙන්නට 19 හැවිරිදි මලිත් දසනායක සිසුවාට හැකි විය.

Gboard, SwiftKey වැනි අන්තර්ජාතික යතුරුපුවරු ශ්‍රී ලංකාවේ සම්මත සිංහල යතුරු පුවරුව වන 'විජේසේකර යතුරුපුවරුව' තවමත් නැති නිසා පරිගණකයෙන් දුරකතනයට පැමිණි අයට ෆොනෙටික් (ශබ්දානුකූල) යතුරු පුවරුවට හුරු වන්නට සිදු විය. මේ ගැටලුව විසඳීමත්, සරල බවින් පිරිපුන් බවත්, SwiftKey තරම් සුමට බවත් එක්තැන් කළ මලිත්ගේ නිර්මාණයට 'ඩ්‍රීම් කීබෝඩ්' ලෙස නම යෙදුණේ මෙරට ජනතාවගේ සිහිනයක් ඉන් සැබෑ කරන නිසා බව නම් නොරහසකි. විජේසේකර සහ ෆොනෙටික් යතුරු පුවරු, අත්වැරදීම්වලින් තොරව ටයිප් කිරීම පහසු කරවන සිංහල ශබ්දකෝෂ වචන, අකුරක් ස්පර්ශ කිරීමෙන් පසු ප්‍රතිචාර දැක්වීමට ගත වන අවම කාලය සමඟ ඉහළ පරිශීලක අත්දැකීමක් (UX), සහ හුදෙක් යතුරුපුවරුවක් වශයෙන් එහි උපරිම කර්තව්‍යය මැනවින් ඉටු කිරීම නිසා මෙය අන්තර්ජාලය පුරා සිටින බොහෝ දෙනකුගේ සිත් ගත්තේය.












## කීබෝඩ් ඇප්

සරල කීබෝඩ් ඇප් එකක අවශ්‍යතාව දැනුණු මලිත් කොරෝනා වසංගතය නිසා නිවෙසේ ගත කරන්නට වූ සමය එවැන්නක් සැකසීම වෙනුවෙන් යොදා ගන්නට තීරණය කළේය. ඉන් තම මෘදුකාංග සංවර්ධන දැනුම වැඩි කර ගැනීමටත් ඔහුට අවශ්‍ය විය. ඇන්ඩ්‍රොයිඩ් ඇප් සැකසීම පිළිබඳ අන්තර්ජාලය හරහාම සොයමින් ස්වයං අධ්‍යයනයක යෙදුණු ඔහුට අවසානයේ විවෘත කේත මෘදුකාංග වැඩිදියුණු කරමින් මෙරටට ගළපෙන නවමු නිර්මාණයක් බිහි කරන්නට හැකි විය. එහෙත් තම නිර්මාණය ජනගත කරන්නේ කෙසේද යන්න පිළිබඳ අවබෝධයක් ඔහුට නොවීය. මේ නිසා, 2020 පෙබරවාරි 16දා ෆේස්බුක් ගෲප් එකක සටහනක් තබමින් ඔහු "මම ලංකාවේ මෙතෙක් නොහදපු මට්ටමට ඇන්ඩ්‍රොයිඩ් සිංහල කීබෝඩ් ඇප් එකක් හැදුවා. සල්ලි බලාගෙන නෙමෙයි හැදුවේ. මම ලංකාවේ මේ වගේ ඇප් ගැන දාන ෆේස්බුක් ගෲප් කිහිපයකට මේක ගැන දාන්න ට්‍රයි කෙරුවා. ඒත් හුඟක් ගෲප්ස්වල ඇඩ්මින්ලා ඒ පෝස්ට් රිජෙක්ට් කරනවා. හේතුව පෝස්ට් එකේ වැරැද්දක් නෙමේ, මට තේරුණ විදිහට මේ ඇප් එක ප්‍රසිද්ධ වෙනවට තියන පෞද්ගලික අකැමැත්ත හින්දා. එයාලා එක්ක කතා කරලා බැලුවත් වැඩක් වුණේ නෑ. මට මේක නොමිලේ මාකට් කරගන්න වෙන ක්‍රමයක් ගැන අදහසක් දෙන්න පුළුවන් ද?"යි ඇසුවේය.

සිදු වූයේ ඔහුවත් නොසිතූ විරූ යමකි. ඔහු දෙන ලද සබැඳියට පිවිසුණු සැවොම එම යතුරුපුවරුව අත්හදා බලා එයට මන බඳින්නට විය. ඔහුගේ එම පෝස්ට් එකට මේ වන විට කමෙන්ට් 730 ඉක්මවා, රියැක්ට් 1,600 ඉක්මවා තිබේ. මසක් ගත වන්නටත් ප්‍රථම Dream Keyboard ඇප් එක ප්ලේ ස්ටෝරුවේ 5000 ඉක්මවා බාගත කරගෙන තිබේ. ඊට 400 ඉක්මවා ඇගයුම් ලැබී ඇති අතර, 4.9ක රේටිං එකක් ද ලබා තිබේ. මෙගාබයිට් 8.7ක් තරම් කුඩා නමුත්, ප්‍රබල කීබෝඩ් වන මෙය පරිශීලක අවශ්‍යතා රැසක් නොමිලේ සහ ඉහළම මට්ටමින් ඉටු කරදීම එහි සාර්ථකත්වයේ රහස විය.

## ඉමෝජි ඉඟි

මේ යතුරුපුවරුවෙන් ලැබෙන පෙනුම ඔබට රිසි ආකාරයෙන් වෙනස් කර ගැනීමට ඩ්‍රීම් කීබෝඩය තුළ කිසිදු බාධාවක් නැත. දී තිබෙන වර්ණ, වර්ණ සංකලන පමණක් නොව ඡායාරූප සහ වීඩියෝ පවා කීබෝඩ් තේමාවට (Theme) ඇතුළත් කර ගත හැකිය. ඊට අමතරව ඔබේ දුරකතනයේ තිබෙන ඡායාරූපයක් වුව එයට එක් කරගත හැකි නිසා ආදරණීයයන්ගේ ඡායාරූපයක් යොදා ගන්නට පමණක් නොව, ග්‍රැෆික් නිර්මාණ හැකියාව ඇති අයකුට තමන්ගේ නිර්මාණශීලීත්වය භාවිත කරන්නටත් උපරිම නිදහසක් ලැබේ.

මෙම නිර්මාණයේ පසුබිම් කථාව දැනගන්නට අපි මලිත් දසනායක සම්බන්ධ කරගතිමු.


මලිත් දසනායක

"ලංකාවේ නිර්මාණය කරපු කීබෝඩ් ඇප් තිබුණත් ඒ එකක්වත් මම බලාපොරොත්තු වුණු ගුණාත්මක මට්ටමේ තිබුණෙ නෑ. මගේ අරමුණ වුණේ සිංහල භාෂාව ටයිප් කරන්න අන්තර්ජාතික මට්ටමේ ගුණාත්මක බවක් තියන කීබෝඩ් ඇප් එකක් නොමිලේම ලංකාවේ පරිශීලකයන්ට ලබා දෙන එක." ඔහු කීවේය.

වෙන්නප්පුවේ වෙසෙන මලිත් උසස් පෙළ විභාගය අවසන් කර, ප්‍රතිඵල එන තෙක් විනෝදාංශයක් වශයෙන් පරිගණක කේතකරණයට යොමු වූවෙකි. ඔහුගේ අනාගත ඉලක්කය වන්නේ, මෘදුකාංග නිර්මාණකරණයට අදාළ රැකියාවක් කිරීමත්. ඉන් පසුව ඔහුගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමත්ය.

ස්පේස් (Space) යතුර මත ඔබාගෙන ඇඟිල්ල චලනය කිරීම මඟින් කර්සරය චලනය කිරීම, බැක්ස්පේස් (Backspace) යතුර මත ඔබාගෙන සිට වමට ඇඟිල්ල චලනය කර වචන මැකීම, වැනි අන්තර්ජාතික කීබෝඩ් ඇප්වල ඇති ගෙස්චර් (Gesture) විශේෂාංග ද ඩ්‍රීම් කීබෝඩයේ අඩංගු කර තිබේ. වේගයෙන් ටයිප් කිරීමට උපකාරී වීම සඳහා වචන සහ ඉමෝජි ඉඟි ඇතුළත් වීම, ස්පේස් (Space) යතුර මත දෙවරක් එබීමෙන් නැවතීමේ තිත ටයිප් කිරීම පමණක් නොව, ඉංග්‍රීසි සහ සිංහල භාෂා දෙකෙන්ම වොයිස් ටයිපිං (කටහඬ භාවිතයෙන් ටයිප් කිරීම) මෙයි අඩංගු කර තිබීම ද විශේෂත්වයකි. කොපි කරගත් දේවල් දැකිය හැකි ක්ලිප්බෝඩ් (Clipboard) එකත්, ටයිප් කළ වචන අතර කර්සරය ගෙන යමින් Undo/Redo කළ හැකි විශේෂාංග දී තිබීමත් මෙය නිතැතින්ම නූතනත්වයෙන් පිරි කීබෝඩ් එකක් බවට ඔසවා තබයි.

## පෞද්ගලිකත්වය

"මේ ඇප් එකේ තියන සියලු පහසුකම් නොමිලේ භාවිත කරන්න පුළුවන්. ඉදිරියටත් නොමිලේම තමා දෙන්නේ. ඒ වගේම මිල අඩු දුරකතනවලත් හොඳින් ක්‍රියාත්මක වන විදිහට අඩු බැටරි, රැම් සහ ස්ටෝරේජ් භාවිතයක් සහිතවයි නිර්මාණය කරලා තියෙන්නෙ." පරිශීලක ඔබ සතු ඕනෑම දුරකතනයකින් උපරිම පහසුවක් විඳීමට අවස්ථාව දීමේ අරමුණ පෙරදැරි කරගත් මලිත් කියයි. දැනට මෙය ඇපල් දුරකතන සඳහා නොතිබුණත්, ඉදිරියේදී 'ඇපල් ඇප් ස්ටෝර්' එකටත් නිර්මාණය කරන්නට බලාපොරොත්තු වන බවයි වැඩි දුරටත් අප සමඟ පැවසුවේ.

කීබෝඩ් ඇප් එකක මීළඟට ඇතිවන ගැටලුව පරිශීලක පෞද්ගලිකත්වයයි. ඒ ගැන අප විමසූ විට "සාමාන්‍යයෙන් ඉහළ මට්ටමේ සමාගම්වල පරිශීලක දත්ත රැස් කරලා ඔවුන්ගේ වෙනත් සේවා දියුණු කරන්න ඒ දත්ත යොදාගන්නවා. මේ ඇප් එකේ පරිශීලකයන්ගෙ කිසිම පෞද්ගලික දත්තයක් මම ගන්නෙ නෑ. ඉදිරියටත් එහෙමයි," කීවේය. ඉදිරියේදී මෙහෙයුම් පද්ධතිය තුළින් එවන් සනාථ කිරීම් ඉදිරිපත් වුවහොත් ඒවාට ද අනුකූල වන ආකාරයෙන් කීබෝඩ් එක හැඩගස්වන බවටත්, අඩුපාඩු ඇතොත් ඇප් එකේ ඇති 'ෆීඩ්බැක්' බොත්තම ක්ලික් කර මැසෙන්ජර් හෝ ඊමේල් මඟින් තමාව සම්බන්ධ කරගන්නා ලෙසත් වැඩි දුරටත් පැවසීය.

**මේ යතුරුපුවරුව ඔබට ප්ලේ ස්ටෝර් එකේ "Dream Keyboard" ලෙස සර්ච් කිරීමෙන් හෝ bit.ly/dream-keyboard යන වෙබ් ලිපිනයට පිවිස නොමිලේ බාගත කර ගත හැකිය.

තඹරු විජේසේකර

# බිත්ති පිරිසුදු කරන ඔටෝ පේන්ටිකරු



තාප්පවල, නිවාස බිත්තිවල විවිධ පුද්ගලයන් විසින් අඳින ලද රූප මෙන්ම අකුරු හේතුවෙන් පරිසරයට ගෙන එන්නේ අවලස්සනකි. එලෙසම එම නිවෙස හෝ තාප්පය අයිතිකරුවන්ට ද මෙවැනි රූප මෙන්ම අකුරු ඇඳ තිබීම ද බාධාවකි. එවැනි රූප මකා දැමීමට නම් නැවතත් සම්පූර්ණයෙන්ම පින්තාරු කිරීම හැර වෙන කිරීමට දෙයක් නැත. විවිධ පුද්ගලයන්ගේ නොමනා ක්‍රියා හේතුවෙන් එලෙස නිතර නිතර තාප්ප හෝ බිත්ති පින්තාරු කිරීමට යෑමෙන් සිදු වන්නේ විශාල මුදල් ප්‍රමාණයක් නිකරුණේ නාස්ති වීමය.

දැන් ඔබට එවැනි ආකාරයෙන් මුදල් නාස්ති කර ගැනීමක් අවශ්‍ය නැති අතර Tornado Acs ඊට හොඳ විසඳුමකි. මෙමඟින් ඔබ තාප්පයේ හෝ බිත්තියේ පින්තාරු කර ඇති මුල් වර්ණයම දෙමින් ඇඳ ඇති වෙනත් දෑ ඉවත් කරන අතර ඉන් පෙර අලංකාර බිත්තියම සුළු වේලාවකදී දැක ගැනීමට හැකිය. පෝස්ටර් ඇලවීමෙන් අවලස්සන වී ඇති තාප්ප, බිත්ති යථා තත්තවයට පත් කර ගැනීමට Tornado Acs ඉටු කර දෙන්නේ ඉමහත් සහායකි. මෙහි කුඩා කොටසක් අදාළ ස්ථානයට තබා තද කිරීමෙන් පිරිසුදු කර ගැනීමේ හැකි අතර මිනිස් ශ්‍රමය ද ඉතිරි කර ගැනීමට හැකිය.





# රත් කර කපන කැටයම් පිහිය



යම් යම් සැරසිලි කිරීමට, මූර්ති නිර්මාණයට, කැටයම් කැපීමට පහසුවෙන්ම භාවිත කළ හැකි ද්‍රව්‍යයක් ලෙස රිජිෆෝම් හැඳින්විය හැකිය. මෙවැනි නිර්මාණයක් සිදු කිරීමට රිජිෆෝම් භාවිත කරන්නේ නම් ඒවා කපා ගැනීමේදී ඉන් ඉවත් වන කොටස් හේතුවෙන් අවට අපවිත්‍ර වීමක් සිදුවේ. hot knife foam cutter kd-5 යනු රිජිෆෝම් කපා ගැනීමේදී අවට පරිසරයට හානියක් නොවන අයුරින් අවශ්‍ය හැඩය නිවැරැදිව කපා ගැනීමට උපකාරී වන උපාංගයකි.

මෙමඟින් තමන්ට අවශ්‍ය අයුරින් හැඩතල මෙන්ම අකුරු ද නිර්මාණය කර ගැනීමට කොටස් පවතින අතර රත් වීම ආධාර කර ගනිමින් කැපීම සිදු වේ. එහෙයින් යම් කොටසක් කපා අවසන් කළ පසු දෙපස දාරය කඩතොලු නොවන අතර, යම් යම් මූර්ති නිර්මාණකරුවන්ට මෙන්ම කැටයම් නිර්මාණකරුන්ට hot knife foam cutter kd-5 බෙහෙවින් උපකාරි වේ.



# උරහිසේ පැළඳි හිම ගිලින යන්ත්‍රය



අප රට දේශගුණික තත්ත්ව අතින් වාසනාවන්ත රටක් ලෙස සැලකිය හැකි වුවද ලොව බොහෝ රටවල ශ්‍රී ලංකාවේ මෙන් වසර පුරාම එකම කාලගුණික තත්ත්වයක් පවතින්නේ නැත. ශීත ඍතුවලදී එම රටවල නිවෙස් තුළට වී කාලය ගත කිරීමට පුරුදුව ඇති අතර බොහෝ දුරට රැකියාවලින් ද නිවාඩු පවා ලැබෙයි. හිම වැටෙන කාලවලදී එරට රජය මඟින් දවසේ කිහිප වතාවක්ම උදෑසනින්ම මාර්ගවල පතිතව ඇති හිම තට්ටු ඉවත් කිරීම සිදු කරයි. මේ සඳහා විශාල වාහන භාවිත කෙරෙන අතර, ගෙවත්තේ තමන්ට අවශ්‍ය ස්ථානයක හිම ඉවත් කර ගැනීමට නම් තමන් විසින්ම විකල්පයක් සොයා ගත යුතුය.

අප රටට මෙවැනි අත්දැකීම් නැති වුවද Air jet shovel හිම වැටෙනා රටවල මිනිසුන්ට ඉතාමත් ප්‍රයෝජනවත්ය. මෙය තණකොළ කපනා මැෂිමක් අයුරින් උරහිසේ පලඳා හිම ඉවත් කිරීම සිදු කළ හැකි අතර එහි සුළං ප්‍රවාහයක් වේගවත්ව දෙමින් හිම තට්ටු ඉවත් කිරීම සිදු කරයි. නිවෙසේ සිට ප්‍රධාන මාර්ගය යන තම වත්ත මැදින් පවතිනා අතුරු මාර්ගය වැනි කොටසක හිම තට්ටු ඉවත් කර ගැනීමට Air jet shovel භාවිත කළ හැකිය.



# සෞඛ්‍ය සේවයේ ඩ්‍රෝන සේවාව



ගුවන් යානාවලින් අනතුරුව, නියමුවන් රහිතව තම එදිනෙදා වැඩකටයුතුවලට, ඔත්තු බැලීමට, මෙහෙයුම්වලට, සේවා සැපයීමට ආදි නොයෙක් වූ කාරණා සඳහා ඩ්‍රෝන යානා භාවිතයට පැමිණි අතර, එය කුඩා කාලයක් තුළදී ශීඝ්‍රයෙන් ලොව පුරා ව්‍යාප්ත විය. ඊට ප්‍රධානතම හේතුවක් ලෙස සැලකිය හැක්කේ ඩ්‍රෝන යානා මඟින් එදිනෙදා කාර්යයන් පහසුවෙන් මෙන්ම ඉතා ඉක්මනින්, සුළු වියදමක් මඟින් කර ගැනීමට හැකි වීමයි. එහෙත් ඇතැම් රටවල මෙවැනි ඩ්‍රෝන යානා අනවශ්‍ය ක්‍රියාවලට යොදා ගැනීමට මිනිසුන් පෙලඹීම හේතුවෙන් තහනමට ද ලක් වී ඇත. අප රට තුළද ඩ්‍රෝන යානා භාවිතයේදී යම් යම් නීති රාමුවලට යටත් වීමට සිදුව ඇත්තේ ද ඩ්‍රෝන යානා මඟින් නීති විරෝධී ක්‍රියා සිදු කිරීමට යොමු වීමයි.

කෙසේ වෙතත් මේ ඩ්‍රෝන තාක්ෂණය අත්‍යවශ්‍ය සේවා සඳහා යොදා ගැනීමට විවිධ රටවල් පෙලඹී තිබේ. ඉන් ප්‍රධානව සෞඛ්‍ය සේවාවන් පෙන්වා දීමේ හැකි අතර ඉන් රෝගීන්ගේ ජීවිත රැක ගැනීමට මනා පිටිවහලක් සැලසේ. Matternet station යනු සෞඛ්‍ය සේවයට විශාල සේවාවක් සපයන ක්‍රියාවලියකි. මේ සඳහා ඩ්‍රෝන යානා භාවිත කරන අතර මින් සුළු වේලාවකදී රෝගීන් විශාල ගණනකගේ ජීවිත රැක ගැනීමට හැකිය.

අප යම් පරීක්ෂණයක් සිදු කිරීමේදී (උදාහරණ-ලේ පරීක්ෂාවක්) උදෑසනම පරීක්ෂණ මධ්‍යස්ථානයට යා යුතු අතර එහිදී පරීක්ෂණයට භාජන වී ප්‍රතිඵල ලබා ගැනීමට සවසට හෝ දින ගණනකින් පැමිණෙන්න යැයි එහි සේවකයන් පවසනු ඇත. ඊට හේතු වනුයේ ඒ පරීක්ෂණය සඳහා ගන්නා ලද රුධිර සාම්පල ආදිය වෙනත් ස්ථානයක පවතිනා පරීක්ෂණාගාරයකට රැගෙන ගොස් ප්‍රතිඵල ගතයුතු වීමයි. නගරයක නම් ඇතැම් විට මෙවැනි ප්‍රතිඵල පැය ගණනකදී ගත හැකි අතර ගම්බද ප්‍රදේශවල එසේ සිදු නොවේ.

මීට ප්‍රධානතම හේතුව වනුයේ එම සාම්පල අදාළ පරීක්ෂණාගාර වෙත රැගෙන යෑමට පවතින ගැටලුවය. ඩ්‍රෝන තාක්ෂණය භාවිතය කර එවලේම පරීක්ෂණාගාරය වෙත සාම්පල යැවීමට Matternet station මඟින් හැකිය. මෘදුකාංගයක් ඔස්සේ පරීක්ෂණාගාරය වෙත සම්බන්ධ වී සාම්පල රැගත් කුඩා පෙට්ටිය ඩ්‍රෝන යානයේ ඇති කොටසට ඇතුළු කළ විට ස්වයංක්‍රීයවම අදාළ ස්ථානයට රැගෙන යන අතර ඊට මිනිසුන්ගේ මැදිහත්වීමක් කෙසේවත් අවශ්‍ය නැත. එහි ප්‍රතිඵල ද සුළු මොහොතකින් රැගෙන නැවතත් ඩ්‍රෝන යානය පැමිණෙන අතර ඇතැම් විට ප්‍රතිඵලය අන්තර්ජාලය මඟින් අදාළ සාම්පල ගත් ස්ථානය වෙතට එවනු ලබයි.

මින් හදිසි රෝගියකුගේ සාම්පල වාර්තාවක් කුඩා කාලයකදී ගැනීමට හැකිවීමෙන් අදහස් වනුයේ වෛද්‍යවරුන්ට රෝගියාගේ ඉදිරි ප්‍රතිකාර ක්‍රම ඉක්මනින් ආරම්භ කිරීමට හැකි බවත් ඉන් රෝගියාගේ ජීවිතය ගැලවෙන බවත්ය. එහෙයින් මේ තාක්ෂණය අද වන විට විවිධ රෝහල්වල මෙන්ම පරීක්ෂණාගාර ද භාවිතයට ගැනීමට පටන් ගෙන ඇත.







# ගස් කපන වීරයා ඔරිගන්

අතීතයේ මිනිසා ගල් ආයුධවලින් පටන්ගෙන යකඩින් තැනූ ආයුධ භාවිතයට පැමිණෙන තුරු ගස් කැපීම ඉතා අපහසු කාර්යක් විය. එලෙසම මෙයට මනා පළපුරුද්දක් ද ඇති අයකු විය යුතු අතර ගසකට නැග අතු කැපීම හෝ විශාල ගස් බිමට හෙළීම එතරම් පහසු නොවීය. පසුකාලීනව තාක්ෂණයේ දියුණුවත් සමඟම විවිධ යන්ත්‍රෝපකරණ භාවිතයට පැමිණි අතර ගස් කපන මැෂින් ද වෙළෙඳපොළට පැමිණීමෙන් අනතුරුව මිනිස් ශ්‍රමය යොදා ගස් කැපීමට තිත තැබිණි. විශාල වෘක්ෂ පවා සුළු මොහොතකින් මේ මැෂින්වලට බිම හෙළීමට ගත වන්නේ කුඩා කාලයකි.

එයද යම් තරමකට අපහසු වූයේ මැෂිම ද රැගෙන ගසට නැඟීමට තිබූ අපහසුතාව හේතුවෙනි. අනෙක ගසට නඟින්නාට ඇති අවදානම ද එක් අතකට භයානක වන අතර ඊට විසඳුමක් ලෙස බිම සිටම තම ජීවිතයට ද ආරක්ෂාවක් සැලසෙන අයුරින් අතු කැපීමට Oregon Ps750 මැෂින් මනා පිටිවහලකි. මෙය මීටර 4ක පමණ දිග වන අතර එවැනි උසක පවතිනා ගස් අතු පහසුවෙන් පහළ සිටම කැපීමට හැකියාව පවතී. තවද එම උස ප්‍රමාණයේ පවතින්නා වූ ඕනෑම ප්‍රමාණයක අත්තක් Oregon Ps750 මඟින් පහසුවෙන් කපා ගැනීමට හැකිය. තම ගෙවත්තේ ගසක අත්තක් කපා ගැනීමට ගස් නඟිනා පුද්ගලයන් සොයා වද වීමට අවශ්‍ය නැති අතර පහසුවෙන් Oregon Ps750 මඟින් ඔබටම එම කාර්යය කර ගැනීමට දැන් හැකියාවක් ඇත.

# බහුකාර්ය ලී කැටයම් ගැජට්



ලී කැටයමක ලස්සන එසේත් නැතිනම් සියුම් බව කොපමණ ද යන්න තීරණය කිරීමේදී එම නිර්මාණය කළ පුද්ගලයාගේ ඉවසීම පිළිබඳ ද අවබෝධයක් ගැනීමට හැකිය. ඊට හේතුව වනුයේ එවැනි කැටයමක් ලීයක සිදු කිරීමේදී කොළයක අඳින චිත්‍රයක් මෙන් පහසු නොවීමය. අතීතයේ පටන් අප රටේ ලීයෙන් විවිධ දස්කම් දක්වමින් සියුම් කැටයම් නිර්මාණය කිරීමට දක්ෂ ශිල්පියෝ බොහෝ සිටියහ. ඊට ද ආවේණික වූ ආයුධ ද තිබුණු අතර වර්තමානය වන විට එම ආයුධ සියල්ල වෙනුවට එක උපකරණයක් භාවිත කිරීමට හැකිය. Kaindl Super Carver ලෙස හඳුන්වන මේ උපාංගය මඟින් වඩු කාර්මිකයන්ගේ, කැටයම් ශිල්පීන්ගේ කාලය මෙන්ම ශ්‍රමය ද වැය කිරීමකින් තොරව නිර්මාණ කළ හැකිය.

Kaindl Super Carver යනු විවිධ තල මාරු කරමින් ලීයක් තමන්ට අවශ්‍ය පරිදි කොටස් ඉවත් කරමින් කපා ගත හැකි උපකරණයකි. එලෙසම ලී කොටයකින් ඔබ කිසිවකු නොසිතන අයුරින් විවිධ හැඩතලවලට නිර්මාණ කළ හැකි අතර අවසානයේ මනා නිමාවකින් යුතු භාණ්ඩයක් මෙන්ම කැටයමක් දැක ගැනීමට ද හැකිය. කෙසේ වෙතත් මේ Kaindl Super Carver උපකරණය පැමිණීමත් සමඟ ලී ආයුධ නිෂ්පාදනය කරන පුද්ගලයන්ගේ ජීවනෝපායට නම් කණකොකා හැඬෙන බවට සැකයක් නැත. ඒ මිනිසුන් ආයුධ විශාල ප්‍රමාණයකින් සිදු කරන වැඩ තනි උපකරණයකින් කර ගැනීමට පවතින්නා වූ දැඩි කැමැත්ත සහ උනන්දුවයි.





Gadget පිටුව

# එළියේ සිට අගුළු ඇරීම



තාක්ෂණයේ දියුණුවත් සමඟ ඊට සමගාමීව ආරක්ෂාවත් වැඩි කර ගැනීමට සිදු වූ අතර, ඊට දියුණු ආරක්ෂක උපකරණ නිර්මාණය කිරීමට ද මිනිසාට සිදු විය. ඉන් සෑම පුද්ගලයකුම වැඩි සැලකිල්ලක් දක්වනුයේ තම නිවෙසේ ආරක්ෂාව පිළිබඳය. ඊට ප්‍රධානතම හේතුව තමන් ජීවිත කාලය පුරාවටම හම්බ කර ගන්නා දේවල් නිවෙසේ තබා තැබීමය. දොර අගුළු අතීතයේ පටන් විවිධ අයුරින් නිර්මාණය කර ඇති අතර අද වන විට ඇඟිලි සලකුණු මෙන්ම මුහුණ පරීක්ෂා කරනා අගුළු ද වෙළෙඳපොළට පැමිණ තිබේ.

smart camera door lock යනු එවැනි දැඩි ආරක්ෂිත දොර අගුළකි. මෙමඟින් නිවෙසේ සිටින පුද්ගලයන්ගේ මුහුණු හඳුනා ගැනීමට හැකි අතර එය ස්මාර්ට් දුරකතනය ඔස්සේ ද සම්බන්ධ වෙමින් නිවෙසට පැමිණෙන අය සමඟ කතාබහ කළ හැකිය. එලෙසම තමන් නිවෙසේ නොසිටින ඕනෑම අවස්ථාවක සිටිනා තැන සිට අවශ්‍ය කෙනකුට දොර විවර කර දීමට ද හැකිය. එලෙසම නිවෙසට යම් කෙනකු හොර රහසේ ඇතුළු වීමට උත්සාහ කරන්නේ නම් එයද සුළු මොහොතකදී තම ස්මාර්ට් දුරකතනය ඔස්සේ දැක ගැනීමට හැකි අතර ආරක්ෂක පියවරක් ගැනීමට හැකිය.



ගයාන් සංජය

දැනමුණ ද්වාර LOADING





# පොලිතීන්වලින් හැදූ ඇඳුම්

පොලිතීන් මඟින් රෙදි නිෂ්පාදනය කිරීම පිළිබඳ පර්යේෂණයක් ඇමෙරිකාවේ මැසචුසෙට් තාක්ෂණ ආයතනයේ විද්‍යාඥයෝ පිරිසක් අත්හදා බලති. තම පර්යේෂණය සාර්ථක ගැනීමට හැකි වූ බව ඔවුහු පෙන්වා දෙති.

භාණ්ඩ ඇසුරුම්, වරක් භාවිතයට ගන්නා බොහෝ බෑග් වර්ග ආදිය නිමවා තිබෙන්නේ පොලිතින්වලිනි. ඒවා භාවිතයෙන් පසු පරිසරයට මුදා හැරේ. මේ ආකාරයෙන් පොලිතින් ගොඩගැසීම පාරිසරික වශයෙන් විශාල ගැටලුවක් වී ඇත. එයට විසඳුමක් හැටියට ඉවත ලන පොලිතීන්වලින් රෙදි නිෂ්පාදනය අත්හදා බැලූ බව පර්යේෂණයට සහභාගී වූ විද්වත්හු පවසති. පොලිතීන් භාවිතයට ගෙන නිපදවූ රෙදි පරිසර හිතකාමීය. එමෙන්ම ඒවා ඉතා ඉහළ විලාසිතාවලින් යුතුය. ඒවා නැවත නැවත පරිහරණය කිරීමේ හැකියාවෙන් ද යුක්තය. එම රෙදි භාවිතයට ගෙන නොයෙක් අන්දමේ ඇඳුම් නිමවාගත හැකි බව මැසචුසෙට් තාක්ෂණ ආයතනයේ ඉංජිනේරු අංශයේ ආචාර්ය ස්වෙට්ලානා බොරිස්කිනා පවසයි.

නව රෙදි විශේෂය නිර්මාණය කරගෙන තිබෙන්නේ පොලිතින්වලින් ගත් තන්තු රෙදි වියන යන්ත්‍රවලට යොමු කිරීමෙනි. එම රෙදි නිසා පරිසරයට වන හානිය වූල්, කපු, ලිනන්, සිල්ක්, නයිලෝන් සහ පොලියෙස්ටර් යන රෙදි වර්ගවලින් පරිසරයට වන හානියට සමාන බව පර්යේෂකයෝ පවසති. නව රෙදි වර්ගය සාමාන්‍ය ජලයෙන් සේදිය හැකි වේ. ඒ අන්දමට නිපදවා ගත් රෙදි භාවිතයට ගනිමින් ක්‍රීඩා ඇඳුම්, බැනියම්, ලෙගින් මසා ගැනීමට පුළුවන් බව අනාවරණය වී තිබේ. එසේම අභ්‍යවකාශ ගමන් සඳහා පරිහරණය කෙරෙන ඇඳුම් කට්ටල නිමවා ගැනීමට ද එම රෙදි විශේෂය කදිම බව තහවුරුව ඇත.

මේ ආකාරයේ රෙදිවලින් නිමවන ලද ඇඳුම් සම්බන්ධයෙන් එක්සත් රාජධානියේ ලීඩ්ස් විශ්වවිද්‍යාලයේ ආචාර්ය මාර්ක් සමර් අදහස් පළ කරයි. පොලිතීන්වල ද්‍රවාංකය සහ ශක්තිය සලකා බැලීමේදී රෙදි නිෂ්පාදනය කිරීම සඳහා පොලිතීන් යොදා ගැනීම සම්බන්ධයෙන් ගැටලුවක් ඇති බව හෙතෙම පවසයි. පොලිතීන්වලට ජලය උරා ගත හැකි වන්නේ ද ඉතා ස්වල්පයකි. පොලිතින් භාවිතයෙන් නිෂ්පාදනය කරන රෙදිවලත් ඉටි ස්වරූපයක් පැවැතිය හැකි බව ආචාර්ය මාර්ක් පෙන්වා දෙයි. එවැනි රෙදි වර්ගයකින් මසා නිම කළ ඇඳුමක් ඇඳ සිටීමට අපහසු තත්ත්වයක් මතුවන්නට ඉඩ ඇති බව ඔහුගේ මතයයි. එවිට එම රෙදි විශේෂය පාරිභෝගිකයා අතර අඩුවෙන් ජනප්‍රිය වනු ඇතැයි හෙතෙම සැක පළ කරයි.

රෙදිපිළි නිෂ්පාදනය හේතුවෙන් පාරිසරික දූෂණය ඉතා තදින් සිදු වන බව පරිසර විද්‍යාඥයෝ පෙන්වා දෙති. එම කර්මාන්තය සඳහා විශාල වශයෙන් ජලය සහ බලශක්තිය අවශ්‍යය. අපද්‍රව්‍ය ටොන් මිලියන ගණනක් එම කර්මාන්තයෙන් පරිසරයට බැහැර කෙරෙන බව ද සඳහන් වේ. පරිසරයට විමෝචනය කෙරෙන හරිත වායුවලින් 5%ත් 10%ත් අතර ප්‍රමාණයක් එකතු වන්නේ රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තයෙනි.



# ලොව පැරණිතම ලෝකඩ පරිගණකය

වසර දෙදහසක් පැරණි සුවිශේෂ උපකරණයක ක්‍රියාකාරීත්වය අනාවරණය කරගන්නට විද්‍යාඥයෝ පිරිසක් සමත් වෙති. මේ උපකරණය ලොව පැරණිතම පරිගණක යන්ත්‍රය හැටියට හඳුන්වා දීමටත් ඔවුහු මැළි නොවෙති. උපකරණය 1901 වසරේදී පමණ ග්‍රීසියෙන් සොයා ගන්නා ලද්දේ රෝම යුගයේ පෞරාණික නෞකාවක සුන්බුන් අතර තිබියදී ය. එය ඇන්ටිකයාතෙරා යන්ත්‍රණය සහිත උපකරණයක් බැව් විද්‍යාඥයෝ පෙන්වා දෙති.

පළමුව කී උපකරණය පණ ගැන්විය හැකි වන්නේ අතෙනි. විද්‍යාඥයන් පවසන අන්දමට මේ උපකරණය භාවිතයට ගෙන තිබෙන්නේ චන්ද්‍රග්‍රහණ, සූර්යග්‍රහණ සහ අවශේෂ අභ්‍යවකාශ ක්‍රියා සම්බන්ධයෙන් අනාවැකි පළ කිරීම සඳහාය. එය තාරකා විද්‍යාත්මක ගණන යන්ත්‍රයක් බැව් විද්‍යාඥයන්ගේ මතයයි. ඒ අනුව එය ලොව ප්‍රථම ඇනලොග් පරිගණක යන්ත්‍රය හැටියටත් හැඳින්වේ. උපකරණය තනා තිබී ඇත්තේ ලෝකඩවලින් බව සනාතව ඇත. යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය පවත්වාගෙන ගොස් තිබෙන්නේ එහි අභ්‍යන්තරයේ තිබූ දැති රෝද පද්ධතියක් ආධාරයෙනි. නෞකා සුන්බුන් අතර තිබී විද්‍යාඥයන් අතට පත්ව තිබෙන්නේ සමස්ත උපකරණයෙන් තුනෙන් එකකට ආසන්න කොටසකි. සම්පූර්ණ උපකරණයේ නිමාව කවර ආකාරයක් උසුලන්නට ඇත්ද යන්න විද්‍යාඥයන් සොයාගෙන තිබෙන්නේ ත්‍රිමාණ පරිගණක ආකෘතියක් නිර්මාණය කරගැනීමෙන් අනතුරුවයි.

උපකරණය සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කරන්නේ එක්සත් රාජධානියේ ලන්ඩන් විශ්වවිද්‍යාලීය කොලිජියේ විද්වතුන් පිරිසකි. එහි ප්‍රධාන පර්යේෂක ටෝනි ෆ්‍රීත් සඳහන් කරන්නේ මෙවැන්නකි.

"... අප නිර්මාණය කළ පළමු ආකෘතියෙන් ම එම උපකරණයේ භෞතික ස්වරූපය අනාවරණය කරගන්න හැකි වුණා. ඒ වගේම උපකරණයේ යන්ත්‍රණය සම්බන්ධයෙන් විද්‍යාත්මක කරුණු හෙළි කරගන්නත් එම ආකෘතිය වැදගත් වුණා."





# කොරෝනා එන්නත රටවල් සියයකට

කොරෝනා මර්දන එන්නත් සම්බන්ධයෙන් බොහෝ දෙනෙක් මේ දිනවල උනන්දු වෙති. වාර්තාවන්ට අනුව අද වන විට කොරෝනා එන්නත් මිලියන 335කට අධික ප්‍රමාණයක් රටවල් සියයකට බෙදා දෙන්නට ලෝක සෞඛ්‍ය බලධාරීන් කටයුතු කර ඇත. එහෙත් ලොව විවිධ කලාපවලින් එන්නත් කිරීම සම්බන්ධයෙන් අසන්නට දකින්නට ලැබෙන්නේ එකිනෙකට වෙනස් පුවත්ය. සමහර රටවලට ඉතා ආරක්ෂිතව එන්නත් තොග ළඟා වී තිබේ. එයින් ඇතැම් රටවල් විශාල ජන සංඛ්‍යාවකට එන්නත් දීමටද පියවර ගෙන ඇත. සැලකිය යුතු රටවල් සංඛ්‍යාවකට කොරෝනා එන්නත්වල ප්‍රථම තොගයවත් තවම ලැබී නැති බව වාර්තා වෙයි.

ලෝක සෞඛ්‍ය සංවිධානය සහ තවත් ආයතන කිහිපයක් සමඟ එකට එක්ව කොරෝනා එන්නත් තොග සැපයීමේ වැඩසටහනක් ආරම්භ කර ඇත. කොවැක්ස් යනුවෙන් නම් කර ඇති එම වැඩසටහනෙන් පළමුවෙන්ම ප්‍රතිලාභ ලැබුවේ බටහිර අප්‍රිකා රාජ්‍යයක් වන ඝානාවයි. මේ වසර අවසන් වන විට එම වැඩසටහනෙන් එන්නත් මාත්‍රා බිලියන දෙකක් ලෝ පුරා බෙදා හැරීමට නියමිතව ඇත.

කොරෝනා වයිරසය සඳහා ඖෂධ නිෂ්පාදන සමාගම් කිහිපයක් එන්නත් කිහිපයක් නිෂ්පාදනය කර තිබේ. ෆයිසර්, කොවිෂීල්ඩ්, මොඩර්නා, සිනොෆාර්මා, ස්පුට්නික් V, සිනොවැක්, එපිවැක්කොරෝනා සහ කෝවැක්සීන් (භාරත් බයෝටෙක්) යනු එලෙස නිෂ්පාදනය කෙරී ඇති කොරෝනා එන්නත්ය. මෙම එන්නත්වලින් ෆයිසර් එන්නත සහ කොවිෂීල්ඩ් එන්නත වැඩිපුරම ප්‍රචලිත වී ඇත. කොරෝනා එන්නතෙන් වැඩිම මාත්‍රා සංඛ්‍යාවක් ගෙන තිබෙන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයයි. එම ලැයිස්තුවේ දෙවැනි සහ තුන් වැනි ස්ථානවල ඇත්තේ චීනය සහ ඉන්දියාව යන රටවල්ය.

කොරෝනා සඳහා එන්නත් කිරීම ආරම්භ කර ඇති බොහෝ රටවල පරිපාලනය එන්නත් දීමේදී වයස අවුරුදු 60ට වැඩි පිරිසට, සෞඛ්‍ය සේවයේ නියුතු පිරිසට සහ සායනික වශයෙන් අවදානම් මට්ටමක සිටින පිරිසට ප්‍රමුඛතාව දී තිබේ.

එන්නත් කිරීම ආරම්භ කරන ලද රටවලින් කොරෝනා ව්‍යාප්තියේ සහ කොරෝනා මරණ සංඛ්‍යාවේ අඩුවක් වාර්තා වන්නේ එක්සත් රාජධානියෙන් සහ ඊශ්‍රායලයෙන් පමණි.

BBC ඇසුරෙනි

**මංජුලා විජයරත්න**

දිනමිණ
ද්වාර LOADING





# අභ්‍යවකාශයේ ප්‍රසූත ළමා



තර්කානුකූලව ගත් කල අප සැම ඉපදී තිබෙන්නේ පෘථිවිය පිහිටා තිබෙන අභ්‍යවකාශයේය. එහෙත් මේ අප කතා කරන්නේ පෘථිවියෙන් පරිබාහිර පිටත අභ්‍යවකාශයේ දරු උපතක් සිදු විය හැකිද යන්න ගැනයි. මෑත කාලයේදී අභ්‍යවකාශය ගැන සිදු වන කතාබහ සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබෙන බව රහසක් නොවේ. එලොන් මස්ක්, ජෙෆ් බෙසොස්, රිචඩ් බ්‍රැන්සන් වැනි කෝටි ප්‍රකෝටිපතියන් අභ්‍යවකාශයට මානවයන් යැවීමටත්, එතැනින් නොනැවතී අභ්‍යවකාශයේ හෝටල් තැනීමට පවා දැනටමත් සැලසුම් සකස් කොට අවසන්ය. 2011 වසරේ නොවැම්බර් මාසයේ සිට අඛණ්ඩව අභ්‍යවකාශයට මානවයන් යැවීමට අපි සමත්ව සිටින්නෙමු. සංඛ්‍යාත්මකව ගත් කල අභ්‍යවකාශය ජය ගත් පළමු මිනිසා වන යූරි ගගාරින්ගේ සිට එම අගය පන්සියයක් පමණය. මේ නිසා සැලකිය යුතු කාලයක් අභ්‍යවකාශයේ ගත කිරීමට මිනිසාට දැනටමත් හැකියාව තිබේ. එහෙත් බිළිඳකුට අභ්‍යවකාශයේ ඉපදිය හැකිද? එසේ ඉපදුණද අභ්‍යවකාශයේ දුෂ්කර තත්ත්ව යටතේ ජීවිතය පවත්වා ගැනීමට හැකිද? අභ්‍යවකාශයේ ඉපදෙන දරුවකුගේ ස්වභාවය කෙබඳු වනු ඇතිද?

## සඳට ඇති දුර

මේ වන විට මිනිසා පෘථිවියෙන් එපිටට ගමන් කිරීමට සමත්ව ඇති උපරිම දුර වන්නේ කිලෝමීටර හාර ලක්ෂයකි. ඒ පෘථිවියේ සිට සඳට ඇති දුරයි. එහෙත් පෘථිවියට කිලෝමීටර හාරසියයක් එපිටින් පිහිටි අන්තර්ජාතික අභ්‍යවකාශ මධ්‍යස්ථානයේ දැනටද ගගනගාමීහු ශුන්‍ය ගුරුත්ව තත්ත්ව යටතේ ජීවත් වන්නෝය. නමුත් ගගනගාමීහු යනු අභ්‍යවකාශයේ ජීවත් වීම සඳහා විශේෂ පුහුණුවක් ලද, අත්දැකීම්වලින් සේම සවි ශක්තියෙන්ද පරිණත පුද්ගලයන් කොට්ඨාශයකි. ළදරුවකුට ඒ සා හැකියාවක් නැති බව අමුතුවෙන් කිව යුතු නැත. අභ්‍යවකාශයේ ජීවත්වීම ගැන කතා කිරීමේදී මූලිකවම සැලකිල්ලට ගැනෙන්නේ එහි වන ශුන්‍ය ගුරුත්ව තත්ත්වයයි. එහෙත් සැබවින්ම ගුරුත්වය කිසිදු තැනකදී ශුන්‍යයක් වන්නේ නැත. ඇල්බට් අයින්ස්ටයින්ගේ සාපේක්ෂතාවාදයට අනුව ගුරුත්වය අප අවට සෑම ස්ථානයකම අවකාශය-කාලය නමැති වක්‍රතාවන් ලෙස පවතින්නකි. පෘථිවියට වඩා කිලෝමීටර් හාරසියයක් ඉහළින් පිහිටි අභ්‍යවකාශ මධ්‍යස්ථානය තුළ එය ශුන්‍ය තත්ත්වයකට පත්ව තිබෙන්නේ තත්පරයට කිලෝමීටර අටකට අධික වේගයකින් (උණ්ඩයක් ගමන් කරනවාටත් වඩා වැඩි වේගයකින්) එය භ්‍රමණය වීමෙන් ගුරුත්වය කෙරෙහි ඇති කරන ප්‍රතිවිරුද්ධ බලය නිසාය. එහිදි අප අත්දකින්නේ ඇත්ත වශයෙන්ම ශුන්‍ය ගුරුත්වයක් නොව, ගුරුත්වය නිෂේධනය වීම නිසා සිරුරේ බර අහිමි වීමකි. එවැනි ස්ථානයක දරු පිළිසිඳ ගැනීමක් සිදු විය හැකිද?

## ගුරුත්වය

ගුරුත්වයේ බලපෑමක් නැති බැවින් ඩිම්බ හා ශුක්‍රාණු සංසේචනය වීමේ හැකියාවක් නැත්තේ, ශුක්‍රාණුවලට ඩිම්බය වෙත පිහිනා යෑමට ගුරුවත්ව බලය ඇවැසි වන නිසාය. මොන යම් ක්‍රමයකින් හෝ සංසේචනයක් සිදු වූවා යැයි උපකල්පනය කළ හොත් එලෙස නිර්මාණය වන කලලයට මෝරා වැඩීම සඳහා මවගෙන් ලැබිය යුතු පෝෂක ගන්නට නම් මවත්, කලලයත්, අතර සිදු වන තරල හුවමාරුව සාර්ථකව සිදු විය යුතුය. එහෙත් ගුරුත්වයක් නැති තැනකදි තරල පරිවහනය නිසියාකාරව සිදු වන්නේ නැත. මේ නිසා කලලයේ වර්ධනය සාමාන්‍ය පරිදි සිදුවන්නේ නැත. අනෙක් අතට ශුන්‍ය ගුරුත්වයකදී ජීවිතය පවත්වා ගැනීම ගර්භිණී කාන්තාවකටද පහසු නොවන්නකි. ගුරුත්වයේ බලපෑමක් නැති බැවින් ඇගේ අස්ථි හා පේශි පද්ධතීන් දුර්වල වීම වැළැක් වීය නොහැකිය. දරු උපතේදි මෙය මවගේ ජීවිතය විශාල අවදානමකට පත්කරන්නේ, දරුවා බිහිවීමේදි ඇගේ ශ්‍රෝණිමේඛලාව කෙරෙහි ඇති කරන අධික පීඩනය නිසා අස්ථි බිඳී යාමේ හැකියාවක් පවතින නිසාය. එසේම ගුරුත්ව බලයක් නැති බැවින් සාමාන්‍ය දරු උපතකදි මෙන් දරුවා යෝනි මාර්ගය ඔස්සේ පහළට තල්ලු කිරීමේ හැකියාවක්ද මවට නැත. මේ නිසා අභ්‍යවකාශයේදී සිසේරියන් සැත්කමකින් මිස සාමාන්‍ය දරු උපතක් කිසිසේත් බලාපොරොත්තු විය නොහැකිය. අඩු වර්ධනයක් සහිතව එලෙස උපදින දරුවාට තව දුරටත් අභ්‍යවකාශය තුළ ජීවිතය පවත්වා ගැනීමට පුළුවන්කමක් තිබේද?

## සමබරතාව

මවගේ කුස තුළ සිටියදී සේම තව දුරටත් ඔහුගේ සිරුරේ තරල පරිවහනයට ශුන්‍ය ගුරුත්වයෙන් බාධා එල්ල වන බැවින් සිරුරේ සමබරතාව පවත්වා ගැනීමට ඔහු අපොහොසත් වනු ඇත. පෘථිවියේදි ගුරුත්වයේ බලපෑම හේතුවෙන් සිරුරේ වන තරලත්, විශේෂ කොටම සමබරතාව පවත්වා ගැනීමට හේතුවන කන තුළ පිහිටි තරලත් පහළට තල්ලුව තිබුණත්, ශුන්‍ය ගුරුත්වයකදි එවැනි බලපෑමක් තරල කෙරෙහි ක්‍රියාත්මක වන්නේ නැත. මේ නිසා කන තුළ ඇති තරල නිදහසේ විසිරී පැවතීමෙන් 'චලන ආබාධය' (motion sickness) නමැති සිරුරේ අසමබරතාවට හේතු වන තත්ත්වයකින් ඔහුට පීඩා විඳින්නට සිදු වනු ඇත. මෙම තත්ත්වය ගගනගාමීන් තුළ පවා දැකිය හැකි අතර එය හැඳින් වෙන්නේ 'අභ්‍යවකාශ අනුවර්තන සංකූලතාව' ලෙසය. අභ්‍යවකාශයේ ඉපදුණු දරුවකු යළි පෘථිවිය වෙත රැගෙන ආවද, ශුන්‍ය ගුරුත්වයක උපන් ඔහුට පෘථිවියේදි පවා සමබරතාව රැක ගැනීම අභියෝගයක් වනවා ඇත.

## මොළයේ කාර්යක්ෂමතාව

පෙනුමෙන්ද අභ්‍යවකාශයේ උපන් දරුවකු සාමාන්‍ය දරුවකුට වඩා බෙහෙවින් වෙනස් වනු ඇත. අක්‍රමවත් තරල පරිවහනය හේතුවෙන් ඔහුගේ මුහුණ පිම්බී ගිය ස්වභාවයක්ද, සිරුර ඉදිමුණු ස්වභාවයක්ද ගනු ඇත. අභ්‍යවකාශයේ කෙටි කාලයක් ගත කළ ගගනගාමීන්ගේ පවා මෙම තත්ත්වය දැකිය හැකිය. දෑස් පිටතට නෙරා විත්, හිස් කබලද සාපේක්ෂව ප්‍රමාණයෙන් විශාල වනු ඇත. අක්‍රමවත් තරල පරිවහනය සේම අස්ථි හා පේශි කෙරෙහි පෘථිවියේදි මෙන් ගුරුත්වයේ බලපෑමක් නොමැති වීමෙන් කිසිදු ආකාරයක ආතතියක් එල්ල නොවීම මීට හේතුවයි. ගුරුත්වයට එරෙහිව ක්‍රියාත්මක වීමට හදවතට සිදු නොවන නිසා එහි ක්‍රියාකාරීත්වය ක්ෂණිව යනු ඇතිවා සේම, සිරුරේ රුධිරය සැලකිය යුතු ප්‍රමාණයක් අහිමි වීමෙන් ඔහු සුදුමැලි වී ගත දුර්වල වනු ඇත. එසේම සිරුරේ ඉහළ කොටසේ රුධිර පීඩනය ඉහළ යෑමෙන් මොළයේ කාර්යක්ෂමතාව පහළ වැටී සිරුර තව දුරටත් දුර්වල වීම වැළැක්විය නොහැකි වනු ඇත.

අභ්‍යවකාශයේ උපදින දරුවකුට මුහුණ දීමට සිදු වන තවත් ප්‍රධානම අභියෝගයක් වන්නේ සූර්යයාගෙන් නික්මෙන අහිතකර විකිරණයි. පෘථිවියේදි ඕසෝන් ස්තරයෙන් එවැනි විකිරණවලට එරෙහිව ආරක්ෂාවක් ලැබුණද අභ්‍යවකාශයේදි විද්‍යුත් චුම්බන විකිරණ බලපෑම ඉහළ හෙයින් දරුවාගේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය අඩාළ කිරීමට එය හේතුවක් වනු ඇත.

රෝගවලට එරෙහිව ආරක්ෂාව සපයන සුදු රුධිරාණුවල ක්‍රියාකාරීත්වය අඩපණ වීමෙන් රෝගවලට එරෙහි ප්‍රතිශක්තිය අහිමි වනවා ඇත. එසේම එය දරුවා ඇල්සයිමර් රෝගයට ගොදුරු කිරීමටද හේතුවක් වනු ඇත. ශුන්‍ය ගුරුත්වයේදි දරුවකුට මුහුණ දීමට වන තවත් ප්‍රධානම ගැටලුවක් වන්නේ අස්ථි හා පේශින්ගේ ඝනත්වය අඩු වී, ඒවා ක්ෂය වී යාමට පටන් ගැනීමයි. අස්ථිවල සේම පේශිවලද නිසි වර්ධනයට ගුරුත්වයෙන් ඒවා මත ඇති කරන පීඩනය අත්‍යවශ්‍ය වන අතර බාහිර ආතති දරා ගනිමින් ශක්තිමත්ව නැඟී සිටීමට අස්ථි හා පේශි දිරි ගන්වන්නේ ගුරුත්වයෙනි. එහි බලපෑමක් නැති කල අස්ථි වර්ධනය අඩාළ වීමෙන් 'රිකට්ස්' රෝගය වැනි විකෘතිතා ඇති විය හැකිය. සිරුරේ හැඩය අක්‍රමවත් වී, කශේරුව ඇදවී, අස්ථි පහසුවෙන් බිඳී යන තත්ත්වයකට පත්වනවා ඇත.

මෙකී සියලු ශාරීරික අක්‍රමිකතාවන්ට අමතරව අභ්‍යවකාශයේදි හුදෙකලාව හේතුවෙන් දරුවාට මුහුණ දීමට වන මානසික අසහනයද ඔහුට දරා ගැනීම පහසු නොවනු ඇත. එය විශාදය දක්වා වර්ධනය වීමේ ප්‍රවණතාවක්ද තිබේ. මේ සියලු කායික හා මානසික අඩත්තේට්ටම් මැද අභ්‍යවකාශයේදි අලුත උපන් දරුවකුට ජීවිතය පවත්වා ගැනීම යථාර්ථයක් නොවනු ඇත.

රැක්ලන්ති පෙරේරා

**විද්‍යා ප්‍රබන්ධය**



# බග්ස් 06

# නූල්වල කෙළවර

හෙට සහ අනිද්දා පුවත්පත් සහ රූපවාහිනී නාලිකා කිහිපයක ප්‍රවෘත්ති සිරස්තල ද, සති කිහිපයක් ඉදිරියට ලොතරැයිවල දිනුම් අංක ද, කොටස් වෙළෙඳපොළ හැසිරීම ද ඇතුළු ඉදිරියේ දී සිදු වන විවිධ දේවල් හා ඒවා විය හැකි සම්භාවිතාව 100% සිට කොපමණ වේදැයි එහි විය. මම හැකි ඉක්මනින් ලක්දීප පුවත්පතේ සිරස්තල සොයාගතිමි.

පෙරදා විරාන් කියූ ලෙසටම එහි එක් සිරස්තලයක වූයේ කොළඹ විද්‍යා මාවතේ ගසක අත්තක් කඩා වැටීමෙන් දෙදෙනකු ජීවිතක්ෂයට පත් වීම පිළිබඳය.

මෙවේලේ නැවතත් සංකීර්ණ ගණකය වෙතින් සියුම් ශබ්දයක් නිකුත් වන්නට පටන් ගත්තේය. වහාම ජංගම දුරකතන කැමරාවෙන් පලාපල කොටසේ වූ සිරස්තල ඇතුළු විවිධ විස්තර කිහිපයක ඡායාරූප ගත්තේ පසුව ඒවා නැවත පරිස්සමින් කියවා ගැනීම පිණිසය. කෙමෙන් කෙමෙන් සංකීර්ණ ගණකයෙන් නිකුත් වන ශබ්දය ඉහළ යන්නට විය. ඉක්මනින් මුදල් ආපසු ගැනීමේ මෙනුවට පිවිසි මම අවශ්‍ය මුදල ලෙස රුපියල් 5,000ක් ටයිප් කළෙමි. මොහොතකින් යන්ත්‍රය වෙතින් රු:5,000ක් නිකුත් විය. මා ගෙවූ ජීවිතයේ හැටියට, කිසිම ආයාසයකින් තොරව මෙතරම් මුදලක් ලැබීම එවේලේ මා අමන්දානන්දයට පත් කළේය.

වෙනත් ලෙසකින් දක්වන්නේ නම් මුදල් ලැබෙන මොහොතේදී වේගයෙන් සිරුරෙන් මුදා හැරුණු ඩොපමීන් ඇතුළු හෝමෝන විසින් මොළය ආස්වාදයෙන් පුරවාලමින් තාර්කික බව වසා දමමින් තණ්හාව අවුළුවාලීය. තණ්හාව විසින් මාගේ මනස මොහොතකට පැහැර ගැනිණි. තප්පර කිහිපයකට මනසක් රහිත සොම්බි කෙනකු වූ මා යාන්ත්‍රිකව ATM යන්ත්‍රයේ නැවතත් රු. 50,000ක් ටයිප් කළෙමි. කෙසේ වෙතත් ඊළඟ මොහොතේ මගේ මනසේ පාලනය නැවතත් මා හට ලැබුණ මුත් මා ප්‍රමාද වැඩිය. යන්ත්‍රය විසින් රු. 50,000ක් නිකුත් කොට තිබිණි.

සංකීර්ණ ගණකයෙන් කන් බිහිරි කරවන තරමේ නාදයක් නිකුත් වීමට පටන් ගත්තේය. කලබල වූ මා ඉක්මනින්ම මුදල් ඩැහැගෙන එතනින් පිටවීමට ආපසු හැරුණෙමි. ATM යන්ත්‍රයෙන් පිටත නුරුස්නා මුහුණුවලින් යුත් මිනිසුන්ගේ දිගු පෝලිමකි. ඔවුහු සියල්ලෝ මා දෙස බලා සිටිති. වහාම එතනින් පැනගත් මම ආපණ ශාලාවට නොගොස් වේගයෙන් එතනින් ඉවතට ඇවිද යන්නට වීමි. මා පසුපසින් පිරිසකගේ කෑ ගැසීමක් ඇසුණත් සංකීර්ණ ගණකයෙන් තවමත් නිකුත් වෙමින් තිබුණු ශබ්දය හමුවේ ඒ කිසිවක් පැහැදිලිව නොඇසිණි. පසුපස නොබලමින් මම හැකි ඉක්මනින් එතනින් ඉවතට ඇවිද යන්නට වීමි. එහෙත් මගේ පසු පසින් නැවතත් කෑ ගසන ශබ්දයක් ඇසුණෙන් හැරී බැලුවෙමි. හැඩි දැඩි පුද්ගලයෙක් දිව එයි. සිතීමට කාලයක් නැත මෙතනින් පැනගත යුතුය. මා මුළු වෙර යොදා එතනින් පැන දිවීමට උත්සහ කළත් දිව එන තැනැත්තාගේ අතෙහි වූ දෙය දැක මම හිටි තැනම නැවතිණි. ඒ සර්පයාය. මා කළු පැහැ කාඩ් පත ATM යන්ත්‍රයේම අමතක කොට පැමිණ ඇත. ඉතින් කාඩ් පත නැවත මට දුන් පුද්ගලයාට හදවතින්ම ස්තූති කරමින් එය ගත්තෙමි.

"අනේ බොහොම ස්තූතියි, තව පොඩ්ඩෙන් හරි ප්‍රශ්නයක් වෙන්නේ"

"කලබලේට අමතක වුණා නේද?" ඔහු විමැසීය.

"ඔව්, මම..මට මම.. ටිකක් කලබල වුණා." ගොත ගසමින් පැවසීමි.

"කලබල වෙන්න එපා, කලබලේට කොරස් කටෙත් අත දාන්න බෑ කියනවානේ, කලබල නොවුණොත් කොරස් කට ලෝකයක් තරම් විශාල වෙනවා" හෙතෙම සිනාසෙමින් පවසමින් මා පසුකොට ගියේය. ඔහුගේ කතාවේ අමුත්තක් දැනිණි.

කෙසේ වෙතත් ඒ ගැන සිතීමට කලින් මගේ දුරකතනය නාද විය. ඒ මගේ ආයතන ප්‍රධානියාය. මා රැකියාව කළේ 'ඇල්ෆා බිට්' නම් මෘදුකාංග සංවර්ධන ආයතනයකය. එය දැවැන්ත බහුජාතික සමාගමක වසර සියයකට වඩා පැරණි වූ ශ්‍රී ලාංකික ශාඛාවට අයිති වී තිබුණු සමාගමකි.

"තමුසෙට මොකද වුණේ? කොහෙද අතුරුදන් වුණේ?"

"සර් අද පොඩි කරදරයක් වුණා... " එහෙත් මා තවත් කිසිවක් කීමට පෙර නැවත බොස්ගේ කටුක ගෝරනාඩුවය,

"මොනවා වුණත් තමුසේ මැරිලා නැනෙ, කෝල් එකක් දෙන්න තිබ්බනේ මොකද වුණේ කියලා..මම කෝල් එකක් දෙනකම්ම ඉන්න ඕන ද?"

"සර්... මම.. කෝල් එකක් දෙන්න තමයි හැදුවේ.. මේ" කලබල වූ මා උත්තර දුන්නත් ඔහුට කුමක් කියන්නේ දැයි මට කල්පනා නොවිණි. මා කිව යුතු කරදරය කුමක්ද? එවිටම මට කල්පනා වූයේ මොහොතකට පෙර සර්පයා ගෙනැවිත් දුන් පුද්ගලයා කියූ දේය. කලබල නොවුණොත් කොරස් කට ලෝකයක් තරම් විශාල වෙනවා. ඉතින් හැකි තරම් සන්සුන් වූ මම මාගේ ප්‍රධානියාට උත්තර දුන්නෙමි.

"උදේ වැඩට එනකොට කොටුව ස්ටේෂන් එකේ රණ්ඩුවක්. මගේ දුරින් ඥාති වෙන නංගි කෙනෙක්ට මිනිහෙක් කරදර කරන්න හදල, නංගි ඒ මිනිහට ගහල, මම යනකොට එතන ලොකු රණ්ඩුවක්. මමත් එක මැද්දට පැටලුණා, අන්තිමට නැවතුණේ කොටුවේ පොලිස් කූඩුවේ, ඉතින් ෆෝන් එක පාවිච්චි කරන්නවත් දුන්නේ නෑ"

"එතකොට තමුසෙගෙ නංගි කෙනෙක් ද ඒ"

"ඔව් ඔව්, බොසුත් දන්නවාද එක?"

"ඔව්, මට කිව්වා සුධර්මන්. මිනිහත් දැකල තිබ්බ, ඉතින් කොහොමද මිනිහ තමුසෙව නොදැක්කේ ඔතන?"

"අනේ මන්ද, නැත්තම් දකින්නත් ඇති බොස්, ඒත් අනවශ්‍ය කරදරයකට මැදිහත් වෙලා පරක්කු වෙලා ඔෆිස් එන්න අකමැති නිසා නොදැක්ක වගේ උන්න ද දන්නේ නෑ, අහල බලන්න"

"ඔව් ඔව්, ඕන නෑ අහන්න, මිනිහ කීයටවත් කියයි ද ඕයි තමුසෙව දැක්ක කියල, මොන දේ තිබ්බත් අමතක කරල රාජකාරිය දේවකාරියක් කියල හිතන දියුණු වෙන මිනිහෙක්, තමුසෙලා වගේ අහක යන නයි රෙද්දේ දාගන්නේ නෑ සුධර්මන්, අනික තමුසෙටත් මාර නංගිලානේ ඉන්නේ " බොස්ගේ උපහාසාත්මක සිනහා හඬ අනෙක් කෙළවරින් ඇසෙයි.

"බොස් මට අද නිවාඩුවක් ඕනෑ, ලෝයර් කෙනෙක් අල්ලාගෙන මේ වැඩේ ගොඩදාගන්න"

"හරි හරි"

දහවල ආසන්න වන විට මා හට අසාමාන්‍ය තෙහෙට්ටුවක් සමඟ ආ අසනීප ගතියක් ද වම් බාහුවේ ඉහළ මස්පිඬුවල වේදනාවක් දැනෙන්නට විය. වම් බාහුව අතගා බැලූ විට එහි ප්ලාස්ටරයකින් ඇලවූ පුලුන් කැබැල්ලක් විය. මෙතෙක් වේලා එය නොතේරීම ගැන පුදුම වූ මම ප්ලාස්ටරය ගලවා බැලීමි. පුලුන් කැබැල්ලේ වියළී ගිය රුධිරය තිබිණි. ඉතින් සැකයක් නැතිවම උදෑසන පුංචි ඇතුළු කණ්ඩායම විසින් මට යම් එන්නතක් විද ඇති බව වැටහිණි. මේ සියලු අපහසුතා එහි බලපෑම විය යුතු යැයි කල්පනා කළ මම අසල වූ ආපණ ශාලාවකට ගොඩ වැදී පිරියක් නැති වුවත් පාන් සහ පරිප්පු ගෙන්වා ගතිමි. එන්නත ගැන කල්පනා කරන විට මට ඒ පිළිබඳ බියක් නොදැනිණි. ඔවුන්ට මා හට අනතුරක් කිරීමට අවශ්‍ය වූවා නම් උදෑසන එය පහසුවෙන්ම කළ හැකිව තිබිණි. එහෙත් එන්නත කුමක් විය හැකිදැයි කල්පනා කරමින් සිටින අතර, මට විරාන්ගෙන් ඇමතුම ලැබිණි.

මුලින්ම මට යම් අපහසුවක් දැනෙන්නේ දැයි ඇසූ විරාන් වේදනා නාශක පෙති ගන්නා ලෙස ඉල්ලීය. එන්නත කුමක්දැයි ඇසූ මුත් විරාන් දිගින් දිගටම කියා සිටියේ ඒ ගැන කරදර නොවනා ලෙසත් එය සිරුරේ ප්‍රතිශක්තිකරණය ඉහළ නැංවීමේ එන්නතක් පමණක් බවයි. ඒ සතුටුදායක පිළිතුරක් නොවුවත් අන් කළ හැකි දෙයක් නැති බැවින් මම ඔහු කී දේ පිළිගතිමි.

"මචං, උඹේ අතින් වැරදි දෙකක් වුණා." අනතුරුව විරාන්ගේ හඬ සානුකම්පිතය.

"උඹ රූකඩ මඩු දැකල තියෙනවා නේද? රූකඩ ඔක්කොම නැටවෙන්නේ රූකඩ ශිල්පීන් කීප දෙනෙක්ගේ අතේ තියන නූල්වලින්. මම කියන්නම් උඹට අපූරු රූකඩ මඩුවක් ගැන..!" මගෙන් පිළිතුරක් බලාපොරොත්තු නොවුණු විරාන්ගෙන් පැහැදිලි කිරීමකි.

"මේ අපූරු රූකඩ මඩුවේ රූකඩ නටවන පිරිසත් තවත් ඉහළින් එන නූල්වලින් මෙහෙයවෙන රූකඩ ටිකක් කියල හිතන්න."

"මොකක්..?" මම ඇසීමි.

"ඔව්, ඒ විතරක් නෙමේ, මේක තවත් ඉහළට යනවා. අන්තිමට අපි කවුරුත් නොදකින තැනක ඉන්නවා ඇත්තම රූකඩ නටවන්නා..!"

"ඔව්, මට තේරෙනවා" මම පැවසීමි.

"රූකඩ නැටවෙන නූල් කියන්නේ මේ සිස්ටම් එක බේස් වෙලා තියන මූල්‍ය පද්ධතියට. ඔයා මුදල්වල ව්‍යාජ වසඟයට අහුවෙලා මොහොතකට මනස අහිමි කරගත්තා. මිනිසා කියන්නේ මනසක් සහිත කියන එක නේ, මනස අහිමි වුණු ගමන් ඔයා රූකඩයක් වෙනවා, නූල්වලින් නැටවෙන. මේ නූල්වල අන්තිම කෙළවර තියෙන්නේ ගොඩාක් ගැඹුරේ, ඒ නූල් හරිම සංවේදී, ඒවට හැමදේම දැනෙනවා".

විරාන් නිවැරදි බව දැනුණෙන් මම කිසිවක් නොපැවසීමි.

"අනික ඔයා කලබල වුණා. කලබල වුණාම කොරොස් කටෙත් අත දාගන්න බැරි වෙනවා, සන්සුන් වුණහම කොරොස් කට ලෝකයක් තරම් ලොකු වෙනවා. මේ සිදුවීම නිසා සමහර දේවල් ටිකක් වෙනස් වුණා. ඒත් ඒවා අපට විසඳගන්න බැරි තරම්ම බැරෑරුම් ප්‍රශ්න නෙවෙයි. දැන් මම කියන මේ දේ ඔයා එහෙමම කරන්න ඕන, මොකද අපට තව පැය කීපයයි තියෙන්නේ."

මතු සම්බන්ධයි

> සිය නූල්වලට ආදරය කරන තාක් රූකඩයක් සිතන්නේ තමන් නිදහස් බවයි.
> \- සැමුවෙල් බෙන්ජමින් හැරිස්

**රංගන ප්‍රෂාද් ආරියවංශ**

වර්ෂ 2021ක් වූ මාර්තු මස 22 වැනිදා සඳුදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදි.



දිනමිණ
දැන්වීම් අතිරේකය
මාර්තු මස 22 සඳුදා
ලෝක ජල දිනය
2021 මාර්තු 22
ජලයට වටිනාකමක්
රන් දියවර
වාරි කෘෂි කර්මාන්තය අතික්‍රමණය කළ වටිනාකම
වාරිමාර්ග දෙපාර්තමේන්තුව

## වාරිමාර්ග අමාත්‍ය ගරු චමල් රාජපක්ෂ මහතාගේ පණිවුඩය



ජලය මිහිපිට අති වටිනාම සම්පතක් වන අතර, කාලගුණික සහ දේශගුණික සිද්ධාන්ත මත එය ලොව සීමිත සම්පතක් ලෙස හඳුනාගෙන තිබේ. ශීඝ්‍රයෙන් ඉහළ යන බිලියන 7ක් ඉක්ම වූ ලෝක ජනගහනය මෙන්ම, වෙනස් වන ස්වාභාවික පිහිටීම් අනුවත් ජලය යනු මැනවින් කළමනාකරණය කර ගත යුතු සම්පතකි.

මේ තත්ත්වය නිවැරැදිව කල් ඇතිව වටහා ගත් 1992 වසරේ පැවති පරිසරය සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවට සහභාගී වූ සියලු රටවල්, ලෝක ප්‍රජාව ජලය පිළිබඳව ලබාදිය යුතු ප්‍රමුඛත්වය වටහා ගැනීම පදනම් කරගෙන, නැවුම් ජලය සඳහා වූ ජාත්‍යන්තර දිනයක් සැමරීමේ තීරණයට එළඹි අතර, ඒ තීරණය ක්‍රියාත්මක පියවරක් කරගනිමින් 1993 සිට මාර්තු 22 දිනය ලෝක ජල දිනය ලෙස ප්‍රකාශයට පත් කර ඇත. මෙවර ලෝක ජල දින තේමාව වන "ජලයට අගයක්" යන්න ලෝක ප්‍රජාවට මෙන්ම, පෙරදිග අපට ද ඉතා සමීපව බලපාන මාතෘකාවකි. පෙරදිග රටවල්, විශේෂයෙන් ශ්‍රී ලංකාව ජල ශිෂ්ඨාචාරයක් සහිතව ක්‍රමිකව ගොඩනැගුණු රටක් වන අතර එයිනුත් ලාංකීය අපගේ සම්භවය සහ වාරි ශිෂ්ඨාචාරය එකිනෙකට දැඩිව බැඳුනු සිද්ධාන්තයක් වේ.

ලාංකීය ජන ජීවිතය සහ වැව අතර ඇති අන්තර් සම්බන්ධතාවය ශක්තිමත්ව පැවතීමට පුරාතනයේ සිටම බෞද්ධ ආභාසය බලපෑ අතර, "වැවයි දාගැබයි – ගමයි පන්සලයි" යන සංස්කෘතිකමය සංකල්පය තුළ පුළුල් විද්‍යාත්මක පදනමක් තිබුණි. වැව සකස් කිරීම ප්‍රමුඛ කාර්යයක් වූ අතර, ඉන් ශේෂ වූ පස් යොදා චෛත්‍ය නිර්මාණය කිරීමත්, පන්සල ගොඩනැගීමත්, ඒ මත ගමේ ජීවනෝපාය මාර්ග සහ ජන ජීවිතය සුරක්ෂිත කිරීමත් එදවස සිදුවුණි. එදා වැවට මෙන්ම වාරි ජලයට ද ලැබුණු අප්‍රමාණ අගය නිසාම ලොව අන් කිසිදු රටක දක්නට නොලැබුණු ජල පූජා, දියවර මංගල්‍ය, දිය බෙදුම, දිය කැපුම ආදී ජලය ආශ්‍රිතව පුද පූජා කිරීම් නිරන්තර සිදු කළ අතර, වාරි ජලය සුරක්ෂිත කිරීම සඳහා කඩවර දෙවියන් නමින් වූ දේව ඇදහිල්ලක් ද, ලාංකීය සමාජය තුළ තදින් තිබුණි. ජලය උදෙසා වූ කඩවර දේව පූජාව ද, අඛණ්ඩව අදටත් වැව් ආශ්‍රිතව සිදු වේ.

ඒ මතු ද නොව, ලාංකීය ජාතියේ මහා සංස්කෘතික මංගල්‍ය වන සිංහල – දෙමළ අලුත් අවුරුදු මහෝත්සවය තුළද "ජලයට අගයක්" එකතු කිරීම නැකැත් පත්‍රයේ විධිවිධාන සහිතව සිදු කෙරේ. "ළිඳ සමග ගනුදෙනු කිරීම" සඳහා, අලුත් නැකැත් සීට්ටුවේ දිනයක් වෙන් කරන අතර, එදිනට එම මොහොතට ළිං ජලයට ගරු කරමින්, එය පිරිසිදු වේවා යන ප්‍රාර්ථනය සහිතව මල් සහ දර අඟුරු එක්කරයි.

ජලය හා බැඳුණු එවැනි දැවැන්ත සංස්කෘතිකත්ව ඉතිහාසයකට උරුමකම් කියන අප සතු මහාර්ඝ ජල සම්පත මතු පරපුර සඳහාත්, වර්තමාන පරිභෝජනය සඳහාත්, ඉතා මැනවින් කළමනාකරණය කිරීමේ කාලීන අවශ්‍යතාවයකට මුහුණ දෙමින් සිටිමු. විශේෂයෙන්ම ජලය පිළිබඳව ලාංකීය අපට තිබූ ගෞරවාන්විත අවධානය, නූතන සමාජ සහ සන්නිවේදන ක්‍රියාකාරකම් සමඟ අවප්‍රමාණය වී තිබේ.

එහිදී ලාංකීය ආර්ථිකයේ දැවැන්ත වැඩ කොටසක් වගකීමක් ලෙස දරා සිටින කෘෂිකාර්මික අංශයේ සියලුම ක්‍රියාකාරකම් වාරි ජල සැපයුම මත රඳා පවතින අතර, වාරිමාර්ග අමාත්‍යාංශයේ සමස්ත ක්‍රියාකාරකම්, කෘෂිකර්මය විෂය ක්ෂේත්‍රයේ අභිබවා යමින්, විදුලි ජනනය, දෙස් විදෙස් සංචාරක ක්‍රියාකාරකම්, ප්‍රජා නිරෝගීතාවය ආදී ක්ෂේත්‍ර දක්වා ද විහිදී යයි. විශේෂයෙන්ම මෙරට ක්‍රියාත්මක සියලු මහවැලි ප්‍රධාන ව්‍යාපෘති මෙන්ම, උතුරු පළාත් මහ ඇළ, වයඹ පළාත් මහ ඇළ, ගිං – නිල්වලා, උමා ඔය, මව් ආර, දැදුරු ඔය, මල්වතු ඔය ආදී දැවැන්ත වාර්මාර්ග ව්‍යාපෘති හරහා ද මෑතක සිට අප අමාත්‍යාංශය ක්‍රියාත්මක කරනු ලබන ග්‍රාමීය වැව්, අමුණු සහ වාරි ඇළ මාර්ග පද්ධති 5000ක් පිළිසකර කිරීමේ "වාරි සෞභාග්‍යා" ජාතික වැඩසටහන හරහා ද, සිදුවෙමින් තිබෙන්නේ "ජලයට අගයක්" එකතු කරමින්, ඵලදායී ජල කළමනාකරණයක් මගින් ලාංකීය ජාතියම පෝෂණය කිරීම බව සිහිපත් කරමි. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ ඒ සඳහා වූ සියලු නිර්දේශයන්, මග පෙන්වීම් යථාර්ථයක් කිරීමට අප සියලු දෙනා ඒකාවන්ව කැපවිය යුතු බව සඳහන් කරමි.

දශක 7ක, නිදහසින් පසු වූ පරිපාලන ඉතිහාසය තුළ ජලයට සම්බන්ධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන එක් අමාත්‍යාංශයක් යටතට පත් කළ පළමු අවස්ථාව තුළ, වාරිමාර්ග අමාත්‍යාවරයා ලෙස කටයුතු කරමින්, "ජලයට අගයක්" එකතු කිරීමෙන් ඔබ්බට ගොස් ශ්‍රී ලංකාවේ පානීය සහ වාරි ජල ඵලදායිතාවය හා කළමනාකරණය නිවැරැදි දිශානතියකට ගෙන යාමට දරන සාමූහික උත්සාහයට "2021 ලෝක ජල දින සැමරුම" ද එක් ආශීර්වාදයක් බව ශුභාශිංසනාත්මකව සිහිපත් කරනු කැමැත්තෙමි.

**චමල් රාජපක්ෂ**
වාරිමාර්ග අමාත්‍ය

## රාජ්‍ය අමාත්‍ය අනුරාධ ජයරත්න මහතාගේ පණිවුඩය



පිරිසිදු ජලය දෙවනි වන්නේ මව් කිරට පමණි.....

සියලු සත්වයන්ට මිය යන තෙක් ජීවය ලබා දෙන්නේ ජලයයි. අනාදිමත් කාලයක සිට ජල සම්පත කෙරෙහි සුවිශේෂි අවධානයක් යොමු කොට ඇත. ජල සම්පාදන ක්ෂේත්‍රය නොයෙකුත් ක්‍රම මගින් දියුණු කරමින් ශ්‍රී ලාංකික ගොවි ජනතාවට ප්‍රතිලාභ සැලසූ සාඩම්බර ඉතිහාසයක් අප හට ඇත.

1993 වර්ෂයේ සිට සෑම වසරකම මාර්තු 22 වන දින ලෝක ජල දිනය වශයෙන් සමරනු ලබන අතර, එය එක්සත් ජාතිනගේ සංවිධානයේ මහා සභාව විසින් ද (General Assembly of the United Nation) ප්‍රකාශයට පත් කර ඇත.

ලෝක ජල දිනය ප්‍රකාශයට පත් කිරිමේ මූලික අරමුණ වන්නේ ජලය හා සම්බන්ධ වී ඇති ගැටලු අවම කිරිම සඳහා ජනතාව යොමු කිරිමයි.

ඒ සඳහා ජනතාවගේ ආකල්ප දිරි ගැන්වීම සඳහා වාර්ෂිකව තේමාවක් ද හඳුන්වා දෙනු ලබයි. 2021 වර්ෂයේ තේමාව " ජලයට වටිනාකමක්" (Valuing Water) යන්නයි. එම තේමාව තුළ සියලු මනුෂ්‍යයන්ගේ ආකල්පමය හැඟිම් වර්ධනය කර සුභවාදි අනාගතයකට මං පෙත් විවර වීමට එය මහත් පිටිවහලක් වන බව මාගේ විශ්වාසයයි.

ලොව පුරා බිලියන 2කට අධික ප්‍රමාණයක ජනතාව පිරිසිදු ජලය නොමැතිකමින් මහත් පීඩාවට පත් වි සිටින අතර, ලොව පුරා 80% පමණ ප්‍රමාණයකට පිරිසිදු පානීය ජලය නොමැත.

එම අවධානම ශ්‍රී ලංකාවට ද බලපෑම් එල්ල කරනු ලබන අතර, ජල මූලාශ්‍ර රැක ගැනීම පමා කළහොත් ඔබටත් අපටත් විශාල ජල අර්බුදයකට මුහුණ දීමට සිදු වේ. පිරිසිදු පානීය ජලය භාවිතා නොකිරිම හේතුවෙන් හට ගන්නා නොයෙකුත් හේතු නිසා වාර්ෂිකව මිය යන ප්‍රමාණය විශාල වශයෙන් ඉහළ යන බව ලෝක සෞඛ්‍ය සංවිධානය කරුණු වාර්තා කරයි.

ලෝකයේ ඇති මුළු ජල ප්‍රමාණය ඝන කිලෝමීටර් බිලියන 1386ක් පමණ වන අතර, එයින් 97.5%ක් කරදියත් 2.5%ක් මිරිදියත් වශයෙන් වෙන් කර ඇතත් මිරිදිය ජලයෙන් අඩකටත් වඩා ප්‍රමාණයක් ඇත්තේ ද්‍රාවීය ප්‍රදේශවල අයිස් කඳු වශයෙනි.

භූගත ජලය, පාංශු ජලය, හිම, වායු ගෝලීය ජල වාෂ්ප, ගස්වැල් තුළ, සතුන්ගේ ශරීර තුළ, වැව්, වගුරු බිම්, පොකුණු, ඇළ දෙළ යන ස්ථාන වල තවත් කොටසක් ඇත. මේ අනුව බලන විට මිනිසාට පානීය ජලය හා එදිනෙදා අවශ්‍යතා සඳහා ප්‍රයෝජනයට ගත හැකි මිරිදිය ජලය ඇත්තේ ගංගා ඇළ දෙළ, ළිං පොකුණු ආදියෙහි පමණි. එම ප්‍රමාණය ලෝක ජල ප්‍රමාණයෙන් 0.29% ක් වේ.

ශ්‍රී ලංකාව තුළ මධ්‍යම කඳුකරයේ උස් බිම් වල සිදු කරන විනාශකාරී මිනිස් ක්‍රියාකාරකම් නිසා ඉතා කෙටි නියං කාලවල දී පවා ජල උල්පත් සිදී යයි. වර්ෂා කාලයේදී ලැබෙන ජලය ජල සංචිත ලෙස ගබඩා කර තබා ගැනීමට අපට කළ හැකි දේ බොහෝය.

ජල සංරක්ෂණය මනා ජල පරිභෝජනය මෙන්ම ජල දූෂණය වැළැක්වීම ඇතුළත් ජල කළමනාකරණ ක්‍රම වේදයන් තුළින් පාසල් දරුවාගේ සිටම ආකල්පමය වෙනස්කමක් සිදු කිරිම සිදු කළ යුතුය.

පිරිසිදු ජලය දෙවනි වන්නේ මව් කිරට පමණි. සියලු සත්වයන්ට මිය යන තෙක්ම ජීවය ලබා දෙන්නේ ජලයයි.

දිවියේ ජීවය ජලය යන්න මාගේ ප්‍රාර්ථනයයි.

**නීතිඥ අනුරාධ ජයරත්න**
ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්,
ජලාශ හා
වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍ය

## රාජ්‍ය අමාත්‍ය සිරිපාල ගම්ලත් මහතාගේ පණිවුඩය



මාර්තු 22 දිනට යෙදෙන, ලෝක ජල දිනය, නිමිත්තෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ප්‍රකාශනය සඳහා පණිවුඩයක් නිකුත් කරන්නේ, අතිශය සතුටිනි. මෙවර 2021, ලෝක ජල දිනයේ, තේමාව වී ඇත්තේ "ජලය ට වටිනාකමක්" යන්නයි.

එක්සත් ජාතීන්ගේ සංවිධානය පෙන්වා දෙන්නේ ලොව පුරා බිලියන ගණනාවක්, ජනයා පිරිසිදු ජලය නොමැති කමින් පීඩාවට පත්ව සිටින බවයි. ග්‍රාමීය වශයෙන් ජීවත් වන පුද්ගලයින්ගෙන් සියයට 80ක් පමණ ජලය ලබා ගන්නේ අනාරක්ෂිත ජල මූලාශ්‍රවලින් බව එම සංවිධානය පෙන්වා දී ඇත. වසර 2030 වනවිට පිරිසිදු ජලය නොමැති වීම හේතුවෙන් ලොව පුරා පුද්ගලයින් මිලියන 700ක් අවතැන්වනු ඇති බව ද එක්සත් ජාතීන්ගේ සංවිධානය වැඩිදුරටත් පෙන්වා දී තිබේ. ජලය සම්බන්ධයෙන් ලෝක තත්ත්වය එලෙස පවතින පසුබිමක ශ්‍රී ලංකාවේ ද ජල කළමනාකරණය හා භාවිතය මෙන්ම සුරක්ෂිතතාවය පිළිබඳව පුළුල් කථිකාවක් ආරම්භ විය යුතු බව මාගේ හැඟීම වේ. පවතින කාලගුණ වෙනස් වීම් හමුවේ අප රටේ පානීය ජලය මෙන්ම, කෘෂි කර්මාන්තය සඳහා වන වාරි ජලය සපයා ගැනීම, අනාගත අභියෝග බව කෘෂිකාර්මික හා පාරිසරික අංශ මගින් හඳුනාගෙන තිබේ. කෘෂි කාර්මික රටක් ලෙස, වාරි ජලය කළමනාකරණය හා සුරක්ෂිතතාවය සඳහා අප සතු දැනට පවතින ජල මූලාශ්‍ර ආරක්ෂා කර ගැනීම සහ එම ස්ථාන පෝෂණය කර ගැනීම කාලීන අවශ්‍යවතාවයක් වී ඇත්තේ එබැවිනි.

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේත් ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේත් අභිලාෂය වන්නේ රටේ සියලු ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කර ඔවුන්ගේ සමාජීය ජීවිතය යහපත් කිරීමය. ඒ අනුව නිෂ්පාදන ආර්ථිකයක් සඳහා රට මෙහෙයවීම වත්මන් රජයේ අරමුණ වී තිබේ. අන් රටකට නොදෙවෙනි අප සතු ස්වාභාවික ජල සම්පත, පිරිසිදු පානීය ජල අවශ්‍යතාවය සඳහාත්, වාරි කර්මාන්තය සඳහාත්, විදුලි බලය උත්පාදනය සඳහාත්, නවීන තාක්ෂණය සහිත කර්මාන්ත හා සේවාවන් පවත්වාගෙන යාම සඳහාත් නිසි ලෙස, කළමනාකරණය කර ගත යුතුව ඇත. සෞභාග්‍යයේ දැක්ම වැඩපිළිවෙළේ එක් ප්‍රධාන අරමුණක් වී ඇත්තේ රටේ සියලු ජනතාවට පිරිසිදු පානීය ජලය සැපයීමය. එය ඉදිරි වසර කිහිපය ඇතුළත සිදුකර අවසන් කිරීමට සැළසුම් කර තිබෙන අතර ඒ සඳහා රජය විශාල මුදලක් වෙන්කර තිබේ. අපගේ අරමුණ වන්නේ එක ජල බිඳුවක් හෝ අපතේ නොයාවා ජාතික ආර්ථිකය ගොඩනැගීම වෙනුවෙන් සුරක්ෂිත කර ගැනීමය. ඒ අනුව ඉතිහාසයේ සිට ජලය සුරක්ෂිත කර ගැනීම සඳහා අනුගමනය කළ එල්ලංගා පද්ධතිය ඇතුළු රටපුරා විහිදී තිබෙන වැව්, අමුණු 5000ක් ඉදිරි වසර 5 ඇතුළත ප්‍රතිසංස්කරණය කර අවසන් කිරීමට පියවර ගෙන තිබේ. උතුර, උතුරු මැද, නැගෙනහිර හා වයඹ පළාත් සඳහා පානීය ජල අවශ්‍යතා මෙන්ම කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් මහවැලි ව්‍යාපාරය යටතේ ක්‍රියාත්මක උතුරු මැද පළාත් මහ ඇළ සහ වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය පසුගිය දා ආරම්භ වුයේ එහි එක් පියවරක් ලෙසිනි.

ජලය නිසි ලෙස කළමනාකරණය තුළින් එය ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට යොදා ගැනීම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේත් වගකීම බව මාගේ හැඟීම වේ. ඒ සඳහා වාර්මාර්ග අමාත්‍ය ගරු චමල් රාජපක්ෂ මැතිතුමාගේ නිසි මග පෙන්වීම ලැබී තිබීම ප්‍රශස්ත කරුණක් බව මෙහදී සිහිපත් කර සිටිමි.

**සිරිපාල ගම්ලත්**
මහවැලි කලාප ආශ්‍රිත ඇළවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම්
සංවර්ධන රාජ්‍ය අමාත්‍ය

## වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් අනුර දිසානායක මහතාගේ පණිවුඩය



ජල සම්පතේ වටිනාකම ලෝකවාසීන්ට කියා දීම අරමුණු කරගනිමින් සෑම වසරකම මාර්තු මස 22 වන දින,ලෝක ජල දිනය ලෙස එක්සත් ජාතීන් විසින් නම් කර තිබේ. "ජලයට වටිනාකමක්" යන තේමාව යටතේ මෙවර ලෝක ජල දිනය සමරන විට ජල සම්පතේ වටිනාකම පිළිබඳව අප වඩාත් හොඳින් තේරුම් ගනිමින් සිටිමු. සමස්ත පෘථිවියම මුහුණ දෙමින් සිටින දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම හේතුවෙන් ඇතිවී ඇති අභියෝග රැසකට වර්තමාන ලෝකය මුහුණ දී සිටියි. එබැවින් අප සතු මහඟු ජල සම්පත ප්‍රශස්තව කළමනාකරණය කර ගැනීමේ අවශ්‍යතාව කවරදාටත් වඩා අත්‍යවශ්‍යව ඇත. නුදුරු අනාගතයේ දී අප හට මුහුණ පෑමට සිදු විය හැකි ජල අර්බුදවලට තිරසාර විසඳුම් සෙවීම සඳහා, ජල සම්පත සුරැකීම, ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය, ජල සුරක්ෂිතතාව ඇතිකිරීම යන කරුණු කෙරෙහි, අවධානය යොමු කරමින්, ඒ හා සම්බන්ධ ජාතික වැඩපිළිවෙළක් සකස් කිරීම ශ්‍රී ලංකාවට ද අත්‍යවශ්‍ය වූ ප්‍රමුඛතාවකි. "වාරි සෞභාග්‍යා" ජාතික වැඩසටහනට අනුගතව, නව ජලාශ පද්ධතීන් ස්ථාපනය කිරීම, මධ්‍යම හා මහා පරිමාණ ජලාශවල ගබඩා ධාරිතාවය ඉහළ නැංවීම, කෘෂිකාර්මික ඉඩම්වල ජල භාවිතයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, අප ශ්‍රේෂ්ඨ වාරි ශිෂ්ඨාචාරයේ මහඟු උරුමයක් වූ එල්ලංගා පද්ධතීන් සංරක්ෂණය සමඟ කුඩා වාරිමාර්ග පුනරුත්ථාපනය ආදී ඉලක්ක ද පෙරදැරිව පුළුල් වාරි සංවර්ධනයක් අප රට තුළ සිදු කිරීමේ කාර්යයට වාරිමාර්ග අමාත්‍යංශය මේ වන විටත් උර දී සිටින බව සතුටින් සටහන් තැබීමට කැමැත්තෙමි.

**අනුර දිසානායක**
ලේකම්
වාරිමාර්ග අමාත්‍යංශය



## රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් ඩී.ඩී. ආරියරත්න මහතාගේ පණිවුඩය

සෑම වසරකම මාර්තු 22 දිනට යෙදෙන ලෝක ජල දිනය සැමරීම තුළින් ජලය හා ජීවයේ පැවැත්ම සඳහා ජල සම්පත ආරක්ෂාකර ගැනීමේ වැදගත්කම නැවත නැවත අවධාරණය කරනු ලැබේ. ජලය පෘථිවියේ ජීවයේ පැවැත්මට අත්‍යාවශ්‍ය වූ ස්වභාවික සම්පතක් වන නමුත් විවිධ ක්‍රියාකාරකම් මෙන්ම යම් ස්වාභාවික සංසිද්ධීන් ද හේතුවෙන් ජලය මූලික වූ ස්වාභාවික විපත් එනම් ගංවතුර, නියඟ, නායයාම් හා සාගර ආශ්‍රිත විපත් බහුල ලෙස වාර්තා වන තත්ත්වයක් තුළ අප විසින් මෙම ස්වාභාවික සම්පත කෙරෙහි දක්වන නිරන්තර අවධානයෙහි අවශ්‍යතාව නැවත නැවත සිහිගන්වයි.

එවැනි පසුබිමක් තුළ ලෝක ජල දිනයේ දී ශ්‍රී ලංකාවේ ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය වර්මානයේ දී මුහුණ දෙන ගැටලු හා අභියෝග කෙරෙහි මෙන්ම ඒ සඳහා මුහුණ දීමට සුදුසු ප්‍රශස්ත ක්‍රියාමාර්ග කෙරෙහි නිසි අවධානය යොමු කිරීමට මෙම අවස්ථාව උපයෝගී කර ගැනීම සුදුසුය.

මෙම වසරේ ලෝක ජල දිනයේ තේමාව ලෙස එක්සත් ජාතීන් විසින් තෝරා ගෙන ඇති "ජලයට වටිනාකමක්" (Valuing Water) යන තේමාව ද අපගේ සැලකිල්ලට ගැනීම සුදුසු වේ. මෙම තේමාව ලෝකයේ විවිධ රටවල් එක් එක් මට්ටමින් හා අරුතින් ක්‍රියාත්මක කිරීමට උත්සාහ දරමින් සිටින මෙවන් අවස්ථාවකදී ශ්‍රී ලංකාවේ ජල සම්පත පිළිබඳ නිසි තක්සේරුවක් කරමින් ඒ තුළින් ක්‍රමවත් හා ශ්‍රී ලංකාවට අනන්‍ය වූ ජල කළමනාකරණ ප්‍රවේශයක් කෙරෙහි එළඹීමට ශ්‍රී ලාංකික ජල සම්පත් කළමනාකරණ විද්වතුන් හා ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ විශේෂ අවධානය යොමු වීම වැදගත් වේ.

**ඉංජි. ඩී.ඩී. ආරියරත්න**
ලේකම්, ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන
රාජ්‍ය අමාත්‍යාංශය.



## රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් වසන්ත බණ්ඩාර පලුගස්වැව මහතාගේ පණිවුඩය

මාර්තු 22 වන දිනට යෙදෙන ලෝක ජල දිනය සැමරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද සැමරුම් කලාපයට මම මෙම පණිවිඩය ලියමි. ජලය සම්බන්ධ බුද්ධිමතුන් සහ ජල අංශයේ අනෙකුත් පාර්ශ්වකරුවන් විශ්වාස කරන්නේ ජලයට වැඩි ප්‍රමුඛතාවයක්, වැඩි අවධානයක් හා වැඩි සැලකිල්ලක් දිය යුතු බවයි, ඒ වෙන කවරදාකටත් වඩා ජලයේ වටිනාකම දැනෙන බැවිනි. මේ නිසා එක්සත් ජාතීන්ගේ සංවිධානය මේ වසරේ ලෝක ජල දිනයේ තේමාව "ජලයේ වටිනාකම කිරීම" යනුවෙන් සකස් කරන ලද්දේ අහම්බයකින් නොවේ.

සාපේක්ෂව ශ්‍රී ලංකාව ජල හිඟ රටක් ලෙස නොසැලකේ. එහෙත් දේශගුණික විපර්යාස හේතුවෙන් පසුගිය දශක කිහිපය තුළ වර්ෂාපතන ව්‍යාප්තියේ අසමානතාවයන් තවදුරටත් උග්‍ර වී තිබේ. දේශගුණික විපර්යාස දකුණු ආසියානු කලාපයේ සෑම රටකටම පාහේ බලපා ඇත. ශ්‍රී ලංකාව දැන් අක්‍රමවත් වර්ෂාපතන රටාවන්ට මුහුණ දී සිටී. මෙම බලපෑම නිසා තෙත් කලාපයට වැඩි වැඩියෙන් ජලය ලැබෙන අතර, වියළි කලාපයේ ජල වෘත්තිකයන් දැඩි කරදරයකට ඇද දැමේ. අතීතයේ කළාක් මෙන් වර්ෂාපතනය ගැන අනාවැකි කීමට අපට දැන් හැකියාවක් නැත. එබැවින් වගා කාලයන් සැලසුම් කිරීම සහ විවිධ භාවිතයන් අතර ජලය බෙදාගැනීම අපහසුතාවයට පත් වී ඇත.

ජල දූෂණය ජනතාව විසින් සිදු කරනු ලැබේ. සියලුම ජල ප්‍රභවයන්, උල්පත්, ගංගා, ඒවායේ අතු ගංගා, වැව් හා විල් දූෂණය වී ඇත. වාරිමාර්ග ජල කළමනාකරණය පිළිබඳව නිසි අවධානයක් යොමු කර නොමැත. ජලයෙන් පොහොසත් යෝජනා ක්‍රමවල ගොවීන් තම වගාව සඳහා වැඩි ජල ප්‍රමාණයක් භාවිතා කරන අතර ජලය හිඟ ප්‍රදේශවල ප්‍රතිලාභීහු ජලය හිඟ වීමෙන් පීඩා විඳිති. මෙම පසුබිම තුළ ජලය අපගේ කුටුම්භ, ගොවිබිම්, ආහාර, සංස්කෘතිය, සෞඛ්‍යය, අධ්‍යාපනය සහ අපගේ ස්වාභාවික පරිසරයේ අඛණ්ඩතාව සඳහා අතිමහත් හා සංකීර්ණ වටිනාකමක් බවට පත්ව ඇත. මෙම අගයන්ගෙන් කිසිවක් අප නොසලකා හැරියහොත්, මෙම තීරණාත්මක සම්පත වැරදි ලෙස කළමනාකරණය කිරීමේ අවදානමක් ඇත. ශ්‍රී ලංකාව යනු ජල ශිෂ්ටාචාරයේ ඉතිහාසයෙන් පොහොසත් රටකි. වසර දහස් ගණනක් ගතවී ඇතත්, අපගේ කඳු පද්ධති ජලය ආරක්ෂා කර පිරිසිදු කරන්නේ කෙසේද යන්නත්, අපේ මුතුන් මිත්තන් ජලය ගබඩා කිරීම සඳහා තාක්ෂණය භාවිතා කළ ආකාරයත්, නවීන උපකරණ නොමැතිව ජල බෙදාහැරීමේ ජාලය සෑදූ ආකාරයත් ලෝකය තවමත් විශ්මයට පත් කර තිබේ. මහා පරාක්‍රමබාහු රජුගේ සුප්‍රසිද්ධ වචනවල ජීවත්වීමට කාලය පැමිණ තිබේ. "වැස්සෙන් ලැබෙන ජලය ස්වල්පයක්වත් මනුෂ්‍ය වර්ගයාට ප්‍රයෝජනවත් නොවී සාගරයට ගලා යා යුතු නැත".

පාසැල් දරුවන්ගේ සිට රටේ පරිපාලකයින් දක්වා සෑම පුද්ගලයෙකුගේම මනසට "ජලයේ වටිනාකම" ඇතුළත් කිරීමේ මෙම මෙහෙවරට ජාතියක් වශයෙන් අප එක්සත් විය යුතුය. මෙම සීමිත හා ආපසු හැරවිය නොහැකි සම්පතට ගරු කරන, අගය කරන සහ සංරක්ෂණය කරන ජාතියක් ලෙස අපි සෙසු ලෝකයට ආදර්ශයක් ලෙස ගොඩනැගෙමු.

**ඉංජි. වසන්ත බණ්ඩාර පලුගස්වැව**
ලේකම්
මහවැලි කලාපයේ ජනාවාසවල ඇළ හා පොදු යටිතල පහසුකම්
සංවර්ධනය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය



## වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් කේ. ඩී. නිහාල් සිරිවර්ධන මහතාගේ පණිවුඩය

2021 මාර්තු 22 වන දිනට යෙදී ඇති ලෝක ජල දිනය නිමිත්තෙන් සුබ පැතුම් පණිවිඩයක් එක් කරන්නේ ඉමහත් සතුටිනි. මෙවර ජල දිනයේ තේමාව වන්නේ ජලයේ සමාජ, ආර්ථික, පාරිසරික, කෘෂිකාර්මික හා සංස්කෘතිමය වටිනාකම් පිළිබඳව අවධානය යොමු කිරීමයි. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය අනුව මෙවර තේමාව මනාව ගැළපී ඇත. පෙර රජදරුවන්ගේ සිට පැවත එන අපිටම ආවේණික වූ වාරි කර්මාන්තය අපේ රටේ සමාජ, ආර්ථික හා සංස්කෘතිමය භූමිකාව තුළ කැපී පෙනෙන මානයකින් කටයුතු කරනු ලැබේ. අපේ රටේ වාරි කර්මාන්තය කෘෂි කර්මාන්තය පමණක් ඉලක්ක කරගත් ව්‍යාපෘතියක් නොවන අතර, එය ජාතිය ජීවත් කරවීමත්, පරිසරය සුරැකීමත් යන පුළුල් අරමුණු ඔස්සේ විකාශනය වූ විෂයකි. විශේෂයෙන් පානීය ජලය, කර්මාන්ත සඳහා අවශ්‍ය ජලය, ජල විදුලි බලය සඳහා අවශ්‍ය ජලය යන විවිධ වූ පැතිකඩ ඔස්සේ නිර්මාණය වූවකි. එහිදී කෘෂි කර්මාන්තය සඳහා වැඩි ජලය ප්‍රමාණයක් වැය කිරීමට සිදුවීම අපගේ ප්‍රධාන ආහාරය වූ බත සැපයීම වෙනුවෙන් සිදුවන්නකි.

ශ්‍රී ලංකාවේ ප්‍රථම වැව බසවක්කුලම නොහොත් අභය වැව පණ්ඩුකාභය රජතුමන් විසින් ඉදි කරන්නේ එකල අග නගරය වූ අනුරාධපුර නගරයට අවශ්‍ය ගෘහස්ත ජල පරිභෝජනය හා සංස්කෘතිමය කටයුතු සඳහා අවශ්‍ය වූ ජලය ලබා ගැනීමේ ප්‍රධාන අරමුණ සහිතවයි. ඊට අමතරව කෘෂි කර්මාන්තයට අවශ්‍ය ජලය ද එමගින් සපයනු ලැබීය. මේ අනුව කියවෙන්නේ අපේ වාරි කර්මාන්තය ජල සම්පත් ක්ෂේත්‍රයේ සියලුම අවශ්‍යතාවයන් ඉටු කර ගැනීම උදෙසා නිර්මාණය වූ කර්මාන්තයක් බවයි. ඉහත පරිදි ඓතිහාසික විකාශනයකින් පැවත එන වාරි කර්මාන්තය වර්තමාන අවශ්‍යතාවයන්ට සරිලන පරිදි සැලසුම් කිරීම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාලීන වැඩසටහනක් වී ඇත. ඒ අනුව අලුතින් ඉදිවන සෑම ජලාශයක්ම සැලැසුම් කිරීමේ දී කෘෂි කර්මාන්තයට අමතරව පානීය ජලය සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලබන අතර, පරිසර අවශ්‍යතාවය ද සැලකිල්ලට ගනු ලැබේ.

මෙසේ සියලු ජනතා අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ප්‍රමාණවත් වාර්ෂික වර්ෂාපතනයක් අප සතුවන අතර, විශාල ප්‍රාග්ධනයක් වැය වන ක්‍රියාවලියක් බැවින් රටට ඔරොත්තු දෙන පරිදි පියවරෙන් පියවර ඉටු කිරීම දෙපාර්තමේන්තුවේ අභිලාශයයි. මේ කාර්යයේ දී සියලුම රාජ්‍ය ආයතනවල මෙන්ම මහජනයාගේ සහයෝගය අත්‍යවශ්‍ය සාධකයක් බැව් සටහන් කිරීමට කැමැත්තෙමි.

**ඉංජි. කේ. ඩී. නිහාල් සිරිවර්ධන**
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්

# ලෝක ජල දින තේමාව උදෙසා වාරි කර්මාන්තයේ දායකත්වය

මෙවර ලෝක ජල දින තේමාව වශයෙන් තෝරාගෙන ඇති ජලයේ වටිනාකම යන්න ගත්කළ හුදෙක් ආර්ථිකමය නැතහොත් මූල්‍යමය වටිනාකම යන්නට හාත්පසින්ම වෙනස් වූ අර්ථයක් ඇත්තේය. යමක මූල්‍යමය වටිනාකම සැලකූ විට ඊට සමාන තවත් මූල්‍යමය වටිනාකමක් ඇති භාණ්ඩයක් සමඟ හුවමාරු කිරීමට හෝ ඒ දෙකම විකිණීමෙන් එකම මුදලක් ඉපයීමට හැකිවනු ඇත. එහෙත් තවත් ද්‍රව්‍යයකින් නැතහොත් භාණ්ඩයකින් කළ හැකි දේ අන් කිසිම ද්‍රව්‍යයකින් හෝ භාණ්ඩයකින් කළ නොහැකි නම් එය මිල කළ නොහැකි වන අතර, අමිල වේ. ඒ අනුව ජලය මෙලොව ඇති අමිල වූ සම්පත වන්නේය.

මෙලොව මොනතරම් මූල්‍යමය වටිනාකමින් යුත් රන් රිදී මුතු මැණික් හා නානාප්‍රකාර වූ ස්වභාවික ද්‍රව්‍යයන් මෙන්ම මිනිසා විසින් නිපදවන ලද සම්මතයේ ඇති භාණ්ඩ කොතෙකුත් ඇති නමුත් මේ කිසිවක් නොමැතිව මිය යන තුරුම ජීවත් වීමට මිනිසාට හැකියාව ඇත. එහෙත් ජලය නොමැත්තේ නම් මිනිසාට පමණක් නොව සතා සිවුපාවුන්ට ද සතියකට වඩා ජීවත් වීමට නොහැකි වනු ඇත. ඕනෑම ග්‍රහලෝකයක ජීවීන්ගේ පැවැත්ම උදෙසා අත්‍යවශ්‍ය සාධකය ජලයයි. ජලය නොමැති තැන ගහක් කොළක් නොපවතින්නේය. ගස කොළ නොමැති තැනක කිසිදු ආහාරයක් නිෂ්පාදනයක් කළ නොහැකිය. ගහ කොළ නොමැති ලෝකයක වායුගෝලයේ ඔක්සිජන් ප්‍රතිශතය පවත්වා ගත නොහැකි වන අතර, එවැනි පරිසරයක කුමන නම් ජීවයක්ද ?

මේ නිසාම පෙරදිග වැසියෝ ජලයට අති විශේෂ සැලකිල්ලක් ගෞරවයක් දැක් වූවා පමණක් නොව ඊට තම සංස්කෘතියේ විශේෂ ස්ථානයක් දී තිබුණි. මේ නිසාම මේ මිහිතලයට ජලය ලැබෙන ප්‍රධාන මාර්ගය වන වැස්ස ඔවුන් සලකනු ලැබුවේ දේවත්වයෙනි. එසේ කරන ලද්දේ භෞතික අගයක් දිය නොහැකි අසීමාන්තික වටිනාකමට තමාට දිය හැකි ඉහළම අගය දීම සඳහාය. එසේම වර්ෂාවෙන් ලැබෙන ජලය නිරපරාදේ මුහුදට ගලා යා නොදී එය මානවයාගේ අභිවෘද්ධිය හා යහපත පිණිස ඵලදායිව යොදා ගැනීම උදෙසා වැව් ඉදිකර ඒවා රැස් කිරීමට කටයුතු කළේය.

ඒ අනුව ක්‍රි.පූ. 5 වන සියවසේ පමණ සිට ආරම්භ වී මේ දක්වා මෙරට බිහි වූ වාරිකර්මාන්ත තුළින් අද වන විට වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් පාලනය වන විශාල ජලාශ 75ක හා මාධ්‍ය පරිමාණ වැව් 167ක ජලය මිලියන ඝන මීටර් 3,982 රඳවා ගැනීමට හැකියාව පවතී. මීට අමතරව මහවැලි අධිකාරිය මගින් පාලනය වන ජලාශ තුළ මිලියන ඝන මීටර් 3,157ක් හා අති විශාල කුඩා වැව් ප්‍රමාණයක ඇති ජල ගබඩා මානව වර්ගයාගේ පැවැත්ම උදෙසා දෙන දායකත්වය දෙස ඔබගේ අවධානය යොමු කිරීම මෙම ලෝක ජල දිනය සමරන අද දිනයේදී සිදු කරන්නේ නම් කිසිදාක ජල මූලාශ්‍රයකට කෙළ පිඩක් හෝ මුසු නොකරනු ඇත.

ඉහත ජලාශ බොහෝමයක් පානීය ජලය සැපයීම සඳහා ජල මූලාශ්‍රය ලෙස යොදා ගැනීමෙන් සලසන සේවයට අපට අගයක් දිය හැකි ද ? කුඹුරු අක්කර 1,500,000කට අධික ප්‍රමාණයකට ජලය සැපයීම තුළින් වාර්ෂික වී මෙට්‍රික් ටොන් 4,800,000 කට අධික ප්‍රමාණයක් සඳහා ඇති සහතික මිල මත පදනම්ව මිලක් දිය හැකි වුව ද මානව සංහතියේ කුසගිනි නිවීමට දෙන දායකත්වයේ අගය දැනෙනු ඇත්තේ ආහාර හිඟයක් ඇති වූ දාකම පමණි. ඒ සෘජුවම වාරි කර්මාන්ත තුළින් ජලයට එක් කරන අගයයි.

මීට අමතරව මිරිදිය ධීවර කර්මාන්තයටත්, භූගත ජල මට්ටම පවත්වා ගැනීමටත්, පරිසර සිසිලනයටත්, ගහ කොළවල පැවැත්ම තුළින් ඔක්සිජන් නිෂ්පාදනයටත්, දිය නෑම. ජල ක්‍රීඩා, විනෝද කටයුතු සඳහාත්, වන සතුන්ගේ පැවැත්ම උදෙසාත් දෙන දායකත්වය තුළින් මිහිතලයට සපයනු ලබන අගය කෙසේ නම් මිල කළ හැකි ද ?

වාරි කර්මාන්තවල මෙන්ම ජලසම්පතේ අගය අප පැරැන්නන් අතීතයේ සිටම දැන සිටි බව ධාතුසේන රජු විසින් එතුමාගෙන් වස්තුව ඉල්ලූ පුත් කාශ්‍යප කුමරුට තමා සතු වස්තුව ලෙසට කලා වැව පෙන්වීම තුළින් මොනවට පැහැදිලි නොවන්නේ ද? මේ අනුව සා පවස නිවන, කුසගිනි නිවන, ගහකොළ රකින, හුස්ම ගැනීමට මඟ සලසන, ආදේශකයන් කිසිදා බිහිකළ නොහැකි ජල සම්පතේ අගය මේ මිහිතලය පවතින තෙක් මොනයම් හෝ නිර්ණායකයක් මත නිශ්චිතවම ඇගයීමට කිසිදා නොහැකි වනවා මෙන්ම එම ජලය ගබඩා කරමින් සුරක්ෂිතව හා ඵලදායි ලෙස කළමනාකරණය කරන වාරි පද්ධතියට ද ඊට නොදෙවෙනි අගයක් හිමි වනු ඇත.

**ඉංජි. ඩබ්ලිව්. කේ.එස්. වික්‍රමපාල**
වාරිමාර්ග අධ්‍යක්ෂ
(භෞතික සම්පත් කළමනාකරණ)



# හම්බන්තොට පොළොන්නරුව පුත්තලම

# දිස්ත්‍රික්කවල ප්‍රධාන ජලාශවල ජලයේ ගුණාත්මක භාවය

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් විශාල කොටසක් කෘෂිකාර්මික අංශයේ නිරත වේ. එබැවින් ගොවීන්ට ප්‍රමාණවත්, ගුණාත්මක ජලය සැපයීම ඉතා වැදගත් වේ. සැම විටම ජල ප්‍රමාණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන නමුත් ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ අඩු සැලකිල්ලක් ඇත. දැනට ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල ජලයේ ගුණාත්මකභාවය අඩුවෙමින් පවතී. ජලයේ ගුණාත්මක ඉල්ලුම වගා කරන ලද බෝග වර්ගය මත බෙහෙවින් රඳා පවතී. සමහර බෝග ජලයේ ගුණාත්මකභාවයට ඉතා පහසුවෙන් ගොදුරු වේ. ජලයේ ගුණාත්මකභාවය යනු ජලයේ රසායනික, භෞතික හා ජීව විද්‍යාත්මක ලක්ෂණ වේ.

කෘෂිකර්මාන්තය හා සම්බන්ධ ජලයේ ගුණාත්මක ගැටලු රාශියක් ඇත. ඒවායින් සමහරක් වන්නේ ලවණතාව, සෝඩලිටි, ජලය තුළට කාන්දු වීමේ ගැටලු, පිරිවිතර විෂවීම හා යුට්‍රොෆිකේෂන් යනාදියයි. ලවණතාව යනු ක්ලෝරයිඩ්, කාබනේට් සහ කැල්සියම්, මැග්නීසියම්, සෝඩියම් සහ පොටෑසියම් වැනි බයිකාබනේට් වැනි ලවණ අඩංගු ජලයයි. සෝඩලිටි යනු වාරිමාර්ග ජලයේ ඇති සෝඩියම් ප්‍රමාණයයි. සෝඩියම් අතිරික්තයක් ඇති ජලය වාරි ජලය මඟින් පාංශු ව්‍යුහයට, ශාක වර්ධනයට හා බෝග අස්වැන්න කෙරෙහි අහිතකර ලෙස බලපායි.

එබැවින් වාරිමාර්ග ජලයේ ගුණාත්මකභාවය තීරණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම වැදගත්ය. එම පරාමිතීන් ඇගයීම සඳහා ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) මාර්ගෝපදේශ භාවිතා කළ හැකිය. ජල සැපයුමේ ගුණාත්මක භාවය පෙන්වා දීමේ පළමු පියවර වන්නේ මාර්ගෝපදේශයන් ය. ප්‍රධාන දර්ශක වන්නේ pH අගය, විද්‍යුත් සන්නායකතාව (EC) සහ සෝඩියම් අවශෝෂණ අනුපාතය (SAR) ආදියයි.

pH අගය යනු ජලයේ ආම්ලිකතාවය හෝ භාෂ්මිකත්වය පිළිබඳ දර්ශකයකි. වාරිමාර්ග ජලය සඳහා සාමාන්‍ය pH පරාසය 6.5 සිට 8.4 දක්වා වෙනස් වේ. සාමාන්‍ය පරාසයෙන් පිටත pH අගය සහිත වාරිමාර්ග ජලයේ පෝෂණ අසමතුලිතතාවයට හේතු විය හැක, නැතිනම් එහි විෂ අයන අඩංගු විය හැකිය. මෙය පරාසයෙන් බැහැර ජලය ගොවිතැනට බලපෑම් සිදුකරයි.

වාරිමාර්ග ජලයේ ලුණු ප්‍රමාණය විද්‍යුත් සන්නායකතාව (EC) මඟින් වක්‍රව මැනිය හැකිය. විද්‍යුත් සන්නායකතාව වැඩි නම් වැඩි ලුණු අන්තර්ගතයක් ඇත. සාමාන්‍ය වාරිමාර්ග ජලයේ 0.7 mmho / cm ට අඩු EC අඩංගු වේ.

සෝඩියම් උරාගැනීමේ අනුපාතය (SAR) යනු සෝඩියම් බලපෑමට ලක් වූ පස් කළමනාකරණය සඳහා භාවිතා කරන වාරිමාර්ග ජල තත්ත්ව පරාමිතියකි. ජලයේ ඇති සෝඩියම් ($Na^{+}$), කැල්සියම් ($Ca^{+2}$) සහ මැග්නීසියම් ($Mg^{+2}$) ශීර්ෂයන්ගේ සාන්ද්‍රණයෙන් තීරණය වන පරිදි එය කෘෂිකාර්මික වාරිමාර්ග සඳහා ජලය සුදුසු බව පිළිබඳ දර්ශකයකි. විශ්ලේෂණයෙන් තීරණය වන පරිදි එය පසක සෝඩලිටි උපද්‍රව සඳහා සම්මත රෝග විනිශ්චය පරාමිතියකි. ජලයේ අධික සෝඩියම් අයන පසෙහි පාරගම්‍යතාවයට බලපාන අතර ජලය කාන්දු වීම, පස දූෂණය වීම හා සම්පීඩනය වීම වැනි කරුණුවලට හේතු විය හැක. ජලය කාන්දු වීම හා ලබා ගත හැකි අස්වැන්න අඩුවීම හැරුණු විට, ඉහළ SAR මඟින් මතුපිට පස තාවකාලිකව සන්තෘප්ත වීම, පෝෂ්‍ය පදාර්ථ ප්‍රමාණවත් නොවීම සහ ශාක රෝග ඇතිවීමේ අවදානම වැඩි වීමට හේතු වේ. අවසාන වශයෙන් එම සාධක ශාකයේ වර්ධනයට සහ බෝග නිෂ්පාදනයට බලපායි.

හම්බන්තොට, පොළොන්නරුව සහ පුත්තලම් දිස්ත්‍රික්කවල තෝරාගත් ප්‍රධාන ජලාශවල ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ අධ්‍යයන කරන ලදී. මෙම දිස්ත්‍රික්ක ශ්‍රී ලංකාවේ වියළි කලාපයට අයත් වේ. වී වගා කිරීමට පෙර සහ වගාව අතර එක් එක් ජලාශයේ තෝරාගත් ස්ථානවලින් ජල සාම්පල තුනක් ලබා ගන්නා ලදී. pH, EC, $Na^{+}$, $k^{+}$, $Ca^{+2}$, $Mg^{+2}$, $HCO^{3-}$ සහ $CO^{3-}$ අයන සාන්ද්‍රණ තීරණය කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉඩම් පරිහරණ අංශයේ රසායනාගාරයේ දී මේ සියලුම ජල සාම්පල විශ්ලේෂණය කරන ලදී.

## පොළොන්නරුව දිස්ත්‍රික්කය

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රධාන ජලාශ කිහිපයක් තෝරා ගන්නා ලදී. ඒවා නම් ගිරිතලේ, කවුඩුල්ල, මින්නේරිය සහ පරාක්‍රම සමුද්‍රය ය. එක් එක් ජලාශයෙන් ජල සාම්පල දෙවරක් එකතු කරන ලද අතර සාමාන්‍ය pH අගය, සාමාන්‍ය EC සහ සාමාන්‍ය SAR අගයන් ගණනය කරන ලදී. එම ප්‍රතිඵල පහත 01 වගුවේ ලැයිස්තුගත කර ඇත.

FAO ජලයේ ගුණාත්මක මාර්ගෝපදේශයන්ට අනුව සියලු සාම්පලවල මනින ලද pH අගය සහ විද්‍යුත් සන්නායකතාව (EC) වාරිමාර්ග සඳහා පිළිගත හැකි පරාසයක පැවතුණි. එසේම මනින ලද සාමාන්‍ය SAR අගයන් අවස්ථා දෙකේදීම පිළිගත හැකි පරාසය තුළ විය. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියලුම ජල තත්ත්ව දර්ශක සාමාන්‍ය පරාසයක පවතී.

## හම්බන්තොට දිස්ත්‍රික්කය

හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් ප්‍රධාන ජලාශ තෝරා ගන්නා ලදී. ඒවා නම් යෝධකණ්ඩිය, තිසාවැව, ලුණුගම්වෙහෙර, රිදියගම සහ බඳගිරිය ය. සාමාන්‍ය pH අගය, සාමාන්‍ය EC සහ සාමාන්‍ය SAR අගයන් ගණනය කරන ලදී. එම ප්‍රතිඵල පහත 02 වගුවේ ලැයිස්තුගත කර ඇත.

01 වගුව

| පොළොන්නරුව දිස්ත්‍රික්කය | | | | | | |
|---|---|---|---|---|---|---|
| ජලාශ | වගාවට පෙර | | | වගා කිරීම අතරතුර | | |
| | pH | EC | SAR | pH | EC | SAR |
| FAO නිර්දේශ | 6.5 - 8.4 | < 0.7 | < 3 | 6.5 - 8.4 | < 0.7 | < 3 |
| ගිරිතලේ | 6.61 | 0.17 | 0.2 | 8.07 | 0.15 | 0.3 |
| කවුඩුල්ල | 6.75 | 0.26 | 0.4 | 7.86 | 0.16 | 0.4 |
| මින්නේරිය | 7.08 | 0.18 | 0.3 | 7.98 | 0.15 | 0.4 |
| පරාක්‍රම සමුද්‍රය | 7.23 | 0.26 | 0.3 | 8.12 | 0.12 | 0.4 |

02 වගුව

| හම්බන්තොට දිස්ත්‍රික්කය | | | | | | |
|---|---|---|---|---|---|---|
| ජලාශ | වගාවට පෙර | | | වගා කිරීම අතරතුර | | |
| | pH | EC | SAR | pH | EC | SAR |
| FAO නිර්දේශ | 6.5-8.4 | < 0.7 | < 3 | 6.5-8.4 | < 0.7 | < 3 |
| යෝධ වැව | 7.47 | 0.63 | 2 | 7.84 | 0.60 | 3.3 |
| තිසා වැව | 7.79 | 0.48 | 1.5 | 7.88 | 0.43 | 1.7 |
| ලුණුගම්වෙහෙර | 8.00 | 0.31 | 0.6 | 8.13 | 0.23 | 1.1 |
| රිදියගම | 7.92 | 0.33 | 0.5 | 7.64 | 0.37 | 1.5 |
| බඳගිරිය | 7.97 | 0.85 | 2.4 | 7.72 | 0.57 | 3.7 |
| වීරවිල | 8.03 | 0.45 | 3.18 | 7.89 | 0.40 | 2.4 |

03 වගුව

| පුත්තලම් දිස්ත්‍රික්කය | | | | | | |
|---|---|---|---|---|---|---|
| ජලාශ | වගාවට පෙර | | | වගා කිරීම අතරතුර | | |
| | pH | EC | SAR | pH | EC | SAR |
| FAO නිර්දේශ | 6.5-8.4 | < 0.7 | < 3 | 6.5-8.4 | < 0.7 | < 3 |
| ඉඟිණිමිටිය | 6.62 | 0.34 | 2.6 | 8.06 | 0.28 | 1.8 |
| තබ්බෝව | 6.69 | 0.47 | 5 | 7.96 | 0.44 | 3.1 |
| කොට්ටුකච්චිය | 5.99 | 0.56 | 4.2 | 8.05 | 0.54 | 3.9 |
| කරවිටාගාර | 6.52 | 0.34 | 2.3 | 7.79 | 0.22 | 2.5 |

FAO ජලයේ ගුණාත්මක මාර්ගෝපදේශයන්ට අනුව සියලුම සාම්පලවල මනින ලද pH අගය වාරිමාර්ග සඳහා පිළිගත හැකි පරාසයක පැවතුණි. කෘෂිකාර්මික කටයුතුවලට පෙර බඳගිරිය ජලාශයේ සාමාන්‍ය විද්‍යුත් සන්නායකතාව 0.7 මට්ටම ඉක්මවා ගිය නමුත් එය වගාව අතර සාමාන්‍ය පරාසය විය. යෝධකණ්ඩිය, බඳගිරිය සහ වීරවිල හි සාමාන්‍ය SAR අගයන් මධ්‍යස්ථ මට්ටම 3 ඉක්මවා ඇත.

## පුත්තලම් දිස්ත්‍රික්කය

පුත්තලම් දිස්ත්‍රික්කයෙන් ප්‍රධාන ජලාශ තෝරා ගන්නා ලදී. ඒවා ඉඟිණිමිටිය, තබ්බෝව, කොට්ටුකච්චිය සහ කරවිටගාරය ය. සාමාන්‍ය pH අගය, සාමාන්‍ය EC සහ සාමාන්‍ය SAR අගයන් ගණනය කරන ලදී. එම ප්‍රතිඵල පහත 03 වගුවේ ලැයිස්තුගත කර ඇත.

මනින ලද සාමාන්‍ය විදුලි සන්නායකතාව FAO ජල තත්ත්ව මාර්ගෝපදේශයන්ට අනුව වාරිමාර්ග සඳහා පිළිගත හැකි පරාසයක පැවතුණි. කෘෂිකාර්මික කටයුතුවලට පෙර කොට්ටුකච්චිය ජලාශයේ pH අගය පිළිගත හැකි අගය වන 6.5 ට වඩා පහත වැටී ඇත. අවස්ථා දෙකේදීම තබ්බෝව සහ කොට්ටුකච්චියෙ හි සාමාන්‍ය SAR අගයන් මධ්‍යස්ථ මට්ටම 3 ඉක්මවා ඇත. පුත්තලම් දිස්ත්‍රික්කයේ අනෙකුත් ජලාශ හා සසඳන විට කොට්ටුකච්චිය ජලාශයේ pH අගය සහ SAR යන දෙකම ඉහළ අගයක් ගනී. වගාව අතර සාමාන්‍ය pH අගය වැඩි කරන ලදී. එම සංඛ්‍යා ලේඛනවලට අනුව පුත්තලම් දිස්ත්‍රික් ජලාශවල ජල තත්ත්ව දර්ශක අනෙකුත් දිස්ත්‍රික්කවලට සාපේක්ෂව මධ්‍යස්ථ මට්ටමක පවතී. අධික සෝඩියම් සාන්ද්‍රණය පාංශු විසුරුවා හැරීමට හා මැටි ස්ථර ඉදිමීමට බලපායි. පාංශු විසුරුවා හැරීම නිසා මැටි අංශු පාංශු සිදුරුවලට සම්බන්ධ වන අතර එමඟින් පසෙහි පාරගම්‍යතාව අඩු වේ. පස තෙත් කිරීම හා වියළීමකට ලක් වූ විට, මැටි විසරණය සිදු වන අතර, පසුව එය දුර්වල ව්‍යුහයක් සහිත සිමෙන්ති වැනි පසකට ප්‍රතිසංස්කරණය කර ශක්තිමත් කරයි. සෝඩියම් ප්‍රේරිත විසරණය නිසා ඇති වන ප්‍රධාන ගැටලු වන්නේ ආක්‍රමණය අඩු වීම සහ මතුපිට පෘෂ්ඨයය. එබැවින් පසෙහි ජලය රඳවා ගැනීම ක්‍රමයෙන් අඩු වේ.

ලවණ හා අපිරිසිදු පස ශුෂ්ක හා අර්ධ ශුෂ්ක කලාපවල සහ දුර්වල ස්වාභාවික ජලාපවහන ප්‍රදේශවල පවතී. එම ප්‍රදේශවල ලවණතාව කළමනාකරණය කිරීමෙන් සැලකිය යුතු ප්‍රගතියක් ලබා ගත හැකිය. වාරිමාර්ග සංඛ්‍යාතය වැඩි කිරීම සහ නිසි ලෙස වගා කිරීම තුළින් ලුණුවල බලපෑමට ලක් වූ පස් ගොඩ කිරීම අතිරික්ත අයන සේදීම හිතකර වේ. පස සුව කිරීමට බොහෝ කාලයක් ගතවනු ඇත. වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් වාරිමාර්ග ජලයේ ගුණාත්මකභාවය තක්සේරු කිරීම සඳහා වැඩිදුර අධ්‍යයන සිදු කරනු ලැබේ.

ජේ. ඒ. පී. එස්. ජයලත්
(සහකාර පාංශු රසායනඥ)
භූමි පරිභෝජන අංශය
වාරිමාර්ග දෙපාර්තමේන්තුව



# යාන්ඔය ජලාශය සමඟ යළි පිබිදෙන පරිසරය



ජලය පරිසරයේ පැවැත්මට බලපාන මූලික සාධකයක් වන අතර මිහිතලය මත ජීවය පවත්වා ගැනීම සඳහා අමිල මෙහෙයක් ඉටු කරයි. ජල සම්පත මහත් ගරුත්වයෙන් සැළකූ දේශයක් ලෙස ශ්‍රී ලාංකිකයින් අනාදිමත් කාලයක සිට ජල කළමනාකරණයේ නවමු සංකල්පයන් අත්හදා බලමින් ජනතාවට මෙන්ම, පරිසරයටද ප්‍රතිලාභ සැපයූ විශිෂ්ඨ වාරි ඉතිහාසයක උරුමකරුවන් වේ.

වර්තමානය වන විට සමස්ත ලෝකයම උග්‍ර ජල අර්බුදයකට මුහුණ දී සිටින අතර, ශ්‍රී ලංකාව කෙරෙහි එහි අවම බලපෑමට හේතු වන්නේ ද අපගේ අතීත ජල කළමනාකරණයට නවමු අගයන් එක් කරමින් ශ්‍රී ලංකා රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන තිරසාර ජල කළමනාකරණ ප්‍රතිපත්තීන් වේ. මෙහිලා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන විශාල ප්‍රමාණයේ වාරි ව්‍යාපෘති අනුපමේය මෙහෙයක් ඉටු කරයි.

ශ්‍රී ලංකාවේ ඊසාන දිග ප්‍රදේශය, ස්වභාවයෙන්ම ශුෂ්ක දේශගුණයකට හිමිකම් කියන අතර අවුරුදු 30 ක සිවිල් යුධමය තත්ත්වයකට යටත්ව තිබූ හෙයින් රජය විසින් ක්‍රියාත්මක කරන ලද විශාල සංවර්ධන ව්‍යාපෘතීන් යටතේ සංවර්ධනය සඳහා අවධානය යොමු නොවූ ප්‍රදේශයකි. වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් වර්ෂ 1947 දී ශ්‍රී ලංකාවේ ඊසාන දිගට දිවෙන පස්වන දිගම ගඟ සේ සැලකෙන යාන් ඔය, වාහල්කඩ ප්‍රදේශයෙන් හරස්කොට ජලාශයක් නිර්මාණය සඳහා සැලසුම් කර තිබුණ ද විවිධ හේතූන් නිසාවෙන් එම සැලසුම් ද ක්‍රියාත්මක නොකෙරුණි.

මෙම ප්‍රදේශය සංවර්ධනය සඳහා රජයේ අවධානය යොමු වීමෙන් පසු යාන් ඔය හරස් කරමින් ජලාශයක් ඉදිකිරීමේ සැලසුම් මල්ඵල දැරූ අතර, උතුරුමැද පළාතේ දැනට ඉදිකර ඇති විශාලතම ජලාශය ලෙස වර්ෂ 2013 දී ආරම්භ වන්නේ ශ්‍රී ලංකා රජයේ මූල්‍ය දායකත්වය, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තාක්ෂණික දැනුම හා උපදේශනයද, චීන කොන්ත්‍රාත් සමාගමක් වන CAMC ආයතනයේ ඉදිකිරීම් ශක්‍යතාව ද එකට එක් කරමිනි.



මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේ එවකට දැඩි ජල අවශ්‍යතාවයකින් හෙබි ශ්‍රී ලංකාවේ ඊසාන දිග කොටසේ ජල අවශ්‍යතාව සැපිරීම වන අතර, මෙම ජලාශය මගින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ උතුරු කොටසේ මහා වාරිමාර්ග ව්‍යාපෘතියක් වන පදවිය ව්‍යාපාරය ඇතුළු අනෙකුත් ප්‍රදේශයන්හි කෘෂිකාර්මික සංවර්ධනය මෙන්ම පානීය ජල අවශ්‍යතාවය සපුරනු ලැබේ.

ලොව පුරා සිදුවන බොහෝ සංවර්ධන ව්‍යාපෘතීන් මිනිසාගේ පැවැත්ම උදෙසා හා ඔහුගේ සුවපහසුව පමණක්ම අරමුණු කර ගනිමින් සිදුකරන අතර භෞතික හා ස්වභාවික පරිසරයේ පැවැත්ම යන දෙකම අරමුණු කරගනිමින් ඉදිවන සංවර්ධන ව්‍යාපෘතීන් අල්පය. අප රට තුළ ක්‍රියාත්මක වන අධිවේගී මාර්ග, වෙළඳ නගර හා කර්මාන්තපුර හුදෙක් මානව යහපැවැත්ම සඳහා ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්වලට මනා උදාහරණයන් සපයයි. මෙම ව්‍යාපෘතින් ඉදිකිරීමේ දී වගුරුබිම්, වනාන්තර ආදී ස්වභාවික සම්පත් විනාශ වන අතර එම ව්‍යාපෘති ඉදිකිරීමෙන් පසුව වුවද පෙර මෙන් පරිසර හිතකාමී තත්ත්වයන් නිර්මාණය නොවේ. බොහෝ සංවර්ධන ව්‍යාපෘතීන් ඉදිකිරීම් අවස්ථාවේ මෙන්ම ඉදිකිරීම් අවසන් වන විට ශේෂය ලෙස පරිසර දූෂණය හෝ පරිසර හායනය ද සිදුවේ.

වාරි ඉදිකිරීම් සාම්ප්‍රදායික සංවර්ධන ව්‍යාපෘතීන් වලින් වෙනස් වන අතර, ඒවා මගින් මිනිසාගේ යහපත මෙන්ම පාරිසරික සංතුලනයද අරමුණු වේ. පෙර සඳහන් කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් හා සසඳන කළ වර්ෂය පුරාවට ඉතා ශුෂ්ක වියළි කාලගුණයක් හා මි.මී. 1500 ට අඩු වාර්ෂික වර්ෂාපතනයකින් යුතු මෙම ප්‍රදේශයට වසරේ මාස කිහිපයක් තුළ ලැබෙන වර්ෂා ජලය රැස්කර ප්‍රයෝජනයට ගැනීම සඳහා විශාල ජලාශයක් නිර්මාණය කිරීම වඩාත් සුදුසු සංවර්ධන තෝරාගැනීමක් වේ. එය මෙම ප්‍රදේශයේ ජනතාවගේ මෙන්ම ශාක හා සත්ත්ව ප්‍රජාවගේද යහපතට හේතුවන තීරණයකි. එමගින් මෙම ප්‍රදේශයේ පවතින ශුෂ්ක පාරිසරික තත්ත්වය අවම කරන අතර, මෙය මිනිසාගේ සෞඛ්‍ය යහපැවැත්මට සේම ශාකවල පැවැත්මට ද මහෝපකාරී වේ. මෙවන් විශාල ජලාශයක් නිර්මාණය කිරීම තුළින් ජලාශය අවට ක්ෂුද්‍ර දේශගුණික තත්ත්වයක් නිර්මාණය වන අතර, එය ආසන්න ප්‍රදේශ වලට වර්ෂාපතනය වැඩිකිරීම සඳහා මනා පිටුවහලක් සැපයේ. එය සෘජුව මෙන්ම වක්‍රව ද පාරිසරික පැවැත්මට හේතුවේ.

හෙක්ටයාර 4100ක විශාලත්වයෙන් යුතු මෙම ජලාශය ඉදිකිරීමේදී හෙක්ටයාර 1500 ඉක්මවූ වනාන්තර ප්‍රමාණයක් ජලයෙන් යටවූ අතර මෙසේ වනාන්තර භූමි ජලාශයක් සඳහා වෙන් කිරීම පිළිබඳ විවිධ විවේචන හා අදහස් මතුවිය. කෙසේ වෙතත් ජලාශය මගින් එහි එක් අන්තයකට මායිම් වන පඹුරුගස්හින්න රක්ෂිතයේ ශාක හා වන සතුන්ගේ ජල අවශ්‍යතාව වර්ෂය පුරාවට සැපයීමේ කාර්යභාර්ය ඉටුකරලයි. මෙම ප්‍රදේශයට පවතින දැඩි නියං සමයේදී පවා රක්ෂිතයට සීමා වූ වන සතුන්ට මෙම ජල මූලාශ්‍රය මගින් ජීවය සපයන අතර ජලාශය හා රක්ෂිත වනාන්තරය යා කෙරෙන තෘණ භූමි ප්‍රදේශය වන සතුන්ට ආහාර සඳහා මනා පිටුවහලක් එක් කරයි. ජලාශය මගින් භූගත ජල මට්ටම ඉහළ නැංවීම කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරන අතර එමගින් ජලාශය අවට වනාන්තර වර්ධනය හා රඳාපැවැත්ම තහවුරු කරනු ඇත.

රක්ෂිතය මැදින් සමෝච්ච ඇළ මාර්ගයක් ලෙස දිවෙන දකුණු ඉවුර ඇළ මගින් රක්ෂිතයට අයත් වැව් අමුණු වර්ෂය පුරාවට ජලයෙන් පුරවාලන අතර මෙම ප්‍රදේශයේ අත්හැර දමා තිබූ වැව් 06ක් පුනරුත්ථාපනය සිදුකරමින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට අයත් ජන ශූන්‍ය ප්‍රදේශයන් සංවර්ධනය කිරීම ආරම්භකර ඇත. ඒ අනුව මෙම වැව් යටතේ කුඹුරු ඉඩම් දහස ඉක්ම වූ ප්‍රමාණයක් යල මහ කන්න දෙකම වගාකළ හැකිවේ. ඇළ මාර්ග හා වැව් සංවර්ධනය මගින් ප්‍රදේශයේ භූගත මෙන්ම මතුපිට ජල මට්ටමද ඉහළ යන අතර එමගින් පාරිසරික ගුණාංගයන් (Environmental quality) ඉහළ යනු ඇත.

මිනිසාගේ පමණක් නොව ශාක මෙන්ම සත්ත්ව ප්‍රජාවගේ ද පැවැත්ම උදෙසා ඉදිවන මෙවැනි මහා පරිමාණ ව්‍යාපෘති ඉදිකිරීමේ දී පරිසරයට විශාල ලෙස බලපෑම් ඇතිකරන බව කිව යුතුය. යාන්ඔය ජලාශය ඉදිකිරීමේ දී විශාල වනාන්තර ප්‍රමාණයක් ජලාශයට මෙන්ම අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා ඉවත් කෙරුණද එහි බලපෑම අවම කර ගැනීම සඳහා නැවත වන වගා වැඩසටහන් (Replanting programs) හා පෝෂණ වන වගා (Enrichment programs) වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ව්‍යාපෘතිය විසින් දැනටමත් ආරම්භ කර ඇත. එසේම ඉදිකිරීම් හේතුවෙන් බලපෑමට ලක්වූ වනාන්තර ආරක්ෂා කර ගැනීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා එක්වී ව්‍යාපෘතිය අවට ශේෂව ඇති වනාන්තර භූමි සඳහා මායිම් සලකුණු කිරීම ආරම්භ කර ඇත.

එසේම, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා එක්ව ආසන්න රක්ෂිත ප්‍රදේශයේ ක්ෂේත්‍ර කාර්යාල පිහිටුවා වන සතුන් කෙරෙහි වන්නාවූ මානව බලපෑම අවම කිරීමටත්, අලි මිනිස් ගැටුම් පාලනය සඳහා අලි වැටවල් ඉදිකිරීමටත්, වන සතුන්ගේ සංචරණය උදෙසා පහසු මාර්ග (eco overpasses) ඉදිකරමින් ඔවුනට නිදහසේ ජීවත්වීම සඳහා වූ අයිතිය තහවුරු කිරීමට කටයුතු කර ඇත. එසේම ජලාශයට ජලය පුරවන අවස්ථාවේදී සිරවී සිටි සතුන් දහස ඉක්ම වූ ප්‍රමාණයක් ඉවත් කිරීම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සම්පූර්ණ සහයෝගය සහිතව සිදුකරමින් එය තවදුරටත් තහවුරු කර ඇත.

ජලාශය ජලයෙන් පිරවීමෙන් පසු ඉතා කෙටි කාල සීමාවක දී සංචාරක පක්ෂීන් හා අනෙකුත් ජලාශ්‍රිත පක්ෂීන්ගේ වාසස්ථානයක් බවට පත්ව ඇත. ශේෂ වූ ශාක කඳන් සහිත ජල පෘෂ්ඨය ඔවුනගේ පැවැත්ම සඳහා නොමඳ සහයෝගයක් ලබා දෙන අතර, සංචාරක පක්ෂීන්ගේ අභිජනනය හා වර්ධනය සඳහා සුදුසු පාරිසරික තත්ත්වයක් නිර්මාණය කර ඇත. මෙම ප්‍රදේශය පුරා පවතින කුඩා වැව් නියඟයත් සමඟ සිඳී ගිය ද, එවැනි ශුෂ්ක පරිසර තත්ත්වයකදී වුව ද මෙම සුවිශාල ජලාශය නොසිඳෙන බැවින් මෙම ප්‍රදේශයේ මිනිස් ප්‍රජාවට මෙන්ම ශාක හා සත්ත්ව ප්‍රජාවට ද ජලාශය මගින් සිදුවන්නේ අමිල සේවාවකි. එය හුදෙක් එක් එක් අංශ වශයෙන් වෙන්කර දැක්විය නොහැකි අතර, අවුරුදු 30 ඉක්ම වූ යුධමය තත්ත්වය, ශුෂ්ක දේශගුණික තත්ත්වය හා ඉදිකිරීම් ඇතුළු අනෙකුත් මානව ක්‍රියාකාරකම් ආදී වූ හේතූන් නිසාවෙන් හායනයට ලක්වූ සමස්ත පරිසර පද්ධතියම යථාතත්ත්වයට පත්කිරීමට සමත්ව ඇත.

සංවර්ධනය සඳහා වූ ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම ඉතා සංකීර්ණ මෙන්ම අපහසු ක්‍රියාවලියක් වන අතර, මෙහිලා මිනිසා වෙනුවෙන් පමණක් නොව ශාක හා සත්ත්ව ප්‍රජාව ඇතුළු සමස්ත පරිසරය පිළිබඳවම සංවේදීව තීරණ ගැනීම අත්‍යවශ්‍ය කරුණකි. පොදුවේ ගත් කළ වාරි සංවර්ධන ව්‍යාපෘති සමස්ත පරිසර පද්ධතිය කෙරෙහිම හිතකර බලපෑම් ඇතිකරන අතර, එම ව්‍යාපෘති ඉදිකිරීමේ දී සිදුවන පාරිසරික බලපෑමද ඉදිකිරීමෙන් පසු සැලකිය යුතු ලෙස අවම කරගත හැකිවනවා සේම නිවැරදි සැලසුම්කරණය මගින් එම බලපෑම් ද වළක්වාගත හැක.

විශාල මෙන්ම කුඩා ප්‍රමාණයේ වුවද නිවැරදි ලෙස සැලසුම් කළ වාරි ව්‍යාපෘතීන් තුළින් සමස්ත පරිසර පද්ධතිය වෙත හිතකර බලපෑම් ඇතිකළ හැකි අතර සමස්ත ලෝක ප්‍රජාවම පරිසරය හායනය හේතුවෙන් බලපෑමට ලක්ව සිටින මෙහොතක මෙවැනි පරිසර හිතකාමී ව්‍යාපෘතීන් සඳහා ප්‍රමුඛතාවය ලබා දීම මෙන්ම අවධානය යොමු කිරීම ද එක්ව කටයුතු කිරීමද අත්‍යවශ්‍ය කරුණකි.



**පවිත්‍රා ප්‍රනාන්දු**
පාරිසරික නිලධාරී,
යාන්ඔය ජලාශ
ව්‍යාපෘතිය



# සිහින සැබෑ වන මොරගහකන්ද

වසර සියදහස් ගණනක් පුරාවට ගොවිතැන මූලික කරගෙන ජීවත් වූ අපේ මුතුන්මිත්තෝ කල්යල් බලා ගොවිතැන් කිරීමේ කලාව අතැඹුලක් සේ දැන සිටියෝය. වර්ෂාව ලැබෙන කාලය අනුව තම ගොවිතැන ආරම්භ කළ ඔවුහු ලක්දිව පුරා වැව් අමුණු තනමින් දැවැන්ත වාරි ශිෂ්ඨාචාරයකට අඩිතාලම් දැමුවෝය. කාලයත් සමඟ දේශගුණ රටාවන් වෙනස් වූ අතර, වෙනස් වන දේශගුණ රටාවන්ට අනුගත වීම අප ඉදිරියේ ඇති අභියෝගයකි. වර්ෂාව ලැබෙන කාලයට අධිකව වර්ෂාව ලැබීමත්, වර්ෂාව නොලැබෙන කාලයට දැඩි නියගයත් පසුගිය දශක කිහිපය පුරාවට අපහට අත් විඳින්නට සිදුවිය.

දේශගුණික විපරියාසයන්ට මුහුණදිය හැකිවන ලෙස නව වාරි නිර්මාණ ඇති කිරීම දැවැන්ත අභියෝගයකි. මොරගහකන්ද ජලාශය ද මෙම අභියෝග ජය ගැනීම සඳහා ඉදිකළ නිර්මාණයකි.

ඇලහැර අමුණට ඉහලින් ඉදිකර ඇති මොරගහකන්ද ජලාශය අක්කර අඩි 422000ක ජල ධාරිතාවකින් යුක්තය. මොරගහකන්ද ජලාශය මාතලේ ජල පෝෂක කලාපයෙන් පෝෂණය වන අතර, බෝවතැන්න ජලාශය හරහා ඉහළ මහවැලි පෝෂක කලාපයේ ජලය ද ලබාගත හැක. මෙම ජලාශය තැනීමේ අරමුණ නම් ඇලහැර අමුණ වෙත පැමිණෙන ජලය රඳවාගෙන නිසි නියාමනයක් සිදු කිරීමයි. වර්ෂා කාලයට ඇලහැර අමුණ වෙත අධික ජල ප්‍රමාණයක් ගලා එන අතර, එම ජලය අඹන්ගඟ ඔස්සේ මහවැලි ගංගාවට ප්‍රයෝජනයකින් තොරව ගලා යයි. නමුත් ඇලහැර අමුණට ඉහලින් මොරගහකන්ද තනා එම ජලය රඳවා ගැනීම තුළින් ඇලහැර, මින්නේරිය, ගිරිතලේ, කවුඩුල්ල සහ කන්තලේ ජලාශ යටතේ අක්කර 80,000කට ආසන්න ගොවි බිම් ප්‍රමාණයක් පෝෂණය කිරීමේ හැකියාව ලැබේ. එමෙන්ම වර්ෂාව වැඩි කාලයට ජලය රදවා ගැනීම තුළින් ගංවතුර පාලනයක් ද සිදු වේ. මීට අමතරව ඉදිරියේදී අනුරාධපුරදිස්ත්‍රික්කයේ වාරි කර්මාන්තයට මොරගහකන්ද ජලාශය මගින් ජලය ලබා දීමට සැලසුම් කර ඇති අතර, මෙම ඇළ මාර්ගයේ ඉදිකිරීම් කටයුතු දැනටමත් ආරම්භ කර ඇත. මේ අතිරික්ත ජල අවශ්‍යතාවය සඳහා ජලය සැපයීමට කළුගඟ ජලාශය ඉදිකර ඇති අතර, කළුගඟ ජලාශය මගින් මොරගහකන්ද ජලාශයට ජලය සැපයෙන උමං මාර්ගයේ ඉදිකිරීම් ද ආරම්භ කර ඇත.

මොරගහකන්ද ජලාශයෙන්, ඇලහැර මින්නේරිය යෝධ ඇළ ඔස්සේ අක්කර 16500 කින් යුතු ඇලහැර ගොවිබිම් සඳහා ජලය ලබාදෙන අතර, අක්කර අඩි 110000කින් යුත් මින්නේරිය ජලාශය පෝෂණය කරනු ලබයි. මින්නේරිය ජලාශයේ සිට මින්නේරිය – කන්තලේ යෝධ ඇල ඔස්සේ අක්කර අඩි 104000 ක ධාරිතාවකින් යුත් කවුඩුල්ල ජලාශයටත් අක්කර අඩි 114000ක ධාරිතාවකින් යුතු කන්තලේ ජලාශය දක්වාත් ජලය ලබා දිය හැක. එසේ නමුත් මින්නේරිය කන්තලේ යෝධ ඇළ පිහිටා ඇති උස් මට්ටම අනුව කවුඩුල්ල සහ කන්තලේ දක්වා ජලය නිකුත් කිරීමට මින්නේරිය ජලාශයේ අවම අක්කර අඩි 70000ක ජල ප්‍රමාණයක් පැවතිය යුතුය.

එම හේතුව නිසා ඇලහැර සහ මින්නේරිය ගොවි ජනපද වල කන්නය ආරම්භයට පෙර කවුඩුල්ල සහ කන්තලේ ජලාශවලට ජලය නිකුත් කර කන්නය ආරම්භයට අවශ්‍ය ජලය රැස් කරගත යුතුය. මක් නිසාද යත් කවුඩුල්ල සහ කන්තලේ ගොවිහු දෑස් දල්වා බලා සිටින්නේ නියමිත කාලයට ජලය ලැබී කන්නය ආරම්භ කිරීම සඳහාය.

මේ හේතුව නිසා මොරගහකන්ද ජලාශයේ ප්‍රතිලාභ ගොවි ජනතාවට ලබා දීමට නම් එම ජලාශය මගින් නියමිත කාලයේදී ජලය බෙදාහැරීමේ කටයුතු සිදු කළ යුතුය. නියමිත කාලයට ගොවි බිම් සඳහා ජලය ලබා දීමට මනා ජල කළමනාකරණයක් අත්‍යවශ්‍ය වේ. මේ වන විට ගොවි ජනතාව වැඩි වශයෙන් වී වගාවට යොමුවී ඇති අතර, ජලාශවල ජලය අඩු කාලවල දී අස්වැන්න සඳහා වන ඉල්ලුම සලකා අතුරු බෝග වගාවට යොමු වීම තුළින් ආහාර අපනයනය වෙනුවට මෙරට තුළම ආහාර නිෂ්පාදනය සිදු කළ හැක.

මොරගහකන්ද ජලාශය තැනීමට පෙර පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කවුඩුල්ල ජලාශය යටතේ ජලය හිඟකම නිසා කන්න කිහිපයක්ම වගා කිරීමට නොහැකි විය. නමුත්, මොරගහකන්ද ජලාශය ඉදිවීම නිසා වර්ෂාව අධික කාලයට අඹන්ගඟ ඔස්සේ මහ මුහුදට ගලා ගිය ජලය රඳවා ගැනීම තුළින් කවුඩුල්ල ජලාශය යටතේ වගා කරන ගොවි මහතුන්ට අවශ්‍ය කාලයට ජලය ලබා ගැනීමට හැකි වී ඇත. ඒ අනුව 2020 වර්ෂයේදී අතරමැදි කන්නයක් ලෙස කවුඩුල්ල ජලාශය යටතේ ඉපනැල්ලේ මුං වගාවට සාර්ථක ආරම්භයක් ලබා ගැනීමට හැකි විය. එමෙන්ම කවුඩුල්ල ජලාශය යටතේ බිසෝපුර හා දම්සෝපුර යන නව වගා බිම් සඳහා ද ජලය ලබා ගැනීමට බලාපොරොත්තු දැල්වී ඇත. රජරට වාරි ක්ෂේත්‍රයේ නව මාවතක ආරම්භය සනිටුහන් කරමින් ඉදිකළ මොරගහකන්ද අටුකොටු පිරෙන හෙට දවසක ගොවි ජනතාවගේ සිහින සැබෑවීමකි.



ඉංජි. පී.ජී. දඹෝරගම
ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු,
කවුඩුල්ල කොට්ඨාසය.

## වාරිමග සදනත් - නොවෙද මිහිපිට දෙවියන්

කෘශව සුදුමැලිව ගිය
දෙඅත් දිගුකර අහසට
මිහිපිට තිබෙන දෙවොලෙහි
නුදුටු දෙවියන් යදිමින
ඉල්ලමින් ඉරී තැලුණු දෙරණත
තෙමා සනසන මහරු දියබිඳ

දුක් ගීයක්ම වූ විට
දෙවියන් යදින යාදිනි
අසරණය ගොවි පියවරු
නිවනට නොහැකි දරුවන්ගේ කුසගිනි

දෙවියන් වැඩ සිටිති යැයි
දැන සිටිය විසල් නුබ කුස
දෙවියන්වත් නුදුටු
නිවී ගිය ලිපගිනි

හරස්කර මහ ජල කඳ
ගලා බස්නා සිදු වෙත
පෙන්වා වාරි විස්කම්
සදා මහ වැව් ගම්දෙර

දැන ඒ මහරු සේවය
වැසි දිය හසුරුවා සිරිලක
සසිරිමත් කරන දැක්මෙන
නියං සායද පැරදවිය හැක

තෙමා වියැලුණු ගොවි බිම්
නිවා දුක්ගිනි එදනත්
වාරි මග සදනත්
නොවෙද මිහිපිට දෙවියන්

නදීශානී වත්සලා රත්නායක
කළමනාකරණ සේවා නිලධාරී II
ප්‍රාදේශීය වාරිමාර්ග කාර්යාලය,
වාරියපොල.

# මියවාකි ක්‍රමය භාවිතයෙන්

## ඉදිකිරීම් වැඩබිම් ආශ්‍රිතව

## නැවත වන වගාව මඟින් ජල සම්පත රැක ගැනීම

අභ්‍යවකාශයේ සිට බලන විට නිල් පැහැයෙන් දිස්වන ජීවය පැවතීමට අවශ්‍ය ජලය, ඔක්සිජන් හා ආහාර ඇතුළු සියලු තත්ත්වයන් පවතින සෞරග්‍රහ මණ්ඩලයේ එකම ග්‍රහ වස්තුව වන පෘථිවිය රැක ගැනීම උදෙසා මිනිසා වගකිව යුතුයැයි ජපන් ජාතික පරිසර විද්‍යාඥ මහාචාර්ය මියවාකි මහතා නිරන්තරයෙන් ප්‍රකාශ කරයි. ඔහුගේ නමින්ම ලොව පුරා ප්‍රචලිතව ඇති ක්‍රමවේදය මඟින් වසර 30ක් පමණ වූ කාලයක් තුළ අධි ඝණත්වයෙන් යුත් සදාහරිත වනාන්තරයකට බොහෝ සෙයින් සමානකම් දක්වන වන වගාවන් මුඩු බිමක් තුළ ස්ථාපිත කළ හැකි වේ. එවැන්නක ශාක පත්‍ර වර්ගඵල දර්ශකය සාමාන්‍ය වානාන්තරයක මෙන් තිස් ගුණයක් පමණ වන අතර ඉතා ඉහළ ජෛව විවිධත්වයක් දරයි.

විවිධාකාර වූ අහිතකර මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් සහ නිරන්තරයෙන් ඇතිවන වර්ෂාව සහ සුළඟ නිසා භූමියෙහි පාංශු ඛාදනය වී ගල් බොරළු ඉතිරිව නිසරු ශුන්‍ය භූමි බවට පත් වෙයි. එවැනි ස්ථාන වලට සුළඟින් සහ සතුන්ගේ සම මත ඇවටි එන්නාවූ බීජ මඟින් වල් පැළෑටි බෝවීම සිදුවේ. නැවතත් දැඩි හිරු රශ්මිය නිසා විනාශ වෙමින්ද යළි වර්ෂා සමය එළඹීමත් සමඟ ඉපදෙමින් යළි යළිත් මැරී ඉපදෙන තෘණ වර්ග නිසා වසර දහයක් පමණ කාලයකදී මතුපිට පස මත ඓන්ද්‍රිය ද්‍රව්‍ය එකතු වී තරමක් යහපත් පරිසරයක් ඇතිවේ. එය මත සතුන්ගෙන් හා සුළඟින් ව්‍යාප්ත වන බීජ මඟින් ලදු කැලෑ සහ පතනශීලි ශාඛා බිහිවී ප්‍රාථමික වනාන්තර බිහිවේ. මේ සඳහා වසර 70ක් හෝ ආසන්න කාලයක් ගතවේ. එසේ වන්නේ ද කිසිදු අහිතකර මිනිස් ක්‍රියාකාරකමක් සිදු නොවුනහොත් පමණි. මේ අකාරයෙන් පැවැතියහොත් ස්වභාවික වරණ වාදය අනුව යමින් වසර 300ක දී පමණ බහු ස්ථරීය අධි ඝණත්ව වනාන්තරයක් බිහිවෙයි. නමුත් අප මියවාකි ක්‍රමවේදය අනුගමනය කළහොත් වසර 30ක් වැනි කාලයක දී බහු ස්ථරීය අධි ඝණත්වයෙන් යුත් වනාන්තරයක් නිර්මාණය කරගත හැකිය. එබැවින් යම් කෙනෙකුට තම ජීවිත කාලය තුළ දී එවැනි වනාන්තරයක් වර්ධනය වෙමින් උපරිමයට ළඟා වන අයුරු සියැසින් දැක ගත හැකිවෙයි.

අධි ඝණත්ව බහු ස්ථරීය වනාන්තරයට වැටෙන අති විශාල වැසි ජලය ප්‍රමාණවත් දීර්ඝ කාලයක් රඳවා ගත හැකිය. පාංශු ඛාදනය අවම වීමත්, ගැඹුරු හා පුළුල් මූල මණ්ඩලයක් ස්ථාපිත වීමත් නිසා පස තුළ සවිවර භාවය වැඩිවී, ජල අවශෝෂක හැකියාව ඉහළ අගයක් ගැනීම එයට හේතුවයි. එවැනි වනාන්තරයකින් සෙමින් කාන්දු වන භූගත ජලය මඟින් ඉතා පිරිසිදු , වර්ණයකින් හෝ ගන්ධයකින් තොර වූ ජල උල්පත් බිහිවී ඇළ, දෙළ නිර්මාණය වෙයි. ඔබ සිංහරාජ වනාන්තරයේ හෝ කන්එළිය රක්ෂිතය හෝ වැනි ස්ථානයක සැරිසරා ඇත්නම් එවැනි දියපහරක පහස විඳීමට වාසානාවන්ත වී යැයි පැවසිය හැක. එහෙයින් ඝන වනාන්තරයක් යනු නොපෙනෙන ජලය ඇති හරිත සාගරයකි. වසර හැටක පමණ කාලයක සිට මියවාකි ක්‍රමය අනුසාරයෙන් වනාන්තර ප්‍රතිනිර්මාණය කිරීම ජපානය, චීනය, තායිලන්තය, ජර්මනිය, ප්‍රංශය, ඉන්දුනීසියාව, ලතින් ඇමරිකාව සහ අපේ අසල්වැසි ඉන්දියාව වැනි රටවල ඉතා සාර්ථකව ක්‍රියාත්මක වේ. පොසිල ඉන්ධන දහනය නිසා දිනෙන් දින වැඩිවෙමින් පවතින හරිතාගාර වායු ආවරණය හේතුවෙන් සිදුවන දේශගුණික අවබලපෑම් තුලනය කිරීමට අප රටේද හරිත ඝනත්වය ඉහළ දැමීම අත්‍යවශයෙන්ම කළ යුතුව ඇත. හුදෙක් තැනින් තැන උත්සවාකාරයෙන් පැළ කිහිපයක් රෝපණය කරනු වෙනුවට ඉතා කුඩා කොටසක වුවද අධිඝනත්වයෙන් යුත් වන වගාවන් පිහිටුවීම කාලෝචිතය. මේ සඳහා රජයේ සහ පෞද්ගලික අංශයේ ගොඩනැගිලි ආසන්නව අඩුම තරමින් පර්චස් 20 පමණ බිම් තීරුවක් වුවද ඉතා පහසුවෙන් යොදා ගත හැකිය.

2007 වසරේදී ජනතා අයිතියට පත්වූ වේලි ඔය ව්‍යාපාරයේ පරමාර්ථය වූයේ වේලි ඔය හැරවීම මඟින් තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සිත්තරම් පළාතේ දුගී දුප්පත්කම තුරන් කිරීමයි. එය මේ වන විට යථාර්ථයක්ව ඇතත් එම ප්‍රදේශය 90 දශකයට සිට උග්‍ර ජල හිඟයකින් පීඩා විදි ප්‍රදේශයකි. ජනතාව බහුතරයක් ජීවනෝපාය ලෙස හේන් ගොවිතැනත්, අතලොස්සකගේ දැව ජාවාරම් සහ වන සතුන් දඩයම් කිරීමත් හේතුවෙන් සමස්තයක් ලෙස ගත් කළ ණය බරින් පෙළුණු දුප්පත්කම වැළඳගත් සමාජයක් ලෙසින් පැවතිණ.

ප්‍රදේශයේ ඉඩම් අක්කර 5000 කට පමණ වසර මුළුල්ලේම වාරි ජලය ලබාදීමට හැකිවන අයුරින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් දේශීය ඉංජිනේරු තාක්ෂණයෙන් පමණක් වේලි ඔය ව්‍යාපාරය සැලසුම් කර නිම කරන ලදී. මීටර් 90 කට වැඩි දිගින් යුක්ත වූ කොන්ක්‍රීට් වේල්ල, කි.මී. 1.6 දිගැති උමග , කි.මී. 24 පමණ දිග ප්‍රධාන ඇළ, ප්‍රවේශ මාර්ග, කුඩා වැව් 20ක් පමණ සංවර්ධනය කිරීම වැනි ප්‍රධාන අංග වලදී ඇවැන්ත පස් වැඩ ප්‍රමාණයක් සහ පාෂාණ කැණීම් කිරීමට සිදුවිය.

විශේෂයෙන්ම ව්‍යාපෘතිය ආරම්භයට පෙර සිටම පැවැති වනාන්තර ගිනි තැබීම් නිසාත්, ඉදිකිරීම් කටයුතු වලදී නිරාවරණය වූ මතුපිට පොළව නිසාත්, අතිශයෙන් කර්කෂව විනාශයට යමින් තිබූ වනාන්තර කොටස් සංරක්ෂණය කිරීම වේලී ව්‍යාපෘතිය හා සමගාමීව වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලදී.

මේ සඳහා මියවාකි ක්‍රමවේදය සාර්ථකව යොදා ගැනිණි. මෙම කාර්යය සමස්තයක් වශයෙන් සැලකූ විට එය වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ඌව පළාත් සභාව, වාරි කළමනාකරණ අංශය, තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යන සියලුම ආයතනවල සාමුහික ප්‍රයත්නයක් විය.

මෙම විවිධ අභියෝග වාරිමාර්ග දෙපාර්තමේන්තුව මැදිහත් වීමෙන් ව්‍යාපෘති සීමාවන් තුළ වනාන්තර ප්‍රතිසංස්කරණය කිරීම හමුවේ ප්‍රථම වතාවට සිදුකළ කාර්යයකි. නමුත් එම කාර්යය කොතරම් සාර්ථක වීද යත් 2015 වසරේදී ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතන විසින් පරිසරය සඳහා පිරිනමන ලද ජාතික සම්මානයෙන් ද පිදුම් ලැබීය.

මියවාකි ක්‍රමවේදය හඳුන්වාදීමේ දී ඉහත සඳහන් ආයතනවල නිලධාරින් අවට පාසල්වල දරු දැරියන් සඳහාත්, ප්‍රාදේශයේ ගොවි ජනතාව සඳහාත්, පරිසර සංරක්ෂණය හා ජල සුරක්ෂිතතාවය වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ප්‍රදේශයට ආවේණික ශාක වර්ගවල පැළ තවාන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ භූමි තුළ පවත්වාගෙන යමින්, ගොවීන් හා පාසල් දරුවන්ගෙන් මිලදී ගනිමින් සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහන මිලට ලබාගනිමින් බඳුන්ගත පැළ ලක්ෂ අටක් පමණ නඩත්තු කර, ජනතා සහභාගීත්වය ඇතිව හඳුනාගත් ස්ථානවල සිටුවන ලදී.

මෙම ක්‍රියාවලියට සක්‍රියව දායකත්වය ලබා දීම හරහා පොදුවේ පාසැල් ළමුන් තුළ ද, ප්‍රදේශයේ ගොවි ජනතාව අතර ද, පරිසර පද්ධතියන් රැකගෙන ධරණීය සංවර්ධනයක් අරමුණු කර ගත් වගාවන් සඳහා යොමු වීම කෙරෙහි ආකල්පමය වෙනසක් ඇති විය. මෙතෙක් කල් වනාන්තර ගිනි තබමින් සිදුකළ හේන් ගොවිතැන වෙනුවට වී, මුං, ඉරිඟු, එළවළු, සහ පලතුරු වගාවන්ට හුරුවී ස්ථාවර ආර්ථිකයක් ගොඩනගා ගැනීමට ඔවුනට හැකිවිය.


















ඉංජි. එස්.එම්.ඒ. නෙළුගොල්ල
වරිමාර්ග අධ්‍යක්ෂ
(විශාල ඉදිකිරීම්)

# Irrigation Schemes under Irrigation Department (Water Management Branch)




## LIST OF MEDIUM SCHEMES

1. Radella
2. Lahugala
3. Panama
4. Tempitiya
5. Konduwattuwan
6. Ampara tank
7. Tissa wewa
8. Abaya Wewa
9. Eruwewa
10. Galkaduwawala
11. Kadahatha
12. Kadurugas demana
13. Kallanchiya
14. Kendewewa
15. Kapirigama
16. Keerikkulama
17. Kokatiyagollewa
18. Labonoruwa
19. Maha Bulankulamawewa
20. Mahindawewa
21. Mahamankadawala (Elayapaththuwa)
22. Maminiyawa
23. Maningamuwa
24. Mahamankadawala (Kekirawa)
25. Mankadawala
26. Periyakulama
27. Pihibiyagollewa
28. Thalagaha wewa
29. Thambalagollawa
30. Thannayankulama
31. Uttimaduwa
32. Weruppankulama
33. Kawarakkulama
34. Aluthdiulwewa
35. Ambagaswewa
36. Bellakadawala
37. Dekathipothana
38. Demata Wewa
39. Ella wewa
40. Horiwila wewa
41. Horowpathana Wewa
42. Kalpe wewa
43. Kandara Rathmalewewa
44. Kanhinda wewa
45. Kapogollawa wewa
46. Kiulekada
47. Kudapattiya Diyulwewa
48. Maha halmillawawewa
49. Mahawewalkada
50. Maha Kiulekadawewa
51. Maradanmaduwa
52. Iratiya wewa
53. Hendegamawewa
54. Pandarellawa wewa
55. Eluwankulama
56. Pahariya
57. Eriga oya
58. Maha Wewalkada
59. Mahakiulekada wewa
60. Maradanmaduwa
61. Iratiya Wewa
62. Muslim walahawiddawewa
63. Panderllawa wewa
64. Panwalawewa
65. Parangiyawadiya
66. Pethiyannekada
67. Ranpathwila wewa
68. Rasnaka wewa
69. Serunewewa
70. Sihala Walahawiddawewa
71. Thawalan Halmilewewa
72. Wadiyawewa
73. Wagollakada wewa
74. Wahagahapu wewa
75. Welimuwa pothana
76. Tirippankadawala
77. Ralapanawa
78. Aiyathige wewa
79. Banadara Ulpotha
80. Ellewewa (Padaviyawewa)
81. Ethakada mahawewa
82. Gonuheddena wewa
83. Kebithigollawa
84. Kodawaran kulama
85. Muslim Etaweerawewa
86. Muwategama
87. Sangilikandarawa
88. Thiththagonnewa
89. Waththe wewa
90. Ambalangaha wewa
91. Ittukulama
92. Kirindi waththa
93. Maha horiwila
94. Manewa
95. Ralapanawa
96. Thuruwila
97. Bomuruella
98. Dehigama
99. Demodara
100. Thumbankeni
101. Maddumurivu
102. Kitul wew
103. Rota wewa
104. Halmilla wewa
105. Bebiya wewa
106. Kalahagala wewa
107. Abagaswewa
108. Janaranjana wewa
109. Peramaduwa
110. Irataperiya kulam
111. Maruthamadu
112. Wadamunai
113. Weligahakandiya
114. Boralasgamuwa
115. Thalangama
116. Wewalanda
117. Uyanwaththa
118. Denagama
119. Kumburuhena wewa
120. Lenabatuwa wewa
121. Nape Udawathrawewa
122. Uan wewa
123. Maha AluthgamaAra
124. Mahagalwewa
125. Debarawewa
126. Udukkiriwalawewa
127. Pattiyapola Mahawewa
128. Kirama wewa
129. Pahala andarawewa
130. Wewala wewa
131. Meewalpitiya
132. Himbiliyakada
133. Karawagaswewa
134. Maha Galgamuwa
135. Maha Siyabalagamuwa
136. Mahanneriya
137. Meddeketiya
138. Wennaru wewa
139. Hulugalla
140. Kiniyama
141. Makadura
142. Badulu oya
143. Alilotara
144. Kotiyagala
145. Saddatissa
146. Yudaganawa
147. Sugaladewi
148. Alugalge
149. Balaharuwa
150. Dambe wewa
151. Debara Ara
152. Halmillawa pillewa
153. Mallipotha
154. Detagamuwa
155. Karawila
157. Mailagama
158. Hambegamuwa
159. Kahakurullan pelassa
160. Kandiyapita
163. Muhathan kulam
164. Rajendran kulam
165. Madawachchiya
166. Pallemattala
167. Ranmaduwa wewa
168. Pannegamuwa
169. Mahanikkatuwa
170. Wewala wewa

## SUMMARY OF IRRIGATION SCHEMES

| Details | Numbers of scheme | Cultivated Extent(acs) |
|---|---|---|
| Major Tanks | 73 | 500913 |
| Medium Tanks | 170 | 87857 |
| Anicut scheme | 98 | 140200 |
| Drainage | 10 | 25420 |
| Lift | 3 | 1610 |
| Total schemes | 354 | 756000 |

**Major schemes:** The schemes having 1000 acs or more irrigable area.

**Medium schemes:** The schemes having less than 1000 acs and more than 400 acs of irrigable area.

## LIST OF MAJOR SCHEMES

1. Ambal oya
2. Ekgal oya
3. Namal oya
4. Pallan oya
5. Pannalagama
6. Rambukkan oya
7. Rottikulama
8. Senanayaka Samudraya
9. Kalugalloya
10. Huruluwewa
11. Mahakandarawa
12. Mahawilachchiya
13. Manankattiya
14. Nachchaduwa
15. Nuwara Wewa
16. Padaviya
17. Rajangana
18. Wahalkada
19. Yan Oya
20. Ambewela
21. Dambarawa
22. Kande Ela
23. Mapakada
24. Nagadeepa
25. Sorabora
26. Morana
27. Nawakiri
28. Rugam
29. Unnichai
30. Vakaneri
31. Badagiriya
32. Kekirioboda
33. Lunugamwehera
34. Mau Ara
35. Muruthawela
36. Ridiyagama
37. Tissawewa
38. Weheragala
39. Weerawila
40. Yodawewa
41. Ellewewa
42. Kekanadura
43. Dewahuwa
44. Nalanda
45. Wemedilla
46. Ambakolawewa
47. Attaragalla
48. Batalagoda
49. Deduru oya
50. Hakwatunawewa
51. Kimbulwana oya
52. Mediyawa
53. Magalla
54. Jayawewa
55. Usgal Siyabalan
56. Ethimale
57. Handapanagala
58. Muthukandiya
59. Girithale
60. Kaudulla
46. Ambakolawewa
47. Attaragalla
48. Batalagoda
49. Deduru oya
50. Hakwatunawewa
51. Kimbulwana oya
52. Mediyawa
53. Magalla
54. Jayawewa
55. Usgal Siyabalan
56. Ethimale
57. Handapanagala
58. Muthukandiya
59. Girithale
60. Kaudulla
61. Minneriya
62. Parakkrama Samudraya
63. Inginimitiya
64. Tabbowa
65. Kanthale
66. Mahadiulwewa
67. Morawewa
68. Vendrasan
69. Wan Ela
70. Pavatkulam
71. Akathimuruppu
72. Giants tank
73. Viyathikulam



# අමිල ජලය රැගෙන ගලන ගංගා...





අද්‍යත අතීතයේ පටන් මිනිසාට ඉතාමත් සමීප ජල ප්‍රභවය ස්වභාවිකව ගලා බසිනා ගංගාවන්ය. ඉපැරණි මිනිස් ශිෂ්ටාචාර වන මෙසපොතේමියානු ශිෂ්ටාචාරය යුප්‍රටීස්-ටයිග්‍රීස් ගංගා නිම්නයේ ද, ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ඉන්දු ගංගා නිම්නයේ ද, චීන ශිෂ්ටාචාරය හොවැංහෝ (යෙලෝ) සහ යැංසි ගංගා නිම්නයේ ද බිහි වී ඇත. ආර්යයන්ගේ සංක්‍රමණයෙන් පසු ලංකාවේ ද මුල්ම ජනාවාසයන් බිහිවූයේ මල්වතු ඔය හා කලා ඔය ආශ්‍රිතවය.

ගංගා අසල ජීවත් වෙමින් මූලික මිනිස් අවශ්‍යතාවයන්ට ලබා ගැනීමෙන් ආරම්භ වන ජල පරිභෝජනය, ශිෂ්ටාචාර දියුණු වත්ම, සතුන් ඇති කිරීමටත්, ගොවිතැන් කිරීමටත්, ප්‍රවාහන මාධ්‍යයක් ලෙසත්, විවිධ කර්මාන්ත අවශ්‍යතා සඳහා සහ ජල විදුලිය සඳහාත් භාවිතා කරමින් අද වන විට වඩාත් පුළුල් වී තිබේ. මෙසේ ගංගා ජලයෙන් තම අවශ්‍යතා සපුරා ගත් මිනිසා හට විවිධ දේශගුණික විපර්යාසයන් නිසා ජලයට ඇති වන බලපෑම නිසාවෙන් ජල සුරක්ෂිතතාවය පිළිබඳ විවිධ ගැටලු පැන නැගී තිබේ. එලෙසම විවිධාකාර වූ අහිතකර මිනිස් ක්‍රියාකාරකම් නිසා ජල මූලාශ්‍රවල පැවැත්මට ඇති තර්ජන, මිනිසාගේ ජල අවශ්‍යතා සපුරා ගැනීමට බාධා පමුණුවන විවිධ ගැටලු ඇතිකර තිබේ. ශතවර්ෂ ගණනාවක් තම පැවැත්ම සඳහා විවිධාකාරයෙන් ගංගා ජලය භාවිතා කරන මිනිසා ජල සම්පත, ගංගාශ්‍රිත ජෛව පද්ධතිය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කර නොමැති බව පෙනේ. මිනිසාගේ අවිධිමත් ක්‍රියාකාරකම් නිසා ලොව බොහෝ ගංගා විනාශ වී තිබේ. ඇමෙරිකාවේ මිසිසිපි, ඉතාලියේ සානෝ, පිලිපීනයේ මරිලාවෝ, චීනයේ හොවැංහෝ හා ඉන්දියාවේ ගංගා නදියත් මෙයට හොඳම නිදසුන්ය.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා 103ක් ඇත. මෙම ගංගා රට මැද කඳුකරයෙන් ආරම්භ වී අරීයව ගලා ගොස් මුහුදට එක් වෙති. මෙම ප්‍රධාන ගංගාවන්හි ගංගා ද්‍රෝණීන් වර්ග කිලෝමීටර 59,000 පමණ වූ ප්‍රදේශයක් පුරා පැතිර ගොස් ඇති අතර එම භූමි ප්‍රදේශය ශ්‍රී ලංකාවේ විශාලත්වයෙන් 90%ක් පමණ වේ. මීට අමතරව වෙරළාසන්න ප්‍රදේශවලින් පටන් ගන්නා කුඩා ජලඅපවහන ද්‍රෝණීන් ගණනාවක් ද ඇත. ශ්‍රී ලංකාවේ ද මිනිසුන් හා ගංගා යහජීවනයෙන් බද්ධව පැවතුණු කාල වකවානුව ඉක්මවා,1990 දශකය ගතවන විට මිනිසුන් අසීමාන්තිකව ගංගාවන්හි ස්වාභාවික සම්පත් ලබා ගැනීමට යොමු වී තිබේ. වැලි කැණීම මෙන්ම, මැටි කැණීම හා මැණික් ඉල්ලම් හැරීම ද මෙසේ ගංගාවන්හි පැවැත්මට ඇතිව තිබෙන විශාලම තර්ජනයන් වේ. අවිධිමත් මිනිස් ක්‍රියාකාරකම් නිසා මහවැලි, කළු, කැළණි, මහ, ඇඳුරු, කලා, මල්වතු (අරුවි ආරු), ගිං, නිල්වලා, ඇතුළු ගංගා 27 ක් පමණ දැඩි ලෙස හානියට පත්ව ඇති බව මේ වන විට හඳුනා ගෙන ඇත. ගංගාවකින් අප ලබා ගන්නා පාරිසරික, සමාජයීය හා ආර්ථික වටිනාකම අති මහත්ය. අපේ රටේ එක් ප්‍රධාන ගංගාවක් වන කැළණි ගඟ පිළිබඳව සලකා බලමු. සමනල කඳු මුදුනින් ආරම්භ වී මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුම දිගේ ගලා බසිනා කැළණි ගඟ කිලෝමීටර 145ක් දුර ගෙවා කොළඹට උතුරින් ඉන්දියන් සාගරයට එක් වෙයි. කැළණි ගඟ සම්පූර්ණයෙන්ම තෙත් කලාපයේ පිහිටි ගංගාවකි. වර්ග කිලෝමීටර 2340ක් වන එහි පෝෂක පෙදෙසෙහි සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මි.මී. 3700ක් පමණ ඉහළ අගයක් ගනී. මේ වර්ෂාවෙන් වැඩි කොටසක් නොවැම්බර් සිට දෙසැම්බර් හා මැයි සිට ජූනි මස දක්වා කාලය තුළදී ලැබෙයි. කැළණි ගඟෙහි ඉහළ ජල පෝෂක පෙදෙසෙහි පිහිටි කෙහෙල්ගමුව ඔය හා මස්කෙලිය ඔයෙහි ඇති ජලාශ ජල විදුලිය නිපදවීම සඳහා දායක වේ. එසේම කොළඹ නාගරික ප්‍රදේශයේ ජල අවශ්‍යතාවයන්ගෙන් 70%ක් පමණ අඹතලේ පිහිටි පොම්පාගාරය මගින් කැළණි ගඟෙන් ලබා ගනී. අතීතයේ පටන්ම භාණ්ඩ ප්‍රවාහනය සඳහා කැළණි ගඟ භාවිතා කර ඇත. කැළණි ගංගා ද්‍රෝණියේ ඉහළ ජල ධාරා ප්‍රදේශ මෙන්ම මධ්‍යම කොටසේ කිතුල්ගල ප්‍රදේශයද ඉතාමත් ඉහළ සංචාරක ආකර්ෂණය සහිත ප්‍රදේශයකි. මේ වන විට තහනම් කර ඇතත්, දශක කිහිපයක් තිස්සේ වැලි කැණීමද මේ ගංගාව තුළ සිදු විය. මේ සියලු ප්‍රයෝජන ලබා දෙන කැළණි ගඟ, ජනගහනය අධික කොළඹ නගරය අසලින් ගලා බසිමින් එම පරිසරයේ සිසිලස රැඳවීමට හා අලංකරණයට ද ඉතා ඉහළ දායකත්වයක් ලබා දෙයි.

අපේ ගංගාවන්, විශේෂයෙන් වියළි කලාපය හරහා ගලා බසිනා ගංගාවන්, අතු ගංගාවන් හරස් කර වැව්, අමුණු බැඳ එම ජලයෙන් ගොවිතැන් කළ ප්‍රෞඪ වාරි ශිෂ්ටාචාරයක් අපට හිමිව තිබේ. අද වන විට වැව් හා අමුණු මගින් ජලය සපයන වාරි පද්ධති මගින් පෝෂණය වන වී වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර 600,000ක් පමණ වේ. මෙලෙස ජලය සපයන ලක් මවගේ ජීවනාලිය බඳු අපේ ගංගාවන් විනාශ නොවී රැක ගන්නේ කෙසේ ද? මේ ගැන සිතා බැලීමට, කුඩා උල්පතක්ව ආරම්භ වන දිය දහරාවක් විශාල ගඟක් වී මුහුදට වැටෙන තෙක් එහි ගමන් මඟ විමසා බලමු.

කුඩා දිය පහරවල් එක්ව ගලා ගොස් ගඟක් නිර්මාණය වී වේගවත්ව ගලායන ගඟෙහි යෞවන කාලය තද බෑවුම් සහිත ඉහළ ජල ධාරා ප්‍රදේශය තුළ දී ගතවේ. මෙම ප්‍රදේශය තුළ ද සිදුවන විවිධ මිනිස් ක්‍රියාකාරකම් නිසා ගඟෙහි පැවැත්මට තර්ජන ඇති වේ. බොහෝ ගංගා ද්‍රෝණි වල ඉහළ ජල පෝෂක ප්‍රදේශයන්හි වනාන්තර එළි කර තේ වගාව හා වෙනත් මිශ්‍ර බෝග වගාවන් ව්‍යාප්ත වී ඇත. බෝග වගාවන්හිදී විශාල වශයෙන් පොහොර හා කෘමිනාශක භාවිතය හා පාංශු සංරක්ෂණ ක්‍රම අනුගමනය නොකිරීම නිසා ඉහල ජල ධාරා පෙදෙස්හිද ජල මාර්ග අපවිත්‍ර වෙයි. එසේම නාගරික කුණු කසළ ජල මාර්ග වලට එක් කිරීම මෙම ප්‍රදේශයන්හිද සිදුවෙයි.තරමක් සෙමින් ගලා බසින ගංගාවෙහි පිරිපුන් අවධිය මධ්‍යම කොටසෙහි මද බෑවුම් සහිත ප්‍රදේශයන්හි ගත වේ. මෙම ප්‍රදේශය තුළද ගඟ දෙපස ඇති වටිනා දැව වර්ග ඉවත් කිරීම, ගංගා රක්ෂිතය ආක්‍රමණය කර නිවාස, හෝටල්, කර්මාන්තශාලා ඉදි කිරීම, ඒවායේ අපද්‍රව්‍ය ගඟට බැහැර කිරීම සිදු වෙයි. මිශ්‍ර බෝග වගාවන් හා වී වගාව ද සිදුවේ. පහළ නිම්න ප්‍රදේශයට එන විට නිහඬව ගලා බසින ගංගාව පසු කරන්නේ වයෝවෘද්ධ අවධියයි. මෙම ප්‍රදේශය තුළ දී අසීමාන්තිකව ගඟෙහි ස්වාභාවික සම්පත් පරිහරණයට මිනිසා කටයුතු කරයි. තවදුරටත් රක්ෂිත ආක්‍රමණය කරමින්ද විශාල ලෙස ජනාවාස වී ඇත. ගඟ දෙපස නිවාස, හෝටල්, කර්මාන්තශාලා බහුලව ඉදි වී ගඟට අපද්‍රව්‍ය මුදා හැරීම හා නාගරික කුණු කසළ ගං ඉවුරේ බැහැර කිරීම නිසා ගඟෙහි ජලය පමණක් නොව ගංගාධාරය ද විනාශ වෙමින් පවතී. ගංවතුර අවස්ථාවකදී ගඟ අවට ඇති කැලි කසළ ගඟට එක් වන අතර, බෝක්කු , පාලම් අසල අවහිර වී ජලය බැස යාම අවහිර කරයි.

1990 දශකයේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ඇති වූ දියුණුවත් සමඟ ගංගා වැලි කැණීම යාන්ත්‍රිකරණය වී ඇත. එතෙක් ගඟකට සිදුවන හානිය අවම වන ලෙස වැලි තැන්පත් වන ස්ථානවලින් සාම්ප්‍රදායික ක්‍රම මගින් සිදු කළ වැලි කැණීම වෙනුවට පාරිසරික සමතුලිතතාවය බිඳ දමමින් ගං ඉවුර විනාශ කරමින් යන්ත්‍රෝපකරණ භාවිතයෙන් වැලි ලබා ගැනීම මහා පරිමාණයෙන් සිදු වීම ආරම්භ විය. මේ තත්ත්වයන් හමුවේ අද වන විට ලංකාවේ ගංගා බොහොමයක ගං පතුල බාදනය වී ගං ඉවුරු කඩා වැටී විනාශයට පත්ව ඇත. මෙලෙසින්, මහ ඔය පසුගිය දශක කිහිපයේදී ඉතා විශාල ලෙස හානියට පත් වූ ගංගාවකි. තවද, කැළණි ගඟ හා කළු ගඟ වැලි කැණීම හා මැණික් ගැරීම නිසා දැඩි ලෙස විනාශ වූ ගංගාවන්ය.

ජෛව විවිධත්වයෙන් සපිරි ගංගාවක් තුළ සුළු වශයෙන් එක් වන ජීව අපද්‍රව්‍ය යම් දුරක දී දරාගෙන පවිත්‍රව බැසයාම අපහසු නොවේ. නමුත් ගංගාවන්ට විශාල වශයෙන් එක් වන රසායනික අපද්‍රව්‍ය ඇතුළු නොයෙකුත් අපද්‍රව්‍ය හේතුවෙන් ජලයේ ගුණාත්මක භාවය විනාශ වී, ගංගාව ආශ්‍රිත ජෛව විවිධත්වයෙන් පොහොසත් පරිසරය ද විනාශ වී යයි. ගංගාවක පාරිසරික, සමාජයීය වටිනාකම නොතකා අසීමාන්තිකව ආර්ථික වටිනාකම උකහා ගැනීමට මිනිසා විසින් සිදු කරන අවිධිමත් ක්‍රියාකාරකම් නිසාවෙන් විනාශ වන ගංගාවන් නැවතත් මිනිසාගේම ජීවිත පැවැත්මට තර්ජනයක් වන්නේය. ජලය අපිරිසිදු වී පරිභෝජනයට නුසුදුසු වීම, මත්ස්‍ය ගහනය විනාශ වීම, ගංගාධර ප්‍රසන්න පරිසරය විනාශ වීම, විශාල ලෙස පාරිසරික, සමාජයීය හා ආර්ථික ගැටලු රැසක් මිනිසාට ඇති කරයි. තවද වැලි කැණීම් නිසා ගං පතුල බාදනය වී ගඟ දිගේ කරදිය ගලා ඒම, පාලම් පාදක නිරාවරණය වීම, අමුණු වැනි වාරිමාර්ග නිර්මිත තර්ජනයන්ට ලක්වීම, කඩා වැටුණු ගං ඉවුරු නිසා ප්‍රදේශවලට ගංවතුර තර්ජන ඇති වීම හේතුවෙන් ආර්ථිකයට විශාල ලෙස බලපෑම් ඇති වේ. මේ විපත් සඳහා තාක්ෂණික පිළියම් යොදා අනතුරු අවම කර ගැනීමට කටයුතු කිරීම සඳහා අධික පිරිවැයක් දැරීමට සිදු වේ.

මෙලෙස අවිධිමත් මිනිස් ක්‍රියාකාරකම් නිසා මේ වන විට කැළණි ගඟට සිදු වී ඇති හානිය සලකා බලමු. හංවැල්ල ප්‍රදේශය දක්වා ගඟ පතුල මුහුදු මට්ටමට වඩා පහත් මට්ටමක පවතී. 2016 දී කරන ලද ගඟෙහි හරස්කඩ මිනුම් අනුව ගං පතුල මුහුදු මට්ටමින් මීටර් 8 කටත් වඩා බාදනය වී, ගං ඉවුරු කඩා වැටුණු ස්ථාන රැසක් පවතී. මෙලෙස ගං පතුල බාදනය වී ගඟ දිගේ මුහුදු ජලය ගලා ඒම හේතුවෙන් අඹතලේ පොම්පාගාරයට ලවණ ජලය මුසු වීම නිසා පානීය ජලය ලබා ගැනීමේ තර්ජනයක් ඇති වී ඇත. ඒ අනුව තාවකාලික ලවණ බාධකයක් ගඟ හරහා ඉදි කර ඇති අතර, මෙහි ස්ථිර නිර්මිතයක් ඉදිකිරීම සඳහා කටයුතු කරමින් පවතී. මේ වන විට ගං පතුල බාදනය වී හංවැල්ලේදී, හංවැල්ල කිරිඳිවැල මාර්ගයේ ඉදි කර ඇති පාලමෙහි පාදකයක් නිරාවරණය වීම නිසා එහි ස්ථායීතාවයට ඇති වන බලපෑම නිවැරදි කිරීමට අධික පිරිවැයක් දරා කටයුතු කර තිබේ. ගඟ දිගේ කිහිප ස්ථානයකම ගංවතුර බැම් සුරක්ෂිත කිරීම හා ආපදාවන් වළ කාලීම සඳහා විවිධ ක්‍රම මගින් ගංඉවුර ආරක්ෂා කර ඇත. එසේම දැනට කර ඇති අධ්‍යයන අනුව ඉදිරි කාලයේදී තෙත් කලාපයට ලැබෙන වර්ෂාව වැඩි විය හැකි අතර ගංවතුර ඇති වීමේ ප්‍රවණතාව ද වැඩිවේ. මේ අනුව මේ ගංගාශ්‍රිත අවිධිමත් ක්‍රියාකාරකම් මෙලෙස පැවතියහොත් දේශගුණික විපර්යාසයන් නිසා ගංගාවන්ට ඇති වන තර්ජන ද තීව්‍ර වී, මිනිසාට තව තවත් විපත්වලට අනාගතයේදී මුහුණ දීමට සිදු වෙයි.

ගංගාවට සිදු වන මේ විපත් ගංගාධරය තුළත් (ගං පතුල, ගං ඉවුරු හා ගංගා රක්ෂිත පෙදෙස) ගංගා ද්‍රෝණිය තුළත් (ගඟට ජලය ගලා එන සියලුම ප්‍රදේශ) පවතින අවිධිමත් මිනිස් ක්‍රියාකාරකම් සියල්ලගේම ප්‍රතිඵලයකි. මේ අනුව ගංගාවක් රැක ගැනීමට ගංගා ද්‍රෝණිය තුළ වෙසෙන සියලුම පුරවැසියන් එක්ව කටයුතු කළ යුතු අතර, එය ගංගාවක් රැක ගැනීමට ඇති විශාලතම අභියෝගය ද වී ඇත. ගංගාවන් රැක ගැනීමේ ප්‍රධාන වගකීම, ආයතනයක් ලෙස පැවරී ඇත්තේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවටය. එහෙත් එම කාර්යය ඉටු කිරීම සඳහා රාජ්‍ය අංශයේ අනෙක් ආයතනවලද, වෙනත් රාජ්‍ය නොවන සංවිධානවලද, සියලුම පුරවැසියන්ගේ ද සහයෝගය අත්‍යවශ්‍ය වේ. එසේම ගංගාධරය තුළ පමණක් නොව ගංගා ද්‍රෝණිය තුළම සිදුවන විධිමත් / අවිධිමත් ක්‍රියාකාරකම් සමඟ සමගාමීව කටයුතු කළ යුතු වේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව විවිධ ගංගා ද්‍රෝණි පිළිබඳව අධ්‍යයනය කරමින්, දේශගුණික විපර්යාස සඳහා මුහුණ දීමට මෙන්ම මිනිස් ක්‍රියාකාරකම් නිසා විනාශ වූ ගංගාවන්ට ද විවිධ ඉංජිනේරුමය පිළියම් යොදයි. එලෙසින්ම මහජනතාව දැනුවත් කරමින් විවිධ වැඩසටහන් පවත්වමින් ඔවුන්ගේ දායකත්වය ගංගාවන්ගේ යහ පැවැත්ම සඳහා ලබාගැනීමට කටයුතු කරයි. එසේ වසර පුරා විසිරුණු විවිධ වැඩසටහන් අතර විශේෂයෙන් සෑම වසරකම ලෝක ජල දිනය තේමා කරගනිමින් ද වාරිමාර්ග කොට්ඨාස මට්ටමින් දිවයින පුරා ගංගාවන් හා ජල සම්පත රැක ගැනීම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වයි.

අපේ ගංගාවන් රැක ගනිමින්, ජලයෙහි අමිල වටිනාකම අවබෝධ කරගමින් දේශගුණික විපර්යාසයන් ඉදිරියේදී වුවත් ශක්තිමත්ව මුහුණ දීම සඳහා ජල සම්පත සුරක්ෂිත කිරීමට දායකත්වය ලබා දීම පුරවැසි අප සැමගේ යුතුකමයි.





ඉංජි. නදීකා වික්‍රමසිංහ
වාරිමාර්ග අධ්‍යක්ෂ
(ජල සම්පත් සැලසුම්)

# ගෘහස්ථ පරිභෝජනය සඳහා වැසි ජලය එක් රැස් කිරීම

ජලයේ වටිනාකම එහි මිලට වඩා බොහෝ සෙයින් වැඩිය. අපේ කුටුම්භ, සංස්කෘතිය, සෞඛ්‍යය, කෘෂිකර්මාන්තය, ආර්ථිකය, අපගේ ස්වාභාවික පරිසරයේ අඛණ්ඩතාව සඳහා ජලයට අතිමහත් හා සංකීර්ණ වටිනාකමක් ඇත. සීඝ්‍ර නාගරීකරණය, කාර්මිකකරණය සහ කෘෂිකාර්මික ක්‍රියාකාරකම් වැනි වර්ධනය වන ජනගහනය හා සංවර්ධන ක්‍රියාකාරකම්, පවතින ජල සම්පත කෙරෙහි දැඩි පීඩනයක් ඇති කරයි. කාර්මික හා වෙනත් අපද්‍රව්‍ය ජල කඳට දැමීම නිසා ජලය දූෂණය වන අතර ජලයේ පිරිපහදුව සඳහා වැය වන මුදල වැඩි කරන අතරම සැපයුම තවදුරටත් සීමා කරයි. එබැවින් අදාළ බලධාරීන් ඔවුන්ගේ ඉලක්කවල බරපතල පසුබෑමකට මුහුණ දී ඇති අතර ප්‍රමාණවත් තරම් ගුණාත්මක ජලය සැපයීම රජයට විශාල පිරිවැයක් වී තිබේ. මෙම තත්ත්වය යටතේ වැසි ජලය එක්රැස් කිරීමේ ක්‍රම ගෘහස්ථ ජල අවශ්‍යතාවය සපුරා ගැනීමේ වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇත.

### වැසි ජලය එක්රැස් කිරීමේ (Rain Water Harvesting) පද්ධතිය

රූප සටහන 1හි දක්වා ඇති පරිදි වැසි ජලය එකතු කරන්න. මෙම පද්ධතිය යනු වැසි ජලය එක්රැස් කිරීම සඳහා සැලසුම් කර ඇති පද්ධතියක් වන අතර එය පොම්ප කිරීම සඳහා අවශ්‍ය වන විදුලි පිරිවැය අඩු කරයි. එකතු කරන ලද ජලය පිරිසිදු ජලය හිඟයක් පවතින විට වියළි කාලවලදී භාවිතා කිරීමට හැකිය. මීට අමතරව, භූගත ජලය නඩත්තු කිරීම සඳහා එය කෙළින්ම පොළොවට උරා ගැනීමට සැලැස්වීමට හැකි වේ.

වැසි ජලය එක්රැස් කිරීමේ පද්ධතිය සැලසුම් කිරීම සඳහා අවශ්‍ය මූලික අංග පහත පරිදි වේ.

එකතු කිරීමේ ප්‍රදේශය
(සාමාන්‍යයෙන් ගොඩනැගිල්ලේ වහලය)
ප්‍රවාහන පද්ධතිය (ආවරණ සහ පහළ පයිප්ප)
පෙරීම / පිරිපහදු කිරීම (බොරළු, වැලි, අඟුරු, ලෝහ හෝ ප්ලාස්ටික් දැලක් ගටරයට සවි කිරීම හෝ ටැංකියට ඇතුල්වීමේ කොටසට යෙදීම)

- ගබඩා ටැංකිය
- භාවිතය / නැවත ආරෝපණය කිරීම (නඩත්තු කිරීම)



රූපය 3: මීගම්මන ප්‍රාථමික පාසලේ වැසි ජලය එක්රැස් කිරීමේ ඡායාරූපයක්



රූපය 2: උඩහේන ගම්මානයේ ගෘහස්ථ වැසි ජලය රැස් කිරීමේ ඡායාරූපයක්




ප්‍රවාහනය සහ ගබඩා පහසුකම් ඇතුළුව වහල වැසි ජලය රැස් කිරීමේ පද්ධතියක සරල ක්‍රමානුරූප සටහනක් රූප සටහන 1 හි දක්වා ඇත

### එකතු කළ හැකි වැසි ජලය ප්‍රමාණය වර්ෂාපතනය සහ වහලයේ මතුපිට ප්‍රමාණය මත රඳා පවතී

ලෝක සෞඛ්‍ය සංවිධානයට (WHO) අනුව, මූලික සනීපාරක්ෂක අවශ්‍යතා (රෙදි සේදීම සහ ස්නානය නොමැතිව) පවත්වා ගැනීමට දිනකට ඒක පුද්ගල ජල ලීටර් 20ක් පමණ සහතික විය යුතුය. එබැවින් ටැංකියේ ධාරිතාව ඒ අනුව තීරණය කළ යුතුය.

### මහනුවර දිස්ත්‍රික්කයේ උඩහේන ගම්මානයේ වැසි ජලය එක්රැස් කිරීමේ වැඩසටහන

මීට පෙර ප්‍රජාව විසින් ජල අවශ්‍යතා සඳහා නළ ළිං 5ක්, පෞද්ගලික ළිං 15ක් සහ කුඩා ස්වාභාවික ටැංකියක් භාවිතා කර ඇත. ඔවුහු නළ ළිං පානීය ජල ප්‍රභවයක් සහ කුඩා ස්වාභාවික ටැංකියක් වෙනත් අරමුණු සඳහා භාවිත කළහ. එබැවින් මිනිසුන්ට බොහෝ විට සීමිත ජල ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා කඳු බෑවුම්වල ඇවිදීමට සිදු විය. මීට අමතරව, පසුගිය දශකය තුළ ඔවුහු ප්‍රමාණවත් තරම් ජලය නොමැතිව දුක් වින්දහ.

මීට පිළියමක් ලෙස ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය විසින් ජල සැපයුම් විකල්පයක් ලෙස වැසි ජලය එක්රැස් කිරීමේ ක්‍රමය හඳුන්වා දෙන ලදී. එම ව්‍යාපෘතිය $5m^3$ හෝ $7.5\ m^3$ පරිමාවකින් යුත් ටැංකි නිර්මාණය කර ඇත. එම ව්‍යාපෘතිය හඳුන්වා දීමෙන් පසු මෙම ප්‍රජාවට වැඩි ප්‍රතිලාභ ලැබුණි. ගෘහස්ථ මට්ටමේ වැඩි ජල ප්‍රමාණයක් තිබීම නිසා වඩා හොඳ සනීපාරක්ෂක තත්ත්වයක් හිමි විය. ජලය රැස් කිරීම සඳහා දුර ගමන් නොකිරීමෙන් කාලය ඉතිරි විය.

### මහනුවර දිස්ත්‍රික්කයේ මීගම්මන ප්‍රාථමික පාසලේ වැසි ජලය රැස් කිරීමේ වැඩසටහන

වත්තේගම මීගම්මන ප්‍රාථමික පාසල ඔවුන්ගේ පාසලේ වැසි ජලය එක්රැස් කිරීමේ ක්‍රමයක් ඇතුළත් කර ඇත. මෙම ස්ථානය වත්තේගම නගරයේ සිට කි.මී. 2ක් දුරින් පිහිටා ඇත. ප්‍රධාන ගොඩනැගිල්ලේ වහලයෙන් වැසි ජලය එකතු වේ.

මෙම පාසලේ සිසුහු 120ක් පමණ ඉගෙනුම ලබති. වර්ෂාපතනය අඩු හෝ අඩු වීම හේතුවෙන් සෑම වසරකම ජනවාරි සිට මාර්තු දක්වා ඔවුහු දැඩි ජල හිඟයකට මුහුණ දෙති. එබැවින් වැසි ජල පද්ධතිය නිර්මාණය කර ඇති අතර දැන් එය ඔවුන් සඳහා පූර්ණ භාවිතයක් බවට පත්ව ඇත.

ඔවුන් සතුව ඇත්තේ එක් නළ ළිඳක් සහ වැසි ජලය ගබඩා කිරීමේ ටැංකියකි (5m3 ධාරිතාව). නළ ළිඳ පානීය කටයුතු සඳහා භාවිතා කරන අතර වැසි ජල පද්ධතිය අත් සේදීම, සනීපාරක්ෂාව සහ ගෙවතු වගාව සඳහා යොදා ගනී.

ගෘහස්ථ වැසි ජලය එක්රැස් කිරීම වියළි කාලවලදී ජල හිඟයට හොඳම විකල්පයක් වන අතර එය ගෘහස්ථ සෑම කටයුත්තකටම භාවිතා කළ හැකිය. ඕනෑම ජල ප්‍රභවයක් ලෙස වැසි ජලය ආරක්ෂිතයි.

භූගත ජලය ලබා ගැනීමට නොහැකි හෝ වෙනත් ජල ප්‍රභවයක් නොමැති භූගත ජල මට්ටමට අඩු කඳුකර ප්‍රදේශවල, ජලය මිල අධික වන නාගරික ප්‍රදේශවල මෙම පද්ධතිය ස්ථාපිත කළ හැකිය. සේදීම සහ ගෙවතු වගාව සහ දේශීය ගංවතුර වැළැක්වීම සහ විශාල ජල පරිභෝජනයක් ඇති පොදු හා වාණිජ ගොඩනැගිලිවල මේ ක්‍රමය ඉතා සාර්ථක වේ.

තවද මෙම ක්‍රමයෙන් වැසි ජලය භාවිතා කිරීම මඟින් ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයෙහි පිරිසිදු ජලය භාවිතය අවම කළ හැකි අතර පිරිසිදු නළ මඟින් ලැබෙන ජල සැපයුම සඳහා රජයට විශාල පිරිවැයක් (ජල පිරිපහදු හා පොම්ප කිරීමේ බලශක්ති පිරිවැය) ඉතිරි වේ. එබැවින් මෙම ක්‍රමය දිරිගැන්වීම සඳහා රජයේ අනුබද්ධිත ආයතනයක් හෝ ණය පහසුකම් සැලසුමක් සකස් කළ යුතුය.

වහල වැසි ජලය එක්රැස් කිරීමේ තාක්ෂණයේ එක් ප්‍රධාන අඩුපාඩුවක් නම් ගබඩා ටැංකි සහ අනෙකුත් අතිරේක උපාංග ඉදිකිරීම සඳහා මුලින් ඉහළ ප්‍රාග්ධන ආයෝජනයක් අවශ්‍ය වීමයි. වර්ෂාපතනය අඩු වන විට හා වඩා දිගු වියළි කාල පරිච්ඡේදයක් පවතින විට පිරිවැය බෙහෙවින් වැඩි වන අතර එමඟින් ජල සුරක්ෂිතතාවය සහතික කිරීම සඳහා විශාල ටැංකියක් අවශ්‍ය වේ. ඕනෑම තාක්ෂණික මැදිහත්වීමක සාර්ථකත්වය රඳා පවතින්නේ එහි පිරිවැය සහ පරිශීලකයින්ට දැරිය හැකි මිල මත ය. එබැවින් සුදුසු ටැංකි ප්‍රමාණයක් භාවිතා කිරීම සහ අඩු ශ්‍රමය සහ සරල ඉදිකිරීම් ආධාරක ඉදිකිරීම් පිරිවැය අඩු කිරීම සඳහා වැදගත් සාධක වේ. මේ සම්බන්ධයෙන්, අඩු ආදායම්ලාභී පවුල් අතර තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා ණය සහ සහනාධාර වැනි ආධාරක යාන්ත්‍රණ ඵලදායී ලෙස භාවිතා කළ හැකිය.

ඉංජි. නිලන්ති ප්‍රියංකා කොස්වත්ත
ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු-මාතලේ



# රජරට ජනතාවට සැමදා නිදන්ගත වකුගඩු රෝගයෙන් පීඩා විඳීමට සිදුවේ ද?

ජීවිතයේ පරිණාමීය ආරම්භයේ සිටම, මේ පොළොවේ ජීවත්වීමට අවශ්‍ය වූ ප්‍රධාන සාධකය ජලයයි. එය සැම ජීවියෙකුගේම අතිශය අවශ්‍යතාවයකි. එක්සත් ජාතීන් විසින් ජලය සැම මිනිසෙකුගේම මූලික අයිතිවාසිකමක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත්තේ ඒ නිසාය. එතැන් පටන් සැම මිනිසෙකුටම පිරිසිදු ජලය තිබීම මූලික අයිතියකි. වර්තමානයේ මෙම අයිතිය ලෝකයේ නූතන ප්‍රවණතා මගින් තර්ජනයට ලක්ව ඇත.

ජලයේ සමාජ වටිනාකම ගැන සලකා බලන විට පානීය ජලය එම ලැයිස්තුවේ ඉහළට පැමිණේ. වර්තමාන තත්ත්වයත් සමඟ එය විශාල උභතෝකෝටිකයක් වන අතර ඇත්ත වශයෙන්ම අප සැම මිනිසෙකු අතර ජලයේ සමාජ වටිනාකම සමානව සුරක්ෂිත කර ඇත. දැන හෝ නොදැන අපි රටේ එක් කොටසක් නොසලකා හරිමු. කෙළින්ම කිවහොත්, ශ්‍රී ලංකාවේ (හඳුනානොගත් වකුගඩු රෝගය) පිළිබඳ ගැටලුව බොහෝ දුරට මුහුණ දී ඇත්තේ සෞඛ්‍යයට අහිතකර ජලය පරිභෝජනය කිරීම නිසා බව අනාවරණය වී තිබේ. වර්තමාන වාර්තාවලට අනුව, ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ මෙම ගැටලුව සඳහා දැඩි අවධානමක් ඇත. විශේෂයෙන් උතුරු මැද පළාතේ ග්‍රාමීය ප්‍රදේශ වන විලච්චිය, තන්තිරිමලේ, කහටගස්දිගිලිය, ගලෙන්බිඳුනුවැව, පදවිය සහ රාජාංගනය වැනි ග්‍රාමීය ප්‍රදේශ මෙම විනාශයට වඩාත් ගොදුරු වේ.

මෙම ගැටලුව මඟහරවා ගැනීම සඳහා ප්‍රමාණවත් ගෘහස්ථ ජලය ලබා ගත යුතු බව පොදු මතයකි. ගෘහස්ථ ජලය (නළ ජලය) ඕනෑම මනුෂ්‍ය වර්ගයකගේ ජීවන තත්ත්වය උසස් කළ හැකි බව සත්‍යයකි. කෙසේ වෙතත්, දිගු කාලීන ස්ථිරසාර විසඳුමක් සොයා ගැනීමේදී මෙම වකුගඩු රෝගයට මූලික හේතු සොයා බැලීම සුදුසුය.

අතීත වාර්තාවලට අනුව, වර්තමානයට සාපේක්ෂව ජලය ලබා ගැනීම සඳහා සමාන හෝ අඩු පහසුකම් ඇති කාලයේ මෙම වකුගඩු රෝගය වැනි කිසිදු බරපතල සෞඛ්‍ය ගැටලුවක් ඇති නොවූ කිසිදු ප්‍රතිකාර ක්‍රියාවලියකට භාජනය නොවී ඔවුහු ගමේ වැව හෝ ළිඳ හරහා ජලය පරිභෝජනය කළහ. පසුගිය දශක දෙක තුළ මෙම විලාපකාරී තත්ත්වය විශාල ලෙස වර්ධනය වී ඇති බව නිරීක්ෂණය විය. කෘෂිකාර්මික කටයුතුවල දී රසායනික පොහොර හා පළිබෝධනාශක භාවිතය පිළිබඳ වාර්තා සලකා බැලුවහොත්, මෙම වකුගඩු රෝගයේ මෙම හදිසි වැඩිවීම පිළිබඳව පැහැදිලි ඇඟවීමක් ලබා දෙනු ඇත. මෙය අනාගතයේ දී පර්යේෂණ කළ යුතු දෙයකි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මෑතක දී කරන ලද අධ්‍යයනයන්ට අනුව, අනුරාධපුර ප්‍රදේශයේ පොස්පරස් ප්‍රතිශතය අවශ්‍ය මට්ටමට වඩා ඉහළ මට්ටමක පවතින බව අනාවරණය වී තිබේ. (දැනට මිලිග්‍රෑම් 267කි.) වැඩිම ප්‍රමාණය ලැබෙන්නේ ත්‍රිත්ව සුපර් පොස්පේට් (TSP) වලින් වන අතර එහි සාමාන්‍ය අගය කිලෝග්‍රෑමයකට මිලිග්‍රෑම් 31ක් වේ. ටීඑස්පී යනු ක්‍රෝමියම්, කැඩ්මියම්, නිකල්, රසදිය ඇතුළු අනෙකුත් නෙෆ්‍රොටොක්සික් (වකුගඩු සඳහා හානිකර) ලෝහවලින් පොහොසත් ප්‍රභවයකි. ගොවීන් තවමත් මෙය මහා පරිමාණයෙන් භාවිතා කරන්නේ තර්ජනය නොදැන සිටීම හේතුවෙනි.




නවතම පර්යේෂණයන්ට අදාළව, වකුගඩු ගල් සඳහා පොස්පේට් ප්‍රධාන හේතුවක් වන අතර එය වකුගඩු රෝගයට තුඩු දෙන තවත් හේතුවක් විය හැකිය. අප දන්නා පරිදි, උතුරු මැද පළාතේ ප්‍රධාන වැව් බොහොමයක් ගෘහස්ථ ජල අවශ්‍යතා සඳහා භාවිතා වේ. ජාතික ජල සම්පාදන සහ හා ජලාපවහන මණ්ඩලය මගින් ජල සම්පාදන යෝජනා ක්‍රම අනාගතයේදී ද පුළුල් කරනු ඇත. නමුත් අප දන්නා පරිදි රජරට ප්‍රදේශයේ ප්‍රධාන වැව්වල රසායනික සාන්ද්‍රණය බහුලව පවතී. අනුරාධපුර නගරයේ වැව්වල ජාතික ජල සම්පාදන සහ හා ජලාපවහන මණ්ඩලයෙහි ජල තත්ත්ව වාර්තාවලට අනුව, ජලයේ බොරතාවය වේගයෙන් ඉහළ ගොස් තිබේ. ජලයේ බැර ලෝහ සාන්ද්‍රණය පවතින බවට පැහැදිළි ඇඟවීමකි. ජාතික ජල සම්පාදන සහ හා ජලාපවහන මණ්ඩලය හෙළි කරන පරිදි, අපගේ ප්‍රතිකාර පහසුකම් බොහෝ හේතු නිසා ඉහත බැර ලෝහ හා රසායනික සංයෝගවලින් ජලය පිරිසිදු කිරීමට හැකියාවක් නැත. තාක්ෂණයේ හිඟතාවය සහ පෙරීමේ පිරිවැය ඒවායින් දෙකකි. ජාතික ජල සම්පාදන සහ හා ජලාපවහන මණ්ඩලය මේ සම්බන්ධයෙන් පොදු සැලකිල්ලක් දැක්වීමට උත්සාහ කරන නමුත් කෙසේ හෝ එය වකුගඩු රෝග ගැටලුවට මූලික හේතුව සමඟ කටයුතු කිරීමට තරම් සුදුසු නොවන බව පෙනේ. අතිරික්ත රසායනික සංයෝග හා පළිබෝධනාශකවලින් සමන්විත නළ මාර්ග හරහා එකම දූෂිත ජලය සැපයීම තවදුරටත් මෙම ජාතික සීමාව සඳහා තිරසාර විසඳුමක් නොවන බව නැවත සිතා බැලිය යුතුය. එබැවින් නැවුම් ජල මූලාශ්‍ර හරහා ගෘහස්ථ ජලය සැපයීමේ අපගේ උපාය මාර්ග නැවත සකස් කිරීමට කාලය එළඹ ඇති අතර එය මේ රටේ අනාගතය උදෙසා ජාතික ප්‍රමුඛතා සැලැස්මට යටත් විය යුතුය.

2018,2019 සහ 2020 වර්ෂය සඳහා ජාතික ජල සම්පාදන සහ හා ජලාපවහන මණ්ඩලය විසින් අනුරාධපුර නගර වැව්වල ජල තත්ත්ව අධීක්ෂණ වාර්තාව ඉහත දක්වා ඇත.





### මේ සඳහා තිරසාර විසඳුම් තිබේ ද?

සමහර සංවර්ධිත රටවල පානීය ප්‍රභවයන්හි ඉහළ ජල පෝෂක ප්‍රදේශවලට ඉහළ සීමාවන් ඇති අතර ඒවා සැම විටම බාධාවකින් තොරව පවත්වාගෙන යයි. බොහෝ සංවර්ධිත රටවල් හොඳින් සංරක්ෂිත ජලාශ හරහා තම නගරවලට මිරිදිය ජලය සැපයීම සඳහා කිලෝමීටර් 500කට වඩා වැඩි දිගින් යුතු නළ මාර්ග ඉදිකර ඇත. බටහිර ඕස්ට්‍රේලියාවේ "ගෝල්ඩන් පයිප් ලයින්", පර්ත් නගරයේ ගෘහස්ථ ජල සැපයුම සඳහා කිලෝමීටර් 642ක් දිවෙන මොන්ඩරින් ජලාශය නිදසුනකි. ඉන්දියාව, අපේ අසල්වැසි රට ද දේශීය ජල සැපයුම සඳහා එවන් සැකසුමක් ඇති අතර, අප නැවත සිතා බැලිය යුතුය, අප ජල සැපයුම සඳහා එකම උපාය මාර්ග දිගටම කරගෙන යන්නේ ද, වකුගඩු රෝගය සමග සටන් කිරීම සඳහා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වැඩි ආයෝජනයක් කරන්නේ ද නැතහොත් නව ගෘහස්ථ ජල සැපයුම් සංවර්ධන ප්‍රධාන සැලසුම් සඳහා ආයෝජනය කරන්නේ ද යන්න සෙවීම වඩා තිරසාර ය.




ශ්‍රී ලංකා රජය විසින් මෑතක දී උතුරු මැද පළාත් ඇළ ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර එය කළු ගඟ-මොරගහකන්ද ජලාශය උතුරු මැද පළාතට හරවන අතර එමගින් එන්.සී.පී. හි වගා ප්‍රමාණය සුරක්ෂිත වන අතර පානීය ජල ඉල්ලුම සපුරාලනු ඇත. මෙම අපසරණය උමං මාර්ග හා සමීප වාහකය හැරුණු විට විවෘත ජලාපවහන ඇළකින් සමන්විත වන බැවින් ජලය පහසුවෙන් දූෂණය විය හැකිය. එබැවින් එය උතුරු මැද පළාත් ප්‍රදේශයේ වකුගඩු රෝග. ගැටලුව සඳහා තිරසාර විසඳුමක් නොවිය හැකිය.

ඒ සඳහා විකල්ප විසඳුමක් ලෙස අනාගතයේ දී පහත සඳහන් ක්‍රියාමාර්ග ගත හැකිය. මානව ක්‍රියාකාරකම්වල මන්දගාමී වර්ධනයක් සහිත නැවුම් ජල පෝෂකයක් ලෙස නඩත්තු කෙරෙන නකල්ස් රක්ෂිතය වන කළුගඟ ජලාශයේ ජල පෝෂක ප්‍රදේශය අධ්‍යයනය කළහොත් මෙයට විසඳුමක් දැකිය හැකිය. ජාතික ජල සම්පාදන සහ හා ජලාපවහන මණ්ඩලයෙහි ජල සම්පාදන යෝජනා ක්‍රමය හේතුවෙන් මානව ක්‍රියාකාරකම් සඳහා සුප්‍රසිද්ධ සංරක්ෂිත හා සීමාසහිත ප්‍රදේශයක් වන ලබුගම - කලටුවාව වන රක්ෂිතය ලෙස මෙම ප්‍රදේශය මුළුමනින්ම තහනම් කර සංරක්ෂණය කිරීමට අපට තවමත් හොඳ අවස්ථාවක් තිබේ. එවිට එය ජලයේ ගුණාත්මකභාවය සහතික කරනු ඇත. අනෙක් අතට, අපි ඉහළ ඇළහැර ඇළ හා උතුරු මැද පළාත් ඇළ මාර්ගයට සමාන්තරව වෙනම රේඛාවක් ඉදිකරන්නේ නම්, පිරිසිදු ජලය අපවිත්‍ර නොවී උතුරු මැද පළාත් ප්‍රදේශයට හරවා යැවිය හැකිය.

ජාතික ජල සම්පාදන සහ හා ජලාපවහන මණ්ඩලයේ වාර්තාවලට අනුව, උතුරු මැද පළාත් ප්‍රදේශයේ ජනගහනය මිලියන 1.1ට ආසන්න වන අතර වසර 35ක වර්ධන සාධකය 1.5ක් වන අතර එය මිලියන 2ට වඩා වැඩි නොවේ. අප ඒක පුද්ගල ජල භාවිතය දිනකට ලීටර් 120 ලෙස සලකන්නේ නම්, දෛනික ඉල්ලුම දිනකට 0.25MCM වේ. එබැවින් මෙම ඉල්ලුම කළු ගංගා ජලාශයේ සෘජු නළ මාර්ගයක් හරහා පහසුවෙන් ලබා ගත හැකි අතර එමගින් දීර්ඝ කාලයක් තිස්සේ උතුරු මැද පළාත් ජලාශවල බීම සඳහා වියුක්ත කිරීම් කපා හැරිය හැකි අතර එම ඉතිරි කිරීම වගාව සඳහා ජල ඉල්ලුමට යොදාගත හැකිය. ගෘහස්ථ ජල සැපයුමේ මහා පරිමාණ අවශ්‍යතාවය සඳහා තනි ජලාශයක් වෙන් කිරීමෙන් වාරිමාර්ග සැපයුම් හා ගෘහස්ථ ජල සැපයුම් ආයතන දෙකක් අතර පවත්නා සංකූලතා නිරාකරණය කළ හැකිය. මෙම ගැටලුවට එවැනි සමස්ත ප්‍රවේශයකින් ජල සමතුලිතතාවය ද සිදු කළ යුතුය. මෙම ව්‍යාපෘතිය සඳහා දැරීමට සිදුවන වියදම රට තුළ සිදුවන එක් මහාමාර්ග ව්‍යාපෘතියක පිරිවැයට වඩා වැඩි



ඉංජි. එල්.කොටවිල ආරච්චි
වාරිමාර්ග ඉංජිනේරු
වාරිමාර්ග
දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකාව





# වැවක අන්දරය

## ලෝක ජල දිනය නිමිත්තෙනි

ලෝක ජල දිනය - මාර්තු 22 යනු ජලයේ වැදගත්කම පිළිබඳව අවධානය යොමුවන හා ඒ වෙනුවෙන් වෙන් වූ දිනයකි. 2021 වසරේ ලෝක ජල දිනයේ තේමාව ලෙස "ජලයට වටිනාකමක්" යන්න තෝරාගෙන තිබේ. මෙවන් විශේෂිත දිනයක පමණක් නොව මානව වර්ගයා ලෙස වසර පුරාවට ජලයෙහි වැදගත්කම ගැන අපගේ අවධානය යොමු කිරීම ඉතා වැදගත්ය. එලෙසම, වසර 2500 කට වඩා පැරණි ප්‍රෞඪ ඉතිහාසයක් උරුම ශ්‍රී ලාංකිකයන් වන අප වැනි කෘෂිකාර්මික රටවල ජනයාට ජලයෙහි ඇති වටිනාකම අති මහත්ය.

ඈත අතීතයේ අප රටේ ජීවනාලිය වූයේ ජාතියට බත සැපයීමට දායක වූ වාරි පද්ධතියයි. දුඹුරුවන්ව නිස්සාරව පැවති වියළි කලාපය නිල වර්ණයෙන් සහ කොළ පාටින් සිත්තම් කිරීමට එයට හැකි විනි. අදටත් විශාල ජනතාවකට ජීවන මාර්ග සපයමින් ග්‍රාමීය ජනතාවගේ ප්‍රධාන ජීවනාලිය බවට පත්වී ඇත්තේ මෙම වාරි පද්ධතියයි. වැසි කාලවල දී ලැබෙන ජලය එක්රැස් කර වියළි කාලවල දී භාවිතා කිරීමට වාරි පද්ධති අතීතයේ පටන් බිහි විය.

වාරි කර්මාන්තය ලොව මුලින්ම ඇරඹූ දේශයන් ගෙන් එකක් ලෙස ශ්‍රී ලංකාව සැලකෙන අතර, එක් ගම් දනව්වකට ගැළපෙන වැව් පමණක් නොව කුළු වැව් හා මහ වැව් වලින් සමන්විත වාරි පද්ධතියක් ශ්‍රී ලංකාව සතුය.

සැබැවින්ම 'වැව' යනු ශ්‍රී ලාංකීය මුතුන් මිත්තන් විසින් ස්වභාවික ජල ධාරාවන් හරහා වැව් බැම්මක් බැඳ ඉදිකළ නිර්මාණයක් පමණක් නොව එය තිරසාර සංවර්ධනය උදෙසා වූ උදාර සංකල්පයකි. එහි උදාරතම සංකල්පය ලෙස 'වැවයි, දාගැබයි ගමයි පන්සලයි' යන තිරසාර සංකල්පය දැක්විය හැකිය. එම සංකල්පය අතීතයේ පටන්ම ශ්‍රී ලංකාවේ අති සාර්ථක වූ සංකල්පයක් වූ අතර, මානව වර්ගයාගේ යම් ක්‍රියාකාරකම් නිසා සොබා දහමේ සිදුවන කාලගුණ විපර්යාස හේතු කොට ගෙන එවැනි උතුම් සංකල්ප මේ වන විට අපගෙන් ඈත්වෙමින් පවතී.

මෙම 'වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි' යන සංකල්පය සොබා දහම හා මුසුවුණු ආගමික පසුබිමකින් යුතු ඉතාමත් සශ්‍රීක කෘෂිකාර්මික පසුබිමකින් හෙබි වීම එහි තිරසාර බවේ සංකේතයක් ලෙස දැක්විය හැකිය. එලෙසම, එය වර්තමානයේ පවතින ක්ෂණික වැසි, ගංවතුර හා නියං තත්ත්ව, සුළි සුළං වැනි තත්ත්වවලට එරෙහිව නැගී සිටීමට කදිම සංකල්පයකි. එම නිසා වැවක් මගින් ජලයෙහි ඇති වැදගත්කම මෙන්ම එහි වටිනාකම මනාව පිළිබිඹු වේ.

මෙම පැරණි වාරි සංස්කෘතියේ තවත් වැදගත් අංගයක් වන්නේ 'කුළු වැව්' පද්ධතියයි. එය 'එල්ලංගා වැව්' පද්ධතිය ලෙස ද විටෙක හැඳින්වෙන අතර, එය පැරණි වාරි ශිෂ්ඨාචාරයේ අතිදක්ෂ ක්‍රමවේදයක් ලෙස දැක්විය හැකිය. එය වැව ආශ්‍රිත ඉහළ ජල ධාරා ප්‍රදේශවල ජලය ඉතිරි කරගෙන පහළ ජල පෝෂිත ප්‍රදේශවලට ලබාදීමේ දේශීය සංකල්පය මුල් කරගත්තකි. මෙම එල්ලංගා වැව් පද්ධතීන්ගේ සුවිශේෂීතාවය වන්නේ වැව ආශ්‍රිත ප්‍රදේශයේ පමණක් නොව වැව් පද්ධතිය අඩංගු වන මුළු ප්‍රදේශයේම භූගත ජල මට්ටම ඉහළ ගොස් එය සශ්‍රීක වීමයි. එය මානව වර්ගයාට මෙන්ම සත්ව ප්‍රජාවටද මහගු




පිටිවහලක් වන්නේය. ඉතා අධික වර්ෂාවක දී එම වර්ෂා ජලය මහා වැව් කරා ක්ෂණිකව ගලා ඒමට පෙර කුළු වැව් පිරී ඒවායින් ඉහළ පෝෂක ප්‍රදේශ සශ්‍රීක වීම සිදු වෙයි.

තවද එලෙස වැසි ජලය ක්‍රමාණුකූලව මහා වැව් කරා ගලා ඒම නිසා මහා වැව් ගොඩවීම ද අවම වේ. එබැවින් මහා වැව්වල ධාරිතාව උපරිම මට්ටමකින් පවත්වා ගැනීමට හැකි වෙයි. මෙම එල්ලංගා පද්ධතිය ඉතාමත් පරිසර හිතකාමී පරිසර පද්ධතියක මූලාරම්භය ද වෙයි. වනාන්තර තුළ පවතින කුළු වැව්වලින් පෝෂණයවන වන සතුන් ග්‍රාමීය ප්‍රදේශවලට ජලය සොයා ඒම අඩුවීම මගින් වන සතුන්ගේ නිදහස රැකීම මෙන්ම මානව වර්ගයා හා වන සතුන් අතර සිදු වන ගැටුම්ද අවම වේ.

කුළු වැව් මෙන්ම අනෙකුත් වැව් වලට ද වැසි ජලය ලැබෙන ප්‍රදේශය "ධාරා ප්‍රදේශය" හෙවත් "ඉහත්තාව" ලෙස හැඳින්වේ. ඉහළ ධාරා ප්‍රදේශයන්ට ලැබෙන වැසි ජලය ස්වභාවික දිය පහරවල් හෝ ඇළ මාර්ග දිගේ කුඩා වැව්වලට පැමිණේ. සාමාන්‍යයෙන් මෙම ධාරා ප්‍රදේශ උස් බිම් හෝ කඳුවලින් වට වූ ප්‍රදේශයකින් යුක්ත වී ඇත. මෙම ධාරා ප්‍රදේශය තුළ ඇති වන ගහනය මෙන්ම එහි ඇති ශාක ප්‍රජාව ද වැව පෝෂණය කිරීම සඳහා මහගු කාර්යයක් ඉටුකරයි.

ධාරා ප්‍රදේශයේ සිට වැවට ජලය ගලා ඒමට පෙර එය 'පැන්නුම' හරහා ගලා එයි. පැන්නුම යනු වැවට එන ජල පහරේ වේගය පාලනය කිරීම සඳහා ගල් බැම්මක් හෝ බාධකයක් යොදා ගනිමින් වැවට ඉහළින් කරන නිර්මාණයකි. තවද එය වැව තුළට එන ජලයේ පෙරණයක් ලෙස ද භාවිතා වෙයි. එමගින් වැව තුළට රොන් මඩ එකතුවීම හා කුණු එකතු වීම අවම වීම සිදු වෙයි. වැවට ඉහළින් රොන් මඩ එකතු වීම වැළැක්වීමට ඇති තවත් උපක්‍රමයක් වන්නේ 'ගොඩවල' යි. මෙමගින් රොන්මඩ මගින් වැව ගොඩවීම අවම වන අතර, වැවෙහි කල්පැවැත්ම හා ධාරිතාවය ද වැඩි කරයි. වැසි ජලය ගංගා ඇළ දොළ දිගේ පැමිණ පැන්නුම හා ගොඩ වල හරහා වැවට ඇතුළුවන තැන හඳුන්වන්නේ 'ඇතුල්වාන' ලෙසය.

වැවෙහි ඉහළ ප්‍රදේශය දෙපසට වන්නට උස් බිම් ප්‍රදේශයක් ලෙස 'ඉස්වැටි' නැතහොත් 'පෝටාවැටි' පවතී. එහි ප්‍රධානතම කාර්යය වන්නේ ඛාදනය වූ රොන්මඩ හා පස්, වැව තුළට ඒම වැළැක්වීමයි. එලෙසින් වැව දෙපස පෝටා වැටි පැවතීම මගින් වැවෙහි ජල පෘෂ්ඨයෙහි වර්ගඵලය අඩුවීම සිදුවේ. එමගින් වැව් පෘෂ්ඨය මතින් ජලය වාෂ්පීභවනය වීම අවම වී වැඩි ජල ප්‍රමාණයක් ආරක්ෂා කර ගත හැකි වේ. 'වැව් තාවුල්ල' හෝ 'වැව් ඉස්මත්ත' බොහෝ විට භාවිතා වූයේ හේන් වැවීම සඳහාය. සාමාන්‍යයෙන් අලුත් අවුරුදු උත්සව වැනි සංස්කෘතිකමය හා සාම්ප්‍රදායික උත්සව සිදු වූයේ මෙම වැව් තාවුල්ලේය. මෙම වැව් තාවුල්ල හෝ වැව් ඉස්මත්තේ භූගත ජල මට්ටම ඉතා ඉහළ අගයක පවතින බැවින් මෙම ප්‍රදේශ ඉතා සුව පහසු සිසිලසක් ගෙන දෙන ප්‍රදේශ වේ.

වැවක් යනු ඉතා විශාල ප්‍රදේශයක ජලය විහිදී පවතින ප්‍රදේශයකි. එබැවින් වැවක ජලය වාෂ්පීභවනය වීම ඉතා වැදගත් මෙන්ම අවම කළ යුතු සාධකයකි. සුළගේ වේගය වැඩිවත්ම වැවෙහි ජල පෘෂ්ඨය මතින් ජලය වාෂ්පීභවනය වීම වැඩි වීම නිසා වැව් තලය මත සුළගේ වේගය අවම කිරීමට පැරැන්නන් සොබා දහමේ පිහිට පැතුවේ ඉතා අපූරු ලෙසය. 'ගස් ගොම්මන' නම් වූ ප්‍රදේශයක වැඩුණු ඉතා උස් හා විශාල ගස් මගින් වැවට ඉහළින් හමන සුළං ධාරාව තරමක් ඉහළින් හමා යාමට සලස්වයි. එවිට වැව මගින් වාෂ්පීභවනය වන ජල ප්‍රමාණය අඩු වී වැවෙහි ජලය සුරැකිව තබයි.

'කළිඟු බැම්ම' යනු පැරණි වාරි ශිෂ්ඨාචාරයේ වැවක තිබූ තවත් අංගයකි. වැව් පිටිය තුළ වූ උස් බිම් දෙකක් යා කර පිටවානට සමාන්තරව ඊට ඉහළින් මෙය ඉදි කර ඇත. වැව වාන් දමන අවස්ථාවේ දී මෙම කළිඟු බැම්ම යට වන අතර, මෙමගින් වැවෙහි ජලය ආරක්ෂා වනවා මෙන්ම පිටවානෙහි ස්ථායීතාවයට මෙන්ම ආරක්ෂාවට ද රුකුලක් වෙයි.

තවද මෙම කළිඟු බැම්ම මගින් වැව තුළ තවත් කුඩා වැවක් නිර්මාණය වෙයි. එමගින් වැව තුළ පවතින ජලයේ පෘෂ්ඨ වර්ගඵලය අවම වී වාෂ්පීභවනය අඩුවේ. ඇයට රන් දිය පුදන වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාරි ගීතයේ ද වාරිමාර්ග දෙපාර්තමේන්තුව මෙම කළිඟු බැම්මට උපමා කර ඇත්තේ එහි වැදගත්කම මනාව පෙන්නුම් කරමිනි.

"ගිගුම් දී රළ ගලන ................................
වියරු දිය විදු නැණින .......
නතු කරන්, පිතු සෙනෙන් සිඹිනා ............
කළිඟු බැම්මක් විලස නැගෙනා,
කළිඟු බැම්මක් විලස නැගෙනා ..........."

ශ්‍රී ලාංකීය වාරි ක්ෂේත්‍රය තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුව කළිඟු බැම්මක් විලස නැගී සිට මෙහෙය සිදු කිරීමට සූදානම් බව මින් කියැවෙයි.

වැව් බැම්මට පහළට වන්නට ඇති රක්ෂිත ප්‍රදේශය 'කට්ටාකඩුව' ලෙස හැඳින්වෙයි. වැව තුළෙහි පවතින ජලයේ අඩංගු ලවණ හා අනෙකුත් හානිකර අංගු පහළ පිහිටි කුඹුරු කරා ගලා යාම අවම කරන පෙරණයක් ලෙස ද මෙය භාවිතා වෙයි.

සහල් යනු ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආහාරය වන අතර, වී යනු ලංකාවේ බහුලව වගා කරන කෘෂිකාර්මික බෝගයයි. එලෙසම වැව ආශ්‍රිතව අනෙකුත් බෝග වර්ග ද වගා කරනු දැකිය හැකිය. 'ගංගොඩ' යනු වැවට පහළින් අමතර බෝග වගා කරන ප්‍රදේශයයි. එය ඉතා සශ්‍රීක ප්‍රදේශයක් වන අතර, එහි වගා කළ බෝග පරිභෝජනය කළ එදා හෙළ මුතුන් මිත්තෝ ශරීර ශක්තියෙන් ද නිරෝගී බවින් ද පරිපූර්ණ වූවන් බවට ඉතිහාසය සාක්ෂි දරයි. වැවක ඉහත සඳහන් කළ අංග අතරින් සුවිශේෂී අංගයක් වන්නේ 'හරක් ගාල' යි. එහි හරක් එළුවන් වැනි සතුන් ඇති කිරීම සිදු විය. එමගින් මදුරු උවදුරු අවම වීම ද සිදු වීම ඉතා වැදත් කරුණකි. වැවක ජලය පිට කිරීම ගැන සලකා බලන විට ඒ සඳහා සොරොව්ව වර්ග කිහිපයක්ම භාවිතා විය. ඉන් බහුලව භාවිතා වූ දෙකක් නම් බිසෝ කොටුව හා කැට සොරොව්වයි. ඉතා ඉහළ පීඩනයකින් පිටව යන ජල කඳෙහි පීඩනය අඩු කර ඉන් සිදු වන හානිය අවම වන සේ ජලය පිට කිරීම බිසෝ කොටුවේ ප්‍රධාන අරමුණ වූ අතර, කැට සොරොව්ව භාවිතා වූයේ වැවක ජලය ඉහළ මට්ටමකින් ලබා ගැනීමටයි. එම තාක්ෂණික උපක්‍රම පිළිබඳ තව දුරටත් පර්යේෂණ කරමින් පවතින අතර, අප ශ්‍රී ලාංකික වාරි ක්ෂේත්‍රයේ පැරැන්නන් විසින් සිදු කර තිබූ නිර්මාණ විශ්මය ජනකය.

සැබැවින්ම ශ්‍රී ලාංකික ඉතිහාසය තුළ වූ වාරි ශිෂ්ඨාචාරය සොබා දහමට මෙන්ම ශාක හා සත්ව ප්‍රජාවට ඉතා හිතකර ලෙස ගොඩ නැගුණු එකකි. වැවක් නිර්මාණය කිරීමේ දී එහි ස්වභාවික පාරිසරික විද්‍යාත්මක කරුණු සැලකිල්ලට ගත්තා මෙන්ම ඉතා දියුණු තාක්ෂණික උපක්‍රම ද භාවිතා විය. වැව් බැම්ම, රළපනාව, සොරොව්ව, පිටවාන යන ව්‍යුහයන් තැනීමේ දී ශ්‍රී ලාංකික වාරි තාක්ෂණය ලොව අන් කිසිවකුට දෙවැනි නොවන බව සැකයෙන් තොරව පැවසිය හැක්කේ එබැවිනි.

අපගේ ශ්‍රී ලාංකික වාරි පද්ධතිය හා සොබා දහම ඉතා මැනවින් බද්ධ වූ පද්ධතියකි. සොබා දහමට අනුගත වෙමින් පැවති අපගේ වාරි පද්ධතිය මගින් කාලගුණ විපර්යාසවලට එරෙහිව නැගී සිටීමට තරම් ශක්තිමත් වූ අතර, මෑත කාලීනව සිදු වූ මානව ක්‍රියාකාරකම් නිසා සිදුවී යන විපත් ගැන සිතිය යුතු කාලය එළඹ ඇත. එලෙසම එම කාළගුණ විපර්යාසවලට අනුගත වීම හෝ වලක්වා ගැනීම උදෙසා මානව වර්ගයා ලෙස අපට කළ හැකි දේ ගැනද සිතා බැලීම ඉතා වැදගත් වේ. එලෙස ජලයෙහි ඇති වටිනාකම තේරුම් ගෙන ක්‍රියාකළහොත් අප මානව වර්ගය ලෙස ජලයට ලබාදෙන වටිනාකමට වඩා වටිනාකමක් ජලය විසින් මනුෂ්‍ය වර්ගයාට ලබාදෙනු නිසැකය.



ඉංජි. ජනක
ප්‍රියන්ත වික්‍රමසූරිය
වාරිමාර්ග ඉංජිනේරු
කොළඹ කොට්ඨාසය.


ඉංජි. දසුන්
තිලකරත්න
වාරිමාර්ග ඉංජිනේරු
ඇලහැර කොට්ඨාසය.


ඉංජි. පී.පී.
දඹෝරගම
ප්‍රාදේශීය වාරිමාර්ග
ඉංජිනේරු,
කවුඩුල්ල කොට්ඨාසය.

# ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තයේ ඉතිහාසය

වසර 2500 කට වැඩි වාරි ඉතිහාසයකින් හෙබි ශ්‍රී ලංකාවට වාරි ශිෂ්ටාචාරයකින් බිහි වූ රටක් ලෙස ලොව අන් රටවල් අතර සුවිශේෂී තත්ත්වයක් හිමි වේ. වර්ෂාවෙන් ලැබෙන ජලය රැස්කර තබා ගැනීම සඳහා වැව් ඉදිකිරීමේ ශිල්පය අපටම ආවේණික වූ කර්මාන්තයකි. මෙසේ ඉදිකරනු ලබන වැව් මගින් පානීය ජලය, කෘෂිකර්මාන්තය, අනෙකුත් ගෙදරදොර පරිභෝජන කටයුතු සතා සිව්පාවුන්, ගහකොළ හා පරිසර අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය ජලය ලබා දේ.

වැව් අමුණු සහ ඇළ මාර්ග වැනි වාරි කර්මාන්ත ඉදිකිරීමේ අපේ තාක්ෂණය නවීන විද්‍යාව අනුවද නිශ්චය කර ගැනීමට අපහසු තරම් ඉහළ මට්ටමක පවතී. අපටම ආවේණික වූ ශිල්පයක් වන නමුත්, මේ පිළිබඳව ලියවුණු ඓතිහාසික ලිපිලේඛන සොයා ගැනීමට නොහැකිවීම ඇතැම් විට ගැටලුවකි. අපේ රටේ ලියැවුණු ඉතිහාස කතාව ආරම්භ වන්නේ, ක්‍රි. පූ. 6 වන සියවසේ සිදු වූ විජයාගමනයෙන් පසුවයි. ඒ අනුව මේ කතාව ආරම්භ වන්නේ මීට වසර 1400 කට පෙර ලියවුණු මහා වංශය හා චූල වංශය මගිනි. එසේ ලියවුණු ඉතිහාස පුරාවෘත්තයට අනුව ක්‍රි. පූ. 4 වන සියවසේ පණ්ඩුකාභය රජු විසින් ශ්‍රී ලංකාවේ ප්‍රථම වැව එනම්, අභය වැව නොහොත් බසවක්කුලම වැව නිර්මාණය කර ඇත. අනුරාධපුර යුගයේ දී මල්වතු ඔය ද්‍රෝණිය තුළ ඉදිකර ඇති මෙම වැවෙහි ප්‍රධාන අරමුණ වී ඇත්තේ එකල ප්‍රධාන නගරය වූ අනුරාධපුර නගරයට අවශ්‍ය ගෘහස්ත ජලය ලබා දීමයි. ඊට අමතරව වාරි කෘෂි කර්මාන්තය ද තවත් අවශ්‍යතාවයක් ලෙස සලකා ඇත. ඉන් අනතුරුව රජරට නොහොත් වාරි නගරය ලෙස හැඳින්වූ අනුරාධපුරය කේන්ද්‍ර කර ගනිමින් තිසා වැව, නුවර වැව සහ තවත් බොහෝ වැව් විශාල ප්‍රමාණයක් අනුරාධපුර ප්‍රදේශයේ ඉදිවිය. එහිදී දේවානම්පියතිස්ස රජතුමා, වසභ රජු, මහසෙන් රජු, අග්බෝ රජු ඇතුළු සෑම රජ පෙළපතක්ම සඳහන් කළ හැකිය. මෙම සියලු රජවරු පරදවා පරාක්‍රමබාහු රජතුමා විසින් දිවයිනේ සියලු පළාත්වල වාරි කර්මාන්ත ඉදි කිරීමෙන් වාරි මහරජු බවට පත්විය. එසේ වාරි සංස්කෘතියක් බිහි කිරීමෙන් රට සශ්‍රීක වූ බවත්, ආහාරයෙන් ස්වයංපෝෂිත වූ බවත්, වෙනත් උවදුරු, කරදර නොතිබූ බවත් ඉතිහාස කතාවේ මනාව සඳහන් වේ.

## යටත් විජිත සමය

වාරි සංස්කෘතියකින් සෞභාග්‍යමත් ලෙස පැවති අපේ රට ක්‍රි.ව. 1505 දී ඉතාමත් අවාසනාවන්ත ඉරණමකට පත්විය. පළමු ආක්‍රමණය වූ පෘතුගීසීන්ගේ පැමිණීම එයට හේතුවයි. එහෙත්, රට අභ්‍යන්තරයට පැමිණීමට පෘතුගීසීන්ට ඉඩ නොදුන් ශ්‍රී ලාංකීය ජනයා ඔවුන් වෙරළ තීරයට පමණක් සීමා කෙරිණ. එහෙත්, ඔවුන් වසර 150ක් පමණ එනම් 1656 වන තෙක් අප රටේ රැඳී සිටියේය. ඉන් අනතුරුව 1659 දී ලන්දේසී ආක්‍රමණය සිදු වූ අතර, ඔවුන්ද වෙරළ තීරයට පමණක් සීමා විය. එහෙත් ලන්දේසීන් ද වසර 150ක් පමණ මෙරට සැරි සැරූහ. වෙළදාම ප්‍රධාන ජීවිකාව කරගත් මෙම ජාතීන් වෙරළ තීරය ආසන්නයේ ප්‍රවාහන කටයුතු සඳහා ඇළ වේලි ඉදිකරනු ලැබීය. මෙම අයගෙන් වාරි කර්මාන්තයට ලැබුණු දායකත්වය ඉතා අල්පය. පසුව 1796 දී බ්‍රිතාන්‍ය ජාතිකයන් ශ්‍රී ලංකාවේ වෙරළ තීරය අත්පත් කරගෙන 1815 වනවිට සමස්ත දිවයිනම ආක්‍රමණය කරනු ලැබීය. පෘතුගීසීන් පළවා හැරීම සඳහා ලන්දේසීන්ගේ සහාය පැතූ අතර, ලන්දේසීන් පළවා හැරීම සඳහා ඉංග්‍රීසීන්ගේ සහාය පැතූහ. මේ සෑම සහායකින්ම අපේ රටට සිදු වූයේ අනර්ථයකි. එය "ඉඟුරු දී මිරිස් ගත්තා වගේ" යැයි කියමින් ජනප්‍රවාදයක් බිහිවීම තුළින් මෙහි ප්‍රතිවිපාක කීමට වෙනත් පැහැදිලි කිරීම් අවශ්‍ය නොවේ.

ඉංග්‍රීසීන්ගේ භූමිකාව වෙනස්ම තත්ත්වයක් විය. ඔවුන්ට අවශ්‍ය වූයේ අපේ රටේ සම්පත් සූරා කෑමට අමතරව දිගුකාලීන වැඩසටහනකට අනුව සමස්ත ලෝකයම යටත් කර ගැනීමටයි. එහිදී සමාජ, ආර්ථික හා සංස්කෘතිකමය වශයෙන් අපේ රට මහා පෙරළියකට ලක් කරනු ලැබීය. ඉංග්‍රීසීන්ගේ අභිප්‍රාය වූයේ අපේ රටේ ඇට, මුතු මැණික්, කුළුබඩු වර්ග හා ඇත් දළ වැනි වටිනා සම්පත් බ්‍රිතාන්‍යයට රැගෙන යන අතර තේ, පොල්, රබර් වැනි වගාවන් ප්‍රචලිත කිරීමෙන් ආදායම උත්පාදනය කිරීමයි. විදේශ ආක්‍රමණිකයන් සමඟ පැවති යුද්ධයන්හි දී වැව් අමුණු විශාල ප්‍රමාණයක් විනාශ විය. ඊට අමතරව වැව් අමුණු නඩත්තු නොකිරීම හේතුවෙන් දේශීය වාරි කර්මාන්තය සම්පූර්ණයෙන්ම අකර්මණ්‍ය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලාංකීය ජනයාගේ ආහාර ප්‍රශ්නයක් උද්ගත විය. ශ්‍රී ලාංකීය ජනයාගේ පෝෂණය දුර්වල වීම හේතුවෙන් විවිධ ලෙඩ රෝගවලට භාජනය වූ අතර, ජනතාව නඩත්තු කිරීම ඉංග්‍රීසි ජාතීන්ට අභියෝගාත්මක විය. මේ හේතුවෙන් ජනයාගේ ආහාර සහ බෙහෙත් හේත් සඳහා අමතර පිරිවැයක් දැරීමට සිදු වූ අතර ශ්‍රම බලකාය අහිමි වීම හේතුවෙන් තේ, පොල්, රබර් වගාව සඳහා අවශ්‍ය ශ්‍රම බලකාය ශ්‍රී ලංකාව තුළින් සපයා ගැනීමට නොහැකි විය. මේ සඳහා විකල්පයක් වශයෙන් ඉන්දියාවෙන් කම්කරුවන් ගෙන ඒමට බ්‍රිතාන්‍ය රජය කටයුතු කරනු ලැබීය.

ජාතික ආහාර සුරක්ෂිතතාවය අහිමි වීම හේතුවෙන් අමතර පිරිවැයක් දැරීමට බ්‍රිතාන්‍ය රජයට සිදු වූ අතර, එය අවම කර ගන්නේ කෙසේද යන්න බ්‍රිතාන්‍ය පාලකයන් කල්පනා කරනු ලැබීය. එහි ප්‍රතිඵලයක් වශයෙන් යුද්ධය හේතුවෙන් විනාශ වී ගිය වාරි කර්මාන්තය නැවත නගාසිටුවීම සඳහා බ්‍රිතාන්‍ය රජය විශාල වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට විය. වාරි කර්මාන්ත නගා සිටුවීමකින් තොරව මෙම රටෙන් ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි බව ඔවුනට අවබෝධ විය. ඒ අනුව විනාශ වී ගිය වාරි පද්ධතිය අධ්‍යයනය කිරීම සඳහා ලන්ඩන් සිවිල් ඉංජිනේරු ආයතනයේ ඉංජිනේරුවරුන් ශ්‍රී ලංකාවට කැඳවනු ලැබීය. ඔවුන් පැමිණ වාරි කර්මාන්තය පමණක් නොව මාර්ග පද්ධතිය හා නව දුම්රිය මාර්ග පද්ධතිය සැලසුම් කරනු ලැබීය. බ්‍රිතාන්‍ය පාලන සමය ආරම්භයේදී අපේ රටේ පාලනය සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙස යුද්ධ නිලධාරීන් යොදාගනු ලැබුව ද පසුව හඳුනාගත් යටිතල පහසුකම් සංවර්ධනය ප්‍රමුඛතාවයක් වූ බැවින් වෘත්තිය පදනමක් සහිත ඉංජිනේරුමය හා මිනින්දෝරු කාර්ය මණ්ඩලය දෙපාර්තමේන්තු පරිපාලනය සඳහා පත් කරනු ලැබීය.

ඉහත පසුබිම යටතේ යටිතල පහසුකම් සංවර්ධනය ප්‍රධාන කාර්යභාරය කර ගනිමින් රජයේ වැඩ දෙපාර්තමේන්තුව (PWD)1796 දී ආරම්භ කරනු ලැබීය. ඒ යටතේ වාරිමාර්ග, ගොඩනැගිලි, මහාමාර්ග, දුම්රිය, මිනින්දෝරු වැනි අංශ ස්ථාපිත කරනු ලැබීය. මෙම සෑම අංශයකම ප්‍රධාන තනතුර සුදුසුකම්ලත් ඉංජිනේරුවරුන්ට හිමි විය. එහිදී හෙන්රි පාකර්, බ්‍රවහියර් වැනි වෘත්තීයවේදීන් අපේ රට පිළිබඳ විශාල අධ්‍යයනයක නිරත විය. මෙහිදී ශ්‍රී ලංකාවේ භූ විෂමතා සිතියම නිර්මාණය කරමින් පැරණි වැව් අමුණු සියල්ල විමර්ශනය කරනු ලැබීය. මෙම අධ්‍යයනයේ දී බ්‍රිතාන්‍ය වෘත්තියවේදීන්ට නිරීක්ෂණය වූ ප්‍රධාන කාරණය වන්නේ අපේ රටේ වාරි කර්මාන්තය විශ්මිත තාක්ෂණයකින් යුතු බවයි. එය තේරුම් ගැනීමට එවකට පැවති බ්‍රිතාන්‍ය තාක්ෂණය අනුව අපහසු කාරණයක් විය. පස්බැම් යොදා ගනිමින් ඉදිකර තිබූ විශාල වැව් හා සැතපුම් ගණන් දිවයන යෝධ ඇළ මාර්ග වල තාක්ෂණය හඳුනාගැනීම ඔවුනට ගැටලුවක් විය. මේ හේතුවෙන් කිසිදු ආකාරයක ව්‍යුහාත්මකව වෙනසක් සිදු නොකරමින් පැරණි වාරි කර්මාන්තය පැවති ආකාරයටම නැවත පුනරුත්ථාපනය කළ යුතු බවට ඔවුන් තීරණය කරනු ලැබීය.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ආරම්භය

1796 වසරේ සිට සිදු කරන ලද අධ්‍යයනයන්හි ප්‍රතිඵලයක් ලෙස 1900 මැයි 15 වන දින වාරිමාර්ග විෂය සඳහා වෙනම ම දෙපාර්තමේන්තුවක් එකල ප්‍රධාන නගරයක් වූ ත්‍රිකුණාමලයේ දී ආරම්භ කරනු ලැබීය. පසුව කොළඹ කොටුව ප්‍රදේශයටත් ඉන් අනතුරුව 1961 වසරේ දී කොළඹ 07, ජාවත්තේ පිහිටි වර්තමාන පරිශ්‍රයටත් ගෙන එනු ලැබීය. ජාතික ආහාර සුරක්ෂිතතාවය සඳහා වාරි කර්මාන්තය වෙනුවෙන් වෙනම ම දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කළ යුතු බව ඉහත අධ්‍යයනවල දී බ්‍රිතාන්‍ය පාලකයින්ට අවබෝධ විය. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පළමු අධ්‍යක්ෂ වරයා ඉංජි. එස්. ඩී. එස්. වෝර්ඩ් මහතාය. මෙම දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් අනතුරුව පළාත් මට්ටමින් හා දිසාපතිවරයා යටතේ පාලනය වූ මහා වාරිමාර්ග අංශ අහෝසි කරනු ලැබීය. එහෙත්, සුළු වාරිමාර්ග විෂය පමණක් දිසාපතිවරයා යටතේ තවදුරටත් පැවතිණ. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පළමු වසර 50 තුළ නටඹුන් වූ සියලුම ප්‍රධාන වාරි කර්මාන්ත වන කලා වැව, යෝධ ඇළ (ජය ගඟ), මින්නේරිය, පරාක්‍රම සමුද්‍රය, නාච්චදූව, කන්තලේ සහ තවත් විශාල ප්‍රමාණයේ වැව් අමුණු දිවයින පුරාම ප්‍රතිෂ්ඨාපනය කරනු ලැබීය. මෙම දැවැන්ත කාර්යභාරයේ දී බ්‍රිතාන්‍ය පරිපාලනයේ නායකත්වය යටතේ දේශීය වෘත්තිකයන් සම්බන්ධ කර ගැනීම පැසසිය යුතුව ඇත. ඒ තුළින් වසර 450 කට අධික කාලයක් යටපත්ව තිබූ වාරි තාක්ෂණය හා දේශීය ශිල්පීය ක්‍රම නැවත පණගැන්විණි. විශේෂයෙන් මෙම පුනරුත්තාපන වැඩසටහනේ දී සෑම වාරි කර්මාන්තයක්ම මුලින් ඉදිකරන ලද රජුගේ නම සඳහන් කිරීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබීය. මෙම දැවැන්ත ක්‍රියාන්විතයේ දී බොහෝ වැව්වල ධාරිතාව කිහිප ගුණයකින් වැඩි කිරීමට හැකි වීම දෙපාර්තමේන්තුව ලැබූ ජයග්‍රහණයකි.

## නිදහසෙන් පසු

1948 නිදහස ලැබීමත් සමග වාරිමාර්ග දෙපාර්තමේන්තුව නව ප්‍රබෝධයක් ලැබූ අතර, පළමු අග්‍රාමාත්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමාගේ නායකත්වය යටතේ ශ්‍රී ලංකාවේ විශාලතම ජලාශය වන සේනානායක සමුද්‍රය 1951 වසරේ දී විවෘත කරනු ලැබීය. සුදු පරිපාලනය සම්පූර්ණයෙන්ම ඉවත්ව නව පන්නරයක් ලැබූ දේශීය ඉංජිනේරු වෘත්තිකයන් මගින් පමණක් මෙම දැවැන්ත සංවර්ධන යෝජනා ක්‍රමය අවසන් කිරීම විශේෂත්වයකි. පෙර රජ දවස පැවති වාරි තාක්ෂණය නැවත අත්හදා බැලීමට දේශීය වෘත්තිකයන්ට ලැබුණු පළමු අවස්ථාව මෙයයි. එමගින් අපේ රටේ විනාශ වී ගිය වාරි ශිල්පය තවදුරටත් සුරක්ෂිතව පවතින බව තහවුරු කිරීමට ශ්‍රී ලාංකීය ජනයාට හැකි විය. මෙම කාලය තුළ, අතීත රජදරුවන්ගෙන් පසුව නව ජලාශ බොහොමයක් ඉදිකිරීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමත් විය. ඒ අතර, උඩවලව ජලාශය, මුරුතවෙල ජලාශය, නාලන්දා අමුණ, පොල්පිටිය ජලාශය, නෝර්ටන් ජලාශය, ලුණුගම්වෙහෙර, ඉගිණිමිටිය, මවුආර, මා උස්සා කැලේ, රාජාංගණය වැනි දැවැන්ත වාරි කර්මාන්ත විශේෂයෙන් සටහන් කළ හැකිය. ඊට අමතරව කන්තලේ, පරාක්‍රම සමුද්‍රය, කවුඩුල්ල, පදවිය, හුරුළු වැව වැනි පැරණි ජලාශවල ධාරිතාව වැඩි කිරීමද විශේෂ තත්ත්වයකි.

## මහවැලි සංවර්ධන ව්‍යාපාරය

මෙහි මූලික ශක්‍යතා අධ්‍යයන වාර්තාව 1964 වසරේ දී වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කොට 1968 වසරේ දී අවසන් කරනු ලැබීය. මේ සඳහා මූල්‍ය දායකත්වය එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල (UNDP) විසින් දරනු ලැබීය. සම්පූර්ණ මහවැලි සංවර්ධන වැඩසටහන දේශීය ඉංජිනේරුවරුන් මගින් පමණක් සිදු කිරීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව සැලසුම් කර තිබිණි. එහෙත්, මූල්‍ය ප්‍රතිපාදන සීමා වීම හා මහවැලි ජලාශ කඩිනමින් අවසන් කළ යුතු බවට රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයක් අනුව විදේශ ආධාර ලබා ගැනීමට කටයුතු සිදු විය. මේ හේතුවෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලද සියලුම සැලසුම් 1970 වසරේ දී මහවැලි සංවර්ධන මණ්ඩලය ලෙස පිහිටවනු ලැබූ නව ආයතනයකට පවරනු ලැබීය. ඉන් අනතුරුව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුමය කාර්ය මණ්ඩලයේ කොටසක් බඳවාගෙන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ස්ථාපිත කරනු ලැබීය.

ඒ අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අන්‍යෝන්‍ය අවබෝධතාව මත ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධීක්ෂණය යටතේ මහවැලි සැලැස්ම ක්‍රියාත්මක විය. එමගින් කොත්මලේ, රන්දෙනිගල, රන්ටැඹේ, වික්ටෝරියා වැනි නව ජලාශ ඉදිකළ අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පැවති කලාවැව වැනි ජලාශ කිහිපයක් ජල කළමනාකරණය කිරීමේ පහසුව පිණිස මහවැලි අධිකාරිය වෙත පවරනු ලැබීය.

## 1990න් පසු මෑත ඉතිහාසය තුළ...

වාරිමාර්ග සහ ජල සම්පත් ක්ෂේත්‍රයේ වර්තමානයේ උද්ගතව ඇති අභියෝග වන පානීය ජල සැපයුම, කර්මාන්ත සඳහා අවශ්‍ය ජලය, විවිධ පරිසර අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය ජලය හා සීඝ්‍රයෙන් වර්ධනය වන කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ජලය ලබා දීම පිණිස පසුගිය දශක 3 ක කාලය තුළ අතිවිශාල කාර්යභාරයක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් දැයට දායාද කර ඇත. මේ සඳහා ඉදිකරන ලද ජලාශ ප්‍රමාණය වාරි ඉතිහාසයේ කැපී පෙනෙන ඉසව්වක් සටහන් කරනු ඇත.

මවුආර, වෙහෙරගල, කැකිරිඔබඩ, වැමැඩිල්ල, රඹකැන් ඔය, ඇදුරු ඔය, ගුරුගල් ඔය, යාන් ඔය, කළුගල් ඔය, උමා ඔය පහළ නිම්න ජලාශ පද්ධතිය ඇතුළුව වේලි ඔය අමුණ, අට්ටික්කා අමුණ, ඇල්ලපොතාන අමුණ වැනි අමුණු රාශියක් ද මෙහිදී විශේෂයෙන් සටහන් වේ.

සැබැවින්ම වර්තමානයේ නඩත්තු කරනු ලබන ප්‍රධාන ජලාශ 73 අතරින් වැඩිම ප්‍රමාණයක් නිර්මාණය කර ඇත්තේ නිදහසින් පසු ශ්‍රී ලංකාවේ දේශීය වාරි ඉංජිනේරුවරුන් විසිනි. මෙහිදී වාරිමාර්ග ක්ෂේත්‍රයේ විවිධ තාක්ෂණික සේවාවලට අයත් කාර්ය මණ්ඩලයේ දායකත්වය කිසිවිටෙකත් අමතක කළ නොහැක. ඊට අමතරව ගොවි ජනතාවගෙන් ලැබුණු පැසසුම් හා ගෞරවය දෙපාර්තමේන්තුවේ ශක්තියයි.

## ඉදිරි වාරි සැලසුම්

ප්‍රථම වතාවට 1958 වසරේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරන ලද ජාතික ජල සම්පත් සැලසුමට අනුව ජලාශ ඉදිකිරීම ශ්‍රී ලංකාව ලැබූ ජයග්‍රහණයකි. ඉන් අනතුරුව වරින්වර මෙම ජල සම්පත් සැලස්ම යාවත්කාලීන කොට පවත්වාගෙන යනු ලැබේ. දැනට භාවිත වන ජල සම්පත් සැලැස්ම 2014 වසරේදී යාවත්කාලීන කරන ලද සැලැස්මයි.

වාර්ෂික දළ වර්ෂාපතනය මිලිමීටර් 2000කට ආසන්නව පවතින අපේ රටේ වාරිමාර්ග සහ ජල සම්පත් ක්ෂේත්‍රයේ සැබෑ ගැටලුව කුමක්ද යන්න පිළිබඳව පැහැදිලි අවබෝධයක් සමාජගත වී නොමැත. ලැබෙන වර්ෂාපතනයෙන් 65%ක් මුහුදුකරය ආශ්‍රිත තෙත් කලාපයට ලැබීමත්, 35%ක් ඉහළ ජල ධාරා ප්‍රදේශයට ලැබීමත් හේතුවෙන් දැඩි අසමතුලිතතාවයක් පවතී. ඊට අමතරව වාර්ෂික වර්ෂාපතනයට සමාන වාෂ්පීකරණයක් සහිත දේශගුණයක් පැවතීම තවත් අභියෝගයකි. පරිසර සමතුලිතතාවය සඳහා දැනට පවතින 27%ක් වූ කැළෑ ඝනත්වය 32%ක් දක්වා වැඩි කළ යුතු බව පිළිගත් මතයයි. මිලියන 22ක් වන වර්තමාන ජනගහනය සඳහා අවශ්‍ය ආහාර සුරක්ෂිතතාවය සහ පානීය ජලය ඇතුළු අනෙකුත් සනීපාරක්ෂක කටයුතු සඳහා අවශ්‍ය ජලය සැපයීම ප්‍රමුඛ කාර්යයක් වී ඇත. ඉහත තත්ත්වයන් යටතේ පිළිගත් ජල සම්පත් සැලැස්මට අනුව තවත් ජලාශ බොහොමයක් ඉදිකිරීමට සැලසුම් කර ඇතත් විසඳගත යුතු පාරිසරික ගැටලු රාශියකට දෙපාර්තමේන්තුව මුහුණ දී ඇත.

අතිරික්ත ජලය පවතින ගංගා ද්‍රෝණිවල ජලය අනෙකුත් ජලය හිඟ ගංගා ද්‍රෝණි කරා රැගෙනයාම අත්‍යාවශ්‍ය සහ හදිසි කරුණකි. ඉදිරි වසර 5 තුළදී තවත් බහුකාර්ය වාරි යෝජනා ක්‍රම විශාල ප්‍රමාණයක් ජනතා අයිතියට පැවරීමට නියමිතයි. ඒ අතර පහළ මල්වතුඔය ජලාශය, තල්පිටිගල ජලාශය, මුන්දෙනිආරු ද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය, ගිං නිල්වලා ව්‍යාපෘතිය, හැඩඔය ව්‍යාපෘතිය, කුඹුක්කන්ඔය ව්‍යාපෘතිය, රුගම් කිතුල් ව්‍යාපෘතිය යන ව්‍යාපෘතීන් විසින් වර්තමාන සමාජ, ආර්ථික ගැටලු බොහොමයකට පිළිතුරු සපයනු ඇත. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මුහුණපෑමට සිදුවන ගැටලු විසඳගැනීමට රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන සහ පොදු මහජනතාව ඇතුළු සෑම අංශයකින්ම ලැබෙන සහය මෙම ව්‍යාපෘති යථාර්ථයක් බවට පත්කර ගැනීමෙහි ලා මහඟු පිටිවහලක් වනු ඇත.



ඉංජි. ඩී. අබේසිරිවර්ධන
වාරිමාර්ග අධ්‍යක්ෂ
(ජල කළමනාකරණ)







# පියානෝ කී වියරය

# පිටවාන් තාක්ෂණයේ නවමු ප්‍රවේශය...

කෘෂිකාර්මික රටක් ලෙස, ආර්ථික, සාමාජීය, සංස්කෘතික සහ පාරිසරික මානයන් ඔස්සේ ජලය සඳහා තිසි ඇගයීමක් ලබා දීම, අප රටෙහි පෙර රජ දවස සිට පවත්නා වාරි සංස්කෘතියෙහිම අංගයකි. ජල සම්පත් සංවර්ධනයේ දී හා වාරි පද්ධති ගොඩනැගීමේ දී අතීතයේ සිට යොදා ගන්නා ලද විවිධ ඉංජිනේරුමය තාක්ෂණික ක්‍රමවේද හේතුවෙන් අප රට වර්තමානයේ දී පවා කීර්තියක් උසුලයි. ජලයේ ගුණාත්මක බව, ජලය පිහිටා ඇති ස්ථානය සහ ගබඩා කරන ලද ජලය ද එසේ නැත්නම් නිදහසේ ගලා යන ජලය ද යන්න මත ජලයෙහි වටිනාකම තීව්‍ර වේ. මෙරට පවත්නා වර්ෂාපතනයේ ඍතුමය හා ස්ථානීය විචලනයන් හේතුවෙන් විශාල හා කුඩා වැව් ඉදිකොට ජලය ගබඩා කර තබා ගැනීම වියළි කලාපයේ ජල සම්පත් සංවර්ධනයේ දී යොදා ගත් මූලික උපක්‍රමයකි. මෙසේ ඉදිකරන ලද වැව්වල බැම්වලට මෝසම් කාලවල දී ඇද හැලෙන වැසි හේතුවෙන් ගලා එන අධික ජල ප්‍රවාහයන් නිසා සිදු විය හැකි හානි වළක්වමින් වැව් හා ජලාශවල ආරක්ෂාව තහවුරු කිරීම ප්‍රමුඛ අවශ්‍යතාවයකි. ඒ අනුව, මෙසේ වැව් වලට ගලා එන අතිරික්ත ජලය ආරක්ෂාකාරීව මුදාහැරීම සඳහා ඉදිකරන ලද ඉංජිනේරුමය නිර්මිතය පිටවාන ලෙස හැඳින්වේ. ශ්‍රී ලංකාවේ මුල් යුගයේ දී ඉදිකරන ලද වැව්වල යොදා ගන්නා ලද පිටවාන් තාක්ෂණයන් අතර ස්වභාවික පිටවාන් (Natural spillways) සහ ගල් කුට්ටි යොදා ගනිමින් ඉදිකරන ලද පිටවාන් මෙන්ම බදාමයෙන් සහ ගලින් ඉදිකරන ලද බැම් ද පැවතිණි.

වර්ෂ 1957 දී ඇති වූ මහා ගංවතුර පිළිබඳ අත්දැකීම් සමඟ එවකට පැවති පිටවාන්වල ධාරිතාව වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාව පැන නැගුණු අතර හඳුනාගත් පිටවාන් ගේට්ටු සහිතව නවීකරණය කර පිටවාන්වල ධාරිතාව වැඩි කෙරිණි. එතැන් සිට අද දක්වා ඉදිකරන ලද හා මෙම තාක්ෂණය යොදා ගත හැකි බොහෝමයක් ජලාශ සඳහා ගේට්ටු සහිත පිටවාන් ඉදි කෙරේ. මෙහෙයුම් සහ නඩත්තු සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදු වීමත්, ගේට්ටු ක්‍රියාත්මක කිරීම සඳහා පූර්ව දැනුවත්වීමක් සහ සූදානමක් අවැසි වීමත් ගේට්ටු සහිත පිටවාන්වල මූලික අවශ්‍යතාවයන් වේ.

දේශගුණික විපර්යාසවල බලපෑම් නිසා ඇතිවන අධික තීව්‍රතාවයෙන් යුත් වැසි හේතුවෙන් පවත්නා ජලාශවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා මෙන්ම, නියං තත්ත්වයන්ගේ බලපෑම් හේතුවෙන් ජලාශවල ධාරිතාව ඉහළ නැංවීම කෙරෙහි ද ලෝකයේම අවධානය යොමුව ඇත. මේ සඳහා යොදා ගත හැකි නව පිටවාන් තාක්ෂණයක් ලෙස පියානෝ කී වියරය (Piano Key Weir / PKW) පිළිබඳ සංකල්පය 2001 වසරේ දී පළමු වරට ලොවට හඳුන්වා දෙන ලද අතර වැඩිදුර අධ්‍යයනයන්ගෙන් අනතුරුව පළමු පියානෝ කී වියර පිටවාන 2006 වර්ෂයේදී ප්‍රංශයේ ඉදි කරන ලදී. පියානෝ කී වියරයට අයත් ප්‍රධාන අංගයන්ගේ විවිධ ස්වරූපයන් අනුව වියර වර්ග පහකට බෙදා ඇති අතර එම සෑම වියරයකටම සාමාන්‍ය වාන්වලට වඩා වැඩි ජල ධාරිතාවක් මුදා හැරීමේ හැකියාවක් පවතී. පියානෝ කී වියර වාන්වල ජලය මුදා හැරීමේ ධාරිතාවේ සාමාන්‍යය, බහුලව භාවිත වන කොන්ක්‍රීට් වාන් මෙන් තුන් ගුණයක් පමණ වන අතර, පූර්ව මෙහෙයවීමක් අවශ්‍ය නොවන හෙයින් අනපේක්ෂිත ලෙස ජලාශවලට ගලා එන ජල ප්‍රවාහයන් ආරක්ෂිතව මුදා හැරීමත්, වැඩි ජල ධාරිතාවක් මුදා හැරීමේ හැකියාවත් මෙම වානෙහි ප්‍රධාන ප්‍රයෝජනයන් වේ. එලෙස, අතිරික්ත ජලය වැඩි ධාරිතාවකින් මුදා හැරීමේ ප්‍රතිඵලයක් ලෙස, වැව මුලින් සැලසුම් කරන අවස්ථාවේ දී ඉඩ සලසන ලද ඉහළ ගංවතුර මට්ටමට (High Flood Level) වඩා අඩු ජල මට්ටමකින් ජල ප්‍රවාහය මුදාහල හැකි වේ. ඒ අනුව, විභවයක් පවත්නා දැනට ඉදිකොට ඇති ජලාශවල පූර්ණ සැපයුම් මට්ටම (Full Supply Level) ඉහළ නැංවීම මගින් වැවේ ධාරිතාව වැඩිකිරීමේ හැකියාව මෙම පිටවාන සතු තවත් ප්‍රයෝජනයකි.

## ගිරිතලේ වැවෙහි ඉදිකළ පියානෝ කී වියර පිටවාන

මෙම පිටවාන් තාක්ෂණයේ වැදගත්කම අවබෝධ කර ගැනීමත් සමඟ එම තාක්ෂණය ශ්‍රී ලංකාවේ වැව් සඳහා යොදා ගත හැකි ආකාරය පිළිබඳව අවධානය යොමු කෙරිණි. ඒ අනුව, 2012 වසරේදී ඇති වූ දැඩි නියගයට පිළියම් යෙදීම සඳහා ක්‍රියාත්මක කරන ලද කඩිනම් වැඩපිළිවෙළ යටතේ ජලාශවල රොන් මඩ ඉවත් කිරීමට අමතරව ගිරිතලේ වැවේ ධාරිතාව ඉහළ නැංවීම සඳහා පියානෝ කී වියරයක් ඉදි කිරීමට ද සැලසුම් කෙරිණි. ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යෝජනාවට ප්‍රතිපත්තිමය අනුමැතිය ලැබීමෙන් අනතුරුව, නියමු ව්‍යාපෘතියක් ලෙස, ශ්‍රී ලංකාවේ පමණක් නොව දකුණු ආසියාවේම පළමුවන පියානෝ වියර පිටවාන ගිරිතලේ වැවෙහි ඉදිකිරීමට හැකි විය. මෙම නිර්මාණකරණය නවමු අත්දැකීමක් මෙන්ම ඉංජිනේරුමය වශයෙන් අභියෝගයක් වුව ද වසරකට ආසන්න කාලයක් තුළ සැලසුම් පිළියෙල කිරීම, නිර්මාණකරණය සහ ඉදිකිරීම් කටයුතු අවසන් කොට එය කඩිනම් ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාවට නැංවීමට හැකි විය. මෙම නිර්මාණ කාර්යයට අදාළ තොරතුරු කතුවරුන් විසින් PKW 2013 වාර්තාවේ පළකරන ලද Design of a Piano-Key Weir for Giritale Dam Splway in Sri Lanka නම් වන පර්යේෂණ පත්‍රිකාවේ සඳහන් වේ. ශ්‍රී ලංකාවේ පළමු වරට ඉදිකරන ලද මෙම පියානෝ කී වියර පිටවාන, ලෝකයේ මෙම වර්ගයට අයත් 13 වන වාන වන අතර, එවකට ලෝකයේ මෙවැනි වාන් ඉදිකොට තිබුණේ අප රට ඇතුළු රටවල් අටක පමණි. විශාල වේලි පිළිබඳ ජාත්‍යන්තර කොමිසමෙහි (ICOLD) තුන්වන තාක්ෂණික කමිටුව මගින් පළකරන ලද ප්‍රකාශනයේ 6 වන පරිච්ඡේදයේ දී සැලසුම් කිරීම පිළිබඳ අත්දැකීම් ලබාගත හැකි ලෝකයේ පළමුව ඉදිකරන ලද පියානෝ කී වියර වාන් අතරට ගිරිතලේ පියානෝ කී වියර පිටවාන ද ඇතුළත් කර ඇත.

මෙම ඉංජිනේරුමය යෙදවුම හේතුවෙන් ගිරිතලේ වැවෙහි ධාරිතාව අක්කර අඩි 2400 කින් පමණ ඉහළ නැවීමට හැකි වූ අතර, එය රොන්මඩ ඉවත් කිරීම මගින් වැඩිකරන ලද ධාරිතාවට සාපේක්ෂව ඉතා ඉහළ අගයකි. දෙවන අග්බෝ රජු විසින් ඉදිකරන ලද්දක් වන මෙම ගිරිතලේ වැව, පළමුවන පරාක්‍රමබාහු රජතුමන් විසින් ප්‍රතිසංස්කරණය කර ඇති අතර, ඉන් පසුව ද කිහිප අවස්ථාවකදී විශාල කරන ලදුව එහි වත්මන් ධාරිතාව අක්කර අඩි 19000 පමණ වේ.

## රඹෑව වැවෙහි ඉදිකළ පියානෝ කි වියර පිටවාන

මෙම ඉංජිනේරුමය නිර්මාණකරන කාර්යයේ දී සහ ඉදිකිරීමේ කාර්යයේ දී ලත් අත්දැකීම් උපයෝගී කර ගනිමින් සහ මේ සම්බන්ධයෙන් වන අධ්‍යයනයන් ඉදිරියට ගෙනයාමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ පිහිටා ඇති කුඩා වැව් සඳහා යොදාගත හැකි පරිදි කුඩා ප්‍රමාණයේ පියානෝ කී වියර පිටවානක් නිර්මාණය කිරීමට හැකි විය. මෙම නව පිටවානෙහි ධාරිතාව දැනට එම වැව්වල භාවිත වන පිටවාන්වලට වඩා වැඩි අතර, එමගින් කුඩා වැව් මුහුණ දෙන වැව් බැම් බිඳී යාමේ අවදානම අඩු කිරීමට හැකිවන බව හඳුනා ගැනිණි. ඒ අනුව, 2013 වර්ෂයේ ඇති වූ ගං වතුර හේතුවෙන් බිඳී ගිය රඹෑව වැව ප්‍රතිසංස්කරණ කාර්යයේදී නියමු ව්‍යාපෘතියක් ලෙස පියානෝ කී වියර පිටවානක් යොදා ගැනීමට තීරණය කෙරිණි. Type D වර්ගයට අයත් මෙම පිටවාන 2015 වර්ෂයේදී ඉදිකරන ලද අතර එම නිර්මාණ කාර්යයට අදාළ තොරතුරු කතුවරුන් විසින් PKW 2017 සමුළු වාර්තාවේ පළකරන පද Adoption of a type D Piano Key Weir spillway with tapered noses at Rambawa Tank, Sri Lanka, වන පර්යේෂණ පත්‍රිකාවේ සඳහන් වේ. මෙය, මෙම වර්ගයට අයත් පළමුවන පිටවාන වන අතර ලෝකයේ සියලු පියානෝ කී වියර අතර 19 වැන්න වේ (මූලාශ්‍රය: ජගත් පියානෝ කී වියර රෙජිස්ටරය - World Register of Piano Key weirs prototypes). ඉහත නිර්මාණයන්ට සියලු භෞතික මාදිලි පරීක්ෂාවන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ජල ශක්ති පර්යේෂණාගාරයේ දී සිදු කෙරිණි.

## කුඹිච්චන් වැවෙහි ඉදිකරන ලද පියානෝ කී වියර පිටවාන

මෙම වර්ගයේ දෙවන වාන අනුරාධපුර නගර මධ්‍යයේ පිහිටා ඇති කුඹිච්චන් වැවෙහි ඉදිකරන ලද අතර එමගින් මීට පෙර නගරය අත්දකින ලද වැව බිඳී යෑම නිසා ඇති විය හැකිව තිබූ අවදානම සඳහා සාර්ථක විසඳුමක් විය.

## යුදගනාව වැවෙහි ඉදිකරන ලද පියානෝ කී වියර පිටවාන

පසුව, මෙම වර්ගයේ තවත් පිටවානක් බුත්තල යුදගනාව වැව සඳහා සැලසුම් කර ඉදිකරන ලද අතර, එමගින් වැවෙහි ධාරිතාව අක්කර අඩි 835 සිට 1135 දක්වා අක්කර අඩි 300කින් වැඩි කළ හැකි විය. මෙම පියානෝ කී වියර පිටවාන ඉදිකිරීමෙන් අනතුරුව 2019/20 ජල වර්ෂය තුළ දී වැව යටතේ කන්න තුනක් සාර්ථකව වගා කිරීමට හැකි විය. තවද, මැතක දී මැණික් ගඟ ද්‍රෝණියේ කරන ලද ජල විද්‍යාත්මක අධ්‍යයනයක ගණනය කිරීම් අනුව වසර 500 කට වරක් ඇතිවන ගං වතුර තත්ත්වයකදී ද ඔරොත්තු දිය හැකි පිටවාන් ධාරිතාවක් වත්මන් වියරයට ඇති බව නිරීක්ෂණය කර ඇත.

## එල්ලංගා පද්ධති සඳහා යොදා ගැනීම

මේ වන විට සිදුකර ඇති තවත් අධ්‍යයනයකට අනුව මෙම පිටවාන් තාක්ෂණය තනි වැව් සඳහා පමණක් නොව එල්ලංගා සංවර්ධනයේදී ද ඵලදායීව යොදා ගත හැකි බව 2020 වර්ෂයේදී පැවති මොරටුව විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සමුළුවට ඉදිරිපත් කරන ලද Spillway Modernization for Improving Robustness of Village Tank Cascades for Floods, Sri Lanka පර්යේෂණ පත්‍රිකා මගින් තහවුරු වේ. මේ අනුව, මෙම පිටවාන් තාක්ෂණය ශ්‍රී ලංකාවේ පිහිටා ඇති 30 000 පමණ වන කුඩා වැව්වල ධාරිතාව ඉහළ නැංවීම සඳහා සහ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ද අවශ්‍ය පරිදි යොදා ගත හැකි වනු ඇත.

## අමුණු සඳහා යොදා ගැනීම

ඉහත සඳහන් යොදා ගැනීම්වලට අමතරව, මෙම පිටවාන් තාක්ෂණය ගංගා හරහා හැරවුම් නිර්මිත ලෙස ද යොදා ගත් අවස්ථාවක් ලෙස වියට්නාමයේ මීටර් 475ක් දිගැති වැන් පොන්ග් අමුණ (Van Phong Barrage) සඳහන් කළ හැකිය. පියානෝ කී වියරයෙහි ආනතියකින් යුත් පතුල් නිසා සිදුවන ජලය ගලා යාමේ ස්වභාවය අනුව ඉහත දක්වන ලද ප්‍රයෝජනයන්ට අමතරව රොන්මඩ මෙන්ම පාවෙන සුන්බුන් (Floating debris) එක්රැස් වීම ද අවම කර ගත හැකි හෙයින් එවැනි ගැටලු සහිත ශ්‍රී ලංකාවේ අමුණු සඳහා ද මෙය විසඳුමක් ලෙස යෝජනා කළ හැක.

මේ අනුව, නව තාක්ෂණික ක්‍රමවේදයන් නිර්මාණකරණයේ දී සුදුසු පරිදි යොදා ගැනීම මගින් කාලානුරූපව මුහුණ දීමට සිදුවන ගැටලු සඳහා ඉංජිනේරුමය විසඳුම් හඳුනා ගත හැකි බව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මෙම ප්‍රවේශය මගින් තහවුරු කරයි. ඒ අනුව, සැමට ජලය රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ දී සහ කෘෂිකාර්මික නවෝදයක් සඳහා වන ගමන්මගෙහි මූලිකම අවශ්‍යතාව වන ජල සම්පත ආරක්ෂිතව රැස් කිරීම සඳහා මෙම පිටවාන් ක්‍රමය යොදා ගැනීමේ වැඩි විභවයක් පවතී.

ඉංජි. කේ.ටී.එන්. පෙරේරා
වාරිමාර්ග ඉංජිනේරු
පර්යේෂණ සහය
හා ක්‍රියාවලි වැඩිදියුණු
කිරීමේ අංශය



ඉංජි. එච්.එම්. ජයතිලක
වාරිමාර්ග
දෙපාර්තමේන්තුවේ හිටපු
අධ්‍යක්ෂ (වාරි හා ජල කළ
මනාකරණ) සහ වාරිමාර්ග
හා ජල සම්පත් සංවර්ධන
අමාත්‍යාංශයේ හිටපු අතිරේක
ලේකම් (ජල සම්පත් සැලසුම්)











# ජල සුරක්ෂිතතාව හා සබැඳි අපේ කාර්යභාරය

ජලය අප සැමගේ ජීවිත තුළ හිමි කරගෙන සිටිනුයේ අද්විතීය ස්ථානයකි. එදිනෙදා අවශ්‍යතාවයන් වන පානය, සේදුම් කටයුතු, ආහාර නිෂ්පාදනය, බලශක්ති උත්පාදනය, ප්‍රවාහනය සඳහා පමණක් නොව, ජලය අපගේ සෞඛ්‍යය සනීපාරක්ෂාව, සංස්කෘතිය, අධ්‍යාත්මික වටිනාකම් හා සබැඳි විශ්වාසයන් මෙන්ම ආගමික කටයුතුවලදී ද මුල් තැන හොබවනු ලැබේ. අතීතයේ සිටම ජල සුරක්ෂිතතාවය අපගේ සංස්කෘතිය තුළ බෙහෙවින් අගය කළ සංකල්පයක් වූ බැවින්ම ජල සුරක්ෂිතතාව හා සබැඳි සිරිත් විරිත් සමුදායක් ශ්‍රී ලාංකික ජන සමාජය තුළ මුල් බැසගෙන පැවතුණි. නමුත් වර්තමානයේදී ගෝලීයකරණය හා සබැඳි සංවර්ධනය නිසා බෙහෙවින් කාර්යබහුල වූ අපගේ ජන ජීවිතයෙන් ජල සුරක්ෂිතතාව පිළිබඳ පුරුදු හා ආකල්ප ක්‍රම ක්‍රමයෙන් ඈත් වී යනු පෙනේ.

## ජල සුරක්ෂිතතාවය අවශ්‍ය ද?

ජලය යනු අපරිමිත සම්පතක් නොවේ. පෘථිවියෙන් 70%ක්ම ජල ගෝලය ලෙස සැළකුව ද එයින් 3% වන මිරිදිය ප්‍රමාණයෙන් තුනෙන් දෙකක් ග්ලැසියරවල සිරවී හෝ වෙනත් ආකාරයකින් අපගේ භාවිතය සඳහා ලබා ගත නොහැකි මට්ටමේ පවතී. අපට භාවිතයට ගත හැකි මට්ටමේ පවතින 1%ක් පමණ වූ ජල ප්‍රමාණයෙන් ද වැඩි ප්‍රතිශතය ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය හා කෘෂිකර්මාන්තය සඳහා භාවිතා වේ.

එම නිසා ලෝක ජනගහනය වන බිලියන 7ක පමණ පිරිස අතරින් ලොව පුරා බිලියන 1.1ක පමණ පිරිසකට පානයට සුදුසු ජලය ලබාගත නොහැකි වන අතර, බිලියන 2.7ක පමණ පිරිසකට අවම වශයෙන් අවුරුද්දේ එක් මාසයක්වත් ජල හිඟතාවයකට මුහුණ දීමට සිදු වනු දක්නට ලැබේ. ලෝක ජනගහනයෙන් බිලියන 2.1ක පමණ ජනතාවකට පිරිසිදු පානීය ජලය සපයා ගැනීමට අපහසු වන නිසා ඔවුන් කොලරාව, ටයිපොයිඩ් උණ වැනි රෝගවලට හා ජලයෙන් බෝවන වෙනත් රෝගවලට නිරාවරණය වේ. ලෝක සෞඛ්‍යය සංවිධානයේ දත්තවලට අනුව සෑම වසරකම මිලියන 3.4ක පමණ පිරිසක් ජලයෙන් බෝවන රෝග නිසා මිය යන අතර, එයින් වැඩිම ප්‍රතිශතය කුඩා දරුවන් වේ.

දිනෙන් දින වැඩි වන ජනගහනය ද ජල පරිභෝජන අවශ්‍යතා ඉහළ නැංවීමට හේතු වේ. ජල හිඟතාවය ජන ජීවිත හා ජීවනෝපායන් කෙරෙහි ඇඩි ලෙස බලපාන සාධකයකි. ජල සැපයුම අඩුවීමෙන් මිනිසුන්ගේ එදිනෙදා ජන ජීවිතයේ අස්ථාවරත්වය, මානසික පීඩනය, ප්‍රචණ්ඩකාරී ගැටුම්වලට යොමු වීම සහ වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වීම වැනි සමාජයීය ගැටලු ඇති කිරීමට හේතු වේ. වර්තමානයේ අප මුහුණ දෙමින් සිටින දේශගුණික විපර්යාස සමඟ උච්චාවචනය වන වර්ෂාපතන රටා සහ අධික උෂ්ණත්වය, කෙටි වැසි සහ දිගු වියළි කාලයක් නිර්මාණය කරයි. මෑත කාලීන පර්යේෂණවලට අනුව අනාගතයේ දී දේශගුණික අවබලපෑම් නිසා තෙත් කළාපයන්හි වැඩි තීව්‍රතාවයකින් යුත් කෙටි කාලීන වර්ෂාපතනයන් නිරන්තරයෙන් ඇතිවීම ද, වියළි කළාපයන්හි වර්ෂාපතනය අඩු වීම ද යන හේතූන් නිසා නිරන්තර ගංවතුර සහ නියං ආපදා ඇතිවීමේ ප්‍රවණතාවයක් ද හඳුනාගෙන ඇත. ගෘහස්ත අපද්‍රව්‍ය, කර්මාන්තවල අතුරුඵල ලෙස ජනනය වන විෂ අපද්‍රව්‍ය, වගා බිම් සඳහා අධික පරිමාණවලින් කෘමිනාශක භාවිතය, තෙල් කාන්දු වීම් වැනි ප්‍රභව මගින් රෝග කාරක ක්ෂුද්‍ර ජීවීන් හා විෂ ද්‍රව්‍ය ජලයට එකතු වී ජල දූෂණය ඇති කිරීම ද අවට පරිසර පද්ධතිවල සමතුලිතතාව කෙරෙහි විනාශකාරී බලපෑම් ඇති කිරීම ද සිදුවේ. තීව්‍ර බෑවුම්වල සිදු කරන අවිධිමත් වගා කටයුතු හා ඉදිකිරීම් නිසා වන පාංශු ඛාදනය හේතුවෙන් ඇති වන අවසාදිතය (උදා: රොන්මඩ) වර්ෂාව මගින් ගංගා හා අනෙකුත් ජල මූලාශ්‍රවලට එකතු වීම නිසා ජල මූලාශ්‍රවල පතුළ කරා සූර්යාලෝකය විනිවිද යාමට බාධා කරන අතර, එමගින් ජල පෘෂ්ඨවල ඇල්ගී සහ වල් පැළෑටි ඇතිවීම සිදු වී ජලයට පිරිසිදු වාතය මුසුවීමේ ක්‍රියාවලිය අඩාල වේ. එසේම, එය ජල දූෂණයටද වක්‍රාකාරව හේතු වේ. මෙම රොන්මඩ ජලාශවල පතුලේ තැන්පත් වීම තුළින් ජලාශවල සක්‍රීය ධාරිතාවය පහළ ගොස් ගබඩා කළ හැකි ජල පරිමාව අඩු වීම නිසා කෘෂි කර්මාන්තයට හා පානයට අවශ්‍ය ජලය සැපයීමේ අපහසුතා මතු වේ.

වර්තමානයේ නිරන්තරයෙන් දැකිය හැකි වැඩි තීව්‍රතාවයකින් යුත් කෙටි කාලීන වර්ෂාපතනයන් නිසා හා කොන්ක්‍රීට් ඇතිරිලි නිසා බොහෝ නාගරික ප්‍රදේශවල මතුපිට පාංශු ස්ථරය හරහා භූ ගත ජල ස්ථරවල ජලය ගබඩා කිරීමේ හැකියාව සීමාසහිත වී තිබේ. එමෙන්ම ජලාශවල ඉහළ ජල පෝෂක ප්‍රදේශ විනාශ වී යාම, මහා පරිමාණ වන විනාශය නිසා උල්පත් වැනි ජල මූලාශ්‍ර සිඳියාම, භූගත ජල මට්ටම යථාවත් වීම ඇනහිටීම වැනි ගැටලු නිසා වර්තමානය වන විට අපි උග්‍ර ජල හිඟතාවන් වලට මුහුණ දෙමින් සිටිමු. ශ්‍රී ලංකාව අරීය ජල වහන රටාවකට උරුමකම් කියන ගංගා 103කින් සැදුම්ලත් ජාලයකින් සමන්විත ජල සම්පතින් සශ්‍රීක රටක් වුවද මේ වනවිට අප මුහුණ පා සිටින ඉහත සඳහන් කළ අර්බුද හමුවේ ජලය සීමිත හා තර්ජිත සම්පතක් බවට පත් වී ඇත. ඒ අනුව ජල සම්පත සංරක්ෂණය කරමින් භාවිතා කළයුතු පරිමිත සම්පතක් බව වටහාගෙන අද පමණක් නොව මතු අනාගතය සඳහා ද පිරිසිදු ජල මූලාශ්‍ර රැකගැනීමේ අභියෝගය වර්තමාන පරපුර සතු වී පවතී.

## ජලය සුරක්ෂා කරන්නේ කෙසේ ද ?

ජල සුරක්ෂාව සඳහා මූලිකව අනුගමනය කළයුතු ක්‍රියාවලීන් පහක් හඳුනාගෙන තිබේ. 1. ජල සැපයුම් හා අපවහන පද්ධති කාර්යක්ෂම හා නිසි ක්‍රියාකාරීත්වයෙන් සැකසීම 2. භූගත ජලය සුදුසු පරිදි භාවිතා කිරීම හා භූගත ජල ස්ථර යථාවත් වීමට ඉඩ සැළසීම 3. අපජලය පරිසරයට මුදාහැරීමට පෙර නිසි පවිත්‍රකරණය 4. වන විනාශය පාලනය කිරීම 5. දූෂණයෙන් ජලය ආරක්ෂා කිරීම. එම ක්‍රියාවලීන් වේ.

ජල සුරක්ෂාව ගෘහස්ත මට්ටමෙන් ඇරඹිය හැකිය. මුළුතැන්ගේ සේදුම් කටයුතු සඳහා භාවිතා කර ඉවත් කරන ජලය සුදුසු බඳුනක රැස් කර ගෙවතු වගාව සඳහා එම ජලය යොදා ගත හැකිය. එමෙන්ම ගෙදර ජල කරාම හා ටැංකිවල කාන්දු පවතී නම් ඒවා නිරන්තර පරීක්ෂාවට ලක්කර අලුත්වැඩියා කිරීම, දිය නෑම හා සේදුම් කෙටි කාලයක් තුළ දී සිදු කිරීම, අඩු ජල පරිමාවක් අවශ්‍ය වන පරිදි නිපදවූ රෙදි සේදුම් යන්ත්‍ර, කොමෝඩ් සහ වතුර කරාම භාවිත කිරීම, දත් මැදීම / සබන් ආලේප කිරීම වැනි අවස්ථාවල ජල කරාමය වසා තැබීම වැනි සරල පුරුදු අපගේ ජීවිතයට ළං කර ගැනීම තුළින් ඉතා විශාල ජල ප්‍රමාණයක් අපතේයාම අවම කළ හැකිය. ගෙවතු වගාවන්ට ජලය රැස්කර ගැනීම සඳහා ගෘහස්ත මට්ටමේ වැසි දිය එක් රැස් කළ ගබඩා ටැංකියක් භාවිතා කර නිවසේ වහලය මතට වැටෙන ජලය ගබඩා කර තබා ගැනීම, ගෙවතු වගාවන්ට ජලය යෙදීමේ දී වාෂ්පීකරණය අවම කිරීම සඳහා උදෑසන හෝ සවස් කාලය තෝරා ගැනීම වැනි ක්‍රියාවන් ද ජල සුරක්ෂාව සඳහා සුදුසු ක්‍රමවේදයන් වේ.

කෘෂි කර්මාන්තය සඳහා ද ඉතා විශාල ජල ප්‍රමාණයක් දෛනිකව අවශ්‍ය වේ. වගාබිම් සඳහා ජලය සැපයීමේ දී වාෂ්පීකරණය අවම වන තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතය, වගාවට අවශ්‍ය ජල ප්‍රමාණය කාර්යක්ෂමව සැපයීම සඳහා බින්දු ජල සම්පාදනය, විසිරුණු ජල සම්පාදනය වැනි ක්‍රම බෝග සඳහා යොදා ගැනීම, අඩු ජල ප්‍රමාණයක් අවශ්‍ය වන පරිදි තාක්ෂණය මුසු කර සුදුසු බෝග වර්ග වැඩි දියුණු කිරීම, දේශගුණික විපර්යාස සහ වෙනස් වන මෝසම් වැසි කාලයන්ට අනුරූපව වගා කාලයන් නිර්ණය කිරීම වැනි පියවර මගින් වගාවන්ට අවශ්‍ය මුළු ජල ප්‍රමාණය අඩු කර ගැනීම මගින් පානීය ජල සැපයුම, කර්මාන්ත සඳහා ජල සැපයුම වැනි අවශ්‍යතා ද තෘප්ත කර ගත හැකි වේ.

වියළි කලාපයේ බොහෝ ප්‍රදේශ වල දෛනික ජල අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා නොගැඹුරු හා ගැඹුරු ළිං භාවිත කරනු ලැබේ. උල්පත් වැනි භූගත ජල මූලාශ්‍ර මගින් මෙම ළිං වලට ජලය ගලා එනු ලැබේ. එම නිසා වියළි කලාපයේ ජල අර්බුදය විසඳීම සඳහා භූගත ජල මූලාශ්‍ර රැක ගැනීම අත්‍යවශ්‍ය වන අතර, මහා පරිමාණ වනාන්තර එළිපෙහෙළි කිරීම්, මතුපිට පාංශු ස්ථරයේ සච්ඡිද්‍ර බවට හානි වන අයුරින් කරන ඉදිකිරීම්, ජල මූලාශ්‍ර දූෂිත වන ක්‍රියාකාරකම් යනාදියෙන් වැළකීමට කටයුතු කළ යුතු වේ.

ජල දූෂණය වර්තමානයේ ජල සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා බලපාන මූලිකම ගැටලුවයි. වගා බිමවලට අවශ්‍ය ප්‍රමාණයට වඩා ඉතාමත් වැඩි ප්‍රමාණයකින් කෘෂි රසායන යෙදීම නිසා ඒවා වර්ෂාව මගින් සෝදාගෙන ගොස් ඉතා ඉහළ සාන්ද්‍රණ මට්ටම්වලින් ජල ධාරාවලට එක්වීම නිසා ජලය අපිරිසිදු වීම සිදු වේ. මෙම අවදානම අඩු කර ගැනීමට නම් කාබනික පොහොර වගාවන්ට යෙදීම හා පොහොර අත්‍යවශ්‍ය නම් අවශ්‍ය ප්‍රමාණය පමණක් සුදුසු විශේෂඥ නිර්දේශයන්ට අනුකූලව වගාවට යෙදීම වැනි විකල්ප සඳහා අප හැඩ ගැසිය යුතු කාලය එළඹී තිබේ. නිවෙස් හා කර්මාන්ත ශාලාවල ජනනය වන අපජලය හා අපද්‍රව්‍ය ජල ප්‍රභවයන්ට එකතු කිරීමෙන් වැළකීම ද ඉතාම වැදගත් වේ.

එසේ අපජලය ජලයට එකතු කිරීමට පෙර අනිවාර්යයෙන්ම පිරිපහදු ක්‍රියාවලියට ලක් කිරීම හා ජාතික ප්‍රමිතිගත මට්ටම් හා අනුකූල වන ලෙස ජලය පිරිපහදු කිරීමෙන් පසුව පමණක් පරිසරයට මුදා හැරීම අත්‍යවශ්‍යය. එමෙන්ම තීව්‍ර බෑවුම් සහිත ප්‍රදේශවල කුඩා මූල පද්ධති සහිත පඳුරු වර්ග වගා කිරීමෙන් වැළකී පැතිරුණු ස්ථාවර මූල පද්ධතියක් ඇති ශාක වගා කිරීම, පාංශු ඛාදනය අවම වන ලෙස බැම් ඉදි කිරීම, සමෝච්ච රේඛා දිගේ වගා කටයුතු සිදු කිරීම වැනි ක්‍රියාමාර්ග තුළින් ජලධාරා වලට රොන් මඩ එකතු වීම අවම කරගත හැකි වේ.

වනාන්තර විනාශය නැවත්වීම, ජලාශ හා වැව්වල ඉහළ ජල පෝෂක ප්‍රදේශයේ ඇති තුරුගොමු ආරක්ෂා කිරීම, ජලාශ හා වැව් පතුල් වල ගබඩා වී ඇති අවසාදිත ඉවත් කිරීම මගින් ඒවායේ සක්‍රීය ධාරිතාවය වැඩි කිරීම වැනි ක්‍රමවේදයන් තුළින් වියළි කාලයන්හි දී භාවිත කිරීම සඳහා වැඩි ජල ප්‍රමාණයක් ඉතිරි කර ගත හැකි වේ. එපමණක් නොව අපජලය පිරිපහදු කිරීම සඳහා දැනට ඇති ප්‍රමිතීන් ප්‍රමාණවත් ද යන්න නැවත අධ්‍යයනය කිරීම හා ඒ සම්බන්ධ නියාමනයන් යථාවත් කිරීම, ජල සුරක්ෂිතතාව සබැඳි ජාතික ප්‍රතිපත්ති මාලාවක් සැකසීම හා ඒ පිළිබඳ නිරන්තරයෙන් ජනතාව දැනුවත් කිරීම වැනි පියවර ද ජල සුරක්ෂිතතාව අරමුණු කොට ගෙන ජාතික මට්ටමෙන් සිදු කිරීම සුදුසු වේ. ලෝකයේ ජීවය රැඳී පවතින මූලිකම සාධකය ජලය බැවින් ජල සම්පතෙහි වටිනාකම අවබෝධ කරගෙන සකසුරුවම් ජල භාවිතය තුළින් මතු පරපුර සඳහා ද පිරිසිදු ජලය ලබා ගැනීමේ අයිතිය තහවුරු කිරීම සඳහා තනි පුද්ගලයන් ලෙස ද සමාජයක් වශයෙන් ද අපගේ වගකීම ඉටු කිරීමට මේ ජල දිනයේ දී අපි අදිටන් කර ගනිමු.



**ඉංජි. තිලිණි කෞශල්‍යා**
වාරිමාර්ග ඉංජිනේරු ජල සම්පත් සැලසුම් අංශය
වාරිමාර්ග දෙපාර්තමේන්තුව



# තෙත්බිම රකින ආනවිලුන්දාව වැව් පන්තිය



වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ වෙරළබඩ තැනිතලාවේ ආරච්චිකට්ටුව ප්‍රදේශයට ආසන්නව පිහිටා ඇති ආනවිලුන්දාව තෙත් භූමිය මෙරට දෙවැනි විශාලතම රැම්සා තෙත් භූමිය ලෙස සැලකේ. ආනවිලුන්දාව යන්නෙහි සිංහල අර්ථය ලෙස සැලකෙන්නේ 'වැව් හත' යන්නයි.

ආනවිලුන්දාව අභය භූමියක් ලෙස දැනට වනජීවී දෙපාර්තමේන්තුව යටතේ හෙක්ටයාර 1397 ක පමණ ප්‍රදේශයක් පුරා විහිදී ඇත. සංචාරක පක්ෂීන්ගෙන් ගහණ සුප්‍රසිද්ධ කුරුලු අභය භූමියක් ලෙස ද සැලකෙන ආනවිලුන්දාව සුවිශේෂී ශාක ප්‍රජාවක් වන කඩොලාන පරිසර පද්ධතියකින් ද සමන්විත වේ.

ප්‍රධාන වශයෙන් කඩොලාන වැනි ශාකයන්ගෙන් සමන්විත තෙත්බිමක් ලෙස ද කරදිය පරිසර කලාපයක් ලෙස ද මිරිදිය වැව් පද්ධතියකින් ද යන ත්‍රිවිධාකාර පාරිසරික කලාපයන්ගෙන් මෙම පරිසර පද්ධතිය සමන්විත වේ.

මෙලෙස වටිනා ජෛව විවිධත්වයකින් සැකසුණු ආනවිලුන්දාව පරිසර කලාපය, හුදෙක් සොබාදහමෙන් ලද උරුමයෙන් පමණක් මෙවැනි සුවිශේෂී පරිසර පද්ධතියක් ලෙස ගොඩනැගුණා නොව ඒ සඳහා සොබාදහමත් සමඟ අපූරු බැඳීමක් ඇති එයට කදිම ලෙස අනුගත වූ මිනිස් ක්‍රියාකාරකම් ද බලපා ඇත. එම මානව මැදිහත්වීම කෙබඳු දැයි කෙටි විමසීමක් කිරීම මෙම ලිපියේ මූලික අරමුණ වේ. පෙර සඳහන් කළ පරිදි ආනවිලුන්දාව යන්නෙහි තේරුම 'වැව් හත' වෙයි. ඉහළ වැව, ආනවිලුන්දාව වැව, සූරුවිල, මායියාව, මරදන්සෝලේ, පිංකට්ටිය හා වෙල්ලවල ලෙස වැව් හතක් ඇති අතර, මෙම සියලු වැව් රතඹලා ඔය ද්‍රෝණියේ වෙරළට ආසන්නව පිහිටා ඇත. ඓතිහාසික තොරතුරුවලට අනුව මෙම වැව් පද්ධතිය 12 වැනි සියවසේ පමණ ඉදිකර ඇති බවට විශ්වාස කෙරේ. මෙම වැව් හතට අමතරව ජලය රැඳෙන පහත් භූමි ලෙස සැලකෙන එබවල් තුනකින් ද සමන්විත වේ.

මෙම වැව් පද්ධතිය මූලික වශයෙන් සෙංගල් ඔයේ හා රතඹලා ඔයෙහි ජලයෙන් පෝෂණය වන අතර, එමගින් සපයන වාරි ජලයෙන් අක්කර 1300කට ආසන්න කුඹුරු ප්‍රමාණයක් පාරම්පරිකව වගා කරනු ලැබේ. එක් අතකින් ගත් කල ජලය රැඳවෙන ස්වාභාවික තෙත් බිමක් ලෙස ද අනෙක් අතින් ගත්කල සුවිශේෂී ජෛව විවිධත්වයක් සහිත අභය භූමියක් ලෙස ද, තවත් අතකින් ගත්කල පාරම්පරික ව වී ගොවිතැන සිදුකරන වාරි පහසුකම් ලබන මිනිස් ජනාවාසයකින් ද මෙම කලාපය යුක්ත වෙයි. එහි දී ඉහත සඳහන් කරන ලද වැව් පද්ධතිය මඟින් පරිසර කලාපයට කරන පහතින් දක්වා ඇති සුවිශේෂී බලපෑම් තුනක් හඳුනාගත හැක.

1. තෙත් බිමක පෝෂණයට අවශ්‍ය ජල රඳවනයක් ලෙස ක්‍රියාකිරීම.
2. වෙරළාසන්න භූමි පෙදෙසක වුව ද කරදියෙන් සිදුවන බලපෑම අවම කර, වී ගොවිතැන් කිරීමට අවශ්‍ය පාංශු ජල සංරක්ෂණය සිදුකිරීම.
3. අධික වර්ෂා සමයන් හි ගංවතුර තත්ත්වයන් නිසා මිනිස් ජනාවාසවලට සිදුවන හානිය පාලනය කිරීමට උපකාරී වීම.

වැවක් හෝ එබක් යනු මිනිස් නිර්මිතයක් වේ. රතඹලා ඔය ද්‍රෝණියේ වෙරළට ආසන්නව ජලය රැඳෙන ස්වභාවික පහත් බිමක් ලෙස තිබී 12 වැනි සියවසේ දී පමණ වේලි බැඳ මෙම වැව් පද්ධතිය සකස් කර ඇති බව සිතිය හැක. ඉහත සිතියමේ දක්වා ඇති පරිදි මෙම වැව් පද්ධතියේ ඉහළින්ම පිහිටා ඇත්තේ ඉහළ වැව ලෙස හඳුන්වන වැව වන අතර, එම වැවේ සිට දෙපසට ක්‍රමයෙන් බෑවුම් වී එල්ලංගාවක් සේ වැවෙන් වැවට ජලය බැස යයි. සාමාන්‍යයෙන් අපට හුරුපුරුදු වැවක වැව් බැම්මට පහළින් කුඹුරු යාය ද නැවත පහළින් තවත් වැවක් ලෙස එල්ලංගාවක් පැවතිය ද මෙහි දක්නට ඇත්තේ එවැනි පිහිටීමක් නොවන බව පැහැදිලි වනු ඇත. මෙහි ඇති එක් විශේෂ ලක්ෂණයක් වන්නේ වැව් දෙකක් වෙන් වන්නේ ද එක වැව් බැම්මක් මතින් වීමය. එනම් ස්වභාවිකව ජලය රැඳෙන භූමියක භූමියේ බෑස්ම උපයෝගී කොටගෙන වැවෙන් වැවට ජලය ගලා යන පරිදි වේලි සකස් කොට මෙම වැව් හත නිර්මාණය කොට ඇති බවයි.

මෙහි ඇති අනෙක් විශේෂ කරුණ වන්නේ, ලංකාවේ වෙරළාසන්නව ඉදි කරන ලද වාරි කර්මාන්තයන් බහුල නොවන නමුත් ඒ අතරින් එක් ප්‍රධාන වාරි කර්මාන්තයක් ලෙස මෙය හඳුනාගත හැකි වීමය. කරවිට වැව් ලෙස පැරැණ්නන් විසින් හඳුන්වනු ලබන්නේ මේ වෙරළට ආසන්නව ඉදිකර තිබූ වැව් වන අතර, ලංකාවේ වයඹ දිග වෙරළාසන්නයේ මෙවැනි වැව් වල වැඩි ව්‍යාප්තියක් දක්නට ඇත.

හලාවත සමීපයේ පිහිටි කරවිට වැව, මුන්නේෂ්වරම් වැව, පතන්කුඩාව වැව, මයික්කුලම වැව මේ සඳහා නිදසුන් වේ. මෙම වැව්වලින් කෙරෙන ප්‍රධාන කාර්යයක් වනුයේ ලවණ මිශ්‍රිත කරදිය පොළව තුළින් වෙරළාසන්න ගොඩබිම දෙසට කාන්දුවීම වළකා පොළවේ මිරිදිය ජල තත්ත්වය පවත්වා ගෙන යාමය. ආනවිලුන්දාවේ වැව් පන්තියද මේ සඳහා හොඳ හැඩගැහුණු වැව් පන්තියක් වන අතර එමඟින් වෙරළාසන්න වී ගොවිතැන ආරක්ෂා කිරීමට මහත් පිටිවහලක් වී ඇත. මෙවැනි සුවිශේෂී කරුණු රැසකින් හා පිහිටීමකින් සමන්විත ආනවිලුන්දාව වැව් පන්තිය සොබාදහමේ අපූර්වත්වයෙන් ද එයත් සමඟ මනා ලෙස අනුගත වූ විශිෂ්ට වාරි තාක්ෂණයකින් ද මුසු වී අද වන විට එහි මිනිස් නිර්මිතයන් පවතී ද යන්නවත් සිතා ගැනීමට නොහැකි ලෙස ගොඩනැංවී තිබේ.

මෙම වැව් පද්ධතිය හුදෙක් වී ගොවිතැන වෙනුවෙන් පමණක් භාවිත නොවන අතර, ප්‍රදේශයේ මිරිදිය ධීවර කර්මාන්තය ද සිදු කරගෙන යාමට අවශ්‍ය පරිසරය සකසා දී ඇත. එයට අමතරව අභය භූමියක් ලෙස ප්‍රසිද්ධව ඇති බැවින් දෙස් විදෙස් සංචාරක ආකර්ෂණය ද නිබඳව ලබන තෝතැන්නක් ලෙස ද මෙය හඳුනාගෙන ඇත. සොබාදහම සමඟ සහජීවනයෙන් හිඳ සිය අවශ්‍යතා සපුරා ගැනීම උදෙසා වන තිරසාර සංවර්ධනයටත්, විශිෂ්ට ජල කළමනාකරණයකින් මහ පොළවේ එකතු වන ජලය ලෝකෝපකාරය වෙනුවෙන් යොදා ගැනීමත් යන කාරණා සඳහා දිය හැකි හොඳම නිදසුනක් ලෙස මෙම ආනවිලුන්දාව වැව් පන්තිය පෙන්වා දිය හැක.

ඉංජි.ආර්.ඒ.ආර්.වී. ක්‍රිෂාන්ත,
ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු,
පුත්තලම.





LAKE HOUSE
දැන්වීම් අතිරේක අංශය
☎: 0112 429 339, 0777 270 076
සම්බන්ධීකරණය
නිශාන්ත පිරිස්
සම්බන්ධීකරණ සහායක - එස්. එස්. වික්‍රමරත්න
සංස්කරණය - තුෂාරි වික්‍රමසිංහ
පිටු සැකසුම - එච්.ඩී.සී. කුමාරසිරි, කේ. උදය කුමාර, ටී. ජයවික්‍රම, ඒ. බමුණුආරච්චි

2021 මාර්තු 22 සඳුදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.